# පුරාවේද

හත් වැනි කලාපය

2022



පුරාවිද්‍යා විෂයය සංගමය
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

# පුරාවේද

හත් වැනි කලාපය 2022

# පුරාවේද

**හත් වැනි කලාපය 2022**


**ප්‍රධාන උපදේශක සංස්කාරක**

මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි

**උපදේශක සංස්කාරකවරු**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආරිය ලගමුව

මහාචාර්ය ඩී. තුසිත මෙන්ඩිස්

මහාචාර්ය පී. බී. නුවන් අබේවර්ධන

ආචාර්ය ඩබ්. එම්. ටී. බී. විජේපාල

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්දිම බණ්ඩාර අඹන්වෙල

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එන්. ඩී. ටී. එම්. සිරිවර්ධන

සහය කථිකාචාර්ය ජේ. එම්. ඉන්දික රුවන් ජයසේකර

සහය කථිකාචාර්ය පී. ජේ. ඩබ්. එන්. නොනිස්

සහය කථිකාචාර්ය පී. එන්. හංසනී

සහය කථිකාචාර්ය ඩබ්. එම්. සී. එම්. අධිපත්තු

සහය කථිකාචාර්ය පී. එන්. එම්. සමරතුංග

සහය කථිකාචාර්ය ආර්. එම්. අයි. පී. ඩී. කේ. රත්නායක

**ප්‍රධාන සංස්කාරක**

කේ. ඩී. සී. සෙව්වන්දි.

**සංස්කාරක මණ්ඩලය**

එස්. ආර්. එල්. සේනානායක

කේ. කේ. ජී. කේ. එම් සෙනරත්



**ප්‍රකාශනය**

පුරාවිද්‍යා විෂයය සංගමය

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

මිහින්තලේ

2022

# පුරාවේද

**හත් වැනි කලාපය 2022**

© හිමිකම් ඇවිරිණි

**ප්‍රකාශනය:**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය

පුරාවිද්‍යා විෂයය සංගමය

ISSN 2478-0774
ISSN 2989-0306
ප්‍රකාශන අංකය - 9 772478077006

(මෙහි පළවන ලිපි පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන්ට පැවරෙන බව කරුණාවෙන් සළකන්න)

**පිටකවරය නිර්මාණය** - පී. එම්. එස්. සෙනවිරත්න

**ඡායාරූපයේ අයිතිය** - මහාචාර්ය පී. බී. නුවන් අබේවර්ධන

**පරිගණක පිටු සැකසුම** - කේ. ඩී. සී. සෙව්වන්දි

## උපකුලපතිතුමියගේ පණිවිඩය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශයේ විෂය සංගමය විසින් **"පුරාවේද"** නමින් වාර්ෂිකව සකස් කරනු ලබන ශාස්ත්‍රීය සඟරාවේ හත් වැනි කලාපය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් මම බෙහෙවින් සතුටට පත් වෙමි.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ඉගෙනුම් පාඨමාලාවෙහි ප්‍රධාන විෂයක් ලෙස පුරාවිද්‍යා විෂයය පැවතීම අපට ආඩම්බර විය හැකි කරුණකි. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීයාගේ පරමාර්ථය විය යුත්තේ නව පර්යේෂණ ආරම්භ කර නව දැනුම සොයා යාමය. ඒ සඳහා මහගු අවස්ථාවක් මෙම **"පුරාවේද"** සඟරාව තුළින් අත්කර ගැනීමට හැකි වී තිබේ. රටක ඉතිහාසය නිවැරදි ලෙස සමාජගත කිරීමට පුරාවිද්‍යා විෂයට හැකියාවක් ඇත. උපාධි අපේක්ෂකයින්ගේ පුරාවිද්‍යාත්මක ගවේෂණ සාකච්ඡා කෙරෙමින් ඔවුන් දිරිමත් කෙරෙන සහ පර්යේෂණ හැකියාවන් ප්‍රකට කරන මෙවැනි ශාස්ත්‍රීය සඟරාවන් ප්‍රකාශයට පත්කිරීම කාලෝචිතය.

පුරාවිද්‍යා විෂයය සංගමය මඟින් තම අධ්‍යයනාංශයේ විද්‍යාර්ථීන් ඒකාබද්ධ කර ගනිමින් පීඨාධිපතිවරයාගේත්, අංශාධිපතිවරයා හා අධ්‍යයනාංශ ඇඳුරු මඩුල්ලගේත් උපදෙස් මත සිදු කරන ලද පර්යේෂණයන් ශාස්ත්‍රීය සංග්‍රහයක් ලෙස එළිදැක්වීම සමස්ත විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය විද්‍යාර්ථීන්ට ආදර්ශයක් සහ මගපෙන්වීමක් ද වේ. එබැවින් මෙවැනි ශාස්ත්‍රීය කටයුතු ඉදිරියටත් කරගෙන යාමට ඔවුන්ට ශක්තිය ධෛර්යය ලැබේවා' යි මා ප්‍රාර්ථනා කරමි.

**මහාචාර්ය සංජීවනී ගිනිගද්දර**
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

## පීඨාධිපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය 2010 වසරේ ස්ථාපිත කිරීමෙන් අනතුරුව ඉතා කෙටි කාලයක් තුළ ශ්‍රී ලංකා පුරාවිද්‍යා ක්ෂේත්‍රයට විද්‍යාත්මක විෂය දැනුමින් පිරිපුන් පුරාවිද්‍යා ගෞරව උපාධිධාරින් බිහිකිරීමේ උදාර කටයුත්තක නියැලීම පීඨාධිපතිවරයා වශයෙන් මා පැසසුමට ලක්කරමි.

බහුවිෂයාත්මක විෂයක් වන පුරාවිද්‍යාව අධ්‍යයන ක්ෂේත්‍රයේ සෑම විෂය ක්ෂේත්‍රයක් සමඟම බැඳී පවතින විෂයකි. එම නිසා පුරාවිද්‍යාඥයා පරිසරය, සමාජය මෙන්ම විවිධ විද්‍යාත්මක විෂයන් සමග බද්ධ වෙමින් පරිසර පුරාවිද්‍යාව, මානවවංශ පුරාවිද්‍යාව, භූ පුරාවිද්‍යාව, ප්‍රාග් ඉතිහාසය, නිර්මිත පරිසරය කලා ඉතිහාසය ආදී වශයෙන් වන විවිධ විෂය ක්ෂේත්‍ර රාශියක් සමඟ බද්ධව කටයුතු කරනු ලැබේ.

මෙවැනි විෂය ක්ෂේත්‍රයන් ඉගෙන ගන්නා විද්‍යාර්ථයා අනාගතයේදී අර්ථකථනාත්මක ප්‍රවේශයකින් විෂය හැදෑරීමට හුරු කිරීම අතිශය වැදගත් කාර්යකි. එම කාර්ය සඳහා පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශයේ අංශාධිපතිතුමා හා ආචාර්ය මණ්ඩලය ශිෂ්‍ය විද්‍යාර්ථීන් හා එක්ව **"පුරාවේද"** නමින් ශාස්ත්‍රීය සඟරාවක් ආරම්භ කිරීම ඉතාම වැදගත් වේ.

සිසුන්ගේ දැණුම ආකල්ප හා කුසලතා වර්ධනය සඳහා මෙම සඟරාව වැදගත් වී ඇති බව එම සඟරාව් පරිගනක කටයුතුවල සිට කවර නිර්මාණය ඇතුළු සියළුම කාර්යන් සිසුන්ගේ ක්‍රියාකාරකම් බැවින් එය ඔවුන්ගේ මෘදු කුසලතා සංවර්ධනයට ඉවහල් වී ඇති බව මෙම සඟරාව පරිශීලනය කිරීමෙන් අවබෝධ කරගත හැකිය. ආචාර්ය මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සකස් වී තිබෙන මෙම සඟරාවේ ලිපි එකතුව සඳහා සෑම වසරකම තෝරාගත් විෂය තේමාවක් යටතේ සඟරාව සකස් වන බව පෙනේ. එමගින් විශ්වවිද්‍යාලයට පැමිණෙන නවක සිසුන්ට තම ජ්‍යෙෂ්ඨ සිසුන්ගේ විෂය ප්‍රවේශය අධ්‍යයනයට ද ඉන් පිටුවහලක් ලැබෙන බව මාගේ විශ්වාසයයි. එබැවින් මෙම සඟරාව ඉදිරියේ දී තවදුරටත් සංවර්ධනයට ලක් වී ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිළිගත් සඟරාවක් බවට පත්වේවා යැයි මා ප්‍රාර්ථනා කරමි.

**ඩී තුසිත මැන්දිස් (PhD, FSLCA)**
පුරාවිද්‍යා මහාචාර්ය
පීඨාධිපති
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

## අංශාධිපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශයේ ගෞරව උපාධි පාඨමාලාව හදාරන ශිෂ්‍ය විද්‍යාර්ථීන්ගේ ලිපි එකතුවක් ලෙස මෙවර පුරාවේද සඟරාවේ හත්වැනි කලාපය එළි දක්වනු ලැබේ. මෙවර පුරාවේද සඟරාව සඳහා තේමා කරගෙන ඇත්තේ වාරි පුරාවිද්‍යාවට අදාළ ශාස්ත්‍රීය ලිපි රචනා වේ.

අධ්‍යයනාංශයේ ආචාර්යවරුන්ගේ අධීක්ෂණය යටතේ සකස් වී ඇති මෙම ලිපි රචනා තුළින් පුරාවිද්‍යා විශේෂ උපාධි පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශයේ ශිෂ්‍ය විද්‍යාර්ථීන්ගේ විෂය දැනුම විවිධ විෂයය පථයන් ඔස්සේ පුළුල් කිරීමට අධ්‍යයනාංශය බලාපොරොත්තු වේ.

එමෙන්ම රජරට විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන නවක සිසුන්ට ජ්‍යෙෂ්ඨ සිසුන්ගේ පර්යේෂණ කටයුතු ඇතුළත් ප්‍රකාශනයන් කියවීමට ලබා දීමට හා එමඟින් විෂය පිළිබඳ මාර්ගෝපදේශනයක් නවකයින්ට ලබාදීමට ද මෙමඟින් අපේක්ෂා කරන බැවින් පුරාවේද සඟරාව තවදුරටත් ඉදිරියේ දී ශාස්ත්‍රීය මට්ටමින් සංවර්ධනයට ලක් වී ශ්‍රී ලංකාව තුළ ඉතා ඉහළ පිළිගැනීමකට ලක්වන සඟරාවක් බවට පත්වේවා යැයි මම ප්‍රාර්ථනා කරමි.

**මහාචාර්ය නුවන් අබේවර්ධන**
අංශාධිපති
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

## සභාපතිතුමියගේ පණිවිඩය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨයේ පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය කෙටි ඉතිහාසයකට හිමිකම් කියයි. නමුත් මෙම කෙටි කාලය තුළ අත්පත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව අධ්‍යයනාංශයේ වර්තමාන ශිෂ්‍ය විද්‍යාර්ථයින් ලෙස අපට ඇත්තේ අභිමානයකි. අප අධ්‍යයනාංශය පර්යේෂණ කාර්යයන් මෙන්ම ශාස්ත්‍රීය අතින් ද ඉතා කෙටි කාලයක් තුළ සීඝ්‍ර දියුණුවක් ළඟා කරගෙන ඇත. අප අධ්‍යයනාංශයේ ගෞරව උපාධි පාඨමාලාව හදාරන ශිෂ්‍ය විද්‍යාර්ථීන්ගේ ශාස්ත්‍රීය ලිපි එකතුවක් ලෙස **"පුරාවේද"** ශාස්ත්‍රීය සඟරාව තුළින් ප්‍රකාශයට පත් කරයි. අධ්‍යයනාංශයේ ඇඳුරු මඬුල්ලේ මඟ පෙන්වීම යටතේ පුරාවසර හයක් මුලුල්ලේ වාර්ෂිකව ප්‍රකාශයට පත්කරන ලද පුරාවේද ශාස්ත්‍රීය සඟරාවේ 2022 වසරේ ප්‍රකාශයට පත්වන්නේ සත්වන කලාපය යි.

අංකුර පර්යේෂකයන්ගේ සාර්ථකත්වය උදෙසාත්, පුරාවිද්‍යා විෂයය සංගමයේ උන්නතිය උදෙසාත් අප අධ්‍යයනාංශයේ ඇඳුරු මඬුල්ලෙන් ලැබෙන සහයෝගය අතිමහත් ය. ඇදුරු මඬුල්ලකගේ මඟපෙන්වීම යටතේ මෙම ශාස්ත්‍රීය සඟරාව සාර්ථකව එළිදැක්වීමට හැකිවීම අංකුර පර්යේෂකයන් ලෙස අප ලද අගනා අවස්ථාවකි. න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව අත්හදාබලමින් ලබාගත් නව දැනුම සමාජයට විවර කිරීමට මං සොයන අංකුර පර්යේෂකයන්ට පුරාවේද ශාස්තීය සංග්‍රහය දායකත්වය සපයනු ඇතැයි විශ්වාස කරන අතර ඉදිරියටත් මෙම සඟරාව දිනෙන් දින දියුණු වෙමින් පුරාවිද්‍යාවේ ශාස්ත්‍රීය උන්නතිය උදෙසා ඉමහත් දායකත්වයක් ලබාදීමට හැකි වේවා යි ප්‍රාර්ථනා කරමි.

**පී.එම්.එස්. සෙනෙවිරත්න**
සභාපති
පුරාවිද්‍යා විෂයය සංගමය
පුරාවිද්‍යා හා උරුම කලමනාකරණ අධ්‍යයනාංශය

## සංස්කාරක සටහන

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංහයේ පුරාවිද්‍යා විෂය සංගමය මඟින් ප්‍රකාශයට පත්කරනු ලබන පුරාවේදය ශාස්ත්‍රීය සඟරාවේ හත් වැනි කලාපය සඳහා වාරි පුරාවිද්‍යාව විෂය ක්ෂේත්‍රය ඔස්සේ අන්තර්ගත පර්යේෂණ මාතෘකා 31ක් උපයෝගීත්වයෙන්, ශිෂ්‍ය විද්‍යාර්ථීන් විසින් මෙම ග්‍රන්ථයට ලිපි ඉදිරිපත් කර ඇත. මෙම ශාස්ත්‍රීය සඟරාව ප්‍රකාශයට පත්කිරීම මඟින් විෂය සංගමය බලාපොරොත්තු වන්නේ අංකුර පර්යේෂකයන්ගේ පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත් කිරීම සදහා ඉඩ ප්‍රස්ථාවක් නිර්මාණය කිරීමයි. නව පර්යේෂකයින්ට කයින්ට මෙම විෂය හැදෑරීමේ දී එම විෂයය පිළිබඳව මූලික අවබෝධයක් ලබාදීමය. පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ වාරි කර්මාන්තය පිළිබඳව දැඩි කැමැත්තක් හා උනන්දුවක් දක්වන ශිෂ්‍ය විද්‍යාර්ථීන්ට වඩ වඩාත් උනන්දුව ජනිත කරගැනීමට ද, පිටිවහලක් මෙම සඟරාවේ හත්වන කලාපය තුළින් සපයනු ඇත. අධ්‍යයනාංශයේ සිසුන්ගේ විෂය පරිබාහිර ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමේ අරමුණ මූලික කරගත් ආකල්පමය කුසලතා සංවර්ධනය කරමින් මෙම ශාස්ත්‍රීය සංග්‍රහය **"පුරාවේද"** නමින් එළිදැක්වීම අප ලත් ශාස්ත්‍රීය විෂයානුබද්ධ ජයග්‍රහණයක් ලෙස ද පෙන්වාදිය හැකිය.

පර්යේෂණාත්මක දැනුමින් සුපෝෂිත ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශයේ අංශාධිපතිතුමන් ප්‍රමුඛ සමස්ත ආචාර්ය මණ්ඩලයේ මාර්ගෝපදේශයන් සහ නිරීක්ෂණය යටතේ සම්පාදිත වූ පර්යේෂණ ග්‍රන්ථයක් ලෙස මෙම සඟරාව එළිදැක්වෙන අතර මෙකී කෘතියට පර්යේෂණාත්මක ලිපි සැකසූ සියලු දෙනාටම හා ඒ සඳහා මඟපෙන්වූ ආචාර මණ්ඩලය හට සංස්කාරක මණ්ඩලයේ ස්තූතිය පළකරන අතර, මෙම ශාස්ත්‍රීයමය කර්තව්‍යයට දායකත්වය සැපයීම පිළිබඳව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනංශයේ ශිෂ්‍ය විද්‍යාර්ථීන්ට පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය වෙත තම පර්යේෂණාත්මක දැනුම අනාගතයේදීත් වඩාත් දියුණු මට්ටමකින් සමාජගත කිරීමට හැකිවේවා යැයි සංස්කාරක මණ්ඩලය ලෙස අප ප්‍රාර්ථනා කරමු.

**කේ. ඩී. සී. සෙව්වන්දි**
ප්‍රධාන සංස්කාරක
පුරාවිද්‍යා විෂයය සංගමය
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

## පුරාණ ලක්දිව වාරි කර්මාන්තයේ සමාජ භාවිතය පිළිබඳ සංකල්පීය ආකෘතිය

**මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි**

**ප්‍රවේශය**

පැරණි ලක්දිව වාරි කර්මාන්තය පිළිබඳ සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් වාරි කර්මාන්තය භාවිතයේ සමාජ පුරාවිද්‍යාත්මක අගය සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ලැබේ. මෙම පර්යේෂණයට අදාල තොරතුරු සහ දත්ත සම්පාදනය කරගැනීමේ දී ලේඛනගත ප්‍රභවයන් සහ ක්ෂේත්‍ර ගවේෂණ අනාවරණය කරගත් භෞතික තොරතුරු පදනම් කරගනු ලැබී ය. ප්‍රධාන වශයෙන් වියළි කලාපය හා තදාශ්‍රිත ප්‍රදේශයන් හි පැරණි වාරි කර්මාන්ත අවධානය යොමුකර තිබේ. මෙලෙස දිවයිනේ සමස්ථ වියළි කලාපයේ වාරි කර්මාන්තය පිළිබඳ ශේෂ ව තිබෙන නටබුන් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට සිදු වූයේ පොදුවේ වාරි කර්මාන්ත භාවිතය සම්බන්ධයෙන් සිදු කෙරෙන විමර්ශනයන්හි දී එක් කලාපයක් පමණක් හුදකලා ලෙස තෝරාගැනීම තුළ සමස්ථ වියළි කලාපය තුළ වන විවිධත්වය හඳුනාගැනීමේ දී ඇතිවන ගැටළුවලට විසඳුම් සපයාගැනීමේ පරමාර්ථයෙනි. මෙමගින් පුරාණ ලක්දිව වාරි කර්මාන්තයේ සමාජ භාවිතය පිළිබඳ සංකල්පීය ආකෘතිය පිළිබඳ විමසීමක් සිදුකිරීමට අපේක්ෂිත ය.

**විමර්ශනය**

වාරි කර්මාන්තයෙහි සමාජ භාවිත අගය සම්බන්ධයෙන් විමර්ශනය කරන විට එහි ප්‍රධාන අංශයක් ලෙස සැලකිය හැක්කේ වැව සහ අමුණෙහි වගකීම හඳුනාගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම ය. වැව සහ අමුණ යනු වාරි කර්මාන්තය තුළ ක්ෂණිකව බිහිවූවක් නොවී ය. මෙම නිර්මාණ ජනතාව විසින් ගොඩනගන ලද්දේ එහි අවශ්‍යතාව මැනවින් වටහා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්ත භාවිතය පිළිබඳ ව පැරණිතම ලිඛිත සාක්ෂි ලැබෙනුයේ ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසෙන් පසුභාගයේ ශිලා ලේඛනවල ය (*Ic*. Vol. 1: Nos. 25, 168, 1130, 1132, 1151, 1153; *Ez*. Vol. v: 225). ඒ අනුව අපට එළඹිය හැකි නිගමනය වන්නේ මෙරට වාරි කර්මාන්ත වඩා සංවිධානාත්මක ලෙස ඉදිකිරීම ආරම්භ වන්නට ඇත්තේ එම කාලයේ දී වන බවය. ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවස ආරම්භ වන විට වාරි කර්මාන්තය පැවති බව ශිලා ලේඛන මූලාශ්‍රය වලින් පමණක් නොව වංසකතා තොරතුරු අනුව ද තහවුරු වේ (*මව.* ix: 11; 83 සිට; xxii: 4; xxiii: 92-5; xxiii: 45,90). පූර්ව අනුරාධපුර සමයේ සිට ක්‍රිස්තු පූර්ව අවසාන භාගයට ආසන්න කාලය වන තෙක් ග්‍රාමීය කුඩා වාරි කර්මාන්ත මගින් වියළි කලාපීය ප්‍රදේශවල වාසය කළ ජනතාවගේ කෘෂි කාර්මික හා අනෙකුත් අවශ්‍යතාවන් උදෙසා ජලය සම්පාදනය කරගැනීම ප්‍රමාණවත් වන්නට ඇත. පුරාතනයේ සිටම ග්‍රාමීය වැව් ජන ජීවිතයට වඩාත් සමීප සාධකයක් වූ ක්‍රිස්තු පූර්ව සමයේ සිටම ස්ථාන නාම සකස් වීම කෙරෙහි එය බලපා තිබීමෙන් තහවුරු වේ (විතානාච්චි 1999: 96). නමුත් ක්‍රිස්තු පූර්ව අවසාන භාගය වන විට ජනගහනයේ වර්ධනය සීඝ්‍ර වීම මත වියළි කලාපයේ තුනී ජන විසිරුම ක්‍රමයෙන් වියුක්ත වී යාම තුළ පෙර කී **ග්‍රාම වාපී සංකල්පය** වැනි මූලික ජල සම්පාදන ක්‍රම මගින් ජලය ලබාගැනීම ප්‍රමාණවත් නොවන්නට ඇත. මේ නිසා මෙරට වාරි කර්මාන්තය වඩාත් සංවිධානාත්මක ලෙස සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව ජන සමාජය තුළ ඉස්මතු වීම හේතුවෙන් රාජ්‍යය මැදිහත් වීම මත වඩාත් ඵලදායී ජල සම්පාදන ක්‍රම ඉදිකිරීම කෙරෙහි යොමු වීමට සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර වැව් අමුණු නිර්මාණය කිරීම කෙරෙහි පෙළඹවීමක් ඇති කරන්නට ඇති බව සිතිය හැකි (පූව. 18; *රාව.*: 44; *Ic*. Vol. ii: No. 01).

පොළවේ මතුපිට තිබෙන හා භූගත ජලය ප්‍රධාන වශයෙන් සැපයෙනුයේ වර්ෂාපතනයෙනි. එම ජලයෙන් සීමිත කොටසක් ජනතාව විසින් ඉදි කරන්නට යෙදුන **වැව්** මගින් ගබඩා කරගන්නට ඇති අතර වර්ෂාවෙන් පොළවට සැපයෙන ජලයෙන් වැඩි කොටසක් ජල චක්‍රයට අනුව වාෂ්පීකරණ ක්‍රියාවලිය මගින් පොළවෙන් ඉවත් ව යන්නට ඇත. ඉන් තවත් කොටසක් පොළව මතුපිටින් ගලා යෑමෙන් හෝ පසට උරා ගැනීමෙන් ජල මාර්ගවලට එකතු වී මුහුදට ගලායයි. මෙලෙස ජල මාර්ගවලට එකතුවන ජලයෙන් කිසියම් ප්‍රමාණයක් නැවත රැස්කර භාවිතයට ගැනීමේ පරමාර්ථයෙන් **අමුණ** ඉදිකළ බව පැහැදිළි ය.

ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ දී සිදු වූ වාරි කර්මාන්තයේ වර්ධනය සාමාජීය වර්ධනය කෙරෙහි ද සෘජුව ම බලපා තිබෙන බව මූලාශ්‍රය ගත තොරතුරු ඇසුරින් තහවුරු කරගත හැකි ය. වියළි කලාපය ආශ්‍රිත ව සිදු වූ තත්කාලීන සමාජ සංස්කෘතික පරිවර්තනයන් ඒ සඳහා බලපාන්නට ඇති බව පැහැදිළි ය. එම සමාජ සංස්කෘතික විපර්යාසයන් ප්‍රධාන වශයෙන් සාමාජීය, දේශපාලනික හා ස්වභාවික යන ක්‍රියාකාරීත්වයන් ත්‍රිත්ත්වය තුළ ක්‍රියාත්මක වූ බව හඳුනාගත හැකි ය. වාරි කර්මාන්ත නිර්මාණය කෙරෙහි බලපෑ හේතූන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී එම කරුණු ත්‍රිත්වය ඔස්සේ අවධානය යොමු කිරීම මගින් වාරි කර්මාන්ත ඉදිකිරීම කෙරෙහි පුරාතන මානව සමාජ යොමු වීමට මූලික වූ කරුණු සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගත හැකි ය. ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශ ආශ්‍රිත ව ඉදිකළ පැරණි වාරි කර්මාන්ත නිර්මාණය කෙරෙහි මූලික වූ අපේක්ෂිතාර්ථ හෙවත් වගකීම් ගණනාවක් ම පවතී. එම වගකීම් ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් සහ උප ප්‍රධාන කරුණු ගණනාවක් යටතේ වෙන්කරලීමේ හැකියාව පවතී.

සාමාජීය අවශ්‍යතාවන් ඉටුකරලීමේ පරමාර්ථයෙන් සිදුවන නොයෙකුත් කාර්යයන් සාමාජීය ක්‍රියාකාරකම් ලෙසින් සැළකේ. මේ සඳහා ඒ ඒ කාල පරිච්ඡේදයන් තුළ මිනිසා අත්පත් කරගත් බුද්ධියේ වර්ධනය, දියුණු කරගත් තාක්ෂණික ඥානය, හඳුනාගනු ලැබූ සම්පත් පරිහරණය වැනි ක්ෂේත්‍රවල දායකත්වය සිදු වී තිබෙන බව පුරාතන මානව සමාජ පරීක්ෂා කිරීමේ දී තහවුරු වේ. එම සාමාජීය ක්‍රියාකාරකම් සකස්වීම කෙරෙහි භූගෝලීය හා පාරිසරික තත්ත්වයන් ද සෘජුව ම බලපා තිබෙන බව හඳුනාගත හැක්කේ පොදු ක්‍රියාකාරකම් හැරුණු විට එකිනෙකට වෙනස් භූගෝලීය හා දේශගුණික කලාපවල වාසය කරන ජන කොට්ඨාසවලට පමණක් ආවේණික වූ විශේෂ ක්‍රියාකාරකම් පවතින බැවිණි. පුරාණ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය වාරි කර්මාන්තය තුළ වැව් අමුණු නිර්මාණය කෙරෙහි හේතු වූ සාමාජීය ක්‍රියාකාරකම් ගණනාවක් හඳුනාගත හැකි විය. ඒ අතර ජන රේඛනයේ ප්‍රසාරණය, තාක්ෂණය අත්පත් කර ගැනීම, කෘෂි ආර්ථිකයේ දියුණු වීම, මහා පරිමාණ ජල සැපයුම, අතිරේක ජල සම්පාදනය, පාරිසරික සුරක්ෂිතතාවය, වැව් සඳහා ජලය සම්පාදනය කිරීම, වැව්වලට හා කෙත් බිම්වලට එකවිට ජලය සම්පාදනය කිරීම, ජල පරිමාව අවම අවස්ථාවල දී ජලය කළමනාකරණය කිරීම, දුර බැහැර ප්‍රදේශ කරා ජලය සැපයීම, කෘෂි බිම් සඳහා අවශ්‍ය ජල සම්පාදනය, අන්තර් නිම්න ඔස්සේ ජලය රැගෙන යාම, නාගරික ජල සම්පාදනය සහ නිම්නබද ප්‍රදේශ පෝෂණය කිරීම වැනි අංශ හඳුනා ගැනීමේ හැකියාව පවති.

රටක පරිපාලන ව්‍යුහය ප්‍රධාන වශයෙන් දේශපාලනික ක්‍රියාකාරීත්වය මත පදනම් ව ගොඩනැගී තිබේ. එය ජන සමාජයේ සෑම අංගයක් සමඟ ම විවිධාකාරයෙන් සම්බන්ධ ව පවතින්නකි. වාරි කර්මාන්තය ගොඩනැගීම සහ භාවිතය තුළ ද දේශපාලනික ක්‍රියාකාරකම් පුළුල් ලෙස දක්නට ලැබේ. වර්තමානය වන විට ගෝලීය දේශපාලනය තුළ ජලය දේශපාලන ප්‍රපංචයක් බවට පත්වෙමින් ඒ මත ක්‍රියාත්මක වන **ජල දේශපාලනය (Water Politics)** නම් භාවිතාව ඉදිරියට පැමිණ ඇත (Iyer 2003: 197-9). එහෙත් මෙම සංකල්පය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන වැදගත් කාරණයක් වන්නේ මෙරට තුළ ඒ

සඳහා දීර්ඝ ඉතිහාසයක් පවතින බවයි. ජාතික පදනමින් ජල සම්පත භාවිත කිරීම හා කළමනාකරණය කිරීම ප්‍රතිපත්තියක් බවට ක්‍රිස්තු වර්ෂාරම්භයේ සිට පත්වෙමින් පැවති බව මෙරට වාරි කර්මාන්තයේ වර්ධනය සඳහා ඍජු රාජ්‍ය අනුග්‍රහය ලැබීම තුළින් තහවුරු වේ (පරණවිතාණ 1964: 174; *මව.* xxxv: 94-5; ). පුරාතන ලංකාවේ දේශපාලන බලය තහවුරු කරගැනීම පිණිස උපයෝගී වූ ප්‍රධාන සාධකයක් ලෙස වාරි නිර්මාණ කටයුතු සඳහා රාජ්‍ය මැදිහත්වීම හඳුනාගත හැකි ය. (*Ic*. Vol. ii: Nos. 1, 3, 7, 9, 10, 13, 14[4], 15, 16, 18, 19, 21, 23, 26, 31, 37, 38, 39). වාරි මාර්ග භාවිතය ඇසුරින් දේශපාලන ස්ථාවර බව ගොඩනගා ගත් රජවරුන් ගණනාවක් පිළිබඳ තොරතුරු අනුරාධපුර සහ පොළොන්නරු යුගයෙන් හමු වේ (*මව.* xxxvii:47-50; *රාජා.*: 76-80,197-8; lxviii: 43-52,57-8; lxxix: 24-87). එහිදී වාරි කර්මාන්ත ඔස්සේ ජනතාවට සමීප වීම වඩාත් සංවිධානාත්මක ව හා ශක්තිමත් ව සිදු වූ බව හඳුනාගත හැකි ය. මෙහි උපරිම ඵලය නෙලාගත් පාලකයා වනුයේ පළමුවන පරාක්‍රමබාහු රජු ය (*මව.* xxxvii:47-50; රාජා.: 76-80,197-8; lxviii: 43-52,57-8; lxxix: 24-87). රටේ වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි විවිධ පරිමාණයේ වාරි නිර්මාණ ඉතා විශාල ප්‍රමාණයක් කරවීම හා ප්‍රතිසංස්කරණය තුළින් ජනප්‍රසාදය ලබා ගැනීම මගින් රටේ සෑම පෙදෙසක ම තම බලය ව්‍යාප්ත කරලීමට හෙතෙම කටයුතු කළ බව පැහැදිළි ය.

ජල පාලනය මගින් රට පාලනය කළ හැකි බවට වටහාගත් පුරාණ රජවරුන් **වැව් අමුණු** ඒ සඳහා උපයෝගී කරගත හැකි ප්‍රධාන වාරි තාක්‍ෂණික නිර්මාණ ලෙස හඳුනාගෙන කටයුතු කළ බව පැහැදිළි ය. ඒ අනුව ස්වභාවික මූලාශ්‍රයවල පවතින ජලය අමුණ මගින් පාලනය කිරීමට කටයුතු කිරීම තුළින් ජලයේ නතු බව දේශපාලන යාන්ත්‍රණය වෙත යොමු කර ගැනීමට රාජ්‍යත්වය කටයුතු කළ බව පෙනේ. එහි දී ස්වභාවික ජලය පාලනය කළ හැකි ප්‍රධාන තාක්‍ෂණික ව්‍යුහයක් ලෙස 'අමුණ' පුරාතනයේ දී දේශපාලනය සමඟ ක්‍රියාත්මක ව තිබෙන බව හඳුනාගත හැකි ය. තම දේශපාලනික බලය තහවුරු කරගැනීම පිණිස අමුණ උපයෝගී කරගත් ප්‍රධානත ම රජු ලෙසින් සැළකිය හැකි වන්නේ පළමුවන පරාක්‍රමබාහු රජු ය. **දේශපාලනික ක්‍රියාකාරකම්** වාරි කර්මාන්ත ක්‍ෂේත්‍රය තුළ අමුණ ඉදිකිරීම සහ එය සංවිධානාත්මක ව ව්‍යාප්ත වීම කෙරෙහි බලපා තිබේ. දේශපාලන බලය තහවුරු කර ගැනීම, ජලය පාලනය කළ හැකි වීම, මධ්‍ය හා බාහිර පර්යන්තය අතර සම්බන්ධතාව ගොඩනැගීම, මහා සංස්කෘතිය හා ක්‍ෂුද්‍ර සංස්කෘතිය අතර සම්බන්ධතාව පවත්වාගෙන යෑම, ජන සම්බන්ධතාව වර්ධනය කරලීම සහ ජලයේ මූල්‍ය වටිනාකම හඳුනාගැනීම වැනි අංශ ඒ අතරින් වැදගත් වේ. ඒ අනුව පැහැදිළි වන්නේ වාරි කර්මාන්තය සංවර්ධනය කිරීම තුළින් දේශපාලනික වශයෙන් ස්ථාවර වීමට කටයුතු කිරීමේ ක්‍රියාවලිය තුළ ජල සම්පාදනයේ ප්‍රධාන වාරි තාක්‍ෂණික නිර්මාණයක් වශයෙන් අමුණේ දායකත්වය ඒ සඳහා ඍජුව ම ලැබී තිබෙන බවකි. ප්‍රධාන සහ උප ප්‍රධාන ජල මාර්ග හරස් කරමින් සහ අමුණු වැනි තාක්‍ෂණික නිර්මාණයක් උපයෝගී කරගනිමින් දුරස්ථ ජල ප්‍රභවයකින් ජලය ලබාගනිමින් ඉදි කළ වැව් ඔස්සේ ද ස්වාභාවික ජලයේ නතු බව රජය සතු කරගැනීමට කටයුතු කර තිබේ.

ක්‍රිස්තු වර්ෂාරම්භ වන විට ජලය යනු සීමිත සම්පතක් බව දේශපාලන ව්‍යුහය විසින් හඳුනාගනු ලැබ තිබිණ. මේ නිසා එය වර්තමානයේ මෙන් ම කිසියම් ආකාරයක ආර්ථික භාණ්ඩයක් බවට ද පත් වී තිබෙන බව පෙනේ. එබැවින් එම කාලයේ ජලයට මිලක් නියම කොට එය සුරැකීමේ ක්‍රමවේදයක් පැවති බව හඳුනාගත හැකි ය. ජලය භාවිතය වෙනුවෙන් අයකරන ලද දිය බද්දෙන් මේ බව තහවුරු වේ. එය අභිලේඛනවල **දකපති** (*Ic*. ii: 45, 78, 115). **දකපෙත** (*Ez*. iv: 14.3), **දකබක** (*Ic*. ii: 38), **දකබුක** (එම.; 79) සහ **දකබලි** (එම.; 14) යනුවෙන් සඳහන් ව තිබේ. වංසකථාවේ එම බද්ද **දිය භාගය** යනුවෙන් දක්වා තිබේ (*මව.* iiiv: 84-5).

පුරාණ ශ්‍රී ලාංකිකයන් වාරි කර්මාන්තයේ නියුතු වීම කෙරෙහි මූලික වූ ප්‍රධාන කාරණයක් ලෙස හඳුනාගත හැක්කේ මෙරට පැවති පාරිසරික හා දේශගුණික ගැටළු ය. මෙරට පැරණි ජනාවාස වඩාත් සාර්ථක ලෙස ව්‍යාප්ත වූ වියළි කලාපය ලෙසින් ව්‍යවහාර වෙන තැනිතලා භූමි ප්‍රදේශය ආශ්‍රිත ව මෙම ගැටළු විශාල වශයෙන් උද්ගත වී පැවතින. ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොලැබීම, ජල හිඟතාවය, වාෂ්පීකරණය ඉහළ මට්ටමක පැවතීම, අධික උෂ්ණත්වය, පරිසරයේ වියළි ස්වභාවය, දැඩි වියළි සුළඟ, ස්වභාවික ජල මූලාශ්‍රවල හිඟ බව, ස්වභාවික ජල මාර්ග අවම වීම හා පවතින ජල මාර්ගවල ජලය ප්‍රමාණවත් නොවීම වැනි ස්වභාවධර්මයේ ක්‍රියාකාරීත්වය මත පදනම් වූ ගැටළු රැසක් මෙම කලාපය ආශ්‍රිත ව පැවති බව හඳුනාගත හැකි වේ. මෙම කලාපයේ විවිධ ප්‍රදේශවල වාසය කරන ජනතාවගේ ආර්ථික ක්‍රියාකාරීත්වයන්ගේ වෙනස මත සහ තම ජීවිතය කෙරෙහි බලපානු ලබන වියළි හා ශුෂ්ක භාවයේ හානි අවම කර ගැනීම පිණිස ඔවුන් විසින් අනුගමනය කරනු ලැබූ වාරි තාක්ෂණයේ විවිධත්වය හේතුවිය. මෙම අදහස වියළි කලාපීය පුරාතන සමාජය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ ඒ පිළිබඳව පුරාතන මානව සංජනනය අතර පුළුල් විවිධත්වයක් නොපවතින්නට ඇති බවය. එම සමාජයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාවලිය සෑම කල්හිදීම ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය මත ගොඩනැගී තිබීම, එවැනි විවිධත්වයක් නොදැකීමට හේතු වන්නට ඇත. මේ නිසා වියළි කලාපීය පුරාතන ජනපදිකයින්ට වුවමනා වූයේ තම ප්‍රධාන අර්ථ ක්‍රමය වූ කෘෂිකාර්මික කටයුතු කෙරෙහි බාධා පමුණුවන වියළි හා ශුෂ්ක භාවය මගින් එල්ල කරන්නා වූ අභියෝගතාවය ජයගැනීම පිණිස විසඳුම් සෙවීම ය. වැව් අමුණු පදනම් කරගත් වාරි කර්මාන්තය බිහිවන්නේ එහි ප්‍රතිඵල ලෙසිනි.

පුරාණ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල සම්පාදන ක්‍රමවේදයක් ලෙස හඳුනාගත හැකි වැව් අමුණු නිර්මාණය වීම කෙරෙහි මෙම පාරිසරික හා දේශගුණික ගැටළු ඇතුළත් වන ස්වභාවික ක්‍රියාකාරීත්වයන් බලපා තිබෙන බව පැහැදිලි ය. මෙම අභියෝගතාවයන්ට මුහුණ දීම පිණිස වැව් අමුණු ඉදිකරලීම සඳහා පුරාතන ජනතාවට මෙන් ම දේශපාලන අධිකාරියට යොමු වීමට සිදුවන්නට ඇත්තේ දුරස්ථ ජල සම්පාදනයේ ප්‍රධාන කාර්යය භාරයක් එමගින් ඉටුකරන බැවිනි.

තාක්ෂණය සෘජුව හා වක්‍රව මිනිසාගේ ජීවන ක්‍රියාවලිය සමඟ සම්බන්ධ වූවකි. එය ඔවුන්ගේ සම්පත් පරිහරණය හා නිර්මාණයන් කෙරෙහි බලපාන්නා වූ ප්‍රධාන සාධකයක් විය. විශේෂයෙන් ම මිනිසා විසින් තම අවශ්‍යතාවන් සපුරා ගැනීම උදෙසා සිදු කළ ස්වභාවික සම්පත් පරිහරණය වර්ධනය වීම කෙරෙහි තාක්ෂණය අත්පත් කරගැනීම සෘජුව ම බලපා තිබෙන බව හඳුනාගත හැකි ය. මුල් කාලීන ජන සමාජ හා ස්වභාවික පරිසරය අතර වූ අන්‍යෝන්‍ය පැවැත්ම සඳහා උවමනා වූ සහජීවන සම්බන්ධතාවය අංශ ගණනාවක් තුළින් ඉදිරිපත් වූ අතර තාක්ෂණය අත්පත් කර ගැනීම යන කාරණය එහි දී වැදගත් වූ සංකල්පයක් විය.

කෘෂිකර්මාන්තය ප්‍රාථමික තාක්ෂණයක සිට උසස් ක්‍රමවේදයන් දක්වා වර්ධනය වීම පිළිබඳ සාක්ෂි ලෝකයේ පුරාතන සමාජ ඇසුරින් හඳුනාගත හැකි ය. කෘෂිකර්මාන්තය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ජලය සම්පාදනය කර ගැනීම පිණිස ක්‍රමවේදය තාක්ෂණික වශයෙන් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස ලොව පුරා විවිධාකාර ස්වරූපයෙන් යුතු වාරි කර්මාන්තයන් ඒ ඒ ප්‍රදේශයන් හි භූ පාරිසරික රටාවට අනුකූල වන පරිදි ගොඩනගා ගැනිණ. ශ්‍රී ලංකාවේ ජලාශ්‍රිත සමාජය බිහිවන්නේ ද වාරි කර්මාන්තය සම්බන්ධයෙන් වන තාක්ෂණය අත්පත් කර ගැනීම තුළ බව පැහැදිලි ය. වාරි කර්මාන්තයේ ප්‍රධාන නිර්මාණයන් ලෙස සැළකෙන වැව හා අමුණ බිහිවීම කෙරෙහි පූර්ව ඓතිහාසික අවධියේ සිට සිදු වූ තාක්ෂණයේ වර්ධනය සෘජුව ම බලපා තිබේ. වැව් තැනීම සඳහා යෝග්‍ය භූමි හඳුනා ගැනීම, වැව් බැම්ම හා වැවේ ජල

කළමනාකරණයට අවශ්‍ය අංගෝපාංග තැනීම ආදී කටයුතු සඳහා පමණක් නොව වැව ඇතුළු විවිධ ක්ෂේත්‍රවලට ජලය හරවා යැවෙන අමුණ ඉදි කිරීම සම්බන්ධයෙන් වන තාක්ෂණය පිළිබඳ වඩාත් විධිමත් පරිචයක් මේ යුගයේ දී ලබාගන්නට ඇති බව පැහැදිළි වන්නේ ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවස වන විට මහා පරිමාණ වාරි කර්මාන්ත ආරම්භ වූ බවට වංසකතා සහ අභිලේඛන මගින් කරුණු අනාවරණය වීම නිසා ය (*පූව.* 18; *රාව.*: 44; *Ic*. Vol. ii: No. 01).

ආරම්භක අවධියේ දී ප්‍රාථමික තාක්ෂණය හා ක්‍රමවේද භාවිත කරමින් ඉදි කළ වාරි කර්මාන්ත, ක්‍රිස්තු වර්ෂාරම්භය වන විට මහා වාරි කර්මාන්ත ඉදිකිරීමේ තාක්ෂණය හඳුනාගැනීම දක්වා වර්ධනය වී තිබේ. ඒ සඳහා පෙළඹීම පිණිස ප්‍රධාන වශයෙන් බලපාන්නට ඇති කාරණය වන්නේ ලෝහ තාක්ෂණය තුළ වානේ මෙවලම් භාවිතයට පැමිණීම බව පැහැදිළි ය.

වාරි කර්මාන්ත නිර්මාණය කිරීමට හේතු වූ තවත් තාක්ෂණික වර්ධන තත්ත්වයන් කිහිපයක් හඳුනාගත හැකි ය. ඒවා තාක්ෂණය භාවිත කිරීම සම්බන්ධයෙන් වන විවිධාකාර මැදිහත්වීම් ලෙසින් පැහැදිළි කරගත හැකි වේ. වාරි කර්මාන්ත ඉදිකිරීම සඳහා යෝග්‍ය භූමිය තෝරා ගැනීම පිළිබඳ දැනුම, සැළසුම් කිරීම පිළිබඳ අවබෝධය, ඉදිකිරීම් මාධ්‍යය තෝරා ගැනීම සම්බන්ධයෙන් පවතින පරිචය, වාරි නිර්මාණයේ  ශක්තිය පවත්වා ගැනීම පිළිබඳ තාක්ෂණික දැණුම, වැව හෝ අමුණේ ජලය අදාල ක්ෂේත්‍ර වෙත යොමු කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් වන මිණුම් පිළිබඳ අවබෝධය සහ වාරි කර්මාන්ත ඉදිකිරීමට අවශ්‍ය සම්පත් ක්ෂේත්‍රය වෙත ප්‍රවාහනය පිළිබඳ ඥාණය පුරාණ වාරි නිර්මාණ ශිල්පීන් තුළ පැවති තාක්ෂණික හැකියාව පෙන්නුම් කරන ක්ෂේත්‍ර ලෙස හඳුනාගත හැකි ය (විතානාච්චි 2014). වැව් අමුණ ඉදිකරනු ලබන ස්ථානයේ සිට ඇළ වේලි යොදමින් අවශ්‍ය ස්ථාන කරා ජලය ලබා දීමට වුවමනා භූමි මිණුම් මට්ටම් සකසා ගැනීම සඳහා පැරණීනන් භාවිත කළ මිණුම් ක්‍රම ඉතාමත් ම නිවැරදි බව දැදුරු ඔය ආශ්‍රිත රිදීබැඳි ඇල්ල හෙවත් පුරාතන සූකර නිජ්ජර අමුණේ ජලය ඇළ මාර්ග වෙත යොමු කිරීම සඳහා භාවිත කළ පුරාණ මිණුම් මට්ටම් සමඟ එම ස්ථානය සම්බන්ධයෙන් වර්තමානයේ ලබාගත් මිණුම් සමඟ සැසඳීමෙන් ද කලා වැවෙන් ජලය අනුරාධපුරය වෙත ගෙන ගිය ජය ගඟ හෙවත් පුරාණ යෝධ ඇළ මගින් ද තහවුරු වේ.

අපගේ පැරණි උරුමයක් ලෙස ශ්‍රී ලංකාවට ආවේණික වූ දේශීය වාරි ක්‍රමයක් බිහි කිරීමෙහි ලා භාවිත කරනු ලැබූ තාක්ෂණය හා ශිල්ප ක්‍රම සම්බන්ධයෙන් වූ දැනුම පෙන්වා දීමට පුළුවන. දියුණු තාක්ෂණයෙන් අනූන එවැනි ඉදිකිරීම් සඳහා අවශ්‍ය වූ දැනුම හා මානසික ශක්තිය පුරාණ දේශීය ජනතාවට තිබිණ. **අරමුණ ඉටුකර ගැනීම තුළින් අපේක්ෂිතාර්ථය සපුරාගැනීම** යන සංකල්පය වඩාත් සංවිධානාත්මක ලෙසින් ඉස්මතු වූ අවස්ථාවක් ලෙස පැරණි වාරි කර්මාන්තය දැක්වීමට පුළුවන. වාරි ක්‍රමයක් තීරණය කිරීමේ දී අවශ්‍යතාව තේරුම් ගැනීමේ නෛසර්ගික හැකියාවන් පැරණි දේශීය වාරි නිර්මාණ ශිල්පීන් සතු විය. එය අත්දැකීම් මත ලබාගත් ප්‍රායෝගිකත්වය පිරි හැකියාවක් ලෙස හඳුන්වාදිය හැකි ය.

වාරි කර්මාන්ත සඳහා භූමිය තෝරා ගැනීමේ දී එහි ජලය අදාල ක්ෂේත්‍ර වෙත යොමු කිරීමේ හැකියාව කෙරෙහි ද සැළකිලිමත් වී තිබෙන බව හඳුනාගත හැකි ය. වාරි නිර්මාණයක ශක්තිමත් බව, කල්පැවැත්ම හා එහි කාර්යක්ෂමතාව උපරිම මට්ටමින් පවත්වාගෙන යෑම සඳහා එහි නිර්මාණාත්මක ස්වභාවය හා සැලසුම්කරණය ක්‍රමානුකූල විය යුතු බව පුරාණ වාරි නිර්මාණ ශිල්පීන් වටහාගෙන තිබිණ. ඒ අතරින් වඩාත් වැදගත් වන්නේ ස්ථානයට ගැලපෙන්නා වූ රටාවක් තුළ වාරි කර්මාන්තයක සැළසුම්කර තිබීම ය.

**වැව හෝ අමුණ ඉදිකිරීමට යෝජිත ස්ථානයේ භූමියේ ස්වභාවය, ජල ප්‍රභවයේ ස්වභාවය, ජල ප්‍රවාහයේ වේගය හා බෑස්මේ ස්වභාවය**

වාරි කර්මාන්තයේ ප්‍රභවය සම්බන්ධයෙන් මෙතෙක් සිදු කරනු ලැබූ පර්යේෂණවලට අනුව ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පුරාණ වාරි කර්මාන්ත එක් එක් කාලවකවානු හි පැවැති සමාජ සංස්කෘතික අවධිවල පැවැති ජනාවාස රටාවේ ව්‍යාප්තියේ ස්වභාවය මත විවිධ වර්ධනීය තත්ත්වයන් අත්කරගත් බව හඳුනා ගැනීමට පුළුවන. එම වර්ධනීය ක්‍රියාවලිය සංකල්පීය ආකෘතියක් වශයෙන් අදියර කිහිපයක් ඔස්සේ ගොඩනැගීමේ හැකියාව පවතී.

**ප්‍රාරම්භය**

මෙතෙක් සිදු කළ පර්යේෂණ මගින් අනාවරණය කරගත හැකි වූ තොරතුරු අනුව පැහැදිළි වන්නේ වාරි කර්මාන්තයේ ආරම්භය මෙරට පූර්ව ඓතිහාසික අවධිය තෙක් දිවයන්නට ඇති බවයි. මෙරට වියළි කලාපය ආශ්‍රිතව ස්ථාවර ජනාවාස ගොඩනගා ගත් බවට සාක්ෂි හඳුනාගත හැකි ස්වදේශික ප්‍රාථමික ග්‍රාමීය ජනතාව කෘෂිකාර්මික කටයුතු කරගෙන යෑම පිණිස අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග අතර ස්වභාවික ජල මාර්ග ආශ්‍රිත ව අර්ධ ස්ථාවර ද්‍රව්‍ය භාවිතයෙන් සකසන ලද විශාල නොවූ තාවකාලික අමුණු (අමුණු වැටි) භාවිතය හඳුනාගත හැකි ය. මෙමගින් අවට සීමිත වපසරියකට ජලය ලබාගත් බව පැහැදිළි ය.

පූර්ව ඓතිහාසික ජනාවාස පිළිබඳ සාක්ෂි හමුවන යාන් ඔය, මල්වතු ඔය, කලා ඔය, දැදුරු ඔය, කිරිඳි ඔය, මැණික් ගඟ, කුඹුක්කන් ඔය හා අඹන් ගඟ ආශ්‍රිත භූමි ප්‍රදේශයන් හි හඳුනාගත හැකි මූල ඓතිහාසික ජනාවාස පිළිබඳ සුසාන භූමි සාක්ෂි අනුව නිගමනය කළ හැකි වන්නේ (Seneviratne 1984: 240-62; සේනානායක 1993: 07; Somadewa et al. 2008: 13; වාච්චගේ සහ විතානාච්චි 2008: 293-96; විතානච්චි 2009b: 1-5; ජයරත්න 2011: 99-102; විතානච්චි 2012: 43-64) එම ජල මාර්ග හා ඒවාට සම්බන්ධ වන අතු ගංගා ආශ්‍රිතව සිදු කරනු ලැබූ කෘෂිකර්මාන්තය සඳහා භාවිත කරනු ලැබූ ප්‍රාථමික වාරි කර්මාන්තය තුළ වැව් අමුණුවල ප්‍රභවය ද සිදුවන්නට ඇති බවයි. ප්‍රාථමික වාරි කර්මාන්ත භාවිතයේ පැවැති සාර්ථකත්වය ජනතාව ගංගා නිම්නාශ්‍රිතව තවදුරටත් ස්ථාවරව රැඳී සිටීමටත්, ව්‍යාප්ත වීමටත් හේතු වන්නට ඇත. විශේෂයෙන් ම ප්‍රාථමික ජනාවාස කිහිපයක් ඒකාබද්ධව නිර්මාණය වන **මහාගාම සංකල්පය**, පොකුරු ජනපද ආශ්‍රයෙන් කළඑළි බැසීම මෙම නිම්නාශ්‍රිතව සිදු වී තිබේ. යාන් ඔය නිම්නය ගත් කළ අපට හඳුනා ගත හැක්කේ මුළු සාර්ව නිම්නය පුරාම පොකුරු ජනපද පිහිටා තිබුණු ආකාරයකි. මෙම නිම්නය තුළ ස්ථාපිතව තිබෙන පූර්ව ඓතිහාසික සුසාන භූමිවල වපසරිය හා ඒවායෙහි මිහිදන් කර ඇති මළවුන්ගේ ප්‍රමාණය පිළිබඳ සැළකිල්ලට ගැනීමේ දී විශාල ජනතාවක් යාන් ඔය නිම්නයේ ජීවත් වූ බව පැහැදිළි ය. විශේෂයෙන් ම එවැනි ජනතාවකට භූ පතන සහිත භූ රූපණය පදනම් කොට නිර්මාණය කරන කුඩා වාපි මගින් සපයන ජලය පරිභෝජනයට මෙන් ම කෘෂි කර්මාන්තය සඳහා ප්‍රමාණවත් නොවන බැවින් අතිරේක ජල සම්පාදනය පිණිස අමුණෙහි මූලික සංකල්පය ඃජරසප්රහ ජදබජැචඑ* පූර්ව ඓතිහාසික මුල් යකඩ යුගයේ කළඑළි බසින්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

**දේශපාලන ක්‍රියාවලියේ මැදිහත් වීම**

වියළි කලාපය ආශ්‍රිත ව ජනාවාස ව්‍යාප්ත වීම ගංගා නිම්නවල වඩාත් ඈත ප්‍රදේශ දක්වා සිදු වීම පිටත භූ කලාප ජනාවාසකරණයට ලක් වීම හෙවත් පර්යන්ත ජනාවාසකරණය ලෙසින් හඳුනාගත හැකි ය. මෙම ජන ප්‍රසාරණ ක්‍රියාවලිය මෙරට ජන සමාජයේ සංවිධානාත්මක බව පෙන්නුම් කරන ප්‍රධාන අවස්ථාවක් ලෙසින් හඳුනා ගැනීමට පුළුවන. වියළි කලාපය තුළ හඳුනා ගත හැකි සමකාලීන ශිලා ලේඛනවල ව්‍යාප්තිය මඟින් පෙන්නුම් කරනු ලබන්නේ මෙම අවස්ථාව බව පැහැදිළි ය. ඒ සඳහා ඒ වන විට ගොඩනැගී පැවැති දේශපාලන ක්‍රියාවලිය සෘජුව ම සම්බන්ධ වී තිබෙන බව හඳුනා ගත හැකි වේ.

මෙලෙස ව්‍යාප්ත වූ නව ජනාවාසයන් හි කෘෂි කාර්මික හා අනෙකුත් අවශ්‍යතාවන් පෙරට වඩා සංකීර්ණ ස්වරූපයන්ගෙන් ඉදිරිපත් වන්නට ඇති අතර, ජල සම්පාදන ක්‍රියාවලිය තුළ ගොඩනැගෙන වාරි කර්මාන්තය ද නව මුහුණුවරකින් ඉදිරිපත් වන බව පැහැදිලි ය. ඒ වනවිට ක්‍රියාත්මකව පැවති කුඩා වාපි ආශ්‍රිත ජලය ප්‍රමාණවත් නොවීම තුළ වැව ප්‍රමාණයෙන් විශාල වීම හා සංඛ්‍යාත්මකව වැව් ප්‍රමාණය ඉහළ යාම ක්‍රිස්තු වර්ෂාරම්භය වන විට සිදු වී තිබේ. ජල පරිභෝජනය වැඩි වශයෙන් සිදු වීම හේතුවෙන් වාපි ජලය ප්‍රමාණවත් නොවීම තුළ විකල්ප ජල සම්පාදන ක්‍රමයක් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම ක්‍රිස්තු වර්ෂාරම්භක කාල සීමාව තුළ හඳුනා ගත හැකි විශේෂත්වයක් විය. ඒ අනුව වැව් අමුණ වඩාත් ප්‍රායෝගික ලෙස වාරි ජල සම්පාදන ක්‍රම ලෙසින් මෙරට සමාජ ගත වීම ආරම්භ වී ඇත. වාරි කර්මාන්ත භාවිතය පිළිබඳ සඳහන් වන සමකාලීන සෙල් ලිපි තොරතුරු හා වංසකතාගත කරුණු මගින් මෙම කාරණය තවදුරටත් තහවුරු කරගැනීමේ හැකියාව පවතී. ඉන් පැහැදිලි වන්නේ මෙම කාලය තුළ වැව් අමුණු ඉදිකිරීම හා භාවිතය දේශපාලන ක්‍රියාවලිය තුළ රාජ්‍යය මැදිහත් වීම මත මෙරට පොදු වාරි කර්මාන්තය සමග සම්බන්ධ වී තිබෙන බවයි.

දේශපාලනික නායකත්වයත්, තාක්‍ෂණයේ වර්ධනයත් සම්බන්ධ වීම තුළ එතෙක් ග්‍රාමීය වශයෙන් හුදකලා අරමුණු මත කේන්ද්‍රගත වූ තාවකාලික හෝ අර්ධ ස්ථාවර වාරි කර්මාන්ත වෙනුවට ස්ථාවර අමුද්‍රව්‍ය වන පාෂාණ වැනි මාධ්‍ය භාවිතයෙන් පොදු අරමුණු සමග බද්ධ වූ විශාල ප්‍රමාණයේ වාරි කර්මාන්තයක ඉදිකිරීම ආරම්භ වී තිබේ. සමීපගත භූමියට අමතරව වඩා දුර බැහැර භූමි කරා ජලය සම්පාදනය කිරීමට මෙම කාලය තුළ කටයුතු කර ඇත. එහි ප්‍රතිඵල ලෙස වැව් අමුණ සමග බද්ධ වන මහා පරිමාණ ඇළ වේලි නිර්මාණය සංවිධානාත්මකව ආරම්භ වී තිබේ.

**වාරි පද්ධතියක සම්බන්ධතාව ගොඩ නැගීම**

ක්‍රිස්තු වර්ෂ හයවන සියවස පමණ වන විට මෙරට වියළි කලාපීය වාරි කර්මාන්තය පද්ධතියක් ලෙස සකස් වීම ආරම්භ වී තිබේ. මේ වන විට වාරි කර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරී තාක්‍ෂණික අංග ලෙස වැව් අමුණ වටහාගෙන තිබීමත්, එහි තාක්‍ෂණික අංශය දියුණුවට පත්වීමත් තුළ වියළි කලාපීය වාරි කර්මාන්තය අන්තර් නිම්න ඒකාබද්ධ වූ වාරි පද්ධතියක් බවට පත්වීම කෙරෙහි ප්‍රබල දායකත්වයක් එමගින් සපයා තිබෙන බව හඳුනා ගත හැකි ය.

ක්‍රිස්තු වර්ෂ හයවන සියවසේ පසුභාගය වන විට අනුරාධපුර රාජධානිය ආශ්‍රිතව විවිධ සම්පත් භාවිතය සක්‍රීය ලෙස ඉහළ යාමත්, වෙළඳාම වැනි ආර්ථික ක්‍රියාකාරකම් හි වර්ධනයත් වැනි හේතුන් මත අනුරාධපුරය කේන්ද්‍රකර ගනිමින් මධ්‍ය ප්‍රදේශය ආශ්‍රිතව නාගරික ජනගහනය වර්ධනය වීම හා පර්යන්ත ප්‍රදේශවල ජනාවාස තවදුරටත් ව්‍යාප්ත වීම තුළ එක් නිම්නයකින් සපයාගන්නා ජලය එම නිම්නය පෝෂණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අතිරේක ජල සම්පාදනය සඳහා අන්තර් නිම්න බද්ධ කරමින් වාරි කර්මාන්ත ජාලයක් ගොඩනගන ලදී. මල්වතු ඔය, කලා ඔය නිම්න සඳහා බාහිර නිම්නවලින් අතිරේක ජලය ලබා ගැනීම තුළ අනුරාධපුර මධ්‍ය කේන්ද්‍රය පෝෂණය කිරීමට කටයුතු කර තිබේ. අනුරාධපුර නාගරික වැව් පදනම් කොටගෙන ජනගහන වර්ධනය සිදු වී තිබීම නිසා එම ජනතාවගේ අවශ්‍යතාවන් උදෙසා අනුරාධපුර නාගරික ප්‍රදේශය වෙත අතිරේක ජල සම්පාදනය කිරීමට හේතු වී තිබෙන බව පැහැදිලි ය. ඒ සඳහා අන්තර් නිම්න ජල සම්පාදනය වැව සහ අමුණු පදනම් කරගනිමින් සිදු කොට ඇත.

පළමුවන පරාක්‍රමබාහු රජු විසින් අනුගමනය කළ වේගවත් දේශපාලනික හා ආර්ථික ක්‍රියාවලිය තුළ විවිධ ක්ෂේත්‍රවල සිදු වූ වේගවත් වර්ධනය වාරි කර්මාන්තය කෙරෙහි ද බලපා තිබේ. මෙහි ප්‍රතිඵල ලෙස වැව් අමුණු ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම වේගවත් විය.

අනුරාධපුර මධ්‍ය භාගය වන විට අත්කොටගෙන තිබූ වාරි කර්මාන්තයේ දියුණුව කෙරෙහි සක්‍රීය දායකත්වයක් සැපයූ වැව සහ අමුණ මෙම අවධිය තුළ යළිත් වාරි කර්මාන්තයේ වර්ධනය සඳහා ඉතා වැදගත් තාක්ෂණික නිර්මාණයක් බවට පත්වී ඇත.

**සමාලෝචනය**

පුරාවිද්‍යාව මගින් සමාජය විග්‍රහ කිරීමේ දී තනි තනි සිදුවීම් හා ඒවා අතර පවතින්නා වූ අන්තර් සම්බන්ධතාවයන් තේරුම් ගැනීමට උත්සහ කරනු ලබයි. එවැනි සිදුවීම් එලෙස ක්‍රියාත්මක වීමට බලපෑ හේතු කාරණා කවරේ ද යන්න සම්බන්ධයෙන් අනුමානයන්ට එළඹීම ද එමගින් අපේක්ෂා කළ හැකි ය. ඒ අනුව තනි ප්‍රපංචයක් ලෙසින් මෙන් ම සමූහයක් වශයෙන් ඒකරාශීව ගොඩනැගී තිබූ සමාජීය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු ය. එය පැහැදිළි කිරීමෙන් ඔබ්බට යා යුතු ක්‍රියාවලියකි. දැනුම ගොඩනැගීමේ දී, ගොඩනගා ගත් දැනුමේ වලංගු බව සහ විශ්වාසනීය බව තහවුරු කිරීමට එම දැනුම වාස්තවික :ධඉවැජඑසධැ* විය යුතු වේ. ඒ අනුව පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ අපගේ අරමුණ විය යුත්තේ අප ක්‍රියාත්මක වන යථාර්තයේ පවතින්නා වූ සුවිශේෂී බව තේරුම් ගැනීමයි. ඒ සඳහා විවිධ වූ න්‍යායාත්මක ප්‍රවේශයන් තුළ ප්‍රස්තුතයන් විග්‍රහ කිරීමේ හැකියාව පැවතිය යුතු ය. පුරාණ වාරි කර්මාන්තය තුළ වැව් අමුණු භාවිතය සම්බන්ධයෙන් සිදු කරනු ලබන පුරාවිද්‍යාත්මක විමර්ශනය තුළ සෑම සමාජ සංවිධානයක් ම ඒවා ක්‍රියාත්මක වන පරිසරයේ බලපෑම්වලට යටත් වන බව නිරීක්ෂණය කළ හැකි විය. එහි බලපෑම්වලින් සමාජයේ පැවැත්මට කිසියම් බාධාකාරී තත්ත්වයක් ඇති වේ නම් ඉන් මිදීමේ අරමුණින් අනුගමනය කරන ලද විවිධ ක්‍රියාමාර්ග තුළ වාරි කර්මාන්ත ගොඩනැගී තිබේ. මෙරට වාරි පද්ධතිය බිහිවන්නේ ද ජල හිඟතාව හා වියළිභාවය යන පාරිසරික බලපෑම්වලින් මිදීමට ගත් උත්සහායක ප්‍රතිඵල ලෙසිනි. එසේ වුවද වාරි කර්මාන්තයට පරිසර පද්ධතියෙන් බැහැරව ස්වාධීන ලෙස ක්‍රියාත්මක වීමට අවකාශ නොලැබේ. එයට හේතුව වන්නේ වාරි පද්ධතිය ක්‍රියාත්මක වීමට අවශ්‍ය ජලය පරිසරයෙන් ලැබෙන ස්වභාවික සම්පතක් වන බැවිනි. පරිසර පද්ධතිය තුළ පවතින්නා වූ වර්ෂාව ජලය සපයන ප්‍රධාන ක්‍රමවේදය වන අතර වර්ෂාව ලැබීමට හේතු වන සුළං, උෂ්ණත්වය, උත්ස්වේදනය හා ගහකොළ වැනි සාධක ද ක්‍රියාත්මකව පවතින්නේ පාරිසරික සාධක වශයෙනි.

වාරි කර්මාන්තය මගින් සිදු කරනු ලබන්නේ පරිසර පද්ධතිය මගින් ලබාගන්නා ජලය සමාජ පද්ධතිය තුළ ගොඩනැගෙන වාරි නිර්මාණ මගින් ජන අවශ්‍යතාවන් සඳහා යොමු කරලීම ය. ඒ අනුව වාරි කර්මාන්තය මගින් පරිසර පද්ධතිය හා සමාජ පද්ධතිය අතර අන්තර් සම්බන්ධතාවක් ගොඩනැගෙන බව පැහැදිළි ය. මෙයට පරිසර පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ජල චක්‍රය ද සම්බන්ධ වන බව හඳුනා ගත හැකි වීමෙන් ඉහත අදහස තවදුරටත් තීව්‍ර කරගත හැකි ය. මෙරට වියළි කලාපයේ ජනාවාස බිහිකරගත් ජන කණ්ඩායම්වලට සිදු වූයේ එකී පරිසර පද්ධතියට ගැලපෙන ලෙසින් අනුගත වීම ය. එහි දී ඔවුහු පාරිසරික අභියෝගතාවන්ට මුහුණදීමේ ප්‍රතිඵලයක් ලෙස වාරි නිර්මාණ තවත් පාරිසරික සාධකයක් වන භූමියේ පිහිටීම මත ගොඩනගමින්, භූමිය මත සිදු කරනු ලැබූ පරිවෘත්තීය ක්‍රියාවලි ඇසුරින් භූමියට අනුගත වීමක් හා භූමිය තමාට අනුගත කර ගැනීමක් සිදු කොට තිබෙන බව පැහැදිළි ය.

වාරි කර්මාන්තය ජනාවාසකරණය සමඟ ඍජුව ම බද්ධ වූ ක්‍රියාවලියකි. කිසියම් පරිසරයක ජනාවාසයක් බිහිවනුයේ ඔවුනගේ ජීවනෝපාය සාර්ථක ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය භෞතික හා පාරිසරික සම්පත් තිබේ නම් පමණි. ජීවනෝපාය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ දී තාක්ෂණය හා ඒ සඳහා වන සම්පත් භාවිතය අවශ්‍ය විය. එය සාමාජීය පරිවෘත්තීය ප්‍රවේශය මගින් ගොඩනගනු ලබන ඓන්ද්‍රික ප්‍රතිසාම්‍යතාවය හෙවත් වස්තූන් දෙකක සමානතාවය හා සම්බන්ධතාවය හඳුනා ගැනීම තුළින් ඉදිරිපත් වූවක් ලෙස පෙනේ. ආරම්භක

අවධියේ ඉතා කුඩා ග්‍රාමීය වැව් හා අමුණු වැටි ඉදිකිරීමෙන් ආරම්භ වන මෙම ක්‍රියාවලිය ක්‍රමයෙන් ඉතාමත් දියුණු තාක්ෂණයෙන් අනූන විශාල වාරි කර්මාන්ත දක්වා වර්ධනය කරගැනීමට සමත් වූවා පමණක් නොව එය **වාරි පද්ධතියක්** (Irrigation system) ලෙස සංවර්ධනය කරගැනීමට සමත් වීම තුළින් මෙම ඓතිහාසික ප්‍රතිසාමාන්‍යතාවය තහවුරු කෙරෙන බව පැහැදිළි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


**ප්‍රාථමික මූලාශ්‍රයයෝ**

***පූජාවලිය 1,*** 1998., සංස්. ඒ. වී. සුරවීර, එච්. ඒ. පී. අභයවර්ධන, ආර්. පතිරණ, කොළඹ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

***මහාවංසය*** (සිංහල), 1967, සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව.

***රාජාවලිය 2,*** 1997, සංස්, ඒ. වී. සුරවීර. කොළඹ, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

***Epigraphia Zeylanica Vol. iv.,*** 1943, eds. S. Paranavitana, London, Published for the Government of Ceylon, Oxford University Press.

***Epigraphia Zeylanica Vol. v. Part. i.,*** 1955, eds. S. Paranavitana, Archaeological Survey of Ceylon.

***Inscription of Ceylon Vol. i. Part. i.,*** 1970, eds. S. Paranavitana, Colombo, Department of Archaeology.

***Inscription of Ceylon Vol. ii. Part. i.,*** 1983, eds. S. Paranavitana, Colombo, Department of Archaeology.

**ප්‍රාථමික මූලාශ්‍රයයෝ**

ජයරත්න, ඩී.කේ., 2011, ශ්‍රී ලංකාවේ මුල් යකඩ යුගයේ පුරාවිද්‍යාවථ ඉහළ කලවැල්ලා උල්පත සුසානය ඇසුරින්, ***පුන් කළස, ජාතික පුරාවිද්‍යා සමුළුව***, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවඃ 99-102 පිටු.

වාච්චගේ, එස්., සහ විතානාච්චි, සී. ආර්., 2008. සියඹලාගස්වැව මෙගලිතික සුසාන භූමිය ආශ්‍රිත මූලික ගවේශනය, ***ජාතික පුරාවිද්‍යා සමුළුව***, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවඃ 293-296 පිටු.

විතානාච්චි, සී. ආර්., 1999ල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන ඇසුරින් අනාවරණය වන පුරාණ ලංකාවේ ස්ථාන හා ග්‍රාම නාම "***Studies in Humanities, Journal of the Dept. of Humanities***. Rajarata University of Sri Lanka, Vol. i, No. i: 89-106 පිටු.

විතානාච්චි, සී. ආර්., 2009, සන්දනම්කුලම ඉට්ටිකට්ටිය මෙගලතික සුසාන භූමිය ආශ්‍රිත මූලික ගවේෂණය, ***ජාතික පුරාවිද්‍යා සමුළුව*** , පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවඃ 1-5 පිටු.

විතානාච්චි, සී. ආර්., 2012, මූල ඓතිහාසික අවධිය, ***ශ්‍රී ලාංකේය ඉතිහාසය,*** වෙළුම i, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 43 - 64 පිටු.

විතානාච්චි, සී. ආර්., 2012, පුරාණ වාරි මාර්ග විකාශය හා පරාක්‍රම සමුද්‍රය, ***ශ්‍රී ලාංකේය ඉතිහාසය,*** වෙළුම ii, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 355-380 පිටු.

සේනානායක, පී., 1993, ***වයඹ පළාතේ සංස්කෘතික දායාද***, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Iyer, R.R., 2003, ***Water perspectives, issues, concerns***, New Delhi, Saga Publication India Pvt. Ltd.

Senavirathna, S., 1984, The archaeology of the Megalithic-Black and Red Ware complex in Sri Lanka. ***Ancient Ceylon, The journal of the archaeological Department of Sri Lanka***, Colombo, Vol.5: pp.237-307.

Somadewa, R., Dissanayake, R., Fernando, R., 2008 , The Galpaya Survey: Results of the first field season 2006***, Occasional paper No. 1,*** ed. Nimal De Silva, Raj Somadewa, Colombo, PGIAR, University of Kelaniya.

# ලේඛක වතගොත

| | |
|---|---|
| ආර්.එම් ඉෂිණි | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| කේ.ආර්.සී.එස්. කල්දේරා | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| අයි.ඒ.වී.පී. කුමාරි | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| බී.එස්.පී. කුමාරි | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| පී.බී.අයි.කේ කුසුම්ලතා | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| ඩී.ඩී.බී. ගිම්හානි | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| ඩී.ඒ.එම්.පී ගුණවර්ධන | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| එම්.පී.එන්.එන් ජයසිංහ | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| ජී.වී.ඕ. ජීවන්තක | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| එම්.ජී.ආර් තරුෂිකා | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| බී.එම්.ඒ. දනන්ජිත් | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| ඩී.ජී.ටී.ආර්. දන්දෙනිය | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |

| | |
|---|---|
| ඩී. එම්. වී. දිසානායක | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| ජී.පී.කේ. දිල්රංග | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| පී.ඩී.ජී. දිල්හාරා | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| ඊ.කේ.සී. පබසරා | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| අයි.ඒ.යූ. පුෂ්පමාලි | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| එස්.එන්.සී පෙරේරා | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| එම්.පී.එච් මදුෂිකා | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| ආර්.ඩබ්.සී. මධුෂානි | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| එම්.ඩී රණසිංහ | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| ආර්.එම්.යූ.එන් රත්නායක | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| කේ.පී.එච් රන්දික | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| යූ.සී ලත්හාරී | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| වයි.පී.එම්.එස්. වික්‍රමසිංහ | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |

| | |
|---|---|
| ඒ.එම්.එම්. වීරකෝන් | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| කේ.කේ.ජී.කේ.එම් සෙනරත් | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| පී.එම්.එස්. සෙනවිරත්න | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| එස්.ආර්.එල් සේනානායක | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| කේ.ඩී.සී. සෙව්වන්දි | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, සිව් වැනි වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. |
| ඒ.එම්.ජී.එච්.එම් හේමතිලක | ශාස්ත්‍රවේදී (ගෞරව) පුරාවිද්‍යා හා උරුම කලමනාකරණය, තෙවන වසර, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |

## පෙළගැස්ම


උපකුලපතිතුමියගේ පණිවිඩය iii

පීඨාධිපතිතුමාගේ පණිවිඩය iv

අංශාධිපතිතුමාගේ පණිවිඩය v

සභාපතිතුමියගේ පණිවිඩය vi

සංස්කාරක සටහන vii

පුරාණ ලක්දිව වාරි කර්මාන්තයේ සමාජ භාවිතය පිළිබඳ සංකල්පීය ආකෘතිය viii

ලේඛක වතගොත xviii

පෙළගැස්ම xxi

01. මහවැලි සංවර්ධන ව්‍යාපාරය හා මහවැලි එච් කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනය 1

ආර්. එම්. ඉෂිණි

02. අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය තත්කාලීන සමාජයේ තිරසාර සංවර්ධනය කෙරෙහි දායක වී තිබෙන ආකාරය පිළිබඳව විමසුමක් 7

කේ.ආර්.සී.එස්. කල්දේරා

03. වියළි කලාපීය වැව හා සබැඳි සාම්ප්‍රදායික රීති පද්ධතිය හා එහි වර්තමාන අනාගත ප්‍රවණතා 13

අයි.ඒ.වී.පී.කේ.කුමාරි

04. පුරාණ ලාංකේය වාරි තාක්ෂණ ක්‍රමවේදය සහ උපයෝගීතාවය 19

බී.එස්.පී.කුමාරි

05. අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය හා වාරි කර්මාන්තය 26

පී.බී.අයි.කේ. කුසුම්ලතා

06. පුරාණ වාරි කර්මාන්ත වපසරිය විශ්ලේෂණාත්මකව ප්‍රමාණය කිරීමට අභිලේඛන විද්‍යාත්මක සාධක සපයන දයකත්වය 32

ඩී.ඩී.බී. ගිම්හානි

07. ජෛව විවිධත්වය ආරක්ෂා කෙරෙමින් ගොඩ නැගුණු ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ජල කළමණාකරණය 38

ඩී. ඒ. එම්. පී. ගුණවර්ධන

08. පොළොන්නරුව ඇතුලු නගරයේ ජල කළමනාකරණය 44

එම්. පී. එන්. එන්. ජයසිංහ

09. අනුරාධපුර යුගයේ වාරි කර්මාන්ත ඇසුරෙන් ආර්ථිකය ගොඩනැගීම පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යනයක් 49

ජී.වී.ඕ. ජීවන්තක

10. පුරාණ සොරොව්ව පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යනයක් 55

එම්. ජී . ආර්. තරුෂිකා

11. දිගාමඩුලු සංවර්ධනයෙහිලා සේනානායක සමුද්‍රයේ දායකත්වය. 61

බී. එම්. ඒ. දනන්ජිත්

12. තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිවල පැවැත්ම කෙරෙහි පවතින අභියෝග 67

ඩී. ජී. ටී. ආර්. දන්දෙනිය

13. මල්වතු ඔය නිම්නයේ පුරාණ ජල කළමනාකරණය 70

ඩී. එම්. වී. දිසානායක

14. මූලාශ්‍රයන් මගින් හෙළිවන පුරාණ වාරි කර්මාන්තය හා බැඳුණු බෞද්ධාගමික සංස්කෘතිය 76

ජී. පි. කේ. දිල්රංග

15. රජරට වාරි පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ කාලීන අවශ්‍යතාවය හඳුනා ගැනීම. 82

පී.ඩී.ගෝතමී දිල්හාරා

16. වැවක පැවැත්ම කෙරෙහි වැව් බැම්මේ බලපෑම හා තාක්ෂණය පිළිබඳව විමර්ශනයක් 87

ඊ. කේ. සී. පබසරා

17. පුරාණ වාරි කර්මාන්තය හා සම්බන්ධ බදු හා නීතිරීති පිළිබඳව සිදු කරනු ලබන අධ්‍යයනයක් 93

අයි. ඒ. යූ. පුෂ්පමාලි

18. වාරි නිර්මාණවල පරිසරානුගත වීම පිළිබඳව පැරණි වැව් හා නූතන ජලාශ අතර සංසන්දනාත්මක විමසුමක් 99

එස්. එන්. සී. පෙරේරා

19. ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ සංවර්ධනයට යටත්විජිත අවධියේ දායකත්වය. 104

එම්.ජී.එච්. මදුෂිකා.

20. සාම්ප්‍රදායික වාරි ජල කළමනාකරණය 109

ආර්. ඩබ්ලිව්. සී. මදුෂානි

21. පුරාණ වාරි කර්මාන්තය හා තත්කාලීන දේශපාලනය 114

එම්. ඩී. රණසිංහ

22. දැදුරු ඔයේ අතු ගංගා ආශ්‍රිත වාරි ජල කළමණාකරණය 119

ආර්. එම්. යූ. එන්. රත්නායක

23. රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට වාරි කර්මාන්තයේ බලපෑමක් සිදුවීද...? 125

කේ.පී.එච් රන්දික

24. පරාක්‍රම සමුද්‍රයේ ජල කළමනාකරණය තුළින් අනාවරණය කරගත හැකි තත්කාලීන සමාජයේ තිරසාරත්වය. 131

යූ. චතුනි ලත්හාරි

25. රජරට ශිෂ්ටාචාරයේ වාරි පද්ධතියේ සංවර්ධනය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්. 137

වයි.පී.එම්.එස්.වික්‍රමසිංහ

26. ග්‍රාමීය වැව ආශ්‍රිත සමාජ උපයෝගීතාවය පිළිබඳ වූ අධ්‍යයනයක් (කරම්බන්කුලම ග්‍රාමය ඇසුරින්) 144

ඒ. එම්. එම්. වීරකෝන්

27. මින්නේරිය වැව ආශ්‍රිත ගොවි ජනපද ව්‍යාපාරය. 151

කේ.කේ.පී.කේ.එම් සෙනරත්.

28. වියළි කලාපය ආශ්‍රිත තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිය පිළිබඳ විමර්ශනයක්. 157

පී.එම්.එස්. සෙනෙවිරත

29. කුඩා වාපි සංස්කෘතිය හා බැඳි අභිචාර විධි (නුවර කලාවිය පුරාණ කුංචුට්ටු කොරළයේ වැව් ගම්මාන ඇසුරිනි) 163

එස්. ආර්. එල්. සේනානායක

30. ශ්‍රී ලාංකේය පැරණි වැව් ගම්මානවල සිදු කරන පාරම්පරික හා සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් පිළිබඳ විමසුමක්. 169

කේ. ඩී. සී. සෙව්වන්දි.

31. ශ්‍රී ලංකාවේ අතීත වාරි කර්මාන්තය තුළින් පිළිඹිබු වන භූගෝලීය පරිකල්පනය 175

ඒ.එම්.ජී.එච්.එම්. හේමාතිලක

## 01. මහවැලි සංවර්ධන ව්‍යාපාරය හා මහවැලි එච් කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනය

ආර්. එම්. ඉෂිණි

### හැඳින්වීම

ඈත අතීතයේ පටන් ශ්‍රී ලංකාව සාම්ප්‍රදායික කෘෂිකාර්මාන්තයෙන් පෝෂිත රටක් වූ බව ශ්‍රී ලංකාවේ ඓතිහාසික තතු අධ්‍යනයේ දී සනාථ වී ඇත. රටේ එම ස්වයංපෝෂී ආර්ථික රටාව දියුණු වීමට අතීත පාලකයන් විසින් වාරි කර්මාන්ත නගා සිටුවමින් ගෙන ගිය අනුග්‍රහය අතිමහත් වේ. අහසින් වැටෙන එක දිය බිඳක් හෝ ප්‍රයෝජනයට නොගෙන මහා මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතු යැයි මහා පරාක්‍රමබාහු රජු පැවසූ එම උදාන ප්‍රකාශයෙන් ද පෙනෙනුයේ වාරි කර්මාන්ත දියුණු කරවීම උදෙසා අතීත පාලකයින්ගේ තිබූ කැපවීම හා උනන්දුව පිළිබඳවයි. ඒ ආකාරයෙන් වියළි වූ වියළි කලාපයේ කෘෂිකාර්මික දියුණුව ඇති කරවීමට අතීත පාලකයන් ගත් උත්සහය හේතුවෙන් වර්තමානය තෙක්ම මිනිසා හට ප්‍රයෝජනයට වාරි මාර්ග පද්ධති සුරැකීම පවතී. නමුදු අතීත පාලකයන් කර වූ එම වාරි නිර්මාණ හැරෙන්නට වියළි කලාපය තුළ මෑත කලයේ පාලකයන් ඉදි කළ ව්‍යාපෘති දැකිය හැකි වන්නේ ඉතාමත් අල්ප වශයෙනි. ඒ අතරින් ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ මෑත කාලයේ ඉදි වූ විශාලතම වාරි ව්‍යාපෘතිය ලෙස කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය පෙන්වා දිය හැකිය. මහජනයා හට සුවසෙත සලසන සහන රැසක් ලබා දීමේ අරමුණින් මහවැලි ගංගාව පාදක කොට ගනිමින් ශ්‍රී ලංකාවේ වියළි කලාපය කේන්ද්‍ර කොට ගනිමින් ඉදි වූ මෙම දැවැන්ත මහවැලි සංවර්ධන ව්‍යාපාරය පිළිබඳව සාකච්ඡාවක් සිදු කිරීම මෙම අධ්‍යනය මගින් සිදු කර ඇත.

### අධ්‍යයනය අරමුණ

ලංකාවේ වියළි කලාපයේ ජල අවශ්‍යතාවය වැඩි කිරීමේ අරමුණින් ඉදි වූ මෙම මහවැලි ව්‍යාපාරයේ ආරම්භයට තුඩු දුන් හේතු මොනවාද එහි ආරම්භය සිදු වූයේ කෙසේද ඉන් ලැබෙන සේවය කෙබඳු ද යන කරුණු පිළිබඳවත් මහවැලි කලාපයන්ගෙන් මහවැලි එච් කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳවත් කරුණු හැදෑරීම මෙම අධ්‍යනයේ අරමුණ වේ.

### ක්‍රමවේදය

මෙම අධ්‍යනය සිදු කිරීමේ දී මූලික වශයෙන් දත්ත රැස් කර ගැනීමේ ක්‍රමවේදය වූයේ අන්තර්ජාලයයි. මහවැලි සංවර්ධන අධිකාරියේ වෙබ් පිටුව මඟින් ලබා ගත් වාර්ෂික වාර්තා හා වෙනත් ලිපි මඟින් දත්ත රැස් කොට ගනිමින් මෙම අධ්‍යනය සිදු කර ඇත. මහවැලි සංවර්ධන ව්‍යාපාරය පිළිබඳවත් මහවැලි එච් කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳවත් කරුණු ගොනු කර දැක්වීමෙන් මාගේ අභිප්‍රාය වනුයේ මෑත කාලයේ ශ්‍රී ලංකාවේ ඉදි වූ දැවැන්ත වාරි ව්‍යාපෘතිය පිළිබඳ කරුණු මෙම සඟරාව මඟින් ගෙනහැර දැක්වීමයි.

### විමර්ශනය

මහවැලි සංවර්ධන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලැබූ අති දැවැන්ත භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩසටහනයි. මූලික වශයෙන් වියළි කලාපයේ ග්‍රාමීය සංවර්ධනය අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 1968 වර්ෂයේ දී එවකට පැවති රජය විසින් ඔහෘෂරැප්ඩ සංවිධානය මඟින් ලද තාක්ෂණික සහයත් මත සැලසුම් කරන ලදී.

මධ්‍යම කඳුකරයේ ඇති ස්වභාවික ජල සම්පත වියළි කලාපයේ කෘෂිකර්මාන්තයට හා ජනාවාස සංවර්ධනය සඳහා යොදා ගැනීමේ කාර්යයේ දී මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් විශාල කාර්යය භාරයක් සිදු කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ ජනගහනය විශාල වශයෙන්

ඒකරාශි වීමක් දැක ගත හැකි වේ. තෙත් කලාපය තුළ ජන සනත්වය වර්ග කිලෝමීටරයට 465ක් වූ අතර වියළි කලාපය තුළ වර්ග කිලෝමීටරයට 80ක් පමණ විය. දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 66%ක්ම වියළි කලාපයට අයත් වන අතර ජනගහනයෙන් 70%ක් තෙත් කලාපයේ ජීවත් වේ. මේ අනුව වියළි කලාපයේ විශාල බිම් ප්‍රදේශයක් පුරාම ඉතා අඩු ජනගහන ව්‍යාප්තියක් දක්නට ලැබිණි. ලංකාවේ අනෙකුත් ගංගා හා සසඳන විට තෙත් කලාපයේ මධ්‍යම කඳුකරයෙන් ඇරඹී දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 1/6කට ලැබෙන වර්ෂා ජලය සිය ග්‍රහනයට ගෙන වියළි කලාපය මැදින් මුහුදට ගලා යන මහවැලි ගංගාව වසරේ සෑම කාලයකටම සුපෝෂිත ගංගාවකි. මේ අනුව මහවැලි ගඟ වියළි කලාපයට හරවා එයින් ලැබෙන ජලයෙන් වියළි කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීමත්, ඉහළ මහවැලි බල ප්‍රදේශ ආශ්‍රිතව විදුලි බලාගාර ඉදිකිරීම මගින් ශ්‍රී ලංකාවේ අනාගත අවශ්‍යතා සපුරා ගත හැකි බවත් ප්‍රත්‍යක්ෂ විය. මේ පිළිබඳ ඉදිරිපත් වූ අදහස්වල ප්‍රතිඵලයක් ලෙස රජය කළ ඉල්ලීමකට අනුව එක්සත් ජනපද මෙහෙයුම් දූත මණ්ඩලය විසින් වියළි කලාපය ආශ්‍රිත ඉඩම් සංවර්ධනය පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් 1956 දී ආරම්භ කර ඇත. ඒ සමගම ශ්‍රී ලංකාවේ වාරිමාර්ග හා මිනුම් දෙපාර්තමේන්තු යන ආයතනවල සහය ඇතිව කැනේඩියානු රජයේ තාක්ෂණික ආධාර මත කැනේඩියන් හර්ටින් සර්වේ කෝපරේෂන් ආයතනයද ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත මහවැලි ගඟ පිළිබඳ අධ්‍යනයක් සිදු කරන ලදි. මෙම ආයතන එම අධ්‍යනය පිළිබඳ ස්වාධීන වාර්තා දෙකක් 1961 දී ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව අනුමැතිය සඳහා 1962 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. සමස්ත මහවැලි ද්‍රෝණියේම ජල සම්පත පිළිබඳ පූර්ණ අධ්‍යනයක් සිදු නොකර මහවැලි ජලයෙන් කොටසක් හරහා යැවීම අයහපත් ප්‍රතිඵල ජනනය කරන බැවින් දේශිය විද්වතුන්ගේ අදහස් හේතුවෙන් පාර්ලිමේන්තුව මෙම යෝජනා අනුමත නොකරන ලදී. ඉන්පසු මහවැලි ගඟ ඇතුළු වෙනත් ගංගා ආශ්‍රිත ඉඩම් හා ජල සම්පත් පිළිබඳ සමස්ත අධ්‍යනයක් කර සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු ව්‍යාපෘති තෝරා ස්වාධීන නිර්දේශ ඉදිරිපත් කරන ලෙස 1962 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් එහි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට එවන ලදී. එයට අමතරව එම කණ්ඩායමට සහය සඳහා ශ්‍රී ලංකාවේ විශේෂඥ පිරිසක්ද පත් කරන ලදී. කෙසේ හෝ සිව් වසරක දැඩි අධ්‍යනය පරිශ්‍රමයකින් පසුව 1968 දී වෙන් වෙන් වූ විශේෂ වාර්තා 14කින් යුතු කාණ්ඩ තුනක අධ්‍යයන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදි. මහවැලි සංවර්ධන සැලැස්ම 1968 වසරේ දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදි. මෙම සැලැස්මට අනුව උතුරු මැද පළාත් සහා නැගෙනහිර පළාත් ආශ්‍රිත ප්‍රතිලාභ ලබන ප්‍රදේශය කලාප 13ක් ලෙස නම් කරන ලද අතර එය ඉංග්‍රීසි A සිට M දක්වා නම් කෙරිණි. ආර්ථික වශයෙන් වඩාත් ඵලදායි හා අඩු ආයෝජනයක් මගින් වැඩි ප්‍රතිලාභ ලැබිය හැකි ව්‍යාපෘති පළමු වන පියවර යටතට ගන්නා ලදී.

මහවැලි මහා සැලැස්මේ ප්‍රධාන අරමුණ වූයේ මහවැලි ගඟේ ජල සම්පතෙන් ඝන මීටර් මිලියන 6900ක් පමණ වූ ජල ප්‍රමාණයක් විදුලි බල නිෂ්පාදනයට හා වාරි කටයුතු සඳහා සැපයීමයි. දෙවන අරමුණ වූයේ ජලාශ 15ක් ඉදිකර 11ක් ප්‍රධාන වශයෙන් විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමයි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ආහාර හා කෘෂිකාර්මික සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද මහවැලි මහ සැලැස්ම අනුව මහවැලි ගංගා ද්‍රෝණියේ සහ වියළි කලාපය තුළ වූ තවත් ගංගා ද්‍රෝණිවල ඉඩම් හෙක්ටයාර් 364,372ක් සඳහා යල මහා දෙකන්නයටම වගා කිරීමට වාරි ජල පහසුකම් සලසා දීමට යෝජනා කර තිබිණි. මෙයින් හෙක්ටයාර 264,777ක් අලුතින් අස්වැද්දීමට යෝජිත අතර හෙක්ටයාර 110,404ක් ඒ වන විට වසරක එක් කන්නයක් පමණක් වගා කළ ඉඩම් විය. සැලසුම් කළ ජලාශ හා ඇළ මාර්ගවල විභවයන් ප්‍රයෝජනයට ගැනීමෙන් ගිගා වොට් පැය 2037ක, වාර්ෂික ස්ථාවර විදුලිය ප්‍රමාණයක් ජනනය කළ හැකි බවද එයින් පෙන්වා දී තිබුණි. මහවැලි මහා සැලැස්ම අනුව එම සංවර්ධන

කටයුතු වසර 30ක් තුළ නිම කිරීමට යෝජනා විය. අරමුදල් යෙදවීම හා ක්‍රියාක්මක කිරීමේ පහසුව මෙන්ම විශේෂයෙන් ම සංවර්ධන ප්‍රතිලාභ වල අවශ්‍යතාව වන කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් සංවර්ධන කටයුතු පියවර තුනකට බෙදා ව්‍යාපෘතිය ගෙන යන ලදී.

- ප්‍රථම පියවර

1969 - 1980 අතර කාලය තුළ ක්‍රියාත්මක කරන්නට යෝජනා විය. මින් අලුත් ඉඩම් හෙක්ටයාර 74494කටත් පැරණි ඉඩම් හෙක්ටයාර් 58300කටත් වාරි ජලය සැපයීමටත්, ගිගාවොට් පැය 820ක් වාර්ෂික ස්ථාවර විදුලි බල ප්‍රමාණයක් ජනනය කිරීමටත් සැලසුම් කර තිබුණි. මෙහි කටයුතු ව්‍යාපෘති 3ක් යටතේ විය.

- පොල්ගොල්ල හැරවුම (1969 - 1973)
- වික්ටෝරියා/මිනිපේ හැරවුම (1973 - 1977)
- මොරගහකන්ද බහුකාර්ය ඒකකය

- දෙවන පියවර

මේ යටතේ මාදුරු ඔය ජලාශය තල්දෙන බහුකාර්ය සංකීර්ණය හා කණ්දකාඩු අමුණ යන මූලස්ථාන වැඩ කොටස් යටතේ මහවැලි හා මාදුරු ඔය නිම්නයන්හි ඉඩම් හෙක්ටෙයාර 93,117ක් වගා කිරීමට වාරි පහසුකම් ලැබෙන අතර මෙගා වොට් 15ක ස්ථාපිත ජවයක් සහිත ජල විදුලි බලාගාරයක් තල්දෙන දි ඉදිකිරීමට මාදුරු ඔය ජලාශය පෝෂණය කිරීමට උල්හිටිය රත්කිද ජලාශයේ සිට උමගක් ඉදිකිරීමට ද මාදුරු ඔය ජලාශය ආශ්‍රිතව මෙගා වොට් 4.9 ක ස්ථාපිත ජවයක් ඇති කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරිම ද මෙහි ප්‍රධාන කාර්යය විය.

- තෙවන පියවර

මෙමගින් දිවයිනේ උතුරු මධ්‍යම පළාතේ අලුතින් ඉඩම් හෙක්ටෙයාර 105,668ක් සංවර්ධනය කෙරේ. ජල විදුලි නිපදවීමේ අවසන් සැලැස්ම ක්‍රියාත්මක කොට මෙගා වොට් 293ක ප්‍රමාණයක ස්ථාපිත ජවයක් ඇති විදුලි බලාගාර ඉදි කරන අතර එමගින් වාර්ෂිකව ගිගා වොට් පැය 1169 ක ස්ථාවර විදුලියක් ජනනය කරනු ඇත. පැරණි මිණිපේ වම් ඉවුර ඇළ වැඩි දියුණු කිරීම, 164ක් දිග උතුරු මධ්‍යම ඇළ ඉදි කිරීම, රොටලාවල, උමා ඔය, රන්ටැඹේ, කොත්මලේ. කළු ගඟ ආදී ජලාශ ඉදිකිරීම මෙම පියවරට ඇතුළත් විය.

නමුත් කාලීන අවශ්‍යතා මත වර්තමානය වන විට මහවැලි මහා සැලැස්ම ක්‍රියාත්මක කිරීම සිදු විය. ii සංවර්ධන සැලැස්ම සංවර්ධන අදියර තුනකින් ක්‍රියාවට නැංවෙමින් පවතී. ඒ යටතේ i වන සංවර්ධන අදියර ලෙස මහවැලි මහා සැලැස්ම ක්‍රියාත්මක විය. ii වන සංවර්ධන සැලැස්ම යටතේ කඩිනමින් මහවැලි සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක විය. මහවැලි මහා සැලැස්මට අයත් තෝරා ගත් ව්‍යාපෘති කිහිපයක් එක විට අරඹා වසර 6 ක් වැනි කෙටි කලකින් නිම කිරීමට 1997 දී රජය තීරණය කළේය. මෙම ව්‍යාපෘතිය සඳහා ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය, ජර්මනිය, කැනඩාව, ජපානය, කුවේටය යන රටවල් ආධාර සැපයීය. මෙම ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා 1979 දී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. iii වන සංවර්ධන ව්‍යාපෘතිය මහවැලි ව්‍යාපෘතියේ වර්තමාන කාර්යය භාර්යය හා අනාගත සැලසුම් සකස් කරමින් දියත් වේ. මේ යටතේ මොරගහකන්ද හා කළු ගඟ ව්‍යාපෘතිය ඉදි කොට ඇති අතර කාලිංගනුවර අංගමැඩිල්ල ජල පොම්පාගාර ව්‍යාපෘතිය, කුඩා ඔය ආශ්‍රිත බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය, මිණිපේ ඇළ ව්‍යාපෘතිය ආදී ව්‍යාපෘති තවත් රැසක් සිදු කිරීමට යොජනා වී ඇත.

ඉහත පරිදි ආරම්භ වෙමින් පියවරෙන් පියවර ක්‍රියාත්මක වෙමින් පවතින මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ වියළි කලාපය පෝෂණය කිරීමට විශාල මෙහෙවරක් ඉටු කරනු ලබයි.

**මහවැලි එච් කලාපයේ කෘෂිකාර්මික දියුණුව**

ලංකාවේ සංවර්ධන ව්‍යාපෘතියක් වන මහවැලි සංවර්ධන ව්‍යාපාරය තුළින් සංවර්ධනයට ලක් වූ මහවැලි එච් කලාපය පිළිබඳ සාකච්ඡා කිරීම මෙම ලිපියේ අනෙක් අරමුණ වේ. ඒ අනුව එච් කලාපයේ සංවර්ධනයට මහවැලි ව්‍යාපාරය විසින් ලබා දෙන්නා වූ සහයෝගය කුමනාකාරයෙන් ද යන්න සාකච්ඡා වේ. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකළ මහවැලි ජනපද එච් කලාපය සුවිශේෂී වේ. i වන මහවැලි සංවර්ධන අදියර යටතේ මහවැලි මහා සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී මෙම මහවැලි එච් කලාපයට අයත් වන කලා වැව නිම්නයේ ගොවි පවුල් 23000ක් 1977 වන විට පදිංචි කරවනු ලැබීය. එම අදියර වන විට මහවැලි එච් කලාපයේ සියලුම ජනාවාසවල කටයුතු අවසන් කොට ඇති අතර එහි පදිංචි කරවනු ලැබූ මුළු පවුල් ප්‍රමාණය 39500 ක් විය. මහවැලි කලාපයට අයත් ප්‍රධාන කොට්ඨාස සඳහා කලා වැව මගින් කලා වැව මගින් ජලය ලබා දිම සිදු කරනු ලබයි. මහවැලි එච් කලාපයේ වැව් 127 පමණ ඇති අතර ඒ සෑම වැවකටම කලා වැව මගින් දියවර සපයයි.

මහවැලි එච් කලාපය තඹුත්තේගම, තලාව, එප්පාවල, නොච්චියාගම, මහ ඉලුප්පල්ලම, ගල්නෑව සහ මීගලෑව යන කොට්ඨාස හතෙන් සමන්විත වේ. මෙම කොට්ඨාස හත පදනම් කර ගනිමින් කෘෂිකාර්මික අංශයෙන් සහ වාරි කර්මාන්ත අංශයෙන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. කෘෂිකාර්මික අංශයෙන් ප්‍රධාන වශයෙන් වී ගොවිතැන සිදු වන අතර ඊට අමතරව එළවළු වර්ග පලතුරු වර්ග මෙන්ම ලොකු ළූණු වගාවන් ද දැකිය හැකි ය. කෘෂිකර්මාන්තයට අමතරව වැව් ආශ්‍රිතව සිදු කෙරෙන මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ද සිදු කරනු ලබයි. එච් කලාපයට අදාල ප්‍රධාන මහවැලි අධිකාරිය තඹුත්තේගම පිහිටන අතර අනෙකුත් කලාපවලට අදාල උප කාර්යාල තලාව, ගල්නෑව, මීගලෑව යන උප නගර කේන්ද්‍ර කර ගනිමින් පිහිටුවා ඇත. එච් කලාපයේ සංවර්ධන ව්‍යාපෘති මඟින් හෙක්ටයාර දෙදහසක් (2000) පමණ භූමියක් ආවරණය කෙරෙන අතර ගොවි පවුල් තිස් නව දහස් එකසිය හතලිස් පහක් 39145 පමණ ප්‍රමාණයක් සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන් මඟින් ආවරණය කරනු ලබයි. එච් කලාපයේ ප්‍රධාන කොට්ඨාස හත සඳහා කලා වැව මඟින් ජලය ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව එච් කලාපයේ කුඹුරු ගොවිතැන සිදු කරනු ලබන්නේ කලා වැව උපයෝගී කර ගනිමිනි. කලා වැව වර්ග කිලෝ මීටර අටසිය හතලිස් දෙකක 842 වපසරියක් පුරා විහිදී ඇති අතර උස 14.8කි. වේල්ලේ දිග මීටර හයසිය පනහක් (650) වන අතර උපරිම ධාරිතාවය මුහුදු මට්ටමේ සිට 129.3 කි. කලා වැව ක්‍රි:පූ: පස්වන ශතවර්ෂයේ ධාතුසේන රජතුමා විසින් නිර්මාණය කළ අතර ක්‍රි:පූ: හත්වන ශතවර්ෂයේ පරාක්‍රමබාහු රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කරන ලදී. ඉන් පසු බ්‍රිතාන්‍ය පාලනය යටතේ 1872-1877 කාලයේ ලංකාව පාලනය කළ විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා කලා වැව ප්‍රතිසංස්කරණය කළ අතර 1833-1890 කාලයේ දී සර් ආතර් හැමිල්ටන් විසින් කලා වැව ප්‍රතිසංස්කරණය කරන ලදී.

මහවැලි එච් කලාපයේ වැව් 127 පමණ ඇති අතර ඒ සෑම වැවකට ම කලා වැව දියවර සපයයි. මහවැලි අධිකාරිය මඟින් සිදු කරනුයේ කන්නයකට එක් කොට්ඨාශයකට සපයන වතුර ප්‍රමාණය තීරණය කරමින් වගා කළ යුතු බෝග වර්ග පිළිබඳ ගොවියන් දැනුවත් කිරීමයි. ජලය නිකුත් කිරීම සහ කන්නයට වගා කළ යුතු භෝග මොනවාද යන්න තීරණය කරනුයේ කලා වැවේ පවතින ජල ප්‍රමාණය අනුවයි. මෙහි දී මහවැලිය මඟින් පිහිටුවා ගෙන ඇති ගොවි සංවිධාන ද එකතුවෙන් තීන්දු තීරණ ගැනීම සිදු වේ. සෑම කොට්ඨාශයකට ම අදාලව ගොවි

සංවිධාන පිහිටුවා ගෙන ඇති අතර කලා වැවෙන් ජලය නිකුත් කිරීමෙන් අනතුරුව ප්‍රධාන ඇළ මාර්ග ඔස්සේ ගලා යන ජලය උප ඇළවල් වලට නිකුත් කිරීමේ කාර්යය සිදු කරනු ලබයි.

ඉහතින් සඳහන් කළ පරිදි කුඹුරු හෙක්ටයාර 2000 ක පමණ ප්‍රමාණයකට ජලය සපයන අතර එමඟින් පවුල් 39145ක ප්‍රමාණයක් පෝෂණය වේ. ජලය සැපයීමේ දී ගොවි පවුල් 25627ක් නීත්‍යානුකූල වශයෙන් ද ගොවි පවුල් 13518ක අනියම් ආකාරයෙන් ද ජලය ලබා ගනී. මේ වසරේ යල කන්නය සඳහා වී වගා කිරීමට ජලය සපයන ලද්දේ තිබෙන කුඹුරු ප්‍රමාණයෙන් 50% ක ප්‍රමාණයක් සඳහා පමණි. එයට හේතු වූයේ පවතින ජල හිඟය යි. කෙසේ වුවත් මහවැලි සංවර්ධන ව්‍යාපාරය ආරම්භ වීමත් සමඟ එච් කලාපයේ කෘෂිකර්මාන්තය වර්ධනය වී ඇත. ක්‍රමවත් වගා රටාවන් හඳුන්වා දෙමින් කෘෂිකර්මාන්තය වර්ධනය කිරීමට මහවැලි නිළධාරීන් කටයුතු කරනු ලබයි. කෘෂිකර්මාන්තය වර්ධනය කිරීමට රජය විසින් මහවැලි අධිකාරියට ආධාර සපයන අතර මහවැලි නිළධාරීන්ගේ මැදිහත් වීමෙන් සංවර්ධන ව්‍යාපෘති සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු වේ. එසේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතීන්වලට නිදසුන් ලෙස නොමිලයේ බීජ වර්ග ලබා දීම, එළවළු පැළ පළතුරු පැළ වර්ග නොමිලයේ ලබා දීම, අඩු මිලට එළවළු පළතුරු පැළ ලබා දීම, තරඟ වැඩසටහන් මඟින් ගොවි ජනතාව අභිප්‍රේරණය කිරීම මෙන්ම ජයග්‍රාහකයන්ට තිළිණ ලබා දීම වැනි වැඩසටහන් දැක්විය හැකි ය.

වී නිෂ්පාදනය පමණක් නොව වැව් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ද සිදු කරනු ලබයි. මහවැලි නිළධාරීන් පවසන ආකාරයට මහවැලිය මඟින් මෙම ව්‍යාපෘතිය සිදු කරනු ලබනුයේ වැව් ගම්මාන වල ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමේ අදහසිනි. එසේම මෙම ව්‍යාපෘතිය මඟින් ගැමි ජනතාවගේ ආර්ථිකය වර්ධනය කර ගැනීම ද සිදු කරනු ලබයි. ඒ අනුව මහවැලිය මඟින් හඳුන්වා දුන් මෙම ව්‍යාපෘතිය ඔස්සේ තෝරා ගත් වැව් කිහිපයකට ඔවුන් විසින් ම මිරිදිය මත්ස්‍යයන් මුදා හරිනු ලබන අතර ඉන් පසු නඩත්තු කිරීම් ධීවර සමිති මඟින් සිදු කරනු ලබයි. එසේ නඩත්තු කිරීම්වල දී ධීවරයන්ට ඇතැම් නීති රීති වලට යටත්ව ධීවර කටයුතු කිරීමට සිදු වේ. ඒ අනුව ගම්මානයෙන් පිට ධීවරයන්ට අදාල ගම්මානයේ වැවෙන් මසුන් මැරීම තහනම් අතර ධීවර කටයුතු සිදු කිරීමේ දී මුලින්ම ගම්මානයේ අවශ්‍යතාවන් සපුරාලිය යුතු ය. එසේම වීසි දැල් භාවිතා කිරීමේ දී අඟල් 5ට අඩු දැල් සහිත වීසි දැල් භාවිතා කිරීම තහනම් ය.

මෙසේ වාරි කර්මාන්තය හා ඒකාබද්ධ වී ඇති මහවැලි සංවර්ධන ව්‍යාපාරය මඟින් එච් කලාපයේ සංවර්ධනයට මනා පිටුවහලක් වී ඇත. කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාව අතීතයේ පටන් යැපුම් කෘෂිකර්මාන්තයෙන් පෝෂණය වූවකි. අතීතයේ ලංකාව පාලනය කළ රජවරුන් පවා කෘෂිකර්මාන්තයේ වටිනාකම පසක් කර ගනිමින් කෘෂිකර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමට රාජ්‍ය අනුග්‍රහය දක්වා ඇති බවට ලංකාව පුරා විහිදී පවතින වැව් අමුණු, ඇළවල්, විනාශ නොවූ කෙත් වතු, මනාවට සාක්ෂි සපය යි. පෙර රජවරුන් මෙන්ම ලංකාව පාලනය කරන ලද වෙනත් ජාතීන් ද කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. එසෙම වර්තමානයේ පාලන කටයුතු කරන්නා වු පාලකයන් ද කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීමට කටයුතු සිදු කරනු ලබයි. එසේ ආරම්භ වූ සංවර්ධන ව්‍යාපාරයක් වන මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවි ජනපද වල ආර්ථික දියුණුව උදෙසා මෑත කාලීනව කරනු ලැබූ අති දැවැන්ත ව්‍යාපෘතියක් වන මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය මගින් එදා මෙදා තුළ කරනු ලැබූ සහ අනාගතයේ සිදු කිරිමට නියමිත වන්නා වූ කාර්යයන් රැසක් පිළිබඳව ඉහත දී සාකච්ඡා කරනු ලැබිණි. තවද මහවැලි එච් කලාපයේ කෘෂිකාර්මික දියුණුව පිළිබඳවත් කරුණු දක්වන ලදී. එම කරුණු අධ්‍යනය කිරීම මගින් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ගොවි ජනපද සශ්‍රීක වීමට ඉදි වූ අති දැවැන්ත ව්‍යාපාරයක් බව නිසැකව කිව හැක.

**නිගමනය**

අති දැවැන්ත වාරි ව්‍යාපාරයක් වූ මහවැලි සංවර්ධන ව්‍යාපාර පිළිබඳව අධ්‍යන වාර්තාවක් ඉහත සකස් කොට ඇත. ඉඩම් සංවර්ධනය කරමින් යටිතල පහසුකම් දියුණු කිරීම, ජල විදුලිය උත්පාදනය කිරීම, කෘෂිකාර්මික දියුණුව ආදිය අරමුණු කොට ගනිමින් ක්‍රියාත්මක වූ මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය මගින් විවිධාකාර ගැටලු මධ්‍යයයේ වුවද අරමුණු සාධනය කරමින් වර්තමානයේ දී ද ක්‍රියාත්මක වෙමින් පවතී. ගොවි ජනපද සංවර්ධනයට නිසි සැලැස්මක් යටතේ මෙය ක්‍රියාත්මක කරන බව කරුණු සාධනයෙන් පැහැදිලි විය. ඒ අනුව අවසන් වශයෙන් නිගමනයකට එළඹිය හැක්කේ විවිධ ගැටළුකාරී අවස්ථා පැමිණිය ද මෙම මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ජල අවශ්‍යතාව සපුරා ගැනීමට ඉතාමත් යෝග්‍ය වූ ව්‍යාපෘතියක් බවයි. අතීතයේ අන්තර් ද්‍රෝණි ජල කළමනාකරණ ක්‍රියාවලිය වත්මන් අන්තර් ද්‍රෝණි ජල කළමනාකරණ ක්‍රියාවලියට බොහෝ සෙයින් සමාන ක්‍රියාවලියකි.

**පරිශීලන**


*ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාර්ෂික වාර්තාව - 2015*

ජේ.කේ. එස්. එම්. පෙරේරා, ***මහවැලි H කලාපයේ කෘෂිකර්මික සංවර්ධනය***

නිකලස්, සී. ඩබ්ලියු." 1964(2001), **ජල සම්පාදනය**, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, කාණ්ඩය i, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

නිකලස්, සී. ඩබලිව්., 1964 (2001), **කැරළි මහා පරාක්‍රමබාහු රජු උදාවීම**, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, කාණ්ඩය සසල විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

නිකලස්, සී. ඩබ්ලිව්, (1972) **කෘෂිකර්මය සහ ජලානයනය**, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, කාණ්ඩය සසල විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

## 02. අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය තත්කාලීන සමාජයේ තිරසාර සංවර්ධනය කෙරෙහි දායක වී තිබෙන ආකාරය පිළිබඳව විමසුමක්

කේ.ආර්.සී.එස්. කල්දේරා

### හැඳින්වීම

ශ්‍රී ලංකාව යනු ප්‍රෞඪ ඉතිහාසයක් ඇති උරුමයන්ගෙන් පරිපූර්ණ වූ රටකි. මෙරට සංස්කෘතියේ හා ප්‍රෞඪත්වයේ සංකේතයක් ලෙස ලාංකීය වාරි කාර්මාන්තය පෙන්වා දිය හැකිය. මෙරට වාරි කර්මාන්තයේ ආරම්භය හා සුවිශේෂී වූ වාර්ධනයක් අනුරාධපුර යුගයේ දී හඳුනාගත හැකිය. අනුරාධපුර යුගයේ සමාජය දෙස බැලීමේ දී අපට දැකිය හැකි සුවිශේෂී කරුණක් වන්නේ තත්කාලීන සමාජය තිරසාර සංවර්ධනයෙන් යුක්ත සමාජයක් බවයි. මෙම පර්යේෂණ ලිපියේ අරමුණ වන්නේ අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය තත්කාලීන සමාජයේ තිරසාර සංවර්ධනය කෙරෙහි දැක්වූ දායකත්වය පිළිබඳ විමසුමට ලක් කිරීමයි. තිරසාර සංවර්ධනයේ දී කරුණු කිහිපයක් හඳුනාගත හැකි අතර ඒ ඒ අංශ ඔස්සේ සංවර්ධනයට වාරි කර්මාන්තය දායක වී ඇති ආකාරයක විමසුමට ලක් කරයි. තව ද මෙරට තිරසාර සංවර්ධනය කෙරෙහි එකළ සිට අද දක්වා දායක වී ඇති ආකාරය විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරයි.

### ක්‍රමවේදය

මෙම ලිපිය සඳහා දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය වූයේ සාහිත්‍ය ගවේශනයයි. පොත්, සඟරා පුවත්පත් හා අන්තර්ජාලය පරිශීලනයෙන් ලබා ගත් කරුණු ඇසුරෙන් මෙම පර්යේෂණ ලිපිය සකස් කර ඇත.

### විමර්ශනය

තිරසාර සංවර්ධනය යනු පරිසරයේ පවත්නා සම්පත් වලින් ප්‍රයෝජනය ගන්නා අතරම අනාගතය සඳහා ද ඒවා සුරැකීමයි. මේ අනුව තිරසාර සංවර්ධනය යන්නෙන් පවත්නා සම්පත් වර්තමානයේ ප්‍රයෝජනයට ගැනීම ඒවා සංවර්ධනය කිරීම මෙන්ම අනාගත පරපුරේ අවශ්‍යතාවයන් සඳහා ආරක්ෂා කිරීම ද අදහස් වේ. අනාගතය සඳහා ආරක්ෂා කිරීමේ දී වර්තමාන අවශ්‍යතා කැප කිරීමට සිදුවිය හැක.

තිරසාර සංවර්ධනය සඳහා දායක වන මූලික කරුණු හතරක් හඳුනා ගත හැකිය. ඒවා නම් **පරිසරය, සමාජය, ආර්ථිකය** හා **සංස්කෘතිය** යි. තිරසාර සංවර්ධනයට පරිසරය හා ජීවීන්ගේ සමතුලිතතාවය තිබිය යුතු අතර එය සමාජයේ පැවැත්මට ද අවශ්‍ය වේ. සමාජයක තිරසාර සංවර්ධනය සිදු වීමට නම් ආහාර, තාක්ෂණය, පාරිසරික සම්පත්, නිවාස, ඇඳුම් හා සමෘද්ධිය යන සාධක අවශ්‍ය  තිරසාරත්වයේ දී අප ළඟා කර ගතයුතු කරුණු කිහිපයකි.

I. ආර්ථික තිරසාර බව

II. සමාජ තිරසාර බව

III. පාරිසරික තිරසාර බව අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව යනු ලොව අන් රටවල් සියල්ල සමඟ සැසඳීමේ දී අනගිභවනීය ඉතිහාසයක් ඇති රටකි. ඊට පාදක වන හේතූන් දෙකක අපට හඳුනාගත හැකි ය.

- මහින්දාගමනය ඇසුරෙන් ගොඩනැගුණු කලා ශිල්ප
- දේශීය වාරිකර්මාන්තයේ වර්ධනය

මේ අතුරින් අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය ඉතා සුවිශේෂී වේ. අනුරාධපුර යුගයේ ආරම්භය සිදු වන්නේ ක්‍රිස්තු පූර්ව 377 වන අතර අවසානය සිදු වන්නේ ක්‍රිස්තු වර්ෂ 1017 දීය.

පණ්ඩුකාභය රජු ආරම්භ රාජ්‍ය පිහිට වූ අතර පස්වන මිහිඳු රජු අවසාන පාලකයා විය. මෙරට වාරි කර්මාන්තය ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ ආර්යාගමනය දක්වා දිව යන්නකි. ප්‍රාග් ඓතිහාසික යුගයේ පවා ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිතව ජනාවාස ව්‍යාප්ත වී ඇත.

ආර්යයන් යනු කෘෂිකාර්මික පිරිසකි. ඔවුන් තම ජනාවාස පිහිටුවා ගත්තේ වියළි කලාපයේ ගංගාධරයන් ආශ්‍රිතවය. අනුරාධපුර යුගයේ සමාජයේ තිරසාර සංවර්ධනය පිළිබඳ විමසීමේ දී තිරසාර සංවර්ධනය යන සංකල්පය බිහි වීමට වාරි කර්මාන්තය බලපා ඇත. වාරි කර්මාන්තය ආරම්භ වීමට විවිධ සාධක හේතු වී ඇත. කාලයක දී ගංගා ජලය සිඳී යාම, ගංගාවල ජලය පමණක් ප්‍රමාණවත් නොවීම, වර්ෂාව අවිනිශ්චිත වීම, ජනගහනයේ සීඝ්‍ර වර්ධනය ආදිය හේතු විය. මේ නිසා මොවුන් ජලය එකතු කිරීම සඳහා සැළසුම් සකස් කිරීම සිදු විය.

මොවුන් පවතින සම්පත් භාවිත කිරීමට ක්‍රමයෙන් සැළසම් සකස් කිරීම සිදු විය. අහස් දිය භාවිතා කරමින් ජලය ඒකරාශි කිරීම මොවුන්ගේ මූලික පියවර විය. මෙම නිර්මාණ අනාගතයේ දී භාවිතා කළ හැකි වූ අතර සමාජ දියුණුවට මහත්සේ දායක විය. දෙවන පියවර වූයේ ගංගාවක් ගලා ගිය පටුම ස්ථානය ඉලක්ක කොටගනිමින් කඳු දෙකේ නෙරු දෙක යා කොට වේල්ලක් බැඳීමයි. වංශකතා මූලාශ්‍රයන්ගේ දැක්වෙන පරිදි මෙරට මුල්ම වැව අනුරාධ ඇමති විසින් ඉදි කළ බවට සැළකේ. එය අනුරාධ වැවයි. මින් පසුව වැව් විශාල ප්‍රමාණයක් නිර්මාණය වූ අතර වාරි කර්මාන්තය අතිශය දියුණු විය. වැවට තවත් අංග එක් වීම සිදු විය.

පසුව එළඹුණු පණ්ඩුකාභය රාජ්‍ය සමයේ අභය වැව ඇතුළු වැව් කිහිපයක් ඉදි විය. මහින්දාගමනයත් සමඟ මෙරට වාරි තාක්ෂණයේ ද විශාල වෙනසක් මෙන්ම දියුණුවක් සිදු විය. දේවානම්පියතිස්ස රාජ්‍ය සමය, දුටු ගැමුණු රාජ්‍ය සමය, වසභ රාජ්‍ය සමය, මහසෙන් රාජ්‍ය සමය, ධාතුසේන රාජ්‍ය සමය ආදි රාජ්‍ය සමයන් වලදී වාරි කර්මාන්තයේ විශාල දියුණුවක් සිදු වී ඇත. තිරසාර සංවර්ධනයේ මූලික කරුණක් වන්නේ පවත්නා සම්පත් වලින් ප්‍රයෝජන ගැනීමයි. අනුරාධපුර වාරි කර්මාන්තය පිළිබඳ විමසීමේ දී මුල් කාලයේ සිටම පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගනිමින් සංවර්ධනය වී ඇත. මෙහි දී අප මානව සම්පත්, ස්වභාවික සම්පත් හා නිෂ්පාදිත සම්පත් යන සියල්ල ප්‍රයෝජනයට ගෙන ඇත. ආර්යයන් ජනාවාස පිහිටුවා ගැනීමේ දී ද මෙය හඳුනා ගත හැකිය.

- නිර්මාණය කරන ලද තඩාගයක වැසි ජලය රඳවාගෙන එම ජලය ඇළ මාර්ග ඔස්සේ ප්‍රයෝජනයට ගැනීම.
- වසර පුරා ජලය රැගෙන යන ජල මාර්ග ගල් හා දැව දමා හරස් කොට එම ජලය කුඩා ජල මාර්ග ඔස්සේ අවශ්‍යතාවයන් සඳහා ලබා ගැනීම.

විජය කුමරුගේ පැමිණීම සිදු වන කාලයේ ද ස්වභාවික සම්පත් භාවිත කිරීම හා තව දුරටත් වැඩි දියුණු කිරීම හඳුනා ගත හැකිය. විජය කුමරු පැමිණෙන අවස්ථාවේ කුවේණිය කපු කටිමින් සිට ඇත. එසේ නම් ස්වභාවික සම්පත් භාවිතය හා සංවර්ධනය පුරාණයේ සිටම පැවතී ඇත. නමුත් අනාගත අවශ්‍යතාවයන් සඳහා ඉතිරි කිරීම අරමුණු වී නැත. මෙනිසා අනුරාධපුර යුගයට ප්‍රථම තිරසාර සංවර්ධනය යන සංකල්පය සම්පූර්ණ වී නැත. මෙරට ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තයයි. මෙහි දී අනුරාධපුර සමාජය ස්වභාවික පිහිටීම උපරිම ප්‍රයෝජනයට ගෙන ඇත. ගොඩ ගොවිතැන සහ මඩ ගොවිතැන යනුවෙන් දෙයාකාරව කෘෂිකර්මාන්තය සිදු වී ඇත. මඩ ගොවිතැනේ දී බොහෝ විට ධාන්‍ය වර්ග වගා කොට ඇති අතර ගොඩ ගොවිතැනේ දී වෙනත් ආහාර වර්ග වගා කොට ඇත. මේ වගා ක්‍රම දෙක සඳහා ම වැව් ජලය භාවිතා කර ඇත. කාවන්තිස්ස රජ දවස නිටොල්පිටිය ග්‍රාමයේ සහෝදරයන් පස් දෙනෙක් හේනක් සකස් කළ බවට මහාවංශයේ සඳහන් වේ. ආර්යයන් මුල් කාලීනව ගංගාධරයන් ආශ්‍රිතව වගා කටයුතු

සිදු කරගෙන ගියත් පසුව වැව් නිර්මාණයත් සමඟ ක්‍රමවත් ව කෘෂි කර්මාන්තය දියුණු විය. මඩ ගොවිතැනේ කුඹුරු ඉතා ක්‍රමවත්ව නැවත නැවත වගා කළ හැකි ආකාරයට කොටස් වශයෙන් වෙන් කොට සිදු විය. වසරක් තුළ කන්න තුනක් වගා කිරීම සිදු විය. පසට හෝ පරිසරයට හානියක් නොවන පරිදි පරිසරය නිසි අයුරින් ප්‍රයෝජනයට ගනිමින් නැවත නැවත වගා කළ හැකි ආකාරයට වගා කිරීම සිදු විය. අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය තත්කාලීන සමාජයේ ආර්ථිකය සම්පත් හා සමාජය යන අංශයන් තිරසාර සංවර්ධනය කරා ගෙන ගොස් ඇත.

තිරසාර සංවර්ධනයේ දී කරුණු හතරක් අපට හඳුනාගත හැකිය. මෙහි පළමු කරුණ ලෙස පරිසරය හඳුනාගත හැකිය. මෙහි අරමුණ වන්නේ ජෛව විවිධත්ව ආරක්ෂා කරමින් පරිසරයට ගරු කරමින් සංවර්ධනය සඳහා යොමු වීමයි. මෙහි දී ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීමත් සමඟින් ආර්ථික දියුණුව ඇති කරයි. අනුරාධපුර යුගයේ තත්කාලීන සමාජය පිළිබඳ විමසීමේදී ද මෙය හඳුනා ගත හැකිය. ක්‍රිස්තු පූර්ව පළමු සියවසේ දී ගම් වැව් ඉදි කළ ක්‍රම දෙක මඟින් මෙය මනාව හඳුනාගත හැකි වේ. එම ක්‍රමවේදයන් වන්නේ ජල මාර්ග හරහා ගලින් දැවයෙන් හෝ මැටියෙන් වේලි බැඳ ජලය ඇළ මාර්ගවලට යොමු කර ප්‍රයෝජනයට ගැනීම හා පස්වැටි ඉදිකොට එහි රැස්වන ජලය පහළ කෘෂි බිම්වලට යොමු කිරීම. අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය පිළිබඳ විමසීමේ දී කිසිදු පරිසර හානියක් හෝ පරිසර දූෂණයක් සිදු වී ඇති බවට හඳුනාගත නොහැකි ය. මෙකල සමාජයේ ජෛව විවිධත්වය ආරක්ෂා කරමින් සිදු කළ විශිෂ්ඨ නිර්මාණයක් වන්නේ උමං ජලමාතිකා නිර්මාණය කිරීමයි. අනුරාධපුර තිසා වැවේ සිට රන්මසු උයනේ පොකුණු දක්වා මේ ආකාරයෙන් ජලය ගෙන ගොස් ඇත. අනුරාධපුර වාරි කර්මාන්තය පිළිබඳ විමසීමේ දී ස්වභාවික සම්පත් සංරක්ෂණය කරමින් තත්කාලීන සමාජය ආර්ථික සංවර්ධනය කරා ගෙන යාම හඳුනාගත හැකිය. මෙහි දී මහසෙන් අවධිය, ධාතුසේන රාජ්‍ය අවධිය, කාශ්‍යප රාජ්‍ය අවධිය ආදී රාජ්‍ය අවධීන් වැදගත් වෙයි. මහසෙන් රාජ්‍ය අවධියේ මෙරට විශාල වැව් තැනීම සිදු විය. මෙහි දී අක්කර 4670 ක් භූමි ප්‍රදේශයක් වසා පැතිර ඇති මින්නේරිව වැව වැදගත් වෙයි. පරිසරයට හානියක් නොවන පරදි ස්වභාවික සම්පත් භාවිත කරමින් මෙම නිර්මාණය සිදු කර ඇත. මින්නේරිය වැවේ වැව් බැම්ම නිමවා ඇත්තේ ක්වාට්සයිට් පාෂාණයේ විහිදීම ඔස්සේය. එමෙන්ම මින්නේරිය වැව සෘතු වෙනස්වීමට ඔරොත්තු දෙන පරිදි ඉදි කර ඇත. ධාතුසේන රාජ්‍ය සමයේ ඉදි වූ විශිෂ්ඨ නිර්මාණයක් වන්නේ යෝධ ඇළයි. මෙහි කිලෝමීටර් එකකට මිලිමීටර් අනුපහක බෑස්මක් සහිතව නිර්මාණය කර ඇත. අනුරාධපුර යුගයේ පාරිසරික සම්පත් සංරක්ෂණය කරමින් විශිෂ්ඨතම වාරි නිර්මාණ බිහිවූයේ කාශ්‍යප රාජ්‍ය යුගයේ දී බව කිව හැකිය. මොහුගේ රාජධානිය සිගිරියේ පිහිටි කලාත්මක නිර්මාණයකි. මෙහි වාරි නිර්මාණ පිළිබඳ සැලකීමේ දී පරිසර සම්පත් මනාව යොදා ගෙන ඇත. රාජධානියේ ජල උද්‍යානයේ සිට මාලක උද්‍යානය දක්වා භූගතව ජලය ගෙන ගොස් ඇත. එමෙන්ම භූගත ජලමල් තාක්ෂණය ද තිබී ඇත. වර්තමානයේ පවා මේවා කිහිපයක් ක්‍රියාත්මක වේ. මේ ආකාරයෙන් තත්කාලීන සමාජයේ පාරිසරික තිරසාරත්වය හඳුනාගත ගත හැකි වේ.

මීළඟට ආර්ථික තිරසාරත්වය වැදගත් වේ. අනුරාධපුර ආර්ථිකය ශක්තිමත් වීමට වාරි කාර්මාන්තය නිසැකවම බලපා ඇත. ආර්යයන් ගංගාධරයන් ආශ්‍රිතව ජනාවාස පිහිටුවා ගනු ලැබුවේ ද කෘෂිකර්මාන්තයට හා සත්ත්ව පාලනයේ ඇති පහසුව නිසාවෙනි. මෙරට ආර්ථිකයේ ප්‍රධාන සාධකය වන්නේ කෘෂිකර්මාන්තයයි. වාරි කර්මාන්තයේ ආරම්භයත් සමඟ කෘෂිමර්න්තය හා සත්ත්ව පාලනය දියුණු වූ අතර තත්කාලීන සමාජයේ ආර්ථිකය ද ශක්තිමත් විය.

ශ්‍රී ලාංකීය කෘෂි කර්මාන්තය සෑම විටම වාරි කර්මාන්තය හා බැඳී පැවතී ඇත. පහත කරුණු මඟින් එය තව දුරටත් ගම්‍ය කළ හැකිය.

- කඳු දෙකක් ඇති ස්ථානයක් සොයාගෙන මැද නිම්නය සාරා එහි පසින් අඩි 15 ක් හෝ 20 ක් තරමක උස කඳු දෙකෙහි දෙපාර්ශවය පුරවා විශාල බැම්මක් සාදා ගනී. එසේ දිගට බැඳි බැම්මෙන් කුඹුරට ජලය ගැනීම සඳහා සොරොව්වක් ද තබා ගනී. කුඹුර සාදා ගනු ලබන්නේ වැව් බැම්මට පහත තැනිතලා බිමෙනි.
- තුන් පැත්තකින් උස් කඳු ගැට පිහිටා ඇති විට එක් පැත්තකින් විවෘත වී ඇති නිසා ඒ පැත්තෙන් වැ කන්ද සාදා ගනු ලබයි. වර්ෂා ජලය කඳු වලට වැටී එහි දොළ පාරවල් දිගේ අවුත් ජලය වැවට වැටෙයි. මෙහිද වැකන්දෙන් සොරොව්වක් සහ වැව් වාන සාදා ගනී. කුඹුරු යාය අසවද්දා ගන්නේ වැ කන්දට පහළිනි. කුඹුරෙහි එහා වනාත දක්වාම ජලය ලබා ගැනීමට වැවේ සොරොව්වේ සිට වේලි සාදා ගනී.
- කඳු වලින් ගලා බසින ඔයවල් උතුරුදිග තැනිතලාවේ ඇත. මෙවැනි තැනක උස් භූමිය අල්ලා ශක්තිමත් බැම්මක් බඳියි. මෙසේ බැම්මක් බැඳ ගැනීමෙන් අක්කර දහස් ගණනක කුඹුරක් වගා කළ හැකිය.
- විශාල ජලයක් ගලා බසින ඔයක් හෝ ගඟක් හරහා වැව් බැම්මක් බැඳ ඊට තරමක් දුරින් වැව සාදා ගනු ලබයි. විශාල වර්ෂා කාලයක දී වැව් බැම්මට උඩින් ජලය ගලා යන අතර එතැන් සිට වැවට එම ජලය ඇළ මඟින් ගලා යයි. මෙසේ සාදා ගන්නා වැවක් මඟින් විශාල වපසරියක් වගා කළ හැකිය. මීට උදාහරණයක් ලෙස මින්නේරිය වැව පෙන්නා දිය හැකිය.
- තවද පෙර ක්‍රමයටම වැවක් සාදා මහ වැවෙන්, කඩා වැවට ජලය ලබා දෙයි. මෙමඟින් විශාල භූමි ප්‍රමාණයක් වගා කළ හැකිය.

වාරි කර්මාන්තය හා බැඳුණු බඳු ක්‍රමයක්, නිලධාරි මණ්ඩලයක් හා නීති පද්ධතියක් ද ඇති විය. 'මතිර මජිබක' යනුවෙන් ඇළ මාර්ග වලින් බද්දක් අයකර ඇත. මේවා ආර්ථිකය ශක්තිමත් කිරීමට හේතු වී ඇත. වාරි කර්මාන්තයේ දියුණුවත් සමග ගොඩ, මඩ වගාව දෙකම දියුණු විය. උඳු, මුං ආදිය හේන්වල වගා කර ඇත. විවිධ නිෂ්පාදනයන් ද සිදු වී ඇත. කුඹල් කර්මාන්තය දියුණු වී පැවතී ඇත. වේළුසුමන යෝධයා විසින් විහාර මහා දේවියගේ දොළදුක සංසිදුවීමට තිසා වැවෙන් ජලය ගෙන ගොස් ඇත්තේ අනුරපුර කුම්බකාර වීදියේ වෙළඳසැළක ඇති මැටි බඳුනකට බව මූලාශ්‍රවල සඳහන් වේ. තවත් වෙළඳාම් රැසක් ආරම්භ වී දියුණු වීම ද හඳුනාගත හැකිය.

තිරසාර සංවර්ධනයේ මීළඟ කරුණ ලෙස සමාජය පෙන්වා දිය හැකිය. ඕනෑම රාජ්‍යයක් ස්ථාවර වීම හා සංවර්ධනය සඳහා සමාජයේ දායකත්වය අතිමහත් වේ. සමාජය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පවුල, පරිපාලනය, නීතිය, ආර්ථිකය, සංස්කෘතිය යන සියල්ල වැදගත් වේ. අනුරාධපුර වාරි කර්මාන්තය පිළිබඳ සැළකීමේ දී ඒ හා බැඳී මේ සියල්ල ගොඩනැගී සමාජය සැකසුණු බව කිව හැකිය. ආර්යයන් ගංගාධරයන් ආශ්‍රිතව ජනාවාස පිහිටුවා ගැනීමත් සමඟ කුටුම්බයන් ජලාශ්‍රිත ප්‍රදේශවල ගොඩනැගුණු බව කිව හැකිය. වාරි කර්මාන්තයේ ආරම්භයත් සමඟ කුටුම්බයන් සමඟ ජීවිතය මේ හා බද්ධව ගෙනගිය බව නිසැක ය. මන්දයත් කෘෂිකාර්මික කටයුතු සඳහා වැව් ජලය අත්‍යවශ්‍ය සාධකය විය. කෘෂිකාර්මික සමාජයක් වූ මෙම සමාජයේ පවුල වැව් ආශ්‍රිතව ගොඩනැගෙන්නට ඇති බවත් ඔවුන්ගේ එදිනෙදා කටයුතු සිරිත් විරිත් සියල්ල මේ හා සම්බන්ධව ගොඩනැගෙන්නට ඇති බව නිගමනය කළ හැකිය.

මීළඟ කරුණ සංස්කෘතිය යි. ශ්‍රී ලාංකේය සංස්කෘතිය ගොඩනැගීමට වැව ප්‍රධාන වශයෙන්ම බලපා ඇත. ඊට නිදසුනක් ලෙස **'ගමයි පන්සලයි වැවයි දාගැබයි'** යන යෙදුම පෙන්වා දිය හැකිය. මහින්දාගමනයත් සමඟ ස්ථූප ඉදිකිරීම ආරම්භ විය. සාමාන්‍ය ජනතාවට වැඳුම් පිදුම්

කළ හැකි ස්ථාන ඉදි වීම සිදු විය. දියුණු තාක්ෂණයක් සහිත වැව් ඉදිවීම සිදුවිය. ශ්‍රී ලාංකීය සංස්කෘතිය ගොඩනැගී ඇත්තේ බෞද්ධාගම මත වීම සුවිශේෂී කරුණකි. මහින්දාගමනයත් සමඟ මෙය සිදු විය. දේවානම්පියතිස්ස රජු ඉතා දියුණු තාක්ෂණයෙන් යුතු වැව් තැනීම සිදු කළේය. මීට තිසා වැව කදිම නිදසුනකි. එමෙන්ම ථූපාරාමය වැනි වැඳුම් කළ හැකි දාගැබ් ද නිර්මාණය වුනි. මෙකල සමාජයේ දාගැබ් ඉදි කිරීම ප්‍රධාන කාර්යයක් වූ අතර ඒ සඳහා වැව් සෑදීමේ දී ඉවත් කරන පිරිසිදු පස් භාවිත කර ඇති බවට මූලාශ්‍රවල සඳහන් වේ. වියළි කලාපීය ප්‍රදේශවල බොහෝ විට වැවක් ආශ්‍රිතව අපට ස්තූපයක් හඳුනාගත හැකි වේ. මීට කදිම නිදසුනක් ලෙස තිසා වැව හා රුවන්වැලි සෑ දාගැබ පෙන්වා දිය හැකිය. මෙරට සංස්කෘතියේ වැදගත් උත්සවයක් ලෙස අලුත් සහල් මංගල්‍යය පෙන්වා දිය හැකිය. මෙහි දී වැව සමඟ ද චාරිත්‍ර කිරීම අනිවාර්ය වේ. අලුත් සහලින් සැකසූ ආහාර කැවිලි ආදිය වැවට පූජා කිරීම සිදු වේ. මේ සියල්ල බෞද්ධාගමික වත් පිළිවෙත් අනුව සිදුවේ.

පණ්ඩුකාභය රජුගෙන් ආරම්භ වූ අනුරාධපුර රාජධානිය ඉතා විධිමත් මෙන්ම දීර්ඝ කාලයක් පැවති රාජධානිය විය. අනුරාධපුර රාජධානිය වැව් බැඳි රාජධානිය යනුවෙන් ද හඳුන්වයි. ඒසා විශාල වැව් ප්‍රමාණයක් නිර්මාණය විය. අනුරාධපුර යුගයේ ඉදි වූ තිසා වැව, කලා වැව, පදවිය වැව, මහකනදරා ආදි වැව් මෙරට සංස්කෘතියේ ස්වර්ණමය මතක සටහන්ය. මහින්දාගමනයත් සමඟ සංස්කෘතික අංගයන්ගෙන් පරිපූර්ණ වූ අනුරාධපුර රාජධානියේ සුවිශේෂී අංගයක් ලෙස වාරි නිර්මාණ පෙන්වා දිය හැකිය.

සමාජයක තිරසාර සංවර්ධනය සිදු වීමට නම් තවත් සාධක කිහිපයක් අවශ්‍ය වේ. මෙහි දී තාක්ෂණය ප්‍රධාන වේ. අනුරාධපුර වාරි තක්ෂණය දෙස් විදෙස් පතල ඉතා විශිෂ්ඨ වූ තාක්ෂණයකි. පණ්ඩුකාභය රජු සියලු නගරාංග සහිත රාජ්‍යයක් සමඟ වැව් නිර්මාණය ද සිදු කරන ලදී. ප්‍රථමයෙන් සිදු වී ඇත්තේ උස් භූමි දෙකකට කොටු කරමින් එක් පසකින් පමණක් ලී දඬු, අතු වැනි දෑ හරස් කොට වැව් නිර්මණය කිරීමයි. පසු කාලීනව වැව් බැම්ම, සොරොව්ව, රළපනාව, බිසෝ කොටුව ආදී අංග තාක්ෂණික වශයෙන් එක් විය. තාක්ෂණය පිළිබඳ විමසීමේ දී වසභ රජුගේ රාජ්‍ය සමයේ දී ඇළහැර ඇළ භූමියේ සමෝච්ච රේඛා අනුව ඉදි කර ඇති අතර අනුරධපුරයේ පොකුණු සඳහා නිර්මාණය කළ උමං ජලමාතිකා වැදගත් වේ. වාරි කර්මාන්තය හා බැඳුණු තත්කාලීන සමජයේ තාක්ෂණය පිළිබඳ විමසීමේ දී අමුණු, පොකුණු හා භූගත ජල මාර්ග ආදිය වැදගත් වේ. ලෝකයේ ඉදි වූ විශිෂ්ඨ පොකුණු අනුරාධපුර යුගයේදී ලංකාවේ ඉදි වී ඇත. අභයගිරිය හා ජේතවනාරාමය ආශ්‍රිතව මේ සඳහා නිදසුන් මනාවට දැකගත හැකිය.

අපට දැකිය හැකි තවත් ලක්ෂණයන් කිහිපයකි. නිවාස, ආහාර, ඇඳුම්, පාරිසරික සම්පත් මේවා අතර වේ. තත්කාලීන සමාජයේ විශාල රජ මාළිගා ඇතුළු ජනතාවට ජීවත් වීමට අවශ්‍ය නිවාස වැව් ආශ්‍රිතව තිබී ඇත. වැව් ජලය ඔස්සේ පෝෂණය ලබමින් කෘෂිකර්මාන්තය දියුණු වී ඇත. මේ නිසා ආහාර වලින් ස්වයංපෝෂිත සමාජයක් පැවති බව කිව හැකිය. ඇඳුම්, ආභරණ ආදිය ද තිබූ බවට පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වලින් මෙන්ම සාහිත්‍ය මූලාශ්‍ර වලින් ද අනාවරණය වේ. මේ සෑම අංගයකින්ම පරිපූර්ණ වූ අනුරාධපුර තත්කාලින සමාජය සමෘද්ධිමත් බවින් යුක්ත වූ බව හොඳින් ගම්‍ය වන කරුණකි. තිරසාර සංවර්ධනය සහිත සමාජයක මූලික ලක්ෂණයක් වන්නේ සමෘද්ධිමත් බවයි. වාරි කාර්මාන්තයන්ගෙන් පෝෂණය වූ අනුරාධපුර තත්කාලීන සමාජය ආහාර, නිවාස, භෞතික සම්පත්, ස්වභාවික සම්පත්, නිෂ්පාදිත සම්පත් ආදියෙන් ආඪ්‍ය වූ ආර්ථිකය, සමාජය, සංස්කෘතිය, දේශපාලනය දියුණු මට්ටමක පැවති සමෘද්ධිමත් වූ සමාජයක් බව කිව හැකිය.

පණ්ඩුකාභය රජු පිහිටවූ අනුරපුර රාජධානි යුගයේ ඉදිවූ වාරි නිර්මාණයන් තත්කාලීන සමාජයේ අවශ්‍යතාවයන් සඳහා ඉවහල් වූවා සේම එතනින් පසු පොළොන්නරු සිට මහනුවර අවධිය දක්වාම මෙම වාරි නිර්මාණයන් ඉතා ප්‍රයෝජනවත් වූ අතරම එම තාක්ෂණය ඔස්සේ පසුකාලීන රාජ්‍ය යුගවලදී වාරි නිර්මාණ සිදු කෙරුණි. වැදගත් කරුණක් වන්නේ එදා ආරම්භ වූ වාරි නිර්මාණයන් අද දක්වාම නොනැසී ඉතා ප්‍රයෝජනවත් අයුරින් පැවතීමයි. එසේ නම් අනුරාධපුර තත්කාලීන සමාජය තුළ වාරි කර්මාන්තය ඇසුරින් තිරසාර සංවර්ධනය යන්න ගොඩනැගුණු බව නිසැකවම කිව හැකිය.

## නිගමනය

විජය කුමරුගේ පැමිණීමත් සමඟ ආරම්භ වූ වාරි කර්මාන්තයේ ක්‍රිස්තු පූර්ව 247 සිට ක්‍රිස්තු වර්ෂ 362 දක්වා හා ක්‍රිස්තු වර්ෂ 362 සිට ක්‍රිස්තු වර්ෂ 1017 දක්වා සුවිශේෂී කාලයන් දෙකකි. මෙම කාලසීමාවන් දෙකෙහි වාරි කර්මාන්තය සංවර්ධනය වූවා මෙන්ම තිරසාර සංවර්ධනය යන සංකල්පය සමාජය තුළ බිහිවී තත්කාලීන සමාජය තිරසාර සංවර්ධනය කරා ගෙන යාමට වාරි කර්මාන්තය දායක විය. අනුරාධපුර සමාජයේ මිනිසුන්ගේ පැවැත්ම සහ ජීවන තත්ත්වය තහවුරු වී ඇත. එනම් තිරසාර සංවර්ධනයේ මානව කේන්ද්‍රීය බව පැවතී ඇත. දරිද්‍රතාවය තුරන් වූ සමෘද්ධිමත් සමාජයක් පැවතී ඇත. අනාගත පරපුර සමඟ සහයෝගීතාවය පැවැත්වීම මෙන්ම පරිසරය ආරක්ෂා කිරීමද සිදු වී ඇත. දේශීය වාරි කර්මාන්තය පිළිබඳ අධ්‍යයනයේ දී තිරසාර සංකල්පය හොඳින් හඳුනාගත හැකි අතර එයින් ලද දැනුමෙන් හා පුහුණුවෙන් තත්ත්කාලීන සමාජය තිරසාර සංවර්ධනය කරා යොමුවී ඇති බව හොඳින් ගම්‍යමාන වේ. උක්ත කරුණුවලට අනුව අපට නිගමනය කළ හැක්කේ අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය තත්ත්කාලීන සමාජයේ තිරසාර සංවර්ධනයට ඍජුවම දායක වී ඇති බවයි. වාරි කර්මාන්තය මතින් ගොඩනැගුණු තිරසාර සංවර්ධන සංකල්පය තත්කාලීන සමාජයේ සියලුම අංශ කෙරෙහි බලපා ඇත.

## පරිශීලන.


කුමාරචන්ද්‍ර,ඩී.බී.(2002), ***ලංකා ඉතිහාසය***, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය.

කොඩ්රින්ටන්,ඩබ්.එච්.(2005), ***ලංකා ඉතිහාසය***, නැණිල පබ්ලිකේෂන් (පෞද්.)සමාගම, කොළඹ.

නිකලස්, සී. ඩබ්ලියු., (1972) ***කෘෂිකර්මය සහ ජලානයනය, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, කාණ්ඩය සසල*** විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයල 526-530 පිටු.

විතානාච්චි,සී.ආර්.(2017),***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය***, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07.

විතානාච්චි, සී. ආර්., (2012) ***මූල ඓතිහාසික අවධිය, ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම සල*** කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 43- 64 පිටු.

සුරංජි, ඊ. (2015), ***අනුරාධපුර යුගයේ පැවති කෘෂිකාර්මික කටයුතු පිළිබඳ විමර්ශනයක්***, සරසවිලේඛා සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.

# 03. වියළි කලාපීය වැව හා සබැඳි සාම්ප්‍රදායික රීති පද්ධතිය හා එහි වර්තමාන අනාගත ප්‍රවණතා

අයි.ඒ.වී.පී.කේ.කුමාරි

## හැඳින්වීම

ස්වාභාවධර්මයා විසින් වියළි කලාපීය අතීත ජනයාගේ ජල අවශ්‍යතාවයට එල්ල කරන ලද්දා වූ අභියෝගයට සාර්ථකව මුහුණ දීම වෙනුවෙන් ආදී කාලීන ලාංකිකයා යොදා ගන්නා ලද සාර්ථක උපක්‍රමයෙහි ප්‍රතිඵලය ලෙසින් වාරිමාර්ග පද්ධතිය නම් විශ්මිත නිර්මාණය බිහිවන්නට විය. පූර්ව ඓතිහාසික අවදියේ මුල් කාලයේ දී වියළි කලාපීය ජනයා සිය ජල අවශ්‍යතා සපුරාගෙන ඇත්තේ ස්වාභාවිකව නිර්මාණය වූ රැළි භූමි හේතුවෙන් හැඩගැසී තිබූ 'පතස්/පතහ' නම්වන වර්ෂා ජලය ඒකරාශී වූ කුඩා පොකුණු හරහා බව විද්වත් මතය වී ඇත. ඉන්පසු අවදියේ දී මූලාශ්‍රයමය ගත තොරතුරු මත පෙනී යන්නේ ජනයා සිය කෘෂිකාර්මික අවශ්‍යතා වෙනුවෙන් වැව් නිර්මාණය වෙත යොමු වූ බවයි. ඒ පිළිබඳව තොරතුරු වංශකතාවන්හි නොදැක්වුණත් ශිලා ලේඛන ආශ්‍රිතව යම් තොරතුරු ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

ක්‍රමයෙන් සිදු වූ ජනගහන වර්ධනයත් සමඟ ඇති වූ ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය යටතේ තරමක් විශාල වැව් නිර්මාණය වී ඇති අතර මුල්කාලීන රජවරුන් ඒ අයුරින් ඊට අනුග්‍රහය දැක්විය. ක්‍රමිකව සිදු වූ ජනගහණ ප්‍රසාරණය සමඟ ඇති වූ ආහාර අවශ්‍යතාවයන්ට පිළියම් සෙවීම වෙනුවෙන් ක්‍රි.පූ. 1 වන සියවසේ සිට මහා වැව් ඉදිවන්නට පටන් ගැණුනු බව ලිඛිතමය සාධක ඇසුරින් නිගමනය කළ හැකිය. පොළොන්නරු අවදියේ මහා පැරකුම් රාජ්‍ය සමයේ සිට ශ්‍රී ලාංකිකයෝ සමුදුරු පරයන වැව් තැනීමට යොමු වූයේ දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් ද සමඟයි. කෙසේ හෝ රජරට ප්‍රදේශයේහි සෑම ගමකටම පාහේ වැවක් තිබුණු බවට සාධක දැනුදු හඳුනාගත හැකිය.

ඒ අයුරින් අතීත ජනයාගේ ජල අවශ්‍යතාවයන් වෙනුවෙන් නිර්මාණය කර ගන්නා ලද වැව් ආරක්ෂා කර ගැනීම සඳහා අතීත ජනයා විවිධ ක්‍රමවේද අනුගමනය කර ඇත. ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ වැව් ජලය පමණක් නොව, වැව හා සම්බන්ධ වන සියලුම අංගයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් විවිධාකාර වූ ක්‍රියාමාර්ග ගෙන ඇති බවයි. ඇතැම් ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි ජනයා යොමු වී ඇත්තේ ඔවුන් වැව් පරිහරණය කිරීමේ දී මුහුණ දීමට සිදු වූ අපහසුතා හා ලද අත්දැකීම් මත බව පැහැදිලිව හඳුනාගත හැකිය. ඒ ආශ්‍රිතව ඔවුන් සාම්ප්‍රදායිකව රීති පද්ධතියක් පවත්වාගෙන එනු ලබයි. ව්‍යවහාරයේ දී තහංචි නමින් හඳුන්වනු ලබන මෙම රීති පද්ධතිය සමාජය ලද අත්දැකීම් මත ඔවුන් විසින්ම ගොඩනගා ගන්නා ලද්දක් බව පැහැදිලිය. මෙම රීති පද්ධතිය වර්තමානයේ දී ද වැව් ගම්මාන ආශ්‍රිතව ක්‍රියාත්මක වන අතර නාමික වශයෙන් විවිධ වෙනස්කම් පැවතියත් ඒ සියල්ලකින්ම වැවේ තිරසාර පැවැත්ම තහවුරු කිරීම සිදු කරනු ලබයි. මෙහිදී එකී වැව් ආශ්‍රිත සාම්ප්‍රදායික රිති පද්ධතිය පිළිබඳ විමසීමක් සිදුකරනු ඇත.

## ක්‍රමවේදය

වැව හා සම්බන්ධ සාම්ප්‍රදායික රීති පද්ධතිය හා එහි වර්තමාන හා අනාගත ප්‍රවණතාවයන් පිරික්සීමක් යන මැයෙන් සිදු කරනු ලබන මෙම පර්යේෂණයේ ප්‍රධානතම අරමුණු වශයෙන් වැව හා සම්බන්ධව අතීතයේ සිට ගොඩනැගී පැවත එන්නා වු සාම්ප්‍රදායික රීති පද්ධතිය හඳුනාගැනීම හා එහි වර්තමාන අනාගත ප්‍රවණතා පිරික්සීමයි. මෙහි උප අරමුණු වශයෙන්

අදාල රීති පද්ධතියෙන් අපේක්ෂිත අරමුණු හඳුනාගැනීම හා අදාල රීති පද්ධතියෙහි ඇති වටිනාකම සමාජගත කිරීමත් අපේක්ෂා කරනු ලබයි.

දත්ත ලබා ගැනීම සඳහා ප්‍රධාන ආකාර ද්විත්වයක් මෙහි දී අනුගමනය කරන ලදී. ඒ ද්විතියික ක්‍රමවේදයන් හා ප්‍රාථමික ක්‍රමවේදයන්ය. මූලික වශයෙන් තොරතුරු රැස් කර ගැනීම සඳහා ද්විතියික ක්‍රමවේද යටතේ පුස්තකාල අධ්‍යනයේ යෙදුනි. අධ්‍යනයට අදාල තොරතුරු රැස්කර ගැනීම සඳහා ප්‍රාථමික ක්‍රමවේද යටතේ සම්මුඛ සාකච්ඡාවන්හි නියලෙන ලදී. එහිදී අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පවත්වන ලද්දේ තොරතුරු නිසි පරිදි රැස්කර ගැනීමේ අරමුණ ඇතිවය.

**විමර්ශනය**

ස්වාභාවික පරිසරයෙන් රැස් කරගන්නා ලද ආහාර ද්‍රව්‍යයන් සිය ආහාර අවශ්‍යතා වෙනුවෙන් අපේ ආදිතමයන් භාවිත කළ බව අපි දනිමු. නමුත් ජනගහන වර්ධනයත්, ස්ථිරවාසීතාවයත් සමඟ තම ආහාර නිෂ්පාදනය කර ගැනීමට ඔවුන් ක්‍රමයෙන් යොමු වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකර්මාන්තය බිහි වූ අතර ක්‍රමයෙන් සිදු වූ ජනගහන වර්ධනයට සමානුරූපීව ආහාර නිශ්පාදනයන් වෙනුවෙන් කෘෂිකාර්මික කටයුතු පුලුල් කරන්නට ද සිදු විය. නමුත් එලෙස කෘෂිකාර්මික බිම් පුලුල් කිරීමේ දී ඔවුන්ට මුහුණදීමට සිදු වූ ප්‍රධානතම අභියෝගය වූයේ වර්ෂා ජලය ප්‍රමාණවත් නොවීමයි. එම අභියෝගයට සාර්ථකව මුහුණ දුන් අතීත ලාංකිකයා ඒ සඳහා වැව් නිර්මාණය කරන්නට විය. කුඩා ශ්‍රමයකින් නිර්මාණය ඇරඹි ගම් වැව්වල සිට සමුදුරු පරයන් වැව් නිර්මාණය දක්වා මෙම තාක්ෂණය ක්‍රමයෙන් දියුණුවට ලක්ව ඇති බව අපට වර්තමානයේ දී හඳුනාගැනීමට හැකිය.

මේ අයුරින් සිය කෘෂිකාර්මික කටයුතු සඳහා පමණක් නොව එදිනෙදා අවශ්‍යතා වෙනුවෙන් ද ජලය රැස්කර තබා ගැනීමට අතීත ජනයා භාවිත කරන ලද්දේ වැවයි. එහි දී වැවේ පැවැත්ම, ජලය අරපිරිමැසුම්දායකව භාවිත කිරීම, නඩත්තුව, ජලයේ පිරිසිදු බව පවත්වා ගැනීම යන සියලුම කාරණාවන් වෙත පැරැණ්නන් වැඩි අවදානයක් යොමු කරවා ඇති බව හඳුනාගත හැකිය. එහ දී වැව හා සම්බන්ධ වගකිවයුතු පිරිසක් වැව වටා වූ සමාජයේ බිහි වී සිට ඇත. ඒ අතර ගමරාල, විදානේ, අණුමැතිරාල, ගුරුන්වහන්සේ, වෙදමහතා යනාදින් වෙයි. මෙම සියලුම තනතුරු නිර්මාණය කොට ඇත්තේ වැව හා සම්බන්ධ වූ විවිධ කාර්යයන්ට අනුකූල වන පරිදිය. ඒ ඒ නිළධාරියාට පැවරුනු වගකීම් ප්‍රමාණයක් පැවති අතර වැව හා සම්බන්ධ සියලුම කාර්යයන් මෙම පිරිසේ අනුදැනුම මත සිදුව තිබේ. ගමක පිහිටන වැවක නඩත්තු කිරීමේ බලය, වගකීම හිමිවන්නේ ගමරාලට හෝ විදානේටය. වැව ගමේ සියල්ලන්ටම උරුම වූවක් වූවද වැව හා සම්බන්ධ සියලුම තීන්දු තීරණ ගන්නා ලද්දේ ඔවුන් දැනුවත්වය. වැව හා සම්බන්ධ තහංචි පැනවීම් ආදියේ බලය ලබා සිටියේ ද මෙම පිරිසමය. වැවෙහි හා වැව් දියෙහි වටිනාකම වටහා ගන්නා ලද අතීත ලාංකිකයා සිය දැනුම උපයෝගී කර ගනිමින් වැව හා වැව් ජලය ආරක්ෂා කර ගැනීමට, මත්ස්‍ය සම්පත රැකගැනීමට මෙන්ම වැවේ පැවැත්ම වෙනුවෙන් විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේ. එවැනි ක්‍රියාමාර්ග එකිනෙක පහත පරිදි විස්තර කළ හැකිය.

**මංකඩ වෙන් කිරීම**

ගම සතුව ඇති වටිනාම වස්තුව සේ සැලකු වැව හා වැව් දිය භාවිතයේ දී ගැමියන් ඉතා සුපරික්ෂාකාරීව කටයුතු කර ඇත. වැවේ ජලය උපරිම ලෙස පිරිමැසුම්දායකව පවත්වාගෙන යෑම සඳහා අතීත ජනයා භාවිත කරන ලද එක් උපක්‍රමයක් ලෙසින් වැවේ මංකඩ වෙන් කිරීම දැක්විය හැකිය. මංකඩ යනුවෙන් හඳුන්වනු ලබන්නේ වැවේ ජලය පරිභෝජනය වෙනුවෙන් වැව් දියට බැසීමට වෙන්කරවා ඇති ස්ථානයන්ය. වැවක ජලය පරිභෝජනය කිරීම ගමේ

සියල්ලන්ගේම අයිතියක් වුවත් සිය කාර්යයන් සඳහා වෙන් වූ මංකඩ භාවිත කිරීම වැව හා සම්බන්ධ ප්‍රධාන රීතියකි. වැවක ප්‍රධාන මංකඩ හතරකි.

1. දිය මංකඩ - පානීය ජල අවශ්‍යතා වෙනුවෙන් ජලය ලබා ගත් ස්ථානය
2. නාන මංකඩ - ජලය ස්නානය සඳහා වෙන්කරවා ඇති ස්ථානය.
3. ඇපුල්ලුම් මංකඩ - රෙදි සේදීම සිදු කරන ලද ස්ථානය
4. බොරදිය මංකඩ - සතුන් දිය බීමට නැහැවීමට වෙන් කර තිබූ ස්ථානය

**දිය මංකඩේ තහංචි**

ගැමියන්ගේ පානීය ජල අවශ්‍යතාවන් සඳහා ජලය ලබා ගැනීම වෙනුවෙන් වැව භාවිත වූයේ වියළි කලාපයේ පවතින ජල මූලාශ්‍රයන්හි හිඟතාවය හේතුවෙනි. එහිදී වැවේ ජලයෙහි පිරිසිදු භාවය පිළිබඳව මෙන්ම පරාර්ථකාමී ලෙස ජලය ලබා ගැනීමට ජනයා යොමුව සිට ඇත. ඒ සඳහා ඔවුන් විවිධ තහංචි පනවාගෙන තිබේ. දියමංකඩෙහි ස්නානය කිරීම, රෙදි සේදීම ආදී කටයුතු කිරිම තහංචිය. එමෙන්ම බෝවන රෝග වන සරම්ප, පැපොල ආදී වූ ජනවහරේ දෙයියන්ගේ ලෙඩ නමින් හඳුන්වන රෝග වැළඳුනු පුද්ගලයන්ට හා දද, කුෂ්ඨ ආදී වූ රෝග වැළඳුනු පුද්ගලයන්ට දියමංකඩට බැසීම තහංචිය. තවද දියමංකඩෙන් ජලය ලබා ගැනීමේ දී ජලය බොරවන සේ ජලය කළවලට පුරවා ගැනීම තහංචිය. එපමණක් නොව සතුන්ට දිය බීමට, නැහැවීමට ආදියට දියමංකඩට බැස්සවීම ද තහංචිකි. මෙම සියලුම රීති ඔස්සේ ඔවුන් බලාපොරොත්තු වී ඇත්තේ පානීය අවශ්‍යතා වෙනුවෙන් ලබා ගන්නා ජලය පිරිසිදුභාවයෙන් යුක්තව ලබා ගැනීමයි. දියමංකඩ රෙදි සේදීමට, ස්නානයට, සතුන්ගේ පරිභෝජනයට භාවිත නොකරන ලද්දේ ජලය අපවිත්‍ර වීම වළක්වා ගැනීමේ අටියෙනි. බෝවන රෝග වැළඳුනු පුද්ගලයන්හට දියමංකඩ තහනම් වූයේ එයින් ගම්වැසියන්ගේ සෞඛ්‍යාරක්ෂාවට යම් තර්ජනයක් එල්ල වීමට ඇති ඉඩ අවම කර ගැනීම උදෙසාය.

**නාන මංකඩේ තහංචි**

ස්නානීය අවශ්‍යතාවයන් වෙනුවෙන් වෙන්කර තිබුණු නාන මංකඩ දිය මංකඩට තරමක් ඈතින් පිහිටා තිබුණි. ගැහැණු හා පිරිමි පාර්ශවයන්ට වෙන වෙනම මංකඩවල් පිහිටුවා තිබුණු අතර ඒවා නිසි පරිදි පරිභෝජනය කිරීම අනිවාර්යය විය. එය සදාචාරාත්මක වශයෙන් වූ කාරණයකි. නාන මංකඩට බෝවන රෝග ඇත්තවුන්ට බැසීම තහංචිය. ඊට හේතුව වූයේ ගම්වැසියන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීමයි. නාන මංකඩට ගවයින් එළුවන් වැනි සතුන් බැස්සවීම, නැහැවීම ද තහනම් ය. එමෙන්ම නාන මංකඩ ආශ්‍රිතව මසුන් ඇල්ලීමත් තහනම්ය. ඒ සියලුම රීති පනවා ඇත්තේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙනි.

**බොරදිය මංකඩ**

බොරදියමංකඩ යනු සිය කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් සමය දක්වූ ගවයින්, එළුවන් ආදී සතුන් වෙනුවෙන් වෙන්කර තිබූ ස්ථානයයි. මෙම මංකඩ අනෙක් මංකඩවලින් තරමක් ඈතින් පිහිටවා තිබුණි. සතුන්ට අනෙක් මංකඩවලට බැසීම තහනම් වුවත් සතුන් නැහැවීම, ජලය ලබා දීම ආදී වූ කාර්යයන්ට මෙහි අවකාශය සලසා දී තිබුණි. මෙම මංකඩෙන් පානිය අවශ්‍යතාවයන් වෙනුවෙන් ජලය ලබා ගැනීම තහංචිය. වැවේ ජලය මනුෂ්‍යාන්ට මෙන්ම සිය කටයුතු සඳහා සහය දක්වන සත්ව කොට්ඨාසයන්ට ද වෙන් කර තිබූ බව මෙයින් පැහැදිලි වේ.

**ඇපුල්ලුම් මංකඩ තහංචි**

මෙම මංකඩ වෙන් වී පැවතියේ රදා කුලයේ පිරිස් වෙතය. ඔවුන් ගැමියන්ගේ විශේෂිත අවශ්‍යතා වෙනුවෙන් පිරුවට සැපයූ, ඒවා පිරිසිදු කිරීමේ කාර්යයයේ නියලුනු පිරිසයි. පොදුවේ භාවිත වූ පිරුවට පිරිසිදු කිරීමේ දී මෙම මංකඩ භාවිත වූ අතර නාන මංකඩ, දියමංකඩ මෙම කාර්යයන් සඳහා යොදා ගැනීම තහනම් විය. එයද ගමේ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් ගන්නා ලද ක්‍රියාමාර්ගයන් ලෙස පෙන්වා දිය හැකිය.

මේ ආකාරයෙන් මංකඩ වෙන් කරමින් වැව් දිය තිරසාර ලෙස භාවිත කිරීම සිදු කරන ලද අතීත ජනයා තවත් විවිධ වූ ක්‍රමවේද අනුගමනය කර තිබෙන්නේ වැව් දියෙහි වූ වටිනාකම ඔවුන් හොඳින් අවබෝධ කරගෙන සිටීම හේතුවෙනි. වැව් ජලය ලබා ගැනීමේ දී, වැව් ජලය ගබඩා කර ගැනීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් වූ වැසියන් ඒ වෙනුවෙන් ද රීති පද්ධතියක් සකසාගෙන තිබුණි. එහිදී වැව් බැම්ම, වැවේ ඉහත්තැව මෙන්ම සොරොව්වට පිටතින් වූ කට්ටකඩුව පිළිබඳව ද අවදානය යොමු කර තිබුණි.

**කට්ට කැපීම**

වැවේ පැවැත්ම තහවුරු කිරීම වෙනුවෙන් ගැමියන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගයක් ලෙස කට්ට කැපීම ක්‍රියාත්මක වේ. ඇතැම් ප්‍රදේශවල මෙය කට්ට රාජකාරිය ලෙස ද ව්‍යවහාර කරනු ලබයි. මෙම ක්‍රියාවලිය සිදුකරනුයේ මහ වැසි ඇදහැලීමට ප්‍රථමවය. ඒ සඳහා වැවෙන් යැපෙන්නා වූ සියලුම දෙනා දින කිහිපයක් සිය ශ්‍රම දායකත්වය දැක්වීම අනිවාර්ය වේ. මෙහිදී වැව් බැම්මේ ඇති වී ඇති 'ගොංගැව්ලි' හා 'වෑ කඩවල' පස් දමා පිළිසකර කිරීම සිදු කරයි. ගොංගැව්ලි යනු ගවයන් වැවට බැසීමේ දී ඇති වූ කඩතොලු වන අතර වෑ කඩවල යනු වැව් බැම්ම කැඩී ගොස් ඇති ස්ථානයන්ය. එසේ කිරීමෙන් බලාපොරොත්තු වන්නේ වැව් බැම්මේ පැවැත්ම තහවුරු කිරීමත් ජලය රැස්කර තබා ගැනීමට උචිත ලෙස වැව් බැම්ම ශක්තිමත් කිරීමත්ය.

**වනාත් කෙටීම**

මෙහි දී වැව් බැම්මේ කැලය කපා ශුද්ධ කිරීම සිදු කරනු ලබයි. මෙහි දී වැව් ජලය පරිභෝජනය කරන්නා වූ පිරිස් අතර වැව් බැම්ම බඹ වශයෙන් බෙදීමකට ලක් කරයි. එලෙස තමන්ට හිමිවන බිම් ප්‍රමාණය ශුද්ධ කිරීම අනිවාර්යය වේ. ඉඩම් හිමියා හෝ අඳ ගොවියා අතින් එය සිදු කිරීම මඟහැරිය නොහැක්කකි. මෙමඟින් ඔවුන් තම අවශ්‍යතාවයන් සියල්ලටම සේවාව සැපයූ වැවෙහි පැවැත්ම තහවුරු කර ගැනීමක් සිදු කරනු ලබයි.

**වැව් තාවුල්ලේ තහංචි**

වැව් තාවුල්ල හෙවත් ඉහත්තැව නමින් හඳුන්වනු ලබන්නේ වැවේ පෝෂණ කලාපයයි. වැවට ජලය ලබා දෙන මෙම කලාපය තුළ පන් විශේෂ, බෝල්පනා, කුරටිය, මයිලපිල, කොටකිඹුල, හොර, කුඹුක් ආදී ශාක බහුලව හඳුනාගත හැකි අතර පඳුරු ලඳු කැලෑ ලක්ෂණ සහිත බවක් හඳුනාගත හැකිය. වැව් ඉස්මත්තේ මේ අයුරින් ශාක බහුලව වැවීමට ඉඩ හැරීම සිරිතකි. ඊට හේතුව වන්නේ වැවට පිටතින් ගලා එන අපද්‍රව්‍ය, රොන්මඩ ආදිය එක්වීම වැළැක්වීමයි. වැව්තාවුල්ලේ පිහිටි පන් වර්ග කිසිදු හේතුවක් උදෙසා ගැලවීම තහනම්ය. එමෙන්ම ඒ ආශ්‍රිතව ඇති කිසිදු ශාකයකට හානි කිරීම ද තහනම්ය. තවද ඒ ආශ්‍රිතව හේන් කෙටීම, ගවගාල් සෑදවීම, ගවයින්ට තණකොළ කැපීම ආදිය ද තහනම්ය. ශාක ගැලවීම, කපා දැමීම හා සතුන්ගේ කුරවලට තැලීම ආදිය නිසා ශාක ගහනය අඩු වී යා හැකිය. එයින් වැවට ගලා එන ජලය සමඟ ඇති අපද්‍රව්‍ය වැව තුළට එක් වීමෙන් වැව ඉක්මනින් පිරීගොස් ගබඩා කරගත හැකි ජල පරිමාව අවම විය හැකිය. එමෙන්ම හේන් කෙටීම නිසාවෙන් ජල මූලාශ්‍රයන් අපවිත්‍ර වීමටත් ජලය අඩු

වීමටත් ඇති හැකියාව අවම කර ඇත්තා සේම ගවගාල් තහනම් කිරීමෙන් ජලය අපවිත්‍ර වීම වළක්වාගෙන තිබේ.

**කට්ටකඩුව ආශ්‍රිත තහංචි**

වැව්වල ජලය අධික ලවණතාවයකින් යුක්තය. එම ජලය වී වගාවන්ට සුදුසු නොවන නිසා පැරණි ජනයා වගා බිම් වෙත ලබා ගැනීමේ දී කට්ටකඩුව හරහා ජලය ලබා ගැනීම සිදුකර තිබේ. සොරොව්වෙන් එපිට පිහිටි කට්ටකඩුව යනු කුඹුක්, අමුක්කන්, පන්, ගල්ලැහැපන්, වැටකෙයියා, මී ආදී ගස් වැඩී ඇති කුඩා ලියද්දක් තරම් වූ කොටසකි. මේ හරහා ජලය ගලාගෙන යෑමේ දී ශාකවල මූල පද්ධතියෙන් ලවණ උරා ගැනීම සිදු වේ. මෙම සංකල්පය හේතුවෙන් කට්ටකඩුවේ ඇති ශාකවලට හානි කිරීම ද තහංචිය.

**අණබෝල බැඳීම හෙවත් බොලතු බැඳීම**

අණබෝල බැඳීම ලෙසත් ඇතැම් ප්‍රදේශවල බෝලඅතු බැඳීම ලෙසත් ව්‍යවහාර කරනු ලබන ක්‍රමවේදය වැව් ජලය සිඳී යන විට කරනු ලබන ආඥාවක් ලෙස දැක්විය හැකිය. මෙහි දී සිදු කරනු ලබන්නේ වැවේ ජලය සිඳී යන කාලයට වැව් ජලය පරිභෝජනය කළ යුතු ආකාරය පිළිබඳව ආඥාවක් නිකුත් කිරීමයි. මෙම තහනම පැනවූයේ ගමරාල හෝ විදානේ විසිනි. මෙම ආඥාව නිකුත් කිරීමේ දී සාමාන්‍යයෙන් සිදු කරනුයේ බොල්පනා තුන්මිටක් හෝ ඉහකොළ තුන් මිටක් දිවිකඳුරු රිටක පහතට වැටෙන සේ ජලයෙන් ඉහළට බැඳ සිටවා තැබීමයි. එම ආඥාව නිකුත් කිරීමෙන් අනතුරුව මාළු ඇල්ලීම, වැවේ ජලය පරිභෝජනය කිරීම, හුණු සෑදීමට කුඹුක් මුල් කැපීම ආදිය තහනමට ලක්වේ. මෙහි හුණු සෑදීම යනුවෙන් දක්වා ඇත්තේ වියළි කලාපීය ජනයා බුලත්විට කෑමට භාවිත කරන හුණු වැව ආශ්‍රිතව ඇති කුඹුක් මුල් පිළිස්සීමෙන් සකසා ගන්නා ක්‍රියාවලියයි. මෙම ආඥාවන් කඩකරන්නවුන්ට දඬුවම් ලබා දෙනුයේ සම්මුති තීරණයන්ට අනුවය. ඔවුන්ට තොවිල් තහංචිය, මඟුල්තුලා තහංචිය, දිය තහංචිය ආදී දඬුවම්වලට මුහුණ දීමට සිදු විය.

**මුළු මසුන් ඇල්ලීම**

මුළු මසුන් ඇල්ලීම සිදු කරනුයේ ද වැවේ ජලය අඩු වීමෙන් පසුව ය. මෙම කාර්යයට ගමේ සියලුම දෙනා සහභාගී කරගත් අතර මෙය ගැමියන්ගේ සාමූහිකත්වය, අන්‍යෝන්‍ය සහජීවනය, බෙදා හදාගෙන භුක්ති විඳීම, සමානාත්මතාවය පිළිබිඹුවන අවස්ථාවකි. විදානේගේ දැනුම් දීමෙන් අනතුරුව වැවේ සංහිඳට එක්රොක්වන තරුණ පිරිස් පුල්ලයාර් දෙවියන්ට කෙරෙන යාතිකාවකින් පසු කරක්ගෙඩිය ගෙන වැවට බසිති. කරක යනු මාළු ඇල්ලීම සඳහා භාවිත කරන උපකරණයකි. මසුන් ඇල්ලීමේ දී රීති ගණනාවකි. පැටව්පොළ රකින මාළුන් ඇල්ලීම තහංචිය. ලොකු ලූලන් හැර තිත්තයින්, දණ්ඩි, කාවයියන්, පෙතියන්, කනයින්, කොකුස්සන්, හිරිකනයින්, තෙලියෝ, අංගුට්ටන් ආදී මත්ස්‍ය විශේෂ කරකට හසුවුවහොත් නැවත මුදාහැරීම කළ යුතුය. කරවැල් පොඩිකොට මාළුන් මත් කොට මසුන් මැරීම තහංචිය. පොඩි මාළුන් හසුවන ලෙස දැල් කුඩා දමා මාළු ඇල්ලීම තහංචිය. මෙම තහංචිවලට යටත්ව අල්ලන මසුන් ගමේ සියලුම දෙනාට බෙදා දීම සිරිතය. එහි දී වැන්දඹු කාන්තාවන්ට පවා මාළු ලබා දීම සිදුකරයි. මේ අයුරින් අතීත ජනයා වැව හා වැව් දිය රැක ගැනීමේ අරමුණින් විවිධ වූ ක්‍රියාමාර්ග ගෙන කටයුතු කර ඇත්තේ අනාගතය වෙතත් වැව නම් වන වටිනා නිර්මාණය දායාද කිරීමේ අරමුණ සහිතවය.

**නිගමනය**

වැව අතීත ජනයා සිය වටිනාම වස්තුව සේ සලකමින් එය ආරක්ෂා සහිතව භාවිත කර අනාගත පරපුර වෙත දායාද කිරිමට අති විශාල වෙහෙසක් දරා ඇති බව පැහැදිලිව හඳුනාගත හැකි විය. ඔවුන් ඒ සඳහා සිය ජීවිතයේ ලත් අත්දැකීම්, සිය මුතුන්මිත්තන්ගෙන් ලබා ගත් දැනුම මෙන්ම සමාජය තුළ ජීවත් වීමෙන් ගන්නා ලද දැනුම ද යොදාගෙන ඇති බව පැහැදිලිය. පොතපතින් විද්‍යාත්මක දැනුමක් ලබා නොසිටිය ද ඔවුන් අදාල විද්‍යාත්මක කාරණාවන් තේරුම්ගෙන මනා ලෙස වැව හා වැව් දිය භාවිත කරමින් ඊට අදාල පිලියම් ස්වාභාවධර්මයාගෙන්ම සපයා ගනිමින් කටයුතු කර ඇති ආකාරය අගය කළ යුතුමය. කෙසේ වුවද වර්තමානය වන විට අතීතයේ තරම් මෙම රීති පද්ධතිය වෙත අවදානයක් යොමු නොවුනත් මෙම රීති ඒ අයුරින්ම පිළිපදින්නා වූ පිරිසක් ද ඇතැම් ගම්මාන ආශ්‍රිතව තවමත් හඳුනාගැනීමට හැකිය. වර්තමාන සමාජ, ආර්ථික, දේශපාලනිකමය ක්‍රියාවලින්හි සිදුව ඇති වෙනස්කම් හා සිදුවන සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් මෙම රීති පද්ධති බෙහෙවින් සමාජයෙන් ගිලිහී යන බවක් ද හඳුනාගත හැකිය. එමෙන්ම අද වනවිට විදානේ, ගමරාල යන තනතුරු දැරුවන් නාමික තනතුරු දරන්නන් බවට පත්ව ඇති අතර සාම්ප්‍රදායික දැනුම උකහා ගැනීමට වර්මාන සමාජය වැඩි අවදානයක් යොමු නොකරන බවද හඳුනාගත හැකි කාරණයකි.

මෙහිදී අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ අතීතයේ සිට වැව නම් වටිනා නිර්මාණය ආරක්ෂා කර ගැනීම සිය වගකීමක් ලෙස සැලකූ පිරිසක් විසින් තමන්ට මුහුණ දීමට සිදු වූ අපහසුතා මඟහරවා ගැනීමට සාම්ප්‍රදායයිකව වැව ආශ්‍රිතව රීති පද්ධතියක් ගොඩනගාගෙන ඇති බවයි. එමෙන්ම මෙම රීති පද්ධතිය කිසිවෙකුට හානිදායක නොවූ අතර එය වැව, වැව් දිය තිරසාර ලෙසින් භාවිත කිරීමට ගන්නා ලද වටිනා පියවරක් වශයෙන් පෙන්වාදිය හැකිය. වර්තමානය පිළිබඳව සැලකීමේ දී පෙනීයන කාරණය වන්නේ මෙම රීති පද්ධතිය ක්‍රමයෙන් සමාජයෙන් ගිලිහී යන බවකි. කෙසේ වුවද මෙම රීති පද්ධතියෙහි ඇති වටිනාකම සමාජගත කොට වැව ආරක්ෂා කිරීමට මෙම ක්‍රමවේදයන් අනුගමනය කිරීම ඉතා වැදගත් කොට සැලකිය හැකිය.

**පරිශීලන**

සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (2013) ***ඉතිහාස තරංග***, ආරිය ප්‍රකාශකයෝ, බෞද්ධ විශ්වවිද්‍යාලය මාවත, වරකපොල

***සම්මුඛ සාකච්ඡා***

ගුණසේන, ජී. පී. 57, විදුහල්පති. ඒ යාය, පදවිය. 2021/12/29

දිල්රංග, ජී. පී. කේ. 24, ශිෂ්‍ය විද්‍යාර්ථී, රජරට විශ්වවිද්‍යාලය, හල්මිල්වැටිය, කැබිතිගොල්ලෑව. 2021/12/30

සෙනෙවිරත්න, පද්මලතා. 59 ගොවිතැන, කුණුරාගම පාර, සීප්පුකුලම. 2022/01/04

සෙනෙවිරත්න, පී.එම්.එස්. 24, ශිෂ්‍ය විද්‍යාර්ථී, කුණුරාගම පාර, සීප්පුකුලම. 2022/01/04

ජයතිලක, ඊ. එම්. 58, ගොවිතැන, නාහෙට්ටිකුලම, මහනාන්නේරිය, ගල්ගමුව. 2022/01/03

# 04. පුරාණ ලාංකේය වාරි තාක්ෂණ ක්‍රමවේදය සහ උපයෝගීතාවය

බී.එස්.පී.කුමාරි

## හැඳින්වීම

පුරාණ ලාංකික ප්‍රජාවගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මයයි. එය ආරම්භ වූයේ කවදාදැයි නිශ්චිත ලෙස කිවනොහැකි වුවත් ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයට සියවස් කිහිපයකට පෙරසිට ම ශ්‍රී ලාංකික ජනයා කෘෂි අර්ථ ක්‍රමයකට හැඩගැසෙමින් සිටි බව පුරාවිද්‍යාත්මක සාක්ෂි තුළින් ප්‍රත්‍යක්ෂය. ලෝකයේ ආදිතම ගොවිතැන් ක්‍රමය වන හේන් ගොවිතැන් ක්‍රමය මඟින් එය ආරම්භ වන්නට හැකි නමුත් පසුකාලීන ආර්ථික හා සමාජීය ජීවිතයේ පදනම වූයේ වී ගොවිතැනය. එහිදී පුරාවිද්‍යාත්මක මෙන්ම මහාවංසයට අනුව ලංකාවේ මුල් ජනාවාස ගංගා නිම්න ආශ්‍රිතව ගොඩනැගුණු බව සඳහන් වන අතර පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි විහිදී ඇති ස්වභාවය අනුව එම ජනාවාස ලංකාවේ දූනට ඇති ප්‍රධාන ගංගා හා ඔයවල් ගොවිතැනට අවශ්‍ය එම සාධකයන් සැපයීමේ න්‍යාය ඔස්සේ වර්ධනය වී තිබේ.

මුල් කාලයේ වී ගොවිතැන සඳහා භාවිත කළ ක්‍රම දෙකක් පැවතිණි. කැළෑව එළිපෙහෙළි කරගත් බිම් කැබලිවල හැල් වී වගා කිරීම ඉන් එක් ක්‍රමයකි. එම ක්‍රමයට අනුව කඳු සහිත ප්‍රදේශවල පවා වී වගාව කළ හැකි විය. මේ සඳහා ජලාශ මඟින් ජලය නොසැපයූ අතර වැසි ජලයෙන් පමණක් ඔවුන් ප්‍රයෝජනගත් බව පෙනේ. ජලාශ මඟින් හෝ වෙනත් වාරි ක්‍රමයකින් සෑම කන්නයකදී ම කුඹුරුවල වී වගා කිරීම දෙවෙනි ක්‍රමය වේ. පස නිසරුවීමේ හේතුව නිසා සෑම කල්හිම එකම බිම් කැබැල්ලක වගා කළ නොහැකි වන බැවින් සෘතුවෙන් සෘතුවට වෙනස්වන සුලු වර්ෂාපතනය ගැන පමණක් බලාපොරොත්තු නොතබා වගාකළ හැකි වෙනත් ක්‍රමයක් අවශ්‍ය බව පැරණි ශ්‍රී ලාංකිකයාට අවබෝධ වූ හෙයින් අවශ්‍ය වූ විට කුඹුරුවලට බෙදාහැරීම සඳහා වර්ෂා කාලයේදී ජලය ආරක්ෂා කර තබා ගතහැකි ක්‍රමයක් අවශ්‍ය විය. මෙලෙස ඇතිවූ පළමු අදහස් හේතුවෙන් කුඩා වැව් සෑදීම පිළිබඳ මූලික පදනම සැකසීය. එය ශ්‍රී ලංකාවේ වාරි කාර්මික සමාජයේත් ආර්ථික ශක්තියේත් මූලික පදනම් සැකසීමේ සමාරම්භක අවස්ථාව සනිටුහන් කළේය. ඒ අනුව මෙම වාරි කාර්මික සමාජ පසුබිම නිර්මාණය වීමෙහිලා සැබවින්ම ඔවුන් මෙහෙයවන ලද්දේ මොවුන්ගේ ආවේණික දක්ෂතා මතුකරන ලද්දේ ද සිය මව්බිමෙහි ස්වභාවික පරිසරය විසිනි. දිවයිනේ භූමි ප්‍රමාණයෙන් සියයට හැත්තෑවක් පමණ වියළි කලාපයට අයත් වූ නිසාත් කෘෂිකාර්මික කටයුතුවලට විශේෂයෙන් ම වී ගොවිතැනට සුදුසු ඉඩම් පැවතියේ වියළි කලාපයේ නිසාත් ස්වභාව ධර්මයේ අභියෝගයට අතීත ලාංකික ජනතාව දක්වූ ප්‍රතිචාරයක් ලෙස වාරිමාර්ග විශාල ප්‍රමාණයක් වියළි කලාපයේ බිහිවිය. එම වාරි නිර්මාණයන්හි යොදාගෙන ඇති වාරි තාක්ෂණ ක්‍රමවේදයන් කවරේද යන්න සහ එම තාක්ෂණික අංගයන්ගේ උපයෝගීතාවය කවරේද යන්න අධ්‍යයනය කිරීම මෙහිදී සිදුකර ඇත. එක් එක් තාක්ෂණික ක්‍රමවේදය මඟින් වැවේ ජල කළමනාකරණය සඳහා කෙසේ දායක වී ඇත්ද යන්න මෙහිදී සාකච්ඡා කරන ලදී.

### ක්‍රමවේදය

මෙම ලිපිය සඳහා තොරතුරු සම්පාදනය කරගැනීම ද්විතීයික දත්ත සම්පාදන ක්‍රමවේදයන් වන සාහිත්‍යය මූලාශ්‍රගත තොරතුරු හා අන්තර්ජාල තොරතුරු උපයුක්ත කොටගන්නා ලදී.

### විමර්ශනය

යම් කාර්යයන් ඉටුකර ගැනීම හෝ පහසු කර ගැනීම සඳහා මානවයා තම මනස වෙහෙසවා බාහිර ද්‍රව්‍යයක උපකාර සහිතව යම් උපක්‍රමයක් යොදයි නම් එය තාක්ෂණය යනුවෙන් සරල අර්ථයෙන් හඳුන්වාදිය හැකිය. අතීත මානවයා තම කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වූ ජල

අවශ්‍යතාවය සපුරා ගැනීම උදෙසා විවිධ තාක්ෂණික අංග උපාංග කෙරෙහි අවධානය යොමු කරමින් එය සපුරාගත් බව පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ වාපි කර්මාන්තයන්ගේ ස්ථානගත වීම පිළිබඳව අවධානය යොමු කරනවිට ඒවා ඊටම ආවේණික, උචිත භූගෝලීය ස්ථානයන්හි ස්ථානගත කර තිබීම දැකගත හැකිය. පුරාණ වාරි තාක්ෂණ ශිල්පීන් කවරාකාර හෝ විවිධ භූ කාරක හේතූන් මත වැව් නිර්මාණයට යෝග්‍ය සේ නිර්මාණය වූ අවපාතයන් හඳුනාගෙන සවිඥ්ඥාණිකව ඒවා ඔස්සේ තම වාරි කර්මාන්ත ඉදිකර ඇති බව දැකගත හැකිය. මෙම හඳුනා ගැනීම සඳහා බොහෝවිට ඒ වනවිටත් ස්වභාවික විල් හෝ පතස් වශයෙන් ඇති ස්ථාන ම යොදා ගැනීම අදාළ වාරි කර්මාන්තයන් ස්ථාපිත වීම සඳහා වැදගත් වන්නට ඇත. වංසකතා මූලාශ්‍රයන්හි හා ජනප්‍රවාදගතව පවත්නා යම් යම් වැව් නිර්මාණ සඳහා පාදක වූ ස්වභාවිකව නිර්මාණය වූ ජල තටාක පිළිබඳ කතා මෙම වංසකතාකරුවන් හෝ ජනකතාකරුවන් වටහාගත් ආකාරය විය යුතුය.

වාරි කර්මාන්තයන් හිදී බොහෝදුරට ජල ප්‍රභවයක් හෝ මාතිකාවක් කඳු දෙකක් අතරින් ගලායන නිම්න අවස්ථාවකදී බැම්ම සඳහා පටු ම ස්ථානය තෝරා ගැනීමත් එම බැම්ම බොහෝවිට මව් පාෂාණය මත නිර්මාණය වී තිබෙන අතර ම එය ප්‍රමාණවත් අන්දමින් සණව කාවැද්දීමත් වැදගත් තාක්ෂණික උපක්‍රමයකි. කලා වැව අධ්‍යයනය කළ විශේෂඥයින් පෙන්වා දෙනුයේ කලා වැවේ බැම්ම බිඳී ගිය ස්ථානයේ බැම්ම පිහිටුවා තිබෙනුයේ එහි පිහිටි පාෂාණයේ බවත් බැම්ම එම පර්වතයට ප්‍රමාණවත් අන්දමින් කාවද්දා නොමැති වීමෙන් මෙසේ බිඳී ගිය බවත්ය. පිහිටි පාෂාණය පොළොව මතුපිටට ආසන්න නොවන අවස්ථාවක දී වැව් බැම්මට යාවෙන පාෂාණ තට්ටුවක් වශයෙන් ඇතිරීම මගින් අදාළ වාරි කර්මාන්තයේ චිරස්ථිතිය ළඟා කිරීමට තාක්ෂණික ශිල්පීන් උත්සුක විය. කන්තලේ වැව පිළිබඳ සිංහලේ රජු හා ලන්දේසීන් අතර ඇති වූ ගිවිසුමකින් පසුව ජොහාන් ෆර්න්බවර් නම් ඉංජිනේරුවා විසින් ඉදිරිපත් කළ ලේඛනයේ තත් තාක්ෂණික උපක්‍රමය පිළිබඳව කරුණුත් ඒ පිළිබඳව තම විශ්මයත් දක්වා ඇත. 1970 දශකයේ මුල් භාගයේ මාදුරු ඔය ජලාශය ඉදිකරන අවස්ථාවේ කැනේඩියානු ඉංජිනේරුවන් පිරිසක් තම දියුණු මිනුම් උපකරණ උපකාරයෙන් නව වාරි කර්මාන්ත සඳහා සොරොව්, බිසෝකොටු, ඇළ මාර්ග සළකුණු කළ අතර මෙහිදී වැදගත් කරුණක් අනාවරණය විය. එනම් පුරාණ ශිල්පීන් තම තාක්ෂණික දැනුම හා උපකරණ භාවිතයේ බුහුටි බව විෂධ කරමින් නූතන ක්‍රම මගින් නිර්ණය කළ ස්ථානයට අනුගත වන අයුරින් ම පුරාණ සොරොව්ව අනුගත කර තිබූ බවයි. ඒ අනුව පුරාණ තාක්ෂණික ශිල්පීන් භූමිය පිළිබඳව මනා අවබෝධයකින් හා උපකරණ භාවිතයේ හසලත්වයකින් යුක්තව තම කාර්ය සාධනය කළ බව පැහැදිලි වේ. වසර දහස් ගණනක් පැවතීමට තරම් සවිශක්තිමත් වූ වැව් බැම්ම ස්ථාපිත කළේ කෙසේද යන්න විමසා බැලීමේදී තවත් වැදගත් සරල තාක්ෂණික කරුණක් අනාවරණය වේ. එනම් වර්තමානයේ මෙන් සිමෙන්ති හෝ වෙනත් සංකීර්ණ ඇලවුම්කාරක නොමැතිව පස් පමණක් උපකාරයෙන් එම කාර්යය සිදුකර තිබීමයි. අතීත කතාවලින් පැවසෙන ආකාරයට එසේ බැම්මට දැමූ පස් තදවීම සඳහා ඒ මතින් එළු, ගව වැනි කුඩා කුර සහිත සතුන් එහා මෙහා දැක්වූ බව විශ්වාස කරයි. එමගින් බැම්මට මිනිස් ශ්‍රමයෙන් ඇද හැලෙන පස් වඩා ස්ථාවර ලෙසත් යෝග්‍ය සවිවරතාවක් ලැබෙනසේත් ස්ථාපිත විය.

පුරාණ වාරි කාර්මික ක්ෂේත්‍රය තුළ වේළි නිර්මාණය කිරීමේ තාක්ෂණයේ දියුණු අවස්ථාවක් මෙමගින් පෙන්නුම් කරයි



පුරාණ වාරි කාර්මික ක්ෂේත්‍රය තුළ වේළි නිර්මාණය කිරීමේ තාක්ෂණයේ දියුණු අවස්ථාවක් මෙමගින් පෙන්නුම් කරයි



නූතනයේ කොන්ක්‍රීට් යොදා නිර්මාණය කරන ලද බැම්මක ස්වරූපය



නූතනයේ කොන්ක්‍රීට් යොදා නිර්මාණය කරන ලද බැම්මක ස්වරූපය

වර්ෂා සමයන්හිදී ජලය උපරිම ආකාරයෙන් රඳවා තබාගෙන ජලය හිඟ සමයන්හිදී කෘෂිකාර්මික හා අනෙකුත් කටයුතු උදෙසා භාවිතා කිරීම වැව් නිර්මාණය කිරීමේ අපේක්ෂාව විය. මෙකී කාර්යයන් උදෙසා දිවයිනේ කුඩා හා මධ්‍ය පරිමාණ වැව් රාශියක් ස්ථානගත කිරීම ද වැදගත් තාක්ෂණික උපක්‍රමයක් විය. මහා පරිමාණ වැව් ඉදිකිරීම නඩත්තු කිරීම ආදිය සඳහා සිදුවන අධික පිරිවැය අවම කරගැනීමත් එමගින් නැවත කුඩා වැව්වල නඩත්තුව පහසුකර ගැනීමත් සිදුවිය. එක් ස්ථානයක විශාල වැවක් ස්ථානගත කරනවාට වඩා ස්ථාන කිහිපයක කුඩා වැව් රාශියක් ස්ථානගත කිරීම ඔස්සේ ඒ එක් එක් වැවක් ආශ්‍රිත විශාල ප්‍රදේශයක භූගත ජලය හෙවත් පසෙහි තෙතමනය රඳවා ගැනීමට හැකිවීමත් වැදගත් උපක්‍රමයකි. එලෙසම යම් හේතුවක් නිසා විශාල වැව් බැම්ම බිඳවැටීමෙන් සිදුවන්නා වූ පාරිසරික හා ජීවිත හානිය අවමවීමකත් මෙහි අතුරු වාසි අතර වේ. එක් ජලවහන මණ්ඩලයක් පුරාම සෑම තැනම කුඩා කුඩා වැව් ස්ථාපිත වීමත් ඒ සියල්ලම අවසානයේ දී යොමුවන මධ්‍ය ප්‍රමාණයේ වැවත් මාර්ගයෙන් වසර පුරාම අඛන්ඩ ජල ධාරාවක් ඉතා විශාල ප්‍රදේශයක් ආවරණය වන පරිදි ලබාදීමට අවස්ථාව උදා වේ. එමෙන්ම **පද්ධති වැව් ක්‍රමය** හේතුවෙන් තවත් ඉතා වැදගත් තාක්ෂණික උපක්‍රමයක් පෙන්නුම් කරයි. වියළි කලාපීය භූ දර්ශනයකට අයත් ක්ෂුද්‍ර ජලපෝෂක

කලාපයක සකස් කරන ලද කෙටිකාලීන ජල ප්‍රවාහයන් භාවිතා කරමින් ජලය ගබඩාකර බෙදාහරිමින් භාවිතා කරන එකිනෙකට සම්බන්ධ වැව් රාශියක් පද්ධති වැව් ක්‍රමය යනුවෙන් අදහස් කරනු ලැබේ. යම් ප්‍රදේශයක මහා පරිමාණ ජලාශයක් නිර්මාණය වීම මගින් අඛණ්ඩව ගලා එන ජලයත් සමග මිශ්‍රව එන්නා වූ ලවන හේතුවෙන් පසෙහි ලවණතාව අධික වීම සිදුවෙයි. මෙම කාරණය අදාළ ප්‍රදේශයේ පස සාරවත්බවින් හීන කිරීමට හේතුවක් වශයෙන් නූතනය තුළ හඳුනාගෙන ඇත. එම නිසා මහා පරිමාණ වැව් සීමා කිරීමත් කුඩා ප්‍රමාණයේ වැව් ප්‍රමාණය වැඩිවීමත් මගින් පසේ ලවනතාව සාමාන්‍ය මට්ටමෙන් අඛණ්ඩව පවත්වාගත හැකි වීමත් විශේෂ කරුණකි.

ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය දීර්ඝ කාලයක් චිරස්ථායී වීම සඳහා පුරාණ තාක්ෂණික ශිල්පීන් හඳුන්වා දුන් විශිෂ්ටතම තාක්ෂණික උපක්‍රමයක් ලෙස **බිසෝකොටු සොරොව්ව** හඳුනාගත හැකිය. ක්‍රි.ව. පස්වැනි සියවසේදී විනය පිටකයට එක්වුණු අට්ඨ කථාව වන සමන්තපාසාදිකාවේ සඳහන් "උදක නිද්ධමන තුම්හ" යන්න මෙම උපාංගය සඳහා ව්‍යවහාර කරන්නට ඇතැයි ගුණවර්ධන මහතා අදහස් කරයි. දහවන සහ එකොළොස්වන සියවසට අයත් තමිල්නාඩු ශිලා ලේඛනවල තුම්භ යන පදය සොරොව්ව යන තේරුමින් භාවිත වූ බව ද එතුමා පෙන්වා දෙයි. බිසෝකොටු සොරොව්ව ප්‍රථමයෙන්ම ශ්‍රී ලංකාවේ සංවර්ධනය වූවක් බවත් පසුව දකුණු ඉන්දියාවේ ජල ක්‍රමවේද සංවර්ධනයට එහි ආනුභාවය ලැබෙන්නට ඇති බවත් විශ්වාස කිරීමට ඉහත පද දෙක අතර ඇති සමානත්වය තුළින් ඔහු පොළඹවනු ඇත. බිසෝකොටු සොරොව්ව නිර්මාණය කිරීමේදී වාරි ශිල්පීන් බලාපොරොත්තු වූයේ ජල පීඩනය පාලනය කිරීමටය. මෙහි ඇති වැදගත්කම හෙන්රි පාකර් විසින් ඉදිරිපත් කර ඇති පහත ප්‍රකාශයෙන් මනාව පැහැදිලි වේ. "ලෝකයේ කිසිම රටක විද්‍යමාන නොවන්නා වූ විශ්මිත ජල සම්පාදන ක්‍රමයක් නිපදවීමට පැරණි සිංහලයාට පුලුවන්වූයේ බිසෝකොටුව තනා ගැනීම නිසාය. එකල විශාල වැව්වල රාශිභූත වූ ජල කණ්ඩය පිටවීම පාලනය කිරීමේ ක්‍රමයක් ඔවුන් නොදැන සිටුයේ නම් පැරණි සිංහලයාට කුඩා වැව්වලට වඩා යමක් තැනීමට කිසිසේත් නුපුලුවන් වන්නේය." බිසෝකොටුව වනාහී එක් පැත්තකින් වැවෙන් පිවිසෙන ජලයට විවෘත වූ ද ප්‍රතිවිරුද්ධ පැත්තෙන් ජලය පිටතට ගලායන්නා වූ ද කවුලු දෙකකින් යුක්ත වූ චතුරස්‍රාකාර ගැඹුරු ළිඳක් හෙවත් ටැංකියක හැඩයෙන් යුක්ත වූවකි. පතුලේ සිට ගලින් කෙරූ පරාල එකක් මත එකක් සිටින සේ තැම්පත් කර ඉදිකරන ලද්දකි. බිසෝකොටුවට ඔරොත්තු දී ගත හැකි තරම් වූ ජලය පිරුණු විට ඇතිවන මතුපිට මට්ටමට සමාන වන තරම් උසට තනා තිබෙන්නට ඇත. නූතන යුගයේ වැවෙන් ජලය පිට කිරීම හා පාලනය කිරීමට යොදා තිබෙන යාන්ත්‍රික උපකරණ වලින් කෙරෙන මෙහෙය පුරාණ යුගයේ ඉටුකර ගන්නා ලද්දේ බිසෝකොටු සොරොව්ව මගිනි. සොරොව්ව ඔස්සේ පිටත පිහිටි ඇළට ජලය ගලා ගියේද බිසෝකොටු සොරොව්ව හරහා ය. බිසෝකොටු සොරොව්ව වැවෙන් පිටතට නික්මෙන ජල ධාරාවේ වේගය අවම කිරීමටත් ඍජුව වැව් බැම්ම තුළින් ජලය ගලායාම වැළැක්වීමටත් යෙදූ කදිම උපක්‍රමයක් ලෙසින් වැදගත් වේ. එමෙන්ම මෙමගින් වැ කණ්ඩිය මත ඇතිවන අධික ජල පීඩනය අඩුකොට දීර්ඝ කාලයක් වැ කණ්ඩියේ ජීව කාලය ආරක්ෂා කිරීම ද සිදු කරයි. මෙම තාක්ෂණික අංගය පිළිබඳ දැනීම ක්‍රි.ව. තුන්වන සියවසට පෙර ද තිබූ බව සමන්තපාසාදිකාවේ තොරතුරු වලින් හා අභයගිරියෙන් හමු වූ සෙල්ලිපියට අනුව සිතිය හැකිය. වැව් බැම්මේ ඇතුළුපස නිමවා ඇති මෙය වැවක් තුළ එක්රැස්වන ජලය එහි බැම්ම හරහා ගලායාමේදී ඇතිවිය හැකි දැඩි පීඩනයෙන් එම බැම්ම ආරක්ෂා කිරීමේ උපක්‍රමයක් වශයෙන් වැව්වල සොරොව්ව වෙත ඉදිකරන ලදී. මෙය සෑදීමට පෙර යටට ඉතාමත් තද සණ මාටි තට්ටුවක් දමා නිමවා ඇත. ඉන් කිසිවිටෙක ජලය කාන්දුවීමක් සිදු නොවීය. මෙම තාක්ෂණය කෙතරම් විශිෂ්ටද යත් මුල් කාලයේ බිසෝකොටු සොරොව්වල පෙනෙන තාක්ෂණික ලක්ෂණ ඉක්බිති දහස් වසරකට අධික කාලයක් ඉක්ම ගිය ද විශාලත්වය විනා තාක්ෂණික ලක්ෂණ එලෙසම පැවතිණි. මෙහි ඉතා විශිෂ්ට අංගයක් වනුයේ ජලය

ඇතුලුවීමේ සහ පිටකිරීමේ මාර්ග දෙකයි. මෙම මාර්ග දෙකෙහි ස්වරූපය අනුව ඒවා වර්ග තුනකට වෙන් කළ හැකිය. ඒ අනුව බිසෝකොටු සොරොව්වට ජලය ඇතුළුවීමේ මාර්ග එකකුත් පිටකරන මාර්ග එකකුත් ඇති සංගිලිකනදරා වැවෙහි ඇති බිසෝකොටු සොරොව්වත්, එවැනි දොරටු දෙකක් ඇති වාහල්කඩනුවර වැව, නාච්චිදූව වැනි වැව්වල බිසෝකොටු සොරොව්වත් හා ඇතුල් මාර්ග එකකුත් පිටකරන මාර්ග දෙකකුත් ඇති දූරතිස්ස හා මහගම වැනි බිසෝකොටු සොරොව් ද උදාහරණ ලෙස පෙන්වාදිය හැකිය. බිසෝකොටු සොරොව්වක දිය පිටමං කරන දොරෙහි විවර ලොකු හෝ කුඩා කිරීම සඳහා ඔසවනු නොහොත් බස්වනු ලබන පුවරු දණ්ඩ **මොහොල** වේ. මෙම තාක්ෂණික උපක්‍රමය මගින් සොරොව්වෙන් ජලය පිට කිරීමේදී ඒ සඳහා ක්‍රමානුකුල විධිමත් පාලනයකින් යුතුව එම කාර්යය කළ බවයි.




බිසෝකොටු සොරොව්වේ හරස්කඩක්

මධ්‍ය ප්‍රමාණයේ හා මහා පරිමාණ වැව්වල දකගතහැකි වැදගත් තාක්ෂණික ලක්ෂණයක් ලෙස වැවෙන් ජලය පිටතට ගෙන යාම සඳහා භාවිතා කරන **ගොඩ සොරොව්ව** හා ඊට පහළින් පිහිටි **මඩ සොරොව්ව** පෙන්වා දිය හැකිය. සාමාන්‍යයෙන් කෘෂි කර්මය හා අනෙකුත් අවශ්‍යතා සඳහා අවැසි ජලය ලබාදීම ගොඩ සොරොව්ව මගින් සිදු වූ අතර වර්ෂාව අඩු සමයන් හිදී අදාළ ජලාශයන්හි එක්තැන් වී ඇති රොන් මඩ ඉවත් කිරීමට පහළ මට්ටමින් තිබූ මඩ සොරොව්ව උපයෝගී කරගන්නා ලදී. වැවක් දීර්ඝ කාලයක් තිස්සේ රොන් මඩින් පිරීයාමට ඉඩ නොහැර අඩු පරිමාණයකින් යුක්තව නඩත්තු කිරීමෙහිලා වැදගත් තාක්ෂණික උපක්‍රමයක් වශයෙන් මෙම මඩ සොරොව්ව හඳුනාගත හැකිය. එමෙන්ම ඇළ මාර්ග දිගේ ජලය සමඟ වැවට ඇදී එන රොන් මඩ ආදිය වැවට එක්වීම පාලනය කිරීම සඳහා ද විශේෂ උපක්‍රමයක් භාවිත වූ අතර එය **පොටා වැටිය** නමින් හඳුන්වනු ලැබේ. පසින් ම නිර්මාණය කළ වැ කණ්ඩිය කාලයත් සමග එහි ජලය හා රැල්ල වැදීම සමගින් ක්‍රම ක්‍රමයෙන් සේදීමට ලක්වීම එම බැම්මෙහි ශක්තිය හීන කරන්නක් ද වේ. එහෙත් වර්ෂ ගණනාවක් තිස්සේ දේශීය කෘෂිකර්මයේ චිරස්ථිතිය ලබාදීම සඳහා එයට යෙදූ මනා උපක්‍රමයක් ලෙසින් **රළපනාව** නම් උපක්‍රමය හඳුනාගත හැකිය. එනම් වැව් බැම්මේ ඇතුලු බැම්ම මනාව සකස් කරන ලද ගල් ආස්තරයක් ඇතිරීමයි. එමගින් ජලපහර නිරන්තරයෙන් වැව් බැම්මට වැදීම වැළකී අදාළ කලුගල් බැම්මෙහි වැදීම මගින් සිදුවිය හැකි හානිය අවම වේ.

වාරි කර්මාන්තයන්ගේ ජලය පිරවීමෙ දී යම්කිසි මට්ටම් ප්‍රකාශනයක් උපයෝගී කරගෙන ඇත. එයින් වැවේ ජල මට්ටම මැන ගැනීම සිදුකර ඇත. **දියකැට පහණ** ලෙසින් පුරාණ තාක්ෂණයේ හඳුනාගන්නා මෙයබිසෝකොටුව තුළ ස්ථාපිතකොට ඇත. මෙම මිනුම් මඟින් නිරන්තරයෙන් වැව් බැම්මට හානි නොවන මට්ටමකට ජල ප්‍රමාණය පවත්වාගෙන යාමට හැකි වේ. පුරාණ ලාංකේය වාරි තාක්ෂණ ශිල්පියා **පිටවාන** නමින් තාක්ෂණික එළඹුමක් හඳුනාගෙන සිටි අතර වාරි සංස්කෘතියේ පැවැත්ම උදෙසා එම තාක්ෂණික අංගය ද හේතු කාරක වී ඇත. එනම් වැවෙහි වැඩි ජලය පිටවීමට ස්වභාවික ගල් තලාවක් භාවිතා කිරීමයි. එමගින් බාදනය සීමා වන අතර වැව් බැම්මට හෝ අනෙක් අංගයන්ට හානිනොවන අයුරින් පිටාර ජල මට්ටම පාලනය කිරීමට හැකි විය. වත්මන් කලා වැවේ පිටවාන මෙයට උචිත සාධක සපයන අතර මහියංගනය ආසන්නයේ සොරබොර වැවෙන් ද මේ පිළිබඳ උචිත නිදසුනක් සපයාගත හැකිය.

**ඇළ මාර්ග** වැව් තාක්ෂණය හා සබැඳි තවත් තාක්ෂණික අංගයකි. එනම් වියළි කලාපයේ අධික සූර්යතාපය හේතුවෙන් සිදුවන අධික ජලවාෂ්පීකරණය නිසාත් සය මසකට අධික කාලයක් පවතින නියං තත්ත්වය නිසාත් අදාළ වාරි කර්මාන්තයන්ට අඛණ්ඩ ජල සැපයුම අනිවාර්ය වේ. මේ සඳහා තෙත් කලාපයේ ගලන්නා වූ ගංගාවන් හරස්කර ඉතා විශිෂ්ට වූ උපක්‍රම මඟින් වියළි කලාපයේ වැව් සඳහා ජලය ලබාදීම ද සමහර වාරි කර්මාන්තයන් එකක් මත එකක් රදා පවතින ජාලයක් සේ සංවිධිත කිරීමට මෙමගින් හැකි වී ඇත. වාපි කර්මාන්තය හා සබැඳි ඇළ මාර්ග පිළිබඳව සලකා බලනවිට වාරි තාක්ෂණයේ චිර ජීවනය උදෙසා ප්‍රබල ලෙස වැදගත් වූ අවස්ථාවක් ලෙස මිණිපේ ජල හැරවුම හා අංගමැඩිල්ල ජල හැරවුම පෙන්වා දිය හැකිය. ඒ අවස්ථාවන්හී දී අදාළ ගංගාව සෘජුව හරස් කිරීමට ලක් නොකර ගඟ දෙසට දිවෙන අතක් ආකාරයෙන් ගඟට නොදනෙන ආකාරයෙන් ජලය අඩු ප්‍රමාණයක් ලබා ගැනීමට මෙමගින් සමත් වී ඇති අතර ම අදාළ ගංගාවන්ගේ ගමන් මාර්ගයේ ස්වභාවයට අවම බලපෑමක් පමණක් කර පාරිසරික ස්වභාවික සංසිද්ධියක් මත මෙය ඉටු කිරීම එහි චිරකාලීන පැවැත්ම උදෙසා වැදගත් වූ තාක්ෂණික උපක්‍රමයකි. බොහෝසෙයින් වැදගත්වන ජයගඟ අධ්‍යයනය කිරීමේදී ද පෙනීයන්නේ ජයගඟ උතුරු දෙසට ගලාගියේ සම භූමියකිනි. තැනිතලාවක දියබැස්ම සැලසුම් කිරීම දුෂ්කරය. එහෙත් ධාතුසේන රජු ඇතුලු ඉංජිනේරුවෝ එම දුෂ්කරතාව ජයගෙන ඇත. ඇලේ ඇතැම් තැනක බෑවුම සැතපුමකට අඩියකුත් ඇතැම් තැනක සැතපුමකට අඟල් හයකුත් වේ.

පුරාණ වාරි තාක්ෂණය පිළිබඳ සාකච්ඡා කිරීමේදී කලාත්මක ගුණයෙන් ඉතා ඉහළ නිර්මාණයක් ලෙස **පොකුණු** පෙන්වා දිය හැකිය. විශේෂයෙන් ම රජමාළිගා, පූජ්‍ය ස්ථාන ආදියෙහි පොකුණු නිර්මාණය වී ඇති අතර රාජ අමාත්‍යාදීන්ගේ මෙන් ම බිසෝවරුන්ගේ පරිභෝජනයට ද සංඝයා වහන්සේලාගේ පරිභෝජනය සඳහා මෙම පොකුණු නිර්මාණය කර ඇත. එම නිසාවෙන් කලාත්මක ලක්ෂණ ඊට ආරෝපණය කරන්නට ඇත. කුට්ටම් පොකුණ, ඇත් පොකුණ, නෙලුම් පොකුණ ආදිය උසස් ගණයේ පොකුණු ලෙස හඳුනාගත හැකිය.

පුරාණ වාරි තාක්ෂණය පිළිබඳ විමසා බැලීමේදී සීගිරි රාජධානියේ ඇති වැදගත්කම නම් ඉතා සංකීර්ණ වූ ජලවහන පද්ධතියක් ඒ ආශ්‍රිතව ක්‍රියාත්මක වීමයි. විශේෂයෙන් අදටද රහසක්ව පවතින සීගිරි පර්වතය මුදුනට ජලය ගෙනයාමේ සිට දිය අගල්, පොකුණු, දිය මල් ආදී වූ නිර්මාණ රාශියක් සීගරිය ආශ්‍රිතව දැකගත හැකිය. සීගිරිය තුළ අදට ද වර්ෂා කාලයේදී ක්‍රියාත්මක වන දිය මල් දක්නට ලැබේ. විශේෂයෙන්ම පර්වතය මුදුනේ සිට පහලට ගලා එන ජලය පීඩනයට ලක් කරමින් එම ශක්තිය තුළින් ක්‍රියාත්මක වන ආකාරයෙන් මෙම දිය මල්

නිර්මාණය කර ඇත. මේ ආදී වූ සෑම නිර්මාණයක් තුළින්ම කියාපානුයේ අතීත වාරි නිර්මාණ ශිල්පියා සතුව තිබූ හැකියාව කෙතරම්ද යන්න පිළිබඳවයි.

මෙම තොරතුරු විමසා බලනවිට ලංකාවේ ක්‍රි.ව. පළමුවැනි සියවසේ සිට දියුණු වාරි තාක්ෂණයක් භාවිත කළ බව ප්‍රකට කරුණකි. එසේම එය ක්‍රි.ව. හයවැනි සියවසේ මධ්‍යභාගය වන විට අතිවිශාල දියුණු වාරි කර්මාන්ත පද්ධතියක් බවට පත්ව තිබුණි. ඒ හා සමානව පෘථුල ප්‍රදේශයක් පුරා පැතිරුණු කෘෂිකර්මාන්තයේ දියුණුව ද විද්‍යමානය. දකුණු ඉන්දියාවට තාක්ෂණික ඥාණය ගලා ගිය ද සමාන සංස්කෘතික ලක්ෂණ පැවතිය ද දෙරටේ මූලික ප්‍රශ්නවලට ලබා දී ඇති වාරි කාර්මික විසඳුම අතින් ලාංකේය තාක්ෂණික ඥණය විශිෂ්ට ය. පෙර අපරදෙදිග වාණිජ ලෝකයේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ක්‍රියාකරමින් ලැබූ අතිරික්ත ධන ආයෝජනය මෙම වාරි සමාජය පිටුපසින් දිවෙන ප්‍රධාන ප්‍රවාහය ලෙස සුවිශාල කාර්යභාරයක් ඉටුකළ බව පැහැදිලි කරුණකි.

**නිගමනය**

උක්ත කරුණු කාරණා තුළින් පැහැදිලි වන්නා වූ කරුණ නම් වියළි කලාපීය කෘෂි කාර්මික කටයුතු සඳහා ජලය සපුරා ගැනීමේ අරමුණින් වැව් නිර්මාණය වූ බවය. ප්‍රථමයෙන් කුඩා වැව් නිර්මාණය ද පසුකාලීනව විවිධ රජවරුන්ගේ දායකත්වයෙන් මහා වැව් නිර්මාණය ද මෙරට සිදුවිය. සම්භවයේ සිට ම ජලය හා අත්‍යයන්තයෙන්ම බැඳී පැවති මානවයා එක් උප කුලකයක් වන ලාංකේය මානවයා ස්වභාවික පරිසරය සමග මනාව ඒකාබද්ධ කරමින් ඉතා වැදගත් නිර්මාණ රැසක් ඇති කිරීමට සමත් විය. කුඩා වැව් හා වාරි මාර්ග තිර්මාණයෙන් තම කටයුතු ආරම්භ කළ ස්වදේශික ජනයා එය උච්චතම ස්ථානයකට ගෙන යාමට සමත් විය. පුරාතන වාරි තාක්ෂණය ස්වභාවික පරිසරය සමග මනාව ඒකාබද්ධ කරමින් විශිෂ්ට තාක්ෂණික නිර්මාණයක් හෙවත් සහස්‍රක වසරකට වඩා ඉතාමත් සශ්‍රීක අයුරින් ක්‍රියාත්මකවන පද්ධතියක් ජනනය කිරීමට සමත් වූ අතර නූතනය තුළ මෙන් ම අනාගතයේදීත් යල් නොපනින තාක්ෂණික උරුමයක් වශයෙන් එය පවතිනු ඇත.

**පරිශීලන.**


අඹන්වල, සී. ***ලංකාවේ වාරි තාක්ෂණය හා එහි තිරසාරත්වය උදෙසා බල පෑ සමාජ හා තාක්ෂණික සාධක පිළිබඳ විමසුමක්***, www.archaeology.lk,accessed2015/12/12.

ගුණවර්ධන, ආර්. (1993), ***සිවුර සහ නගුල,*** සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, කොළඹ.

දසනායක. ආර්. (2016), ***පුරාතන ශ්‍රී ලාංකේය වාරි තාක්ෂණය හා ජල කළමනාකරණය,*** *ආඛ්‍යාන:*Vol.01:Iss.01, Article 01.

විතානාච්චි, සී. ආර්. (2018) ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ විකාශනය,*** http://www.vidusara.com/2018/11/07/feature2.html

විතානාච්චි, සී. ආර්. (2010) ***පුරාණ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ජල කළමනාකරණයේ සුවිශේෂීතා හඳුනාගැනීම***
http://respository.rjt.ac.lk:8080/xmlui/handle/123456789/1681

සිරවීර. අයි, (2004), ***ශ්‍රී ලාංකේය ඉතිහාස තරංග,*** ආරිය ප්‍රකාශකයෝ, වරකපොල.

# 05. අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය හා වාරි කර්මාන්තය

පී.බී.අයි.කේ. කුසුම්ලතා

**හැඳින්වීම**

ඓතිහාසික මූලාශ්‍රයන්හි සඳහන් වන පරිදි අනුරාධපුර නගරය ආරම්භ වී ඇත්තේ ක්‍රිස්තු පූර්ව 05 සියවසෙහි ය. කෙසේ වෙතත් ක්‍රිස්තු පූර්ව 04 වන සියවසෙහි පණ්ඩුකාභය රජතුමා අනුරාධපුරය අගනගරය බවට පත් කර ගන්නා අතර එය මනා සංවිධිත සැලසුමක් අනුව සංවිධානය කරන ලදී. මෙලෙස ආරම්භ වුන අනුරාධපුර නගරය වසර ගණනාවක් නොයෙක් පාලකයන් යටතේ පාලනය විය. ඉතා සංවර්ධිත වූ අනුරාධපුර යුගය අවසාන භාගයේදී දිගින් දිගටම දකුණු ඉන්දීය ආක්‍රමණ වලට ලක් විය. මේ හේතුවෙන් අවසානයේ දී ක්‍රිස්තු වර්ෂ 1017 දී අනුරාධපුර නගරය අතහැර දැමීය. මෙම දැවැන්ත නගරය ක්‍රි.පූ. 05 වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ 1017 දක්වා ලංකාවේ අගනගරය ලෙස පැවතුණි. එහි පසුබැස්ම ඇරඹියේ දකුණු ඉන්දීය ආක්‍රමණයන්ට එරෙහිව දිගින් දිගටම යුධ වැදීම හේතුවෙන් ඇතිවූ රාජධානියේ ආර්ථිකමය දුෂ්කරතා නිසා ය. කෙසේ වෙතත් ක්‍රිස්තු වර්ෂ 1017 දී විදේශ ආක්‍රමණ හා තවත් විවිධ හේතූන් නිසාවෙන් මෙය බිඳ වැටීමට ලක් විය. මෙම කාල සීමාව තුළ සමාජීය වශයෙන් විවිධ පැතිකඩයන් යටතේ නොයෙක් අංශ එනම් ආර්ථිකමය, දේශපාලනික, සංස්කෘතික, ආගමික හා සමාජ සිරිත් විරිත් ආදිය මුල්කර ගත් සමාජ සංවර්ධනයක් ඇති විය.ඒ සඳහා එක් ප්‍රබල සාධකයක් වූයේ අනුරාධපුර තදාශ්‍රිත ප්‍රදේශයේ ඇති වූ වාරි කර්මාන්තයන්හි සංවර්ධනයයි. මේ යුගයේ වාරි කර්මාන්තයන් කෙතරම් වැදගත් වේදයත් සෑම පාලකයෙකුම පාහේ ඒ කෙරෙහි අවධානය යොමු කිරීමට අමතක නොකළහ. ඒ අනුව පණ්ඩුකාභය රජුගේ පටන් අනුරාධපුර යුගය අවසානය තෙක් ම විවිධ පාලකයන් යටතේ වාරි කර්මාන්තයන් රාශියක් නිර්මාණය වී තිබේ. අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කෙරෙහි වාරි කර්මාන්තය දායක වී ඇති අතර ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි දී සිදු කරනු ලැබේ.

අනුරාධපුර යුගය ආරම්භ වූයේ කෙසේ ද එහි වර්ධනය මෙන්ම අවසානය පිළිබඳව යම් අවබෝධයක් ලබා ගැනීම, එකල සමාජ සංවර්ධනය වූයේ කෙලෙසද සහ කෙතෙරම් දුරට එහි සාර්ථකත්වයක් දැකගත හැකි වී ද යන්න අවබෝධ කර ගැනීම, අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තයන් පිළිබඳව දළ අවබෝධයක් ලබා ගැනීම මෙන්ම එකල වාරි කර්මාන්ත මඟින් සමාජ සංවර්ධනය සඳහා සැපයූ දායකත්වය කෙබඳු ද යන්න විමසා බැලීමත්, අනුරාධපුර සමාජ සංවර්ධනය හා වාරි කර්මාන්ත යන මැයෙන් සාර්ථක අධ්‍යයනයක් සිදු කර ඒ හා දැනුම සොයන්නට තොරතුරු ලබා ගැනීමට මෙහෙයක් වීම ආදී එකී අරමුණු මුදුන්පත් කර ගැනීමේ පරමාර්ථයෙන් මෙම අධ්‍යනය සිදු කරනු ලැබේ.

**ක්‍රමවේදය**

අධ්‍යයනයේ දී තොරතුරු දත්ත රැස් කිරීමෙන් ලබාගත් අතර මූලික දැනුම ලබා ගැනීමට හා පෙර සූදානම සඳහා පුස්තකාල ගවේශණය මඟින් තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලදී. එසේම මෙම අධ්‍යයනයට  දත්ත, ඡායාරූප හා සැලසුම් පිළිබඳව අවබෝධයට හා විවිධ තොරතුරු ලබා ගැනීමට විවිධ වෙබ් අඩවි තුළ පල වී ඇති සඟරා, පර්යේෂණ වාර්තාවන් අධ්‍යයනය කර තොරතුරු ලබා ගැනීමට කටයුතු කරනු ලැබීය. සාහිත්‍යමය මූලාශ්‍රයන්ට අමතරව පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් ද වැදගත් වන අතර අනුරාධපුර සමාජීය වශයෙන් පැවති හා පවතින සාදක මත මෙන්ම වාරි කර්මාන්තයන්හි නටබුන් ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් එකී ඡායාරූප අධ්‍යයනයට පෙළඹුණි.

අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධන හා වාරි කර්මාන්තයන් පිළිබඳව පූර්ණ වශයෙන් අධ්‍යයනයකට යොමු වීමෙන් ඉහත කරුණු සාක්ෂාත් කර ගැනීමටත් ඉතා සාර්ථක අධ්‍යයනයක් ලෙස නිමා කිරීමටත් බලාපොරොත්තු වේ. එසේ අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කෙබඳු ආකාරයේ දියුණුවක් දැකගත හැකි වූයේ ද යන්නත් එකී සමාජ සංර්ධනය වාරි කර්මාන්තය හා දක්වන සම්බන්ධතාවය පිළිබඳ වටහා ගැනීමටත් හැකි වනු ඇත.

**විමර්ශනය**

ලංකාවේ බිහි වූ ප්‍රථම සංවිධානාත්මක රාජධානිය වූ අනුරාධපුරය වසර ගණනාවක් විවිධ පාලකයන් යටතේ පාලනය විය. අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී සෑම සමාජයේ සෑම අංශයකම දියුණුවක් එනම් දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා ආගමික වශයෙන් සමාජ සංවර්ධනයක් දැක ගත හැකි විය. අනුරාධපුර යුගයේ ප්‍රථම පාලකයා වූයේ පණ්ඩුකාභය රජු ය. ඔහු යටතේ දේශපාලන දියුණුව පමණක් නොව ආර්ථික වශයෙන්, සංස්කෘතික හා ආගමික වශයෙන් සමාජයේ සංවර්ධිත අවධියන් කරා ගෙන යනු ලැබී ය. සමාජ සංර්ධනයේ දී මොහු වාරි කර්මාන්තයන් ත්‍රිත්වයක් ඉදි කිරීමෙන් සමාජ සංවර්ධනයේ දියුණුවට මං විවර කරනු ලැබීය. මෙලෙස ආරම්භ වී පාලනය ගෙන යාමෙන් අනතුරුව බොහෝ පාලකයන් යටතේ අනුරාධපුරය මුල් කරගෙන බලය හසුරුවනු ලැබීය. ඔවුන් එක් එක් කාල පරිච්ඡේදයන් තුල වාරි කර්මාන්තය දියුණු කරමින් මෙන්ම ඉදිකරමින් සමාජ සංවර්ධනයට අවැසි දායකත්වය සපයනු ලැබීය.

අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය පිළිබඳව අධ්‍යයනය දී ආර්ථික දියුණුව ඉතා වැදගත් වූ අතර ඒ සඳහා වාරි කර්මාන්තයන්ගේ දායකත්වය ඉවහල් ව ඇත. මෙකල සමාජයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ කෘෂිකර්මාන්තය යි. ආර්ථිකයේ පදනම වූයේ එයයි. කෘෂිකර්මාන්ත කටයුතු සඳහා ජලය අත්‍යාවශ්‍ය සාධකයක් වන හෙයින් වාරි කටයුතුවල නියැලීමට සෑම පාලකයෙකුම පාහේ වෙහෙස විය. විජය ඇතුළු පිරිස ලංකාවට ගොඩබැසීමෙන් අනතුරුව වාසය කිරීමට ගංගා ආශ්‍රිත ප්‍රදේශ තෝරා ගනු ලැබීය. ක්‍රමයෙන් රජවරු බලයට පත් වූ විට රජවරු යටතේ වාරි කර්මාන්තයන් සංවර්ධනය විය. අනුරාධපුර ප්‍රථම පාලකයා ලෙස සලකනු ලබන පණ්ඩුකාභය රජුගේ සිට අවසාන සමය වන තෙක් ම පාලකයන් යටතේ වාරි කර්මාන්තයන් නිර්මාණය විය. ඊට උදාහරණ වශයෙන් පණ්ඩුකාභය රජුගේ අභය වැව, බසවක්කුලම වැව, වසභ රජතුමා (ක්‍රිස්තු වර්ෂ 67-111) මධ්‍ය ප්‍රමාණයේ වැව් තැනීමේ ආරම්භක පාලකයාය. වාරි නිර්මාණ සඳහා මුල්වරට විශාල වශයෙන් රාජ්‍ය අනුග්‍රහය විය.ඔහු වැව් 11ක් හා ඇළ මාර්ග 12ක් නිර්මාණය කළේය. මහසෙන් රජතුමා විශාලම වැව් තැනීමේ ආරම්භක පලකයා වශයෙන් සැලකේ. ඔහු වැව් 16 ක් හා ඇළ මාර්ගයන් නිර්මාණය කලේය. ධාතුසේන රජතුමාගේ කාල පරිච්ඡේදය අනුරාධපුර වාරි කර්මාන්ත ඉතිහාසයෙහි සංවර්ධිතම අවධිය යි. ඔහු යටතේ මහා වැව් 18 ක් හා ඇළ මාර්ග කිහිපයක් ද නිර්මාණය විය. මෙකී පාලකයන්ට අමතරව දේවානම්පියතිස්ස, සද්ධා තිස්ස, කූටකණ්ණ තිස්ස, ජෙට්ඨ තිස්ස, පළමු අග්බෝ (571-604), දෙවන අග්බෝ (604-614) ආදී මෙන්ම තවත් පාලකයන් රැසක් අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කිරීමෙහිලා වාරි කර්මාන්ත ඉදිකරමින් හා සංවර්ධනය කරමින් දායකත්වය සපයා තිබේ. මෙලෙස වාරි කර්මාන්තයන්ගේ ආරම්භය හා සංවර්ධනය සමඟ සමාජයට නව තනතුරු ද ඇති විය. එනම් වාරි කර්මාන්ත හා සම්බන්ධ නිලධාරීන් පිළිබඳ තොරතුරු මූලාශ්‍රගත සාධක ඇසුරෙන් අපට හඳුනාගත හැකි වේ. උදාහරණයක් ලෙස ***වපි හමික-ජල අධිපතියා*** වැනි තනතුරු පෙන්වා දිය හැකිය. මෙවන් වාරි කර්මාන්ත හා සම්බන්ධ තොරතුරු ශිලා ලේඛන, වංසකතා ගත තොරතුරු වල ද යම් යම් ආකාරයට ඇතුළත්ව ඇත. විවිධාකාරයෙන් ආර්ථිකය කෙරෙහි බලපෑම් කල වාරි කර්මාන්තය එකල වැවේ ජල පරිවහනය තුළ විවිධ බදු මුදල් අය කරනු ලබයි. ඒ අනුව, වැවේ සිටින මතස්‍යයන් හා ජලය වෙනුවෙන් එසේම කෘෂිකාර්මාන්තයට

හා අනෙකුත් ආර්ථික ක්‍රියාවලියන්ට ජලය දීම මගින් ආර්ථිකමය වශයෙන් දියුණුවක් ලැබීමට වාරි කර්මාන්තය ඉතා වැදගත් විය. ඒ අනුව අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනය කෙරෙහි වාරි කර්මාන්තය මගින් දියුණු වූ ආර්ථිකයද ඉතා වැදගත් විය.

ලොව කිසිදු රටකට නොදැවිණි තාක්ෂණයකින් පරිපූර්ණ වාරි ක්‍රමවේදයක් මෙරට තුළ ක්‍රමයෙන් ස්ථාපිත වීම කෙරෙහි අනුරාධපුර ආරම්භයේ සිට අවසානය දක්වා සිදු වූ ලාංකික වාරි කටයුතු හා බැඳි වාරි තාක්ෂණයේ සුවිශේෂී සිදුවීම් හා ලක්ෂණ ඉවහල් විය. ඒ අනුව සමාජ සංවර්ධනය කෙරෙහි එකී තාක්ෂණික බලපෑමද ඇති විය. වාරි කර්මාන්තයේ දියුණුවට කටයුතු කළ ශ්‍රේෂ්ඨයකු වූ වසභ රජු විසින් ඉදි කළ අනුරාධපුරයේ පිහිටි මහ හා කුඩා විලච්චිය, මාන්කැටිය, නොච්චිපොතාන, අක්වඩුන්න යන වැව් නූතනයේ ද දක්නට ලැබෙන අතර පූර්ණ මිනුම් හා පාඨාංක දක්නට නොමැති වුවත් ඒවා පුරාණ කාලයේ ඉදි කළා වූ වාරි කර්මාන්තවලට වඩා තාක්ෂණයෙන් දියුණු හා ප්‍රමාණයෙන් විශාල වුණු බව පෙනී යයි. ඇළ හැර ඇල ඉදි කිරීම අතිශය නිර්මාණාත්මක ක්‍රියාදාමයකි. මෙය අබන් ගඟේ ජලය හරස් කර බඳිනු ලැබුවක් වන අතර විශාල ප්‍රදේශයක් පෝෂණය කරමින් ගොස් අවසානයේ කිරිඳි ඔයට සම්බන්ධ වේ. මෙහි ඇති උසස් තාක්ෂණය විද්වතුන් පෙන්වා දෙයි. මෙකී තාක්ෂණයට අමතරව අනුරාධපුර යුගයේ තවත් වාරි කර්මාන්තය හා බැඳි විවිධ තාක්ෂණික ක්‍රම දැක ගත හැකි විය. ඉහත සඳහන් කළ පරිදි විවිධ ශිල්ප ක්‍රමයන්ට උරුමකම් කී වැසියන් අනුරාධපුර යුගයේ වාසය කිරීම මගින් හා ඔවුන්ගේ දායකත්වය මගින් මහා වාරි නිර්මාණ බිහි වීමෙන් එකළ සමාජ සංවර්ධනය තවදුරටත් විද්‍යමාන වේ.

අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය හා සම්බන්ධ සංස්කෘතියක් මෙන්ම ආගමික කටයුතු, විවිධ චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත් ද සමාජයේ සංවර්ධනයට දායක වී තිබේ. ජල කළමණාකරණය වනාහි මෙරට සංස්කෘතියෙහි ප්‍රබල අවශ්‍යයතාවයකි. ජන ජීවිතයේ ප්‍රධාන ආහාරය වන්නේ බත්ය. එකී හේතුව මත මෙරට තුළ ජල කළමණාකරන සංස්කෘතික රටාවක් ගොඩනැගුණි. ආර්ථිකය කෘෂිකර්මාන්තය මත පදනම් වීමත් ප්‍රධාන ආහාරය බත් වීමත් වැව සමග සංස්කෘතිය පෝෂණය වීම කෙරෙහි බලපෑවේය. ඊට අමතරව රජු කෙරෙහි ගෞරවාන්විත භාවයක් භක්තියක් මෙන්ම ආදරයට පාත්‍ර වීමටද වාරි කර්මාන්තයන් ඉවහල් විය. ඇතැම් රජවරු දේවත්වයෙහිලා සලකනු ලැබේ. ඊට නිදසුනක් ලෙස ක්‍රිස්තු වර්ෂ 274 - 301 අතර කාලයේ රජකම් කළ මහසෙන් රජු ***මින්නේරි දෙවියන්*** හෙවත් ***හත් රජ්ජුරු බණ්ඩාර*** ලෙස ජනයා අතර ප්‍රසාදයට පාත්‍ර වී ඇත.

දිවයිනේ බහුතර ජනගහනය වූ සිංහලයන්ගේ ශිෂ්ටාචාරය වාරිමාර්ග ක්‍රමෝපායන් මත රඳා පැවතුණි. මේ ක්‍රියාදාමය ඔස්සේ ආදි සිංහල ජනයා ස්වකීය ජල කළමනාකරණ ශක්‍යතාවය මත නිර්මිත වූ මුල් කාලීන ශිෂ්ටාචාරය තුළින් මානව වංශයේ විශිෂ්ඨ ස්ථාවරත්වයකට පත් විය. මෙම සම්ප්‍රදායේ එක් ලක්ෂණයක් වූයේ සිංහලයා සතුව තිබූ සංවර්ධිත වාරි තාක්ෂණික ඥානය වූ අතර අනෙක නම් ලෝකයේ විශ්මිත නිර්මාණයක් හා එක්බඳු වූ ඔවුන් නිමැවූ බෞද්ධ ස්මාරකයන් ය. ආගමික හා වාරි තාක්ෂණික යන උභයාංගයන් සංගෘහිතව නිපවුණු මෙම සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය වශයෙන් හැඳින්විය හැකිය. මේ සභ්‍යත්වයේ අභේද්‍ය වූ වැව හා දාගැබ සිංහල සංස්කෘතියේ සංකේතයන් ය. සිංහල වාරි සංස්කෘතිය පිළිබඳ බද්දේගම විමලවංශ හිමියන් මෙසේ සඳහන් කරති. ***"සිංහල සංස්කෘතිය හැඩගැසී ගියෙත් දියුණුවට පත් වුයේත් වැව නිසයි. එයට දාගැබ එක් වීමෙන් පසු සිංහල බෞද්ධ සංස්කෘතිය ඔපවත් විය. හෙළ හැදියාවේ අංග ලක්ෂණ එතුළින් දැක ගත හැකිය."*** වාරි සංස්කෘතිය තුළ ගොඩ නැගුණු චාරිත්‍ර වාරිත්‍ර ඇදහිලි විශ්වාස රැසකි. ඒ අතර *ජටාව, හිස්වැසුම් පැළඳ වැව වටේ යාම වැවට සිදු කරන අගෞරවයක් විය. පච්චවඩම් නැතහොත් රක්තපැහැ ඉන හැඳ පැළඳ ගෙන තොවිල්, ශාන්ති කර්ම හා දේව පූජා පවත්වමින් වැව් බැම්ම උඩින් ගමන් කිරීම නොකට යුත්තකි. පුණ්‍ය*

*තෙනාවෙන් ආශිර්වාද ලද වැව් දියවර දෘෂ්ටිවාදය හා ඇදහිලිවලින් කිලිටි විය යුතු නැත. රංචු වැකන්ද මතින් ගමන් කිරීම වැව් බැම්ම බිඳී යාමට හේතු වෙයි. නොයෙන ගමන් යාම හෙවත් මල මිනිසකු වැව් බැම්ම මගින් ගෙනයාම වැවට කරනු ලබන අගෞරවයකි.* මෙලෙස වාරි කර්මාන්තය හා බැඳි සංස්කෘතියක් එකල පැවතුණි. ඊට අමතරව වාරි කර්මාන්තයෙන් ලැබුණු ආදායම් ආගමික මධ්‍යස්ථාන වෙත පූජා කිරීම සිදු වූ බව මූලාශ්‍රගත තොරතුරුවල වේ. නිදසුනක් ලෙස ඇළහැර ඇළ ඉදිකිරීමෙන් ලැබුණු ආදායම රජු විසින් ***"තිස්සවඩ්ඪමාණක"*** ප්‍රදේශයේ ආරාමයකට පූජා කළ බව වැඩිදුරටත් මහාවංසයේ සදහන් වේ. මෙලෙස ආගම දහමට ලැදි සමාජයක් ලගා කර ගරනීමට අනුරාධපුර යුගයේ වාරි කර්මාන්ත ඉවහල් වූ බව පැහැදිලි වේ. වාරි සංස්කෘතිය කෙමෙන් කෙමෙන් වර්ධනය වත්ම සමාජ සංවර්ධනය කෙරෙහි බලපානු ලැබීය. සමාජ සංවර්ධනය හා වාරි කර්මාන්ත අතර සබඳතාවය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ***"වැවයි දාගැබයි ගමයි පන්සලය"*** සංකල්පය ඉතා වැදගත් වේ. වැව් පෙළෙහි එක් පසක කුඩා කඳු ගැටයක් හෝ උස් බිමක් ආශ්‍රිතව පන්සලක් තිබිම සුලභ දසුනකි. පන්සලේ දාගැබ වැව් ඉස්මත්තට හෝ කෙත් යායට පෙනෙන අයුරින් ඉදි කිරීම ද ඇතැම් විට දැකිය හැකිය. බෞද්ධ ජන පදනමක් සහිත ආදි වාරි කර්මාන්තය තුළ එහි පන්සලයි, වැවයි, දාගැබයි සංකල්පය බිහි වන්නේ මේ නිසාය. ඇතැම් තැන් වල වැව් තාවුල්ලේ කට්ට කපා ගඩොල් පුලුස්සා ඒවායින් දාගැබ් ඉදි කර ඇති බව ද දැක ගත හැකිය. ආගමික සහජීවනයද ගම්මානයේ වැසියන්ගේ රැස්වීම් ද දක්නට ලැබේ. ඒ තුළ ගැටළුවක් හෝ උවදුරක් පැමිණි විට පිහිට පතන ස්ථානයද පන්සලයි. මේ අනුව මිනිස් හැසිරීම්, කෘෂි කටයුතු, ආගමික කටයුතු, සංස්කෘතික කටයුතු සියල්ල වාරි කර්මාන්තය හා සම්බන්ධතාවයක් ඇත.

අවුරුදු 2500 ක දීර්ඝ අතීතයකට මෙන්ම මහා සංස්කෘතියකට ද උරුමකම් කියන අතීත ශ්‍රී ලංකේය සංස්කෘතියේ ප්‍රධාන සංකල්පයක් ලෙස *වැවයි දිගැබයි ගමයි පන්සලයි* සංකල්පය ඇති විය. මිනිසා ක්‍රමයෙන් ශිෂ්ටාචාර වන විට ගම නිර්මාණය විය. ආර්යයන්ගේ පැමිණීමත් සමග ගංගා ආශ්‍රිතව තම ජනාවාස පිහිටුවා ගත්හ. මේවා ග්‍රාම නමින් හැඳින්වේ. නිල්ල පිරුණු ගොයමින් ගම සුන්දර විය. හේන් ගොවිතැන ද අඩු වැඩි වශයෙන් පැවතුණි. දේවානම්පියතිස්ස රජු කළ සිදු වූ මහින්දාගමනය සමඟ මෙරට තුළ සංස්කෘතික පෙරළියක් ද සිදු විය. රටේ ප්‍රධාන ආගම බෞද්ධ ආගම විය. උතුරු ඉන්දියානු ගඟ සම්ප්‍රදායේ ආභාෂය ඇතිව දාගැබ් නිර්මාණය වීම මහින්දාගමනයත් සමඟ ආරම්භ විය. මෙරට ඉදි වූ ප්‍රථම දාගැබ ථූපාරාමයයි. ඉන් අනතුරුව ද විවිධ රජවරුන්ගේ කාළ තුළ දී ද මහා දාගැබ් ප්‍රමාණයක් ඉදි විය. දාගැබ් අසල භික්ෂුන් වහන්සේලාට වැඩ සිටීමට පන්සල් නිර්මාණය විය. මිනිසා පන්සල සමඟ මනා සම්බන්ධතාවයකින් කටයුතු කළහ. කෘෂි කර්මාන්තයන් ස්වංපෝෂිත කිරීමට අතීත රජවරු ගම්මාන අසල විශාල වශයෙන් වැව් නිර්මාණය කළහ. එකළ ජනයා ජීවත් කළේ ද වැව් ජලයයි. පන්සලයි වැවයි දාගැබයි යන කොටස එකිනෙකට බැඳි පැවතුණි. මෙලෙස වැවයි දාගැබයි ගමයි පන්සලයි සංකල්පය සමඟ සමාජ සංවර්ධනයක් ඇති කිරීමෙහිලා වාරි කර්මාන්තය ඉවහල් විය.

අතීත වාරි ශිෂ්ටාචාර වල ජෛව හා අජෛව මානව හා සංස්කෘතික සියලු දෑ වැව කේන්ද්‍ර කොට ගෙන වාරි කර්මාන්තය පදනම් කර ගෙන සිදු ව තිබේ. එනම් වැව බිහි වූ හේතුවෙන් බොහෝ සම්පත් හා සබඳතා ඇති වූ බවත් වැවේ ක්‍රියාකාරිත්වය මත සියල්ල පාලනය වු බවත් බොහෝ අංගයන් එකිනෙක සබඳතා ගොඩ නැගීමට පදනම් වුයේ "වැව" ලෙසත් හඳුනා ගත හැකිය. පහත සටහනින් එය මනාව පැහැදිලි වේ.




වැවට ඉහළින් ඇති රක්ෂිතය විවිධ ශාක ගොන්නකින් සමන්විත විය. එය මානව සුභ සිද්ධිය සඳහා අග්‍ර මෙහෙයක් ඉටු කළ බව පෙනෙයි. සමාජ අවශ්‍යයතා සඳහා මෙන්ම විවිධාකාරයෙන් ඉවහල්ව ඇත. ඉහත සටහනෙහි වන සියලු කටයුතු ,සංකල්ප වාරි කර්මාන්තය හා බද්ධ වී ඇත. එසේම සමාජ සංවර්ධනායට බෙහෙවින්ම ඉවහල් වන කරුණු කාරණා විය.

ඉහතින් පෙන්වා දුන් කරුණු සියල්ලෙන්ම පැහැදිලි වන්නේ අනුරාධපුර යුගයේ සමාජ සංවර්ධනයට වාරි කර්මාන්තයන් බෙහෙවින් ඉවහල් වී ඇති බවයි.

**නිගමනය**

සංවිධානාත්මක අගනගරයක් වශයෙන් පණ්ඩුකාභය රජුගේ කාලයේ ආරම්භ වූ අනුරාධපුර නගරය අති උසස් පාලකයන් යටතේ පාලනය වී විනාශය කරා ළඟා විය. මේ යුගය තුළ සමාජයේ සෑම අංගයකම එනම් දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා ආගමික යන සෑම අංශයක් පුරා විහිදී වර්ධනයක් හඳුනා ගත හැකිය. එමඟින් එකළ සමාජ සංවර්ධනය පිළිබඳව පැහැදිලි වේ. මෙවැනි සමාජ සංවර්ධනයක් අනුරාපුර යුගය තුළ ඇති කිරීමට වාරි කර්මාන්තයන් බෙහෙවින් ම හේතු වී තිබේ. ඉහත සඳහන් සියලු කරුණු වලින් ගම්‍ය වන්නේ වසර එක් දහස් හාරසීයකට ආසන්න කාලයක් සිංහල රජධානිය වශයෙන් පාලනය වූ අනුරාධපුර යුගය තුළින් මනා සමාජ සංවර්ධනයක් මෙන්ම එවන් වාතාවරණයක් ඇතිවීමෙහිලා වාරි කර්මාන්තය විශාල වශයෙන් උපකාරී වී ඇති බවයි.

**පරිශීලන**

බ්‍රෝහියර්. ආර්. එල් (1999), ***බ්‍රෝහියර් දුටු ලංකාව***, පරි. ඒ හේවා වසම්, සූරිය ප්‍රකාශකයෝ, මරදාන.

ප්‍රසන්ජිත් පෙරේරා මුදිත, (2010***), ලාංකික වාරි උරුමය***, පරිසර යුක්ති කේතය, කොළඹ

බස්නායක. එස්. ටී. (1997), ***පුරාතන ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, එම්. ඩී. ගුණසේන හා සමාගම.

විජිත මණුවර්ණ, ***ශ්‍රී ලංකාවේ වැව්***

ඩී. තුසිත මැන්දිස්, ***පුරාතන අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ප්‍රදේශයේ ජල කළමණාකරණය***

සුරවීර, ඒ. වී. (2000), **අනුරාධපුර සංස්කෘතිය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.**

හංසනී දිල්හාරා, (2020), ***හෙළදිව වාරි සංස්කෘතිය***

# 06. පුරාණ වාරි කර්මාන්ත වපසරිය විශ්ලේෂණාත්මකව ප්‍රමාණය කිරීමට අභිලේඛන විද්‍යාත්මක සාධක සපයන දයකත්වය

ඞී.ඞී.බී. ගිම්හානි

## හැඳින්වීම

සුපෝෂිත සංස්කෘතිකමය වටපිටාවක් මතින් ගොඩනැගුණු උරුම රාශිගත ඉතිහාසයකට ඥතී වූ ශ්‍රී ලංකාව සිය ඓතිහාසික අක්මුල් නොවක් ක්ෂේත්‍ර ඔස්සේ විසරණය කළ භූමියකි. එහිලා අතීත ශ්‍රී විභූතිය අභිමානයෙන් වර්ණනයට සංකල්පමය අනුභූතීන් පාදක කර ගැනීම සුවිශේෂිත ය. එවන් සංකල්ප අතර වන ***"වැවයි දාගැබයි ගමයි පන්සලයි"*** යන්නෙන් සමස්ත සමාජයක පදනම සංකේන්ද්‍රනය කෙරුමට උත්සුක වූ බවක් ද පෙනේ. පුද්ගල සමූහයක එකතුවෙන් සැදුම්ලත් පුරාණ ග්‍රාමයක ප්‍රමුඛස්ථානය විහාරස්ථානයට හිමි විය. ග්‍රාම්‍ය සමාජයට අවවාද, ආදර්ශ සපයමින් ගුණගරුක දිවියට අඩිතාලම සැපයූවේ එතුළිනි. ඔවුන්ගේ කෘෂිකාර්මික ජීවනෝපායට අවැසි දියවර සැපයුණේ වැව් මඟිනි. වැව සැකසීමේ දී ඉවත් කෙරෙන පස් දාගැබ නිර්මාණයේ දී යොදා ගත් අතර සමස්ත ග්‍රාමීය ශ්‍රමය ඊට දයකත්වය සපයන ලදී. මෙනයින් අතීත ගැමියා උක්ත සංකල්පයට තදනුබද්ධව සිය ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලනික පැවැත්ම තහවුරු කර ගෙන ඇත.

එකී පුරාණ මානවයාගේ චින්තනය හා ඔහුගේ පාරිසරිකමය සබැඳියාව ද්‍රව්‍යාත්මක අවශේෂ මත පදනම් කර ගනිමින් හදාරණ විෂයයක් ලෙස සැලකෙන පුරාවිද්‍යා විෂයය තුළ අධ්‍යයනයන් සුලභව ම සිදු කරනුයේ සාහිත්‍ය මූලාශ්‍රයගත තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරෙන් අනාවරණය කර ගැනීම හරහා ය. මෙම ක්‍රියාවලිය තුළ අභිලේඛන මූලාශ්‍රයට හිමි වනුයේ සුවිශේෂී ස්ථානයකි. පුරාණ වාරි කර්මාන්තය හා සබැඳි බොහොමක් තොරතුරු මහාවංසය ඇතුළු වංසකතා සාහිත්‍ය තුළ කතිකාවට ලක් වුව ද නිරවද්‍ය දත්ත සැපයීමෙහිලා අභිලේඛන මූලාශ්‍රය වැදගත් වේ. එහෙයින් පුරාණ වාරි කර්මාන්ත වපසරිය විශ්ලේෂණාත්මකව ප්‍රමාණය කිරීමට අභිලේඛන විද්‍යාත්මක සාධක සපයන දයකත්වය අධ්‍යයනය කිරීම ප්‍රමුඛව අපේක්ෂිත ය. එසේම මේ පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යයනයකින් ක්ෂේත්‍රය පිළිබඳ රුචිකත්වයක් දක්වන්නන්ට යම් දැනුමක් සමීප කිරීම ද අරමුණු වේ.

## ක්‍රමවේදය

උක්ත අධ්‍යයනයේ දී භාවිත ක්‍රමවේදය වූයේ පුස්තකාල ගවේෂණය යටතේ දත්ත එක්රැස් කරමින් විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීම යි. විවිධ පර්යේෂකයන්ගේ පූර්ව පර්යේෂණ අධ්‍යයනය කිරීමක් ද සිදු කළ අතර වාරි කර්මාන්තය සම්බන්ධ තොරතුරු ඇතුළත් සාහිත්‍යමය මූලාශ්‍රය හා අභිලේඛන මූලාශ්‍රය සසඳමින් ලියැවුණු ග්‍රන්ථ සහ ලිපි ලේඛන වැඩිදුර පරිශීලනය කරන ලදී. අන්තර්ජාලය ඔස්සේ ද ඇතැම් ලේඛන පරිශීලනයට යොමු විය.

## විමර්ශනය.

ලාංකේය වාරි පුරාණය ක්‍රිස්තු පූර්ව හය වන සියවස තරම් දුරාතීතයට අයත් ය. ***වැ, වව, වවි, වපි, වාපී, වැව, වෙව*** ආදී නම්වලින් හැඳින්වෙන ජලය එක්රැස් කොට තබාගත් ඒකකය අතීත මානවයාගේ දෛනික ජීවිතය හා සාකල්‍යයෙන් ම බැඳුණකි. සාහිත්‍යයමය මූලාශ්‍ර වැව් පිළිබඳ සඳහන් කළ ද නිරවද්‍ය හා සනාථ වන මට්ටමේ සාධක සපයන්නට අභිලේඛන මූලාශ්‍ර සමත් වේ. ක්‍රිස්තු පූර්ව තුන් වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවස අතර කාලපරාසය තුළ දිවයින පුරා ව්‍යාප්තිත ලෙන්වල කටාරය යටින් කොටන ලද බ්‍රාහ්මී ලිපිවල වැව් හා ඇළ මාර්ග පිළිබඳ සඳහන් වීම විශේෂිත ය. මේ පිළිබඳ නියත සාධක ඉදිරිපත් වීම පිළිබඳ සෙනරත්

පරණවිතානයන්ගේ අදහස වන්නේ උක්ත සෙල්ලිපි යුගය වන විටත් ලාංකේය මිනිසුන් පසුකාලීන ව උසස් තත්ත්වයේ වාරි කර්මාන්ත නිර්මාණය ආරම්භ කොට ඇති බවකි.

පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන වන නැට්ටුක්කන්ද ලිපියක ***එරිකවාපි*** නම් වැවක් පිළිබඳව ද මිහින්තලේ ලිපියක ***ලොණවාපි*** නම් වැවක් පිළිබඳව ද හඳගල ලිපියක ***අනුලපිවපි*** නම් වැවක් පිළිබඳව ද සඳහන් වේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මණ්ඩාගල ස්ථානයෙන් හමු වන ලිපියක ***දරක තිස්සා*** විසින් පුද කළ ලෙනක් හා මරගම නමැති වැවක් පිළිබඳ අනාවරණය වේ. එසේ ම පුත්තලම දිස්ත්‍රික්කයේ තෝණිගල පර්වත ලිපි ද්විත්වයෙහි ***පරුමක තිසට*** අයත් වැවක් සංඝයා වෙත පිරිනැමූ බවට කෙරෙන සඳහන අනුව වාරි ප්‍රදාන පිළිබඳ සාක්ෂ්‍ය ද හෙළි වේ. මීට අමතරව ඇතැම් සෙල්ලිපිවල ***දනවාපි (දන වැව)*** නමින් සඳහන් වනුයේ දිය බෙදා හැරීම සඳහා කරන ලද වැව් විශේෂයක් පිළිබඳව ය.

වැව් සේ ම ඇළ මාර්ග පිළිබඳ හෙළි කරන සෙල්ලිපි හඳුනාගැනීම ද වැදගත් ය. පරණවිතානයන්ගේ සෙල්ලිපි අරුත් ගැන්වීම් තුළ ***ආලි*** ලෙස සංස්කෘතයෙහි ද ***ආළි*** ලෙස පෙළ බසයෙහි ද හෙළ බසින් ***ඇළ*** ලෙසින් ද සමකාලීනව ***අඩි*** යනුවෙන් ද හැඳින්වූ බව සඳහන් ව ඇත. ත්‍රිකුණාමල දිස්ත්‍රික් නාච්චියාර්මෙලෙ ලිපියෙහි අඹගම පිහිටි ***නකදක*** නම් ඇළක් පිළිබඳ කියැවේ. මාතලේ දිස්ත්‍රික් අලුවිහාරයේ ලිපියක ඇළක් පිළිබඳ සඳහනක් වන අතර එම දිස්ත්‍රික්කයේ ම දඹුල්ලෙන් හමුවන ලිපියක ***අනාණික*** යන යෙදුම පරණවිතානයෝ ජල සම්පාදනයේ ප්‍රවීණයෙක් වශයෙන් හඳුනාගනී. එහි ම වාරි මාර්ග නිලධාරී ***තිස්ස*** නම් පුද්ගලයෙක් පිළිබඳ හඳුනාගනී. මීට අමතරව කෑගල්ල මාම්පිට විහාර ලිපියක ***අඩිකය*** යන යෙදුමෙන් ඇළ මාර්ග භාරකරු හෙවත් රැකවලෙකු හඟවන බව පෙන්වා දෙයි. එහි ම ඇළ මාර්ග භාරකාර ***උතර*** පිළිබඳ සාධක වන බව වැඩිදුර පැවසේ. මහවැලි ගඟට නුදුරින් වූ මින්විල නම් ස්ථානයෙන් ලද කුඨකණ්ණතිස්ස රජුගේ සෙල්ලිපියක දෙගම නම් වූ ඇළ මාර්ගයක් පිළිබඳ තොරතුරු ඇතුළත් ය.

එකල භික්ෂූන් වහන්සේලාගේ පරිභෝජනය උදෙසා වැව් දියෙන් ලද අස්වැන්න වෙන් කළ බව සෙල්ලිපිවල එයි. පළවන ගජබාහු රජුගේ පාලුමැකිච්චාව ගිරි ලිපියේ ථූපාරාමයේ සංඝයාට සිවුපස පරිභෝජනයට වැව් දියෙන් ලත් අස්වැන්න ලබා දුන් බව කියැවේ. එසේ ම උචිත කාලයට අනුව වැව් භාරා එහි රොන්මඩ ඉවත් කිරීම සඳහා රාජ අනුග්‍රහය ලද බැව් උක්ත ලිපියේ ම සඳහන් ව ඇත. දෙවන මුගලන් රජු විසින් කළ අනුපුර සමයට අයත් මහා පරිමාණයේ වැවක් වන පදවිය වැව සෙල්ලිපිවල හඳුන්වනුයේ ***වීදිවාපී*** ලෙසිනි. අනුරපුර වූ නුවර වැව පළවන ගජබාහු රජුගේ නිර්මාණයක් බව වැව් කණ්ඩියේ පහළ තිබූ සෙල්ලිපියකින් අනාවරණය කොට ගෙන ඇත.

පෙරුමියන්කුළම් පර්වත ලිපියෙහි ***"1. සිඩම් - වහබ මහරජි නක සුදසන පතනගලහිය ජිනපටිසතරිය කම කරනක කොටු තිරගම... යහපතක් වේවා! වහබ මහරජ සහ නාග තිහලක නමැති ප්‍රදේශයේ පලොනකරක නමැති වැවේ ඇළවල මත්ස්‍ය භාගය සහ දියබද්ද සුදසන නම් භාවනා ගෘහයෙහි මුව සම් ඇතිරීම කරනු පිණිස තිරගම ආස්ථානයට දෙනු ලැබීය. භාණ්ඩාගාරික බතකගේ පුත්‍ර සයි කුමාරයාගේ රජ සභාවේ උසස් තනතුරක් නක නමැත්තා විසින් භාවනා ගෘහයෙහි මුව සම් ඇතිරීම පිණිස කෙතවලක වැවේ උදක ප්‍රාප්තිය ද වැවේ තම පියසන්තක කොටස් වූ ප්‍රාප්තිත්‍රය නොහොත් මත්ස්‍ය භාගය ද පරම්පරාවෙන් ම අයිති දිය බද්ද හා සයවැනි කොටස ද අමර ආස්ථානයට අණ බෙර ගස්වා දෙනු ලැබීය"*** සඳහන් වේ.

එසේම *"...2. දිනක මහගරිය වෙවසර වෙ කබුබෙ වෙවසර වෙ කටවනක පුල සර වෙ... 4. පවයට දිනෙ සග බෙගි කෙරෙයනි ම අතනො සිමෙ තවඅ වෙව වෙ නිලස වෙව වෙ ගජඅ වෙව වෙ පඩ වෙව වෙ ම..."* යනුවෙන් නාගිරිකන්ද පර්වත ලිපියෙහි වන සඳහනට අනුව මහා කුමාරදස අභය රජ විසින් මිලයට ගනු ලැබූ බමණගිරිය විහාරයට ත්‍යාග කරන ලද මහගිරිය, වුගරිය, කබුබ හා කටවනකපුල යන වැව් සතරත් තෙත් ඉඩම්වලත් දියබද්ද අහෝසි කර ස්වාමි භාගය බමණගිරිය වෙහෙරේ භික්ෂු සංඝයාට සිවුපසය සඳහා පරිත්‍යාග කරන ලද බවත් තමන්ට අයත් තවඅ, ගජඅ වැව්වල දියබද්ද සහ ස්වාමි භාගය බමණගිරිය වෙහෙරේ භික්ෂු සංඝයාට දෙන ලද බවත් උන්වහන්සේලාට අයත් බැවින් එහි දෙවර්ගයේ ම බදු අහෝසි කර ඇති බවත් හෙළි වේ.

මෙරට වාරි කර්මාන්ත හා සබැඳි අභිලේඛන අධ්‍යයනයේ දී ක්‍රිස්තු වර්ෂ හතර වන සියවසේ සිට අනුරාධපුර යුගයේ අවසානය දක්වා වූ ඇතැම් සෙල්ලිපිවල වාරි මාර්ගවල ස්වරූපය, ඒවා නඩත්තුව හා වාරි නීති, නිලධාරීන් මෙන් ම වාරි තාක්ෂණය පිළිබඳ කරුණු ඇතුළත් ය. එසේ ම වැව් පාලන කටයුතු පිළිබඳ වූ නිලධාරීන් හා ඒ ආශ්‍රිත බදු වර්ග පිළිබඳව සටහන් ව ඇති පරිහාර කණු ද වැදගත් ය. අතුරුපොලයාගම ලිපියේ ***'දෙළොස් මහ වැ තැන්'*** වැව් බලාගෙන සිටි ගම්වැසියන්ගෙන් යුක්ත බෙත්මක නිලධාරීන් පිරිසක් ලෙස නිගමනය කරයි. තව ද මොරගොඩ ලිපියේ රජය වැව් ජලය පරිහරණය කරන්නන්ගෙන් දියබෙදුම වෙනුවෙන් බද්දක් අය කළ බැව් සඳහන් ය. සමකාලීන සෙල්ලිපිවල ***'වපිහමික'*** හෝ ***'වවිහමික'*** යනුවෙන් ***'වැව් හිමියා'*** යනාර්ථයෙන් වැව් ඉදි කළ පුද්ගලයන් හඳුන්වා ඇත. විශේෂයෙන් ම ක්‍රිස්තු වර්ෂ පළවන හා තුන්වන සියවස් අතර කාලපරාසය තුළ ඉදි වූ වැව් එකසිය පනහක පමණ නම් සමකාලීන සෙල්ලිපිවලින් අනාවරණය වේ.

දෙවන මහා සේන රජුගේ කාලයට අයත් සෙල්ලිපියක ***වැවැජෑරුම්*** නිලධාරියකු පිළිබඳ කියැවෙන අතර ඒ වාරි කර්මාන්තය හා සබැඳි නිලධාරියකු වශයෙන් හඳුනාගනී. ***පියොවදරන්නන්*** නම් නිලධාරීන් පිළිබඳ සඳහන් නවය - දහය සියවස්වලට අයත් අත්තාණි ටැම්ලිපි සම්බන්ධ අදහස් දක්වන කොඩ්රින්ටන් ඔවුන් වාරි කර්මාන්ත පරීක්ෂකවරුන් ලෙස මත පල කරයි. දහවන සියවසට අයත් ටැම්ලිපි කිහිපයක ම ***තලා අරැක්ක හා තලා ඇරැක්ක වැදෑරුම්*** නම් වූ නිලධාරීන් දෙදෙනෙකු පිළිබඳ දැක්වෙන අතර අරක් යන්නෙන් ආරක්ෂක තනතුරක් අර්ථ ගැන්වෙන හෙයින් තලා අරැක්ක යනු වාරි මාර්ග ආරක්ෂකයා ලෙසත් තලා ඇරැක්ක වැදෑරුම් යනු ජල සංරක්ෂණය පිළිබඳ විධායක තනතුරක් වශයෙනුත් හඳුනාගනී. මීට අමතරව වාරි නිලධාරීන් පිළිබඳව මලගණේ, කොළඹ කෞතුකාගාර හා නොච්චිපොතාන යන ටැම් ලිපිවල ද මන්නාරම් කච්චේරි සෙල්ලිපියේ ද තොරතුරු ඇතුළත් ය.

ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවසට අයත් සිතුල්පව්වෙන් හමු වුණු සෙල්ලිපි යුගලෙක වාරි කර්මාන්ත ආශ්‍රිත බදු පිළිබඳ අදහස් හෙළි කරමින් සෑම ගොවි කන්නයක දී ම දිය බදු අය කළ බව කියැවේ. මෙකල ලිපිවල ***උදකපති හා දකබක*** යනුවෙන් දියබද්ද සටහන් කොට ඇත. අනුරපුර මුල්කාලීන සෙල්ලිපිවල ***මතෙර මජිබක හා මතර මජිබකපති*** යනුවෙන් වැව් හා සබැඳි ඇළ මාර්ග පිළිබඳ කියැවෙන බව අදහස් වේ. පළවන සිරිනාග රජුගේ පෙරියකඩු විහාර පර්වත ලිපියේ ***'විහාරවලිය වවිය මතර මජිබක තිනි පෙතය එක පෙතෙක - විහාරවලිය වැවේ මතර මජික (බද්දේ) තුන් කොටසින් එක කොටසක්'*** යන්නෙන් මතිරාවලින් ගන්නා ජලයෙන් කරන කුඹුරුවල අස්වැන්නෙන් තුනෙන් කොටසක් දිය බදු වශයෙන් අය කළ බව සඳහන් වේ. නව වන සියවසට අයත් ඊරිපින්නියාව ලිපියෙහි ***'සකුර්වඩා ගොයකොඩ් බද් වත්තට් පොසොනවුල්ලට් මහමඩලියෙන් වන් දෙළොස් කිරියැ දියබෙදුම් නොගන්නා කොට්'*** යන්නෙන් ද හතර වන මිහිඳු රජුගේ සමයට අයත් පොළොන්නරු රජ මාළිගා ටැම් ලිපියෙහි ***'මහඇළින්***

***දියවත් තාක් තැනට් කුළිත වත්තට් හසුලනෙත් ගත්තා දියබෙදුම් වෙල් වැස්සෙන් වෙල් කැමියන් නොවලකණු ඉසා'*** යන්නෙන් ද ***දියබෙදුම්*** යනු බද්දක් නොව කුඹුරු සඳහා වෙන් කළ ජල කොටස බව අදහස් කරයි. මෙලෙස අනුරපුර අවසන් භාගයේ ලිපිවලත් නවය දහය සියවස්වල ලිපි ද්විත්වයකත් දියබද්ද හඳුන්වා ඇත්තේ ***පිසඹුරුවත*** යනුවෙනි. පොළොන්නරු බද්දසීමා ප්‍රාසාදයේ ටැම් ලිපියක හා වාදුරුප්ප පුවරු ලිපියෙහි ද සඳහන් වන්නේ එලෙසිනි.

හතර වන මිහිඳු රජුගේ වෙස්සගිරි සෙල්ලිපියෙහි තිසා වැවේ ජලය භාවිතය සම්බන්ධයෙන් රජු පැන වූ නීතී ඇතුළත් ය. මෙහි ***'දන වවැකින් මොහොල් නඟු රද් සොරො පෙරෙටු සතර රියනක් දියට හින්ද් වූ දිය කටු පහණ්...'*** යනුවෙන් වාරි තාක්ෂණය හා සම්බන්ධ මොහොල හා දියකැට පහණ පිළිබඳ සඳහන් වේ. ***'දෙළොස් මහ වැ සුන වැරියන් නොගන්නා ඉසා'*** යනුවෙන් රජයට අයත් වැව් පිළිබඳ මහපා කස්සපගේ සීගිරි ටැම් ලිපියෙහි සඳහන් වන අතර රජය සතු වූ දෙළොස් මහ වැව් පිළිබඳ දෙරබාවිල හා ගොන්නෑව දේවාල යන ටැම් ලිපිවල දක්වේ. විහාරස්ථාන සතු ව ද වැව් පැවති බව ක්‍රිස්තු වර්ෂ හතර හෝ පහ වන සියවසට අයත් පානම වැව විහාර ගිරි ලිපියෙහි ***'බතයුරි වවියෙ සගහටය දි'*** යනුවෙන් වන සඳහනට අනුව හෙළි වේ.

පෞද්ගලික වැව් පිළිබඳ දන්තපාද විහාර ශිලාලේඛනයෙන් (ගනය පවහ වසන ජයසවලහ ච ද වව) හා රිදී විහාර පර්වත ලිපියෙන් හෙළි වේ. අල්ලයි ටැම් ලිපියේ ද පීලිගම පර්වත ලිපියේ ද අවුණ යන පදයෙන් අමුණු පිළිබඳ සඳහන් වේ. මීට අමතරව ක්‍රිස්තු වර්ෂ තුන් වන සියසයට අයත් තිඹිරි වැව ශිලාලේඛනයෙහි පවුලක් සතු වැවක් පිළිබඳව ද පළවන වික්‍රමබාහු රජ සමයට අයත් කහඹිලියාව ලිපියෙහි පුද්ගලයකු සතු ඇළක් පිළිබඳව සඳහන් වේ. තව ද හදගල, අවුකන, කුරුගොන්කන්ද, ගල්ගේ, සැස්සේරුව යන ලිපිවලින් පිළිවෙළින් අනුලපි වැව් හිමි ***පරුමක මහ වබලිය*** හා නකදපික වැව් හිමි ***දිගදත***, කඩපි වැව් හිමි ***උවහජනක***, ගොකනගමක වැව් හිමි ***තිස*** යන පරුමකවරු පිළිබඳව ද කඩහලක වැව් හිමිකරු, යවවවික වැව් හිමි ***චූල හුමන*** පිළිබඳව ද සාධක හමු ව ඇත. ***ගමික වවි, මහ වවි, දන වවි*** යනුවෙන් වැව් වර්ග ත්‍රිත්වයක් පිළිබඳ කණිට්ඨතිස්ස රජුගේ ජේතවනාරාම සෙල්ලිපියෙහි සඳහන් ය.
පෙර පැවති සංකීර්ණ වාරි මාර්ග පද්ධතිය නඩත්තු කිරීම සඳහා පැවති යාන්ත්‍රණය ද වාරි මාර්ගවල ආරක්ෂාව, විධිමත් ජල කළමනාකරණය සඳහා පැන වූ නීති පිළිබඳව ද තොරතුරු ඇතුළත් සෙල්ලිපි අතරට දඹේගොඩ ටැම් ලිපිය අයත් ය. මිහින්තලා පුවරු ලිපියට අනුව ***" කුඩින් කළ වරජක් ඇත ගම් සිරිත් දඩ් කිරා කිරු දඩ් මිනැ ඇකැ අවට සොළොස් රියන් ගැම්බුරැ රියන් කබුල් බැගින් ගෙනැ වැව් මෙහෙ කැරැවියැ යුතු නොකළ කිරු දඩ් ගතැ යුතු"*** ලෙසින් යම් යම් වැරදිවලට දඬුවම් වශයෙන් වැව්වල වැඩ කිරීමට සිදු වූ බවත් එසේ නොකළහොත් දඩ ගෙවීමට සිදු වූ බවත් අනාවරණය වේ. එසේ ම කොළඹ කෞතුකාගාර ටැම් ලිපියෙන් ගමකට ඔයකින් ජලය ගලා ඒමට බාධා නොකළ යුතු බැව් කියැවේ.

ක්‍රිස්තු පූර්ව පළවන හෝ ක්‍රිස්තු වර්ෂ පළවන සියවසට අයත් ලිපි වන තෝරව මයිලෑව විහාර ලිපියක ***"උපසක විණුය ලෙණෙ පුනපෙටික වවි හිමිකහ - පුන පෙටික වැවේ හිමියා වූ විණු උපාසකයාගේ (මේ) ලෙණ..."*** යනුවෙන් ද රජරට ලිපියක ***"(පු)නපිටික වවි හමික උපසක විනුහ ලෙණෙ ශගශ-පුනපිටික වැවේ අයිතිකරු වූ විණු උපාසකයාගේ (මේ) ලෙණ සංඝයාට"*** යනුවෙන් ද සඳහන් වේ. නා උල්පත ලිපියක
***"1...(ල)ජකතිස මහ රජි විහර කරවය අබදලක වවි සග දිනි. 2...මෙ තෙ හුණ-තණකය කතිර ගණක ච-කෙතක බණක ච-- 3...වවි බිකු සග හටයෙ දිනි. ලජ්ජිතිස්ස මහ රජු විහාරය කරවා අබදලක වැව සංඝයාට දුන්නේ ය, මෙතෙහුණා තණකය කතිර ගණක නම් වැව ද කෙතක බණක නම් වැව ද සංඝයාට දෙන ලදී"*** යනුවෙන් සඳහන් වේ. විහාරේගල සෙල්ලිපියක සහ

රජු පුද කළ ***උපල දෙණික වැව*** අලුත්වැඩියා කර එකද්වාර විහාරයෙහි භික්ෂූන්ට නැවත පිදීම පිළිබඳ සඳහන් ය.

අපර බ්‍රාහ්මී යුගයට අයත් සෙල්ලිපි අතර වන කුරුණෑගල ඉරියාව ලිපියේ ***පරුමක හදන*** විසින් දිපිගල්ල විහාරයට පුද කළ වැවක් පිළිබඳව ද ගල්ගමුවෙන් හමු වූ ලිපියක ***අබය රජ*** විසින් කළ වැව් පරිත්‍යාගයක සාධක ද වේ. කොතලකිඹියාවෙන් හමු වී ඇති ලිපියක දකබරි ගමෙහි වැවෙන් ***උපාසක දතට*** අයත් කොටස් පරිත්‍යාගයක් ද හලඹගල ලිපියක ***උතර*** නම් වැවක් හා ***තිස*** තෙරගේ ජල පිටවානක් ද ගනේකන්ද විහාරයේ කම්කරුවන් සඳහා නව ලක්ෂයක් දී සැකසූ අමුණක් ද ***අබ*** නම් ඇලෙහි වේල්ල සමීපයෙහි ඉඩම් කොටසක සාධක ගල්ලෙන විහාර ලිපියෙන් ද අනාවරණය වේ.

**නිගමනය**

පුරාණ වාරි කර්මාන්ත වපසරිය විශ්ලේෂණාත්මකව ප්‍රමාණය කිරීමට අභිලේඛන විද්‍යාත්මක සාධක සපයන දයකත්වය ප්‍රශස්ත බව උක්ත සමස්තය මත පිළිගත යුතු ය. සමකාලීන ශිලාලේඛනත් සෙසු ලිපි සියල්ලත් සාහිත්‍ය මූලාශ්‍රය හා සැසඳී කරුණු ඉදිරිපත් වන හෙයින් විතර්කව එය සාධනය වේ. ප්‍රමාණාත්මක හා ගුණාත්මක සාධක අනුව පෙර කී අරමුණු සාධනයෙහිලා ද මෙම අධ්‍යයනය සාර්ථක බැව් කිවමනා ය. උක්ත තේමාව සැලකිය යුතු අන්දමින් විස්තර කිරීමට ශිලාලේඛන සමත් වන්නා සේ ම නුදුරේ දී පුරාවිද්‍යාත්මක සොයාගැනීම් මත තවදුරටත් අධ්‍යයන වපසරිය පුළුල් වී නවකයන්ට නව මාවත් විවර වනු ඇත. එහෙයින් වාරි උරුමය රැකගනිමින් ක්ෂේත්‍ර අධ්‍යයන පෝෂණයට දයකවීම කාලීන අවශ්‍යතාවක් සේ සැලකිය හැකි ය.

**පරිශීලන.**


අමරවංශ කොත්මලේ හිමි, (1969) ***ලක්දිව සෙල්ලිපි***, කොළඹ, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

අඹන්වල සී. බී, (2015) ***ලංකාවේ වාරි තාක්ෂණය හා එහි තිරසාරත්වය උදෙසා බල පෑ සමාජ හා තාක්ෂණික සාධක පිළිබඳ විමසුමක්***, https://sinhala.archaeology.lk

***අනුරාධපුර අවසානය දක්වා ශ්‍රී ලංකාවේ වාරි කටයුතුවල හා වාරි තාක්ෂණයේ පැවති විශේෂ ලක්ෂණ***, https://inhistoricmedia.blogspot.com

ඉන්දික එම්.කේ.ඒ, (2012), ***අනුරාධපුර යුගයේ සමාජ ක්‍රමය***, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කුමාර ඒ. ටී, (1990) ***පැරණි ලක්දිව අත්තාණි ප්‍රදන විධි***, කැලණිය, විද්‍යාලංකාර මුද්‍රණාලය.

විතානච්චි සී. ආර්, (2015) ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ සමාජ පුරාවිද්‍යාත්මක අවකාශය හඳුනාගැනීම,*** The Journal of Archaeology and Heritage Studies, http://repository.rjt.ac.lk '

විතානච්චි සී. ආර්, (2018) ***ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය ජල මාර්ග කේන්ද්‍රීයව බිහි වූවක් නොවේ***, www.silumina.lk

දිවාකාර ඒ.අයි, (2015) ***සෙල්ලිපි විමසුම***, කැලණිය, සම්භාව්‍ය ප්‍රකාශන.

බස්නායක සී.ආර්.එම්.කේ. (2011) ***දියවර වගතුග***, අනුරාධපුරය, විමල් ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම.

මුදියන්සේ එන්, (2000) ***සිංහල ශිලාලේඛන සංග්‍රහය***, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජේතුංග ඩබ්.එම්.කේ. (2014) ***ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම-ii; විශේෂාංග-ද්‍යා*** කොළඹ, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, (සංස්).

සිරිවීර අයි, (2001) ***රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි***, කොළඹ, දයාවංශ ජයකොඩි සහ සමාගම.

සුරවීර ඒ.වී. (2009) ***අනුරාධපුර සමාජය***, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

***ශ්‍රී ලංකාවේ ඉතිහාසය***, (1994) බංගලා හන්දිය, පිටකෝට්ටේ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

***ශ්‍රී ලංකාවේ ඉතිහාසය*** (අනුරාධපුර යුගයේ සිට 1978 දක්වා), (2015) කොළඹ, සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

# 07. ජෛව විවිධත්වය ආරක්ෂා කෙරෙමින් ගොඩ නැගුණු ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ජල කළමණාකරණය

ඩී. ඒ. එම්. පී. ගුණවර්ධන

**හැඳින්වීම**

ජීවයක පැවත්ම කෙරෙහි අත්‍යවශ්‍ය මූලිකාංගයක් ලෙස ජලය හැඳින්විය හැකිය. පෘථිවිය එසේත් නැතිනම් තෞම පද්ධතිය ප්‍රධාන උප පද්ධති හතරකින් සමන්විත වේ. එනම් ජල ගෝලය, ශිලා ගෝලය, වායු ගෝලය වන ජෛව ගෝලයකි. මෙහි ජෛව ගෝලය නැතිනම් ශාක හා සතුන් කෙරෙහි පැවැත්මට අනෙකුත් පස, වායු යන අජීවි සංකේත වන අන්තර් සම්බන්ධතාවය ඉතා වැදගත් වේ. මෙ අනුව ජලය යනු එහි අන්තර්ගත වැදගත් සංකේතයකි. ඉන්දීය ජන සංක්‍රමණිකයින් මල්වතු ඔය, මහවැලි ගඟ කනදරා ඔය ආදී වූ ගංගා නිම්න ආශ්‍රිතව සිය ජනාවාස ගොඩනගා ගන්න කෘෂිකාර්මික ජීවිතයට එය රුකුලක් වූ බැවිණි. ජල කළමණාකරණ සැලැස්ම තුළ භූමි සැලැස්ම හා පාංශු සංරක්ෂණ සැලැස්ම ද අන්තර්ගත වී ඇත. මෙලෙස ශ්‍රී ලංකාවේ වියළි කලාපයට ලැබෙන වැසි ජලයෙන් කොටසක් වැව් හා අමුණු නිසා ආරක්ෂා විය. පරිසරයට අනුකූලව කටයුතු කිරීමේ ප්‍රබුද්ධ ඥානයක් පැණි රජ දරුවන්ටත්, එකළ සමාජයටත් පැවති හෙයින් වියළි කාලාපය ජනාවාස පිහිටි ප්‍රදේශවල සශ්‍රීකත්වය උදෙසා ජලය ගබඩා කර තබා ගැනීමට ඔවුහු වැව් බැන්දෝය. ජල ශිෂ්ටාචාරයට ඉතා දිගු ඉතිහාසයක් පවත්නා අතර එය වඩා ක්‍රමානුකූල හා විධිමත් ලෙස සංවර්ධනය සඳහා යොදා ගත හැකි සංවර්ධන උපාය මාර්ගයක් ද වේ. ජෛව විවිධත්වය ආරක්ෂා කෙරෙමින් ගොඩනැගුණු ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ජල කළමනාකරණ පිළිබඳ සලකා බැලීම මෙම ලිපියේ මූලික අරමුණ වී ඇත.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍ර ආශ්‍රය කොට ගනිමින් රචනා කරන ලද සාහිත්‍යය මූලාශ්‍ර මෙන්ම අන්තර්ජාලය ඇසුරෙන් ලබා ගන්නා ලද ඡායාරූප හා සිතියම් ද උපයෝගී කොට ගැණිනි.

**විමර්ශනය**

**ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ජල කළමනාකරණය**

ශ්‍රී ලාංකික පුරාණ ජන සමාජය විසින් මේ සඳහා භාවිතා කරන ලද අති විශ්ෂ්ට වූ තාක්ෂණික ක්‍රමවේදය නම් ''වැව්'' නිර්මාණයයි. අතීතයේ සිටම ශ්‍රී ලාංකිකයන් ජල කළමණාකරණය පිළිබඳ ඉතා ගැඹුරින් දැනුමක් තිබූ සමාජයක් වීම මෙහි ලා කැපී පෙනෙන ලක්ෂණයකි. වර්තමානයේ මෙම ජල කළමනාකරණය වාරි පද්ධතිය ලෙස හඳුනා ගනු ලබන අතර සාම්ප්‍රදායික ජල කළමනාකරණයෙහි ලා පැවතියේ තිරසාර කළමනාකරණ ක්‍රමවේයක් විම විශේෂිත වේ. ඒ ආශ්‍රිත ශාක සතුන් මෙන්ම මානව පරිසර පද්ධතිවල සංකලනයක් ලෙස දැකිය හැකිය. එනම් වියළි කලාපයේ ප්‍රමාණවත් වර්ෂාපතනයක් දැක ගැනීමට නොලැබීම හේතුවෙන් අතීත සිංහල ජනයාට ස්ථිර කෘෂිකර්මාන්තයක නියැලීමට නොහැකි විය. මෙලෙස නිසි කලට ජලය සැපයීම අපහසු බැවින් අහස් දිය ගබඩා කර ගැනීම සඳහා වියළි කලාපය පුරාම වැව් පද්ධති නිර්මාණය කර ගැනීම දැකිය හැකි වේ. විශේෂයෙන්ම නිම්න ජනාවාස අසලින් කුඩා ජලාශයක් ඉදිකරනු ලැබුවේ වැසි ජලය රඳවාගෙන ස්නානය කිරීම හා ගෘහස්ත අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහායි. ඊට අමතරව ඒ ආසන්නයේම පිහිටි පහත් බිම්වලට ජලය සම්පාදනය කර එහි වී වගා කිරීම ද අරමුණක් විය. ශ්‍රී ලංකාවේ හතරවැනි

හා හයවැනි සියවස්වල වියළි කලාපයේ ජන ජීවිතය ගොඩනගා ගැනීමට ප්‍රධාන ක්‍රමවේද දෙකක් අනුගමනය කර ඇත.

1. වැසි ජලය සරල ලෙස නිර්මාණය කරන ලද ජලාශයක රඳවාගෙන එම ජලය ප්‍රාථමික ඇළ මාර්ග ඔස්සේ එකල ජීවත් වූ සුළු ජනතාව වෙත ලබා දීම
2. නිත්‍ය වහයෙන් වසර පුරාම ජලය රැගෙන යන වඩා සැඩ රල ප්‍රවාහයක් නැති ගංගා ප්‍රාථමික ඇසුරින් ගල් පර්වත දමා එම ජලය කුඩා ඇළ මාර්ග ඔස්සේ වගාබිම වලට ගැනීම.

මෙලෙස ජලය රැස්කර ගැනීමට හා ජලය ප්‍රයෝජනයට ගැනීමට එකල මිනිසුන් උත්සහ දැරූහ. එහෙත් මුල් කාලයේ මෙම ජලාශ අක්කර දෙක තුනක පමණ කුඩා බිම් කඩක ව්‍යාප්තව පැවතිණි. ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙම හිග සම්පතක් වන ජලය නැමැති අභියෝගය ජය ගැනීමට මූලික උත්සාහයක් ගත් පළමුවැන්නා ලෙස අනුරාධ කුමරු දැක්විය හැකි අතර ඔහු මල්වතුඔය ආශ්‍රිතව අනුරාධගාම නම් ගමක් නිර්මාණය කළ අතර එහි වාසය කළ අයගේ එදිනෙදා අවශ්‍යතාවයන් සහ ගොවිතැන් කටයුතු පහසු කිරීමට ගමට දකුණු දිශාවෙන් කුඩා වැවක් නිර්මාණය කළ බව මහා වංසයේ දැක්වේ. අතීතයේ දී බෙහෙවින්ම වැව් නිර්මාණය කුඹුරු හා සමගාමීව දම්වැලක ආකාරයට ඉදිකර ඇත. මේ නිසා එක් වැවකින් නිකුත් කරන ජලය ඊට සම්බන්ධ වූ වැවේ ජල ධාරිතාව පවත්වා ගැනීමට හැකි අයුරින් වාරිමාර්ග සකස් කර තිබේ. මෙය ''වෙව් පහු වතුර ක්‍රමය'' යනුවෙන් එකල හඳුන්වා ඇත. වියළි කලාපීය ගම් වැව් සහ තෙත් කලාපීය අමුණු ප්‍රාන වශයෙන් ග්‍රාමීය වාරිමාර්ග යටතට ගැනේ. ඒ හැර උතුරු ප්‍රදේශවල උස්සහන වාරිමාර්ග ක්‍රම, කඳුරට හෙල්මළු ආශ්‍රිත වාරිමාර්ග ක්‍රම සහ නැගෙනහිර වියළි කලාපීය වර්ෂාපෝෂිත සුළු වාරිමාර්ග ක්‍රම ද මේ ගණයෙහි ලා සැලකිය හැකි ය.

**උතුරුමැද පළාතේ එල්ලංගානුගත ග්‍රාමීය කුඩා වැව් වල විකාශනය සහ ව්‍යාප්තිය**

සෑම අවුරුද්දේම මැයි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා දික් ගැස්සී පවතින නියං කාල වල දී ගෙදර දොර ජල අවශ්‍යතා අවම වශයෙන් වත් ලබා ගැනීම ශ්‍රී ලංකාවේ වියළි කලාපීය පෙදෙස් වල පවතින ප්‍රධාන දුෂ්කරතාවයකි. එවැනි වාතාවරණ තුළ මොනම අන්දමේ හෝ ජනාවාසයක් පවත්වා ගැනීමට නම් ගොවිතැනට ජලය සැපයීමට වඩා ප්‍රමුඛත්වයක් දෙන අවශ්‍යතා වනුයේ බීමට, සේදීමට මෙන්ම අනෙකුත් ගෙදර දොර කටයුතුවලට ජලය ලබා ගැනීමය. වියළි කලාපයේ තද පාෂාණ පදනම මත ඇති පාංශු ස්ථර වල ස්වභාවිකව පිහිටා ඇති නොගැඹුරු භූගත ජල නිධි අතිශයින්ම විරල බැව් වටහා ගැනීමෙන් පසුව අඛණ්ඩවම අවශ්‍ය ජලය ලබා ගැනීමට වූ එකම විකල්පය වූයේ කිසියම් ප්‍රමාණයක වැසි ජලය එකතු වූ විල් නැතහොත් පොකුණු පරිහරණය කිරීමය. ''ජලය ලබා ගැනීමට හැකි කෘතිම ජලාශ නොවූයේ නම් උතුරුමැද පළාතේ කිසිම ජනාවාසයක් නොතිබී යන්නට ඉඩ තිබුණේට'' යි අයිවර්ස් 1899 දී කර ඇති දෘෂ්‍යමය ප්‍රකාශයෙන්ම පැහැදිලි වේ.

**උඩරට රාජධානියේ කුඩා අමුණු**

මහනුවර රාජධානී සමයේ දී (1524-1815) වියළි කලාපයෙන් විශාල ජන සංඛ්‍යාවක් මැද කඳුකරයට සංක්‍රමණය විය. බ්‍රෝහියර් (1957) සඳහන් කර ඇති පරිදි කඳුකරයට විශ්වාසනීය වාර්ෂික වර්ෂාපතනයක් ලැබීම නිසා වැසි ජලය එක්රැස් කරගෙන තැබීම සඳහා වැව් තැනීමේ එතරම් අවශ්‍යතාවයක් නොවිණි. කඳුකරයේ බෑවුම්වල හෙල්මළු කුඹුරු අස්වද්දා තැනූ ලියදි මඩ කොටා වී වපුරා කපා අහුරා ගැනීමට ප්‍රමාණවත් වැසි ලැබුණු හෙයින් ජලාශ තනා ඒවායින් කුඹුරුවලින් වතුර හැරවීම අවශ්‍යතාවයක් කොහෙත්ම නොවීය. ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ සියවස් ගණනාවක් තිස්සේම වියළි කලාපයට උචිත ජල

සම්පාදන ක්‍රම බිහිකොට ඒවා විකාශනය කිරීමෙන් ලත් ප්‍රත්‍යක්ෂ ඥාන සම්භාරයක් සතුව සිටි දේශීය ඉංජිනේරුවරු කඳුකර භූ දර්ශනයට උචිත අයුරින් වාරි ක්‍රම සහ විධි ප්‍රගුණ කරමින් කඳුකරය සඳහා ද උචිත වාරි ක්‍රම සහ විධි විකාශනය කර ගැනීමට හැකියාවක් ඇති පිරිසක් වූ බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස ගංගාවට හා ඔයවල් වල නිරන්තරයෙන්ම ගලා ගිය දිය පහරවල් හරහා ලී කණු සිටුවා ඒවාට කොළ අතු පුවා හිරකොට තැනූ ''පෙරවැටි'' අනුසාරයෙන් ජලය ඒ ගංගාවල් හා ඔයවල් දෙපස වූ ලියදි වලට ඇළවල් මඟින් හරවා යැවීමේ ''අමුණු'' ක්‍රමය බිහි කිරීමයි. වැව් ඇත්තේ වියළි කලාපයෙහි ය. අමුණු බහුලව ඇත්තේ කඳුකර ප්‍රදේශයෙහිය.

මෙරට ඇත් අමුණු වලින් සියයට අසූවක්ම ඇත්තේ බදුල්ල, මහනුවර, රත්නපුර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක වලය. දාහත්වන සියවසේ දී උඩරට රාජධානියේ පැවති සමාජීය මෙන්ම ආර්ථික තත්වය පිළිබඳ අධ්‍යයනයක යෙදුණු දේවරාජා (1995) සඳහන් කරනුයේ ''උඩරට රාජධානිය ආර්ථිකය සාර්ථකව කරගෙන යමින් පැවති වී ගොවිතැන මත රැඳුණු කෘෂි ආර්ථිකයක් බවත් උඩරට රාජධානියේ කඳු බෑවුම් අඩි තුනේ සිට අඩි අට දක්වා පළල ඇති හෙල්මළු සකසා එම කඳු බෑවුමේ උඩවානේ සිට යටවාන දක්වා පඩි පෙළවල් මෙන් සැකසුණු සමතලා ලියදි වැටි ලැබූ වැසි ජලය, එකිනෙක හෙල්මළු වල ක්‍රමානුකූලව එකතු වී පිරී ගිය විට ඒ වතුර පහළ හෙල්මළු එකිනෙකට වැසී ඒමට විචාරාත්මකව සකසා තිබූ විධිමත් ජල පාලන ක්‍රමය අදටත් නොවෙනස්ව පවතියි.

සාම්ප්‍රදායික වැව් ආශ්‍රිත ජල කළමනාකරණය විධිමත් හා ක්‍රමවත් අයුරින් සිදුකර ඇත. ජලාශයක රැස්කරගත් ජලය පාලනයකින් තොරව ජල තටාකයේ පෘෂ්ටීය පීඩනය මතට බෙදා හැරියා නම් නැතහොත් ස්වාභාවික තත්වය යටතේ ගලා යෑමට ඉඩ හැරියානම් අක්කර සිය ගණනකට ප්‍රමාණවත් ලෙස ජලය සම්පාදනය කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අතීත රජ දරුවන්ට කිසිසේත් නොහැකි වනු ඇත. එහෙත් ඔවුන් ජලය ක්‍රමවත්ව බෙදා හැරීමටත් වැවේ ජලය ආරක්ෂා කර ගැනීම හා වැව ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ තාක්ෂණික හා කළමනාකරණ උපාය මාර්ග අනුගමනය කර ඇත. එහි දී සාම්ප්‍රදායික වැවක දැකිය හැකි ප්‍රධාන අංග අටක් හඳුනාගත හැකි වේ. වැව් බැම්මේ ඇතුල් පැත්තේ බැම්ම ආරක්ෂා කර ගැනීම සඳහා රලපනාව සාදා ඇති අතර එය වැව් බැම්මේ සිට කළුගල් පුවරු අතුරා සාදා ඇත. වැව් දියෙහි හට ගන්නා වේගවත් ජල පහරින් වැව් බැම්ම ආරක්ෂා කර ගැනීම සඳහා මෙය සාදා ඇත. බිසෝ කොටුව අතීතයේ දී කළුගල් භාවිතාකර නිම කර ඇති අතර මෙය හෙළ වාරි කර්මාන්ත ශිල්පීන්ගේ ශ්‍රේෂ්ඨතම නිර්මාණයක් වී ඇත. වැවකින් වැව් බැම්ම හරහා ජලය ගෙන යාමේදී ඇතිවන පීඩනය වළක්වා ගැනීමට මෙය නිර්මාණය කර ඇත. දැඩි වර්ෂා කාලයේ දී වැවට එක්වන ජලය ආරක්ෂාකාරී ලෙස පිට කිරීම සඳහා පිටවාන සාදා ඇත. වැව් බැම්මේ කෙලවරක වැව් බැම්මක තරමක් පහතින් කපොල්ලක ආකාරයෙන් කළුගල් පුවරු අල්ලා මෙය නිමකර ඇත. වැවේ ජලය පිටතට ගැනීම සඳහා හෙළ වාරි මාර්ග ශිල්පීන් සොරොව්ව නිර්මාණය කර ඇත. ඒ ඒ කාලවල දී ඒ ඒ අවශ්‍යතාවය අනුව සොරොව් වර්ග කිහිපයක් අරමුණු ඉටු කරගත හැකි පරිදි නිර්මාණය කර ඇත. එහි දී කැට සොරොව්ව, ගොඩ සොරොව්ව, රජ සොරොව්ව සහ කුලුනු සොරොව්ව ලෙස වර්ගීකරණය කර ඇත. වැවෙන් කුඹුරු කරා හෝ තවත් වැවක් කරා ජලය ගෙන යාමට යෝධ ඇළ නිර්මාණය කර ඇති අතර මෙය වර්තමානයේ ප්‍රධාන ඇළ ලෙස හඳුන්වයි. කුඹුරුවල අතිරික්ත ජලය පහත් බිම් කරා ගලා යෑමට සකස්කර ඇති ඇළ පෝටාව හෙවත් කුණු ඇළ ලෙස සලකන අතර සාම්ප්‍රදායික වැව්වල නම් මෙම අතිරික්ත ජලය ගලා යනුයේ තවත් කුඩා වැවකට ය. අතීතයේ දී වාරිමාර්ග ශිල්පීහු වැවේ ජලයේ ආරක්ෂාවට සොරොව්ව ආසන්නයේ ගලින් කළ නාග රූපයක් සහිත මුරගලක් නිර්මාණය කරන ලදී. එයින් ඔවුහු

වැවේ ජලය හිඟ නොවීම හා වැව ආරක්ෂා වන බව විශ්වාස කළහ. වැව බැම්ම වැවේ ඇති ජල ධාරිතාවයට උචිත අයුරින් උසට හා පළලට ශක්තිමත්ව ගොඩ නංවා ඇත. මෙම වැව් බැම්ම බොහෝවිට සාම්ප්‍රදායික වැවේ කඳු ගැටි දෙකක් යා කරමින් හෝ ස්වභාවික ගල් තලාවක් උපයෝගී කරගෙන නිර්මාණය කරයි.

**තිරස් ජාලානුගත වැව් පද්ධති ආශ්‍රිත ජෛව විවිධත්වය**

තිරස් ජාලානුගත වාරි පද්ධතිය ප්‍රධාන ලෙසම ජල කළමනාකරණය මූලික කර ගත් මිනිසා විසින් නිර්මාණය කරන ලද්දකි. එය ස්වභාවික නිර්මාණයක් නොවුනත් ස්වභාවික පරිසර පද්ධතියට අනුවර්තනය වූවක් ලෙස හඳුනාගත හැකි වේ. මේ නිසාම සාරවත් ජෛව විවිධත්වයක් මෙම ප්‍රදේශයේ ඇති කිරීමටත් එහි පැවැත්ම තහවුරු කිරීමටත් මෙය සමත් වී ඇත. එනම් තිරස් ජාලානුගත වැව් පද්ධතිය ආශ්‍රිත පරිසර පද්ධතිය ප්‍රධාන ලෙසම ජීවී හා අජීවී ද්‍රව්‍යන්ගේ මනා අන්තර් සම්බන්ධතාවයක් මත ක්‍රියාත්මක වන්නා වූ සමබර පරිසර පද්ධතියකි. එමගින් වර්තමාන මානව අවශ්‍යතා මෙන්ම අනාගත මානව අවශ්‍යතා ද ඉටුකරනු ලබන තිරසාර පැවැත්මක ගති ලක්ෂණ මනාව කියාපානු ලබයි. විශේෂයෙන්ම තිරස් ජාලානුගත වාරි පද්ධිතයේ සෑම වැවකම වැව් රක්ෂිතයක් තිබීම පාරම්පරිකව සිදු වූ අතර වැවට පහළින් කට්ට කඩුවත් වැවට ඉහළින් ගස් ගොම්මනත් දැක ගත හැකි වීම විශේෂ විය. මෙය ප්‍රධාන ලෙසම මෙම පරිසරය තුළ ජෛව විවිධත්වනය කෙරෙහි ඍජුවම බලපාන්නක් වී ඇත. වැව් ආශ්‍රිත පෝෂක ප්‍රදේශ මෙන්ම ස්වභාවික පරිසර පද්ධතිය රැක ගැනීම සඳහාත් සාම්ප්‍රදායික ක්‍රමවේදය තුළ තිබූ විශිෂ්ට ගුණාංගය මෙමගින් මනාව පිළිබිඹු කරයි.

වැව් ජලය පිටාර මට්ටමට පැමිණි විට පමණක් ජලය රදා සිටින වැව් පත්ලට ඉහළින් පිහිටි බිම් තීරයේ ස්වභාවිකවම වර්ධනය වු වෘක්ෂලතා කලාපය වේ. පහළින් ලන්ද පිහිටා ඇති අතර විශේෂයෙන්ම කුඹුක්, නාබඩ, මයිල, දඹ වැනි විශාල වෘක්ෂ ද එළිපත්ත, කලවැල්, බොකල නැමති වැල් වර්ග මෙහි බහුල වශයෙන් දක්නට ලැබේ. ජලය සමඟ පාවී එන බීජ වර්ග රෝපණය වීම මෙහි දී සිදු වේ. විශේෂයෙන්ම ගස් ගොම්මන වැවේ ජලය සඳහා සුළං බාධකයක් ලෙස ක්‍රියාත්මක වන අතර එය වැව් ජලය වියළි කලාය් දී සෞම්‍ය මට්ටමින් පවත්වා ගනිමින් වාෂ්පීකරණය අවම කිරීමට සමත් වී තිබේ. කුඹුක් වැනි ශාක මුල් අතර රැදෙන ජල එකතුවන් සමහර කුඩා මත්ස්‍ය විශේෂ සඳහා ප්‍රධාන වාසස්ථාන වී ඇත. විශේෂයෙන්ම මෙම තීරය ජල පෙරණයක් ලෙස ක්‍රියාත්මක වන නිසා ඉහළින් එනම් හේන් වගා බිම්වලින් පැමිණෙන රොන් මඩ එහි තැන්පත් වීම සිදු වේ. මේ නිසා ශාක විශේෂ වර්ධනයට එය රුකුළක් වී ඇත. විශේෂයෙන්ම ගස් ගොම්මන තිරය හේතුවෙන් සත්ව බිම් හා මානව ජනාවාස අතර වෙන් කරන මායිමක් ලෙස කටයුතු කරයි. මේ හේතුවෙන් ප්‍රදේශයේ සත්ත්ව පරිසරය කෙරෙහි ඇති මානව බලපෑම අඩු නිසා එය ප්‍රදේශයේ ජෛව විවිධත්වය වර්ධනය කිරීමෙහි ලා ඉතා වැදගත් සාධකයක් වී ඇත.

මෙම ප්‍රදේශයේ ජෛව විවිධත්වය පිළිබඳ දැක්වීමේ දී කට්ටකඩුව යනු ප්‍රධාන අංගයකි. මන්දයත් එය වැව් බැම්මට පහළින් කුඹුරු යායට ඉහළින් පිහිටා ඇති රක්ෂිත භූමියකි. මෙහි ක්ෂුද්‍ර දේශගුණ පරිසර තුනකින් සමන්විත වීම කැපීපෙනෙන ලක්ෂණයක් වන අතර එනම්,

- වතුර වල (Water Hole)
- තෙත් බිම් (Wetland)
- වියළි උස් බිම් (dry upland) වේ.

විවධ වාක්ෂලතාදිය හොඳින් වර්ධනය වීමට එය හේතුවක් වී ඇත. විශේෂයෙන්ම එකිනෙක ක්ෂුද්‍ර දේශගුණික කලාපයන්ට අයත් වූ විවිධ ශාක විශේෂ දැකිය හැකි වීම නිසා මේ තුළ දක්නට ලැබෙන විවිධතාවය ඉහළ මට්ටමක ඇත.

කෘෂ්ටිය හා අකෘෂ්ටිය ශාක හොඳින් වර්ධනය වීම නිසා ජලයේ ලවණ හා ලෝහ මිශ්‍ර අයන ඉවත් කර කුඹුරු සඳහා ලබා දීමේ කර්තව්‍ය ඉටු කරනු ලබයි. එය ''යතුරුවල'' ලෙස හැඳින්වේ. විශේෂයෙන්ම වැව් බැම්මෙන් කාන්දුවන ජලය අවම කරමින් භූගත ජල මට්ටම වැඩි දියුණු කිරීමට උපකාරී වේ. වැව් බැම්ම මුදුන ප්‍රදේශයේ වැටකෙයිය ශාක දැකිය හැකි අතර මිනිසාගේ ජීවන රටාවේ යම් යම් අවභ්‍යතා සපුරා ගැනීමට මෙවැනි ශාක උපකාරී වේ. විශේෂයෙන්ම දර ඉන්ධන, ඖෂධ, දැව, ඉනිවැට සඳහා ද්‍රව්‍ය, ගෘහ හා වගා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, ආහාර, පළතුරු හා එළවළු ආදිය මෙමගින් සැපයේ. මෙයින් පැහැදිලිවල වැගත්ම දෙය වන්නේ මෙහි ශාක විවිධත්වය බහුල වීමයි. වැව් පද්ධතියකට අමතර ජලය හා රොන්මඩ රඳවා ගැනීමට කැලෑ වැව් දක්නට ලැබෙන අතර මෙම කර්තව්‍ය වක්‍රව ජෛව විවිධත්වයට රුකුලක් වී ඇත. එනම් වැව් ඉහත්තාව තුළ ජලය රැස් කර තබා ගැනීම නිසා වැව් ඉහත්තාවේ භූගත ජල මට්ම ඉහළ යාම සිදු වේ. මේ නිසා අවට වනය සශ්‍රීක කිරීමට එය හේතුව් වනවා සේම හාක හා සතුන්ගේ පැවැත්ම කෙරෙහි අවශ්‍ය සාධක සලසා දීම කැපී පෙනේ.

තිරස් ජාලානුගත පරිසර පද්ධතියට අයත් කිවුල් ඇළ පොදුවේ ජලය ලබා දෙන පැරණි ස්වභාවික ජල මාර්ගයකි. මෙම ඇළ ආශ්‍රිතව කරද, මී, ඉකිරි හා වැටකෙයියා ප්‍රධාන ශාක වන අතර කුඩා මත්ස්‍ය විශේෂ රැසකට වාසස්ථාන සපයන ජල පද්ධතියකි.
ඉහළ ප්‍රදේශවල දක්නට ලැබෙන ස්වභාවික වනාන්තර හේතුවෙන් ප්‍රදේහයේ පෝෂ්‍ය චක්‍රය සංවිධානය කිරීමට දායක්වය සපයනු ලබයි. මේ හේතුවෙන් සමතුලිත සමබර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමෙහිලා එය හේතු වී ඇත. විවිධ කුරුලු විශේෂ හා මත්සයින් මෙන්ම අලි විශේෂ ද තවත් සත්ව විශේෂ ගණනාවක් ද මේ ආශ්‍රිතව හඳුනා ගත හැකිය. මෙවැනි කළමනාකරණ පද්ධතියක් ප්‍රදේශයේ ජෛව විවිධත්වයට රුකුළක් වන අතරම එමඟින් මෙහි ආරක්ෂාව තහවුරු කර ගැනීම ද පද්ධතිය තුළින්ම සිදු වේ. මේ අනුව සාම්ප්‍රදායික තාක්ෂණික ක්‍රමවේදයන් තුළ පාරසරික දියුණුව ද ප්‍රධාන වී ඇති අතර එය අති ස්වයංපෝෂිත රාජ්‍යක් බිහිකර ඇති බවට නොඅනුමානය.

**නිගමනය**
මෙම තොරතුරු විමසා බලන විට ලංකාවේ ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවසේ සිට දියුණු වාරි තාක්ෂණයක් භාවිත කළ බව ප්‍රකට කරුණකි. එසේම එය ක්‍රිස්තු වර්ෂ හයවන සියවසේ මධ්‍යභාගය වන විට අතිවිශාල දියුණු වාරි කර්මාන්ත පද්ධතියක් බවට පත් වී තිබුණි. ඒ හා සමානව පෘථුල ප්‍රදේශයක් පුරා පැතිරුණු කෘෂිකර්මාන්තයේ දියුණුව ද විද්‍යාමානය. සත්‍ය ලෙසම දකුණු ආසියානු කලාපයේ ලංකාවේ වාරිකාර්මික තාක්ෂණය බැලූ බැල්මට මහාපරිමාණය. සුවිශාල තටාක ඇත. දකුණු ඉන්දියාවට ලාංකේය තාක්ෂණය ගලා ගිය ද සමාන සංස්කෘතික ලක්ෂණ පැවතිය ද දෙරටේ මූලික ප්‍රශ්නවලට ලබා දී ඇති වාරි කාර්මික විසඳුම අතින් ලාංකේය තාක්ෂණික ඥාණය විශිෂ්ටය. ශ්‍රී ලංකාව පෙර අපර දෙදිග වාණිජ ලෝකයේ කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකරමින් ලැබූ අතිරික්ත ධන ආයෝජනය මෙම ශ්‍රී ලාංකේය වාරි සමාජය පිටුපසින් දිවෙන ප්‍රධාන ප්‍රවාහය ලෙස සුවිශාල කාර්යය භාරයක් ඉටු කළ බව පැහැදිලි කරුණකි. එම දැවැන්ත ප්‍රවාහයේ සිදු වූ යම් යම් අවස්ථාවන්වලට සාපේක්ෂව වාරි තාක්ෂණයේ ප්‍රගමනය චංචල ස්වභාවයක් සළකුණු කළ

අවස්ථා විද්‍යාමාන වුව ද දිවයිනේ ස්වයංපෝෂිත ආර්ථිකයේ ස්ථාවර හා අඛණ්ඩ පැවැත්මට සුවිශාල කාර්යය භාරයක් වාරි තාක්ෂණික කටයුතුවලින් සිදු වූ බව පැහැදිලිය.

**පරිශීලන**


අබේසිංහ, ඒ., ශ්‍රී ලංකාවේ විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම සම්බන්ධව ඇතිවන සමාජීය ආර්ථික ප්‍රශ්න, (1986**), *ආර්ථික විමසුම,*** වෙළුම 11.

ජනපාල, කේ., සෝමරත්න, පී. ජී., සාමාද්, එම්., (2001), ගංගාධරයක ජල සම්පත් කළමනාකරණය ආයතනියක අඩුපාඩු හා ගම්‍යතා, ශ්‍රී ලංකාවේ දැදුරු ඔය ගංගාධරය සම්බන්ධ අධ්‍යයනය, ***ආර්ථික විමසුම,*** වෙළුම 27.

පනාපිටිය, එම්., (2010), පසුගිය ශත වර්ෂය තුළ සංවර්ධනය කරන ලද වාරිමාර්ග ව්‍යාපෘතිවල ඉංජිනේරුමය සැලසුම් පිටුපස ඇති දුක්ඛ සත්‍යය, ***ආර්ථික විමසුම,*** වෙළුම 36.

විතානාච්චි, සී. ආර්., (2005) ***ශ්‍රී ලංකාවේ අතීත වාරි උරුමය හා වාරි පුරාවිද්‍යා, පුරාතතන,*** ජාතික පුරාවිද්‍යා දින සමරු කලාපය, කොළඹ මධ්‍යම සංස්කෘතික අරමුදල.

විතානාච්චි, සී. ආර්., (2009) ***පුරාණ ඇළහැර අමුණ,*** සමෝධාන, වෙළුම ෂල මිහින්තලේ, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

## 08. පොළොන්නරුව ඇතුලු නගරයේ ජල කළමනාකරණය

එම්. පී. එන්. එන්. ජයසිංහ

### හැඳින්වීම

ලෝකයේ ජීවය රඳාපවතින සාධක අතුරින් සුවිශේෂී සාධකයක් වන්නේ ජලයයි. සමස්ත ජෛව පද්ධතියේ ම ක්‍රියාකාරීත්වය රඳාපවතින්නේ ජලය මතයි. එබැවින් අතීතයේ පටන්ම මානවයා ජලයෙහි ඇති මේ සා වූ සුවිශේෂී වටිනාකම හැඳිනගත් අතර ලෝකයේ ශිෂ්ටාචාර ජල මූලාශ්‍ර පදනම් කරගනිමින් බිහිවීම ම ඊට කදිම නිදසුනකි. එබැවින් ඔවුන් එදා සිටම ජලය නිසිලෙස කළමනාකරණය කරමින් පරිහරණය කිරීමට උත්සාහ කළ අතර ඒ සඳහා විවිධ වූ ශිල්ප ක්‍රම අත්හදා බලන්නට විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වාරි කර්මාන්තය ලොවට දායාද විය.

එකී ලෙස ජලය විශිෂ්ඨව කළමනාකරණය කරගනිමින් කෘෂිකර්මාන්තයත් අනෙකුත් ජලය පදනම් කරගනිමින් සිදුකරන කාර්යයනුත් පහසු කරගත් විශිෂ්ඨ වාරි කර්මාන්තයක් උරුම ජාතියක් ලෙස අපව හැඳින්විය හැකිය. අහසින් වැටෙන හෝ පොළොවෙන් උනන එකඳු ජල බිඳක් හෝ ප්‍රයෝජනයට නොගෙන මුහුද කරා යාමට ඉඩ නොදී ලෝකෝපකාරයෙන් කළමනාකරණය කිරීමට පැරැන්නන් සමත් විය. රජරට ශිෂ්ටාචාරය මෙකී වූ ජල කළමනාකරණයේ කේන්ද්‍රස්ථානය ලෙස හැඳින්විම වරදක් නැත. අතීත රජ දරුවන්ගේ ජල කළමනාකරණ ඥානයේ විශිෂ්ඨත්වය තවමත් ඉතිරිව ඇති වැව්, අමුණු, ඇළ, වේළි, පොකුණු නිහඬ සාක්ෂි කරුවන් ලෙස ලොවට විදහා දක්වයි. කෘෂි කර්මාන්තය සඳහාම පමණක් නොව සනීපාරක්ෂක කටයුතු ඇතුලු වෙනත් දෛනික අවශ්‍යතා සඳහා මෙන්ම අලංකරණය සඳහා ද අතීත වැසියන් මනාව ජල සම්පත කළමනාකරණය කර ගත්හ.

රජරට ශිෂ්ටාචාරයේ අවසාන පාලන මධ්‍යස්ථානය වූයේ පොළොන්නරු රාජධානිය යි. 1070 දී පමණ චෝල ආක්‍රමණිකයන් පළවා හැරීමෙන් පසු පළමුවෙන්ම විජයබාහු රජු විසින් පොළොන්නරුව තම අගනුවර ලෙස තෝරාගනු ලැබීය. විජයබාහු රජුගෙන් පටන්ගෙන පොළොන්නරුවෙහි බිහිවූ රජවරු ජල කළමනාකරණ විෂයෙහි දැක්වූ විශිෂ්ඨත්වය වර්ථමානයේ දී හමුවන පුරාවිද්‍යා සාධකයන් අධ්‍යනයේ දී මොනවට වටහාගත හැකිය. ඒ අනුව පොළොන්නරුව ඇතුලු නගරයෙහි ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය කරමින් ඉදිරිපත් කළ විස්තරයක් මෙහි අන්තර්ගත වෙයි.

### ක්‍රමවේදය

මෙහි දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස සාහිත්‍ය හා පර්යේෂණ ග්‍රන්ථ විමර්ෂණය, ඡායාරූප අධ්‍යයනය සහ ක්ෂේත්‍ර ගවේෂණය යොදා ගන්නා ලදි. ප්‍රථමයෙන්ම සාහිත්‍ය ග්‍රන්ථ අධ්‍යයනය කර ගනිමින් පොළොන්නරුව ඇතුලු නගරය පිළිබඳව අවබෝධයක් ලබාගත් අතර පර්යේෂණ ග්‍රන්ථ ආධාරයෙන් එහි ජල කළමනාකරණය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදි. ඉන්පසු ඡායාරූප අධ්‍යයනය කරමින් සහ ක්ෂේත්‍ර අධ්‍යයනයක යෙදෙමින් තවදුරටත් කරුණු අවබෝධ කරගනිමින් අධ්‍යයනය කරනු ලැබීය. ඒ අනුව පැරණි පොළොන්නරු ඇතුලු නගරයෙහි ජල කළමනාකරණය අධ්‍යයනය මෙහි අරමුණ විය.

### විමර්ශනය

මේ අනුව පොළොන්නරුව පැරණි නගරය, ඇතුලු නගරය සහ පිටත නගරය ලෙස ප්‍රධාන කොටස් දෙකකින් යුක්තය. අප අද විමර්ශනයට භාජනය කරනු ලබන ඇතුලු නගර කොටස රාජ මාලිගා, රාජ සභා හා රාජකීයන් මෙන්ම උසස් රාජ නිලධාරීන්ගේ ස්ථිර වාස භූමි

සඳහා වෙන් වූ කොටස ලෙස වර්තමානයේ නටබුන් අධ්‍යයනයේ දී පැහැදිලි වෙයි. එසේම මෙම පුරාවිද්‍යා ගවේෂණයන්වලින් තහවුරු කර ඇති ආකාරයට මෙම ඇතුලු නගර කොටස අක්කර 25ක භූමි භාගයක් පුරා පැතිරී ඇති අතර ඒ වටා ආරක්ෂිත ප්‍රාකාරයක් සහ දිය අගලක් ද තිබී ඇත. පොලොන්නරුව පෞරාණික නගරයෙහි නගර සැලැස්ම දෙස බැලීමේ දී මෙම ඇතුලු නගරය උස්ම භූමි ප්‍රදේශයෙහි පිහිටා ඇති බව දැකගත හැකිය. මෙම ඇතුලු නගර ප්‍රදේශය තුළ අපට මහා විජයබාහු රජුගේත්, පරාක්‍රමබාහු රජුගේත් මාලිගා, බිසෝ මාලිගා, රාජකීය උද්‍යාන, දළදා මාළිගය, ඇතුලු සුවිශේෂී රාජකීය ගොඩනැගිලි මෙන්ම ආගමික ගොඩනැගිලි දැක ගත හැකිය. අප අද සාකච්ඡාවට භාජනය කරනු ලබන අංශයට අදාල කෝණයෙන් මෙම ඇතුළු නගරයෙහි අදටත් ශේෂව ඇති උක්ත නටබුන් විමර්ශනාත්මකව අධ්‍යනය කිරීමේ දී පොලොන්නරුව ඇතුලු නගරය තුළ යොදාගත් ජල කළමනාකරණ උපක්‍රම මොනවට විද්‍යාමාන වෙයි. ඇතුලු නගර වාසීන්ගේ එදිනෙදා පරිභෝජනය සඳහා මෙන්ම නගර අලංකරණය සඳහා ද ජල සම්පත මනා උපයෝගීතාවයකින් යුක්තව යොදා ගැනීමට පැරැන්නන් තුළ තිබූ පුදුම සහගත ජල කළමනාකරණ තාක්ෂණ ඥානය අපට මෙසේ පැහැදිලි කරගත හැකිය.

විශේෂයෙන්ම පොලොන්නරුව ඇතුලු නගරය තුළ දැකගත හැකි සුවිශේෂී අංගයක් වන්නේ මහා පරාක්‍රමබාහු රජතුමාට අයත් මාලිගා සංකීර්ණයයි. මෙම නගර සීමාව තුළ දැකගත හැකි විශාලතම ගොඩනැගිල්ල වන්නේ ද මෙම රජ මාළිගාවයි. චූලවංසය මෙම ගොඩනැගිල්ල හඳුන්වනු ලබන්නේ වෛජයන්ති ප්‍රාසාදය ලෙසයි. මහාවංස කතුවරයා මෙම මාළිගාව පිළිබඳ විස්තර කරනුයේ මෙලෙසිනි.

**'' රජතුමා වෛජයන්ත නම් වූ සත්මහල් මහා ප්‍රාසාදයක් කරවීය. එහි කාමර දහසකි. විසිතුරු කැටයමින් යුත් දහස් ගණන් කුලුණු වලින්ද මාලාකර්ම, ලතාකර්මයන් විසිතුරු වූ දොර ජනෙල් වලින් ද සියගණන් වූ කුටිගිර වලින් ද විසිතුරු වූ ප්‍රාසාදයෙහි ගබඩා වන විසිතුරු සයනයන් රන්මුවා, දළකඩමුවා ඇතිරියෙන් ශෝභාවත් විධ''**

මෙලෙස මහාවංසයේ දැක්වෙන උසස් ගෘහ නිර්මාණ ශිල්පයෙහි ලක්ෂණ අදටත් මාලිගාවෙහි නටබුන් තුළ දැකගත හැකි අතර සුඛෝපභෝගී ජීවිතයකට අවශ්‍ය මූලික ලක්ෂණ සියල්ලම මෙහි තිබූ බවට මෙම නටබුන්ම සාක්ෂි දරයි. වංසකතාවෙහි දැක්වෙන මහල් සතෙන් තුනක නටබුන් අදටත් ශේෂව පවතී. විශේෂයෙන්ම අපට අද මාතෘකාවට භාජනය වූ ජල කළමනාකරණයෙහි ලක්ෂණ මෙම මාලිගා පරිශ්‍රය තුළින් දැකගත හැකිය. එනම් මාලිගාව තුළ සිදු වූ ජල පරිභෝජනයට අවශ්‍ය කරන ජලය මනා කළමනාකාරීත්වයකින් යුක්තව දියුණු තාක්ෂණ උපක්‍රම හරහා යොදාගෙන ඇති බවක් දැකගත හැකිය. විශේෂයෙන්ම මාලිගයට යාබද වැසිකිලි, ස්නානාගාර මෙන්ම නළ මගින් සැපයූ ජලය යනාදී සියල්ලම තිබූ බවට සාධක මෙහි නටබුන් අතරම වෙයි. මෙහිදී මාලිගාව තුළට ජලය ලබා ගැනීම සඳහා වර්ධිත ජල කළමනාකරණ ක්‍රමයක් යොදාගෙන ඇති බවට සිතිය හැකි අතර මාලිගාව අවටින් දැකගත හැකි ළිං තුළින් ජලය ලබාගන්නට ඇතැයි සිතිය හැකිය. මෙහි දී එම ජලය නළ මාර්ගයෙන් හෝ සේවකයන් ලවා අද්දවන්නට ඇතැයි අනුමාන කල හැකි මුත් මෙහි දී නිශ්චිතවම මෙම ක්‍රමය යොදාගත්තා යැයි කීමට සාක්ෂි හමුවී නැත. නමුත් මෙහි දී අපට දෙවන අනුමානය යම්කිසි හෙයකින් බැහැර කළ හැක්කේ සමස්ත පොලොන්නරු නගරය තුළින් විශිෂ්ට ජල නළ පද්ධතියක සාධක හමුවන බැවින් එම තාක්ෂණයම මාලිගාව තුළට ජලය රැගෙන යාමට ද යොදාගත්තා යැයි වැඩි සම්භාවිතාවයකින් නිගමනය කල හැකි බැවිනි.

මෙම රජ මාලිගාවට නැගෙනහිර දෙසින් පරාක්‍රමබාහු රජුගේ සභා ශාලාව දැකගත හැකි වෙයි. මෙය රාජවෛශ්‍යභුජංග මණ්ඩපය ලෙස හඳුන්වයි. මෙම සභා ශාලාවට ද ජලය ගෙන

ආ නිශ්චිත ක්‍රමයක් හඳුනාගත නොහැකි නමුත් මැටි නළ මඟින් පරාක්‍රම සමුද්‍රයෙන් හෝ අවට ඇති පොකුණුවලින් ගෙන ආවා යැයි උපකල්පනය කල හැකිය. මෙහි දී විශේෂයෙන්ම රාජ සභා මණ්ඩප තුළට මෙන්ම ඒ තුළින් පිටතට ජලය රැගෙන යාමේ දී විශේෂිත ක්‍රම අනුගමනය කර ඇති බවත් දැකගත හැකිය. ඒ අනුව රාජ සභා මණ්ඩපයේ වැසිකිළි, මණ්පයට දකුණු පසින් ස්ථාපිත කර ඇති අතර මෙහි වැසිකිළි වලවල් දෙකක් ගොඩනැගිල්ලට නැගෙනහිර දෙසින් දැකගත හැකිය. මෙහි දී වැසිකිළි අපද්‍රව්‍ය ක්‍රමානුකූලව නළ මාර්ගයෙන් වැසිකිළි වළවල් වෙතට යාමට සලස්වා ඇති බවක් දැකගත හැකිය.

වෛජයන්ති ප්‍රාසාදයට බටහිරින් ද එකිනෙකට සමාන ලක්ෂණ දරණ තවත් මාලිගා දෙකක් දැකගත හැකිය. ඒවා නම් රජුගේ බිසෝවරුන් දෙදෙනා වන ලීලාවතී සහ පද්මාවතීයන්ගේ මාලිගාවන්ය. මෙම මාලිගාවන් තුළ ද ජල කළමනාකරණයේ සුවිශේෂී අංගයන් දැකගත හැකිය. එනම් මුලුතැන්ගෙයි වැඩි ජලය පිට කිරීමට යොදාගෙන ඇති තාක්ෂණය යි. මෙහි දී මුලුතැන්ගෙය තුළට ජලය පෙර පරිදිම ගෙන එන්නට ඇති අතර පිටකිරීමේ දී මුලුතැන්ගෙය පිටුපස ගඩොලින් තනා ඇති වළකට මුලුතැන්ගෙය හරහා ගල් නළ මාර්ග ඔස්සේ අපවිත්‍ර ජලය බැසයාමට සලස්වා ඇත.

මෙයින් අපට පැහැදිලි වන්නේ ඉතාමත් විශිෂ්ඨ තාක්ෂණයකින් ඇතුලු නගරයෙහි ගොඩනැගිලි තුලට ජලය ගෙන ඇති බවත් ඒවා තුලින් පිටතට අප ජලය පරිසරයෙහි අලංකරණයට, සෞඛ්‍ය ආරක්ෂාවට කිසිඳු බාධාවක් නොවන අන්දමින් විදිමත්ව සහ ක්‍රමානුකූලව බැහැර කර ඇති බවත්ය. මීට අමතරව පොළොන්නරුව ඇතුලු නගරයේ ජල කළමනාකරණයෙහි විශිෂ්ඨත්වය විද්‍යාමාන කරන තවත් එක් සුවිශේෂී අංගයක් වන්නේ උද්‍යානයි. මහාවංසය මහා පරාක්‍රමබාහු රජු විසින් කරවූ උද්‍යාන විසිඅටක් පිළිබඳ සඳහන් කරයි. නන්දන, දීප, ලක්ෂ, මහාමේඝ, චිත්තලතා, මිස්සක ආදිය ඉන් කිහිපයකි. මේ උයන් බෝහෝ විට උද්භිත උද්‍යාන ගනයට වැටෙන අතර විසිතුරු ගස් කොළන් ,ඖෂධ ශාක මෙන්ම මනා ජල කළමනාකරණ තාක්ෂණයකින්  යුක්ත ඉතා අලංකාර පොකුණුවලින් ද යුක්ත වෙයි. ඒ අනුව පොළොන්නරුව ඇතුළු නුවර ප්‍රදේශයෙන් අපට මේ උයන් අතරින් නන්දන උයන දැකගත හැකි වෙයි. නොයෙකුත් තුරුලතාගෙන් ද වතුර මල් සහිත පොකුණුවලින් ද උයන අලංකාර වු බව චූලවංසයේ සඳහන් කරයි. මෙම උයන හඳුන් ටැඹින් විසිතුරු විමනක් ද අටපට්ටම් මණ්ඩපයක් ද නන්ද්‍යාවර්ත්‍යක් බඳු මණඩපයක් ද කරවන ලදි. මේ උයනයෙහි විසිතුරු ගල් පොකුණක් ද රජතුමාගේ සිත වෙසෙසින් සතුටු කරන මඟුල් පොකුණක් ද "පූර්ණා" නම් තවත් පොකුණක් හා "නින්දා" නම්  පොකුණක් ද විය. " වසන්ත" නම් ලෙනක් ද විය.

ඉහත කී සෑම අංගයක් ම වර්තමානයේ දැකගත නොහැකි වුවත් නන්දන උයන තුළ ඉතා ඉහළ ජල කළමණාකරනයක් තිබු බව දැකගත හැකිය. ඒ පිළිබඳ පහත කරුණු සාක්ෂි දරණු ඇත. විශේෂයෙන් ම මෙහි දී නන්දන උයනයට ජලය රැගෙන ඒමේ තාක්ෂණය අද්විතිය ය. නන්දන උයනයට ජලය රැගෙන එනු ලබන්නේ භූගත මැටි නල මඟිනි. ඒ පරාක්‍රම සමුද්‍රයේ සිටයි. අතීතයේ පරාක්‍රම සමුද්‍රයේ ප්‍රධාන සොරොව් අටකින් ජලය පිට කල අතර ඇතුළු නුවරට ජලය ලබාගෙන ඇත්තේ මෙයින් සොරොව් දෙකකිනි. මෙහි දී මෙම උද්‍යානවලට ජලය ලබා ගැනීමේ දී බිසෝකොටුව උපකාරයෙන් මනා ලෙස ජලය කළමනාකරණය කර ඇත. මෙම ක්‍රමවේද ඉතා සුවිශේෂිය. එනම් ජලයේ වේගය කෙරෙහි අවධානයක් යොමුකර ඇත. එනම් ජලයේ වේගය පාලනය කිරීමට මුලිකවම බිසෝකොටුවෙන් සිදුරු තුනකින් ජලය පිටකර නැවත එම බිසෝ කොටුවේම අනෙක් සිදුරු දෙකකින් ජලය පිට කිරීමට සලස්වා ඇත. මෙම ක්‍රමවේදය ජලය සිසිල් කිරීමේ ක්‍රමයක් ද වෙයි. ඒ අතර මෙලෙස

පරාක්‍රම සමුද්‍රයෙන් ජලය භූගත මැටි නල මාර්ගයෙන් නැවත නන්දන උයන වෙත රැගෙන විත් ඇත.

ඒ අනුව මෙම ජල නල පද්ධතියෙන් නන්දන උයනෙහි පිහිටි කුමාර පොකුණ ජලයෙන් පෝෂණය විය. මෙම කුමාර පොකුණ අතීත ජල කළමනාකරණ ඥාණයේ අද්විතීය නිමැවුමක් ලෙස දැක්විය හැකිය. වේදිකා තට්ටු තුනක් සහිතව ඉදිකර ඇත. පොකුණේ ජලය පිරී ඇති විට එම බැමි මත සිට වුව ද ස්නානය කළ හැකිය. ඇතුළත කුඩාවන ලෙස පොකුණේ බැමි බැඳ ඇති නිසා එහි පතුල අඩි තිස් එකක්ද අගල් හයක් හා අඩි විසි හතයි අගල් තුනක් වේ. පොකුණෙහි ජලය ඇති මට්ටමේ සිට වුව ද ස්නානය කිරීමට එමගින් හැකියාව ලැබී ඇත. ඒ අනුව මෙම පොකුණට ජලය සපයා ඇත්තේ උක්ත සඳහන් කළ පරිදි පරාක්‍රම සමුද්‍රයේ සිට ආ භූගත මැටි නල මාර්ගයෙනි. ජලය ගෙන එන ලද මෙම මාර්ග ගල් තහඩු හෝ ගඩොල් බැද හොඳින් බදාම යොදා තිබූ බව හෙළි වී ඇත. මැටි නල මගින් පැමිණි ජලය පොකුණට ගලා ගියේ මකර රූ කෙටූ ගල් පීලී දෙකක් ඔස්සේ ය. මකරාගේ මුඛය තුළින් ජලය පොකුණ තුළට වැටෙන අන්දමට මෙය නිර්මාණය කර ඇත.

මෙලෙස පොකුණ තුළට ජලය ගෙන ඒම පමණක් ම නොව පොකුණෙහි ජලය බැහැර කිරීම ද විධිමත් ක්‍රමයක් යොදා ගෙන ඇත. එනම් පොකුණේ ජලය බැහැර කිරීමට පොකුණේ තැනින් තැන කවුළු තනා තිබේ. පොකුණේ ජලය පමණක් නොව නන්දන උයනෙහි අතිරික්ත ජලය පිටකිරීමට ද විශේෂිත උපක්‍රමයක් යොදා ගෙන ඇත. එනම් උයන තුළ ඇති අතිරික්ත ජලය මැටි නළ මාර්ග තුළින් රැගෙන විත් එම ජලය සුදුසු ස්ථානවල ඇති ජල ටැංකි හරහා පිට කරයි. ඒවා ඇතුලු නගරය වටා ඇති ජල දිය අගලට යෑමට සලස්වා ඇත. එසේම පොළොන්නරුව ඇතුලු නගරයෙහි ජල කළමනාකරණ තාක්ෂණයෙහි පුදුම සහගත නිර්මාණ ලක්ෂණයක් වන්නේ අවශ්‍ය වූ විට (හදිසි අවස්ථාවකදී) මෙම පොකුණුවල ජලය සපයන දිය දොර (සොරොව්ව) යොදන නගර ප්‍රාකාරය වටා ආරක්ෂිත දිය අගලක් ඇතිවන ආකාරයට අවට ප්‍රදේශයේ ජල ගැලීමක් ඇති කිරීමට අවශ්‍ය විධි විධාන සලසා තිබීමයි. ඒ අනුව පොළොන්නරුව නිර්මාණ ශිල්පියා විවිධ අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් ඉතා සූක්ෂම ලෙස ජලය කළමනාකරණය කර ඇති බවට මෙය කදිම නිදසුනකි. දීප උයනද මෙවැනි සුවිශේෂි ජල කළමනාකරණයකින් හෙබි ස්ථානයකි. පොළොන්නරුව ඇතුලු නගරයත් පරාක්‍රම සමුද්‍රයත් අතර ඇති උස් වූ භූමි භාගය දීප උයන වන අතර මෙය පළමුවෙන් ම ඉදිකරනු ලැබුවේ පරාක්‍රමබාහු රජතුමා විසිනි. එතුමා එය සිය රාජකීය උද්‍යානය ලෙස භාවිතා කලහ. පසුකාලීනව නිශ්ශංකමල්ල රජතුමා මෙම උද්‍යානය තම පරිහරණයට ගත් අතර එයට නව අංග ද එකතු කරනු ලැබීය. කෙසේ වෙතත් මෙම දීප උයන ද ඉතා විශිෂ්ඨ ජල කළමනාකරණ තාක්ෂණයකින් අනූනය. විශේෂයෙන්ම දීප උයනට ද ජලය ලබා ගත් ප්‍රධාන මූලාශ්‍රය වූයේ පරාක්‍රම සමුද්‍රයයි. සොරොව් දෙකකින් පිට කළ ජලය නන්දන උයනට ජලය ලබාගත්තා යැයි සඳහන් කළ තාක්ෂණයෙන් ම දීප උයනට ද ලබා ගැනිනි.

මෙලෙස පරාක්‍රම සමුද්‍රයෙන් ලබාගත් ජලය දීප උයනට ඉහළින් ඇති ජල ටැංකියකට පුරවා ඇත. ඉන්පසු මෙම ජල ටැංකියේ සිට ටෙරාකොටා නළ මාර්ගයකින් පොකුණට ජලය රැගෙනවිත් ඇත. මෙලෙස ටැංකියක් මාර්ගයෙන් පොකුණට ජලය සැපයීමට හේතුව විය හැක්කේ දිවා කාලයේ දී වැවේ ජලය අධික ලෙස රත් වීම හේතුවෙන් සිදුවන අපහසුතාවය මගහරවා ගැනීම ය. මෙහි දී මෙම ටැංකියෙන් ටෙරාකොටා ජල මාර්ග ඔස්සේ ජලය කුඩා තටාකයකට ලබා දී ඉන් පසුව තවත් සිදුරකින් ජලය පෙරා පිහිල්ලක් ආධාරයෙන් පොකුණට ජලය ලැබෙන්නට සලස්වා ඇත. මෙවැනි ක්‍රම තවත් උපයෝගී කර ගෙන ඇත්තේ ජලය

උපරිම ලෙස සිසිල් කර ගැනීම සඳහාය. ඒ අනුව අතීත ලාංකිකයන්ගේ ජල කළමනාකරණ අද්විතීය ඥාණය මේ හරහා අපට තහවුරු කරගත හැකිය.

**නිගමනය**

ඒ අනුව මේ සැම දෙයකින්ම පොළොන්නරුව ඇතුළු නගරය මනා ලෙස ජලය කළමනාකරණය කර ඇති බව පෙනී යයි. විශේෂයෙන්ම වියළි කාලගුණයක් ඇති පොළොන්නරුව ප්‍රදේශයට ඇති සීමිත ජල සම්පත මනා ලෙස කළමනාකරණය කර ගැනීම අතිශයින්ම වැදගත් අවශ්‍යතාවයකි. පොළොන්නරුව රාජධානියෙහි විසුවන් ඒ කාර්යය මනා ලෙස සිදු කර ඇත. මෙහි දී අප අවධානය යොමු කළ පොළොන්නරුව ඇතුළු නගරය තුළ වැඩියෙන්ම දැකගත හැකිවන්නේ උද්‍යාන අලංකරණයට සහ ගොඩනැගිලි තුළට ජලය ලබාගැනීම උදෙසා ජලය මනා ලෙස කළමනාකරණය කරගත් අවස්ථාවන් ය. ඒ අනුව අප මෙතෙක් පැහැදිලි කරගත් කරුණු සාරාංශකොට ගතහොත් විශේෂයෙන්ම මෙම පොළොන්නරුව ඇතුළු නගරයට ජලය රැගෙන ඒමට සේම නගරයෙන් පිටතට ජලය රැගෙන යාමේ දී ද විධිමත් තාක්ෂණික ක්‍රමෝපායන් භාවිත කර බව ඇති නටඹුන් අධ්‍යනය කිරීමේ දී පැහැදිලි වෙයි. මෙහි දී ඇතුලු නුවර නගරයට ජලය ලබා ගත් ප්‍රධාන ජල මුලාශ්‍රය වුයේ පරාක්‍රම සමුද්‍රයයි. එහි දී මුළු නගරය පුරාවට විධිමත් භූගත ජල නල පද්ධතියක් තිබී ඇති අතර මේ හරහා උද්‍යානවලට සහ මාළිගා තුළට ජලය ලබා ගෙන ඇත. එසේම ශ්‍රී ලාංකිකයන්ගේ අද්විතිය ජල කළමනාකරණ ඥාණය ලෝකයට හෙළදරව් කරමින් පරාක්‍රම සමුද්‍රයෙහි සොරොව් සහ බිසෝකොටු මාර්ගයෙන් ඉතාමත් විශිෂ්ඨ තාක්ෂණයකින් මෙම ජලය ඇතුළු නගරයට ලබා ගෙන ඇත. එසේම මොවුන් සැම අංශයක් කෙරෙහිම සිය අවධානය යොමු කර ඇත්තේ කෙසේද යත් ජලය සිසිල් කරගැනීමට පවා තාක්ෂණික උපක්‍රම යොදා ඇති බව තහවුරු විය.

ඒසේම ජල ටැංකි තුළ ජලය ගබඩා කරගෙන ඇති සේම ස්නානයට සහ අලංකරණය සඳහා ඉදිකර ඇති පොකුණු පද්ධතිය ද සුවිශේෂී ජල කළමනාකරණ තාක්ෂණයකින් හෙබි නිර්මාණයන්ය. එමෙන්ම අවට පරිසරයට කිසිදු පාරිසරික හෝ සෞඛ්‍යමය වශයෙන් හානියක් නොවන පරිදි භූගත නළ මඟින්ම ඇතුළු නගරයේ අප ජලය ද ඉවත් කර ඇත. මෙවැනි වූ ඉතා සුවිශේෂී ජල කළමනාකරණ පද්ධතියක් අපට පොළොන්නරුව ඇතුළු නගරය තුළ හඳුනා ගත හැකිය. ඒ අනුව පොළොන්නරුව ඇතුළු නගරයේ ජල කළමනාකරණය පිළිබඳ සුවිශේෂි අධ්‍යයනයක් අපට මෙසේ සිදු කළ හැකි අතර මේ සැම කරුණක් දෙසම විමර්ෂණාත්මකව බැලීමේදී ශ්‍රී ලාංකීය ජල කළමනාකරණ ඥාණයෙහි අග්‍ර ඵලයක් ලෙස පොළොන්නරුව ඇතුළු නගරයෙහි ජල කළමනාකරණය නිගමනය කළ හැකිය.

**පරිශීලන.**


ගමගේ ගුණසේන, (2005), ***පැරණි ලක්දිව තාක්ෂණවේදය හා ශිල්පඥාණය,*** නුගේගොඩ, සරසවි ප්‍රකාශන,

පරණවිතාන, සෙනරත් (1972), ***පුරාවිද්‍ය පරියේසණ,*** බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශන,

ලගමුව, ඒ, (1999), ***මධ්‍යකාලීන රාජධානී පොළොන්නරුව,*** නුගේගොඩ, සරසවි ප්‍රකාශණ,

සිරවීර, ඉන්ද්‍රකීර්ති (2004), ***ශ්‍රී ලාංකේය ඉතිහාසය තරංග,*** වරකාපොල, ආරිය ප්‍රකාශකයෝ,

# 09. අනුරාධපුර යුගයේ වාරි කර්මාන්ත ඇසුරෙන් ආර්ථිකය ගොඩනැඟීම පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යනයක්

පී.වී.ඕ. ජීවන්තක

## හැඳින්වීම

මුළු මහත් පෘථිවිතලයේ ම මානව සමාජයේ ව්‍යාප්තිය හා වර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය ජලයයි. ලෝකයේ බොහෝ ජනාවාස ඉදි වී ඇත්තේ ගංගා නිම්න ශිෂ්ඨාචාර වශයෙනි. එහි දී ගංගා නිම්න හේතුවෙන් පෝෂණය වන කිසියම් ප්‍රදේශයක් සීමාවක් කරගනිමින් ජනාවාස බිහි කරගෙන ඇත. එය මානව වර්ගයාගේ මෙන්ම සත්ව වර්ගයාගේ ආරම්භයේ සිටම සිදුවී ඇත. ඉතා පැරණි වුද සමකාලීනව ප්‍රබලව පැතිරගියාවුද නයිල්, යුප්‍රටීස්, ටයිග්‍රීස් මෙන්ම ඉන්දු නිම්න ආදී විදේශීය ශිෂ්ඨාචාර ද මේ සඳහා ප්‍රබල සාක්ෂි සපයයි.

ශ්‍රී ලංකාවේ පුරාතන සමාජය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන ප්‍රධාන කාරණයක් වන්නේ එය ගඟ හෝ ඔය ලෙසින් හඳුන්වනු ලබන කිසියම් ජල මාර්ගයක් කේන්ද්‍රකොට ගෙන බිහි වූ ශිෂ්ටාචාරයක් නොවන බවයි. ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය පිළිබඳ දිගු ඉතිහාසයක් ඇති බව විමර්ශන මඟින් අනාවරණය කරගෙන ඇත. ලංකාවට පැමිනි මුල්ම සංක්‍රමණිකයින් ඔවුන්ට හුරු පුරුදු ජීවන වෘත්තිය වූ වී ගොවිතැන ප්‍රධාන කොටගත් කෘෂිකාර්මික දිවිපෙවෙත ලක්දිව තුළදි ද එලෙසම පවත්වාගෙන යනු ලැබීය. ඒ සඳහා ඔවුන් ලංකාවේ ගංගා නිම්න ප්‍රදේශ සිය වාස භූමි ලෙස තෝරාගනු ලැබිණ. විශේෂයෙන්ම ලංකාවේ උතුරු ප්‍රදේශ වී ගොවිතැනට වඩාත් සුදුසු දේශගුණයෙන් ද, එයටම ආවේනික තැනිතලා භූමියකින් ද යුක්ත වූ හෙයින් කෘෂිකාර්මික කටයුතු වඩාත් හොඳින් පවත්වාගෙන යාම සඳහා ඉතා යෝග්‍ය විය. වසරේ එක් කාලයකට ලැබෙන වර්ෂාව නිසාවෙන් එම කාලයට ගංගා, ඇළ, දොළ පිටාර ගලා දෙපස නිම්නවල එක්වන රොන් මඩ සහිත පස කෘෂිකර්මයට සඳහා තෝතැන්නකි.

## ක්‍රමවේදය

විජයගෙන් ඇරඹි අනුරාධපුර රාජධානිය ක්‍රමයෙන් වර්ධනය වත්ම එහි විසූ සියලුම වැසියන් පාහේ කෘෂිකාර්මික දිවි පෙවෙතකට අනුව හැඩගැසීමේ හේතුව මත කෘෂිකාර්මික කටයුතු වලට අවශ්‍ය ජලය නිසි කළට වේලාවට ලබාදීමේ අවශ්‍යතාවයක් ප්‍රබලව මතුවිය. එම අභියෝගය ජය ගැනීම අරමුණ කොට ගනිමින් අනුරාධපුරයේ බලයට පත්වූ සෑම රජෙකුම පාහේ වාරි කර්මාන්ත කටයුතු සඳහා කැපවී ක්‍රියා කළ බව පෙනෙයි. මේ කාලය වන විට ලංකාවේ වාරි කර්මාන්තය සංවිධානාත්මක පදනමක පිහිටා තිබූ බව සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මුලාශ්‍රයන්ට අනුව පැහැදිලි වේ. ජනතාවගේ ජීවනෝපාය සඳහා ගංගා මිටියාවත් බෙහෙවින්ම රුකුලක් වී ඇති අතර විශේෂයෙන් කෘෂි කර්මාන්තය හා භෝග වගාව උදෙසා ගංගා මිටියාවත් මහෝපකාරී වී තිබීම එයට හේතුව වශයෙන් සැලකීමට හැකිය.

ධම්මපද, අට්ඨ කතා හා ජාතක අට්ඨ කතා පරිශීලනය කිරීමෙන් පැහැදිලි වන්නේ ඉන්දියාවේ සිට ලංකාවට පැමිණි ආර්යන් ජල මාර්ග ඔස්සේ වැව්, පොකුණු බඳිමින් තම කෘෂිකර්මාන්ත දියුණු කිරීම පිළිබඳව මනා අවබෝධයක් ලබා සිටි බවයි. ජනගහනය වැඩිවීමත් සමග ගංගා මිටියාවත් ඔස්සේ ජනපද ඉදිවූ ආකාරයත් ඔවුන් සඳහා ආහාර නිෂ්පාදනය වැඩි කිරීමටත් සිදු වීමෙන් ක්‍රම ක්‍රමයෙන් රටේ අභ්‍යන්තරයට ද පිවිසීමට ඔවුන්ට

සිදුවිය. එම රට අභ්‍යන්තරයට පිවිසීමේ දී ඔවුන්ට භෝග වගාව සඳහා වියළි කලාපයේ තැනිතලා බිම් ප්‍රදේශ ඔවුන්ට ඉතා වැදගත් විය. ලංකාවේ භූගෝලීය පිහිටීම අනුව විශේෂිත තැනිතලා පිහිටා තිබීමද ඔවුනට කෘෂි කර්මාන්තය නඟා සිටුවීමට රුකුලක් වූවාට සැක නැත. විශේෂයෙන් වියළි කලාප සඳහා වර්ෂා ජලය නිතර නොලැබුණ බැවින් ලැබුණ වර්ෂා ජලය ගබඩා කර තැබීම ප්‍රධාන අරමුණ බවට සාධක ලැබේ එයට හේතුව කෘෂිකර්මාන්තය සඳහා ජලය අත්‍යවශ්‍ය ම සාධකය වීමය.

**විමර්ශනය**

ලංකාවේ වාරි කර්මාන්තය පිළිබඳ වැඩි කරුණු හෙළිදරව් වන්නේ ක්‍රිස්තු පූර්ව 06 වන සියවසේ සිටයි. එම යුගය තුළ ලංකාවට විජය රජු හා පැමිණි අනුරාධ නම් අමාත්‍යවරයා ආරම්භ කළ කුඩා ගං වැවක් පිළිබඳ වංශ කතා තොරතුරුවලට අනුව අනාවරණය වේ. පැරණි ශිලා ලේඛන තොරතුරුවලට අනුව පුද්ගලික වැව් හිමියන් සිටි බවද සඳහන් වේ. ඒ බව වව්ගමික ආදී වචන තුළින් පැහැදිලි වේ. මුල් යුගය තුළ සරල වාරි කර්මාන්ත පැවතුණි. ඇළ පහරක් හෝ දිය පහරක් නවතා තාවකාලික අමුණක් බැඳ ඇති අතර ඒ සඳහා පස්, ගල්, මැටි ආදිය භාවිතා කර ඇත. ඒවා බොහෝ දුරට සඳහන් වී ඇත්තේ පෞද්ගලික සංවිධානයක් මතයි. අනුරාධපුර යුගයේදී ජනතාව තම පාලකයෙකුගෙන් බලාපොරොත්තු වූයේ ප්‍රධාන අරමුණු දෙකකි. එනම්,

1. බුදු දහම පෝෂණය කිරීම
2. රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම

අද මෙන්ම අනුරාධපුර යුගයේ දී ද මෙරට ජනතාවගේ ආර්ථික රටාවේ මුල්ම ස්ථානය හිමිවූ බව පෙනෙන්නේ බව පෙනෙන්නේ කෘෂිකර්මාන්තයටය. ඉහත පරිච්ඡේදයක දී ඇති පරිදි අනුරාධ, උරුවේල හා විජිත ආදී නම්වලින් මෙරට ආදීම ජනාවාස පිහිටුවා ගන්නා ලද්දේ මල්වතු ඔය, කලා ඔය, දැදුරු ඔය, වළවේ ගඟ හා කිරිඳි ඔය ආදී වූ ගංගා ආශ්‍රිතවය. අනතුරුව එම ජනපදවල වැව් ඉදිකරවනු ලැබීමෙන් පැහැදිළි වන්නේ ආරම්භයේ සිටම කෘෂිකර්මාන්තය මෙරට ජනයාගේ ආර්ථික රටාවේ ප්‍රධානතම අංගය වූ බවයි.

විජය රජුගේ ඇවෑමෙන් මඳ කලකට පසු මෙරට රජ වූ පණ්ඩුවාසදේව කුමරුගේ පුත්‍රයෙකු වූ ගිරිකණ්ඩ සිව නම් කුමාරයා ඔහුගේ පාලනය යටතේ පැවති ගිරිකණ්ඩ නම් ප්‍රදේශයේ පිහිටා තිබූ සියක් කිරියක් පමණ වූ කුඹුරු යායක ගොයම් කැප්ප වූ බව සඳහන් පුවතක් වංස කථාවේ දැක්වේ. ආර්යයන් මෙහි පදිංචි වී නොබෝ කලකින්ම මෙරට කෘෂිකර්මාන්තය අතින් මහත් දියුණුවක් ලබා තුබූ බව මෙයින් හෙළි වේ. වී වගාවට මුල තැන ලැබුණේ මෙරට ප්‍රධාන ආහාරය බත වූ බැවිනි. විජය කුමරු හා පිරිස මෙහි පැමිණි මුල් දිනයේ දී අනුභව කළේ කුවේණිය විසින් සපයන ලද සහලින් පිස ගත් බත්ය. ඉහතින් සඳහන් කළ ගිරිකණ්ඩ සිව කුමරුගේ දියණියක වූ පාලි කුමරිය සියක් කිරියක ගොයම් කප්පවමින් සිටි තම පියාට හා සෙසු අයට ආහාර පිණිස රැගෙන ගියේ බත්ය. එකළ විශාල වශයෙන් ගොයම් කරවූ බව සඳහන් වීමෙන් පෙනී යන්නේ බත එකල ද මෙරට ජනයාගේ ප්‍රධාන ආහාරය වූ බවය.

මෙරට ආර්ථිකයේ ප්‍රධාන අංශය කෘෂිකර්මය වීම මත වාරි කර්මාන්ත මූලික ආයෝජනයක් ලෙස සලකා ඇත. එය රටේ ප්‍රධාන ධනයක් විය. ධාතුසේන රජු කලා වැව තමන්ගේ ධනය යැයි කීවේ එබැවින්ය. මේ වාරි මූලික ශිෂ්ටාචාරය තුළ දැකිය හැකි විශේෂත්වය ලෙස ප්‍රධාන හෝ උප ප්‍රධන නිම්නවල පිහිටි ස්වාභාවික ජල මාර්ගයන් හි ජලය වාරි ක්‍රමෝපායන්

භාවිතයෙන් ප්‍රයෝජනයට ගැනීමය. ඒ හැරුණු විට වැසි ජලය කළමනාකරණයද වාරි මූලික ශිෂ්ඨාචාරය තුළ හඳුනාගත හැකිය. රටේ ජනගහනය වැඩිවීම නිසා වැඩි වශයෙන් ආහාර නිෂ්පාදනය කිරීමට එවකට රජවරුන්ට සිදු විය. රටේ දුර්භික්ෂවලට ඔරොත්තු දෙන ආකාරයේ වගා කටයුතු සිදු කර රට සහලින් ස්වයංපෝෂිත කිරීම එදා සිටි සෑම රාජ්‍ය පාලකයකුගේ ම අභිප්‍රාය වු අතර ජනතාව පාලකයාගෙන් ඒ සියලු දේ බලාපොරොත්තු විය. ඇතැම්විට පාලකයා මේ බලාපොරොත්තු ඉටු නොකිරීම ඔහුගේ පාලනයට ද අභියෝගයක් වී ඇත.

ලංකාවේ මුල්ම රාජධානිය වන අනුරාධපුර රාජධානිය තුළ බලයට පත්වූ සෑම පාලකයකුම පාහේ වාරිකර්මාන්තය පිළිබද ඉතා වැඩි අවධානයක් යොමු කරන ලද බව පහත සඳහන් වාරි කටයුතු මගින් සනාත වේ. වියළි කලාපීය වී ගොවිතැන ප්‍රධාන කොටගත් කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් සහිත රටක් වශයෙන් මුල් කාලයේ සිටම ඒ සඳහා අවශ්‍ය ජල ප්‍රවාහන පද්ධතීන් සැපයීම රජයේ පූර්ණ වගකීම ද විය. එම නිසා බලයට පත්වූ සෑම පාලකයකුම පාහේ රට සහලින් ස්වයංපෝෂිත කිරීමට දිරි දීමක් වශයෙන් මෙම අතිවිශාල වාරිමාර්ග පද්ධතීන් බිහි කළ බව පෙනේ. විශේෂයෙන්ම ඉන්දියානු ආභාෂය ලද ඉතා දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගනිමින් ඉන්දීය ආභාශය ලැබුවද ඇතැම් විට ඔවුන්ටත් වඩා ශිල්පඥානය භාවිත කරමින් ලාංකේය වාරි ශිල්පීන් අතිවිශිෂ්ට අන්දමින් සිය දක්ෂතාවයන් විදහාපෑමට සමත් වී ඇත.

පළමුවන ජෙට්ටතිස්ස රජු විසින් ගොලක්ගමු, මාටඩු, දෙමතුබඩ, බමුණුගම ආදි වැව් ඉදි කරන ලද අතර මහසෙන් රජු විසින් ඉදිකරන ලද විශාලම වැව වන මින්නේරිය වැවේ ජලය පිරුණු විට අක්කර 4670 ක් පමණ ප්‍රදේශයක් යටවන අතර මෙයින් කුඹුරු අක්කර 4100 වගා කිරීමට තරම් ජලය සපයනු ලබයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ දැනට වල්බිහි වී ඇති මහාදාරනගල්ල වැව ඉදි කරන ලද්දේ ද මේ රජු විසින්මය. එදා මහාදාරකගල්ල වැවෙන් කුඹුරු අක්කර දහස් ගණනක් යල මහ දෙකන්නයේ අස්වද්දවා රටේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීමට මහ මෙහෙවරක් ඉටු කළ බව මහාවංශයේ සඳහන් වේ. වසභ රජු ද ලක්දිව වාරි කාර්මාන්තයට උදාර මෙහෙවරක් කළ අයෙකු බව වංශකතා පෙන්වා දෙයි. ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ අග කොටසට අයත් සියලුම වැව් කරනු ලැබූ බවට සලකනු ලබන්නේ මේ රජු විසිනි. මොහු විසින් මයෙන්ති, රාජුප්පල, කොළඹගාම, මණික්කවට්ටි, මහරාමෙන්ති, කෝහාල ආදී වැව් එකොළහක් ද ඇළහැර ඇළ ඇතුළු තවත් ඇළ මාර්ග දොළහක් ද කරවන ලද බව මහාවංශයේ සඳහන් වේ. අනුරාධපුර රාජධානි සමයේ ඉදි කෙරුණු මහා පරිමාණයේ වැවක් ලෙසින් පදවිය වැව හැඳින්විය හැකි අතර දස වැනි හා එකොළොස් වැනි ශත වර්ෂවලදී පදවිය වාණිජ නගරයක් ලෙසින් පැවතීම තුළින් මෙරට ආර්ථිකය වාරි කර්මාන්තවල බලපෑමක් තිබූ බවට පැවසිය හැකිය.

ක්‍රිස්තු වර්ෂ තුන් වන සියවසේ අගභාගයේ ආරම්භ වූ මහා පරිමාණයේ වැව් හා දීර්ඝ ඇළ මාර්ග ඉදිකිරීමේ කාර්යය ඊළඟ සියවස් කිහිපයේ තවත් පුළුල්ව ගිය බව පෙනෙයි. පළමු වන උපතිස්ස රජු විසින් කරන ලද ප්‍රධාන වැව් හයක් ගැන වංසකතාවල සඳහන්ව ඇත. එමෙන්ම ධාතුසේන රජු විසින් කරන ලද කලා බලලු වැව් ප්‍රධාන වැව් දහ අටක් ගැන ද සඳහන් වේ. කලා වැවේ සිට සැතපුම් 54 දිග ජය ගඟ නම් වූ මහා ඇළ මාර්ගය ද දෙවන මුගලන් රජු විසින් කරන ලද වර්තමානයේ නාච්චාදූව නමින් හඳුන්වනු ලබන වැව ද මහා පරිමාණයේ නිර්මාණයන්ය. පළවන ගජබාහු රජුගේ පාලුමැකිච්චාව ගිරි ලිපියේ වාරි කර්මාන්තය තුළින් ගත් ආදායම ථූපාරාමයේ භික්ෂු සංඝයාට සිව්පස ලබා ගැනීම සඳහා සඳහා පූජා කළ බව දැක්වේ. සිංහල වාරි තාක්ෂණය අනුව කලින් කලට වැව් හාරා ඒවායේ

රොන්මඩ ඉවත්කිරීම සඳහා ද රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බව පාලුමැකිච්චව ගිරි ලිපියෙන් සනාථ වේ. ගමයි පන්සලයි වැවයි දාගැබයි යන සුප්‍රකට ඓතිහාසික සංකල්පයට අනුව ගමක මුලින්ම පන්සලක්ද ඉන්පසු වැවක්ද ඇති වේ. බොහෝ අවස්ථාවල වැව සෑදීමේදී ඉවත් කරන ලද හොඳ තත්වයේ පස දාගැබ ඉදිකිරීමට භාවිතා කරන ලදී. ඒ අනුව එකල ජනසමාජයේ මේ සියලු අංග ඒකාබද්ධව තිබී ඇති බව සඳහන් කළ හැක.

මෙරට පවතින වැව් වර්ග ප්‍රමාණය සහ ප්‍රයෝජනයට ගත් ආකාරය අනුව කොටස් 03ක් යටතේ බෙදා වෙන් කර දැක්විය හැක.

1. ගම් වැව් : කුඩා වැව්
2. දාන වැව් : වැවකින් වැවකට ජලය රැගෙන යන වැව්
3. මහා වැව් : විශාල වැව්

ගම්මානවල කෘෂිකාර්මික කටයුතු සත්ව පාලනය මෙන්ම එදිනෙදා සියලු කටයුතු සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීම සඳහා ගම් වැව් ඉදිකරනු ලබන අතර ගම්වැසියන්ගේ දායකත්වය මත මෙම වාරි කර්මාන්ත ඉදිකීරීම මෙන්ම නඩත්තු කිරීමද සිදුවේ. දාන වැව් ජල ප්‍රවාහනයටද මහා වැව් කෘෂිකර්මාන්තය සත්ව පාලනය මත්ස්‍ය කර්මාන්තය මෙන්ම ප්‍රවාහනය ආදි ආර්ථික කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය සහිතව මහා පරිමාණයෙන් ඉදිකරනු ලබයි.

මේඝවර්ණ රජුගේ කාලයට අයත් තෝනිගල පර්වත ලිපියෙහි එකල වගා කළ පිටදඬහස, මදහස හා අකලහස නම් වූ ශෂ්‍ය වාර තුනක් ගැන සඳහන් වේ. වර්තමානයේ මහ කන්නය හා යල කන්නය නමින් හඳුන්වන ප්‍රධාන කන්න දෙක පිළිවෙළින් පිටදඬහස අකලහස යනුවෙන් හඳුන්වන අතර ඒ අතරතුර වපුරන ලද තුන්වන කන්නය මදහස යනුවෙන් මෙම සෙල්ලිපියෙහි හඳුන්වා ඇත. තෝනිගල පර්වත ලිපියෙහිම උඳු හා මුං වැනි හේන් වගා කෙරෙන ධාන්‍ය ගැන සඳහන් වී ඇති අතර ජල අවශ්‍යතාවට ගැලපෙන ලෙසත් ආර්ථික කටයුතු සඳහාත් මැද කන්නයේදී මෙම බෝග වගා කරන්නට ඇතැයි සිතිය හැක.

අනුරාධපුර යුගයේදී වාරි කර්මාන්ත කෘෂිකර්මාන්තයට මෙන්ම සත්ත්ව පාලනය සඳහාද යොදා ගෙන ඇත. පස්ගෝරස, ප්‍රවාහනයට මෙන්ම කෘෂිකාර්මික කටයුතු සඳහා ගවයා යොදාගනු ලබන අතර ගව පාලනය විශාල වශයෙන් සිදු කිරීමේදී වාරිමාර්ග ආසන්න කරගෙන සිදුකර ඇත. ඒ තුළින් නඩත්තුවේ පහසුව මෙන්ම ගංගා වැව් නිම්න වල ඇති තණ පිට්ටනි මගින් සත්ත්වයන්ගේ ආහාර අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම ද සිදුකර ඇත. ගංගා, වැව්, ඇළ, දොළ යනු ජල මුලාශ්‍ර වන අතර ජලජ ජීවීන් ජීවත් වනුයේද මේ මුලාශ්‍ර තුළය. මාංශමය ආහාර ලබා ගන්නා මිනිසාට මේ තුළින් මත්ස්‍යයන් තම ආහාරය සඳහා ගත හැකි අතර මෙය එකල කර්මාන්තයක් ලෙස සිදු කරනු ලැබුවන්ද සඳහන් වේ. සමකාලීන රජය මගින් තහනම් නොකරන ලද වාරිමාර්ගවල මෙය සිදුකර ඇති අතර මේ සඳහා පනවන ලද නීතී රීදී අණපනත් පිළිබඳවද සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මුලාශ්‍ර හෙළිකරයි. මත්ස්‍ය කර්මාන්තය සඳහාම ප්‍රචලිත වැව් පිළිබඳවද වංශකථාවල සඳහන් වේ. වැව් අමුණු සම්බන්ධව අයකරන ලද විවිධ බදු හා බදු තනතුරු පිලිබඳවද මූලාශ්‍ර මගින් හා ශිලාලේඛන මගින් සාධක සොයා ගත හැකිය. වාරිමාර්ග සමකාලීන ආර්ථිකය සමඟ සම්බන්ධ වීම මත මෙම බදු ක්‍රම හා තනතුරු නිර්මානය වීම සිදු වී ඇති අතර ඇතැම් පෞද්ගලික හිමිකාරීත්වය දරන වැව් වල ජලය භාවිතා කිරීමේදී ආදායමට අනුව බදු අය කිරීමට අවසර ලබා දී ඇත.

අනුරාධපුර යුගයේදී මෙන්ම මෙන්ම ලංකාවේ සෑම යුගයකදීම සමකාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස වාරි කර්මාන්තය දියුණු කර ඇති අතර මෙම වාරි මාර්ග තුළින්

නාගරීකරණයක් සිදු වීමද දැකිය හැකිය. ඒ ඒ වාරි මාර්ගයන් ආශ්‍රිතව පාලම්, පාරු, ඔරු වැනි ප්‍රවාහන මාර්ග ඇති වු අතර තම ප්‍රවාහන අවශ්‍යතා සඳහා ඒ තුළින් සේවාවන් ලබාගැනීමට ජනතාව පෙළඹෙයි. ඒසේම මේ ජල මුලාශ්‍ර ආශ්‍රිත මත්ස්‍ය කර්මාන්තය කිරීම නිසා ඒ ඒ රැකියා කළ පිරිස් ඒ අවට තම ජනාවාස ඉදිකරගත්හ. වාරිමාර්ගයන්හි ඍජු හා වක්‍ර බලපෑම මත කෘෂිකර්මාන්තය සත්ත්ව පාලනය මත්ස්‍ය කර්මාන්තය මෙන්ම කුඹල් කර්මාන්තය පන් කර්මාන්තය ආදි  නොයෙක් කර්මාන්තයන් ඇතිවු නිසාවෙන් පසුකාලීනව මෙම ප්‍රදේශ වඩ වඩාත් නාගරීකරණයන්ට ගොදුරු වු අතර මේ හරහා රටේ ආර්ථිකයට විශාල බලපෑමක් සිදුවී ඇත.

**නිගමනය**

මෙරට දීර්ඝතම රාජධානිය වන අනුරාධපුරය වසර දහසකටත් වැඩි කාලයක් පුරා පැවතීමට ප්‍රධාන හේතුව ලෙස ශක්තිමත් ආර්ථිකයටක් පැවතීම දැක්විය හැක. ආර්ථිකයේ ප්‍රධාන සාධකය වන කෘෂිකර්මාන්ත මෙරට ජනතාවගේ සංස්කෘතියේ කොටසක් ලෙසට එක්විය. වර්තමානය වන විටද කෘෂිකර්මාන්තය මේ ප්‍රදේශවල ජනතාවගේ ජීවිතවල කොටසක් බවට පත්ව ඇත. ආර්ථිකයේ බිඳ වැටීම අනුරාධපුර රාජධානියේ පරිහානිය සඳහා ප්‍රබල හේතුවක් ද විය. රාජධානියට එල්ලවු සෑම ආක්‍රමණයකදීම වැව් අමුණු ප්‍රධාන වාරි මාර්ග පද්ධතිය විනාශකිරීම ආක්‍රමණිකයන්ගේ ප්‍රධාන අරමුණක් වු අතර ඒ තුළින් කෘෂිකර්මාන්තය විනාශ කොට මෙරට ආර්ථිකය විනාශ කිරීම තුළින් පහසුවෙන් යටත් කර ගැනීම සිදුකර ඇත. ක්‍රිස්තු වර්ෂ 10වන සියවසේ අවසාන කාලයේදී අනුරාධපුරයට එල්ලවු රාජ රාජ හා රාජේන්ද්‍ර චෝළගේ සොළී ආක්‍රමණය මේ සා විශාල රාජධානිය පිරිහීමට ප්‍රධාන හේතුව වන අතර ඔවුන් මෙරට වාරිමාර්ගයන් විනාශකොට ආර්ථිකය පරිහාණියකට ගෙන ගියහ කැඩී ගිය වැව් අමුණුවලින් කාන්දු වු ජලය තැන තැන රැදුනු නිසා සමකාලීන රාජ්‍යය තුළ වසංගත රෝග ව්‍යාප්ත විය වාරිමාර්ග නොමැතිව කෘෂිකර්මය සත්ව පාලනය විනාශ වීම නිසාවෙන් ජනතාව අනුරාධපුරය අතහැර පොළොන්නරු ප්‍රදේශය හා වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය විය. ජලය මත පදනම් වී ආර්ථිකයක් හා අගනගර නිර්මාණය වීම වර්තමානයේදී ප්‍රබලව සිදු නොවෙන නමුදු ජලයේ අවශ්‍යතා හා වුවමනා හොඳින් දැනෙනුයේ එහි හිඟකම පවතින පුද්ගලයාටයි. ඒ අනුව සලකා බලන විට මේ සා විශාල අනුරාධපුර රාජධානිය ඇතිවීමටත් නැතිවීමටත් හේතුව ලෙස  වාරිමාර්ග පද්ධතිය  දක්වාලිය හැක. ආර්ථිකයේ පරිහාණිය රාජධානියේ පරිහානියට හොඳින් බලපෑ අතර ආර්ථිකය පරිහාණියට ලක්වීම සඳහා වාරි කර්මාන්ත පදනම් කොටගත් ස්වයංපෝෂිත ආර්ථිකය විනාශවීම හඳුන්වාදිය හැක. මේ සියලු කාරණා අනුව අනුරාධපුර රාජධානීයේ ආර්ථිකය නිර්මාණය වීමට මෙරට ගංගා වැව් ඇළ දොළ මෙන්ම පොකුණු ආදි වාරි කර්මාන්ත ඍජු හා වක්‍රව බලපෑ බව පැහැදිලි කර පෙන්වා දිය හැක.

**පරිශීලන.**


විතානාච්චි, සී. ආර්., (2012) ***පුරාණ වාරි මාර්ග විකාශය හා පරාක්‍රම සමුද්‍රයල ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම සසල*** කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 355-380 පිටු.

විතානාච්චි, සී. ආර්. ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්ත***, 2017, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07.

විතානාච්චි, සී. ආර්., (2009) ***පුරාණ ඇළහැර අමුණ, සමෝධාන, වෙළුම I,*** මිහින්තලේ, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

මැන්දිස්, ටී. ***පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශනය හා භූ දර්ශනය,*** 2017, චතුර මුද්‍රණාලය 69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

සුරංජි, ඊ. 2015, ***අනුරාධපුර යුගයේ පැවති කෘෂිකාර්මික කටයුතු පිළිබඳ විමර්ශනයක්,*** සරසවිලේඛා සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.

සුරවීර ඒ. වී, ***අනුරාධපුර සංස්කෘතිය,*** 2002, චතුර මුද්‍රණාලය, 142, අවිස්සාවේල්ල පාර, වැල්ලම්පිටිය.

# 10. පුරාණ සොරොව්ව පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යනයක්

එම්. ජී . ආර්. තරුෂිකා

## හැඳින්වීම

'වැව' යන සිංහල වදන පාලි හා සංස්කෘත **'වාපි'** යන්නෙන් බිඳී ඇත. පැරණි සෙල්ලිපිවල **'වපි'** හෝ **'වවි'** යනුවෙන් වැව සඳහන් වී තිබේ. එය වැව බවට පත්ව ඇත්තේ අටවැනි සියවසේ දී පමණ වේ. භාෂාවේ පරිණාමයත් සමග එතෙක් නොතිබූ ' ඇ ' කාරය සිංහල භාෂාවට එකතු වීමෙන් මේ වෙනස සිදු වී ඇති බව විද්වත්හු පෙන්වා දෙති. වැවක් යනු ජලය රඳවා තබාගන්නා වූ ද , අවශ්‍ය විටක අවශ්‍යතාවය පරිදි එම ජලය යළි නිකුත් කළ හැකි වූ ද කෘත්‍රිම ජලාශයකි . ඒ අනුව වැව කෘත්‍රිම ව නිර්මාණය කෙරෙන්නක් බැවින් එය විලෙන් වෙනස් වේ. එයින් ලබා ගන්නා ප්‍රයෝජනවල ස්වභාවය නිසා වැව පොකුණෙන් ද වෙනස් වේ. වැව පුරාණ සිංහලයන්ගේ සභ්‍යත්වය අවියෝජනීය ලෙස බැඳුණු අංගයක් විය. අනුරාධපුර යුගයේ විසූ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ ධාතුසේන රජතුමා ( ක්‍රි.ව. 460 - 478 ) තමන් විසින් ඉදිකරනු ලැබූ 'කලා වැව' තමා සතු මහා නිධානය ලෙස සපථ කරමින් කලා වැවේ බැම්ම මතදීම මරණයට පත්වීය. පොළොන්නරු යුගයේ විසූ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ පළමු වැනි මහා පරාක්‍රමබාහු රජතුමා ( ක්‍රි .ව. 1153 - 1186 ) **"වැස්සෙන් හටගත් ජලය මදකුත් ලෝකෝපකාරයෙන් වෙන්ව කිසි කලෙකත් මුහුදට නොයේවා" යි ප්‍රකාශ කර තිබේ. පුරාණ සිංහල රජවරුන් තම ජීවිතය හා සම කර සැලකූ** ශ්‍රී ලංකාවේ "වැව" තාක්ෂණයෙන් ඉතා විශිෂ්ට වන්නා සේම සංඛ්‍යාත්මකව ඉතා ඉහළ අගයක් ගන්නා බව ද මෙයින් පෙනේ.

## ක්‍රමවේදය

එසේ සුවිශිෂ්ඨ වන වැව් තාක්ෂණයේ ප්‍රබල අංගයක් වන පුරාණ සොරොව්වේ නිර්මාණ තාක්ෂණය පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන අතර සාහිත්‍යමය මූලාශ්‍ර පරිශීලනය කරමින් තොරතුරු එක්රැස් කිරීම සිදුකරන ලදි. පර්යේෂණයේ අවසන් ප්‍රතිඵලය ලෙස පුරාණ සොරොව්ව පිළිබඳ සහ එහි නිර්මාණ තාක්ෂණය පිළිබඳ මෙලෙස ලේඛනගත කිරීමට අවස්ථාව උදාවිය.

## විමර්ශනය

වැවක ගබඩා කර ඇති ජලය ක්‍රමානුකූලව එයින් පිට කරන ප්‍රධාන මාර්ගය 'සොරොව්ව' වේ. සොරොව්ව මඟින් මනා පාලනයකින් යුතුව ජලය පිට කෙරේ. එහෙත් මුල් කාලයේ මෙරට ඉදි කළ ගම් වැව්වල සොරොව්ව තිබුණේ ද යන්න එතරම් පැහැදිළි නොවේ. මේ යුගයේ තිබූ කුඩා වැව්වලින් ජලය පිටතට ගෙන ඇත්තේ එක් තැනකින් එහි බැම්ම කපා කවුළුවක් ඇති කිරීමෙන් බව මහාචාර්ය එච්. ටී. බස්නායක ඇතුළු විද්වත්හු පවසති. 1872 වන විට තමන්කඩුව ප්‍රදේශයේ වැව්වලින් කුඹුරුවලට ජලය ලබාගෙන ඇත්තේ වැව් බැම්ම කැපීමෙන් බව ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා පෙන්වා දී තිබේ. වැව් බැම්ම කපා ජලය ඉවතට ගැනීම ඉතා හානිකර ක්‍රියාවකි. එම ස්ථානයෙන් පාලනයකින් තොරව ජලය පිට වේ. ගලායන ජල පහරේ වේගය අනුව වැව් බැම්ම සේදී යමින් එහි කපොල්ල ද ක්‍රමයෙන් විශාල වේ. ඊළඟ වර්ෂා සමයේ දී යළි වැවට ජලය පුරවා ගැනීම සඳහා කපොල්ල වසා වැව් බැම්ම යළි ප්‍රතිසංස්කරණය කළ යුතු වේ. ජල යන්ත්‍ර මඟින් ජලාශවල ජලය ඉහළට නැංවීම පිළිබඳ තොරතරු වංසකතාවල සඳහන් වෙයි. භාතිකාභය රජතුමා රුවන්වැලි මහා චෛත්‍යට කළ ජල පූජාව එවැන්නකි. ' චක්කවට්ටක ' නම් වූ එවැනි ජල රෝද ආධාරයෙන් මුල් කාලයේ දී ගම් වැව්වල ජලය කුඹුරුවලට බෙදා හරින්නට ඇති බවට විශ්වාස කෙරේ. මෙය ඉතා

වෙහෙසකර ක්‍රියාවක් බව පෙනේ. මේ ගැටලුවලට විසඳුම් සෙවීමට කළ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස 'සොරොව්ව' නිර්මාණය කරන්නට ඇතැයි සිතිය හැකි ය. පෞරාණික වාරි උරුමය පිළිබඳ ප්‍රාමාණික විද්වතුන් සිය සොරොව් වර්ගීකරණය තුළ, සොරොව්ව සඳහා යොදාගත් තාක්ෂණය අනුව "කැටසොරොව්ව" හා "බිසෝකොටු සොරොව්ව" ලෙස ප්‍රධාන සොරොව් වර්ග දෙකක් ඉදිරිපත් කරනු ලබයි.

**කැටසොරොව්ව**

විශාල දැව කඳන්වල මැද සිදුරු කර සාදාගන්නා බටයක් වැව් බැම්ම හරහා ස්ථානගත කිරීමෙන් මුල් කාලයේ ගම් වැව්වල සොරොව් නිර්මාණය කරන්නට ඇත. වර්තමානයේ පවා වියළි කලාපයේ ඈත ගම්වල මේ ක්‍රමයේ සොරොව් භාවිත කෙරේ. ගලෙන්බිඳුණුවැව සමීපයේ 'ගැටකුලාව' ගම අසල වනාන්තරයේ වූ බිඳී ගිය ගම් වැවක් එහි ගම් වැසියන් විසින් යළි සකසා භාවිතයට ගෙන ඇත්තේ බුරුත කොටයකින් සැදූ සොරොව්වක ආධාරයෙනි. පලු, බුරුත මෙන්ම තල් කොට ද මේ සඳහා යොදා ගෙන තිබේ. දැව කඳන් වෙනුවට, මැටියෙන් කළ බට යොදා මේ සොරොව්ව නිර්මාණය කිරීම සිදුකර ඇතැයි සිතිය හැකි ය. පොළොව යටින් ජලය ගෙන යාම සඳහා මැටි බට යෙදීමට පුරාණ සිංහලයෝ අති දක්ෂයෝ වූහ. අනුරාධපුරයේ රන්මසු උයනේ සහ සීගිරියේ ප්‍රමාද වනයේ මෙන් ම වසභ රජුගේ කාලයේ දී ද පොළොව යටින් දිය ගෙන යාම සඳහා මෙවැනි මැටි බට යොදා ගෙන ඇති බව මහාචාර්ය පරණවිතාන පෙන්වා දී තිබේ. මෙම සොරොව්වලට ඇතුළුවන ජලයේ පීඩනය පාලනය කිරීම සඳහා ගම් වැව්වල **සොරොව් කැට** භාවිතා කර තිබේ. මේ නිසාම මේ වර්ගයේ සොරොව් ගැමියන් විසින් **කැට සොරොව්** නමින් හඳුන්වනු ලැබේ.

පතුළ නැති මල් පෝච්චි මෙන් වූ මෙම සොරොව් කැට එකක් මත එකක් තැබිය හැකි වේ. සොරොව් කැට අතරින් ජලය කාන්දු වීම වැළැක්වීම සඳහා මැටි හෝ පිදුරු හෝ ඒ දෙකම හෝ යොදා එම හිඩැස පිරවීමට ගැමියෝ පුරුදුව සිටිති. සොරොව් කැට ඇළවීම සහ වැටීම වැළැක්වීමට ඒ වටා රිටි කිහිපයක් සිටවනු ලැබේ. ජලයෙන් මතුපිටට එන තෙක් සොරොව් කැට ඇසිරීමෙන් ජලය පිටවීම වැළකේ. අවශ්‍යතාව මත ඉහළම සොරොව් කැටය ඉවත් කිරීමෙන් වැවේ ජලය පිට කෙරේ. මේ නිසා සොරොව්වට ලැබෙන්නේ උඩින්ම සොරොව් කැටයට ඉහළින් වන ජල කඳේ පීඩනය පමණකි. සම්පූර්ණ ජල කඳේ පීඩනය නොවේ. එය සිංහල ජල තාක්ෂණයට මනා නිදසුනකි. වර්තමානයේ දී මේ වර්ගයේ සොරොව් භාවිතයෙන් ඉවත් වෙමින් පවතී. එහෙත් ලවණ සහ බැර ලෝහ සාන්ද්‍රණය ආදී කරුණු පිළිබඳවත් අවධානය යොමු වී ඇති මෙකල වැව මතුපිටින් ජලය ලබාගැනීමට හැකි මෙම කැට සොරොව් ක්‍රමය නැවතත් වැව් ගම්මාන ආශ්‍රිතව ඇති කුඩා වැව්වල ස්ථාපනය කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලිය යුතු ය. වර්තමානය වන විට සොරොව් කැට වෙනුවට උස් පහත් කළ හැකි දැව හෝ වානේ තහඩු දොරවල් සහ කොන්ක්‍රීට් බට යොදා සොරොව් නවීකරණය කර තිබේ. සොරොව් දොරටු තැනීමේ දී ජලයට ඔරොත්තු දෙන කුඹුක්, මී වැනි දැව භාවිතා කෙරේ.

**බිසෝකොටුව සොරොව්ව**

වැව් ක්‍රමයෙන් විශාල වන විට, එහි රඳන විශාල ජල කඳේ උස ද වැඩි වේ. එවිට එමඟින් ඇති කරන ජල පීඩනය ද අධික වෙයි. අධික පීඩනයකින් යුක්ත ජල කඳක්, සාමාන්‍ය සොරොව් බටයකින් පිටතට ගන්නා විට, එමඟින් වැව් බැම්මට හානි සිදු වීමට ඇති ඉඩ වැඩි වේ. කැට සොරොව් ඊට ප්‍රමාණවත් නොවිණ. මහා පරිමාණ වැව් තැනීම සඳහා මේ අභියෝගය ජය ගත යුතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස පුරාණ සිංහලයන් අතින් "

බිසෝකොටුව" සහිත සොරොව් නිර්මාණය කෙරී තිබේ. බිසෝකොටුව සහිත සොරොව් වංසකතාවේ හඳුන්වා ඇත්තේ "ප්‍රණාලිකා" නමිනි. ආගමනය හෝ ගලා ඒම යන අරුත් ඇති පාලි අභිස්සව හෝ අභිස්සෝන වදනෙන් "බිසෝ" යන්නත්, ගබඩාකාමරය හෝ ජලාශය අරුත් ඇති කොට්ඨක වදනෙන් "කොටුවත්" බිඳී සිංහල **බිසෝකොටුව** යන වචනය සෑදී ඇතැයි විද්වත්හු පෙන්වා දෙති. වචනයේ අරුතින්ම බිසෝකොටුව යනු ගලා එන ජලය ගබඩා කර යළි පිටකරන කුටියකි. තවත් සරලවම පැවසුවහොත් බසින කොටුව යනුවෙන් හැඳින්විය හැකි ය. එනම් ජලය බස්සන කොටුව සහ ජල පීඩනය බස්සන කොටුවයි. චතුරශ්‍රාකාර හෝ ආයත චතුරශ්‍රාකාර හෝ ළිඳක් වැනි එය වැවක ඇතුළත වැව් බැම්මට සමීපව ඉදිකර ඇත. බිසෝකොටුව නමින් හැඳින්වෙන මෙම සොරොව්ව කොටස් 03 කින් යුක්ත වේ. එනම්, ගැඹුරට කණින ලද විවෘත ඍජුකෝණාස්‍රාකාර ළිඳක් හෝ වලක්, වැවෙන් ළිඳට වතුර බසින බෝක්කුවක්, ළිඳේ සිට බන්ධනයෙහි පිටස්තර බෑවුමෙහි අඩිය දක්වා බඳින ලද ජලය පිට කරන බෝක්කුවක් වශයෙනි. වර්තමානයේ කුඩා වැව්වල වෘත්තාකාර බිසෝකොටු ද නිර්මාණය කර තිබේ. බිසෝකොටුව පතුලේ වැවට මුහුණලා ඇති කවුළුවකින් ඊට ජලය ඇතුළු වේ. අධික පීඩනයකින් යුතුව ඇතුළුවන ජලය ස්වාභාවිකවම වැවේ ජල මට්ටම දක්වා ඉහළ යයි. එවිට එහි ජල පීඩනය බෙහෙවින් අඩු වේ. එසේ පීඩනය අඩු වූ ජලය, බිසෝකොටුවේ පතුළට සමීපව, වැව් බැම්ම දෙසට ඇති තවත් කවුළුවකින් ඇරඹෙන උමගක් ඔස්සේ වැව් බැම්ම හරහා වැවෙන් පිටතට ගලා යයි. මෙසේ බිසෝකොටුවට ඇතුළු වන ජලය සම්පූර්ණයෙන්ම නැවැත්වීමට හෝ පාලනය කිරීමට හැකිවන පරිදි එහි වැව් බැම්මට මුහුණලා ඇති කවුළුව වසා කපාටයක් යොදා තිබේ. එය පුරාණයේ දැවවලින් ඉදිකර තිබී ඇත. බිසෝකොටුවේ ඉහළ සිට ලීවරයක් මඟින් එය පාලනය කළ හැකි ය. එහෙත් මේ සම්බන්ධයෙන් කිසිඳු සාක්ෂියක් හමු වී නැත. මෙය ලීවලින් සාදන ලද බැවින් සම්පූර්ණයෙන්ම විනාශ වී ගොස් ඇති බව පෙනේ.

කපා මට්ටම්කල කළුගල් මැනවින් වද්දා පුරාණ බිසෝකොටු නිර්මාණය කර ඇත. මේ තාක්ෂණික නිර්මාණය බිහිකිරීමත් සමඟම අධික පීඩනයකින් යුක්ත ජලය මනා පාලනයකින් යුතුව වැවෙන් පිටකිරීමට සිංහලයෝ සමත් වූහ. ඒ සමඟම ඔවුහු ප්‍රමාණයෙන් අති විශාල වූ වැව් ඉදිකිරීම ඇරඹූහ. ක්‍රිස්තු වර්ෂ පළමුවන වන සියවස පමණ වන විට බිසෝකොටු නිර්මාණය පිළිබඳ තාක්ෂණය සිංහලයන් සතු වූ බව සමකාලීන වැව් ආශ්‍රයෙන් විද්වත්හු පෙන්වා දෙති. බිසෝකොටුව පිළිබඳ හෙන්රි පාකර්ගේ පහත සඳහන් කියමන ඊට මනා සාධකයකි.

**"බොහෝ සෙයින් අඩි 30 ක් හෝ 40 ක් ගැඹුර වැව්වලින් පිටට බහින ජලය ප්‍රමාණ කිරීම එතරම් පහසු කාර්යයක් නොවේ. නමුත් සෑම කාලවලම සාදන ලද බිසෝකොටුවල මෝස්තරයන්හි දක්නට ලැබෙන සමානකම නිසා ක්‍රිස්තු වර්ෂයට පෙර තුන්වන ශතවර්ෂයේ හෝ ඊට පෙර විසූ සිංහල ඉංජිනේරුවන් කොතෙක් දුර එකී කර්මාන්ත තත්වාකාරයෙන් දැන සිටියේ ද කිවහොත් ඊට පසුව ආ සියල්ලෝම ඒ අනුව මේවා සෑදූ බව ඔප්පු වේ. එහි විස්තර සිතින් පමණක් සිතා බැලිය හැකි ය. ඒ බිසෝකොටුවේ මෝස්තරය කුමන කුමන ක්‍රමයකට සෑදුවත් එය සිංහල ඉංජිනේරුවන්ගේ දක්ෂකමෙන් කරන ලද වික්‍රමයක් වශයෙන් පෙනී යන්නේ ය. එයින් පුදුම එළවන කාරණයක් නම් ඉතා පැරණි සොරොව්වලත් මේ බිසෝකොටුව දක්නට තිබීමයි. මෙය සොයාගත්දා පටන්...."**

සූරියවැව, පිහිටි "උරුසිටාවැවේ" ගලින් නිම කල පැරණි බිසෝකොටුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් සංරක්ෂණය කර තිබේ. එහි වැව් බැම්ම හරහා ජලය ගෙන ගිය උමං මාර්ග සහ ජලය පිටකළ සොරොව් දොරටුව, ඉපැරණි ඉදිකිරීමකට අනර්ඝ නිදසුනකි.

පුරාණ පරාක්‍රම සමුද්‍රයට අයත්ව තිබූ වැවේ සෙල්මුවා බිසෝකොටුව ද වර්තමානයේ දැකගත හැකි තවත් එවැනි විශිෂ්ට නිදසුනකි. කැට සොරොව්වලින් වැව මතුපිටට ජලය පිට කෙරුණු අතර බිසෝකොටුව සහිත සොරොව්වකින් වැව පතුළට සමීප ජලය පිට කෙරිණි. මේ දෙකෙන්ම සිදු කෙරුණේ ජලයේ පීඩනය පාලනය කිරීමයි. බිසෝකොටුවක ක්‍රියාකාරීත්වය වර්තමාන විශාල ජලාශවල යොදා තිබෙන "වැල්ව් ටවර්ස්" (Valve – Towers) හා "වැල්ව් පිට්ස්" (Valve – Pits) වලට සමාන බව පෙන්වා දිය හැකි ය. සාමාන්‍යයෙන් බිසෝකොටුවක ඇත්තේ එක් චතුරස්‍රාකාර හෝ වෘත්තාකාර හෝ ළිඳක් පමණි. එහෙත් එකිනෙක යා වූ එවැනි ළිං දෙකක් සහිත අතිශය දුර්ලභ වූ ද්විත්ව බිසෝකොටුවක් පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රයට යාව ඉදිකර තිබේ. නිශ්ශංකමල්ල රජතුමාගේ රාජකීය මාලිගා සංකීර්ණයේ වූ විශාල පොකුණට ජලය ලබා ගැනීම සඳහා නිර්මාණය කළ මෙහි විශේෂත්වය වනුයේ එය වැව් බැම්මට පිටතින් ඉදිකර තිබීමයි. සාමාන්‍යයෙන් බිසෝකොටුවක් ඉදිකරනුයේ වැව් බැම්මකට ඇතුළු පැත්තෙන් හෙවත් ජලය ඇති පැත්තෙනි. මෙම ද්විත්ව බිසෝකොටුව මගින් වැවට ඉතා සමීපයේ ඇති රාජකීය පොකුණට ගලන ජලයේ ප්‍රබල පීඩනය ඉතා අවම මට්ටමකට ගෙන ඒම සිදු කෙරී තිබේ. ඒ එක බිසෝකොටුවකට ජලය වැටී පීඩනය අඩු වී ඊලඟ බිසෝකොටුවට එම ජලය ගලායාමට සැලැස්වීමෙන් තවදුරටත් එහි පීඩනය අඩු කිරීම මගිනි. මෙම ද්විත්ව බිසෝ කොටුව දැනට සොයාගෙන ඇති ඒ වර්ගයේ එකම බිසෝකොටුව වේ. එබැවින් එය සිංහල වාරි තාක්ෂණයේ අද්විතීය නිමවුමක් ලෙස පිළිගැනේ.

බිසෝකොටුවක් සහිත සොරොව්වකින් යුක්ත විශාල වැවකින්, ජලය පිටතට ගෙනයාමට, ඊට පෙර තිබූ මැටි බට ප්‍රමාණවත් නොවිණ. ඒ සඳහා කළුගල් යොදා උමං මාර්ග නිර්මාණය කරවා ඇත්තේ එබැවිණි. බිසෝකොටුවෙන් අඩු වී පැමිණෙන ජල පහරේ පීඩනය, තවදුරටත් පාලනය කෙරෙන ලෙස මේ උමං මාර්ග සකසා තිබේ. එය සිදුකර ඇත්තේ ජලය ඇතුළට ලබාගන්නා විවරයට වඩා පිටකරන විවරය විශාල කිරීමෙනි. මෙම උපක්‍රමය කුඩා ගම්වැව්වල හමු නොවේ. උමං මාර්ගයේ ස්වභාවය අනුව ද සොරොව් වර්ග 03 ක් හඳුනාගත හැකි වේ. **ඒ බිසෝකොටුවට ජලය ඇතුළු කිරීමට සහ එයින් ජලය පිටකිරීමට එක් උමං මාර්ගය බැගින් පිහිටි සොරොව්.** අනුරාධපුරයේ තිසා වැව, බසවක්කුලම වැව මේ සඳහා උදාහරණ ලෙස පෙන්වා දිය හැකි ය. එමෙන් ම අනුරාධපුර නුවර වැවෙහි පිහිටා ඇති පරිදි **බිසෝකොටුවට ජලය ඇතුළු කිරීමට සහ එයින් ජලය පිට කිරීමට උමං මාර්ග දෙකක් බැගින් පිහිටි සොරොව් විශේෂ** මෙන් ම **බිසෝකොටුවට ජලය ඇතුළු කිරීමට එකක් සහ පිටකිරීමට දෙකක් වශයෙන් උමං ඇති සොරොව් ලෙස ය**. මේවායේ ජල මාර්ගය ඉංග්‍රීසි වයි අකුර ඉහළ පහළ මාරුකළ ආකාරයට නිමවා තිබේ. උදාහරණ ලෙස දූරතිස්ස වැවේ සහ මහගම වැවේ සොරොව් පෙන්වා දිය හැකි ය. මෙම වර්ගයේ තුනටම වඩා වෙනස් වූ විශාල සොරොව් ද කලාතුරකින් මහ වැව්වල දැකගත හැකි ය. පරාක්‍රම සමුද්‍රයේ ඩී එක සොරොව්ව මෙයට නිදසුනකි. මේ සොරොව්වේ ජලය ලබාගෙන පිට කිරීම සඳහා උමං මාර්ග 04 ක් බැගින් සකස්කර තිබේ.

වැවක් තුළ පිහිටා ඇති ජල මට්ටම සහ ඒවායෙන් කෙරෙන කාර්යය අනුව ද සොරොව් වර්ග 02 ක් හඳුනාගත හැකි වේ. ජලය පිට කිරීම සඳහා වැව් පතුලට තරමක් ඉහළ මට්ටමකින් පිහිටා තිබෙන සොරොව් "ගොඩ සොරොව්" හෙවත් "දිය සොරොව්" ලෙස හැඳින්වේ. කිසි විටෙකත් පුරාණ සිංහලයෝ වැවක වූ සියලු ජලය ඉන් පිටතට නොගත්හ, මන්ද යත් ගොවිතැනට අමතරව ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවන්ට සහ සතුන්ට බීම සඳහාත් යම් ප්‍රමාණයක ජලය ප්‍රමාණයක් වැව පතුලෙන් ම ඉතිරි කෙරේ. වැවක පතුලෙහි යොදා ඇති සොරොව් වර්ගයක් පිළිබඳව සර් එමර්සන් ටෙනන්ට් මෙසේ සඳහන් කර තිබේ, **"රැස්කරන ලද ජලය වැවේ ටිකක්වත් තිබෙන තුරු එය කිසි අවහිරයක් නැතිව සෑදූ ඇළවල්**

**මගින් පිටත ගැනීමට වැවේ පතුලෙන්ම සොරොව්වක් සාදන්නට ඔවුන්ට සිදුවිය...**" එමර්සන්ට් ටෙනන්ට් මේ සඳහන් කර ඇත්තේ ගොඩ සොරොව්වමම බවට සැකයක් නැත. ඔහු පතුල ලෙස හැඳින්වූව ද එය සත්‍ය වශයෙන්ම වැවේ පතුල නොවේ. ගොඩ සොරොව් යනුවෙන් හඳුන්වනු ලබන සොරොව්වට අමතරව වැවේ පතුල් මට්ටමේ තනා ඇති තවත් සොරොව් වර්ගයක් තිබේ. දිය සොරොව්ව යටින් හෙවත් වැවේ පතුල මට්ටමෙන් තනා ඇති එය හඳුන්වන්නේ "මඩ සොරොව්ව" නමිනි. මඩ සොරොව් කිසිම විටෙක වැවේ ජලය පිටකිරීම සඳහා භාවිතා නොකෙරේ. වැවට එකතු වන රොන්මඩ පිට කිරීම සඳහා මඩ සොරොව් භාවිතා කෙරිණි.

අගෝස්තු මාසයේ වියළි කලාපයට පායයි. මේ නියන් සමයේ වැව්වල ජලය සිඳුණු විට, ගම් වැව්වල පතුලේ ඇති දිය සමඟ මඩ කැලතෙන ලෙස මී හරක් ලවා මඩවනු ලැබේ. විශාල වැව්වල මේ කාර්යය සඳහා අලි ඇතුන් යොදාගත් බව පැරණි ගැමියෝ පවසති. ජලය සහ මඩ මැනවින් මිශ්‍ර වන ලෙස දවස පුරා කැලතීමෙන් පසු මඩ සොරොව්ව විවෘත කරනු ලැබේ. එවිට වතුර සහ කැලතී ඇති මඩ සියල්ල වැවෙන් පිටතට ගලා යයි. කාබනික ද්‍රව්‍යවලින් පොහොසත් මේ රොන්මඩ, කුඹුරුවලට අගනා පොහොරක් ලෙස යොදාගෙන තිබේ. වර්තමානය වන විට වැව්වල, මඩ සොරොව් දැකගත නොහැකි තරම් වේ. එයින් සිදු කෙරෙන කාර්යය නිවැරදිව වටහා නොගැනීම නිසා පසුකාලීන ප්‍රතිසංස්කරණවල දී මේවා වසා දමුවා විය හැකි ය. වැව්වලින් කෙත්වතු සඳහා ජලය පිටකෙරෙන සොරොව්වලට අමතරව, වැවකින් තවත් වැවකට ජලය ගෙන යන සොරොව් වර්ගයක් තිබේ. එය කිසිවිටෙකත් කෙත්වතුවලට ජලය නොසපයයි. උදාහරණ ලෙස කලා වැවේ යෝධ ඇළ ඇරඹෙන සොරොව්ව පෙන්වා දිය හැකි ය. මෙලෙසින් එකිනෙකට වෙනස් කාර්යයභාර රැසක් සහ තාක්ෂණික උපක්‍රම රැසක අන්තර්ගතයකින් ඉපැරණි සොරොව්වේ ක්‍රියාකාරීත්වය හඳුනාගත හැකි ය.

**නිගමනය**

අතීතයේ සොරොව්ව සඳහා යොදාගත් තාක්ෂණය අනුව කැට සොරොව්ව සහ බිසෝකොටුව ලෙස ප්‍රධාන සොරොව් වර්ග 02 ක් දැකිය හැකි අතර මෙම දෙවර්ගයේ ම නිර්මාණ තාක්ෂණය පිළිබඳ සලකා බැලීමේ දී එකිනෙකට වෙනස් තාක්ෂණික ක්‍රමවේද රැසක් භාවිතා කර ඇති බවක් දක්නට ලැබේ. කැට සොරොව්වෙන් අත්හදා බැලි එම තාක්ෂණය සාපේක්ෂව දියුණු ශිල්පීය ක්‍රමවේදයක් ඔස්සේ බිසෝකොටුව සොරොව්ව දක්වා වර්ධනය වී ඇත. ඒ අතීත සිංහලයා කුඩා වැව්වලින් තෘප්තිමත් නොවී මහ වැව් ඉදිකිරීම දක්වා සිය තාක්ෂණික ඥාණය මෙහෙය වූ බැවිනි. මෙම තාක්ෂණික ක්‍රියාදාමය තුළින් නිගමනය වන තවත් කරුණක් වනුයේ අතීත වාරි ශිල්පියා සිය නිර්මාණයන් බිහිකිරීමේ දී තුන්කල් දක්නා නුවණෙන් ක්‍රියා කර ඇති බවයි. බිසෝකොටු සොරොව්ව යනු දේශීය ශිල්ප ශාස්ත්‍රවලින් නිර්මාණය කරන ලද දේශීය නිර්මාණයක් වන අතර, ඒ සඳහා පාදක වූ අපේ සිංහල දැනුම ප්‍රයෝජනයට ගතහොත් රටට ලෝකයට වැඩදායී නිර්මාණ ඉදිරියට ද බිහිකල හැකි වේ.

**පරිශීලන**

අච්සදහාමි, යූ. බී; 2015, *වැව*, හෝකන්දර, ප්‍රාචී ප්‍රකාශන.

බස්නායක, එච්. ටී; 1997, ***පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, ජා- ඇල, සමන්ති පොත් ප්‍රකාශකයෝ

විතානාච්චි, සී. ආර්; 2017, ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය***, කොළඹ, පුරාවිද දෙපාර්තමේන්තුව

ස්වර්ණසිංහ, කේ. එම්. අයි; 2005, ***අපේ වැවෙන් පැන් දෝතක් සිංහල වැව පිළිබඳව ශාස්ත්‍රීය විමර්ශනය***, පන්නිපිටිය, චාග ප්‍රකාශන

# 11. දිගාමඩුලු සංවර්ධනයෙහිලා සේනානායක සමුද්‍රයේ දායකත්වය.

බී. එම්. ඒ. දනන්ජිත්

**හැඳින්වීම**

ඓතිහාසික යුගයේ සිටම දිගාමඩුලු ප්‍රදේශය වාරි කර්මාන්තය හා කෘෂිකර්මාන්තය වෙනුවෙන් ඉතා වැදගත් භූමි කලාපයක් බවට පත්ව තිබී ඇත. නිදහස් ලංකාවේ ගොඩනැගෙන ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය මෙම ප්‍රදේශය කේන්ද්‍රීයව ආරම්භ කිරීමට තරම් එය වැදගත් වී ඇත. සේනානායක සමුද්‍රය කේන්ද්‍රීයව ඉදිවන ගල්ඔය බහුකාර්ය යෝජනා ක්‍රමය 1949 වර්ෂයේ අංක 51 දරන පනතින් එම වර්ෂයේ ම නොවැම්බර් 24වනදා සංස්ථාපිත ආයතනයක් බවට පත්කරන ලදී. මෙම මණ්ඩලය සඳහා 1950 මාර්තු 31දින ගැසට් නිවේදනයකින් බලප්‍රදේශ වෙන්කරන ලද අතර උතුරින් ආඳල්ඔයත්, දකුණින් කෝමාරිය කලපුවත්, බටහිරින් ගල්ඔය ජලාධාර ප්‍රදේශයත්, නැගෙනහිරින් මුහුදත් වශයෙන් වර්ග සැතපුම් 500ක පමණ වූ භූමියක් වෙන්කර ඇත. ඒ අනුව මෙම මණ්ඩලයේ මූලික අරමුණු ලෙස සඳහන් කර ඇත්තේ ජල ගැලීම් පාලනය කිරීම, ඉඩම් නොමැති වූවන්ට ඉඩම් ලබා දෙමින් කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීම, නව කර්මාන්ත ඇරඹීම, පට්ටිපොල ආරු යටතේ වගාකළ අක්කර 40 000ක කුඹුරු ඉඩම්වලට ස්ථාවර ජල පහසුකම් ලබා දීම ආදියයි. මේ ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් වීමත් සමඟ දිගාමඩුල්ලේ එසේ නැතහොත් අම්පාර දිස්ත්‍රික්කයේ ආර්ථික, කෘෂිකාර්මික, සමාජීය වශයෙන් නව ශිෂ්ටාචාරයකට පදනම දැමූ බව අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ.

**සේනානායක සමුද්‍රය හා වාරිමාර්ග පද්ධතිය.**

මෙතෙක් ශ්‍රී ලංකාවේ මිනිසා විසින් නිර්මාණය කරන ලද විශාලතම ජලාශය ලෙසින් සේනානායක සමුද්‍රය සැලකේ. එසේම ලංකාවේ විශාලතම වාරිමාර්ග පද්ධතිය වනුයේ ද ගල්ඔය වාරි පද්ධතියයි. මෙරට පැරණි වාරි ක්‍රම අධ්‍යයනය කරන එවකට වාරිමාර්ග අධ්‍යක්ෂ ජේ. එස්. කෙනඩි මහතා තැනිතලාවේ නොගැඹුරු වැව් ඉදිකිරීම වෙනුවට ලංකාවේ භූ විෂමතාවයට අනුව කඳුකරය මායිමේ ගැඹුරු ජලාශ ඉදිකර වෙරළ දක්වා ජලය ගෙනයාමේ සංකල්පයක් හඳුන්වා දුන් අතර මෙම සංකල්පය ගැඹුරු ජලාශ සංකල්පය ලෙසින් හැඳින්වේ. ඒ අනුව ඒ සඳහා උචිතම ස්ථානයක් වශයෙන් ඉඟිනියාගල 1935 වනවිටත් ඔහු විසින් හඳුනාගෙන තිබුණි. ගල්ඔය ගංගාව මඩොල්සිම කඳුකරයෙන් ආරම්භව සැතපුම් 65ක් ගෙවා නැගෙනහිර මුහුදට එක්වේ. මුහුදට පිවිසීමට සැතපුම් 28කට පෙර ඉඟිනියාගලදී අඩි 3600 දිග අඩි 120ක් උස පස් බැම්මකින් ගල්ඔය ගංගාවේ ගමන අවහිර කිරීමෙන් මෙම ජලාශය ඉදිකර ඇත. වර්ග සැතපුම් 384ක පමණ ජල පෝෂක ප්‍රදේශයකින් ද යුක්ත ය. ජලාශය අක්කර අඩි 770 000ක ජල ධාරිතාවයකින් යුක්ත වන අතර ජලාශය වර්ග සැතපුම් 30ක් පමණ පුරාවට පැතිර පවතී. මෙම ජලාශය ඉදිකිරීම සිදු කරන ලද්දේ ඇමරිකාවේ සැන්ෆ්‍රැන්සිස්කෝහි සමාගමක් වන මොරිසන් සහ ක්නුඩ්සන් සමාගම ය. ගල්ඔය ජලාශය යටතේ ද්විතියික ජලාශ පද්ධතියක් ද ඉදිකර ඇත. ඒ යටතේ පල්ලන්ඔය, එක්ගල්ඔය අම්බලන්ඔය, නවගිරියාව, නාමල්ඔය ආදී ජලාශ වේ. ජලය නිකුත් කිරීම සඳහා ප්‍රධාන ඇලමාර්ග 2ක් පවතින අතර ප්‍රධාන වම් ඇල සැතපුම් 32ක් හා ප්‍රධාන දකුණු ඇල සැතපුම් 22ක් ද වේ. ජලාශයේ ජලයෙන් හිමිදුරාව වැව සහ අලිඔළුව වැව පෝෂණය වන අතර හිමිදුරාව වැව ජල ගැලීම් වළක්වා ගැනීම සඳහා ඉදිකරන ලදී. එසේම වම් ඇලේ ජලය නවගිරියාව ජලාශය හරහා මඩකලපුව වෙත ජලය සැපයීම සිදුවේ.

## කෘෂිකර්මාන්තයේ සංවර්ධනය

සේනානායක සමුද්‍රය ප්‍රමුඛ ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය මඟින් අපේක්ෂා කළ අරමුණුවලින් වඩාත් ප්‍රතිඵලදායක වූ කාර්යය වූයේ කෘෂිකර්මාන්තය නඟා සිටුවීමය. ව්‍යාපාරය ආරම්භයට පෙර තත්ත්වය අධ්‍යයනය කරන විට අම්පාරටත් මුහුදුබඩ ප්‍රදේශයටත් අතර පිහිටි " පට්ටිපොල ආරු" ප්‍රදේශයේ පැරණිනන් ඇල මාර්ග හා අතු ගංගා හරස් කර අමුණු බැඳ වී ගොවිතැන් කළද වගා කිරීමට හැකිවී ඇත්තේ අක්කර 26 000ක් පමණි. එම ඉඩම් ද වගා කිරීමට හැකිවූයේ වර්ෂයේ එක් කාලයක පමණක් වන අතර මහ කන්නයේදී ගල්ඔය පිටාර ගැලීමත්, යල කන්නයේදී ජල හිඟය නිසාත් පට්ටිපොල ආරු යටතේ වී වගාව අපහසු වී ඇත. එම නිසා මහ කන්නයේදී ජලය බැස ගිය විගස එහි තෙතමනය යටතේ මැද කන්නයක් වගාකිරීම පමණක් එදා සිදුවී ඇත. පට්ටිපොල ආරු ප්‍රදේශයේ අමුණු කිහිපයක් ඉදිකිරීම සඳහා ඉංග්‍රීසි පාලකයන් තැත්දැරුව ද එය සාර්ථක වී නැත. ගල්ඔය ව්‍යාපාරය ආරම්භ කර සහලින් ස්වයංපෝශිත කරවීමේ අධිෂ්ඨානයෙන් යුක්තව ජලාශය ඉදිකර දළ වශයෙන් අක්කර 35 000ක් පමණ දෙකන්නය වගා කරන්නට හැකිවේ යැයි කෙනඩි මහතා එදා අදහස් කළද ව්‍යාපාරයේ ඇස්තමේන්තු කටයුතු අවසන් වන විට ජලාශය යටතේ අක්කර 120 000 කටත් වඩා වැඩි බිම් ප්‍රමාණයක් යල මහ දෙකන්නයම වගාකිරීමට හැකිවීමෙන් එහි සාර්ථකභාවය ලොවටම පෙනී යයි. වර්තමානය වන විට, වම් ඇල යටතේ අම්පාරේ අක්කර 40 590 වී වගාව සඳහා ද අක්කර 1392 උක් වගාව සඳහා ද, මඩකලපුවේ අක්කර 22 652 වී වගාව සඳහා ද, දකුණු ඇල යටතේ අම්පාරේ අක්කර 27 744 වී සඳහාද අක්කර 930 උක් වගාව සඳහා ද, මඩකලපුවේ අක්කර 28 520 වී සඳහා ද අක්කර 496 උක් වගාව සඳහා ද වශයෙන් වී වගාව හා උක් වගාව සඳහා ජලය සපයන දැවැන්තයකු බවට සේනානායක සමුද්‍රය පත්වී ඇත. අස්වැන්න පිළිබඳ අධ්‍යයනය කරන විට **2020 - 2021 වර්ෂවලදී මහ කන්නයේ මෙට්‍රික් ටොන් 365 123ක්ද, යල කන්නයේ මෙට්‍රික් ටොන් 290 263ක්ද** ආදී වශයෙන් අස්වැන්නක් ලබා ගැනීමට හැකිවී ඇත. එසේම වර්තමානය වන විට අම්පාර දිස්ත්‍රික්කය මෙරට වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්කවලින් එකක් වන අතර එය ශ්‍රී ලංකාවේ සමස්ත වී නිශ්පාදනයෙන් 16%කට වඩා සැපයීමකි. දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනයෙන් 45%ක් පමණ සෘජුවම වී වගාව හා නිෂ්පාදනයට සම්බන්ධ වන අතර තවත් 35%ක් වක්‍රව සම්බන්ධ වේ. ඒ අනුව මෙතරම් වී නිෂ්පාදනයේ පෙරළියක් සිදුකිරීමට මෙම ප්‍රදේශයේ ජනතාවට හැකිවී ඇත්තේ සේනානායක සමුද්‍රය නිසාවෙන් බව පැහැදිලි වේ.

## ජනපද පිහිටුවීම හා සමාජ සංවර්ධනය

ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කිරීමට ප්‍රථම අම්පාර දිස්ත්‍රික්කයේ ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කරන විට ගල්ඔය නිම්න භූමියේ ඉහළ මධ්‍යම කොටස් දෙකෙහිම සිට ඇත්තේ 4000ක පමණ ජනගහනයක් පමණි. ඔවුන් පැරණි සිංහල වැදි පරම්පරාවලට ද අයත් විය. වෙරළබඩ එනම්, කල්මුණ, කාර්තිව්, නින්දවූර්, අඩ්ඩාලච්චේන, අක්කරපත්තුව, තිරුක්කෝවිල්, පොතුවිල්, සම්මන්තුරේ වැනි ප්‍රදේශවල 79000ක පමණ ජන සංඛ්‍යාවක් ජීවත් වී ඇත. මේ ජනගහනයෙන් අර්ධයක් පමණ ජීවත් වී ඇත්තේ වර්ග සැතපුම් 12කට නොවැඩි පටු බිම් තීරයකය. මෙහි බහුතරය දෙමල හා මුස්ලිම් ජනතාවය. සිංහල ජනතාව ජීවත් වූයේ මුහුදුබඩින් රට තුළට වන්නට වනාන්තරයේ පුංචි ගම්මානවල පවුල් හතරක් හෝ පහක් බැගින්ය. අහස් දියෙන් හෝ කොටන ලද හේනකින් ජීවිතය පවත්වා ගෙන ගිය මෙම ජනතාව ආර්ථික සබඳතා පවත්වන ලද්දේ මුස්ලිම් වෙළඳුන් සමඟ භාණ්ඩ හුවමාරු කරගැනීමෙනි. ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය සමඟ ඇති කරන ලද ගොවි ජනපද අම්පාර දිස්ත්‍රික්කයේ සාමාජීය වශයෙන් ඇතිකළ පෙරළිය අතිවිශාල ය. ඉහතින් දැක්වූ පරිදි මෙම

පෙදෙස් ඊට පෙර ජනශූන්‍ය කලාප වීය. සංවර්ධන ව්‍යාපාරය යටතේ 1959 වර්ෂය වන විට වම් ඉවුරේ ගොවි ජනපද 43ක් ඉදිකෙරිණි. ජනපද අංක 01 - 43 දක්වා අංකවලින් ඒවා හැඳින්වේ. එම ජනපදවලින් 27ක් වැව්ගම් පත්තුවෙත් ඉතිරි ජනපද 16 සම්මන්තුරේ හා පෝර්තිව් පත්තුව තුළත් පැතිරී ඇත.

ජනපදිකයින් පදිංචි කිරීමේදී සේනානායක සමුද්‍රයට යටවූ ගම්මානවල ගම්වැසියන්ට ප්‍රමුඛස්ථානය දෙනු ලැබීය. විවිධ ප්‍රදේශවලින් ජනතාව ගෙන්වා පදිංචි කිරීමට ප්‍රථම ජලාශයට යටවූ කොස්සපොල, කළුගල්කැටිය, අන්නාසිවත්ත, කෙහෙල්පොත, තඹදෙණිය, නිකවැටිය, පල්ලෙඅරාව, බුබල, සේරුවත්ත, බෝගහකිවුල ඇතුළු ගම්මාන රැසක පවුල් 296ක් සඳහා වාවින්න, පරගහකැලේ 1 හා 2 ජනපදවල ගොඩ හා කුඹුරු ඉඩම් අක්කර 7 බැගින් ලබා දී පදිංචි කරවා ඇත. වැව්ගම්පත්තුවේ පිහිට වූ ජනපද 27හි ඉඩම් කට්ටි 3670ක් තිබූ නමුත් පදිංචි කිරීමට ප්‍රදේශයෙන් සොයාගැනීමට හැකි වූයේ පවුල් 725ක් පමණි. අතිරික්ත ඉඩම් කට්ටි 2945ක් සඳහා බදුල්ල, කොළඹ, හලාවත, ගාල්ල, හම්බන්තොට, කුරුණෑගල, කළුතර, කෑගල්ල, මහනුවර, මාතර, නුවරඑළිය, පුත්තලම, රත්නපුර යන දිස්ත්‍රික්කවලින් හා යාපනයෙන් තෝරාගත් ගොවි පවුල් 2945ක් කැඳවා පදිංචි කරවා ඇත.

**"Thus, 34 villages have been established with the completion of the 1954-55 programme of settlement. These 34 villages comprise in all 4780 families consisting of 33 000 persons"** (Development board 1956, p 11)

මෙලෙසින් විවිධ ප්‍රදේශවලින් ජනතාව ගෙන්වා පදිංචි කළ නිසාවෙන් සංස්කෘතික විවිධත්වයක් ඇති වූ බව කිව යුතුය. වර්තමානය වන විට එසේ පදිංචි කළා වූ ජනසංඛ්‍යාව වර්ධනය වී ඇති ආකාරය ජන සංඛ්‍යා ලේඛන අධ්‍යයනයේ දී පැහැදිලි වේ. 649 402ක ජනගහණයක් අම්පාර දිස්ත්‍රික්කය තුළ ජීවත් වන්නේ එදා ඇතිකලා වූ සාමාජීය පුනර්ජීවනය නිසා යැයි කිව හැක.

**නාගරීකරණය ඇතිවීම**

අම්පාර නගරය සේම අනිකුත් කුඩා නගර අද පවතින දියුණුවට පත්වීමට ප්‍රධානතම සාධකය වූයේ සේනානායක සමුද්‍රයයි. අම්පාර නගරය අතීතයේ පැල්පත් පමණක් තිබූ නොදියුණු කලාපයක් විය. අම්පාර නගරය ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කේන්ද්‍රස්ථානය ලෙසින් සංවර්ධනය වී ඇත. නගරය සැලසුම් කරන ලද්දේ සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන සැලසුම් ශිල්පියා වූ චෙකෝස්ලෝවේකියානු ජාතික රොස්ඩොවුස්කි නම් ශිල්පියා ය. 1952 වර්ෂයේ මෙහි මූලික වැඩකටයුතු නිමකළ අතර ක්‍රමානුකූල ලෙස නගරය සංවර්ධනය වී ඇත. නගරයේ එක් කොටසකට වන්නට නිල නිවාස, පාසල්, කාර්යාල ගොඩනැගිලි ඉදිවූ අතර ආගමික සහනශීලීත්වයට මුල්තැන දෙමින් ආගම් හතරටම අයත් ආගමික මධ්‍යස්ථාන ඉදිකර ඇත. සැලසුම් සහගත ලෙස නගරයේ මාර්ග, මාවත් සංවර්ධනය ද ඒ යටතේ සිදුවූ අනිකුත් කාර්යයන් ය. මහා මාර්ගයට ආසන්න වාණිජ බිම් කට්ටි වෙන්දේසියකින් බෙදා දී නගරයේ ආර්ථික කටයුතුවලට ශක්තිය ලබා දී ඇත.

මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ මෙන් සැලසුම් සහගත නාගරික හෝ ග්‍රාමීය මධ්‍යස්ථාන බිහි නොවීම මෙම ව්‍යාපාරයේ අඩුවක් ලෙස පෙනුනද කැපී පෙනෙන සංවර්ධනයත් ඒ හා සමඟම වැඩි වූ වී නිශ්පාදනයත් ඔස්සේ ජනතාවගේ ජනජීවිතය උසස් වන විට හිඟුරාණ, උහන, මධ්‍යම කඳවුර වැනි වෙළඳ මධ්‍යස්ථාන බිහිවිය. නිම්නය තුළ ගල්ඔය ව්‍යාපාරය

ආරම්භ වීමට ප්‍රථම ප්‍රදේශයේ මහාමාර්ග නොවූ අතර ව්‍යාපාරයේ වැඩකටයුතු අවසන් වන විට A, B, C හා D කාණ්ඩයේ මාර්ග විශාල ප්‍රමාණයකින් ඉදිවී තිබිණ.

ඉගිනියාගල විදුලි බලාගාරය හේතුවෙන් එකල බොහෝ දුර්ලභ දෙයක් බවට පත්ව තිබූ විදුලි බලය ද ප්‍රදේශයට ලැබිණ. ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය ඇරඹීමේ මූලික අරමුණක් වූයේ ජලාශය මගින් බලප්‍රදේශයට ජල විදුලිබලය ලබා දීමය. ඒ අනුව සේනානායක සමුද්‍රයේ ජලය භාවිතා කර මුලදී කිලෝවොට් 500ක් ජනක යන්ත්‍රයක් මගින් විදුලිය සපයන ලද්දේ ප්‍රධාන පරිපාලන නගරයේ වූ කාර්යාල හා කර්මාන්ත සඳහාත්, නගරවාසීන්ගේ ප්‍රයෝජනය සඳහාත් ය. අනතුරුව 1954දී විදුලි බලාගාරයේ විදුලිය අම්පාරට ලබා ගැනීමට නිම්නයේ පළමු අධිබල සම්ප්‍රේෂණ මාර්ගය ඉගිනියාගල සිට අම්පාර දක්වා ඉදිකෙරිණ. එතැන් සිට විදුලි බලය මූලිකවම අවශ්‍යව පැවැති ස්ථානවලට සම්ප්‍රේෂණ මාර්ග ඉදි වූ අතර මුල් වර්ෂ කිහිපයේදී උහන, හිඟුරාණ, පාදාගොඩ, පොල්වගා ජනපදය, හාඩි විද්‍යාලය, චවලකඩේ යන ප්‍රදේශවලට විදුලිය සැපයින. 1957 වන විට මඩකලපුව දක්වා එය ව්‍යාප්ත වූ අතර මේ හරහා වීරගොඩ, දඩයම්තලාව යන ප්‍රදේශවලටද අක්කරපත්තුව, කල්මුණේ, මල්වත්ත, එක්ගල්ඔය, සම්මන්තුරේ හා ජනපද කිහිපයකටද විදුලිය සැපයීමට ඉඩ ලැබිණ. 1960දී කැනේඩියානු ආධාර මත ගල්ඔය විදුලිබල පද්ධතිය ඉගිනියාගල සිට බදුල්ල දක්වා දිවෙන 66000kw අධිබල සම්ප්‍රේශණ මාර්ගයකින් ජාතික විදුලිබල පද්ධතියට එකතු වූ අතර මේ නිසා වගා කටයුතු සඳහා නිකුත් කළ ජලයෙන් නිපද වූ අස්ථාවර විදුලි තත්ත්වය මගහැරී වසර පුරා නිම්නයට විදුලිය සැපයීමට හැකියාව ලැබිණ. අද වනවිට බලාගාරය විදුලි ජනක යන්ත්‍ර 4කින් යුක්ත අතර මෙගා වොට් 11.25ක පමණ විදුලියක් නිපදවනු ලබයි. එසේම පානීය ජලය ප්‍රදේශයට විශාල අඩුවක් ලෙස පැවැති අතර සේනානායක සමුද්‍රය හේතුකොටගෙන වර්තමානය වන විට සියළුම ප්‍රදේශවලට පාහේ පානීය ජලය සැපයීමට හැකියාව ලැබීම සුවිශාල ජයග්‍රහණයකි.

**කර්මාන්ත ඇතිවීම හා සංවර්ධනය**

ගල්ඔය සංවර්ධන ව්‍යාපාරයත් සමඟ ම ඇතිවන සුවිශාල කර්මාන්ත හේතුවෙන් ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික දියුණුවත් නාගරික සංවර්ධනයත් ඇතිවිය. එලෙස ආරම්භ කළ සුවිශාල කර්මාන්තයන් වශයෙන් හිඟුරාණ සීනි කම්හල, එරගම උළු කම්හල, අම්පාරේ දැව ඉරුම්හල, සහල් සැකසුම් මධ්‍යස්ථාන දැක්විය සෘජු හා වක්‍ර රැකියා ලබා දෙන දැවැන්ත ආයතනයන් ලෙසින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීමට මෙමඟින් හැකියාව ලැබී ඇත. මෙම ආයතනයන් නිසාවෙන් ජනතාව අතර මුදල් සංසරණය වැඩිවීම, රැකියා උත්පාදනය, ප්‍රාදේශීය සංවර්ධනයන් ඇතිවීම සිදුවෙමින් පවතී. අනිකුත් කර්මාන්ත වශයෙන් මිරිදිය මත්ස්‍ය වගාවන් ඇති කර ඇති අතර නැගෙනහිර පලාත මිරිදිය මත්ස්‍ය අස්වැන්න සඳහා වැඩි දායකත්වයක් සේනානායක සමුද්‍රය සපයනු ලැබේ. ගල්ඔය සංවර්ධන මණ්ඩලය මගින් ගල්ඔය ජාතික වනෝද්‍යානය, සේනානායක සමුද්‍ර අභය භූමිය, ගල්ඔය නිම්න නිරිතදිග අභය භූමිය ස්ථාපිත කරවන ලදී. එමගින් ජලාශය අවට ජීවත් වන සතුන් වෙත වාසස්ථාන ඇති වූවා සේම දේශීය හා විදේශීය සංචාරකයන් ආකර්ෂණය කරවන සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් වී ඇත. වනාන්තරය තුළ සංචාරය කිරීම්, කඳවුරු ඉදිකිරීම්, සංචාරක නිකේතන ඉදිවීම් සමග ප්‍රදේශයේ ජනතාව වෙත මුදල් ගලා ඒම ආර්ථික වශයෙන් වැදගත් වේ.

**නිගමනය**

මීට දශක අටකට පමණ ඉහත දී දිගාමඩුල්ල ප්‍රදේශය පැවැතියේ කෙසේද යන්න පිළිබඳ අධ්‍යයනය කරන විට අවම පහසුකම් හෝ නොමැති ජන ශුන්‍ය කලාපයක් බවට පත්ව තිබූ බව පෙනේ. එසේම ප්‍රදේශයේ ජනයා දුෂ්කර තත්ත්වයන් යටතේ තම ජීවන කටයුතු මෙන්ම වගා කටයුතු ද සිදුකර ඇත. එනමුත් ශ්‍රී ලංකාව නිදහස් රාජ්‍යයක් ලෙසින් ක්‍රියාත්මක කළ ප්‍රථම බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වන ගල්ඔය සංවර්ධන ව්‍යාපෘතිය කෙතරම් ආර්ථික හා සමාජීය වශයෙන් බලපෑමක් දිගාමඩුල්ලට එල්ල කලේ ද යන්න ඉහත කරුණු සාක්ෂ්‍ය දරයි. එසේ ඇතිවූ පෙරළිය අම්පාර නව දිස්ත්‍රික්කයක් වශයෙන් නම් කිරීමට හේතු වූ අතර 1961 වර්ෂයේ අප්‍රේල් 19 දින වෙනම දිස්ත්‍රික්කයක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබීය. එතෙක් මඩකලපුවට අයත්ව තිබූ කරවාකු පත්තුව, නින්දවූර් පත්තුව, අක්කරපත්තුව, පානම් පත්තුව, නාඩුකාඩු පත්තුව, වැව්ගම් පත්තුව එක් කර අම්පාර දිස්ත්‍රික්කය නිර්මාණය කර ඇත. ගල්ඔය සංවර්ධන ව්‍යාපෘතිය මගින් ලබන ලද අත්දැකීම් පසු කලෙක ක්‍රියාත්මක කළ ගොවි ජනපද ව්‍යාපාර හා බහුකාර්ය යෝජනා ක්‍රමවල දී බෙහෙවින් ඉවහල් විය. ඒ අනුව සේනානායක සමුද්‍රය මූලික කර ගත් ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය දිගාමඩුල්ලේ සංවර්ධනය උදෙසා විශාල දායකත්වයක් සැපයූ බව, නව ජීවයක් සැපයූ බව නිගමනය කළ හැකිය.

**පරිශීලන.**


කහඳගමගේ. පි(2007), **දිගාමඩුලු දනව්ව**, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

**ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය ස්වර්ණ ජයන්තිය සමරු කලාපය** (2005), ගල්ඔය ස්වර්ණ ජයන්ති කමිටුව.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012), **ජන හා නිවාස සංගණනය**, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

Galoya Development Board(1956), Annual Report 1954-55, Ministry of Lands and Lands Development" Colombo.

අචිනි දිසානායක(2018), ගල්ඔය බහුකාර්ය යෝජනා ක්‍රමය යටතේ ස්ථාපිත කරන ලද සේනානායක සමුද්‍රය, roarmedia(Online), https://roar.media/sinhala/main/features/senanayake-samudraya-development/amp (21.12.2021)

කේ. පත්මනාදන්(2021), පැරකුම් යුගයකට පාර කැපූ ගල්ඔය ව්‍යාපාරය(Online), dinamina.lk, පෙබරවාරි, https://www.dinamina.lk (22.12.2021)

ලංකාදීප(2021), ගල්ඔය ගොවි ජනපදය ගැන පැරැන්නන් කියන කතා, ලංකාදීප (Online)" https://www.lankadeepa.lk (22.12.2021)

සුනිල් කන්නන්ගර(2017), ගල්ඔය වරුණෙ-නවබිමක කතන්දරේ (Online) [https://www.google.com/amp/s/sunilkannangara.wordpress.com](https://www.google.com/amp/s/sunilkannangara.wordpress.com) (25.12.2021)

**ඡායාරූප**




(ඡායාරූප 01) ගල්ඔය ව්‍යාපාරය යටතේ ඉදිකරන ලද විදුලි සම්ප්‍රේශණ මාර්ග (Annual Report 1956, p 21)



(ඡායාරූප 02) ගල්ඔය ව්‍යාපාරය යටතේ ඉදිකරන ලද ජනපද (කහඳගමගේ 2007, පි 74-75)




(ඡායාරූප 03) ගල්ඔය ගංගා ද්‍රෝණිය - sementicscholar.com

## 12. තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිවල පැවැත්ම කෙරෙහි පවතින අභියෝග

ඩී. ජී. ටී. ආර්. දන්දෙනිය

### හැඳින්වීම

ජලය යනු අතීතය, වර්තමානය සහ අනාගතය යන තුන්කල්හි ම මිනිසාගේ මූලික අවශ්‍යතාවයන්ගෙන් එකකි. එනම් මිනිසුන් වන අපගේ පැවැත්ම තීරණය වීමට බලපාන අත්‍යවශ්‍ය සාධකයක් වන ජලය, මේ ආකාරයෙන් මානවයාගේ ජීවිතය කෙරෙහි ඍජුවම සම්බන්ධ වන බව කිව හැක. ශ්‍රී ලංකාවේ විවිධ දේශගුණික තත්ත්වයන් හමුවේ කෘෂිකාර්මික කටයුතු ඇතුළුව දෛනික පරිභෝජනය පිණිස ජලය මැනවින් කළමනාකරණය කර ගත යුතු විය. වියළි කලාපීයව ලැබෙන වර්ෂාපතනය ක්‍රමවත්ව එක්රැස් කර රඳවා තබා ගෙන තම කර්මාන්තයන්ට යොදා ගැනීමට ජනයා කටයුතු කර ඇති අතර පැරණි ජන සමාජය මේ සඳහා භාවිතා කරනු ලැබුවේ **'වැව'** යි. එකී 'වැව', හුදෙක් තනි ඒකකයක් පමණක් නොව තිරස් ජාලගත වැව් පද්ධතියක් හෙවත් **'එල්ලංගා පද්ධතියක් (cascade system)** ය. එනම්, යම් උස් ස්ථානයක පිහිටි වැවක සිට කුඩා වාරි මාර්ග ඔස්සේ පහළ තිබෙන ජලාශ වලට ජලය සැපයීමට සකසන ලද ක්‍රමවේදයකි.

### ක්‍රමවේදය.

පුස්තකාල ගවේෂණය සිදු කළ අතර ද්විතියික මූලාශ්‍රයන් භාවිත කරනු ලැබිණි. මිනිස් සිරුර තුළ ඇති වකුගඩු මෙන් ජල පෙරණයක් ලෙස ක්‍රියා කරන මෙම තිරස් ජාලගත වැව් පද්ධතිය, මහ වැවක් ජලයෙන් පුරවන වැවක් පෝෂණය කරනු ලබන පද්ධතියක් ලෙස පමණක් නොව ජෛව විවිධත්වයෙන් ස්වයංපෝෂිත වූ පරිසර පද්ධතියක් ද වේ. එබැවින් මෙම අධ්‍යනයෙන් බලාපොරොත්තු වන්නේ 2018 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකාර්මික සංවිධානය විසින් ලෝක උරුමයක් වශයෙන් ද ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ තිරස් ජාලගත වැව් පද්ධතියේ පැවැත්ම කෙරෙහි පවතින අභියෝගයන් හෙවත් විවිධ බලපෑම් මොනවාද යන්න පෙන්වා දීමත් අයහපත් අයුරින් බලපාන අභියෝගයන් අවම කර ගනිමින් සමාජය විසින් කටයුතු කළ යුතු වන බව පෙන්වා දීම සහ සියලු සමාජීය තලයන්ගේ සිටින පුද්ගලයින්ගේ දායකත්වයෙන් මෙම සුවිශේෂී පරිසර පද්ධතිය ආරක්ෂා කර ගතයුතු වන බව අවබෝධ කර දීම අවසානයේ දී මෙම ලිපියෙන් බලාපොරොත්තු වේ.

### විමර්ශනය

ශ්‍රී ලංකාව සතුව පවතින මෙම තිරස් ජාලගත වැව් පද්ධතිය, ජල විද්‍යාත්මකව ඒකාබද්ධ වූ පද්ධතියක කොටස් වශයෙන් ඇති පොකුරු වශයෙන් පවතින බව මහාචාර්ය මද්දුම බණ්ඩාරගේ අදහස ය. මෙම ජාලගත පද්ධතියේ ඉහළින්ම ඇති වැවට ජලය සැපයෙන මාර්ගය මූලික ජල ප්‍රභවය ලෙසින් හැඳින්වේ. එමෙන්ම මෙහිදී ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශයක් වශයෙන් සැළකෙන්නේ එක් වැවක් පෝෂණය වන ප්‍රදේශය යි. එලෙස පෝෂණය ලබන වැවේ සිට තවත් වැවකට ඇළ මාර්ගයන් ඔස්සේ ජලය රැගෙන යමින් එයට පහළින් වූ ප්‍රදේශයේ ජලය සපයා ගත හැකි සීමාවේ කෘෂිකර්මාන්තය සිදු කෙරේ. ඒ අනුව තිරස් ජාලගත වැව් පද්ධතියක කුළු වැව්, ගම් වැව්, විශාල වැව සහ ඇළ මාර්ග එකිනෙකට සම්බන්ධවී ඇත.

මෙරට සාම්ප්‍රදායික ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරන තිරස් ජාලගත වැව් පද්ධතිය අතීතයේ සිටම විදෙස් ආක්‍රමණ, මැලේරියා වසංගත තත්ත්වය, යටත් විජිත සමය ආදි නොයෙක් අවස්ථාවන්හිදී අත්හැර දැමීමට සිදු වී ඇත. මෙම තිරස් ජාලගත වැව් පද්ධතිය වෙත වර්තමානයේදී ද සමාජයෙන් දේශපාලනමය, ආර්ථිකමය සහ සමාජීය

වශයෙන් විවිධ බලපෑම් එල්ල වෙමින් පවතී. ඒවා ඇතැම් විට හිතකර බලපෑම් විය හැකි අතර තවත් ඒවා අහිතකර ප්‍රතිඵල ගෙන දෙන බලපෑම් ද විය හැකිය. නිදසුනක් ලෙස 2013-2015 යන වර්ෂයන් හි දී **International Union for Conservation of Nature (IUCN)** ආයතනය සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන ගණනාවක්ගේ සහභාගීත්වයෙන් මෙරට තිරස් ජාලගත වැව් පද්ධති පරිසර විද්‍යානුකූලව ප්‍රතිෂ්ඨාපනය කිරීමක් සිදු විය. එය මෙම පරිසර පද්ධති වෙත ලැබුණු සුවිශේෂී අවස්ථාවක් ලෙසින් හඳුන්වාදිය හැකිය. මෙවැනි ජාලගත වැව් බොහෝ ප්‍රමාණයක් ඇති අතර ඒ අතරින් අනුරාධපුර රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ .කපිරිග්ගම එල්ලංගා පද්ධතිය' (Kapiriggama Cascade System). මෙහිදී නිදසුනක් වේ.

එලෙස එල්ලංගා පද්ධති නැවත ප්‍රතිස්ථාපනය කිරීමේදී වැසි ජලය රැස් කරමින් මතුපිට ජල ධාරිතාව වැඩි දියුණු කිරීම, කාර්යක්ෂම ජල පරිවහනය, භූගත ජලය නැවත පිරවීම සහ නිසි ජලාප්‍රවාහනය සඳහා ද දායකත්වය ලබාදී ඇත. ජලයේ රොන් මඩ ඉවත් කරමින් ජලයේ ගුණාත්මක බව වැඩි කිරීම සහ කාර්යක්ෂමව ජල කළමනාකරණය කිරීම, ගංවතුර සහ නියං තත්ත්වයනට අනුවර්තනය විය හැකි ලෙස වර්ෂය පුරා ජල සැපයුම ලැබීමට සැළැස්වීම ආදිය එම ව්‍යාපෘතිය යටතේ සිදු විය. සෞඛ්‍ය සම්පන්න සහ පෝෂ්‍යදායි ආහාර වර්ධනය තුළින් තිරසාර කෘෂිකර්මාන්තය වැඩි දියුණු කිරීමට ද විධිවිධාන යෙදීය. එමෙන්ම බෝග විවිධාංගීකරනය හා ධීවර සහ පශු සම්පත් සංවර්ධනයට ද කටයුතු කර ඇත (*Ecological restoration of Kapiriggama cascade system* 2016; 'Restoring Traditional Cascading Tank Systems IUCN Cascade Development Project Information Brief No. 1 For enhanced rural livelihoods and environmental services in Sri Lanka.pdf' n.d.). මේ සියලූම කාර්යයන් එකී පද්ධතියට අයත් පැතිකඩයන් ය. එලෙස අන්තර්ජාතික සංගමයක් මඟින් රාජ්‍ය මැදිහත් වීම ද සහිතව මෙම එල්ලංගා පද්ධතිය පරිසර විද්‍යානුකූලව ප්‍රතිෂ්ඨාපනය කිරීම එම පරිසර පද්ධතිය වෙත දේශපාලමය, ආර්ථිකමය සහ සමාජීය වශයෙන් ලැබෙන හිතකර බලපෑමක් වේ.

බහු කාර්ය වාරි මාර්ග ව්‍යාපෘතීන් සහ අවිධිමත් ලෙස නිවාස සහ වෙනත් ඉදිකිරීම් මෙම පරිසර පද්ධතීන්ගේ පැවැත්මට බාධා එල්ල කරනු ලබයි. එමෙන්ම වැඩි විශ්කම්භයකින් යුතු වගා ළිං හැරීම ආදිය හේතුවෙන් භූගත ජල මට්ටම සීඝ්‍රයෙන් අඩු වී ඒ ආශ්‍රිත පරිසර පද්ධතීන්ගේ සමතුලිත බව හීන වෙන අතර එය වක්‍රාකාරයෙන් අයහපත් ලෙසින් බලපෑම් කරනු ලබන්නේ තිරස් ජාලගත වැව් පද්ධතිය වෙත ය. එමෙන්ම කෘෂිකර්මික කටයුතු වලදී බහුලවම භාවිත වන බැර ලෝහ වර්ග ඇතුළත් විවිධ කෘෂි රසායන ද්‍රව්‍යයන් දිගු කාලීනව වායු ගෝලය සමඟ, භූගත සහ භූතල ජලය සමඟ මුසු වේ. එය තිරස් ජාලගත වැව් පරිසර පද්ධතිය වාසස්ථාන කරගෙන වෙසෙන ශාක සහ සත්ත්ව ප්‍රජාවට මෙන්ම එහි පැමිණෙන සංචාරක පක්ෂීන් වෙත අහිතකර අන්දමින් බලපානු ලබයි. සතුන්ට ඒවා ආග්‍රහණය වීමත් සහ ශරීරගත වීමත් හේතුවෙන සතුන් මිය යාම, වර්ගය බෝ කිරීමේ ප්‍රවණතාවය බාල වීම සහ වඳවී යාමේ තර්ජනයට ලක් වීම ආදී නොයෙක් විපත් ගෙන දේ. තිරස් ජාලගත වැව් පද්ධතියේ කොටස්කරුවන් වන මේ සියලු ජීවීන් සහ පරිසරය අතර වන සබැඳියාව සහ පාරිසරික සමබරතාවය මේ නිසා ගිලිහී යන අතර එම පද්ධතියේ පැවැත්මට නිසැකවම එය අභියෝගයක් වේ.

**නිගමනය**

ඒ අනුව මෙහිදී පැහැදිලි කරනු ලැබුවේ මෙරට තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිය වෙත පවතින අභියෝගයන් සහ මොනවා ද යන්න සහ එම අභියෝගයන් හිතකර ද නැතිනම්

අහිතකර ඒවා ද, එමඟින් ඇතිවන යහපත් සහ අයහපත් ප්‍රතිඵල මොනවාද යන්න පිළිබඳව යි. ඒ අතරින් ඇතැම් කරුණු එම පද්ධතියේ පැවැත්ම තහවුරු කරන ඒවා වන නමුත් කෙටි කාලීනව යහපත් වුවත් පාරිසරික වශයෙන් දිගුකාලීන අයහපත් තත්ත්වයන් උදා කර දෙන අභියෝගයන් ද ඇතිබව මෙහිදී සාකච්ඡා විය. ශ්‍රී ලංකාවේ ඇති මෙම තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිය ලෝකයේ වෙනත් කිසිදු තැනක දක්නට නොමැති ලංකාවටම පමණක්ම ආවේණික ආවේණික වූ අතීතයෙන් ලද දායාදයක් බඳු වේ. එය අනාගතයටත් පවත්වා ගෙන යායුතු වේ නම්, එහි පැවැත්ම වර්තමානයේදීම සනාථ කරගතයුතු වේ. එසේ කිරීමට නම්, සමාජයේ වෙසෙන සෑම පුරවැසියෙක්ම මේ සඳහා මැනවින් දායක කර ගත යුතුය. සම්ප්‍රදායික තාක්ෂණය භාවිතයෙන් අතීතයේ ගොඩ නැගූ මෙම පද්ධතිය ඉදිරියටත් එළෙසින් පවත්වාගෙන යෑමේදී නවීන තාක්ෂණය මනා අවබෝධයකින් යුතුව භාවිත කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එවිට ලෝක උරුමයක් වන තිරස් ජාලගත වැව් පද්ධතිය අනාගතයටත් දායාද කළ හැකි වන බව මාගේ නිගමනය යි.

**පරිශීලන.**


විතානාච්චි, සී. ආර්., (2012) ***පුරාණ වාරි මාර්ග විකාශය හා පරාක්‍රම සමුද්‍රය ශ්‍රී ලාංකේය ඉතිහාසය***, වෙළුම සසල කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 355-380 පිටු.

Bandara, CMM 2007, 'Village Tank Cascade Systems of Sri Lanka', , p. 9.

Dharmasena, PB 2020,'Cascaded Tank-Village System: Present Status and Prospects', in, pp.63–75.

*Ecological restoration of Kapiriggama cascade system* 2016, *IUCN*. Available from: https://www.iucn.org/asia/countries/sri-lanka/past-projects/ecological-restoration-kapiriggama-cascade-system. [15 January 2022].

Geekiyanage, N & Pushpakumara, DKNG 2013, 'Ecology of ancient Tank Cascade Systems in island Sri Lanka', *Journal of Marine and Island Cultures*, vol. 2, no. 2, pp. 93–101.

'Restoring Traditional Cascading Tank Systems IUCN Cascade Development Project Information Brief No. 1 For enhanced rural livelihoods and environmental services in Sri Lanka. pdf' n.d. Available from: https://www.iucn.org/sites/dev/files/content/documents/introductory_brief_1_dec_29_2015.pdf. [15 January 2022].

Wijeratne, V 2013, 'Traditional Sri Lankan Water Management and Bio-Diversity'.

# 13. මල්වතු ඔය නිම්නයේ පුරාණ ජල කළමනාකරණය

ඩී. එම්. වී. දිසානායක

## හැඳින්වීම

*"අහසින් වැටෙන එකදු දිය බිඳක් පවා මනුෂ්‍ය ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා නොයා යුතුයි."*

ජලය මිනිසා මෙන්ම මිහිපිට වාසය කරන සියලුම ජීවීන්ගේ පැවැත්ම කෙරෙහි බැඳී පවතින මහඟු සම්පතකි. අතිශය වටිනාකමකින් යුත් ජලය කළමනාකරණය කර ආරක්ෂා කිරීම ශ්‍රී ලංකාවේ ආරම්භ වන්නේ අතීතයේ සිටය. එනම් වාරි කර්මාන්ත බිහි වීමත් සමඟය. ජලයේ පවතින සමාජ, දේශපාලනික හා ආර්ථික අගය පිළිබඳ මැනවින් වටහා ගත් මහා පරාක්‍රමබාහු රජු ජලය නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමේ වැදගත්කම ඉහත පාඨයෙන් පෙන්වා දී ඇත.

*කොළොම්හොය* හෙවත් කදම්භ නදිය ලෙස ව්‍යවහාර වන මල්වතු ඔය වැව් විශාල ප්‍රමාණයකට ජලය සපයන වැදගත්ම ජල සම්පාදකයා ලෙස වැදගත්කමක් උසුලයි. මෙම අධ්‍යයනයෙන් සිදු කෙරෙනුයේ මල්වතු ඔය නිම්නයේ පුරාණ ජල කළමනාකරණය පිළිබඳ විමර්ශනාත්මක විග්‍රහයක් සිදු කිරීමයි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික මූලාශ්‍රය ආශ්‍රයකොට ගනිමින් රචනා කරන ලද සාහිත්‍ය මූලාශ්‍රය මෙන්ම අන්තර්ජාලය ඇසුරෙන් ලබා ගන්නා ලද ඡායාරූප හා සිතියම්ද උපයෝගී කොට ගැනිණි. මෙම අධ්‍යයනයේදී පරමාර්ථ කිහිපයක් සාධනය කර ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. එනම් මල්වතු ඔයෙන් පෝෂණය වන්නා වූ උප ජලාශයන්, වැව් හා අමුණු පිළිබඳව අනාවරණය කර ගැනීම ප්‍රධාන වේ. එසේම මල්වතු ඔය නිම්නයේ ජල කළමනාකරණය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම මඟින් අනුරපුර ජීවනාලිය සුපෝෂණය කිරීමට එය කෙතරම් දායකත්වයක් සැපයූයේ ද යන්නත් අධ්‍යයනය කෙරේ.

## විමර්ශනය

මල්වතු ඔය ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ වැදගත් සන්ධිස්ථානයකි. මෙහි ඉහළ කොටස මල්වතු ඔය ලෙස සැලකෙන අතර පහළ කොටස අරුවි ආරු ලෙස හැඳින්වේ. පැරණි බ්‍රිතාන්‍ය ලේඛකයන්ගේ සටහන්වල මෙම ගංගාව හඳුන්වා ඇත්තේ *"අරිප්පු ගඟ"* යනුවෙනි. එසේම ඇතැමුන් *"මුසලි ආරු"* යනුවෙනුත් හඳුන්වා ඇත. ගම්භීර නදී යනුවෙන් හඳුන්වන කන්දර ඔයත් අනුරාධපුරයට තරමක් නුදුරින් මල්වතු ඔයට එක් වී පෝෂණය වේ.

මල්වතු ඔය ආරම්භ වන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාවට නුදුරින් පිහිටි රිටිගල කඳු වැටියේ බටහිර බෑවුම්වලිනි. මල්වතු ඔය කිලෝමීටර් 164ක දිගකින් යුක්ත වන අතර වර්ග කිලෝමීටර් 3246ක ජල පෝෂක ප්‍රදේශයක් ආවරණය කෙරේ. ඊසාන දිග මෝසම් වර්ෂාවෙන් පෝෂණය වන මල්වතු ඔය නාච්චදූව, අනුරාධපුරය, තන්තිරිමලේ හරහා මුහුදට ගලා බසින ජල ප්‍රමාණය වසරකට ඝන මීටර මිලියන 560කි.

අනුරාධපුරයේ පූර්ව ඓතිහාසික සංස්කෘතියේ මුල් බැසගැනීම ක්‍රි. පූ. 1000න් පසුව සිදු වූ බව හඳුනා ගත හැකිය. යකඩ තාක්ෂණය භාවිතා කළ මිනිසුන් ප්‍රථම වරට අනුරාධපුරයේ ජනාවාස පිහිටුවා ගනු ලැබුවේ ප්‍රාග් ඓතිහාසික මානවයන් විසින් ජනාවාස පිහිටුවා ගනු ලැබූ මල්වතු ඔය නිම්නයේය. වංසකතා විස්තරයට අනුව ලංකාව ජනාවාස වීම එනම් ක්‍රි. පූ. 6වන සියවසේ සිට මෙරට පිහිටුවාගත් ජනාවාස සෑම එකක්ම පාහේ ගංගා නිම්න අසබඩ පිහිටුවාගෙන තිබේ. අනුරාධපුර රාජධානිය මෙරට දීර්ඝ කාලයක් රාජධානියක් වශයෙන් පැවතීමට ප්‍රධානතම හේතුව වී ඇත්තේ ද මල්වතු ඔයයි.

මල්වතු ඔය නිම්නයේ ඓතිහාසික වැදගත්කම විමසීමේදී අවුරුදු 1500ක පමණ කාලයක් රජවරු 127ක් පමණ තම රාජධානිය මෙහි පිහිටුවා ඇත. මෙහි ස්මාරක ස්ථාන 4000 5000ක් පමණ ව්‍යාප්තව තිබේ. මල්වතු ඔය හරහා යම් ප්‍රමාණයක ආරක්ෂාවක් ද අනුරාධපුර රාජධානියට ලැබී ඇත. පණ්ඩුකාභය රජුට පෙර එනම් කි. පූ. 900 වන විට කැණීමෙන් හමු වූ අශ්ව දත්, වී පොතු, යකඩ කැබලි යනාදි සාධක සාක්ෂි දරයි. අනුරාධපුර සල්ගහවත්ත කැණීමෙන් ප්‍රාථමික නිවස්නයකට අයත් කණු වළවල් හමු වී ඇත. මෙම සාධක විජයාවතරණයට පෙර අයත් වේ. ඒ අනුව මෙම ජනාවාසවල සංවර්ධිත ප්‍රතිඵලය අනුරාධපුර නගරය ලෙස සැලකිය හැකිය. මෙම කණුවළවල් මල්වතු ඔයට ආසන්න අතර නූතන පොළව මට්ටමට වඩා අඩි 23ක් ගැඹුරින් හමු වී ඇත. විජයාවතරණය නිසා මෙරට ජනාවාස වූ අතර ඒ පැමිණි පිරිස් ද කෘෂිකර්මාන්තයට නැඹුරු වූවන් වූ නිසා එම අංශය වඩාත් සංවර්ධනය විය. අනුරාධපුර අවධියේදී මෙම කලාපය තුළ විශාල කෘෂි ආර්ථිකයක් නිර්මාණය වූ බව ශිලාලේඛන ඇතුළු පුරාවිද්‍යා මූලාශ්‍ර මගින් සනාථ වේ.

පූර්ව ඓතිහාසික අවධියේ අනුරාධපුරයේ ජීවත් වූ ජන කණ්ඩායම් මල්වතු ඔය නිම්නයේ ජනාවාස පිහිටුවා ගැනීමෙන් අනතුරුව ජල පරිභෝජනය හා වී ගොවිතැන සඳහා අවශ්‍ය ජලය රඳවා ගැනීමට තාවකාලික වැටි, වේලි ඉදිකර අවශ්‍යතා සපුරා ගැනීම සිදු කර ඇත. අනුරාධපුර රාජධානිය තුළ ජලය ගබඩා කිරීම සඳහා වැවක් ඉදි කළ බව සඳහන් වන්නේ ක්‍රි. පූ. 5වන සියවසේදීය. එනම් විජය රජු සමඟ පැමිණි අනුරාධ නම් ඇමති විසින් ඉදි කළ වැවයි. අනුරාධපුර වැව් ඉදි කිරීම පිළිබඳව මීන් පසු සඳහන් වන්නේ පණ්ඩුකාභය රාජ සමයේය. ක්‍රි. ව. පළමවැනි සියවසින් පසු වඩා සංවිධානාත්මක වූ වාරි කටයුතු හා ජල කළමනාකරණ ක්‍රමවේදයක් ආරම්භ වේ. මුල් ඓතිහාසික සමය වන විට අනුරාධපුර නාගරික අවශ්‍යතා සඳහා සේන හා ගුත්තික යන වෙළඳුන් දෙදෙනා මල්වතු ඔය හරස් කොට නගරය දෙසට ජලය ගෙන ආ බව මහාවංසයේ සඳහන් වේ.

වැව යනු ජලය රැස් කර තබා ගනිමින් අවශ්‍ය අවස්ථාවක කෘෂිකර්මාන්තය ප්‍රමුඛ විවිධ අවශ්‍යතාවයන් සඳහා එම ජලය යලි නිකුත් කළ හැකි වූ මානව නිර්මාණයකි. කෘෂිකර්මාන්තය වඩාත් සංවිධානාත්මක ලෙස කිරීමට අවශ්‍ය ජලය ලබා ගැනීම වැවක් නිර්මාණය කිරීමේ මූලික පරමාර්ථය විය. මෙහිදී ප්‍රධාන වන්නේ වී ගොවිතැනයි. වියළි කලාපීය කෘෂි කර්මාන්තයේ පදනම ලෙස වැව සැලකීමට පුළුවන. වර්තමානයට වඩා පුරාණයේදී වියළි කලාපීය ජනාවාසකරණය වැව් ආශ්‍රිතව බහුල වශයෙන් සිදු වී ඇත.

ගඟක් හා ඔයක් සමාන අර්ථයෙන් නිරූපිත යයි පෙනී ගියද විමසා බැලීමේදී මෙහි අර්ථය ද්විත්වයක් බව විද්‍යමාන වේ. 1. ගඟ-විශාල ජල ධාරිතාවයක් රැඳීම හා වසර පුරා ක්‍රියාත්මක වීම 2. ඔය- වර්ෂා කාලයේදී පමණක් සක්‍රීය වීම මල්වතු ඔය දෙපසද සාරවත් භූමියක් වීමට ඛාදනය, පරිවහනය හා නිධි සාධනය යන සාධක ඉවහල් ඇත. මල්වතු ඔයෙන් පෝෂණය වන උප ඔයවල් කිහිපයක් දකුණු හා වම් ඉවුරුවලින් පැන නැගී මල්වතු ඔය හා බද්ධ වේ. එනම්, මාමිණියාව, කනදරා ඔය හා කල්ආරු ඔය වශයෙනි.

අනුරාධපුර නගරයට බටහිරින් බුලන්කුලම, බසවක්කුලම හා තිසා වැව පිහිටන අතර මල්වතු ඔයට නැගෙනහිරින් නුවර වැවද පිහිටයි අනුරාධපුරයේ නුවර වැවට ජලය බෙදා හරිනු ලබන්නේ නාච්චදූවෙන් එන ඇළ මාර්ගයකිනි. නුවර වැව ලෙස ව්‍යවහාර වුවද එය පිහිටා ඇත්තේ මල්වතු ඔය දකුණු ඉවුරේ ගැඹුරු නොමැති සමතලා ස්ථානයකය. මෙම වැවද සෙසු වැව් මෙන් කෘෂි ක්ෂේත්‍ර කරා ජලය ගෙන යාමටත්, ඊට යාබද වූ වෙහෙර විහාරාදීන්ට හා ග්‍රාමීය ජල සැපයුමටත් දායකත්වයක් සැපයේ.

ක්‍රි. ව. හත්වන සියවස වන විට ඇළ මාර්ග මඟින් අන්තර් නිම්න සබඳතාව ඇති කිරීමට හැකි වීම හේතුවෙන් දිවයිනේ බොහෝ වාරි නිර්මාණවල කාර්යක්ෂමතාවය මේ වන විට ඉහළ මට්ටමක පැවති බව තහවුරු වේ. විශේෂයෙන්ම ගංගාව, අමුණ ,ඇළ මාර්ගය හා වැව අතර පැවති සබඳතාවය මෙම කාලයේදී වඩාත් හොඳින් පෙන්නුම් කළ බව සිතිය හැකිය. අනුරාධපුර යුගයේ මධ්‍ය අවධිය වන විට ඉදිකරන ලදැයි උපකල්පනය කළ හැකි වැව් ගණනාවක් අතරින් මල්වතු ඔය හරස් කර ඉදිකරන ලද ඊරු වැව උදාහරණයක් ලෙස දැක්විය හැකිය. මෙකල හඳුනාගත හැකි සුවිශේෂත්වය වන්නේ වාරි කර්මාන්තය අන්තර් නිම්න සමඟ එකිනෙක බැඳුණු වාරි කර්මාන්ත පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වීමයි. එය දේශීය වාරි කර්මාන්තයේ විශේෂ සන්ධිස්ථානයකි. මේ හේතුවෙන් ජල භාවිතය අඩු නිම්නයක් කරා ගෙනගොස් එම නිම්නයේ අතිරේක ජල අවශ්‍යතාවය සැපිරීමට කටයුතු කිරීමට හැකිව ඇත. මේ සඳහා ප්‍රධාන වාරි තාක්ෂණික නිර්මාණය ලෙස භාවිතා කොට ඇත්තේ මහා පරිමාණ අමුණු බව පැහැදිලිය. අමුණු නිර්මාණයේදී ගංගාවේ ස්වභාවික වක්‍රාකාර නැමි ස්වභාවය හා මඳ බෑස්ම උපයෝගී කර ගැනීමෙන් අමුණෙන් එකතු වන ජලය රඳවා ගැනීම හා අදාළ ඇළ මාර්ගයට යොමු කිරීමට පහසුවක් ඇති වේ. විශේෂයෙන් දිය පහරේ වක් වූ ස්වභාවය හේතු කොට වේගයෙන් ගලා යන ජලයේ වේගය අඩු වී සෙමින් ගලා බසී. එවිට ජල පාලනයට අවශ්‍ය පසුබිම ස්වභාවිකව නිර්මාණය වී අමුණු බැම්මට ජල පහරේ වේගය ඇති වන පීඩනයට ඔරොත්තු දීමේ හැකියාවක්ද ඇති වේ. තේක්කම් අමුණ නිර්මාණයේදී ද මල්වතු ඔයෙහි ඇති නැම්මක ස්වභාවය ප්‍රයෝජනයට ගෙන නොමැති තරම්ය. නමුත් මඳ බෑස්ම කදිමට උපයෝගී කර ඇත. අනුරාධපුර මුල් යුගයේ රජ බවට පැමිණි සේන හා ගුත්තික යන අශ්ව වෙළඳුන් දෙදෙනා අවුරුදු 22ක් රාජ්‍ය විචාල බව සඳහන් කෙරෙන අතර අනුරාධපුරයට දකුණින් අමුණක් බැඳ මල්වතු ඔය හරවා ඇතුල් නගරයේ ජල අවශ්‍යතා සඳහා ජලය කළමනාකරණය කළ බව මහාවංසයේ සඳහන් වේ. වර්තමානයේ දැඩිව විනාශ වී ඇති මේ අමුණ මඟින් ජලය ලබා ගෙන ඇත්තේ හාල්පානු ඇළ මඟිනි. එසේම හාල්පානු ඇළ ජල මාර්ගයක් ලෙස ඉදි කිරීමෙන් අනතුරුව මල්වතු ඔය හරහා ගලා එන ජලය පමණක් නොව ඒ ආශ්‍රිතව තිබූ භූමිවලට අධික වර්ෂාවෙන් අතිරික්ත ජලය එයට එකතු වීමට සලස්වා ඇති බව පැහැදිලි වේ. එය පැහැදිලි වන්නේ රුවන්වැලිසෑයට නැගෙනහිරින් ඉදි කර ඇති භික්ෂු විශ්ව විද්‍යාලයේ උතුරු ප්‍රාකාරය ආසන්නයේ දක්නට ලැබෙනු ඇතැයි පැවසෙන පැරණි මහාවිහාර ප්‍රාකාරය යටින් වන ජල මාතිකාව අනුවය. වර්ෂා සමයේදී මේ ජල මාතිකාව නම් ව්‍යූහ සැකැස්ම හරහා පැමිණෙන ජලය හාල්පානු ඇළට එකතු වේ. මේ අනුව මේ ඇළෙහි උපයෝගීතාවය පුරාණ ජල කළමනාකරණයේදී අතිශයින්ම වැදගත් වී ඇති බව පෙනේ. හාල්පානු ඇළ සකස් කර ඉදිකර ඇති අමුණට අමතරව අනුරාධපුර නගරයේ උතුරු දෙසින් තවත් අමුණක් මල්වතු ඔය හරස් කර ගල්කඩවලදී ඉදි කර ඇත. 30පඥ 30ප පමණ, මේ වන විට ඉතිරිව පවතින මේ අමුණ ඉදි කිරීමේ කාලය පැහැදිලි නැත. එහෙත් මුල් අමුණු ඉදි වූ කාලයට සමකාලීනව හෝ මඳ කලකට පසුව හෝ මෙය සංවර්ධනය වී ඇත්තේ ජල කළමනාකරණය සඳහා බව මැනවින් පැහැදිලි වේ. දෙවන උයද රජුගේ කාලයේ දී මල්වතු ඔය හරහා බඳින ලද අමුණකින් නටඹුන්ව පවතින පැරණිම විශාල වැව වූ පාණ්ඩිකුලම වැවට ජලය ලබා දීමට කටයුතු කර ඇත.

තන්තිරිමලය දෙසට ගලා හැලෙන මල්වතු ඔයට මිහින්තලය ආසන්නයේ ඇති මහකනදරා වැවෙන් හා මැදවච්චිය ආසන්නයේ පිහිටි සංගිලිකනදරා වැවෙන් එන ජලය මහගල්කඩවලදී එකතු වී කනදරා ඔය ලෙසින් සැලකිය යුතු ජල දහරාවක් එකතු වේ. මීට අමතරව තන්තිරිමලයේ සිට ගලා යන මල්වතු ඔයට ප්‍රධාන ජල මාර්ග 5කින් පමණ ජලය එකතු වේ. ඒ අතර කල්ආරු ඔය ප්‍රධානය. මින් අනතුරුව කඩිසරව ගමන් ගන්නා මල්වතු ඔය තෙක්කම නමැති ස්ථානයේදී අමුණක් බැඳ මන්නාරමේ පිහිටි යෝධ වැවට ජලය ලබා දේ.

1859 දී සර් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරතුමා මෙම අමුණ වෙත පිවිස එම නිර්මාණයේ අපූර්වත්වය මෙසේ සඳහන් කර ඇත. *''තෙක්කම'' අරුම කර්මාන්තයක්ය. බැම්මේ යට කැබැල්ල බැඳ තිබෙන විශාල ගල් යෝධයන් විසින් කපා මෙම ස්ථානයට ගෙනෙන ලද්දේ යයි කියන පරම්පරානුගත කථාව ඉසිලීමට එය වටින්නේය. ඒ මුලදී බඳිනකොට තිබුනාක් මෙන් ම දැනුත් මේ මො හොතේ දී පවා කිසිවැරැද්දක් නැතුව තිබේ. කාලයට හා ජලයටත් ඒවා කෙරෙහි බල පවත්වන්නට නුපුළුවන් විය. අනික් අතට ජලය ගලා යාමෙන් තේක්කමට සහ ගංවතුරටත් අතර ක්‍රමයෙන් වැල්ල ගසා බැස්ම ඇති දිග ඉවුරක් සෑදීමෙන් ගල් බැම්ම තද වී මතු දීර්ඝ කාලයක් පවතින අන්දමට සවිව ඇත.* මෙතුමාගේ මේ විග්‍රහය ඔහු තුළ තිබූ නිරීක්ෂණ ශක්තිය මොනවට කියාපානු ඇත. අමුණ පිළිබඳ නිසිලෙස සොයා බැලීමට මෙතුමාගේ කාලවකවානුවේ උත්සාහ දැරීම අමුණ තුළ දක්නට ලැබුණු ඉපැරණි තාක්ෂණික ඥානය හඳුනාගැනීමේ වැදගත්කම ඉස්මතු කෙරේ. මෙම අමුණින් කිලෝමීටර් 3ක් පමණ පහළට ගිය විට කුංචිකුලම හමුවේ. එහිදී තවත් නවතම අමුණක් හමුවේ. එය ද ගම්වාසීන් තෙක්කම යන්න හඳුන්වයි. මෙය ඉංග්‍රීසි ආණ්ඩුවේ ඉදිකිරීමක් වේ. මෙය ඉදිකර ඇත්තේ යෝධ ඇළ හරහා ය. තේක්කම් ප්‍රධාන අමුණ ආසන්නයේ තිබෙද්දී මෙවන් ස්ථානයක ඇළ හරහා අමුණක් ඉදිකරන ලද්දේ මන්දැයි විමසිය යුත්තකි. යෝධ ඇළෙන් නිකුත් වන ජල දහරාවේ අධිකබව නිසාවෙන් යෝධ ඇළේ ගමන් මග මෙම ස්ථානයේදී කැඩී නැවත එහි ජලය මල්වතු ඔයට එකතු වී ඇත. මේ නිසා ජලය නිසි ලෙස යෝධ වැව වෙත ගමන් නොකරන්නට ඇත. එම ගමන්මග නැවත යථා තත්ත්වයට පත් කිරීමට මෙම ස්ථානයේදී අමුණක් ඉදිකර ඇත. කෙසේ වුවත් මෙම අමුණු මඟින් පෝෂණය කරනු ලබන්නේ සහල් නැලිය ලෙස අප හඳුනාගෙන ඇති මෙරට කෘෂිකර්මාන්තය උදෙසා විශාල දායකත්වයක් සපයන භූමි භාගයට ජලය සපයන යෝධ වැව වේ.

මල්වතු ඔය අවසානයට යෝධ වැව පිහිටා ඇත. යෝධ වැවෙන් පසු වැව් දැකගත නොහැකිය. ධාතුසේන රජු ඉදි කළ යෝධ වැව තත්කාලීන අවදිය වන විට මැදිහත් වන මාන්තායි ජනප්‍රිය වරායක් වීමත් පැමිණෙන විදේශිකයින්ට අවශ්‍ය කරන ජලය ලබා ගැනීමේ ක්‍රියාමාර්ගයක් ලෙසත් වැදගත්කමක් ඉසිලීය. මන්නාරම අර්ධ ශුෂ්ක වියළි කලාපයේ පිහිටි ලොකුම සරණ බවට යෝධ වැව පත්ව ඇත. තෙක්කම් අමුණේ සිට තවත් කිලෝමීටර 35ක් පමණ විල්පත්තුව උතුරු සීමාව හරහා ගලා යන මල්වතු ඔය මන්නාරම සිලාවතුරෙ උතුරු ප්‍රදේශයේදී ඉන්දියන් සාගරය සමඟ බද්ධ වේ. දෙවන උයද රජුගේ කාලයේ දී මල්වතු ඔය හරහා බඳින ලද අමුණකින් නටඹුන්ව පවතින පැරණිම විශාල වැව වූ පාණ්ඩිකුලම වැවට ජලය ලබා දීමට කටයුතු කර ඇත.

පහළට ගලා යන මල්වතු ඔය හරස් වී ඉදි වී තිබෙන තෙක්කම් අමුණ නිසා එම ස්ථානයේදී මල්වතු ඔයේ ජලය ප්‍රධාන ගංගාවෙන් කොටස් තුනකට බෙදීම සිදු වේ. එනම් මල්වතු ඔය, මන්නාරම යෝධ වැව දක්වා ජලය ගෙන යන ඇළ මාර්ගය හා පහළ මල්වතු ඔය ජලාශය දක්වා ජලය ගෙන යන ඇළ මාර්ගය යනුවෙනි. මල්වතු ඔයේ වැඩි ජල කොටස

මල්වතු ඔය දිගේ පහළට ගමන් කරයි. මල්වතු ඔයේ තෙක්කම් අමුණෙන් වෙන් වන දකුණු ඇළ මාර්ගය ගමන් කරනුයේ මඩු ප්‍රදේශය හරහා කිලෝමීටර් 28ක් පමණ මන්නාරම සහල් නැළියේ පිහිටි යෝධ වැව වෙතටයි. වර්තමානය වන විට මල්වතු ඔය හරස් කොට තන්තිරිමලේ ජලාශය ඉදි කොට ඇත. නමුත් මල්වතු ඔයෙන් ජලය පරිභෝජනයට නොගෙන වාර්ෂිකව ජලය ඝන මීටර් මිලියන 200ක් මන්නාරමෙන් මුහුදට මුදා හැරේ. ප්‍රයෝජනයක් ගැනීමට හැකි වුවත් උප ප්‍රධාන ගංගාව වන මල්වතු ඔයෙන් ප්‍රයෝජනයට ගත හැක්කේ ඉතාමත් අඩුවෙනි. නාච්චදූව වැව හා අනුරාධපුර හාල්පානු ඔය මඟින් මල්වතු ඔයේ දියවර යම්තාක් දුරට ප්‍රයෝජනයක් වුවද එතැන් සිට ගලන මල්වතු එයේ ජලය කෙලින්ම ගලා යන්නේ මන්නාරම මුහුද දක්වාය. මන්නාරමේදී යෝධ වැව නිර්මාණය කොට මන්නාරම සහල් නැළිය සඳහා දියවර ගනු ලැබවද තවත් විශාල ජල කොටසක් තවමත් ප්‍රයෝජනයට නොගෙන මහ මුහුද වෙත ගලා යන්නේ නිරපරාදේ ය.

**නිගමනය**

ඉහත කරුණු වලට අනුව නිගමනය කළ හැක්කේ මල්වතු ඔය නිම්නයේ චිරස්ථිතිය අත්පත් කර ගැනීමේ මූලෝපායයන් ලෙස නිසි ජල කළමනාකරණය තුළින් ජනතාවට ප්‍රතිලාභ අත් වී ඇති බවයි. එසේම වාරි කර්මාන්තය හා කෘෂි කර්මාන්තය අතර ඇත්තේ දෘඩ බැඳීමක් බවද පැහැදිලිය. කෘෂිකාර්මික අරමුණු මුදුන්පත් කරලීම උදෙසා ජලය සමග කළ හරඹයේදී ලත් අත්දැකීම් පෙරටුකොට අමුණු යන තාක්ෂණික අංගය බිහි වී ඇත.

මල්වතු ඔය නිම්නයේ අභයගිරිය, ජේතවනය, මහාථූපය ඇතුළු මහා ස්තූප ගණනාවක්ම ඉදි වී ඇත. මල්වතු ඔයේ ජලයෙන් පෝෂණය වන ගොවිබිම් ප්‍රමාණයද ඉතා විශාලය. අතීතයේ මෙන්ම වර්තමානයේද අපේ දේශීය ආර්ථිකයට ඍජු හා වක්‍ර දායකත්වයක් මල්වතු ඔය විසින් ලබා දී තිබේ. අනරාධපුර රාජධානියේ ස්ථාවරයට සුවිශේෂී වටිනාකම ලබා දුන් මල්වතු ඔය මෙරට ආගමික, සාමාජීය හා ආර්ථිකය වෙනස් වීම කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කර තිබේ.

මෙරට මුල්කාලීන ජනතාව තම ගොවිතැන හා වගා කටයුතුවල දිගුකල් පැවැත්ම හේතු කොට ගෙන ජලය කළමනාකරණ ක්‍රියාවලිය කෙරෙහි මහත් සේ වෙහෙස වන්නට වූහ. ඒ අත්දැකීම් සම්භාරය පෙරටු කොට පසු කාලයේදී මහ මුහුද පරයන විශාල වැව් අමුණු ඉදි කිරීමට මෙරට වාසය ජනතාව නිතර උත්සාහ කළහ. මේ අනුව මල්වතු ඔය නිම්නයේ පුරාණ ජල කළමනාකරණය කෙසේ නම් ජන ජීවිත කෙරෙහි බලපෑම් කර ඇතිද යන්න මනාව පැහැදිලි වේ. ඒ අනුව පුරාතන ශ්‍රී ලාංකේය සමාජය තුළ හඳුනා ගත හැක්කේ වාරි මූලික ශිෂ්ටාචාරයක් ගොඩනැගීම සඳහා මල්වතු ඔය නිම්නය හේතු සාධක වී ඇති බවද නිගමනය කළ හැකිය.

**පරිශීලන**


කුසුම්සිරි, වී., (2021), **මල්වතු ඔයේ සැඟවුණු අමුණු,**ගඟ දිගේ, (2019), ***ගඟ දිගේ 66 වන කොටස, (මාර්ගගත),*** https://m.facebook.com/niroshan198

චිත්‍රානන්ද, සී., එච්., (2001), ***පැරණි රජරට වාරි තාක්ෂණ ඥානය,*** සරසවි ප්‍රින්ටර්ස්, කැළණිය.

බ්‍රෝහියර්, ආර්. එල්. (2001), ***ලක්දිව පුරාතන වාරිමාර්ග,*** පරි.එල්., පියසේන, මහවැලි කේන්ද්‍රය කොළඹ 07.

***මහාවංසය (ප්‍රථම භාගය),*** (1996), ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, ඇස්. ගොඩගේ සහ කොළඹ

විතානච්චි සී., එච්., (2011), ***පැරණි ශ්‍රී ලංකාවේ වාරි මාර්ග සංවර්ධනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්,*** Journal of Social Sciences and Humanities 2" 184-202.

**(මාර්ගගත),** https://roar.media/sinhala/main/history/matwathu-oya.

# 14. මූලාශ්‍රයන් මගින් හෙළිවන පුරාණ වාරි කර්මාන්තය හා බැඳුණු බෞද්ධාගමික සංස්කෘතිය

ජී. පී. කේ. දිල්රංග

## හැඳින්වීම

පෞඩ ඉතිහාසයකට නෑකම් කියන්නා වූ දේශීය වාරි සංස්කෘතිය මෙරට අභිමානවත් ශිෂ්ටාචාරයේ සුවිශේෂී වූ අනන්‍යතාවක් උසුලයි. ඒ පිළිබඳව වංසකථා හා අභිලේඛන මූලාශ්‍රය සාක්ෂි දරණ අතර ලක්දිව ජන ජීවිතය හා අඛණ්ඩව පැවති බෞද්ධ සම්ප්‍රදාය ද පුරාණ වාරි කර්මාන්තය මැනවින් නිරූපණය කරයි. මහින්දාගමනය සමග අපට උරුම වූ වාරි සංස්කෘතිය මහත් අභිමානයක් ගෙන දෙයි. එය වැවයි දාගැබයි ගමයි පන්සලයි යන බෞද්ධ සංකල්පය මත ගොඩනැගුණකි. ක්‍රි. ව 3 වන සියවසෙන් පසු වාරි කර්මාන්තය හා බෞද්ධ සංස්කෘතිය පිළිබද සදහන් සෙල්ලිපි වල අඩංගු කරුණු පිළිබද අවබෝධයක් ලබාගැනීම මෙන්ම අතීතයේ සිට සාහිත්‍යය මූලාශ්‍රයන් වල එන පංසල හා වැව අතර පැවති සම්බන්ධතාවය පිළිබද හදුනාගැනීම මෙමගින් අපේක්ෂා කෙරේ. එමෙන්ම ලාංකේය භික්ෂූන්ගේ ආගමික පිවිතය තුළ වාරි සංස්කෘතිය හා බැඳුණු වත්පිළිවෙත් පිළිබද මෙහිදී අවධානය යොමු කරයි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී මූලික වශයෙන් යොදා ගනු ලැබුවේ සාහිත්‍ය මූලාශ්‍රයන් පරිශීලනය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අධ්‍යයනයයි. එමෙන්ම වාරි කර්මාන්තය පිළිබඳ සඳහන් අභිලේඛන විමර්ශණය කිරීම ද සිදු කරන ලදි.

## විමර්ශනය

ලාංකේය ජන සමාජයේ ජීවනාලිය බදු වූ වාරිකර්මාන්තය විධිමත්ව වර්ධනය වන්නේ ඉන්දීය ජන සංක්‍රමිකයන්ගේ පැමිණීමත් සමගය. පසුකාලීනව ඉහළ ගිය ජනගහනයත් සමඟ ජල ඉල්ලුම සපුරාලීම උදෙසා ජලය එක්රැස් කර තබාගැනීමට අවශ්‍ය වීමෙන් වැව් නිර්මාණයට පෙළඹුණි. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ට අනුව ලාංකේය වාරිකර්මාන්තයේ ආරම්භය පූර්ව ඓතිහාසික අවධියට ගමන් කළ ද ඓතිහාසික මූලාශ්‍රයන්ට අනුව වාරිකර්මාන්තය උදෙසා රාජකීය මැදිහත්වීම පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිට සිදු වී ඇතැයි වංසකථා සනාථ කරයි. භාරතීය ජන සංක්‍රමිකයන්ගේ පැමිණීමත්, බුදු දහමේ ආගමනයත් සමග පැමිණි ශිල්ප පරම්පරාවන් හේතුවෙන් මෙරට නොයෙකුත් තාක්ෂණික අංශ ලංකාවේ දියුණු විය. ඒ අතර එතෙක් මෙරට තිබුණු වාරි තාක්ෂණයට ඉන්දීය තාක්ෂණික ලක්ෂණ ද එක් විය. ඒ හේතුවෙන් ලක්දිව තුළ වඩාත් තිරසාර වාරි නිර්මාණ බිහි වූ අතර එය ක්‍රමාණුකූලව මෙරට විශාල වාරි නිර්මාණ දක්වා ගමන් කළ බව මූලාශ්‍රමය සාධක මගින් ගම්‍යමාන වේ. මෙරට වංසකථාවල මෙන්ම ශිලා ලිපි හා වෙනත් මූලාශ්‍රය වල සඳහන් පරිදි ලාංකේය සිරිත් විරිත් සාරධර්ම ගොඩනැගී ඇත්තේ බෞද්ධ සංඝ සමාජයේ මූලිකත්වය මත ය. එමෙන්ම ඒ හා සමගාමීව පුරාණ වාපි සංස්කෘතිය ද රාජ්‍ය මැදිහත් වීමකින් පෝෂණය වීමට බුදු දහම පිටුවහලක් විය. මිනිසාගේ උත්පත්තියේ සිට මරණය දක්වා ජලය මූලික වන අතර මෙරට දී එය භික්ෂූන් වහන්සේලාගේ අනුශාසනා පරිදි සිදු වීම වාරි සංස්කෘතිය හා බෞද්ධ වත්පිළිවෙත් අඛණ්ඩ පැවත්මට හේතු වී ඇත.

**සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් හෙළිවන කරුණු**

දේශිය සහ විදේශිය මූලාශ්‍රයන් පෙන්වා දෙන පරිදි අතීතයේ සිට වාරි නිර්මාණ බිහිවීමට බෞද්ධාගමික ප්‍රබෝධය ඉවහල් වු බව සදහන් කළ හැකිය. මෙරට භික්ෂුන් වහන්සේලාට අවශ්‍ය ජල පරිභොජනයට විශාල ජල පරිමාවක් අවශ්‍ය වූ බව අභයගිරි, ජේතවන විහාර පොකුණු තුළින් අවබෝධ වේ. ඒ බව ඇත්පොකුණට ජලය සැපයීමට පෙරියකුලම හා බුලන්කුලම වැව් පාදක වූ බව දැක්වීමෙන් මනාව තහවුරු වේ. පස්වන ශතවර්ෂයේ මෙරටට පැමිණි චීන සංචාරක භික්ෂුවක වූ පාහියන් හිමි ලංකාවට පැමිණි විට දී අනුරාධපුර අභයගිරි ආරාමයේ දී භික්ෂුන් පන්දහසක් ද මහා විහාරයේ තුන්දහසක් හා මිහින්තලය චෛතියගිරි විහාරයේ තවත් දෙදහසක භික්ෂුන් පිරිසක් ද වූහ. රජරට විහරණය වු මුලු භික්ෂු පිරිස අඩු වශයෙන් විසි පන්දහසක් වූ අතර දිනපතා උන්වහන්සේලාට සිවුපසයෙන් සංග්‍රහ කළ බව පාහියන් වාර්තා පෙන්වා දෙයි. ජේතවන ස්ථුපයට දකුණින් එහි ආරාමයට අයත් දාන ශාලාව විය. එහි සලාක ක්‍රමයට භික්ෂුන්ට දන් ලබා දුන් බත් ඔරු දැකගැනීමට හැකිය. එමෙන්ම භික්ෂුන්ගේ ජල පරිබෝජනයට අවශ්‍ය ජලය අවට වාරි නිර්මාණයන් හරහා ගැනීමෙන් විශාල භික්ෂු පිරිසකට එකල ජල අවශ්‍යතා එකවර සැපයිම තුල සාමාජීය වශයෙන් බෞද්ධාගමික මෙහෙවර මැනවින් කියාපායි.තවද ගොවිතැන් පිණිස ජලය ලබා දීම රටේ රජුගේ එක් වගකීමක් ලෙස ජනයා සැලකු අතර පුරවැසියාගේ අවශ්‍යතා සැපිරීම ධාර්මිෂ්ට පාලකයෙකුගේ සත්කාරයක් ලෙස සැලකිනි. රජුගේ ක්‍රියා කලාපය තුළ සමාජ ක්‍රමයේ ස්ථාවරය රදා සිටින බව අංගුත්තර නිකායේ සදහන් වීමෙන් ඒ බව පැහැදිලි වේ. එමෙන්ම චන්දමුඛශිව රජු මණිකාර ගම වැවක් කරවා ඉසුරුමුණි විහාරයට පිදූ බව මහාවංශය කියයි. අභය වාපි හෙවත් බසවක්කුළම වැවේ ජලය ආගමික කටයුතු සදහා සපුරාගෙන ඇති බව වංශකතා අනුව පැහැදිලි වේ. එනම් ථූපාරාමය ඉදිකිරීමට අභය වැවේ මැටි ලබාගත් බවත්, භාතිකාභය රජු රුවන්වැලි සෑය නැහැවීමට යන්ත්‍රාණුසාරයෙන් ජලය ලබාගත් බවත් මහාවංසයේ දැක්වේ. තවද තිසාවැවේ ජලය රාජාභිෂේක උත්සව සදහා යොදාගන්නට ඇතැයි ද වංසකථා පෙන්වාදෙයි. වංසකථා සාහිත්‍යයේ එන පරිදි ක්‍රි.ව තුන්වන සියවසේ උපතිස්ස රජුගේ පාලන කාලයේ ඇති වූ නියගයක් හා වසංගතයක් නිසා මහරජු විසින් මහා සංඝයාට ආරාධනා කොට දිවා රාත්‍රි දෙකෙහිම රතන සූත්‍රය සජ්ඣායනා කරවමින් පිරිත් පැන් ඉස්සවීය. පසුවදා උදෑසන මහත් වලාකුළක් අහසේ උද්ගතව වැසි දිය දහරින් ධරණිය තෙත් කළ බව දැක්වේ. මේ ආකාරයෙන් පුරාණයේ ජලය ආශ්‍රිත වාපි සංස්කෘතියත් බෞද්ධාගමික වත් පිළිවෙතුත් එකට බද්ධ වී තිබීම සාහිත්‍ය මූලාශ්‍රය මගින් පෙන්වා දිය හැක.

**අභිලේඛන මූලාශ්‍රය වලින් හෙළිවන කරුණු**

ගමේ වැවත් පන්සලත් අතර පැවතියේ ආගම පදනම් කර ඇති වු සමාජ සම්බන්ධතාවකි. ගමේ පන්සල ආරක්ෂා කරගනිමින් එහි වැසි භික්ෂුන්ගේ සිව්පසය නිරතුරුව සපයනු පිණිස ලබාදුන් ආදායම් මාර්ග අතර වැදගත් තැනක් ගත්තේ වාරිමාර්ග මගින් ලබාදුන් අයබදු ය. විහාරවලට කළ එවැනි දීමනා සදහන් ආදිතම බ්‍රාහ්මී සෙල්ලිපි කිහිපයක් හමුවේ. තෝනිගල ලිපිය ඉන් එකකි.

**"පරුමක අබය පුත පරුමක තිශහ වපි අබගිරික තිශ පවතෙහි අගත අනගත චතු දිශ ශගශ දිනෙ..."**
**"පරුමක අභයගේ පුත් පරුමක තිස්සගේ වැව අවජගිරික තිස්ස පබ්බත විහාරයේ වැසි සතර දිගින් පැමිණි නොපැමිණි භික්ෂු සංඝයාට පූජා කරන ලදී..."**

වාරි පහසුකම් ලැබීමේ අයිතිය බෞද්ධ ආරාමයන් සතු වූ වරප්‍රසාදයක් බව සිව්වන මහින්ද (956-972) රජුගේ පුවරු ලිපියෙහි සඳහන් වෙයි. තිසාවැවෙන් ඉසුරුමුණිය ආරාමයට ජලය සැපයීම පිළිබඳව අර්බුදයේ දී රජු ආරාමයට පහසුව සැලසෙන පරිදි කටයුතු කරන ලෙස නිළධාරින්ට උපදෙස් දුන්නේය. මෙම රාජකාරි විධිවිධානයට අනුව ආරාම සංකීර්ණයට ද රන්මසු උයනටද ප්‍රධානත්වය තිබී ඇත. එමෙන්ම එම රජුගේම මිහින්තලා පුවරු ලිපිය අනුව කණදරා වැවේ දිය බෙදුමේ ආදායම් මාර්ගය හිමිව තිබුනේ ද ඉසුරුමුණි විහාරයට ය. කොතලකිඹියාවෙන් සොයාගත් ලෙන් ලිපියක දැක්වෙන තොරතුරු අනුව දකබරි ගමේ ඇති වැවේ තමන් සන්තක කොටස දත්තා උපාසිකාව විසින් වස් වැසූ භික්ෂූන්ට අදත පිරිකර පිරිනැමීමට හා එසේ කොට ඉතිරි කොටස භික්ෂූන්ගේ පරිභොජනය පිණිස පූජා කරන ලද බව පැවසේ.

**"උති තෙරහ ලෙනෙ සව- නතිකන අටය නියතෙ, සහහඅටය වස වසික සහඨකෙ අතිරෙක භිකු සහ පරිභුජිතු, දකබරි ගමක වවිය උවසක- දතහ පති ඉම ලෙණෙහි උවනිතිතෙ"**

මෙම ලිපිය මෙන්ම හළඹගල ලිපියෙන්ද හෙළිවන්නේ වස් වැස සිටින භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස යෙදූ ආදායම පිළිබඳවය. එහිදි සඳහන් වන්නේ උත්තරා සතු වැවද තිස මහ තෙරුන්ගේ භූමියද වස්වැඩහුණු භික්ෂූන්ට පූජා කිරිම සම්බන්ධවයි.

**"උතරහ වවි තිස තෙරහ කුමිය නියතෙ වසවසිකෙ"**

ඇතැම් වැව් හිමියන් තමන්ව හඳුන්වාගෙන ඇත්තේ උපසක හෙවත් උපාසක නමිනි. පුනපිටක වැව අයිති වූයේ උපාසක විණුට ය. දකබරි වැව අයිති වූයේ උපාසක දත්තට ය. බෞද්ධාගමික සංස්කෘතියට අනුව භික්ෂු, භික්ෂුණි, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසෙන් උපාසක යන්න වැව් අයිතිකරු හැදින්වීමට යොදාගෙන ඇත. ඒ තුළ පුරාතනයේ පන්සිල් සුරැකි ප්‍රභූන් වාරි කටයුතු සඳහා මුල් වී කටයුතු කළ ආකාරය දැකිය හැක. වැව් භූමියේ තණ බිම් ද ආදායම් මාර්ගයක් සැපයූ ස්ථානයකි. ඉඩම් හිමිට එනම් බොජිකපතිට එවැනි තණතිල්ලකින් අයත් වූ ආදායම අවුකන විහාරයට පූජා කළ බව පවසන සෙල්ලිපියක් ද අවුකන ප්‍රදේශයෙන් සොයාගෙන ඇත. එමෙන්ම මහා සංඝයාට ඇළවල් ද පූජා කළ බව ශිලා ලේඛන සාක්ෂි දරයි. මෝලහිටිය වෙලේගල ලිපිය අනුව භාතිකාභය රජු ගලතටක ඇළ රන් කෙණ්ඩියකින් පැන් වත් කොට පිළිපවත විහාරයේ සංඝයාට පූජා කළ බව පෙනේ. මෙහිදී අත් පැන් වත්කිරීම හා ඉට රන් කෙණ්ඩියක් භාවිත කිරීම තුළ එම චාරිත්‍රයන් සමකාලීනව ඉතා උසස් අන්දමින් මෙරට පැවත ඇති බව සඳහන් කළ හැකිය. එය දක්වා ඇත්තේ **"අතර ගගහි ගලත තකහ අඩි පිලිපවත විහරහි බිකු සගය සොවන කොතුරු නියතෙ"** යනුවෙනි.

පාලුමැකිච්චාව ශිලා ලේඛනයට අනුව ගජබා රජු කහවණු 500ක් දී ගත් උපල පලාතේ මඩමනක වැව ථූපාරාමවාසි භික්ෂූන්ගේ සිව්පසය සඳහා පරිත්‍යාග කළ බව **"මහරජි ගමණි අබෙය උපල විබ ජකහි වඩමනක වවි පච සහ කහවණ දරිය කණවය තුබරබ බුක සහ හටය චතිරි පචෙණි පරි"** යනුවෙන් දැක්වේ. මෙහිදි සමකාලීනව ආරාම භික්ෂූන්ගේ සිව්පසය උදෙසා වැව් වලින් විශාල පිටුවහලක් ලැබී ඇතැයි සිතිය හැක. එහිදි භික්ෂුවකට පූජා කරන චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානපත්තිය යන දෑ සපුරාගැනීමට රටේ පාලකයා විසින් වැවක් පරිත්‍යාග කිරිම ආරාම කටයුතු පහසු කිරිමට දායක වී ඇත. එසේම මිහින්තලය කණ්ඨක චෛතිය අසල ඇති ලිපියක් අනුව මහාදාඨික මහානාග රජු කණ්ටක චෛතිය කබවික

හා බලයන ගමේ වැවේ ආදායම් මාර්ග දෙකක් වූ දිය බද්ද හා ආදායම් බද්ද පවරා දී ඇත. **"සිධ දෙවනපිය තිස මහරජ කටක චෙතහටය කබවිකහි දොපති නක මහ රජෙ දිනෙ බලයත ගමකමහි දෙකිණෙ ගනිය දිනෙ රතොවහි දිනෙ"**

අවුකනින් සොයාගත් තවත් පැරණි බ්‍රාහ්මී ලිපියකට අනුව දින්න නැමැත්තාට අයත් වැවක තණ භූමියේ ආදායමෙන් එක් ලෙනක වැඩ සිටි භික්ෂු සංඝයාට පූජා කර ඇති බව පෙනේ.

**"දිනහ වපිය තණ- බුමික බොඣික පති ඉම ලෙණහ නියතෙ"**

මෙමගින් සමකාලීනව වැව් අයිතිකරුවන් විසින් තම වැවේ ආදායමෙන් මහා සංඝයාට සිවුපසයෙන්ම අනුග්‍රහ කිරීමෙන් පෙනි යන්නේ අතීතයේ පටන්ම සමාජයේ බුදු දහමට තිබූ මහත් ගරුත්වයයි. එපමණක් නොව විහාරේගල ලිපියේ සඳහන් පරිදි **සභ රජු** පූජා කළ උපල දොණික වැව අලුත්වැඩියා කර එකද්වාර විහාරයේ භික්ෂූන්ට නැවත පූජා කිරීම තුළ භික්ෂූන්ගේ පරිහරණය උදෙසා මෙන්ම ආදායම ලැබීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇති බව කිව හැක. එමෙන්ම බෞද්ධ සංස්කෘතිය තුළ ආරාමයන්ගේ මූලික ආදායම වැව් තුළින් සලසාගත් බව අවබෝධ කරගත හැකිය.

**"සිධ සබ රජෙ එකදොරික විහරහි පොහ- තකර කරවය උපලදොණික වවි පවසතෙ කිණිය පවසතෙහිය පසු ඔවය බිකුස ගහටය දිනෙ."**

උක්ත සඳහන් ශිලා ලේඛනයන්ගෙන් අනාවරණිත පොදු කරුණ වන්නේ භික්ෂූන් උදෙසා වැව් පූජා කිරීමයි. එකල ඇතැම් වැව් රජුට අයත් ව පැවති අතර ඇතැම් වැව් සාමුහිකව හෝ පෞද්ගලිකව රටවැසියාට අයත්ව පැවතින. එම වැව් වලින් ජලය ලබාගන්නා ගොවීන් විසින් වැව් හිමියාට යම්කිසි බද්දක් ගෙවිය යුතු විය. දකපති යනුවෙන් සඳහන් වන්නේ එම දිය බද්දයි. එපමණක් නොව වැවේ හෝ වැව් ජලය බෙදාහරින මාතිකාදියෙහි මසුන් මරාගැනීම සඳහා ද වැව් හිමියාට බද්දක් ගෙවිය යුතු විය. මජිබක ලෙස සඳහන් වන්නේ එයයි. ඇතැම් විට මසුන් අල්ලාගැනීමට මාතිකා හිමියාට ද මාතිකා හිමියා විසින් වැව් හිමියාටද බදු ගෙවන ලදී. මෙසේ කුමන ක්‍රමයකින් හෝ වැවෙන් ලැබෙන ආදායම අභිමත විහාරයේ භික්ෂූන්ගේ සිව්පසය හා වෙනත් අවශ්‍යතා සඳහා ලැබෙන්නට සැලැස්වීම වැව් පූජා කිරීමෙන් සිදු කරයි. ගමත් වැවත් පන්සලත් අතර සබඳතාවය මැනවින් තහවුරු වන වැව් පරිත්‍යාග කිරීම සමකාලීන සමාජයේ උසස් මට්ටමේ පූජාවක් බව සිතිය හැක. එනම් සමාජයේ ජීවය බඳු වැව පුද්ගලයාගේ වැදගත්ම සම්පතක් වූ හෙයිනි.

වාරිමාර්ග ක්‍රම හා පන්සල අතර ඇති කළ සම්බන්ධතාවය මෙකළ කෙබඳු වී ද යන්න පැහැදිලි කිරීම සඳහා මෙසේ සෙල්ලිපි මගින් බොහෝ තොරතුරු සම්පාදනය කළ හැක. හයවන සියවසේ විසූ කුමාරදාස රජුගේ නාගිරිකන්ද ලිපියද මෙයට එක් කළ හැක. විවිධ වැව් වලින් අයවන දිය බදු කොටස හා ඉඩම් හිමියා සතු කොටස බමණගිර විහාරයේ භික්ෂු සංඝයාට දෙබදු කොටසේ අය කඩා සග සතු කර පූජා කරන ලද බව එයින් පැවසේ. වැව් පූජා කිරීමෙන් ද කුඹුරු පූජා කිරිමෙන් ද දිය බද්ද හා ඇළේ මත්ස්‍ය භාගය පූජා කිරිමෙන් ද ධාන්‍ය හා මුදල් තැන්පත් කිරීමෙන් උපයන පොලිය පූජා කිරිමෙන් ද ආදි වශයෙන් නොයෙක් අන්දමේ ක්‍රම වලින් විහාර නඩත්තුව පිණිස කටයුතු කර ඇති සැටි මෙම පුරාණ සෙල්ලිපි වලින් අනාවරණය වේ. එමෙන්ම බෞද්ධාගමික සංස්කෘතිය පෝෂණය වීමට වැව මූලික අංගයක් බව ඒ තුළින් අර්ථවත් වේ.

## පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් හෙළිවන කරුණු

සාහිත්‍ය මූලාශ්‍රය මගින් අනාවරණය වන කරුණු සනාත කරන්නේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගිනි. අතීත වාරිකර්මාන්තය හා බැඳී පවතින්නා වූ බෞද්ධ සංස්කෘතික පරිසරය ගැබ්ව පවතින්නේ අනුරාධපුර හා මිහින්තලය පැරණි විහාරාරාම අනුසාරයෙනි. මහා විහාරය, ජේතවනාරාමය, අභයගිරිය, රන්මසු උයන ආදි ප්‍රධාන භික්ෂු මධ්‍යස්ථාන වල ඇති පුරාවිද්‍යා නටබුන් කියාපාන්නේ අතීත හෙළ වාපි සංස්කෘතියයි. පැරණි දානශාලා, පොකුණු, ආරෝග්‍යශාලා, ජන්තාඝර, වැසිකිලි කැසිකිළි, දිය අගල්, ජලය බැසයාමට සැදූ කාණු ආදිය අපට පෙන්වා දෙන්නේ කිසිදු රටකට නොදෙවෙනි වාරි තාක්ෂණයේ මහිමයයි. බුදු දහමෙන් පෝෂණය වූ වාපි සංස්කෘතිය කියාපාන අනර්ඝතම නිර්මාණයක් වන්නේ විහාරාරාම ආශ්‍රිත ඉදිකළ පොකුණුය. භෞතික සාධක මත මිහින්තලයේ භික්ෂූන් දෙදහසක් පමණ පිරිසකට ජල අවශ්‍යතා සැපිරීමට එකළ සමත්ව ඇති බව පුරාවිද්‍යාත්මක නටබුන් සනාථ කරයි. භික්ෂු පරිහරණයට ඇත් වෙහෙර කන්දෙන් හා මිහින්තලා කන්දෙන් ඇද හැළෙන වර්ෂාවෙන් ජලය සපයාගෙන ඇත. එහිදි නාග පොකුණ හරහා මැද මළුවේ පිහිටි දාන ශාලාව වෙත භූගත ආකාරයකින් ජලය ගමන් කරවීම තුළ ජලය පිරිසිදු වී භික්ෂු පරිහරණයට යොදා ගනී. එතැන් සිට තිඹිරි පොකුණ දක්වා භූගතව ජලය රැගෙන යාමට සලස්වා ඇත. එමෙන්ම ඇත් වෙහෙර කන්දෙන් ගලන ජලය කළුදිය පොකුණටත් එතැන් සිට රාජගිරි ලෙන පොකුණ දක්වාත් ගමන් කරවීමට සකසා ඇත.

මහාවිහාර භූමිය තුළ ආරාම සංකිරණයට අත්‍යාවශ්‍යම අංගයක් වූ ජල කළමනාකරණ මූලාශ්‍රයක් වන පොකුණු නිර්මාණය කර ඇත. ඒ අතර ජන්තාඝර පොකුණ භික්ෂූන් වහන්සේලාගේ ශරීර සුවතාවය වෙනුවෙන් ඖෂධ වර්ග ඇග ගල්වා ස්නානය කිරීමට සකස් කර ඇති සුවිශේෂි වාපි නිමවුමකි. එමෙන්ම ආරාම පරිශ්‍රයක දැකගන්නට ඇති වැඩිම පොකුණු ප්‍රමාණයක් සොයාගෙන ඇත්තේ අභයගිරියෙනි. මේවා භික්ෂූන් වහන්සේලාගේ ගිලන්පස පහසුව, ස්නානය හා වෙනත් සනීපාරක්ෂක කටයුතු සඳහා උපයොගි කොට නිර්මාණය කොට ඇත. ඇත් පොකුණ, කුට්ටම් පොකුණ, රත්තරන් පොකුණ, යතුරු පොකුණ ඒ අතර සුවිශේෂ වේ. විහාරවාසි භික්ෂූන් වහන්සේලාගේ නාන තටාකයක් ලෙස කුට්ටම් පොකුණ අතීතයේ දි භාවිතයට ගත් විශිෂ්ඨතම වාරි නිර්මාණයකි. තවද අභයගිරි සංකීරණයේ විහාරවාසි භික්ෂූන් වහන්සේලාගේ සනීපාරක්ෂාව සඳහා ඉදිකොට ඇති ගොඩනැගිල්ලක් වන්නේ ජන්තාඝරයයි. ථුල භාවයට පත් වී විවිධ රෝගාබාදවලට ගොදුරු වූ භික්ෂූන් වහන්සේලාගේ පහසුව සඳහා මෙය ඉදිකොට ඇත. ජලය උණු කොට භාවිතයට ගැනීම මෙහිදී සිදුකරයි. එමෙන්ම බෙහෙත් ඔරු හා බත් ඔරු ද පුරාවිද්‍යාත්මක වශයෙන් වාපි සංස්කෘතිය හා බැදි විහාරාරාම අංග වේ.

## බෞද්ධාගමික චාරිත්‍ර හා උත්සව මගින් හෙළිවන කරුණු

වාරි සංස්කෘතිය හා බැඳුණු බෞද්ධාගමික චාරිත්‍ර හඳුනාගැනීමේ දී ඒවා පුරාණයේ සිට අඛණ්ඩව පැවත ඒම විශේෂත්වයකි. එවැනි සංස්කෘතිකාංගයක් ලෙස අත්පැන් වත් කිරීමෙන් සංකේත වන්නේ අයිතිය ලබාදීමයි. පැන් වැඩීම යනුවෙන් එම කටයුත්ත අදත් සිදු වේ. අතීතයේ රජවරුන් විසින් යම්කිසි පරිත්‍යාගයක් කිරීමේදී මෙය සිදු කරයි. තවද වර්තමානයේ ද විවාහ කටයුතු වලදී ජයමංගල ගාථා කියන විට අතපැන් වත්කරයි. එමෙන්ම පැන් වැඩීම අවමංගලය උත්සවයන්හි දී සිදු කරයි. පුද්ගලයෙක් මිය ගිය පසු එම පුද්ගලයාට පින් පමුණුවා පැන් වැඩීම සිදු කරයි. එහිදී බෞද්ධාගමික වත් පිළිවෙත් අනුව **අනිච්ඡාවත**

**සංකාරා- උප්පාද වය දම්මිකෝ...** යන ගාථාව පවසමින් පිරුණු භාජනයකින් ජලය හිස් භාජනයකට වත් කරයි. මේ තුළින් බලාපොරොත්තු වන්නේ මියගිය පුද්ගලයාගේ ආත්මයට යහපතක් සිදුකිරීමයි. වතුර කළය සැලකෙන්නේ සෞභාග්‍යයේ සංකේතයක් ලෙසිනි. ජලයෙන් බුදු පිළිම නැවීම හා බුද්ධාභිෂේක කිරීමත් බෝධිය නැවීමත් යන කරුණු සිදු වූයේ වර්ෂාව හා ශාන්තිය අපේක්ෂාවෙනි. එය අදටත් බෝධි පූජා සිදු කිරීමෙන් අපේක්ෂා කරයි. එමෙන්ම අතීත ගම්මාන වල ඉඩෝර ගිනියමට වැව සිඳී යාමෙන් වැසි ලැබීම සඳහා වැව් පිරිත හෙවත් වැසි පිරිත සජ්ඣායනා කරයි. මෙයද වැසි ලබාගැනීමට අතීතයේ සිට සිදු කළා වූ බෞද්ධාගමික චාරිත්‍රයක් වශයෙන් සඳහන් කළ හැකිය. මහනුවර ඇසළ පෙරහැර හා සමගාමීව සිදු කරන ජලය හා බැඳි බෞද්ධාගමික සංස්කෘතික චාරිත්‍රයක් වන්නේ දියකැපීමේ උළෙලයි. මෙලෙස වැවත් ගමත් පන්සලත් එකට යා වෙමින් අතීතයේ සිට චාරිත්‍ර හා උත්සව මගින් ජලය හා සබැඳි බෞද්ධ සංස්කෘතියක් ජනිත වී ඇත. එමෙන්ම බුදුන් ස්නානය කල තැන දාගැබක් තැනීමට තරම් සැදැහැවත් ජනතාවක් වෙසෙන කැළණිය වැනි පුදබිමක් හිමි සමාජයේ බුදු දහම පදනම් කොට ගත් වාරි සංස්කෘතියක් බිහිවීම අරුමයට කරුණක් නොවන්නේය.

**නිගමනය**

ලාංකේය ශිෂ්ටාචාරයේ ඉතිහාසය තුළ විශිෂ්ටත්වයේ අනභිභවනීයම නිර්මාණය වන්නේ වාරි කර්මාන්තයයි. අතීතයේ සිට සෑම මූලාශ්‍රයක්ම පාහේ අනාවරණය කරන්නේ වාපි සංස්කෘතියේ කැඩපත බුදු සමය බවයි. එනම් ඉන්දියාවෙන් ලැබුනා වූ බෞද්ධාගමික සංස්කෘතිය මෙරටදි අපට ආවේණික අයුරින් සකසා ගෙන හැඩගැසුනේ වැව පදනම් කරගත් නිසාවෙනි. අනුරාධපුර අවධියේ සිට රාජ්‍ය අනුග්‍රහයත් නොවඩුව හිමි වූ බුදු සසුනට ආලෝකයක් වූයේ වැව හා බැඳුණු මිනිස් ගුණාංගයි. එමෙන්ම බුදු දහමේ උන්නතිය උදෙසා සුවිශල් ජලාශ, ඇළ මාර්ග කාලාන්තරයක් පුරාවට බෞද්ධ සංස්කෘතිය පෝෂණය කරමින් ආරක්ෂා කර ඇත. එසේම වැවත් පන්සලත් අතර ගොඩනැගුණු පුදුම සහගත සම්බන්ධය ලක්දිව ධර්මද්වීපයක් බවට පත් කිරීමට මහගු වූ දායකත්වයක් ලැබූ බව මූලාශ්‍රගත කරුණු තුළින් මනාව පැහැදිලි වේ.

**පරිශීලන.**


විතානච්චි, සී. ආර්. (2017) ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරිකර්මාන්ත,*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

බටුවන්තුඩාවේ සුමංගල හිමි, 1996, ***(සංස්) මහාවංශය***, දීපානි මුද්‍රණ ප්‍රකාශනය, නුගේගොඩ.

සෙනවිරත්න. ඒ, (2001) ***පුරාණ සිංහල වාරි සංස්කෘතිය***, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්, නුගේගොඩ.

අමරවංශ හිමි, කොත්මලේ, (1969) ***ලක්දිව සෙල්ලිපි***, ඇම්. ඩී ගුණසේන සහ සමාගම, කොළඹ 11.

මුදියන්සේ, එන්. (2000), ***සිංහල ශිලාලේඛන සංග්‍රහය***, ඇස්, ගොඩගේ සහ සහෝදරයෝ, ද. එස්. කුලරත්න මාවත, කොළඹ 10.

ස්වර්ණසිංහ, කේ. එම්. අයි (2005), ***අපේ වැවෙන් පැන් දෝතක්,*** චාග ප්‍රකාශනය, පන්නිපිටිය.

## 15. රජරට වාරි පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ කාලීන අවශ්‍යතාවය හඳුනා ගැනීම.

පී.ඩී.ගෝතමී දිල්හාරා

**හැඳින්වීම.**

විශ්මයජනක වාරි පද්ධතියකට උරුමකම් කියන අප ලංකාද්වීපය දෙස් විදෙස් බොහෝ දෙනා හඳුන්වනු ලබන්නේ "වැව් බැඳි අධිරාජ්‍ය" ලෙසයි. මෙසේ හැඳින්වීමට මූලික වී තිබෙන්නේ අතීත රජ දරුවන් විසින් ඉදි කරන ලද අති විශාල වූ වැව් පද්ධතිය නිසාවෙනි. ශ්‍රී ලංකාවේ වාරි ඉතිහාසය මෙරට ජනාවාසකරණය දක්වා දිවයන අතර ක්‍රි.පූ. 6 වන සියවසේ දී උතුරු ඉන්දියාවේ සිට පැමිණි විජය ඇතුලු ආර්ය පිරිසගේ පැමිණීමත් සමගම ලක්දිව වාරි පද්ධතියේ මූලාරම්භය සනිටුහන් වූ බව මහාවංස තොරතුරු අනුව වාර්තා වේ. කෙසේ නමුත් අතීතයේ සිට පැවතගෙන එනු ලබන "වැවයි දාගැබයි - ගමයි පන්සලයි" යන සංකල්පය මතම ලාංකේය ජනතාව වාරි පද්ධතියට මුල් වී සිටි බව පැහැදිලි ය. ශ්‍රී ලංකාවේ සෑම ස්ථානයකම පාහේ වැව් දක්නට නොලැබෙන අතර, විශාල වශයෙන් වාරි පද්ධති දක්නට ලැබෙන්නේ වියළි කලාපය තුළයි. වියළි කලාපයේ පවත්නා ගොවිතැනට උචිත වූ සරු පස නිසාවෙන් මුල් ආර්යයෝ මෙම වියළි කලාපය තුළට සංක්‍රමණය වන්නට විය. කෙසේ නමුත් මෙම කලාපයට වර්ෂාව වසරකට එක් කලකදී පමණක් ලැබෙන නිසාත්, එම වර්ෂාව අඟල් 50 - 75ත් අතර ප්‍රමාණයේ වර්ෂාවක් නිසාත් මේ හේතුවෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා වසරකට අවශ්‍ය වන ජලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ජලය ගබඩාකරගෙන පරිහරණය කිරීම සඳහා ඒ අරමුණ පෙරදැරි කරගෙන මෙම වාරි පද්ධති ඇරඹි බව පසක් වී තිබේ.

කෙසේ නමුත් වර්ෂය පුරාවටම කෘෂිකාර්මික කටයුතු අපහසුතාවයකින් තොරව සිදු කරගෙන යාම සඳහා මෙසේ රැස්කොට ගනු ලබන අතිරික්ත ජලය ගබඩා කොට තබා ගැනීම වාරි පද්ධතිය තුළ සිදුවේ. කෙසේ නමුත් මුල් කාලීන යුගයේ දී ප්‍රාථමික මට්ටමින් වාරි පද්ධති ඉදිවිය. එහි දී ජල පහරක් ස්වභාවිකව පිහිටි උස් භූමි දෙකකට කොටු කරමින් එක් පසක ලී දඬු, කොළ අතු වැනි දෑ හරස් කොට වාරි පද්ධති නිර්මාණය සිදුවී තිබේ. ක්‍රමක්‍රමයෙන් පසුකාලීනව ඉංජිනේරුමය තාක්‍ෂණය යොදා ගනිමින් සවි ශක්තියෙන් යුක්ත වාරි පද්ධති නිර්මාණය සිදු වී තිබේ. මෙසේ දැවැන්ත අන්දමින් නිර්මාණය වූ වාරි පද්ධතිය ලාංකික ජනයාගේ මෙන්ම දෙස් විදෙස් විද්වතුන්ගේ අවධානයට යොමු වී තිබේ. කෙසේ නමුත් අතීතයේ සිට නිසියාකාරව පැවැත්මකින් යුතුව රැගෙන ආ මෙම වාරි පද්ධතිය විනාශ වීමට ඉඩ නොදී ඒවා ප්‍රතිසංස්කරණය කිරීම කාලීන අවශ්‍යතාවයක් වී තිබේ. ඒ අනුව රජරට වාරි පද්ධතිය පිළිබඳව විමසීමේ දී වියළි කලාපයේ වී ගොවියාගේ පණ නල රැඳී පවතින්නේ මෙම වාරි පද්ධතිය තුළ බව නොරහසකි. එක් පසෙකින් ගත් විට වාරි පද්ධතියක් සෑදීම ලෙහෙසි පහසු කාර්යයක් නොවෙති. මෙම වාරි පද්ධතිය ඉදිරිපිට යම් පිරිසකගේ දායකත්වය ඉස්මතු වී පෙනුන ද අභ්‍යන්තරය තුළ ද බොහෝ පිරිසකගේ දායකත්වය යටතේ වාරි පද්ධති නිර්මාණය වී තිබේ.

අතීත රජ දරුවන්ගේ ධන පරිත්‍යාගයෙන් විශාල පිරිසකගේ ශ්‍රම දායකත්වයෙන් ඒකරාශී වී නිර්මාණය කළ වාරි පද්ධතිය එදා ගමෙහි මෙන්ම රටෙහි වාසය කළ සෑම පුද්ගලයෙකුම පාහේ සිය දිවි හිමියෙන් ආරක්‍ෂා කරගන්නට විය. එයට මූලිකම හේතුව වූයේ කෘෂිකර්මාන්තය උදෙසා ප්‍රධාන වශයෙන් වාරි පද්ධතිය අවශ්‍ය වූ නිසාවෙනි. අතීත රජ දරුවන් වාරි පද්ධතිය හා සම්බන්ධ තනතුරු පවා ලබා දී තිබූ අතර වැවේ ප්‍රතිසංස්කරණ පද්ධති සෑම අවස්ථාවකදීම සොයා බලා ඔවුන් නොපිරිහෙලා ඉටු කරන ලදී. ඒ හේතුවෙන්

වර්තමානය තුළ අපට වාරි පද්ධතිය ඉතා සුරක්ෂිතව දැක බලා ගැනීමේ හැකියාව උදා වී තිබේ. එසමයෙහි සමාජීය, ආර්ථික, දේශපාලනික, ආගමික, සංස්කෘතික ආදී කාර්යයන් පෙරදැරි කොටගෙන වාරි පද්ධතිය ප්‍රතිනිර්මාණය කළ බව සිතිය හැකිය. කෙසේ නමුත් වර්තමානය තුළ එසේ සිදුවන බවක් දක්නට නොලැබේ. එම නිසාවෙන් රජරට වාරි පද්ධතිය ක්‍රමක්‍රමයෙන් අභාවයට යන බව ඒ දුටු අපට ගම්‍යමාන විය. ඒ අනුව සමාජීය, ආර්ථික, දේශපාලනික, ආගමික, සංස්කෘතික ආදී කරුණු කාරණා යටතේ මෙම රජරට වාරි පද්ධතියේ ප්‍රතිනිර්මාණය කාලීන අවශ්‍යතාවයක් බවට උද්ගත වී ඇත. ඒ අනුව මෙම සාකච්ඡාව සඳහා තොරතුරු උපයා සපයා ගනු ලබන්නේ වාරි පද්ධතිය ආශ්‍රිත ග්‍රන්ථයන් හා අන්තර්ජාලීය මූලාශ්‍රයන් ඇසුරිණි. එසේම වර්තමානය තුළ අසන්නට දකින්නට ලැබෙන කරුණු ද මාගේ අදහස් ද මෙම සාකච්ඡාව සඳහා බඳුන් කෙරේ.

රජරට වාරි පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ කාලීන අවශ්‍යතාවය හඳුනා ගැනීම යන සාකච්ඡාව සිදු කිරීමෙන් අනතුරුව එහි අවසන් ප්‍රතිඵලය ලෙස මා දකින්නේ වර්තමානයට මෙන්ම අනාගතයට මෙම වාරි පද්ධතිය නිසි නඩත්තුවකින් යුතුව ප්‍රතිනිර්මාණය කොට ආරක්ෂාකර ගැනීමයි. එදා රජ දරුවන් තම දිවි දෙවැනි කොට ආරක්ෂා කරන ලද වාරි පද්ධතිය අද වන විට අභාවයට යමින් පවතී. අතීත වාරි පද්ධතිය අද දින දක්නට ලැබෙන්නේ කුණු කසල පිරි වැව් මිටියාවතක් ලෙසයි. මෙම තත්වයෙන් රජරට වාරි පද්ධතිය මුදවාලීම කාලීන අවශ්‍යතාවයක් වී තිබේ. ඒ අනුව රජරට වාරි පද්ධතිය අතීතයේ පැවති ආකාරයත් වර්තමානයේ තත්ත්වයත් පිළිබඳ වෙනස වටහා ගෙන එය ප්‍රතිනිර්මාණය කිරීමට අවශ්‍ය කාලයයි.

- **සමාජය හා ආගමික ක්‍රියාකාරීත්වය.**

අතීත ගැමියා වැව හා එදිනෙදා ජීවිකාව ගෙවමින් කටයුතු කළ අතර, අද වන විට රජරට ප්‍රදේශයේ ද ඇතැමුන් හැර අන් පිරිස වැව හා ජීවිකාව ගෙවමින් සිටී. කෘෂිකාර්මික දිවියක් ගත කළ ගැමියා සිය දින චර්යාවට පුරුදු වී සිටියේ උදෑසනම වැවට ගොස් සිය ගත තෙමාගෙන පසුව එළඹෙන්නේ ගොවිතැන් කටයුතු සඳහායි. අනතුරුව වැව් පද්ධතියේ ජලය රැගෙන යන ජල මාර්ග ඔස්සේ සිය ගොවිතැන් බතට අවශ්‍ය ජලය රැස් කරමින් ගැමි සමාජය වැඩ කටයුතු අහවර කර නැවත වැවේ නාන තොටට පැමිණ සිය ගත පුරා දැවටි මඩ සෝදා හොඳින් නහා පිරිසිදු වී නිවෙස් බලා පිය මනින්නේ සැනසුම් සුසුම් හෙළමිනි. පිරිමි පාර්ශවය මෙන්ම කාන්තා පාර්ශවය ද සිය එදිනෙදා කටයුතු සඳහා බොහෝ අවස්ථාවන්හි වැවට පිවිසෙති. එසේම සතියකට වරක් හෝ සති දෙකකට වරක් නැතිනම් මසකට වරක් ගමේ සියලු දෙනා රැස්ව සමස්ත වැව් පද්ධතියම සුද්ද පවිත්‍ර කිරීම සිදු කරනු ලබන අතර, වැවට හානිකර යම් දේවල් තිබේ නම් ඒවා නැවත සෑදීමට වගබලා ගනී. එදා ගැමි සමාජයේ වැව භාරව වැවේ රාළහාමි නම් පුද්ගලයෙකු සිටි නිසා මොහු සිය කටයුතු නොපිරිහෙලා කලට වේලාවට සිදු කරන්නට විය. කෙසේ නමුත් වර්තමානය තුළ එම කර්තව්‍ය එසේ සිදු නොවන බව වාරි පද්ධතිය දුටු අපට වැටහේ. ඇතැම් වැව් තාවුලු කැඩී බිඳී ඉරිතලා ගොස්ය. පිරිසිඳුවට තිබුණු වැව් ජලය අද මිනිසාගේ ම නොහොඹිනාකම් හේතුවෙන් අපිරිසිඳු තත්වයට පත්ව තිබේ. වන්දනාගමන් යන පිරිස ප්ලාස්ටික් බෝතල්, කඩදාසි, පොලිතීන් වැනි නොදිරන අපද්‍රව්‍ය වැව් ආශ්‍රිතව දමා යාමට පෙළඹී ඇත. මෙබඳු කරුණු කාරනා නිසා රජරජ වාරි පද්ධතිය විනාශ මුඛයට ඇද වැටෙමින් පවතී.

කෙසේ නමුත් රජරට වාරි පද්ධතිය එදා රජ දරුවන් ආරක්ෂා කළ ආකාරයට ආරක්ෂා කර ගැනීම අපගේ යුතුකම නොවේ? එම නිසාවෙන් මෙම වාරි පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීම

සමාජයක් වන අපගේ යුතුකමයි. සමිති සමාගම් හෝ සාදා ස්වේච්ඡාවෙන් රටේ සම්පත අප ආරක්ෂාකරගත යුතුවේ. නැතිනම් මතු පරපුරට ඉතිරි වන්නේ කොන්ක්‍රීට් වනාන්තරයක් පමණි. වාරි පද්ධතිය හා බැඳි ආගමික පසුබිම ගත් කළ අතීතයේ වෙහෙර විහාර පවා නඩත්තු වූයේ මෙම වාරි පද්ධතිය හා බැඳි රැකීරක්ෂා මත පදනම් වූ බදු මුදල් ලබා ගැනීමෙනි. එසේම ගමේ මහ නායක ස්වාමීන් වහන්සේගේ අනු දැනුම මත මෙම වාරි පද්ධතිද නඩත්තු විය. බොහෝ විට සෑම පන්සලක් පාහේම වැවක් භාරව පැවතුනි. එම වැව් ජලයෙන් අස්වද්දනු ලබන කුඹුරින් ගන්නා සහල් පන්සලටද අයත් විය. වැවෙන් අල්ලන ලද මාළු කොටසක්ද පන්සලට දීම සිරිතක් විය. වෙස්සගිරිය සෙල්ලිපියේ සඳහන් පරිදි "කලා වැවෙන් ජලය රැගෙන සුවඳැල් සහල් අස්වද්දා වෙස්සගිරිය භික්ෂූන් හට ධානය පිදිය යුතුය." යන්න දැක්වේ. ඒ අනුව අපට සිතිය හැකි වන්නේ අතීත වාරි පද්ධති ආගමික සිද්ධස්ථානයන්ට අයත්ව පැවති බවයි.

ආගමික මැදිහත්වීමෙන් අතීත වාරි පද්ධතියට නව දායකත්වයක් ලැබුණු අතර, බුදු සමයත් සමඟ එම තත්වය වඩාත් පිළිබිඹුවේ. වැව සෑදීමේ දී වැවෙන් ඉවත් වන මැටි ගොඩ ගසා දාගැබ නිර්මාණය වූ අතර, දාගැබ සෑදූ ස්ථානයේ පන්සල ඉදිවිය. මේ වටා කෙත් යාය නිර්මාණය වන්නට වූ අතර, මේ සියල්ල නිසා ගම ස්වයංපෝෂිතව දම් වැලක පුරුක් සේ මෙම සංකල්පය බැඳී පවතින්නට වූ බව සිතිය හැකිය. කෙසේ නමුත් අතීතයේ බෞද්ධ ආගම රජරට ප්‍රදේශයේ පැවති වාරි පද්ධති උදෙසා මහඟු සේවයක් ඉටු කළද වර්තමානය තුළ එසේ සිදු නොවෙති. කෙසේ නමුත් මෙම වාරි පද්ධති ප්‍රතිනිර්මාණය කිරීම කාලීන අවශ්‍යතාවයක් ව තිබේ. එම නිසා රටෙහි පවතින සියලු ආගමික නායකයින් එකාවන්ව එකට රොක් වී ආගාදයට ඇද වැටෙමින් පවතින රජරට වාරි පද්ධතිය ප්‍රතිනිර්මාණය කොට ගොඩගත යුතුවමය.

- **ආර්ථික ක්‍රියාකාරීත්වය.**

අතීත රජරට ප්‍රදේශයේ ආර්ථික පැවැත්මට වාරි පද්ධතිය තුළින් ලැබුණු දායකත්වය පිලිබඳව විමසා බලන කල සමස්ථ රටෙහිම ආර්ථිකය රඳා පැවතියේ කෘෂිකර්මාන්තය මතයි යන්න කිවයුතුමය. එහි දී වැඩි බරක් හිමි වූයේ රජරට පෙදෙසටයි. කෘෂිකර්මාන්තය ස්වයංපෝෂිත වූයේ රජරට වාරි පද්ධතිය නිසාවෙනි. වාරි පද්ධතියෙන් ලබා ගනු ලබන ජලය කෘෂිකර්මාන්තයේ අස්වනු සරුකර ගැනීමට මහෝපකාරී විය. වර්ෂාව නොමැති සමයන්හි වාරි පද්ධතියේ ජලය කෘෂිකර්මාන්තය නගා සිටුවීමට උපයෝගී කර ගත් නිසා "අතීත ගොවියාගේ හදවත වැව ලෙස" ඒත්තු ගන්වා තිබේ. කෘෂිකර්මාන්තයට අමතරව වාරි පද්ධතිය තුළින් ආර්ථිකමය වශයෙන් වැව් මාළු වෙළඳාමද පෙන්වාදිය හැකිය. අතීතයේ ස්වයංපෝෂී ආර්ථිකයක් රජරට කලාපය තුළ පැවති ඇති බව අතීත රජ දරුවන් සිදු කරනු ලැබූ නිර්මාණයන්ගෙන් පැහැදිලිය. ඔවුන් කිසිවිටෙකත් වාරි පද්ධතිය අත් නොහලන්නට විය. ඒවා නඩත්තු කරමින් රටේ ආර්ථික මට්ටම ඉහළ නංවන්නට විය.

කෙසේ නමුත් වර්ථමානය තුළ එබඳු කර්තව්‍යයක් දක්නට නොලැබේ. වර්තමානයේ වාරි පද්ධති පවා විනාශ වෙමින් පවතින යුගයකදී අපට අසන්නට දකින්නට ලැබෙන්නේ වැව්වල ජලය හිඳී ගොස් ඇති බව පවසමින් දුක් පීඩා විඳින අන්ත අසරණ මිනිසුන්ය. එසේ නොමැතිනම් වැව්වල නිසි නඩත්තුවක් නොවී වැව් වල් වැදීම වැනි කරුණුය. අතීතයේ සිට පැවත එන කෘෂිකර්මාන්තයෙන් හෙබි සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවටම පමණක් ආවේණික වූ වාරි පද්ධතිය නිර්මාණය වී ඇත්තේ ලාංකික ඉංජිනේරුමය තාක්ෂණය උපයෝගී කරගෙන බව පැහැදිලිය. එම නිසා බොහෝ විදේශීය ජනයා ඒවා දැක බලා ගැනීමට ප්‍රිය කරති. ඒ

හේතුවෙන් මෑතකාලීනව රටෙහි මෙන්ම යම් පිරිසකගේ හෝ ආර්ථිකය වඩවාලීමට හැකියාවක් උදාවී තිබේ. එනම් රජරට වාරි පද්ධතිය නැවත ප්‍රතිනිර්මාණය කර ඉදිරිපත් කිරීමයි. එමගින් ඒවා දැක බලා ගැනීමට දෙස් විදෙස් ජනයා රැස්වන අතර ඒ වටා වෙළඳ පොළවල් රැකීරක්‍ෂා උදාවේ. එසේම රටෙහි විදේශ ආදායමද මින් උදාකරගත හැකිය. මෙම ක්‍රියාවලිය චක්‍ර වූ විශාල පැතිකඩක් වන අතර, විශේෂයෙන්ම රටෙහි ආර්ථිකය ගොඩනන්වාලීමට වාරි පද්ධතියෙන් ලබා ගන්නා ජලය තුළින් අස්වද්දනු ලබන කෘෂිකර්මාන්තය ප්‍රමුඛ තැනක් උසුලයි.

- **දේශපාලනික ක්‍රියාකාරීත්වය.**

අතීත දේශපාලනික තත්වය පිළිබඳව විමසීමේ දී රජ දරුවන් විසින් සෑම වාරි පද්ධතියක් උදෙසාම රාජ්‍ය අනුග්‍රහය ලබා දී තිබේ. විවිධ ප්‍රමාණයෙන් වැව් නිර්මාණය සඳහා දේශපාලනික මට්ටමින් අනුග්‍රහය ලැබී ඇත. එම නිසාවෙන් අතීත වාරි පද්ධතියේ විශාල වූ සංවර්ධනයක් අපහට වර්ථමානය තුළ දැකගත හැකිව තිබේ. සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක සාධක අනුව අතීතයේ රජරට වාරි පද්ධති බිහි කිරීමට මූලිකම පියවර සඳහා මුදලින් දායකත්වය සපයා තිබෙන්නේ දේශපාලනික වශයෙන් නම් දරා සිටින රජ දරුවන්ය. එවන් අතීතයක් පැවති යුගයක දේශපාලනික මට්ටමින් විවිධ වූ සමෘද්ධියක් රජරට වාරි පද්ධතියට සිදුවී තිබේ. එසේම අතීත දේශපාලනය තුළ රජු ජනතා ගෞරවාදරයට පාත්‍ර වීමද මෙම වාරි නිර්මාණ ඉවහල් වූ බව සිතිය හැකිය. එසේම දේශපාලනික තත්වයෙන් උසස් රජවරු සිටි අතර මෙම වාරි පද්ධති නිර්මාණය නිසා ඇතැම් රජවරු දේවත්වයෙන් පවා හඳුන්වන්නට විය. ඒ බව මහසෙන් රජු - මින්නේරිය දෙවියන් ලෙස හඳුන්වනු ලැබූ බව සඳහන් වේ.

වාරි පද්ධති ඉදිකිරීම රාජ්‍ය අනුග්‍රහය අතැතිව සිදුවුවද ඉන් නොනැවතී වාරි පද්ධති නඩත්තු කිරීම පවා සිදු කරන ලදී. නිසි කලට වේලාවට ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වූ නිසා වර්තමානය තුළ අපට රජරට වාරි පද්ධතියක් දැකබලා ගැනීමේ අවස්ථාව උදා වී තිබේ. එසේම වාරි පද්ධතිය තුළින් බද්දක්ද අය කර ඇති අතර එමගින් වාරි පද්ධතියේ නඩත්තුව මෙන්ම රටේ ආර්ථිකයට ද නව අරුතක් එක් කරන්නට විය.
කෙසේ නමුත් වර්තමානය තුළ දේශපාලනික වශයෙන් රජරට වාරි පද්ධතියට කිසිඳු වෙනසක් නොවීය. මෙම හේතුවෙන් රටේ ආර්ථිකයටද මහත් බලපෑමක් වන බව නිසැකය. පුරා වසර ගණනාවකට පසු රජරට ප්‍රදේශයේ වාරි පද්ධතියක් නිර්මාණය වීමට පියවර ගෙන තිබීම සතුටට කරුණකි.

- **සංස්කෘතික ක්‍රියාකාරීත්වය.**

සංස්කෘතිය තුළ බිහි වූ විශිෂ්ඨ ගණයේ නිර්මාණයක් ලෙස මෙම වාරි පද්ධතිය පෙන්වාදිය හැකිය. හෙළදිව ජන සංස්කෘතිය හා වාරි පද්ධතිය අතර පවතින්නේ අවියෝජනීය බැඳීමකි. ඊට ප්‍රධානතම හේතු සාධකය නම් අතීත ගැමියාගේ කෘෂිකාර්මික සංස්කෘතියට බෙහෙවින් වාරි පද්ධතිය උපයෝගී වන නිසාය. විශේෂයෙන්ම ගොවිතැන් කටයුතු උදෙසා ජලය මූලිකම සාධකය වූ අතර සියලු දෙනා ජලය කෙරෙහි දැඩි ඇල්මකින් යුක්ත විය. ජලය එක්රැස් කරගෙන ගොවිතැන් කටයුතු සිදු වූ නිසා ඒ ආශ්‍රිතව වාරි පද්ධතියක් බිහිවන්නට විය. අතීත ගැමියා එදා සිට වාරි සංස්කෘතිය සුපරීක්‍ෂාකාරීව පවත්වාගෙන ආ අයුරු අපට අසන්නට දකින්නට ලැබී තිබේ. එදා අපේ මුතුන් මිත්තන් එසේ ආරක්‍ෂාකරගෙන ආ එම වාරි පද්ධතිය අද වන විට විනාශ මුඛයට අත වනමින් සිටී. කෙසේ නමුත් රජරට ප්‍රදේශයේ දක්නට ලැබෙන කුඩා ප්‍රමාණයේ වාරි පද්ධති වැළලී ගොස්ය. අතීත ගැමියා පණ නළ මෙන්

ආරක්ෂා කළ වාරි පද්ධතියට පුද පූජා පවා පැවැත්වීමට ඔවුන් පසුබට නොවීය. ලෝකය පාලනය කරනවා යැයි සම්මත දෙවියන් හට ගෞරව ආදරයෙන් යුක්තව මෙම වාරි පද්ධති භාර කරන්නට වූයේ සිය සංස්කෘතියේ අංගයන් විදහා පාමිණි. අති සුන්දර සංස්කෘතියක් පවත්වාගෙන ආ අප වර්තමානය තුළ ඒ පිළිබඳව සොයා බලා කටයුතු කිරීම අපගේ වගකීමයි.

මෙතෙක් කතාබහට ලක්වුණු රජරට වාරි පද්ධතිය ආරක්ෂා කර ගැනීමේ වගකීම පැවරී තිබෙන්නේ වත්මන් පරපුරටය. එහිදී සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික යන අංශයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරලීම මෙහිදී සිදු වූ අතර විශේෂයෙන්ම ඒ ඒ අංශයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමෙන් යම්කිසි ප්‍රතිඵලයක් ලඟා කර ගැනීමට හැකිවන බව පැවසිය යුතුමය. ඒ අනුව රජරට වාර පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ කාලීන අවශ්‍යතාවය හඳුනා ගැනීම යන්න මෙහි මාතෘකාවයි. අභාවයට යමින් පවතින රජරට වාරි පද්ධතිය යළි නගා සිටුවීමේ අරමුණ අතැතිව සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික යන අංශයන් කෙරෙහි දළ වශයෙන් හෝ කරුණු කාරණා දක්වමින් ඒ කෙරෙහි යම් අවධානයක් යොමු කර රටේ පවතින රජරට වාරි පද්ධතිය ආරක්ෂා කර ගැනීම මෙහි අරමුණයි.

**පරිශීලන.**


අමරවංස, කේ. (1969) ***ලක්දිව සෙල්ලිපි***, කොළඹ 11, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සමාගම, නො. 17, ඕල්කට මාවත.

අඹන්වල, සී, (2015) ***ලංකාවේ වාරි තාක්ෂණය හා එහි තිරසාරත්වය උදෙසා බලපෑ සමාජ හා තාක්ෂණික සාදක පිළිබඳ විමසුමක්,***

උදුල, බී, අවිසදහාමි, (1999) ***වැව***, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය.

දළුපොත, එම්. කේ. (2010) ***වැවේ වගතුග***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, නො. 675, මරදාන පාර, කොළඹ 10.

බස්නායක. එච්. ටී, (1997) ***පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, සමන්ති පොත් ප්‍රකාශකයෝ.

**විතානාච්චි, සී, ආර්,** (2018) ***පුරාණ*** *ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ විකාශනය.*

# 16. වැවක පැවැත්ම කෙරෙහි වැව් බැම්මේ බලපෑම හා තාක්ෂණය පිළිබඳව විමර්ශනයක්

ඊ. කේ. සී. පබසරා

## හැඳින්වීම

සරලවම ගතහොත් වැවක් යනු නියං කාලවලදී ජලය හිඟකමින් පීඩා නොවිඳීම පිණිස ඉහළ තාක්ෂණික දැනුමක් උපයෝගී කොට ගෙන නිර්මාණය කරන ලද කෘතිම ජල ගබඩාවකි. එබක් හෝ පතසක් ලෙස කුඩාවට ඇරඹි ශ්‍රී ලාංකීය වාරි කර්මාන්තය සියවස් පහක් පමණ ගත වනවිට මහා පරිමාණ වැව් ඉදි කිරීම දක්වා තාක්ෂණය අතින් අති විශිෂ්ට දියුණුවකට පත් විය. මුල් කාලීනව පැවති අවශ්‍යතාවන්ගේ පුළුල් වීම හේතුවෙන් කුඩා වැව්, මහා පරිමාණ වැව් ඉදිකිරීම දක්වා විකාශණය වූ අතර එහිදී කළින් කලට මතුවූ විවිධ ගැටලුකාරී තත්ත්වයන් මැඩපවත්වා ගැනීම පිණිස පවතින අංගයන් ඔපදමමින් නව තාක්ෂණික අංගයන් ද වැවට එක් කරන ලදි.

වැවක ජලය රඳවා ගනු ලබන්නේ වැව් බැම්ම මගිනි. ඒ තුළ රැස් වන අධි පීඩනයකින් යුත් ජල ධාරාව පිහිටි පොළාව මත කෘතිමව රඳවා තබා ගැනීමේ දී ඔරොත්තු නොදෙන සෑම අවස්ථාවකම වැව් බැම්ම බිඳී යා හැකිය. එය වලක්වා ගත හැක්කේ වැව් බැම්මේ උස හා පවතින සමස්ථ ජල ප්‍රමාණය ක්‍රමානුකූලව ගණනය කොට ඉදි කිරීමෙන් පමණි. ඒ අනුව වැව් බැම්මක් නිර්මාණයේ දී එහි තාක්ෂණය මනා කළමණාකාරීත්වයකින් යුක්ත විය යුතු ය. එමෙන්ම වැව් බැම්මේ නීරෝගී පැවැත්ම, වැවෙහි අනෙකුත් සෑම අංගයකම රඳා පැවැත්ම කෙරෙහි ද ඍජුවම බලපායි. වැවක පැවැත්ම කෙරෙහි ඉහත කී වැව් බැම්මේ තාක්ෂණය හා කාර්යභාරය මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් විමර්ශණය කරනු ලැබේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්‍රියාවලිය මූලික වශයෙන් සාහිත්‍යය මූලාශ්‍රයන් අධ්‍යයනයෙන් සිදු වූ අතර අන්තර්ජාලය තුළ යාවත්කාලීන වූ ලිපි මෙන්ම ඡායාරූප හා සිතුවම් ආශ්‍රිත අධ්‍යයනයක් ද සිදු කරන ලදී.

## විමර්ශනය.

වැවක් යනු හුදෙක් බැමි යොදා වට කොට සකස් කරන ලද තවත් එක් ජල ගබඩාවක් නොව, සමස්ථ දේශයක කුසගිනි දුරු කළ කෘෂිකර්මාන්තයක මහා නිමැයුම්කරුවා යි. වැව නිර්මාණය කිරීම, එය මනාව පවත්වාගෙන යාම, පොෂණය කිරීම මෙන්ම පරිහරණය කිරීම ආදී කටයුතු මුල් කොට ගනිමින් වැව් බැම්ම, රළපනාව, බිසෝකොටුව, කළිඟු බැමි, ඉස්වැටි, සොරොව්ව ආදි නව අංගයන් පසු කාලීනව වැවට එක් විය. මෙම භෞතික අංගයන්ට අමතරව වැව හා සම්බන්ධව ආගම හා බැඳි වෙනම සංස්කෘතියක් ද ඇත. මෙකී භෞතික විද්‍යාත්මක අංග හා සංස්කෘතික අංග එකතුව මත නිර්මාණය වූ හා රැකුණු පැවතුණු නිර්මාණය වැව සේ හඳුන්වනු ලබයි.

විවිධ අවශ්‍යතා වෙනුවෙන් වැව් හෝ ජලාශ ඉදිකළ ලොව එකම ජාතිය සිංහලයන් නොවේ. මෙසපොතේමියානුවන් ක්‍රිස්තු පූර්ව හාරදහසේදී පමණ සිට වාරි කටයුතුවල නිරත වූ බවට සාධක තිබේ. ඊජිප්තුවේ කෆාරා ගල් අමුණ ක්‍රිස්තු පූර්ව දෙදහස් හයසීයේ දී පමණ ප්‍රදේශයේ ජන අවශ්‍යතා වෙනුවෙන් ඉදි කළ බවට සාධක ඇත. එසේනම් මෙකී වාරි කර්මාන්තයන් අතර අප සතු විශේෂත්වය හා අනන්‍යතාවය විමසා බැලීම වැදගත් වේ.

### වැවක් නිර්මාණය කිරීමේ දී බලපානු ලබන සාධක

සෑම විටම වැවක් නිර්මාණය කරනුයේ, එම වැවෙන් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අවශ්‍යතාවයන් මැනවින් සලකා බැලීමෙනි. එදිනෙදා ජීවන අවශ්‍යතා සඳහා පමණක් ජලය අවැසි කරන වැවක් එතරම් විශාල විය යුතු නැත. නමුත් කෘෂිකාර්මික කටයුතු හෝ වෙනත් වැව්වලට ජලය නිකුත් කරන්න කටයුතු සිදු කරන්නේ නම්, වැවේ ප්‍රමාණය හා එහි ස්භාවය ඒ ඒ අවශ්‍යතාවයන් මත වෙනස් විය යුතු ය. ඒ අනුව, වැව ඉදිකරන භූමිය, වැවට ජලය ලබා ගන්නා ක්‍රමවේදය, ජලය සහිත වැවේ ආරක්ෂාව, වැවෙන් ඉටු කෙරෙන කාර්යය ආදී කරුණු කෙරෙහි වැවක් නිර්මාණයේ දී මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. වැව් බහුලව ඉදිකොට ඇත්තේ රටෙහි වියළි කලාපයේ වන අතර එය සම තැනිතාවක් නොවූ ශේෂ කඳු, ගල් කඳු හා කුඩා නිම්න ආදියෙන් යුක්ත භූමියක් වේ. මෙම භූවිෂමතා ස්වභාවයත්, පාෂාණ වැටිවල පිහිටීමත් වැව් නිර්මාණය කෙරෙහි යෝග්‍ය වුවත්, මෙහි සෑම ස්ථානයක් ම වැවක් නිර්මාණය සඳහා යෝග්‍ය නොවන අවස්ථාවන් මොරගහකන්ද ජලාශය ආදී වර්තමාන ව්‍යාපෘති තුළින් ද පැහැදිලිව දැක ගත හැක.

ප්‍රාග් කේම්බ්‍රිය නයිස් හා ග්‍රැනයිට් ආදී පාෂාණ උද්ගතයන් පිහිටි ස්ථානයන් අතීතයේ දී වැවක් නිර්මාණය සඳහා තෝරාගත් අතර වැවක කල් පැවැත්ම කෙරෙහි එය අතිශයින් වැදගත් විය. ලංකාවේ ගංගා ද්‍රෝණි බොහෝමයක පදනම වන්නේ ද මෙම පාෂාණයි. ජලයට, දිලීර හා අම්ලවලට, ක්ෂණිකව වෙනස්වන කාළගුණයට මෙන්ම ගින්දරවලට ඔරොත්තු දීමේ හැකියාව හා කල් පැවැත්ම, ශක්තිමත් බව, සකස් කිරීමට ඇති පහසුව හේතුවෙන් වැවකට ජලය ලබා ගන්නා අමුණේ සිට පිටවාන දක්වා සෑම අංගයක්ම නිර්මාණයේ දී මෙම පාෂාණ උද්ගතයන් සහිත ස්ථාන හෝ පාෂාණ කොටස් භාවිතා කොට ඇත. අගාර මගින් හෝ අමුණු හරහා පහළට ගෙන එනු ලබන ජල කඳ හරස් කොට ගැනීමෙන් වැව නිර්මාණය කර ගන්නා අතර එසේ ගෙන්වා ගනු ලබන ජලය වැව තුළ රඳවා ගනු ලබන්නේ *වැව් බැම්ම* මගිනි. මෙම රැස්වන ජලයේ අධික පීඩනය හේතුවෙන්, නිර්මාණයේ කිනම් හෝ ස්ථානයක සමබරතාවය නැති වී යන සෑම අවස්ථාවකම වැව් බැම්ම බිඳී යා හැකි ය. මෙවැනි තත්ත්වයන්ට ඔරොත්තු දීමට හැකි වන සේ වැව් බැම්ම නිර්මාණය කළ යුතු අතර වැව් බැම්ම ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම ද වැදගත් වේ.

### වැව් බැම්ම ඉදිකිරීමේ තාක්ෂණය

කෘෂි බිම්වලට පහසුවෙන් ජලය ලබාගත හැකි වීම, වැව පෝෂණය කිරීමට අවශ්‍ය ජලය සපයා ගැනීමේ පහසුව, වෙනත් වැව් පෝෂණය සඳහා ජලය ලබා ගන්නේ නම් ඒ සඳහා පහසුව, කල් පැවැත්මට හානි නොවන ස්ථානයක් වීම ආදී කරුණු, වැව් බැම්ම ඉදි කිරීමේ දී මූලික වශයෙන් සලකා බලනු ලබයි. වැවක සොරොව්ව ස්ථානගත කල යුතු වන්නේ කෘෂි බිම්වලට ජලය සැපයීමට පහසු වන තරම් ඉහළිනි. නැතහොත් කෘෂි බිම් කරා ජලය සැපයීම අපහසු වේ. ඒ අනුව සොරොව්ව වැව් බැම්ම ආශ්‍රිත ඉදි කිරීමක් වන බැවින් වැව් බැම්මේ ස්ථානගත කිරීම වඩා වැදගත් ය.

### වැව් බැම්ම නිර්මාණය සඳහා ස්ථානයක් තොරා ගැනීම

වැව් බැම්මේ දිග පළල මෙන්ම උස පමණක් නොව එහි ඉදි කිරීමේ තාක්ෂණය ද තීරණය වන්නේ වැව ඉදි කරනු ලබන භූමියේ ස්වභාවය අනුව ය. මේ අනුව වැව් බැම්ම නිර්මාණයේ දී භූමිය කෙරෙහි අවධානය යොමු කළ අවස්ථාවන් කිහිපයක් හඳුනා ගත හැක. තෝරා ගත් භූමියේ ඇති ස්වභාවික උස් වැටි තීර වැව් බැම්මේ කොටසක් ලෙස සම්බන්ධ කර ඇති අවස්ථාවන් දැක ගත හැකි ය. නිදසුනක් ලෙස වංශ කතාවේ සඳහන් වන දීස පාෂාණය

නම් ස්වභාවික පාෂාණ වැටිය; බසවක්කුලම, තිසා හා පෙරිමියන්කුලම ආදී වැව්වල බැම්ම නිර්මාණය සඳහා යොදා ගෙන ඇත.

නිම්නයක පතුලට ජලය ලැබෙන්නේ එය දෙපස ඇති උස් භූමියේ මුදුන් වැටියේ සිට නිම්නය දෙසට ඇති බෑවුම්වලට වර්ෂා ජලය ගලා ඒමෙනි. වැසි කාලවලදී මෙම ජලයෙන් නිම්නය පතුලේ තාවකාලික ඇළ මාර්ග නිර්මාණය වේ. මේ ආකාරයෙන් ලැබෙන ජලය රැස්කර තබාගැනීම සඳහා එම දියපහර හරස් කොට බැම්මක් ඉදි කළ යුතු වේ. එසේ ඉදිකරන බැම්ම, නිම්නයේ ඉහළ කොටසේ ඉදිකරන අතර එමඟින් ජල මට්ටම උස් තත්ත්වයක පවත්වා ගත හැක. නිම්නය පටු නම් වැව් බැම්ම එතරම් දිගට ඉදි කිරීම අවශ්‍ය නොවේ. නිම්නය පළලින් වැඩි නම් වැව් බැම්ම ඉතා දිගට විහිදේ. අක්කර අඩි 110000ක ජල ධාරිතාවක් සහිත මින්නේරිය වැවේ බැම්ම දිග සැතපුම් එකහමාරක් වන අතර අක්කර අඩි 109000ක ජල ධාරිතාවක් සහිත පරාක්‍රම සමුද්‍රයේ බැම්ම සැතපුම් අටහමාරක් පමණ දිගට විහිදේ. පුරාණ වැව් බැම්ම ඊටත් වඩා දිගකින් යුක්ත වූ බවට අදටත් දැකගත හැකි අතර ඊට හේතුව මින්නේරිය වැව් බැම්ම, දෙපස කඳු දෙකක් යා කරමින් නිර්මාණය කර තිබීමයි. සාමාන්‍යයෙන් වැව් බැම්මක් ඉදි කිරීමේ දී උස් බිම් යා කරමින් බැම්ම තැනීම සරල ක්‍රමය වුවත්, එසේ නොවන අවස්ථාවන් නිරන්තරයෙන් දැකගත හැක. නිදසුනක් ලෙස, යෝධ වැවෙහි වැව් බැම්ම ඉදි කිරීම සඳහා කඳු රැළිවලින් ලැබී ඇති දායකත්වය අවම වේ.

තවද වැව ඉදි කරනු ලබන ස්ථානයේ භූමියේ ස්වභාවය ද වැව් බැම්ම නිර්මාණයේ දී වැදගත් වේ. මෙරට මහා පරිමාණ වැව්වල බැම් නිර්මාණය කොට ඇත්තේ පිහිටි භූමියේ ස්වභාවික මව් පාෂාණ තට්ටු මත ය. මින්නේරිය වැව, සොරබොර වැව, ගල්ගමුව වැව හා කවුඩුල්ල ආදි වැව් මේ සඳහා නිදසුන් වේ. කවුඩුල්ල වැව් බැම්ම තිරුවානා නිධියක් මත ඉදිකර ඇත. සාමාන්‍යයෙන් වැව් බැම්ම ඉදි කරනු ලබන්නේ භූමියේ පාෂාණ ස්ථරය වැව තුළට ආනතව තිබෙන ස්ථානය ද අධ්‍යයනය කිරීමෙනි. එවිට, ජලයේ තෙරපුම හේතුවෙන් වැව් බැම්ම තල්ලු වී යාම වළකන අතර පාෂාණ ස්ථරය අතරින් ජලය කාන්දු වීම ද වලකයි.




**වැව් බැම්ම නිර්මාණය කරන ආකාරය හා යොදන අමුද්‍රව්‍ය**

මෙරට සියළුම වැව් සඳහා බැම් නිර්මාණය කොට ඇත්තේ පස්වලිනි. පැරණි ගැමියන් පවසන ආකාරයට වැව් බැම්මකට පස් දමා, අඩිය අඟලකට සිටින සේ තලා තද කර ඇත. ඒ සඳහා කුඩා වැව්වලදී මී හරකුන් ලවා පාගා ඇත. එසේ දමන පස්වල සියළු කුණු රොඩු ඉවත් කර පිරිසිඳු කරවා තිබේ. කලා වැවේ බැම්ම තනන විට පයට සම් බඳන ලද ඇතුන් ලවා පාගවා තද කළ බව පැවසේ. ගැමියන් පවසන්නේ පස් හා වැලි නිසි පදමට මිශ්‍ර කරමින් තට්ටුවෙන් තට්ටුවට තැලීම නිසා වර්ෂාවට පහසුවෙන් ගැලවී සේදී නොයන ලෙස බැම්ම මනා ලෙස තද වන බවයි.

හොලිවුඩ් නගරය ආසන්නයේ ඉදිකළ මල්හොලන්ඩ් ජලාශයේ මුල් ඉදිකිරීම අනතුරුදායක වූ අතර පසුව ජලාශ බැම්මේ පහළ ගංගා නිම්නයේ පස් පුරවා බැම්ම ශක්තිමත් කිරීමට

බලධාරියෝ ක්‍රියා කළහ. මෙම පස් පිරවීමේ ක්‍රමය ලාංකිකයන් ක්‍රියාත්මක කළේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසටත් පෙර සිට ය. එපමණක් නොව එම ජලාශයේ ආධාරක පස් පිරවුම මත වන වගාවක් කිරීමට ද යෝජනා වූ අතර එම ක්‍රමය ලාංකිකයන් විසින් ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ක්‍රියාත්මක කළ ක්‍රමයකි. ලාංකිකයන් වැව් බැම්ම ඉදිකළ අයුරින් ම, ඉදිකළ අනෙකුත් ජලාශවල බැමිද භූ කම්පන ආදියට පවා සාර්ථක ලෙස මුහුණ දුන් අයුරු පිළිබඳව ජාත්‍යන්තරයේ උදාහරණයන් ද ඇත. වැව් බැම්මක් ඉදි කිරීමක් යනු හුදෙක් පස් බැම්මක් ඉදි කිරීමක් නොවන අතර එය ඉදි කිරීමෙන් පසුව ද එහි පැවැත්ම හා ආරක්ෂාව වෙනුවෙන් විවිධ වූ තාක්ෂණිකාංග වැවට එක් කොට ඇත.

**නාරටිය** - වැව් බැම්මක නාරටිය ලෙස සාමාන්‍යයෙන් හඳුන්වන්නේ බැම්මේ ශක්තිමක් ම කොටසයි. මැටි හා බොරළු යොදා සැකසූ මිශ්‍රණයක් මේ සඳහා යොදා ගන්නා ලදි. පළමුව බැම්ම ඉදි කිරීම සඳහා යෝජිත භූමියේ සාමාන්‍ය පස් ආවරණය ඉවත්කර තද පොළව හෝ පාෂාණ ස්ථරය ඉවත් කර ගනි. පසුව ඒ මත ගල් දමා ශක්තිමත් අත්තිවාරමක් සකස් කර ගන්නා අතර පසුව ක්‍රමයෙන් කුඩා ගල් වර්ග හා මැටි යොදා ස්ථරයෙන් ස්ථරය බැම්මේ නාරටිය ඉදි කෙරේ. වත්මන් කොන්ක්‍රීට් බැම්වල නොමැති සියුම් නම්‍යශීලීත්වයක් මෙම මැටි බොරළු මිශ්‍රණයේ පවතින අතර ඒ හේතුවෙන් සුළු භූ චලනවලදී පිපිරී නොයා ඔරොත්තු දීමේ හැකියාව ඇත.

**ආධාරක බෑවුම** - පෙර කී බැම්මේ නාරටිය දෙපසින්, එහි ආරක්ෂාව සඳහා යොදන පස් බැම්මයි. මෙමඟින්, බැම්ම පිටතට තල්ලු වී යාම වැළැක්වෙන අතර බැම්ම ඍජුවම වැසි දියට නිරාවරණය වීම ද වළක්වයි. ඇතුල් පැත්තෙන් ද වැව් දිය, වැව් නාරටියේ ගැටීම වළක්වයි. නමුත් පස් යෙදීමෙන් ඇතුළු පැත්තෙන් සකස් කළ ආධාරක බෑවුම, වැව් දිය හා ගැටී සේදී යාමෙන් බැම්මෙහි නාරටිය යළි පෑදිය හැක. ඒ හේතුවෙන් පස් බැම්ම මත යළි ගල් ආස්ථරයක් එළනු ලබයි. එය රළපනාව නම් වේ.

**අත්තිවාම් වැටි** - වැව් බැම්මක් බිඳී යා හැකි අවස්ථාවක එය පිළිසකර කරනා තෙක් ඒ හරහා ජලය කාන්දුවීම වැළැක්විය යුතු ය. ඒ සඳහා එම ස්ථායට ඔබ්බෙන් තාවකාලිකව බැම්මක් යොදනු ලැබේ. මෙය කිඹුල් වැටි හෝ අත්තිවාරම් වැටි යනුවෙන් හඳුන්වනු ලැබේ. 1957 දී ඇති වූ මහා ගංවතුරෙන් කලා වැවේ බැම්ම බිඳී ගිය අවස්ථාවේ එය පිළිසකර කිරීමේ දී මෙවැනි වැටියක් යොදවා තිබේ. වාර්ෂිකව වැව් බැම්ම ශක්තිමත් කිරීම සඳහා වැව ඇතුලතින් හා පිටතින් වැව් බැම්මට පස් යොදනු ලබයි. එය පංගු කට්ටි කැපීම ලෙස හඳුන්වයි.

**වැව් බැම්මේ හැඩය**

වැව් බැම්මේ හැඩය හා එහි තාක්ෂණය, ඒ ඒ වැවෙහි ප්‍රමාණය හා ස්වරූපය විසින් තීරණය කෙරේ. වැවේ ජල පීඩනය අනුව වැව් බැම්මේ පළල ද, ඊටම වැවේ උන්නතාංශය ද එක්කොට වැව් බැම්මේ හැඩය නිර්මාණය කරයි. ඕනැම වැව් බැම්මක පතුළ පළලින් වැඩිව ද, මුදුන ඊට වඩා පටුවට ද ඉදිකර තිබේ. වැවක වැඩි ජල පීඩනයක් ඇත්තේ ගැඹුරේ බැවින් ඊට සරිලන පරිදි වැව් බැම්මේ පතුළ කොටස මෙලෙස පළලට සාදා ඇත. එය දෙපස එකම ආනතියක් ඇති වන සේ ඉදි කොට තිබෙන අතර එමඟින් වැව් බැම්මේ ඉහළ කොටස අවශ්‍ය පරිදි පටු වීම ද සිදු වේ. බොහෝ විට වැව් බැම්මක් ඉදි කොට ඇත්තේ සරල රේඛාවක ආකාරයට වඩා ක හෝ බ අක්ෂරයේ හැඩයට අනුව ය. වැව ඉදිවන නිම්නයේ හැඩය ද මේ කෙරෙහි බලපා තිබේ. පිහිටි භූමියේ ස්වභාවික තත්ත්වයන් වන කඳුවැටිවල පිහිටීම, භූගත ශිලා තලාවේ පිහිටීම, මතුපිට ගල් පර්වතවල පිහිටීම ආදිය වැවෙහි හැඩය නිර්මාණය වීම කෙරෙහි ඍජුවම බලපෑ නමුත් එසේ නොවූ අවස්ථාවන් ද මෙරට වාරි

කර්මාන්තය තුළ දැක ගන්නට ඇත. නිදසුන් ලෙස, යෝධ වැව හා ආකට්ටිමුරුප්පු වැව. කලා වැවේ වැව් බැම්ම දඟරාකාර ස්වරූපයක් ගනී. යෝධ වැවේ වැව් බැම්ම චාපාකාර ස්වරූපයක් ගන්නා අතර කන්තලේ වැව් බැම්ම සෘජු ය. බලලු වැවේ වැව් බැම්ම ඇතුළට නෙරා ගිය ස්වරූපයක් ගන්නා අතර රාජාංගන වැව් බැම්ම බැඳ ඇත්තේ මධ්‍ය පර්වතයක් ඉලක්ක කර ගනිමිනි. මෙම කරුණු අනුව පෙනී යන්නේ සම්පූර්ණ වැවක් නිර්මාණය කිරීමේ තාක්ෂණය තැනට හා ප්‍රදේශයට සුදුසු සේ ක්‍රමානුකූලව වෙනස් කොට ඇති බවයි.



උපුටා ගන්නා ලදී. (උඩවත්ත, 2016: 18)

වැවක වැව් බැම්මේ උස හා එහි රඳවා තැබීමට නියමිත ජලස්කන්ධය අතර යම් ගණිතමය සබඳතාවයක් ඇත. එම සබඳතාවය බිඳී ගිය සෑම අවස්ථාවකම වැව් බැම්ම බිඳී යයි. නිදසුනක් ලෙස, ලොස් ඇන්ජලීස් හී ශාන්ත ෆැන්සිස් වේල්ල, නූතන තාක්ෂණය යොදා ඉදිකර වසර දෙකකට පසු මිනිස් ජීවිත හාරසිය පනහකට අධික සංඛ්‍යාවක් බිළි ගනිමින් විනාශ වී ගොස් ඇත්තේ, ඉහතින් පැවසූ සබඳතාවය පිළිබඳව නොසලකා හැර ඇති හෙයිනි. ලොකු කුඩා මෙන්ම මහා පරිමාණ වැව් දහස් ගණනක් ඇති ලංකාව තුළ එවැනි පුවත් අසන්නට නොලැබෙන්නේ ඈත අතීතයේ මුතුන්මිත්තන් සතුව තිබූ තාක්ෂණික දැනුමේ විශිෂ්ටතාවය නිසාවෙනි.

**නිගමනය**

*" නූතන කිසි උපකරණයකින් නොපැරදවිය හැකි වූ සියුම් නුවණින්ම විශාල වැ කණ්ඩි සහ භූමි නිර්මාණය ද සලකුණු කර තිබේ... "* යනුවෙන් හෙන්රි පාකර් ඔහුගේ වාර්තාවක දක්වා

ඇත. 1980 දශකයේ දී මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාදුරු ඔය ජලාශය නිර්මාණය කිරීමේ දී පැරණි මාදුරු ඔය වැවේ පුරාණ සොරොව්ව මතුවීම, සිංහලයා සතු සූක්ෂම තාක්ෂණික දැනුම මොනවට විදහා පායි. එම පැරණි සොරොව්ව මතුව ඇත්තේ නවීන තාක්ෂණික ක්‍රම මගින් මැනුම් කර මාදුරු ඔය ජලාශයේ සලකුණු කළ ස්ථානයේ ම වීම විශිෂ්ට ය. එය ඇසීම පවා ආඩම්බරයකි. තාක්ෂණය අතින් අද ලොව දියුණු යැයි පවසන කිසිදු රටකට ලංවිය නොහැකි සේ අද්විතීය තාක්ෂණික දැනුම් සම්භාරයක් ලාංකේයන් සතුව පැවතුනේ වසර දහස් ගණනකටත් පෙර සිට ය. ඒ සඳහා වූ ජීවමාන නිදසුන්, වාරි කර්මාන්තය සතුව අදටත් අප රට තුළ නිරූපදිතව ඇත.

**පරිශීලන.**


අඹන්වෙල. සී., 2015ග ***ලංකාවේ වාරි තාක්ෂණය හා එහි තිරසාරත්වය,*** https://sinhala.archaeology.lk [2022-01-03]

උඩවත්ත, ඒ. එම්., (2016). ***වැකම් පෙළහර,*** ඃ කළුතර.

විතානච්චි. සී. ආර්., (2017). ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය,*** ඃ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විතානච්චි. සී. ආර්., (2006)ග ***ශ්‍රී ලංකාවේ වාරි භූ විද්‍යාත්මක, පාරිසරික පසුබිම සහ පුරාණ වාරි කර්මාන්තය,*** https://scholar.google.com [2022-03-19]

ස්වර්ණසිංහ, කේ. එම්. අයි., (2006). ***අපේ වැවෙන් පැන් දෝතක්,*** ඃ වාග ප්‍රකාශණ, පන්නිපිටිය.

හේරත්, එච්. එම්. ජේ. කේ., (2010). ***විශිෂ්ටත්වයෙන් පිරිපුන් ඉපැරණි වාරි තාක්ෂණය,*** ඃ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කොළඹ 7.

## 17. පුරාණ වාරි කර්මාන්තය හා සම්බන්ධ බදු හා නීතිරීති පිළිබඳව සිදු කරනු ලබන අධ්‍යයනයක්

අයි. ඒ. යූ. පුෂ්පමාලි

### හැඳින්වීම

කෘෂිකාර්මික රටක් වූ ශ්‍රී ලංකාවේ හුදු දෛනික පරිභෝජනයෙන් ඔබ්බට ගොස් ගොවිතැන සඳහා ජලය අත්‍යවශ්‍යය සාධකයක් විය. වසර දහස් ගණනකට පෙර ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයට මුල් පදනම වැටෙන්නේ ද ජලයෙන් සශ්‍රීක වූ සරු භූමිය නිසාවෙන්ම ය. ස්වයංපෝෂිත රාජ්‍යයක් බිහි කිරීමේ අරමුණින් යුතුව හෙළ රජවරු උසස් තාක්ෂණික අංගවලින් හෙබිව අනාගතයටත් ශක්තිමත්ව පවත්නා අයුරින්, ආරක්ෂිත, අගනා වාරි පද්ධතීන් රාශියක් නිර්මාණය කළාහු ය.

රාජ්‍යයක වියදම් පියවා ගැනීම සඳහා රජය මගින් බදු අය කර ගනු ලබන අතර ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා රජය මගින් විවිධ සේවාවන් පවත්වාගෙන යනු ලැබේ. ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම රාජ්‍ය පාලකයාගේ යුතුකම බව දීඝ නිකායේ සඳහන් ය. මහජනතාව විසින් රජයට බදු ගෙවීම සහ ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගැනීම බුද්ධ කාලීන සමාජය තුළ ද සිරිතක් වශයෙන් පැවති බව තවදුරටත් සූත්‍ර දේශනාවන්ගේ සඳහන් ය. වාරි මාර්ගවල උපයෝගීතාවෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාගත් අතීත ගොවීන් ඒ ලබාගත් ජලය සඳහා රජයට බද්දක් ගෙවූ බව සෙල්ලිපිවල මෙන්ම වංසකතා සාහිත්‍යයේ ද දැක්වේ. එවන් වූ වාරි කර්මාන්තය සම්බන්ධ බදු හා නීතිරීති ඇතුළත් නෛතික පසුබිම පිළිබඳ මෙම ලිපිය තුළින් විවරණය කරනු ලැබේ.

### ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ක්‍රමවේදය වශයෙන් ද්විතීය මූලාශ්‍රය පරිශීලනයට අදාල පුස්තකාල ගවේෂණය සඳහා යොමු වූ අතර ඒ ඇසුරින් විවිධ ග්‍රන්ථ, ලිපි, අධ්‍යයනය කරමින් දත්ත ලබා ගන්නා ලදී.

### විමර්ශනය

***දිය ගොඩ දෙකම රජ සතුය*** යන සිද්ධාන්තය අනුව වාරි මාර්ගවලින් ලබා ගන්නා ජලය සඳහා රජුට බද්දක් ගෙවීමට අනුරාධපුර යුගයේ ආරම්භයේ සිටම සිදු වූ බව වංසකතා හා සෙල්ලිපි අධ්‍යයනයෙන් හෙළි වේ. රජවරුන් මෙන්ම ධනවත් පුද්ගලයින් විසින් වැව් තනවා කෘෂිකාර්මික කටයුතුවලට සහයෝගය දුන් අතර එම වැව් පරිහරණය කරන්නන් සඳහා බදු අය කරන්නට විය. මෙසේ අය කරන්නා වූ බදු අතරින් ශිලා ලේඛනයන්හි සඳහන් වන එක් බද්දක් ලෙසට **දකපති** බද්ද පෙන්වා දිය හැකිය. මහාවංසයෙහි දකභාග යනුවෙන් සඳහන් වන අතර (සංස්.) උදකප්‍රාප්ති, (පාලි) උදකපත්ති/ උදකපතිය/ දකපති/ දකපෙති යන නම්වලින් දක්වා තිබේ. මෙම **දකපති** යන වචනය පිළිබඳ වියතුන් විවිධ වූ අරුත් සපයා ඇත. මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කර ඇති ගෝල්ඩන් ස්මිත් පඬි පෙන්වා දී ඇත්තේ **දක** යන්න **දැකීම** යන අර්ථයත් **පති** යන්නෙන් **පසුව** යන අර්ථයත් එනම් මෙයින් දැකීමෙන් පසුව යන අරුත ගෙන දෙන බවයි. **දකපති** යන වචනය පිළිබඳ මුලර්ගේ සහ ප්‍රැන්කේගේ අදහස වනුයේ **දකපත** යන වචනය **පති** යන භාවක්‍රියා පදය ඇතුළත්ව පද දෙකකින් සැදුම්ලත් වචනයක් බවයි. මේ පිළිබඳව බ්‍රෝයර්ගේ අදහස වනුයේ සකු බසෙහි **දක්ෂම්** යන්න **දක** යන්නද **ප්‍රති** යන පදයෙන් **පති** යන පදය ද බිඳී එන්නට ඇති බවයි. ඒ අනුව දකපති යන්නෙහි අදහස දක්ෂ, ප්‍රවීණ යනුවෙන් පැහැදිලි කළ හැකි බව ඔහුගේ අදහසයි.

**දකපති** යන්න නාම පදයක් ලෙස පෙන්වා දෙන වික්‍රමසිංහ මහතා සිය තහවුරු කිරීම සඳහා නිදසුන් වශයෙන් සෙල්ලිපි පාඨයන් දක්වා ඇත.

**"සම සතර වච්සර දකපති කණය බදිපිත"**

මේ අනුව මෙම නාම පදය සංස්කෘත භාෂාවට අනුව අර්ථ තුනක යෙදිය හැකි බව වික්‍රමසිංහ මහතාගේ අදහසයි. එනම් දක්ෂපති (having seen), උදකපති (lord of water) සහ උදක ප්‍රාප්ත යනුවෙනි. මේ අතුරින් සෙල්ලිපිවල සඳහන් තොරතුරු සමඟ උදක ප්‍රාප්තිය හෙවත් ජල බද්ද යන අදහස බෙහෙවින්ම ගැළපෙන බව ඔහුගේ අදහසයි. ජල බද්ද සෑම කන්නයක දී අයකර ගන්නා ලද බව සිතුල්පව්වෙන් ලැබුණු පළමුවන සියවසට අයත් පර්වත ලිපි දෙකකින් පැහැදිලි වෙයි. ජල බද්ද අය කරන ලද්දේ මුදලින් ද නැතහොත් ලැබුණු අස්වැන්නෙන් ද යන්න පැහැදැලි නැත. ඉන්දියාවේ දිය බද්ද අය කරගන්නා ලද ක්‍රමය මෙහි දී අනුගමනය කරන්නට ඇතැ'යි සිතිය හැකිය. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයෙහි සඳහන් වන පරිදි අතින් දිය ඇද ගොවිතැන් කරන්නන් අස්වැන්නෙන් පහෙන් කොටසක් ද කරින් දිය ඇද ගොවිතැන් කරන්නන් අස්වැන්නේ හතරෙන් පංගුවක් ද ජල යන්ත්‍ර මාර්ගයෙන් ජලය ලබා ගනිමින් ගොවිතැන් කරන්නන් අස්වැන්නෙන් තුනෙන් හෝ හතරෙන් පංගුවක් ද දිය බදු වශයෙන් රජයට ගෙවිය යුතු විය. මෙම විස්තරය අනුව පැහැදිලි වන්නේ ඇළ, දොළ, ගංගා, විල්, තටාක, වැව්, අමුණු ආදී ඕනෑම ජලාශයක ජලය ගොවිතැන් සඳහා යොදාගැනීම වෙනුවෙන් රජයට බද්දක් ගෙවීමට එකල ගොවීන්ට සිදු වූ බවයි.

ඓතිහාසික මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කළ විට මණිකාර ගමේ වැවක් කර වූ චන්ද්‍රමුඛ ශිව රජු (ක්‍රි.ව.52-60) ඒ වැව ඉසුරුමුණි විහාරයට පූජා කළ අතර රජුගේ බිසවට එම ගමින් ලැබුණ බද්ද ඇය විසින් විහාරයට පූජා කළ බවත් සඳහන් වේ. තවද වසභ රජු (ක්‍රි. ව. 66- ක්‍රි. ව. 110) ඇළහැර නම් වූ ස්ථානයේ දකභාගය මුංවෙළ විහාරයට පූජා කළ බව සඳහන් වේ. වසභ රජුගේ කාලයට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් හමුවන මඩවල ගිරිලිපියේ **අමරගලක වවිය දකපති බිකු සගහටය දිනහ** යනුවෙන් සඳහන් වීමෙන් අමරගලක නම් වැවෙහි දකපතිය භික්ෂූන් වහන්සේට ලබා දුන් බවට තොරතුරු අනාවරණය වේ. කොතලකිඹියාව ලෙන් ලිපියක දකපති යනුවෙන් සඳහන් නොවුණ ද **දකබරි ගමක වවිය උවසක දතහ පති** (දකබරි ගමේ වැවේ උපාසක දත්තගේ ප්‍රාප්තිය ලෙනට) යනුවෙන් සඳහන් වී ඇත්තේ ද මෙම තත්ත්වය යි.

අනුරාධපුර යුගයේ දී රජු සතු මෙන්ම පෞද්ගලික අය සතුව වැව්, අමුණු, ඇළ මාර්ග, තිබූ බවට සාධක ඇත. ඒ වැව් වෙනුවෙන් ගොවීන්ගෙන් අය කළ බදු වැව් හිමියන්ට අයත් වූ අතර සමහරුන් ඒවා විහාරාරාමවලට පූජා කර ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ගල්ගමුව ලෙන් ලිපියක වඩ්ඩමාන ගමේ ප්‍රාප්තිය (බද්ද) ද, වැව ද අභය රජු විසින් මහා විහාරයට දෙන ලදි'යි යනුවෙන් සඳහන් වීම ද විශේෂ අවස්ථාවකි.

වාරි මාර්ගවලින් දිය බද්දට අමතරව ඒවායෙන් අල්ලා ගන්නා මත්ස්‍යයන් වෙනුවෙන් අය කළ මත්ස්‍ය බද්ද එනම් **මතෙර මඣබක** නම් බද්දක් ගැන සඳහන් වේ. මහරත්මලේ සෙල්ලිපියේ සඳහන් **මජිබක** යන්නට අරුත් සපයන වික්‍රමසිංහ මහතා මජිබක යන්නෙන් **මජ්බුක** නම් තෙරනමක් පිළිබඳව අදහස් ඉදිරිපත් කරයි. මුලර් මහතා ද වික්‍රමසිංහ මහතාගේ මතයම අනුමත කර ඇත. එහෙත් මෙම මතය ප්‍රතික්ෂේප කරන පරණවිතාන මහතා **මජිබක** යන්නෙන් **මත්ස්‍ය භාගය** හෙවත් මාළු ඇල්ලීමෙන් ලැබෙන කොටස යන අදහස ගෙන දෙන බව සාධක සහිතව ඉදිරිපත් කරයි. **මජිබක** යන්න සෑම තැනකටම යෙදී ඇත්තේ වැවක් පිළිබඳව සඳහන් කිරීමෙන් අනතුරුව බව පවසන පරණවිතාන ශූරීහු මජිබක යන්නට පෙර මතෙර, මතිර, මතර යන ශබ්දවලින් එකක් සෑමවිටම යෙදී ඇති බවක් පවසයි.

ඒ අනුව මතෙර, මතිර, මතර යන වචන සංස්කෘත මාතෘකා සහ මාතිකා යන පාලි වචනයන්ගෙන් බිඳී එන්නක් විය හැකිය යන අදහස ඉදිරිපත් කරයි. මාතෘ යන්න වෛදික සංස්කෘතියෙහි **නදී** යන අර්ථය ගෙන දෙයි. **කා** යන්න ස්වල්පාර්ථයෙහි යෙදේ. ඒ අනුව මාතෘකා යනු කුඩා නදියකි. එනම් දිය ඇළකි. මජ්ඣක යනු මත්ස්‍ය භාගයයි. ඇළවල්වල මසුන් ඇල්ලීමෙන් ලැබෙන ආදායම වෙනුවෙන් අය කරන ලද බද්ද මතෙර මජිබක යනුවෙන් සඳහන් කරන ලද බව පරණවිතාන මහතාගේ අදහසයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පෙරියකඩු විහාර ගිරි ලිපියක **තුලහක මහවවි මතෙර මජිබික** යනුවෙන් ද එහිම තවත් ලිපියක **චිගරවලිය වවිය මතර මජි-බක** යනුවෙන් ද කණිට්ඨතිස්ස රජ සමයට අයත් රුවන්වැලිසෑය පුවරු ලිපියක **මතෙර මජිබකි** යනුවෙන් ද සඳහන් වේ.

එවන් ආකාරයෙන් විහාරස්ථානවල අභිවෘද්ධිය තකා මෙකී්වා වූ මත්ස්‍ය බද්ද පූජා කළ බවට ශිලා ලේඛනවල සඳහන් වුව ද බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළා වූ පාරිශුද්ධ දහමේ සත්ත්ව ඝාතනය තරයේ පිටු දැක තිබීම හේතුවෙන් මෙම කාරණය පිළිබඳ පරස්පර විරෝධී අදහස් ගොඩනැගෙනු ඇත. දෙවන සේන රජුගේ අභය වැව ටැම් ලිපියෙහි සඳහන් වන පරිදි රජු විසින් වැවේ සිව් කොනේ කණු සතරක් සිටුවා එහි මසුන් මැරීම තහනම් කරන ලදී. මෙම ශිලා ලිපියට අනුව එම නීතිය උල්ලංඝනය කළ අය අත්අඩංගුවට ගෙන ඔවුන් ලවා වැව් මෙහෙ කරවීමට කටයුතු යොදා තිබුණි. මෙම ශිලා ලිපියෙහි අභය වැවේ මසුන් මැරීම තහනම් කර ඇති ආකාරයෙන් පැහැදිලි වන්නේ වෙනත් වැව්වල මසුන් මැරීම තහනම් නොවූ බවත් මෙය ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානය වූ මහාවිහාරය අසල පිහිටා තිබීම හෙයින් මෙම ආඥාව බලපාන්නට ඇති බවයි.

අනුරාධපුර යුගයේ අග භාගයේ දී දිය බද්ද සඳහා භාවිතා කොට ඇත්තේ **පිසඹුරුවත** යන වචනය බව පෙනේ. නවවන හා දසවන සියවසට අයත් සෙල්ලිපි දෙකක මේ වචනය යෙදී ඇත. එමෙන්ම මෙය පොළොන්නරුව යුගයේ දී නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපි කිහිපයකම සඳහන් වී ඇත. පෙර සඳහන් කළ **මතෙර මජිබක** යන්නට **පිසඹුරුවත** යන්න ආචාර්ය පරණවිතාන මහතා තේරුම් දී ඇත්තේ මසුන් සඳහා අය කළ (මච්ඡ භාග) බද්දක් ලෙස ය. නිශ්ශංකමල්ල රජුගේ පොළොන්නරු බද්ධ සීමා ප්‍රාසාදයේ ඇති ටැම් ලිපියක එන **'රන්තිසැ මිණිහොරු ගඟතලා, පදී ඇතුළු වූ තුන් රජයෙහි නොඑක් මහාවැතැනැ අශේෂ ප්‍රාණීන්ට අභය දී නොමරන නියායෙන් සම්මත කොට පිසඹුරුවත ද සෙහෙන් කොටා ගත් තැනැට ද සැම දවසටමැ කැති අඩහැර'** යන පාඨයෙන් පැහැදිලි වන්නේ **පිසඹුරුවත** යනු දිය බද්දක් බවයි.

වාරි කර්මාන්තයේ නෛතික පසුබිම පිළිබඳ සාකච්ඡාවට ලක් කිරීමේ දී එහි නඩත්තු කටයුතු භාරව සිට ඇති නිලධාරීන් හා ඒ සම්බන්ධ කාරණා ද සැකෙවින් ගෙනහැර පෑම මනාය. වැව් නඩත්තුව සඳහා **වැරි** නමින් හඳුන්වා ඇති ශ්‍රමය භාවිතයට ගත් බව සෙල්ලිපිවලින් අනාවරණය වෙයි. **වැරි** යන්න වැව් පිළිබඳව සඳහන් නොවන අවස්ථාවල ද සෙල්ලිපිවල යොදා ඇති පදයකි. මේ අනුව **වැරි** යන පදය වාරි මාර්ග කටයුතු සඳහා ලබාගත් ශ්‍රමය හැඳින්වීමට පමණක් නොව ඊට වඩා පුළුල් අර්ථයකින් භාවිත කළ බව පෙනේ. රජයට රටවැසියන් විසින් නොමිලේ නිශ්චිත දින ගණනක් ලබා දිය යුතු වූ ශ්‍රමය හැඳින්වීමට **වැරි** යන පදය යොදා ඇත. මෙම ශ්‍රමය වාරි මාර්ග නඩත්තුව සඳහා ද භාවිතයට ගෙන ඇති බව පැහැදිලි ය. **'කුඩින් කළ වරජක් ඇත ගම් සිරිත් දඩ් කිරා කිරු දඩ් මිනැ ඇකැ අවට සොළොස් රියන් ගැම්බුරැ රියන් කබුළ් බැගින් ගෙනැ වැව් මෙහෙ කැරැවිය යුතු නොකළ කිරු දඩ් ගතැ යුතු'** යනුවෙන් සඳහන් වේ. යම් යම් වැරදිවලට දඩුවම් වශයෙන් වැව්වල වැඩ කිරීමට සිදු වූ බවත් මෙමගින් පැහැදිලි වේ. දඹුල්ලෙන් ලැබී ඇති ලෙන් ලිපියක **අණනික තිශ** යනුවෙන් සඳහන් වේ. සෙනරත් පරණවිතාන ශූරීන්ට අනුව **අණනික** යනු

වාරි ඉංජිනේරු තනතුරක් වන්නේ ය. එනිසා තිස්ස නැමති වාරි ඉංජිනේරුවා අණනික තිස යනුවෙන් හඳුන්වා ඇත. කෑගලු දිස්ත්‍රික්කයේ මාපිටි විහාරයේ ලෙන් ලිපියක **අඩිකය උතර** යනුවෙන් සඳහන් වී තිබේ. එයින් ප්‍රකාශ ඇළ මාර්ග භාරව සිටි නිළධාරියෙකු සම්බන්ධවයි. දෙවැනි සේන රජු කාලයට අයත් මිහින්තලේ සෙල්ලිපියක **වැවැජෑරුම්** නම් නිළයක් දැක්වෙන අතර ඉන් ප්‍රකාශ වන්නේ වාරි කර්මාන්තයට අයත් විධායක නිළධාරියෙකු වශයෙන් සැලකේ.

නවවන-දසවන සියවස්වලට අයත් අත්තාණි ටැම් ලිපිවල සඳහන් වන 'වියොවදාරන්නන්' වාරි කර්මාන්ත පර්යේෂකයන් විය හැකි බව එච්. ඩබ්. කොඩ්රින්ටන් උපකල්පනය කරයි. එම කාලයටම අයත් ශිලා ලිපි කිහිපයක සඳහන් *ගංග්කඩත් වැඩි* හා *වැව් මෙහෙ* යන වදන්වලින් ප්‍රකාශ වන්නේ වාරිමාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා ජනතාවගෙන් ලබා ගන්නා ලද රාජකාරි ශ්‍රමයයි. පොළොන්නරු රජමාළිගා ටැම් ලිපියේ සඳහන් වන **පෙරවරිබුද්** නැමැති නිළධාරියා ඇළ මාර්ගවල ජලය කෙත්වතුවලට බෙදී යන සීමා නිර්ණය කරන්නෙකු විය හැකි බව එච්. ටී. බස්නායක ප්‍රකාශ කර තිබේ. අතුරුපොළයාගම අත්තානි කණු ලිපියේ **දොළොස් මහා වැතැන්** නම් වූ නිළධාරියෙකු පිළිබඳ සඳහන් වන අතර ඔහුගේ රාජකාරිය වී ඇත්තේ වැව් තැනවීම සඳහා ගැමියන්ගෙන් ශ්‍රමය ලබා ගැනීමයි. එනයින් පැහැදිලි වන්නේ එක්තරා ආකාරයක වැඩවසම් ක්‍රමයක් වාරිකර්මාන්තය පදනම් කරගෙන ක්‍රියාත්මක වී ඇති බවය. දහනවවන සියවසට අයත් ටැම්ලිපි කිහිපයකම **තලා ඇරැක්ක** හා **තලා ඇරැක්ක වැදෑරුම්** නම් වූ නිළධාරීන් දෙදෙනෙකු ගැන සඳහන් වී ඇත. මෙහි එන **ඇරැක්** යන්නෙන් ආරක්ෂක තනතුරක් ගැන කියවෙන හෙයින් **තලා ඇරැක්ක** යනු වාරිමාර්ග ආරක්ෂයෙකු බව පැහැදිලිය. ඒ අනුව **තලා ඇරැක්ක වැදෑරුම්** නමින් හැඳින්වුණු නිළ නාමය ජල සංරක්ෂණය පිළිබඳ විධායක තනතුරක් විනැ'යි සිතිය හැකිය.

වැව හා සම්බන්ධව සාකච්ඡා කිරීමේ දී වැව හා නොකළ යුතු ක්‍රියාවන් වැව් තහංචි ලෙසට සඳහන් කළ හැකිය. මේවා සාමාන්‍ය ව්‍යවහාරයේ නීති නොඑසේ නම් අණ ලෙසට දක්වන අතර ඇතැම්හු අණ බණ ලෙසටත් මේවා වහරති. මෙකී තහංචි පැනවීම **අණ බෝල බැඳීම** ලෙසට ද  හඳුන්වයි. එහි දී මිනිසාගේ උසට සරිලන දිවි කදුරු ඉත්තක් මුදුනේ අතු තුනක් ඇති බොල්පනා කොළ අතු මිටියක් බඳී. මෙය යම් තැනක සිටුවීමෙන් තහංචිය පැනවේ. මෙම කර්තව්‍යය කුකුළා හැඬලීමට පෙර සිදු කරනු ලැබේ. සාමාන්‍යයෙන් අණ බෝල බඳිනු ලබන ස්ථානයන් වන්නේ වැ කන්ද, අමුණ, වැව් පිටවාන ආදී වූ ස්ථානවලයි. නිදසුන් වශයෙන් දැක්වුවහොත් අනවසරයෙන් සොරොව්වෙන් ජලය ලබා ගැනීම තහනම් කෙරෙන නියෝගය සොරොව්ව අසල අතුමිටියක් සිටුවා එහි බැදීමෙන් සංකේතවත් කරනු ලබයි. වැවේ නපුරු කිඹුලන්ගෙන් ප්‍රවේසම් වීම සඳහා වැවේ ගැඹුරට නොයා යුතුය යන තහංචිය සංකේතවත් වන්නේ රක්ත වර්ණ මල් මිටියක් කණුවක බැඳ වැව් ගැඹුරේ පිටට පෙනෙන පරිදි සිටුවීමෙනි. අනවසරයෙන් මාළු ඇල්ලීම තහනම්ය යන නියෝගය බොල්පනා අතුමිටියක් කණුවක බැඳ වෑ මංකඩ සිටුවීමෙන් අඟවයි. මීට අමතරව වේල්ල කපා ජලය ලබා ගැනීම, ඕලු, නෙළුම් වැනි අල හෑරීම වැළැක්වීම, වියළි කාලයේ කුඩා මසුන් ඇල්ලීම වැළැක්වීම වැනි කාර්යයන් සඳහා ද අණබෝල බැඳීම තහංචිය පැනවේ.

අල්ලායි ටැම් ලිපිය **අවුණට් මීවුන් නොගන්නා ඉසා** යනුවෙන් අමුණ හෝ වේල්ල මතට ගවයන් නොගත යුතු බව දක්වා තිබේ. ගවයන් ඒ මත ගමන් කිරීමෙන් එය බාදනය වීම වැළැක්වීම මෙමඟින් අපේක්ෂා කර ඇත. සමන්තපාසාදිකාවේ වැව් නඩත්තුව හා පවත්වාගෙන යාම සම්බන්ධ මෙවැනි නීති අන්තර්ගත ගමකට ඔයකින් ජලය ගලා ඒමට බාධා නොකළ යුතු බව කොළඹ කෞතුකාගාර ටැම් ලිපියේ සඳහන් ය.  සය වන මිහිඳු රජුගේ වෙස්සගිරි ශිලා ලිපියෙහි තිසා වැවේ ජලය බෙදාහැරීම සම්බන්ධයෙන් වූ වියවුලක්

නිරාකරණය කිරීම සඳහා පනවන ලද නීති ඇතුළත් වේ. වෙස්සගිරි විහාරයට අයත් කුඹුරු කරිස 144කට ජලය සැපයිය යුතු ආකාරය මෙහි නිශ්චිතව ම දක්වා තිබේ. මෙසේ වැවෙන් නිකුත් කළ ජලය එම කුඹුරු, රන්මසු උයන, කෙල ගෙය, උයන් තෙය, මානෙල් තෙය යනාදිය සඳහා බව දක්වා ඇත. භික්ෂූන් කොළොම්බ ඇළට ජලය ගලා යාමට සැලැස්වීම නොකළ යුතු බවත් මෙහි දැක්වේ.

වැව් සම්බන්ධ කොට ගනිමින් මිනිසා තුළ සමගිය සමාදානය ඔපවත් කරනු වස් අතීතයේ වැවෙන් ජලය ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධව බුද්ධඝෝෂ මාහිමියන් මහැඟි සටහනක් දක්වා ඇති අතර අප ප්‍රස්තුතයට ඔබින කරුණු බිදක් අප එතුළින් උපුටා ගෙන මෙසේ දක්වාලමු.

**"සියලු දෙනාටම පොදු යම් වැවක් ඇත්නම් ඒ වැවේ ජලය සියලු මිනිසුන්ම හිමිකම් කියනු ලබයි...... නියං කාලයෙහි දිය හිඟ වූ කල්හි පමණක් වාරයෙන් වාරයට දිය දෙති. දිය වාරය පැමිණි කල්හි යමෙක් දිය නොලබයිද ඔහුගේ ගොයම් මැලවෙයි. යම් කිසිවෙක් අනුන්ගේ කුඩා ඇළෙන් හෝ කුඹුරෙන් හෝ තමාගේ හෝ අනුන්ගේ හෝ ඇළට හෝ දොළට හෝ කුඹුරට හෝ සොර සිතින් දිය ඇතුළු කරවයි ද කැලැව පැත්තට හෝ ගලා යන්නට සලසයි ද ඔහුට වරද පැමිණේ. යම් කිසිවෙක් මගේ දියවරය බොහෝ කලෙකින් වන්නේ ය. මේ ගොයමද මැලිවෙතැයි අනුන්ගේ කුඹුරට ඇතුළුවන දිය ඒ ඇතුළුවන මඟ වසා තමාගේ කුඹුරට ඇතුළු කරවයි නම් වරදමය. ඉදින් ජලය වැවෙන් පිටවන්නට පෙර හෝ අනුන්ගේ ඇළ කටට පැමිණෙන්නට පෙර හෝ ගලා එන දිය අනුන්ගේ කුඹුරට නොපිවිස තමාගේම කුඹුරට ඇතුළුවන පරිද්දෙන් වියළි ඇළම තැනින් තැන බඳියි ද ජලය නික්මෙන්නට පෙර බැන්දානම් යහපති. පිටවූ පසු බැන්දා නම් දඬ ගෙවිය යුතුය....."**

මෙය වාරි කර්මාන්තය හා බැඳි නීතිමය පැතිකඩ පිළිබඳ අවබෝධ කරගැනීමට මනා රුකුලක් සපයන බව පැහැදිලි ය.

නීතිමාලාවෙන් ඔබ්බට ගිය ගැමියන්, ඔවුන් විසින්ම සම්පාදනය කරගත් රීති මාලාවක් ද අතීත වාරි සංස්කෘතිය තුළ මුදුන්පත්ව ඇත. වැවට බැසීමේ දී ඔවුනොවුන් තමන්ට සිතැති ආකාරයට බැසීම සිදු නොකරයි. ඔවුනොවුනගේ විවිධ වූ කාර්යයන් සඳහා විවිධ මංකඩවල් වෙන් වෙන් වශයෙන් ඔවුන් විසින්ම නිර්මාණය කර ගෙන තිබිණ. ස්නානාය සඳහා නාන මංකඩ, පානය සඳහා බොන මංකඩ, රෙදි සේදීම සඳහා රදා මංකඩ වශයෙනි. කිසි අවස්ථාවක එකී මංකඩ වැරදි ආකාරයකට භාවිතා නොකිරීමට ඔවුන් වගබලා ගත යුතුය. වැව් ජලය ගැමියන් එදිනෙදා දෛනික කාර්යයන් උදෙසා පරිභණය කිරීමේ දී වැව දිව්‍යමය වස්තුවක් සේ සලකා කටයුතු කිරීමට නිතැතින්ම පියවර ගත්තාහ. ගම් වැසියෝ කිසිවිටක රක්ත වර්ණ ඇඳුම් ඇඳගෙන වැව් බැම්ම උඩින් ගමන් නොකළ යුතු විය. කුඩයක් ඉහළාගෙන වැව් බැම්ම උඩින් ගමන් කිරීම සිදු නොකළ යුතු විය. වැව අසලින් ගමන් කරන අවස්ථාවක කරෙහි තුවායක් හෝ සළුවක් ඇත්නම් එය අතට ගත යුතුය. ගැමියන් වැව් කන්ද මතින් කිසිදු අවස්ථාවක මළසිරුරක් ගෙන නොයති. මක් නිසාද යත් වැව යනු පාරිශුද්ධ වස්තුවක් වන අතර එය කිසිවිටකත් කිල්ලකට අසු නොකළ යුතුය. කෘෂිකාර්මික දිවියක් ගත කළ ජනයාගේ දිවිය වැව මතම පදනම් වූවක් නිසා හෙයින් වැව දෙවියන්ට සමාන වස්තුවක් සේ ඔවුන් ඇදහීම පුදුමයට කරුණක් නොවේ. එම නිසාවෙන් ම රජුගේ පටන් සුළු ජනයා දක්වා ම වාරි කර්මාන්තයට මුල් තැනක්, විශේෂ ගෞරවයක්, අවධානයක් ලබා දෙන්නට ඇත.

**නිගමනය**

ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ ශ්‍රී ලාංකිකයන්ගේ අතීත ශ්‍රී විභූතිය විදහාලනු වස් වසර දහස් ගණනින් පශ්චිම වර්තමානය තුළ දී මෙන්ම අනාගතය උදෙසාත් සුරක්ෂිත වාරි උරුමය හා බැඳුණු ඒ හා සම්බන්ධ අතීත නීතිරීති මාලාවන් මෙන්ම එකල ශ්‍රී රාජ්‍යයන්ගේ සුබ සිද්ධිය උදෙසා මෙන්ම රාජ්‍ය ආඥාවන් උදෙසා වාරි කර්මාන්තයන් හරහා රජයට එක් කරගත් බදු පිළිබඳවත් වර්තමානයේ දී නඩත්තුවෙන් බැහැරව සිඳීයන වාරි පද්ධතීන්ට සාපේක්ෂව අතීත මානවයා දේවත්වයෙහි ලා වාරි කර්මාන්තයන් සුරැකි අපූර්වත්වය යථෝක්ත කරුණු විග්‍රහයන් අවබෝධයෙන් මනාව පසක් කොට ගත හැකිය.

**පරිශීලන.**


ඉන්දික, එම්. කේ. ඒ. (2012) ***අනුරාධපුර යුගයේ සමාජ ක්‍රමය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය** (පළමුවන කොටස), අනුරාධපුර යුගය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

දිල්හාරා, එච්. (2020.12.16) ***හෙළදිව වාරි සංස්කෘතිය***, www.sinhala.slguardian.lk

දිවාකර, ඒ. අයි. (2015) ***සෙල්ලිපි විමසුම***, සම්භාව්‍ය ප්‍රකාශන, කැළණිය

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, ***මහාවංසය*** සිංහල, සංස්. (1967) කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාඛාව

ස්වර්ණසිංහ, කේ. එම්. අයි. (2005), ***අපේ වැවෙන් පැන් දෝතක්***, වාග ප්‍රකාශන, පන්නිපිටිය

සිරිවීර, අයි. (2004) ***ශ්‍රී ලාංකේය ඉතිහාස තරංග***, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ

සෙනෙවිරත්න, ඒ. (2003) ***පුරාණ සිංහල වාරි සංස්කෘතිය***, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

විජේරත්න, ඒ., ***සෙල්ලිපිවලින් හෙළිවන දීමනා සහ බදු පිළිබඳ විමසා බැලීමක්***, විද්‍යාලංකාර 125 වන ශාස්ත්‍රීය සමරු සංග්‍රහය

විතානාච්චි, සී. ආර්. (2015) ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ සමාජ පුරාවිද්‍යාත්මක අවකාශය හඳුනා ගැනීම,*** The journal of archaeology and heritage studies http://repository.rjt.ac.lk

# 18. වාරි නිර්මාණවල පරිසරානුගත වීම පිළිබඳව පැරණි වැව් හා නූතන ජලාශ අතර සංසන්දනාත්මක විමසුමක්

එස්. එන්. සී. පෙරේරා

## හැඳින්වීම

ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාව සාර්ථක කෘෂිකාර්මික රටක් බවට පත් වීමට අවශ්‍ය සාධක සොබාදහම විසින් නොමසුරුව දායාද කොට ඇත. නමුදු පැරැන්නන් සොබාදහම අපට උරුම කර දුන් සැම ස්වභාවික සංසිද්ධියක් ම ඒ ආකාරයෙන් භුක්ති වින්දේ නැත. එම සැම සංසිද්ධික් ම ඉතාමත් කල්පනාකාරීව වඩාත් උචිත ලෙස වෙනස් කරමින් භාවිතයට ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් කරුණු විමසීමේ දී කදිම නිදසුනක් වනුයේ ජල කළමනාකරණයයි. මෙහි දී වඩාත් වැදගත් වන්නේ ගැඹුරු විද්‍යාත්මක පදනමක් සහිතව ඉතා සරලව එම පරිසරයට යෝග්‍ය තාක්ෂණික ඥාණය භාවිතා කිරීමයි. ඒ නිසා අද වන තුරුත් මෙම වාපි නිර්මාණ ක්‍රියාකාරී ය. එසේ ම තවත් වසර දහස් ගණනක් වුව ද ප්‍රයෝජනයට ගත හැකි මට්ටමක පවතියි. බොහෝමයක් රටවල පුරාණ සංවර්ධනය හා සම්බන්ධ කාර්යයන් පිළිබඳ ඓතිහාසික මූලාශ්‍ර හෝ නැවත තහවුරු කරන ලද හෝ භෞතික ස්වරූපයක් හා පැහැදිලි ලිඛිත මූලාශ්‍ර දක්නට ලැබේ. විශේෂයෙන් ම වැව් අමුණු ආදි වාරි කර්මාන්ත හා බැඳුණු නිර්මාණවල භෞතික ස්වරූප රාශියක් පහතරට වියළි කලාපය තුළ විසිරී පවතින අතර ඒවා දිගු කාලයක් පැවතීම සඳහා කුමන හෝ සාධක ගණනාවක් ම හේතු වී ඇති බව සිතිය හැකිය. තවද ඊසාන දිග මෝසම් සක්‍රීය වීමෙන් උතුරු ප්‍රදේශයට ලැබෙන වර්ෂාව ඔක්තෝම්බර් මාසයේ සිට දෙසැම්බර් දක්වා පවතියි. මෙම වර්ෂා ජලය රැස් කරගැනීම සඳහා පුරාණයේ පටන් ඉදිකරන ලද කුඩා වාරි පද්ධතීන් වියළි කලාපය පුරා දැකිය හැකි අතර ම මෙම වාරි නිර්මාණයන් පරිසර හිතකාමී ක්‍රමවේදයකට අනුව නිර්මාණය ව තිබීම අනුරාධපුර යුගයේ සිට ම සිදු වී ඇත. ක්‍රිස්තු පූර්ව 3-4ට ආසන්න කාලයේ පණ්ඩුකාභය රජ සමයේ වූ මුල් ම වාරි කර්මාන්තවල සිට වසර දහසක් මුළුල්ලේ අඛණ්ඩව වැඩි දියුණු වූ පැරණි වාරි මාර්ග පද්ධති අතරින් අතිශයින් ම සංකීර්ණ වූ ඒවායින් ද සමන්විත විය. ඒවා සමස්තයක් වශයෙන් ගෙන පරිසරානුගත වී ඇති ආකාරයත් මෙන් ම වී නිෂ්පාදනය ප්‍රමුඛ කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීම මූලික අරමුණ ලෙස ද විදුලිබල නිෂ්පාදනය, මිරිදිය ධීවර කර්මාන්තය යන ආදිය අතිරේක අරමුණු ලෙස ද සලකා පසුගිය සියවසේ එනම් 80 - 90 දශකවල දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති මඟින් ඉදිකළ නූතන ජලාශ පරිසරානුගත වීමත් පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් මෙහි අන්තර්ගත වේ.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සිදු කිරීමේ දී මූලික වශයෙන් දත්ත රැස්කිරීමේ ක්‍රමවේද ලෙස පුස්තකාල ගවේෂණය, ඡායාරූප අධ්‍යනය යන ක්‍රමවේදයන් භාවිතා කරන ලදී. හඳුනාගන්නා ලද දත්ත විශ්ලේෂණය කරමින් සමාජයට පැරණි වාරි නිර්මාණ හා මෑත කාලීනව ඉදි වූ ජලාශයන්හි පරිසරයට අනුගත වීම පිළිබඳව අදහස් ලබාදීමට මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කෙරේ.

## විමර්ශනය

ශ්‍රී ලාංකේය සමාජය වාරි මූලික ශිෂ්ටාචාරයක් වශයෙන් වැව සමඟ සමීප සබඳතා පැවති බව කිව හැක. ඒ අනුව මුල් කාලීනව වැසි ජලය උපයෝගී කොට ගෙන ලංකාවේ වියළි කලාප හා අන්තර්කලාප ආශ්‍රිතව දක්නට ලැබෙන කුඩා වැව් රාශියක් පෝෂණය විය. ඒ අනුව ගංගා නිම්නයන්හි ජනාවාස ඉදි කරගත් ප්‍රොටෝ ඓතිහාසික ජනයා අතරින් ආදිතමයා තාවකාලික වැටි වේලි යොදාගනිමින් කෘෂි බිම් සඳහා ජලය ලබා ගත් නමුදු

ජනගහන වර්ධනයත් සමග තැනිතලා භූමියේ ඇති තිරස්වැටි හා උස් බිම් උපයෝගී කරගනිමින් පරිසරයට කිසිදු හානියක් නොවන අයුරින් කුඩා වැව් නිර්මාණය විය.

වැවක් නිර්මාණය කිරීමෙහිලා වැව පමණක් නොව ඒ හා බැඳුණු පරිසර පද්ධතිය පිළිබඳව එකල සිටි පාලකයන්ගේ අවධානය යොමු වී තිබුණි. ඒ බව වැව වටා පිහිටි ගස් ගොම්මන, කට්ටකඩුව, ඉස්වැටිය, තිස්බඹෙ, පෙරණය, ලන්ද වැනි පරිසර පද්ධති මඟින් පැහැදිලි වේ. මෙමඟින් අපේක්ෂා කර ඇත්තේ වැවට පාරසරික වශයෙන් සිදු විය හැකි හානි අවම කරගැනීමයි. එම පරිසරය පුරාණ වැව් ආශ්‍රිත ව දැකිය හැකි නමුත් මෑතකාලීන ඉදි වූ වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ ආදී වූ මහවැලි සංවර්ධන ව්‍යාපෘති යටතේ ඉදි වූ ජලාශ හා සම්බන්ධ පරිසරානුගත වීම පිළිබඳව නිරීක්ෂණය කිරීමේ දී පෙර පැවති වැව් අවට තිබූ පරිසරානුබද්ධතාවෙන් මිදී ඇති බවක් පැහැදිලිව පෙනීයයි.

පරිසරයේ ජෛවගතික ස්වභාවය පවත්වා ගැනීම සඳහා වැදගත් වන පරිසරයේ චක්‍රීයතාව පස මූලික කර ක්‍රියාත්මක වේ. වර්තමාන ජලාශ ඉදිකිරීමේ සංකල්පමය අවස්ථාවේ දී ම මහා පරිමාණ ස්වභාවය මෙන් ම ගැඹුරු ජල කඳක් රඳවා තබා ගැනීමට සැලසුම් කළ යුතු නිසා පරිසර චක්‍රීයතාව බිඳ දැමීමට කටයුතු සැලකේ. තවද නිරතුරුව ම ගලන ජලය සහිත එකිනෙකට වෙනස් පරිසර පද්ධති රාශියක් පෝෂණය කරන ගංගා බැමි මඟින් හරස් කිරීම නිසා පහළ නිම්න ප්‍රදේශ දිගුකාලීන වියළීම්වලට ලක්වීමෙන් අදාළ පරිසර පද්ධති හායනය මෙන් ම විනාශ වීම ද සිදුවේ. මේ තුළින් පරිසරයේ චක්‍රීයතාවයට බාධා පැමිණෙයි.

පුරාණයේ වැව් නිර්මාණය කිරීමේ සංකල්පය තුළ දී වඩා යෝග්‍ය භූමියක් තෝරා ගැනීමෙන් ඊට පාමුලින් වැවක් බැඳ ගැනීම ජන සම්මත සම්ප්‍රදාය වේ. ඒ අනුව කාලීනව සිදීයැම් සහිත ජල පහරකින් යුත් වැවක ජ්‍යාමිතික හැඩය ලබාගත හැකි පහසුම ස්ථානයේ දී අවම වශයෙන් වෙනස් සිදු කිරීම මඟින් වර්තමාන ජලාශයකට සාපේක්ෂව මහා පරිමාණ නොවන ජලය රඳවන ව්‍යුහයක් සකස් කිරීම සිදුකොට ඇත. බොහෝ විට ස්වභාවික ජල පහර වෙනුවට එම ජල පහරේ වේල්ලක් සකස් කර ජලය ලබාගෙන ඇළ මාර්ගයක් හරස් කර මහවැව් තැනීම සිදු කර ඇත්තේ වැවට අවසාධිත ජලය ගලා ඒම අවම කිරීම මඟින් වැවේ දිගුකාලීන පැවැත්ම සහතික කිරීම පිණිස ය. වැවෙන් පහළ ප්‍රදේශයට සොරව්ව මඟින් නිරතුරුව ම පිට කරන ජලය ද ලැබෙන අතර එමඟින් මේ පද්ධතියේ ජෛවගතික ස්වභාවය තවදුරටත් වර්ධනය කර චක්‍රීයතාවය ද පවත්වා ගැනීමට හැකි වේ. මේ අනුව පුරාණ වැව මෑතකාලීනව ඉදි කළ ජලාශයවලට වඩා සංකල්පමය අවස්ථාවේ සිට ම පරිසරානුගත වීම අතින් ඉතා ඉහළ ස්ථානයක ඇත.

කඩිනමින් ඉදිකරනු ලැබූ මහවැලි ව්‍යාපාරය තාක්ෂණික ශිල්ප ක්‍රම සහිතව සැලසුම් කිරීමේ දී සමීක්ෂණවලින් යෝජිත වේලි හා අනෙකුත් වාරි ව්‍යුහ ගොඩනැගීම කළ යුතු ස්ථාන පිළිබඳ භූමි පරීක්ෂාවල දී එම ස්ථාන සියල්ලේ ම පාහේ පැරණි වාරි නිර්මාණවල නටඹුන් දක්නට ලැබී ඇත. මෙයින් පැහැදිලි වන්නේ පුරාණ කාලයේ දී ද එම වාරි ව්‍යුහ නිර්මාණය සඳහා යම් කිසි උසස් තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතා කර ඇති බවයි.

පුරාණ කාලයේ භූමි භාවිතයේ එක් ප්‍රධාන ලක්ෂණයක් වූයේ රටේ කඳුකරය නොඉඳුල් වනාන්තරවලින් පෝෂණය කර තැනිතලාව ආහාර නිෂ්පාදනය, නිවාස ඉදිකිරීම් ආදී ජනතාවගේ අවශ්‍යතාවන් සඳහා යොදා ගැනීමයි. කඳුකර ප්‍රදේශවල බෑවුම් වැනි භූ විෂමතාවන් නිසා ද පාංශු ස්ථරවල ඝනකම, ස්ථායිතාව වැනි පාංශු භෞතික ගුණාංග තැනිතලාවට වඩා අවම අගයක පවතින නිසා ද පාංශු ඛාදන විභවය ඉතා අධික නිසා ද කඳුකරයේ නිර්මාණය කරන ලද ජලාශවල ගබඩාකරන ජලයේ විභව ශක්තිය ඉහළ බැවින්

භූ චලන ආදී ස්වභාවික ආපදාවක දී සිදුවිය හැකි හානිය ඉතා ඉහළ අගයක පවතින නිසා ද පුරාණයේ දී කඳුකර ප්‍රදේශ සඳහා සුදුසු ම භූමිය ලෙස වනාන්තර යොදාගෙන ඇත.

ඉහත දක්වා ඇති සාධක අනුව වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ ආදී මෑතක දී ඉදිකරන ලද ජලාශයන්හි උච්ඡත්වයට සාපේක්ෂව අඩු අගයක පිහිටා ඇති කලා වැව, මින්නේරි වැව, පරාක්‍රම සමුද්‍ර වැව ආදී වූ පැරණි විශාල වැව් ඒවාට අදාළ පරිසරයට ඇති කරන බලපෑම අවම කිරීම අතින් ප්‍රශස්ථ මට්ටමක් පෙන්වන අතර ඒවා පරිසරානුගත වීම අතින් ද ඉහළ ස්ථානයක රැඳවිය හැකිය.

වැවක් නිර්මාණය කිරීමෙහිලා දැනට හමුවන තොරතුරුවලට අනුව පුරාණ වැවක් නිර්මාණය කිරීමට සාපේක්ෂව විශාල වපසරියක වියළි කාලයේ දී පවා ජලය රැඳෙන ජල පහරවල් අනුව වැවක ජ්‍යාමිතික හැඩය පහසුවෙන් ලබාගත හැකි භූ දර්ශන සහිත ව පහත් බිමක් වැව නිර්මාණය සඳහා තෝරාගෙන ඇත. ඉන්පසු වැවේ ගැඹුර පවත්වා ගැනීම සඳහා වැව් පත්ලෙන් ම හාරාගන්නා ලද අවම ප්‍රමාණයක පස් හා වැව් බැම්ම ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මැටි හා අනෙකුත් විශේෂිත මැටි වර්ග පමණක් පිටතින් ලබාගෙන වැව නිර්මාණය කර ඇත. එමෙන් ම පැරණි වැව් නිර්මාණයේ දී වැව් ඉස්මත්තේ කුඩා වැවක් හෝ දෙකක් තනා ඇති අතර ඒවා කුළු වැව් නමින් හඳුන්වා තිබුණි. මෙමඟින් සිදු වූයේ මහවැවට අපද්‍රව්‍ය එකතු වීම අවම කිරීමයි.

නමුදු වර්තමානයේ ඉදිකර ඇති මහා ජලාශ නිර්මාණයේ දී කොන්ක්‍රීට් ආදී අමතර ද්‍රව්‍ය අදාළ පරිසරයට එකතු කරන අතර ම ඉදිකිරීම් සඳහා භාවිත අපද්‍රව්‍ය ද පරිසරයට මිශ්‍ර වේ. එමෙන් ම මෙම ඉදිකිරීම් සඳහා භාවිතයට ගන්නා යන්ත්‍ර සූත්‍ර හා අනෙකුත් ඉදිකිරීම් කාර්යයවල දී අධික ශබ්දය, දෙදරීම නිසා ඒවායින් ඇති වන පාංශු හා වායු දූෂණය නිසා ඒවාට සංවේදී ජීවීන් එම පරිසරයෙන් ඉවත් වීමත් ඔවුන්ට තම වාසස්ථාන අහිමි වීමත් සිදු වෙයි. මේ අනුව පැහැදිලි වන්නේ මහ ජලාශයක් නිර්මාණය කිරීමේ දී එම පරිසරය විශාල ලෙස වෙනස්කම් සිදු කිරීම නිසා ද ඉදිකිරීම් අමුද්‍රව්‍ය විශාල වශයෙන් පිටතින් එම පරිසරයට එකතු කරන නිසා ද යන්ත්‍ර සූත්‍ර ආදිය මඟින් අදාළ පරිසරයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන නිසා ද පුරාණයේ වාරි නිර්මාණයන්ට සාපේක්ෂව පරිසරානුගත වීම ඉතා ම පහත් මට්ටමක පවතියි.

තවද පැරණි වාරි ශිල්පියෝ වැව් නිර්මාණය කිරීමේ දී භූගෝලීය සාධක කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඇති බව පෙනේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ මාතලේ සිට නාවුල්ල, කන්තලේ හරහා ත්‍රිකුණාමලය දක්වා විහිදී ඇති ස්ඵටික හුණුගල් සවිවර පාෂාණයක් වන බැවින් ජලය ඉතා ඉක්මනින් පාෂාණය වෙත අවශෝෂණය කරගනියි. එබැවින් පුරාණ වාරි නිර්මාණය කිරීම සීමා විය. නමුත් වර්තමානය තුළ දී මොරගහකන්ද ජලාශය වැනි විශාල ජලාශ ව්‍යාපෘති තුළින් මෙවැනි ස්ඵටික හුණුගල් පාෂාණය මත ජලාශ නිර්මාණය කර තිබේ. එම නිසා පැරණි වැව පරිසරයට අනුකූලව නිර්මාණය කර ඇතැයි කිව හැක.

එසේ ම වර්තමාන ජලාශ නිර්මාණය කිරීමේ දී තිරසාර නොවන ආකාරයට කළුගල් පිපිරවීම ආදිය සිදු කිරීම නිසා එම පරිසරයට සිදුවන බලපෑම ඉතා ඉහළ අගයක පවතියි. ගල් පිපිරවීම නිසා සිදුවන ශබ්ද දූෂණය හා දෙදරීම නිසා සතුන් එම පරිසරයෙන් ඉවත් වීම හා මිය යෑම, අඩු ඝනකමින් යුත් පාංශු ස්තර ගැඹුරු මව් පාෂාණයෙන් වෙන්වීම හා ඒ නිසා පාංශු ඛාදනය, නායයෑම් ආදිය ද ප්‍රවර්ධන වීම වැනි බලපෑම් ජලාශය නිර්මාණය වන පරිසරයට සිදු වේ. මේ නිසා ජලාශය ගොඩනඟන අවස්ථාවේ දී එය පරිසරානුගත වීම දුර්වල කිරීමට මඟපාදයි.

වැව් පිළිබඳව දැක්වෙන ඓතිහාසික ලේඛනවලට අනුව වැව් බැම්මේ හා පතුලේ පස් සුසංහනය කිරීම සඳහා විශාල ශරීර බරක් සහිත අලි ඇතුන් ආදිය ද කුර සහිත ගවයන්, මී ගවයන් ආදි සතුන් මේ සඳහා යොදාගෙන ඇත. අලි ඇතුන් වැනි සතුන්ට අමතරව පැරණි වැව් සකස් කිරීම සඳහා පරිසරයෙන් ලබාගන්නා ලී දඬු වැනි ද්‍රව්‍ය මඟින් පිළියෙල කරගත් පරිසර හිතකාමී, ලීවර වැනි සරල යන්ත්‍ර මඟින් ද සිදුකර ඇත. පාංශු හා පරිසරයට සිදුවන බලපෑම අවම මට්ටමක පවත්වා ගනිමින් එම වැව් ගොඩනඟන අවස්ථාවේ සිට ම පරිසරයට එකඟතාවක් සහිතව පරිසරානුගත වීමක් එකල සිදුකර ඇති බව ඒ අනුව පැහැදිලි වේ.

වත්මන් ජලාශයන්හි නිදසුනක් ලෙස වික්ටෝරියා ජලාශයේ වාන් දොරටුව ඉතාම උසින් පිහිටා ඇති අතර ඒවාට සාපේක්ෂව පැරණි වැව්වල වාන ඉතාම පහත් මට්ටමකින් පිහිටා ඇත. වැව හොඳින් වාන් දමන විට වැවේ පිටවාන උඩින් ජලය පහළ ප්‍රදේශයට අඛණ්ඩ කෙටි ජල ප්‍රවාහයක් ලෙස පැවතීම නිසා මත්ස්‍ය ඉණිමඟක් ( Fish ladder) ලෙස ක්‍රියා කිරීම තුළින් මිරිදියේ ජීවත් වන ජීවීන් වන ආදා, ලූලා වැනි කරදිය වෙසෙන ජලජ ජීවීන්ට මෙමඟින් තම පැවැත්ම තහවුරු කරගැනීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කරයි. එබැවින් පැරණි වැව් ජලජ ජීවීන් සඳහා සුදුසු පරිසරානුගත වීමකට ලක් වී ඇත. ඊට අමතරව මේ හා සම්බන්ධව දැක්විය හැකි තවත් කරුණක් වන්නේ වියළි කලාපීය වැව් එකිනෙක සම්බන්ධ නිසාවෙන් වාරි පද්ධතිය අවසානයේ ගඟක් හෝ ඔයක් හෝ මඟින් මුහුදට සම්බන්ධ වීම හා වැව්වලින් පිටවන ජලය ලබාගැනීම මෙන් ම වැව්වලට ජලය ලබාදීම යන ක්‍රියාවලි යන දෙක ම සිදුකරන නිසා ද ජලජ මත්ස්‍යයන්ට ඇළවල් හරහා නැවතත් වැව්වලට එක්වීමේ හැකියාව පවතියි. මේ නිසාවෙන් පැරණි වැව් පරිසරානුගතව නිර්මාණය කර ඇති බව පැහැදිලි ය.

මෑත කාලීනව ඉදි වූ ජලාශ සියල්ල ම පාහේ පැති ගැඹුර අධික ආනතියක් සහිත බේසමක් ආකාරයට පවතින නමුත් ඒවායෙහි තැනිතලා පෝෂක ප්‍රදේශයක් සාමාන්‍යයෙන් දක්නට නොලැබේ. මේ නිසාවෙන් ජලාශ ආසන්නයේ තෘණ වැනි ශාක වර්ග ආහාරය සඳහා සත්ත්වයින් පැමිණීම ඉතාමත් අවම අගයක පවතියි. නමුත් වැව ඊට වෙනස්කම් කියන අතර පිටාර මට්ටමෙන් ඉහළ පිහිටි විශාල තෘණ බිම් සහිත පෝෂක ප්‍රදේශ එහි විය. තව ද ජලාශය සිඳී යන විට ජලාශයක එක ම ස්ථානයක හෝ කුඩා ප්‍රදේශයක හෝ ජල මට්ටමක අඩුවන අතර වැවේ ජල මට්ටම අඩුවන විට සාපේක්ෂව විශාල ප්‍රදේශයක තැනිතලා භූමි මතුවීම මඟින් තණපිටි වර්ධනය වීම සිදු වේ. මේ නිසා වැවක් අවට ජීවත් වන අලි ඇතුන්, මුවන්, ගෝනුන්, මී හරක් වැනි සත්ත්වයින් ද දියකාවා, කොරවක්කන් වැනි පක්ෂීන්ට ද පෝෂණය සඳහා මනා ලෙස පරිසරානුගත වී ඇති බව මේ අනුව පෙනී යයි. එසේ ම බොහෝ ජලාශ සිඳී යෑමේ දී ඒවායින් වැඩි කොටසක ආක්‍රමණකාරී ශාකයක් ලෙස හඳුනාගත් යෝධ නිදිකුම්බාවන් ව්‍යාප්තව ඇති අතර එයින් සතුන්ට ජලාශයට ප්‍රවේශ වීම අඩපණ කරයි. මෙම ශාක ගහණ ඉදිරියේ දී ද වඳ කිරීමට අපහසු වන්නේ ඒවායේ බීජ ලක්ෂ ගණනක් මෙම ජලාශ පත්ලෙහි තැන්පත් වීම නිසාවෙනි. එම නිසා පුරාණ වාරි නිර්මාණ හා ජලාශ සසඳන කළ පෙනී යන්නේ පරිසරානුගතව වැව් නිර්මාණ සිදුකර ඇති බවයි.

ජලාශ ආසන්නයේ පවතින පෝෂක ප්‍රදේශයේ ෆයිනස්, ඉයුකලිටස් වැනි ජල පෝෂක ප්‍රදේශවල පාරසරික ස්ථායිතාව සඳහා එතරම් සුදුසු නොවන ශාක ප්‍රජාවක් දක්නට ලැබෙන අතර ම මිනිසාගේ ක්‍රියාවලීන් නිසා විනාශයට ලක් වූ භූමි ද ජලාශ ආසන්නයේ දක්නට ලැබේ. නමුත් පැරණි වැව් ආශ්‍රිත ශාක ප්‍රජාව පිළිබඳව දැක්වීමේ දී එය ජලාශවලට වඩා හාත්පසින් ම වෙනස් ය. මේ අනුව දැඩුහා, බෝල්පනා, කුරටියා, තරණ, මයිල, පිළ අංකෙන්ද, උල්කෙන්ද වැනි පඳුරු මෙන් ම නෑබඩ, කොට කිඹුලා, දුනුකේ, මී, හොර, කුඹුක් පලු, තිඹිරි, ගොඩපර වැනි උත්ස්වේදනය අවම කරන කුඩා පත්‍ර සහිත ශාකවලින් සමන්විත පෝෂක

ප්‍රදේශ ඇති අතර වැවේ වාෂ්පීකරණය අඩු කරන හා ජලජ සතුන්ගේ අභිජනන භූමියක් ලෙස ක්‍රියාත්මක වන පෝටා වැටියකින් ද වියළි කාලයට භූගත හා වැසි කාලයට රොන්මඩවලින් තොර ජල සැපයුම් ලබාදෙන කුළු වැව් පද්ධතියකින් ද සමන්විත වේ. මේ සංරචක වැවේ දිගු කල් පැවැත්ම හා තිරසාර ජල සැපයුම සහතික කර ස්වභාවික ආපදාවලින් සුරැකෙන ලෙස පරිසරානුගත වී ඇති සුවිශේෂී ජලජ පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කරවීමට උපකාරී වේ. මෙලෙසින් පුරාණ වාරි කර්මාන්ත හා වර්තමානයේ නිර්මිත ජලාශ අතර සංසන්දනාත්මකව කරුණු විග්‍රහයක් ඉදිරිපත් කළ ද ඒවා නිර්මාණය කරන ලද මූලික අරමුණුවල වෙනසක් ඇති අතර ආර්ථික වසයෙන් ජලාශයෙන් කෙටිකාලීන ප්‍රතිලාභ රැසක් ලබාගෙන ඇති බව කිව හැකිය. නමුදු මේවා ඉදිකිරීමේ දී පරිසරයට හා මානව ප්‍රජාවට සිදු වූ අහිතකර බලපෑම් සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක පවතියි.

**නිගමනය**

මානවයාගේ මෙන් ම ශාක සත්ත්ව යන සාධක පරිසරයේ තුලනාත්මකභාවය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන අතර ම එම නිසාවෙන් වාරි තාක්ෂණය ඒ සඳහා මහගු දායකත්වයක් උසුලයි. මිනිසාගේ හදවත බඳු වූ ශ්‍රී ලාංකික වාරි සංස්කෘතිය පුරාණයේ නිර්මාණය කරන ලද වාරි නිර්මාණයන් පරිසරයට කෙතරම් ගැළපෙන ආකාරයට ඉදි වී ඇති බවත් මෑත කාලීනව ඉදි කරන ලද මහා පරිමාණ ජලාශ නිසාවෙන් පරිසරයට සිදුව ඇති අසමතුලිතතාවය පිළිබඳවත් මෙයින් සංසන්දනාත්මකව කරුණු ඉදිරිපත් කොට ඇත. මෙමගින් මනා ලෙස පුරාණ වැසියන් වාරි නිර්මාණයන් සිදු කිරීමේ දී තම ජීවිතයේ කොටසක් වූ පරිසරයට කෙතරම් සුරක්ෂාවක් සපයා ඇති බවත් මෑතකාලීනව සිදු කරන ලද ඉදි කිරීම් මගින් එම තත්ත්වය ගිළිහී ඇති ආකාරයත් අපට අවබෝධ කරගත හැකිය. ඒ අනුව වාරි නිර්මාණවල පරිසරානුගත වීම පිළිබඳව සිදුකරන ලද සාකච්ඡාව මගින් පැරණි වැව් ඒ සඳහා ඉහළ දායකත්වයක් සපයා දී ඇති බව මනාව පැහැදිලි වේ.

**පරිශීලන**


කුලතුංග, එම්. , වී, ජේ., ***වැව සමග බැඳුණු තිරසර පරිසර සංරක්ෂණය***, http://www.vidusara.com/2019/06/26/feature4.html

දළුපොත, එම්, කේ. (2011) ***වැව හා සංස්කෘතිය***, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්, දේවානම්පියතිස්ස මාවත, කොළඹ

දළුපොත, එම්, කේ. (2010) ***උරුමය 2 වැවේ වගතුග***, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්, දේවානම්පියතිස්ස මාවත, කොළඹ

රූපසිංහ, එන්., ***නූතන හා පුරාණ වාරි පද්ධතිවල පරිසරානුගත වීම පිළිබඳව වික්ටෝරියා ජලාශය හා මින්නේරි මහවැව ආශ්‍රිත සංසන්දනාත්මක විමසුමක්***, http://www.vidusara.com/2018/11/07/feature6.html

ú;dkdÉÑ" iS¡" wd¾¡" ^2017& *mqrdK YS% ,xldfõ jdß l¾udka;h*" mqrdúoHd fomd¾;=fïka;=j" fld<U¡

Abeywardana, N., ***et al (2019) Evolution of the dry zone water harvesting and management systems in Sri Lanka during the Anuradhapura kingdom; a study based on ancient chronicles and lithic inscriptions " Water History"*** https://doi.org/10.1007/s 12685-01900230-7.

## 19. ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ සංවර්ධනයට යටත්විජිත අවධියේ දායකත්වය.

එම්.ජී.එච්. මදූෂිකා.

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ ජලය ඇසුරු කරගෙන ගොඩනැගුණු ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ක්‍රි.පූ 6 වන සියවස දක්වා අතීතයට ගමන් කරයි. මහාවංසගත තොරතුරු අනුව ක්‍රි.පූ 6 වන සියවසේ දී උතුරු ඉන්දියාවෙන් පැමිණි ජන සංක්‍රමණිකයින් පිරිස් ලංකාවේ ජනාවාසකරණය කළ බව සඳහන් වේ. ඒ අනුව විජය රජු සමඟ පැමිණි ජන පිරිස් දිවයිනේ ගංගාශ්‍රිතව පදිංචි විය. මෙසේ ක්‍රමානුකූලව ගොඩනැගෙමින් කුඩා ප්‍රමාණයේ සිට විශාල ප්‍රමාණය දක්වා වැව් අමුණු නිර්මාණය වීම දක්වා වර්ධනය විය. ඒ අනුව පුරාතන ශ්‍රී ලාංකේය සමාජය තුළ හඳුනාගත හැක්කේ වාරි මූලික ශිෂ්ටාචාරයක් බව පැහැදිලි ය. ඉංග්‍රීසි ජාතික බෙල් ලේඛකයා පවසා ඇති පරිදි **ශ්‍රී ලංකාවේ තරම් දියුණු වූත් පුළුල් වූත් වාරි කර්ම ලෝකයේ වෙනත් කිසිම රටක නොවූ බවයි.** මෙරට මුල්ම රාජධානි සමය වූ අනුරාධපුර රාජධානි සමයේ ආරම්භක පාලක පණ්ඩුකාභය රජු විසින් අනුරාධ ග්‍රාමයෙහි අගනගරයට අවශ්‍ය ජල පහසුකම් ඇතිකරනු වස් ජය වාපි, අභය වාපි සහ ගාමිණී වාපි නමින් වැව් තුනක් ද නිර්මාණය කල බව සඳහන් වේ. එසේ ඇරඹි වාරි කර්මාන්තය ක්‍රමානුකූලව ආ රාජධානි සමයන්හි වාරි කාර්මාන්තයෙහි දියුණුව උදෙසා පාලකයන් විසින් විශාල මෙහෙයක් ඉටු කරන ලදී. අනතුරුව යටත්විජිතකරණයත් සමඟ මෙරටට පැමිණි පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන යුරෝපීය ජාතීන් විසින් පිළිවෙලින් පාලන කටයුතු මෙහෙය වන ලදි. එහි දී මෙරට වාරි කර්මාන්තය වෙනුවෙන් ඔවුන් ලබාදුන් දායකත්වය කෙසේද යන වග මෙහි දී අධ්‍යයනය කරයි. විශේෂයෙන් ලන්දේසි හා ඉංග්‍රීසි පාලන තන්ත්‍රය තුළ මෙරට වැව් කර්මාන්තය වෙනුවෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග, නඩත්තු කටයුතු ආදි කරුණු විමසා බැලීම මූලික අරමුණු අතර වේ.

**ක්‍රමවේදය**

උක්ත පර්යේෂණය සඳහා ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය අනුගමනය කර ඇත. එහි දී පුස්තකාල ගවේෂණය ඊට අදාල පොත් පත්, සඟරා හා පුවත්පත් ආදී මූලාශ්‍රය හා අන්තර්ජාල පරිශීලනය කර තිබේ.

**විමර්ශනය**

ශ්‍රී ලංකාවේ වාරිමාර්ග සංවර්ධනය ක්‍රි.පූ 3 වන සියවසේ සිට දක්නට තිබුණ ද වාරිමාර්ග පද්ධති වර්ධනය දක්නට ලැබෙන්නේ පස්වන සියවසෙන් පසුවයි. මහාවංසය ඇතුළු අනෙකුත් වංස කතාවල නිරන්තරයෙන් සඳහන් වී ඇත්තේ පෙර දවස පාලකයින් වර්ෂා ජලය එක් රැස් කොට තබමින් ජල සම්පාදනය කිරීම විශේෂ අවධානයකින් යුතුව කර ඇති බවය. එම ජලය කළමනාකරණයේ ඇති වැදගත්කම ක්‍රි.ව 1153- 1186 දක්වා පෙළොන්නරුවේ රජ කළ මහා පරාක්‍රමබාහු රජුගේ ***අහසින් වැටෙන එක වැහි බිඳකුදු මානව වර්ගයාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතුය,*** යන ප්‍රකාශය තුළ ගැබ්ව තිබේ. ලංකාවේ වියළි කලාපය හා අන්තර් කලාපය ආශ්‍රිතව දක්නට ලැබෙන කුඩා වැව් විශාල ප්‍රමාණයක් වැසි ජලය මත පෝෂණය වන වැව් ලෙසින් හඳුනාගත හැකි බැවින් එයින් වැසි ජලය එක්රැස් කොට ගබඩා කරගෙන කෘෂිකාර්මික හා අනෙකුත් සමාජීය අවශ්‍යතා සඳහා විධිමත් ආකාරයෙන් ප්‍රයෝජනයට ගෙන තිබේ. එමෙන්ම වාරි මාර්ග ප්‍රතිසංස්කරණය ද වැදගත් කාර්යයකි. යටත්ජිත අවධිය වන විට වාරිමාර්ග ප්‍රතිසංස්කරණය ද වැදගත් මුහුණුවරක් ගන්නා ලදී.

ක්‍රි.ව 1856 වාරිමාර්ග ආඥා පනත අවලංගු කරන විට වාරිමාර්ග පද්ධතියේ නඩත්තුව වැව් ජලය භාවිතය හා බෙදා හැරීම ආදිය කරනු ලැබුවේ ගොවීන් ය. ඒ අතරින්ම තෝරාගත් වෙල්විදානේ හෙවත් ගමරාළ යන අරුත් ඇති ගැමි නායකයාගේ අණසක පරිදි ය. වෙල් විදානේගේ අණසකට ඒ වැවේ වතුර ගන්නා සියලු ගොවීන් යටත් වෙයි. එසේ නොවුණ විට දඩ ගහන්නට ඔහුට අයිතියක් තිබිණි. ගමරාළ හා ගොවීන් රැස් වී ජලය ලැබෙන ආකාරය අනුව වගාකල යුතු බිම් ප්‍රමාණය අනුව වී වගා කාලසටහන ආදිය කන්න රැස්වීමේ දී තීරණය කරයි. මෙරටට පැමිණි මුල්ම යුරෝපීය ජාතීන් වූ පෘතුගීසින් හා ලන්දේසි ජාතිකයන් වාරි කටයුතු ආදිය නොකැඩී පවත්වා ගෙන ගොස් ඇත. එහෙත් වියළි ආර්ථික වැවිළි බෝග හඳුන්වා දෙමින් වී ගොවිතැන අපෙන් ඈත් කිරීමට පියවර ගත්හ. ලන්දේසි ප්‍රතිපත්තිය වූයේ වාරි මාර්ග යතා ලෙස පවත්වාගෙන යාමට ප්‍රදේශවාසීන්ට නියෝග පැනවීම ය. ලන්දේසීහු ඇළ මාර්ග තැනූ නමුත් සිය ඒවා වෙළඳාම වෙනුවෙන් පාවිච්චි කර බව පෙනේ. උදාහරණ වසයෙන් පුත්තලම දක්වා දිවෙන 1802 ඉදිකළ හැමිල්ටන් ඇළ හා ඕලන්ද ඇළ පෙන්වා දීමට පුළුවන. ඒ අනුව නව ඇළ මාර්ග ඉදිකිරීම, වගුරු බිම්වල ජලය බැස්සවීම, ඉඩම් ගොඩකිරීම ආදී කාර්යයන්හි නිපුණ වාරි ඉංජිනේරුවන් ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම රාජකාරී කොට තිබේ. මේ ඇළ මාර්ගයන් බොහෝමයක් ලන්දේසි කාලයේ භාණ්ඩ ප්‍රවාහනය ආදී නාවික කටයුතු සඳහා යොදාගන්නට ඇත.

යටත්විජිත සමය වන විට දේශීය කෘෂිකර්මය බොහෝ සේ පිරිහීමකට ලක් විය. ඒ අනුව ලංකාව යටත්විජිතයක් බවට පත්වන විට අනුරාධපුර හා පොළොන්නරු යුගයන් හී ඉදි වූ සුවිශේෂී වාරිමාර්ග බොහෝමයක් වල්බිහි වී තිබිණ. ඒ බව ආර්. ඩබ්ලිව්. අයිවර්ස්ගේ එදා වැව් බැදි රාජ්ජේ ***"ඉංග්‍රීසීන් රජරට පාලනය අත්පත් කරගන්නා විට රජරට මිනිසුන්ගේ ප්‍රධාන බත්නොවී තිබිණ. ඒ කුඹුරු ගොවිතැන අතිශයින්ම පිරිහී ගොස් තිබුණු බැවින් ය."*** යනුවෙන් දක්වයි. ක්‍රි. ව. 1815 ඉංග්‍රීසින් ලංකාව යටත්කර ගැනීමෙන් පසුව මෙරට කුරුඳු, කෝපි, සිංකෝනා, තේ, පොල්, රබර් යන වැවිලි බෝග හඳුන්වා දුනි. විශේෂයෙන් ක්‍රි.ව1833 දී කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ ගම්සභා ක්‍රමය ඒ වන විට අහෝසි කරන ලදි. මේ හේතුවෙන් එතෙක් ගම්සභා මගින් ඇළවේලි තැනීම හා වැව් අමුණු නඩත්තු කිරීමේ කටයුතු රජය විසින් නොසළකාහැර තිබේ. කෙසේ නමුත් වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීමේ වැදගත්කම බ්‍රෝඩ් විසින් ආණ්ඩුවට වරින් වර කියා ඇත. 1848 වර්ෂයේ දී බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව ජනතාව නැගී සිටීමට ප්‍රධාන හේතුවක් ලෙස දේශීය කෘෂි කර්මාන්තය නොසළකා හැරීමට තමන් ගත් ප්‍රතිපත්ති බලපෑ බව පාලකයෝ තේරුම් ගත්හ. ඒ අනුව 1850න් පසු මෙරට පාලන කටයුතු කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් කීප දෙනෙකු දේශීය කෘෂිකර්මය පිළිබඳ සැලකිලිමත් වෙමින් වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා ගොවි ජනතාවගේ ශුභ සාධන කටයුතු සොයා බැලීම සඳහා ද යොමු වූ බව පෙනේ. හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා විසින් වාරි කර්මාන්ත පිළිබඳ සොයා බැලීම සඳහා 1855 දී කාරක සභාවක් පත්කිරීම, නැගෙනහිර පළාතේ ඉරක්කාමම් හා අම්පාර වැව ප්‍රතිසංස්කරණය කිරීම, හර්කියුලීස් රොබින්සන් ආණ්ඩුකාරවරයා විසින් වාරි මාර්ග පිළිබඳ සොයා බැලීම සඳහා කොමිෂන් සභාවක් පත් කිරීම. ආදිය වේ. ග්‍රාමීය වාරි මාර්ග ප්‍රතිසංස්කරණය රජයේ නොමසුරු ආධාර සහිතව ආරම්භ වූයේ 1875 දීය. එහි දී වාරිමාර්ග කටයුතු නොකඩවා කරගෙන යාම සඳහා වාරි නිළධාරීන් ද පත්කරන ලදි. ඒ අනුව බ්‍රිතාන්‍යයන් විසින් සිදු කිරීමට භාරගන්නා ලද ප්‍රථම වාරි කර්මාන්තය වූයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරම ඔය හරහා කිරම වේල්ල ඉදිකිරීමයි. එමගින් එම ප්‍රදේශයේ ඉඩම් වල ප්‍රයෝජනය සඳහා ජලය නියාමනය පිණිස 1825 දී සිදු කරන ලදි. වඩාත් ඵලදායී අවස්ථාවන් ලබා දීමේ අරමුණෙන් 1867 අංක 21 දරන පනත ද සම්මත කරන ලදි. ඉන් කවර හෝ යෝජිත වාරි කර්මාන්තයක් මගින් ප්‍රතිලාභ ලැබීමට ඉඩ ඇති ඉඩම් හිමියන්ගේ අදහස් විමසීමේ දී අනුගමනය කල යුතු

ක්‍රියා පටිපාටිය මෙහි නියම කර ඇත. එසේම 1887 දී ක්‍රියාත්මක කිරීම සඳහා වාරි කර්මාන්ත අටක් යෝජනා කර ඇති අතර ඉන් කිහිපයක් මෙසේය.

- ➢ මඩකලපුවේ රුගම් වැව - අක්කර 2400
- ➢ බොරලැස්ගමුව වැව - අක්කර 36
- ➢ අල්ලෙයි වැව - අක්කර 1600
- ➢ පෙරියකුලම් - අක්කර 600

ගම් මට්ටමින් වැව් සංවර්ධනය කිරීම වාරි කර්මාන්තයේ දියුණුව පිණිස වැදගත් වේ. ඒ බව ඩයික් මහතා විසින් සිය සංචාර වලදී ලබගත් තොරතුරු ආශ්‍රයෙන් සටහන් තබා ඇති අතර ඉන් ග්‍රාමීය වැව් පිළිසකර කිරීමට ගම්මුන්ට ආධාර කිරීමේ වැදගත් පිළිවෙතක් අනුගමනය කළ යුතු බව පෙන්වයි. උදාහරණ ලෙස 1858 ඔක්තෝම්බර් 26 අංක 20 දරණ ඔහුගේ ලිපියක ඇති සටහනක් මෙසේ ය. "ග්‍රාමීය වැව් පිළිසකර කිරීම සඳහා ගම්මුන්ට ආධාර කිරීමේ විෂය ගැන අවුරුදු ගණනාවක් තිස්සේ ම අවධාරණය කර තිබුණත් එවැන්නක් විධිමත්ව ඉදිරිපත් කොට ක්‍රියාවට නැංවීමට ප්‍රායෝගිකව කිසිම වැඩ පිළිවෙලක් මේ වනතුරුම දියත්කර ඇති බවක් නොපෙනේ. මම මෙහි දී අවධානයට නතු කරන්නේ පාළුවටම ගොස් ඇති වැව් ප්‍රතිසංස්කරණය ගැන නොව, අළුත්වැඩියා කිරීම හෝ විශාල කිරීම් අවශ්‍ය දැනට භාවිත කරන ග්‍රාමීය වැව් ය." මේ බව සලකා බැලීම ආණ්ඩුවකට උචිත යැයි සැලකුව ද ඒ සඳහා ආණ්ඩුව විසින් කිසිත් අනුගමනය කර ඇති බවක් නොපෙනේ.

1870 ගණන්වල දී උතුරු මැද පළාතට ගම්සභා ක්‍රමය හඳුන්වාදුන් අතර වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ගම්සභා ක්‍රමය උපකාරී විය. මෙහි ද සැබෑ ලෙස සිදුවූයේ වාරිමාර්ග නඩත්තුව සඳහා පැවති පැරණි ක්‍රමවේද ගම්සභා ක්‍රමය යටතේ බලාත්මක වීමයි. වාරි මාර්ග ප්‍රතිසංස්කරණයේ නවුමු පිටුවක් පෙරළීමට 1886 ශ්‍රීමත් හර්කියුලිස් රොබින්සන් වාර්තාව සමත් විය. ප්‍රධාන වශයෙන් එහි ඇති යෝජනා පදනම් කර ගනිමින් 1865 වාරි මාර්ග පනතේ දී අනුගමනය කරන ලදි. ඉන් වසර අටකට පසුව උතුරු මැද පළාත ඇති කිරීමෙන් පසුව එම පනත ක්‍රියාත්මක කිරීම ඇරඹුණි. එම පනතට 1872 සංශෝධනයක් ඉදිරිපත් වූ අතර නුවර කලාවියේ උන්නතිය සඳහා ආණ්ඩුව ඉදිරිපත් වී ප්‍රතිසංස්කරණ කටයුතුවල වගකීම භාරගත් අවස්ථාවලදී දැරීමට සිදුවන වියපැහැදම් පියවා ගැනීමට ගම්මුන්ට කිසියම් මුදලක් ගෙවීමට අවශ්‍ය අණ කිරීමේ බලය ආණ්ඩුව වෙත ලැබීය. එසේම මෙහි ඇති පස්වැනි වගන්ති ප්‍රකාරව 1867 අංක 24 දරණ පනතේ ඇති සීමිත බලතල කෙසේ වුවත් නුවරකලාවියේ දී කුඹුරුවලට ජලය සපයන වැව් සඳහා පමණක් ගම්සභා නීති-රීති ක්‍රියාත්මක කරනු ලැබුව ද තමන්කඩුවේ දී විල්ලු නඩත්තුවට ද එම ක්‍රමය උපයෝගී කර ගන්නා ලදි. එසේම එහි හය වැනි වගන්ති ප්‍රකාරව වාරි මාර්ග සංවර්ධන කටයුතු කෙරෙන දිස්ත්‍රික්කය හඳුනා ප්‍රකාශයට පත් කිරීමේ බලය දිස්ත්‍රික් ප්‍රධාන පාලක (ඒජන්ත) වෙත පැවරිණ. මෙහි හය වැනි වගන්තිය අවශ්‍ය වූයේ වැව්වල වාන් සහ සොරොව්ව අලුත්වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමට යෙද වූ වියපැහැදම් ආපසු අයකර නොගැනීමටත් වැව් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය මිනිස් ශ්‍රමය ගෙවීම් රහිතව ලබා ගැනීමටත් අවශ්‍ය නෛතික බලයක් ලබා දීමටත් ය. නමුත් හය වැනි වගන්තිය පිළිබඳව ප්‍රසිද්ධ ප්‍රකාශනයක් නොවීය. ඒ වගේම 1889 වාරි මාර්ග ආඥා පනතට පස් වැනි වගන්තිය ඇතුලත් නොවීම නිසාවෙන් කෙතරම් ප්‍රයෝජනවත් වාරි ප්‍රතිසංස්කරණයක් ඇරඹීමට පවා තිබූ ඉඩකඩ ඇහිරිණ.

ඒජන්ත බර්ච් මහතා විසින් නැගෙනහිර පළාතේ ග්‍රාමීය වැව් පිළිසකර කිරීමේ අවශ්‍යතාවය මැනවින් ඒත්තු ගැන්වීමෙන් පසු ඒවා පිළිසකර කිරීමේ අවශ්‍යතාවය තහවුරුකොට ක්‍රියා කළ පළමු වැව් ආණ්ඩුකාරවරයා ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි ය. 1873 දී ආණ්ඩුකාරධූරයට පත්

මොහු විසින් අනුරාධපුර බසවක්කුලම, තිසා වැව, මැදවච්චිය මහ වැව, කලාවැව, හා කන්තලේ වැව ඇතුළු වැව් කිහිපයක් ප්‍රතිසංස්කරණය කර තිබේ. ඊට අමතරව ග්‍රේගරි ආණ්ඩුකාරතුමා විසින් නුවර කලාවියේ කුඩා වාරි මාර්ග කටයුතු පිළිසකර කිරීම පිණිස වාරිමාර්ග නිළධාරීන් පත් කරන ලදී. එයින් වැව් බැමි කපා කුඹුරුවලට වතුර ලබා ගැනීම වැනි අයහපත් ක්‍රියා වෙනුවට සුදුසු පිළිවෙතක් අනුගමනය කිරීම ය.

1815 සිට 1874 දක්වා ග්‍රාමීය වැව් හෝ ඒ වැව්වල සොරොව් හෝ නවීකරණය කිරීමට ආණ්ඩුවේ ආධාර සපයා නැත. මේ නිසාවෙන් ගම්වාසීන් පුරුදු වී සිටි ආකාරයෙන් ක්‍රියා කිරීමට අවස්තාව හිමිවිය. මෙහි දී ගම්වාසීන් පුරුදුව සිටියේ කට්ටි කපා වැව් බැමි බැඳීමේ පළපුරුද්ද තිබූ ඔඩ්ඩයාර් යනුවෙන් හැඳින්වූ දෙමළ පස් වැඩකරුවන් වැකඳු අළුත්වැඩියා කිරීමටත්, වාන් බැඳීමට යන්තමින් පුරුද්දක් තිබූ පෙදරේරුවන් යොදා ගැනීමටත් ය. එය ගම්වාසීන් විසින් සාර්ථක ලෙස වැවක් ප්‍රතිසංස්කරණය කළ අවස්තාවකි. තමන්කඩුවේ මහවැව් ප්‍රතිසංස්කරණය සඳහා ආණ්ඩුවේ අවධානය යොමුවූයේ පසුව ය. 1891 දී සොරොව් දෙකක් සවි කිරීම සහ 1894 දී මින්නේරිය වැවට සොරොව්වක් සවි කිරීම ඒ සඳහා ගත් මූලික පියවර දෙකක් විය. කෙසේ වෙතත් වැව් ප්‍රතිසංස්කරණය සඳහා ආණ්ඩුවේ දායකත්වය හිමිවිය යුතු බව 1869 දී ආණ්ඩුවේ සහකාර ඒජන්ත ලීසිං මහතා මෙසේ දක්වා තිබේ. "ප්‍රධාන වැව්වලින් පෝෂණය නොවන කුඩා වැව් විශාල සංඛ්‍යාවක් මෙහි තිබේ. මේ වැව්වල බැමි විටෙන් විට අළුත්වැඩියා කළ ද ඒවා නැවත නැවත අබලන් වී යයි. මේ වැව්වල හොරොව් ස්ථාවරත්වයකින් යුතුව සවි කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ඉතා සුපරික්ෂාකාරී ව නිගමනය කර ලබා දිය යුතුව ඇත."

නුවරකලාවිය දිස්ත්‍රික්කයේ වාරි මාර්ග කටයුතු විධිමත් කිරීම සඳහා උතුර හා දකුණ වසයෙන් කොට්ඨාස බෙදා වෙන්කර තිබේ. වාරිමාර්ග නිළධාරියාම ග්‍රාමීය වැව් සුපිරින්ටැන්ඩන්ට් ද වූ අතර සහකාර සුපිරින්ටැන්ඩන්ට් දේශීයව පත් කරන ලදී. ඒ අනුව 1874 සිටි ඩික්සන් මහතා විසින් වැව් ප්‍රතිසංස්කරණය අරඹන ලදී. නිදසුනක් ලෙස බසවක්කුලමේ(පැරණි අභය වැවේ) මිණුම් කටයුතු නිමකර පිළිසකර කිරීම සඳහා වැය තක්සේරුවක් ද කරන ලදී. තමන්කඩුවේ ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණය ආරම්භ වූයේ 1889 වැව් සුපිරින්ටෙන්ඩෙනට් කෙනෙකු පත් කිරීමත් සමඟ ය. 1900 වන විට තමන්කඩුවේ ග්‍රාමීය වැව් 52ක් ප්‍රතිසංස්කරණය වෙමින් තිබිණ (AR;GA-NCP,1900:Diary, GA-NCP, 18 Jan,1901.SLNA 41/499). 1877 දී ග්‍රාමීය වැව් 27 කට සොරොව් සවි කරන ලදී. ඉඩම් හිමියන්ගේ සහාය ඇතුව ආණ්ඩුව විසින් දියත් කරනු ලැබූ මෙම වැව් පිළිසකර කිරීමේ අත්හදා බැලීම් කෙතරම් සාර්ථක වීද යත් වතුර අඩි 8 කට වඩා වැඩියෙන් අල්ලන වැව් මෙසේ පිළිසකර කිරීමට කටයුතු කර ඇත. එබැවින් අඩි 8ක් , 10 ක් සහ අඩි 12 ක් වතුර අල්ලන වැව් වශයෙන් වැව් වර්ග තුනක් හඳුනාගෙන ඒවා පිළිසකර කිරීම සඳහා අවශ්‍ය වැය තක්සේරු ද කරන ලදී. එසේම 1878 දී වැව් 41කත්, 1879 දී වැව් 42 කට සොරොව් ද 26කට කළිඟු සවිකළ අතර 1880 දී වැව් 28 කට ම සොරොව් සවි කිරීමට හැකිවිය. 1884 දී "මෝල්ස්වර්ත්" ක්‍රමයට නිම කළ සොරොව් වැව්වලට සවි කරනු ලැබුවත් ඉන් බෙහෝමයක් සාර්ථක නොවූ බැවින් වෙනත් හොඳ වර්ගයක සොරොව් සවි කිරීම **ෆිසර් මහතා** විසින් අනුමත කිරීමෙන් අනතුරුව 1884 දී වැව් 9ට අත්හදා බැලීමක් වශයෙන් සවිකරන ලදී. මෙහි දී ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණ පවත්වාගෙන යෑමේ මෙහෙයවීම් කටයුතු ඒජන්ත වෙත පැවරිණ. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේනතුවට පැවරුණු කාර්යයන් වූයේ වාන් සහ සොරොව් ඉදිකිරීමත් ඒවා සංරක්ෂණය කිරීමත්, අළුත්වැඩියා කිරීමත් ය.

එහි දී මාස ගණන් තිස්සේ පැවති ජල හිඟය, එමෙන්ම ජල ගැලීම්වලින් ප්‍රතිසංස්කරණ කටයුතුවලට ඇති වූ අවහිරතා, ශ්‍රම සැපයීමේ අඩුපාඩුකම්, ලෙඩ රෝග පැතිරීම් ආදි දුෂ්කරතා මැද වසර තුනක කාලයක් තුළ රයිට්සන් මහතා විසින් නිම කළ කලාවැවේ ප්‍රතිසංස්කරණ කටයුත්ත මෙතෙක් ලංකාවේ කෙරුණු සාර්ථකම ප්‍රතිසංස්කරණ කටයුත්තක් බව සඳහන් කර තිබේ. ඒ අනුව 1850න් පසු මෙරට පාලන කටයුතු කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් කීප දෙනෙකු දේශීය කෘෂිකර්මය පිළිබඳ සැලකිලිමත් වෙමින් වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා ගොවි ජනතාවගේ ශුභ සාධන කටයුතු සොයා බැලීම සඳහා ද යොමු වූ බව පෙනේ. යටත්විජිත සමයේ දී මෙරටට වාරි මාර්ග කටයුතු සිදුකොට ඇත්තේ 1887 ඉදිරිපත් කරන ලද පණතක් මඟින් පිහිට වූ පළාත් වාරි කමිටුව සහ මධ්‍යම වාරි කමිටුව මඟිනි. විශේෂයෙන් 1900 වර්ෂයේ දී වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම මෙරට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වැදගත් අවස්ථාවකි. එහි දී වාරි කර්මාන්ත පිළිබඳ අවබෝධයක් ඇති නිලධාරීන් දෙපාර්තමේන්තුවට බඳවා ගනිමින් එහි කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට කටයුතු කෙරිණි. ඒ වන විට ප්‍රතිසංස්කරණය කොට තිබූ වාරි මාර්ග නඩත්තු කොට පවත්වාගෙන යාමත් නව වාරිමාර්ග ජනගහනයට සාපේක්ෂව හඳුනාගෙන ගොඩනැගීමටත් හැකි විය. පළමුවන ලෝක සංග්‍රාම කාලයේ ආහාර ද්‍රව්‍ය ආනයනය දුෂ්කර වීමත් 1929 ඇති වූ ලෝක ආර්ථික පරිහානිය හේතුවෙන් ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාමත් වැනි හේතු නිසා මෙරට වී ගොවිතැන දියුණු කිරීම කෙරෙහි බ්‍රිතාන්‍ය පාලන කාලයේ අවසාන අවධියේ දී ම අවධානය යොමු විය. නව ගොවි ජනපද පිහිටුවීමත් සමඟ පැරණි වැව් අමුණු ප්‍රතිසංස්කරණය හා වාරි මාර්ග තැනවීම කෙරෙහි රට තුළ ප්‍රබල උනන්දුවක් ඇති විය. මේ අයුරින් යටත්විජිත අවධිය තුළ මෙරට වාරි කර්මාන්තය කෙරෙහි ලැබුණු දායකත්වය කවරාකාර ද යන වග හඳුනාගත හැකි වේ.

**නිගමනය**

මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද මූලාශ්‍රමය සාධක ඉතිහාසය පිරික්සීමේ දී මෙරට යටත් කොටගෙන සිටි පෘතුගීසි හා ලන්දේසි යුගයන් සේම විශේෂයෙන් 1815 සිට 1948 දක්වා බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක්ව පැවති කාල සීමාව තුළ වසර ගණනාවක උරුමයක් හිමි වාරි කර්මාන්තය කෙරේ පවතින්නට ඇතිදැ'යි කරුණු පැහැදිලි කරගත හැකි වේ. ඒ ඒ කාල සීමාවන් හී පාලනයන් ගෙන ගිය ආණ්ඩුකාරවරුන්ගෙන් වාරි කර්මාන්තය වැඩි දියුණු කරමින් පවත්වාගෙන ගිය ආකාරය හා අනුගමනය කල ක්‍රමවේදයන් පිළිබඳව කරුණු ග්‍රහණය කර ගැනීමේ හැකියාව හිමි විය.

**පරිශීලන**

චන්දන රෝහණ විතානච්චි(2019 මාර්තු 03) අතීතය යළි ජීවමාන කළ බ්‍රිතාන්‍ය අවධියේ මහවැලි වාරි ප්‍රතිසංස්කරණ *සිළුමිණ* https://www.silumina.lk ][ 11 January 2022].

තෙන්නකෝන්, එම්. යූ. ඒ. පරි(2004). එදා වැව් බැඳි රාජ්ජේ, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, නිස්සංක පරි(2008). පුරාණ ලංකාව, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හේරත් ගුණතිලක, ටිකිරි (2019). පොළොන්නරුව(නරපති යුගයේ සිට ජනපති යුගය දක්වා), පර්යේෂණාත්මක ශාස්ත්‍රිය සංග්‍රහය.

# 20. සාම්ප්‍රදායික වාරි ජල කළමනාකරණය

ආර්. ඩබ්ලිව්. සී. මදුෂානි

## හැඳින්වීම

ජීව වස්තූන්වල පැවැත්ම කෙරෙහි බලපාන අත්‍යවශ්‍ය මූලිකාංගයක් ලෙස ජලය පෙන්වා දිය හැක. පෘථිවියේ වාසය කරන ජීවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් ජලය ආශ්‍රිත ප්‍රදේශ තම වාසස්ථාන කරගනිමින් ජීවත් වේ. ඒ අනුව මානව ක්‍රියාකාරකම් බොහෝමයක් කෙරෙහි ජලය සෘජු බලපෑමක් කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස ජල කළමනාකරණයක අවශ්‍යතාව පැන නැගී ඇත.

ක්‍රි. පූ 350 පමණ වන විට අහස් දියෙන් හේන් ගොවිතැන් කිරීම ජනගහනයේ ඇති වූ වර්ධනයත් සමග ප්‍රමාණවත් නොවන්නට ඇත. එම නිසා ගොවිතැන් කටයුතුවල දියුණුව උදෙසා ජල සම්පාදන ක්‍රමවල උපයෝගීතාවය වැඩි වැඩියෙන් දැනෙන්නට ඇත. මුල් කාලීනව ලංකාවේ විසූ ජනයා රජරට ප්‍රදේශයේ ස්වභාවික වියළි දේශගුණයක් ඇති තැනිතලා ප්‍රදේශවල ජලය උපයෝගී කරගෙන ඒවා කළමනාකරණය කරගනිමින් ආර්ථිකය ගොඩනගාගෙන ඇත. මෙම ජල කළමනාකරණ සැලැස්ම තුළ පාංශු සංරක්ෂණ සැලැස්ම මෙන්ම භූමි පරිභෝග සැලැස්ම ද අන්තර්ගත වී ඇත. මේ අනුව අතීත මිනිසුන් තම එදිනෙදා ජීවිතයේ අත්‍යවශ්‍යය රාජකාරී ඉටු කර ගැනීම උදෙසා අවශ්‍ය ජලය ගබඩා කර ගැනීමට වැව් බැඳීම අරඹන ලදි. එම නිසා වියළි කලාපයට ලැබෙන වැසි ජලයෙන් කොටසක් වැව් අමුණු තුළ ගබඩා විය. මෙම කරුණු අනුව යමින් ලංකාවේ සාම්ප්‍රදායික වාරිකර්මාන්තය හා ජල කළමනාකරණය පිළිබඳ විමර්ශනය කිරීම මෙම ඉදිරිපත් කිරීම තුළින් අපේක්ෂා කෙරේ.

පුරාණ වාරි කර්මාන්තය දෙස අවධානය යොමු කිරීමේ දී ක්‍රි.පූ තුන්වන සියවසේ සිට ක්‍රි.ව පළමුවන සියවස අතර කාලයට අයත් වන්නා වූ පූර්ව බ්‍රාහ්මීය සෙල්ලිපි මඟින් වැව් පිළිබඳ සාධක ඉදිරිපත් කර ඇත. සාම්ප්‍රදායික ජල කළමනාකරණ ක්‍රියාවලිය වැව් නිර්මාණය වීමත් සමඟ බිහි වූ අතර ඒ සඳහා පැවතියේ තිරසාර කළමනාකරණ ක්‍රමවේදයකි. එමඟින් ඒ ආශ්‍රිත ශාක හා සතුන් මෙන්ම මානව පරිසර පද්ධතිවල සංකලනයක් දැකගත හැකි විය. වැව යනු හුදෙකලාව ක්‍රියාත්මක වූ ඒකකයක් නොව එය එකිනෙකට සම්බන්ධ වූ වැව් පද්ධතියක් ලෙස ක්‍රියාත්මක විය. මෙම සාම්ප්‍රදායික ජල කළමනාකරණ ක්‍රමවේදය ඇතැම් විද්වතුන් **එල්ලංගාව** නමින් හඳුන්වනු ලබයි. නමුත් මෙහි තිරස් අතට විහිදී ගිය වැව් පද්ධතියක් දක්නට ලැබෙන නිසා තිරස් ජාලගත වැව් පද්ධතිය නොහොත් **ඇඳුතු වැව්** පද්ධතිය නමින් හැඳින්වීම වඩාත් උචිත බව තවත් විද්වත් මතයකි. යම් උස් තැනක පිහිටි වැවක සිට කුඩා වාරි මාර්ග ක්‍රම ඔස්සේ පහළ ප්‍රදේශයේ පිහිටා ඇති ජලාශවලට ජලය බෙදාහැරීම උදෙසා ක්‍රමානුකූලව නිර්මාණය කරන ලද වැව් පද්ධතියයි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී දත්ත රැස්කිරීම සඳහා පුස්තකාල ගවේෂණය මඟින් ලබාගත් තොරතුරු හා මේ පිළිබඳව පර්යේෂණයේ නියැලුණු විවිධ පර්යේෂකයින්ගේ ලිපි අන්තර්ජාලය තුළින් ලබා ගන්නා ලදී.

## විමර්ශනය

### කුඩා වැව්වල විකාශනය

සෑම වසරකම පාහේ මැයි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා ම දිගු නියං සමයක් ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශවල දක්නට ලැබේ. මේ නිසා මිනිසාගේ එදිනෙදා අවශ්‍යතා පිරිමසා ගැනීමට තරම්වත් ජලය ප්‍රමාණවත් නොවීය. මීට පිළියමක් ලෙස වියළි කලාපයේ තද පාෂාණ මත ඇති පාංශු ස්ථරයන් හි ස්වභාවිකව පිහිටි භූගත ජල මාර්ග ද විරල වූ නිසා අඛණ්ඩවම ජලය ලබා ගැනීමට යම් ප්‍රමාණයක වැසි ජලය එක්වන විල් හෝ පොකුණු පරිහරණය කිරීම අවශ්‍ය විය. මිනිසාගේ උත්සාහයෙන් නිම වූ කුඩා පොකුණුවලට වැසි සමයේ දී ගලා එන ජලය එක් වී යම් ප්‍රමාණයක ජලය ඒකරාශී වීමක් සිදු විය. පසුකාලීනව යකඩ තාක්ෂණය සොයා ගැනීමත් සමග එම කුඩා පොකුණු හාරා විශාල කර පවුල් ගණනාවකට ඉන් යැපීමට හැකිවන පරිදි තම ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මිනිසා විසින් ජලාශ ඉදිකිරීමට පෙළඹෙන්නට ඇත. මේ ආකාරයට ග්‍රාමීය වශයෙන් බිහි වූ කුඩා වැව් ආරම්භ විය. ප්‍රධාන ජන මාර්ගයන් හැරුණු කොට වැසි කාලයට පමණක් ජන පවතින කුඩා අගාර පාරවල් හඳුනාගෙන එම මාර්ග හරස් වන පරිදි කුඩා වැව් ඉදිකර එහි ජලය ද රැක ගැනීමට ක්‍රියා කර තිබේ. භූමියේ පවතින සමෝච්ච රේඛා ලක්ෂණවල වෙනස්කම් මත රැස් කරගත් ජලය ක්ෂේත්‍රය වෙත ගෙන යාමට ක්‍රියා කර තිබේ. මේ අනුව පෙනී යන්නේ ලංකාවේ විශාල වැව් තැනීමේ මූල බීජය කුඩාවට ජලය එක්රැස්වන ස්ථාන මූලික කරගෙන මුලින් ආරම්භ වූ බවයි.

විශාල ජල ධාරිතාවක් දරා සිටීමට හැකි වැව් නිර්මාණය කළ විට මිනිසාගේ එදිනෙදා අවශ්‍යතා මෙන්ම කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම සඳහා ද ජලය ප්‍රමාණවත් විය. මේ අනුව විශාල වැව උපයෝගී කරගෙන පහළට කුඩා වැව් සිටින සේ රුහැන් ආකාරයට වැව් බැඳීම අතීත රජ දරුවන් විසින් සිදු කර ඇත. මේ සඳහා රළි බිම් සහිත භූ දර්ශනය උපයෝගී කරගෙන තිබේ. මෙම ඇඳුතු වැව් පද්ධති නිසා මෙරට වාරි කර්මාන්තය විකාශනයේ විශාල දියුණුවක් ඇති විය.

### සාම්ප්‍රදායික වැව් ආශ්‍රිත ජල කළමනාකරණය

ලංකාවේ මුල්කාලීන ජනයා මුලින්ම ප්‍රාථමික වැටි, වේලි ආදිය යොදාගෙන ජල මාර්ගවල ගලා යන ජලය ප්‍රයෝජනයට ගෙන ඇත. වියළි කලාපයේ ජල මාර්ග ආශ්‍රිතව මොවුන් තම කෘෂිකාර්මික කටයුතුවල නියැලී ඇත. පසුකාලීනව ජනගහනයේ වර්ධනයත් සමඟ විශාල වැව් සහ අමුණු ඉදිකිරීම කෙරෙහි මොවුන් තම අවධානය යොමු කර ඇත. වියළි කලාපයේ වැව් හා අමුණු යන ක්‍රමවේද ඔස්සේ ජලයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකි වන පරිදි ජලය කළමනාකරණය කර තිබේ. මේ බව දැදුරු ඔය, කලා ඔය, මල්වතු ඔය, හා යාන් ඔය වැනි වියළි කලාපීය ජල මාර්ගවල අමුණු ඉදිකර තිබීමෙන් පැහැදිලි වේ. දකුණු ඉන්දියාවෙන් සංක්‍රමණය වූ පිරිස් ද වියළි කලාපය ආශ්‍රය කරගෙන කෘෂිකර්මාන්තය බිහි කරන ලදි.

අතීතයේ පටන්ම වියළි කලාපයේ ජනතාවට හිඟ සම්පතක් වූ ජලය ලබා ගැනීම උදෙසා අනුරාධ කුමරු මල්වතු ඔය ආශ්‍රය කරගෙන අනුරාධ ග්‍රාමය නිර්මාණය කර එම ග්‍රාම වාසීන්ගේ එදිනෙදා අවශ්‍යතා පහසු කර ගැනීමට දකුණු දිශාවෙන් කුඩා වැවක් නිර්මාණය කළ බව මහාවංසයේ සඳහන් වේ. එමෙන්ම පැරැන්නන් විසින් වැව් නිර්මාණය කුඹුරු හා සමගාමී ව දම්වැලක ආකාරයෙන් ඉදිකර ඇත. මෙම නිසා එක වැවකින් එන ජලය ඊට සම්බන්ධ වූ වැවෙහි ජල ධාරිතාව පවත්වා ගැනීමට හැකි අයුරින් වාරිමාර්ග සකස් කරගෙන ඇත. මෙම ක්‍රමය වෙල් පහු වතුර ලෙස හඳුන්වයි. ග්‍රාමීය වාරිමාර්ග යටතට ගැනෙන්නේ

වියළි කලාපයට අයත් වන ගම් වැව් හා තෙත් කලාපීය අමුණු ය. මීට අමතරව උතුරු ප්‍රදේශවල වාරිමාර්ග ක්‍රම, කඳුරට හෙල්මළු ආශ්‍රිත වාරි මාර්ග ක්‍රම හා නැගෙනහිර වියළි කලාපීය වර්ෂාපෝෂිත වූ සුළු වාරි මාර්ග ක්‍රම ද ගත හැකිය. අතීත මිනිසාගේ සමාජ, ආර්ථික මෙන්ම සංස්කෘතික ජන ජීවිතය මෙම ගම් වැව් රටාව මගින් නිරූපනය කරයි. ඔවුන් වැව හා සමඟ ඉතා සමීප සබඳතාවක් පවත්වා ඇත.

අතීත මිනිසා විසින් නිර්මාණය කරන ලද වැව් දහස් ගණනකින් ලංකාව සමන්විත වේ. ඒ බව සිතියම් නිරීක්ෂණයේ දී වැව් බොහොමයක් ඉතා ළඟින් සකස් කර තිබීමෙන් පැහැදිලි වේ. මෙම වැව් වර්තමානයේ ද භාවිතයට ගන්නා අතර සැලකිය යුතු ප්‍රමාණයක් අභාවයට ගොස් ඇත. රජරට සංස්කෘතිය බිඳ වැටීමත් සමඟ වැව් භාවිතය ක්‍රමයෙන් අභාවයට ගොස් ඇත. වියළි කලාපයට පොදු ලක්ෂණයක් වූ ගම් වැව් පද්ධතිය දීර්ඝ කාලයක් අත්හදා බැලූ ජල හා ඉඩම් කළමනාකරණ ක්‍රමයන් ද සැලකිය යුතු පාරිසරික එකඟතාවයන් ද මත නිර්මාණය වී ඇත. සෑම ගමකම පවත්වාගෙන යනු ලැබූ වාරිමාර්ග ක්‍රමයක් අතීතයේ දක්නට ලැබිණි. එම නිසා සාම්ප්‍රදායික වැව් කළමනාකරණය විධිමත් මෙන්ම අවිධිමත් අයුරින් ද සිදු වී ඇත. විශේෂයෙන්ම කුඩා ජලාශ, අමුණු ඉදිකිරීමේ දී පාෂාණවල භූ විද්‍යාත්මක ලක්ෂණ උපයෝගී කරගෙන ඇති බව පෙනේ. මේ අනුව පාෂාණ තලයේ විශාලත්වය විහිදීම ආදිය සලකා බලා ස්ථාන තෝරාගෙන ඇති අතර එම ජලය මනා පාලනයකින් යුතුව ගලා යාමට ඉඩහැර ඇත. මේ අයුරින් ජලය ක්‍රමවත්ව බෙදා හැරීමටත් වැවේ ජලය ආරක්ෂා කර ගැනීම හා වැවේ ආරක්ෂාව උදෙසා විවිධ තාක්ෂණික මෙන්ම කළමනාකරණ උපායන් අතීතයේ දී ගෙන තිබේ. ඒ අනුව වැවක සාම්ප්‍රදායික අංග දක්නට ලැබුණි. එනම් රළ පනාව, බිසෝ කොටුව, පිටවාන, සොරොව්ව, යෝධ ඇළ, කුණු ඇළ, වැව් බැම්ම එම අංග අතර වේ.

වැවක ප්‍රධාන අංගයක් වන රළ පනාව නිර්මාණය කර ඇත්තේ වැව් බැම්මේ ඇතුල් පැත්තේ බැම්ම ආරක්ෂා කර ගැනීම උදෙසා ය. මෙය වැව් බැම්මේ සිට කළුගල් අතුරා සකස් කරගෙන ඇත. බිසෝකොටුව ද වැවක අංග අතර වේ. මෙය ද අතීතයේ කළුගල් උපයෝගී කරගෙන සකසා ඇත. වැවකින් වැව් බැම්ම හරහා ජලය ගෙන යාමේ දී ඇති වන්නා වූ පීඩනය වළක්වා ගැනීම උදෙසා බිසෝකොටුව උපයෝගී කරගෙන ඇත. පිටවාන මගින් වර්ෂාව වැඩියෙන් ලැබෙන වැසි සමයන්හි වැවට එක්වන ජලය ආරක්ෂාකාරී ලෙස පිට කිරීම සිදු කරනු ලබයි. වැව් බැම්මේ කෙළවරක තරමක් පහතින් කළුගල් උපයෝගී කරගෙන මෙම නිර්මාණය සිදු කර ඇත. සොරොව්ව මගින් වැවේ ජලය පිටතට ගැනීම සිදු කරයි. අවශ්‍යතාවය අනුව කැට සොරොව්ව, මඩ සොරොව්ව, ගොඩ සොරොව්ව, රජ සොරොව්ව, කුළුණු සොරොව්ව ලෙස වර්ග කර ඇත. ප්‍රධාන ඇළ වසයෙන් සැලකෙන යෝධ ඇළ වැවෙන් කුඹුරු කරා හෝ තවත් වැවක් කරා ජලය ගෙන යාමට යොදා ගනී. සාම්ප්‍රදායික වැව්වල අතිරික්ත ජලය ගලා යනු ලබන්නේ තවත් කුඩා වැවකට ය. එහෙත් කුඹුරුවල එකතුවන අතිරික්ත ජලය පහත් බිම් කරා රැගෙන යාමට පෝටාව නමැති අංගය උපයෝගී කරගනී. එමගින් වැවේ ආරක්ෂාව සහ ජලය හිඟ නොවී පැවතීම අපේක්ෂා කරන ලදි. වැව් බැම්ම නිර්මාණය කර ඇත්තේ සාම්ප්‍රදායික වැවේ කඳු ගැට් දෙකක් යා කරමින් හෝ ස්වභාවික ගල් තලාවක් උපයෝගී කර ගනිමින්ය.

අතීතයේ රජුගේ මැදිහත්වීම මත සාම්ප්‍රදායික වැව් ආශ්‍රිත ජල කළමනාකරණය සිදු වී ඇත. පාලනාධිකාරිය සතු වගකීමක් වූ ජල කළමනාකරණය දැඩි නීති රීති, බදු අයකිරීම් මගින් පාලනය විය. ජනතාව වෙත රජකාලයේ බදු පනවා තිබූ බව කෞටිල්‍ය විසින් 'උදක බාගම්' යනුවෙන් බද්දක් ද පොළොන්නරු රන්කොත් වෙහෙරේ ටැම් ලිපියක 'අකලන්‍ය' නම් තවත් දිය බද්දක් පිළිබඳව සඳහන් කර තිබීමෙන් පැහැදිලි වේ. මෙලෙස බදු හා නීති පැනවීම

හේතු කොටගෙන ජනතාව ජලය අනිසි ලෙස භාවිතයෙන් වැළකී ඉන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ලදි. ජලය අනිසි ලෙස භාවිත කරන්නන්ට එරෙහි ව දඩ පැනවීම ද අතීතයේ පැවත ඇත. එමෙන්ම වැවක හෝ ගඟක ජල පරිභෝජනයේ දී ඊට යාබද ඉඩම්වල වපුරා ඇති කුඹුරු හෝ ධාන්‍යවලට හානි නොවන ලෙස ජලය ලබා ගත යුතු වූ අතර වැවකින් නියමිත කුඹුරුවලට හැර වෙනත් කුඹුරුවලට ජලය ලබා ගත නොහැකි විය. තමාට නියමිත වාරයේ නියමිත මාර්ගයෙන් ජලය ලබා ගැනීම කළ යුතු වූ අතර වෙනත් අනියම් මාර්ගවලින් ජලය ලබා ගැනීම හෝ හිස් බිම්වලට ජලය හරවා අනිසි ලෙස භාවිතා කිරීම නීති විරෝධී ක්‍රියාවක් විය.

සාම්ප්‍රදායිකව සිදුවන්නා වූ ජල කළමනාකරණයේ සාර්ථකත්වය රඳා පැවතියේ එකිනෙකා මත පැවරුණු යුතුකම් හා වගකීම් මතයි. ජලය බෙදාහැරීමේ සිට එය නිසි ලෙස පරිහරණය කරන ආකාරය පිළිබඳ රාජ්‍යය පරිපාලනයේ අවධානය යොමු වී තිබිණි. ඒ පිළිබඳ විස්තර තෝනිගල සෙල්ලිපියේ සඳහන් වී තිබේ. දැඩි පාලනාධිකාරයක් යටතේ නීති රීති ප්‍රතිපත්තිමය රාමුවක් තුළ සාම්ප්‍රදායික ජල කළමනාකරණය සිදු වූ බව මෙම කරුණුවලින් පැහැදිලි වේ.

**වර්තමාන ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණය**

වර්තමාන ලෝකය දෙස අවධානය යොමු කිරීමේ දී ජල කළමනාකරණය අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් වී ඇත. කෘෂිකාර්මික ආර්ථිකයක් සහිත රටක් වන ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනයාගේ ආර්ථික හා සමාජ ස්ථාවරත්වය මෙන්ම රටේ ආහාර සුරක්ෂිතතාවයේ වගකීම දරනු ලබන්නේ ද කෘෂිකාර්මික අංශය මඟිනි. ඒ අනුව කෘෂිකර්මාන්තය සඳහා බලපාන ප්‍රධානතම තීරණාත්මක සාධකය වන්නේ ජලය යි. වර්තමානයේ ජලය කළමනාකරණය සිදු කළ යුත්තේ මන්ද යන්න සළකා බැලීමේ දී අතීතයට වඩා ජනගහන වර්ධනයක් පෙන්නුම් කිරීමත්, කුඹුරු ප්‍රමාණය වැඩිවීමත් යන සාධක බලපා ඇති බව පෙනේ.

වර්තමානය වන විට ලංකාවේ වාරි ජල සම්පාදනය සඳහා විශාල වියදමක් රාජ්‍යය අංශය විසින් දරනු ලබයි. වාරිමාර්ග පද්ධතියේ ක්‍රියාකාරීත්වය නඩත්තුව හා ප්‍රතිසංස්කරණය උදෙසා සැලකිය යුතු වාර්ෂික වියදමක් දරනු ලබයි. ජලය නොමිලේ ලබා දීම නිසා ඒවා අකාර්යක්ෂම අයුරින් භාවිතා කිරීම හා අපතේ යැවීම බහුල වසයෙන් සිදුවේ. ලංකාවේ වාරි කෘෂිකර්මාන්තයේ සෑම වාරි ව්‍යාපෘතියක් ම ගතහොත් සාමාන්‍යයෙන් භාවිත වන ජල ප්‍රමාණයට වඩා වැඩි ජල අක්කර අඩි ප්‍රමාණයක් භාවිත කරයි. මෙම ජල අපතේ යැවීමට තාක්ෂණික දුර්වලතා, නිලධාරීන්ගේ දුර්වලතා, නඩත්තු දුර්වලතා, ගොවීන්ගේ අනිසි ජල පරිභෝජන රටා හේතු වී තිබේ. බොහෝ ජලය ජල මූලාශ්‍ර ආසන්නව සිටින ගොවීන්ට පමණක් ප්‍රමාණවත් ලෙස බෙදා දීමට පැවති නිසා ජල මූලාශ්‍රවලින් ඈතට වන්නට වාසය කළ ගොවීන්ට දැඩි ජල හිඟයක් ඇති වී තිබේ. මෙය ප්‍රධාන දුර්වලතාවයකි.

සාමාන්‍යයෙන් වාරිමාර්ග පද්ධතියක ජල කළමනාකරණය නිසි අයුරින් සිදුවීමට නම් රාජ්‍යය අංශ වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආදී ආයතනවල සක්‍රීය දායකත්වය අවශ්‍ය වේ. ඊට අමතරව ගොවියන්ගේ සක්‍රීය දායකත්වය හා සහභාගී වීම ද වැව් නිර්මාණය කිරීමේ දී දියුණු ඉංජිනේරු ක්‍රම ශිල්ප භාවිතය ද අත්‍යවශ්‍ය සාධක වේ. මෙම කරුණු නිසියාකාරයෙන් සම්පූර්ණ වූ විට මහා වාරි ජල කළමනාකරණයක් සිදු කිරීම පහසු වේ. අද වන විට වාරිමාර්ග ජල කළමනාකරණය ප්‍රධාන ඇළ, බෙදුම් ඇළ, කෙත් ඇළ, ජල ප්‍රවාහන ඇළ ආදී වශයෙන් බෙදීමකට ලක්කර ජලය බෙදා හරිනු ලබයි.

**නිගමනය**

මුල් කාලයේ දී කුඩා දිය පහරවල් උපයෝගී කරගෙන තම එදිනෙදා අවශ්‍යතා පිරිමසාගත් අතීත ජනයා කල් යත්ම එය දියුණු කරගෙන තම අවශ්‍යතා මෙන්ම ගොවිතැන් කටයුතු සඳහා ද උපයෝගී කර ගන්නා ලදි. ස්වභාවික පරිසරය සමග මනා ලෙස ඒකාබද්ධ වෙමින් කුඩා දිය පහරවල් වලින් ගලා එන ජලය එක්කොට ජලාශ ඉදිකර අවසානයේ මහාපරිමාණ වැව් තැනීම දක්වා ක්‍රම ක්‍රමයෙන් අතීත ජන සමාජය දියුණු විය. මේ ආකාරයට දියුණු වී වැව් පද්ධති ඇති කර ඒවායින් සාම්ප්‍රදායික ජල කළමනාකරණ ක්‍රමවේද උපයෝගී කරගනිමින් තම අවශ්‍යතා මනාව සපුරා ගත්තේ ය. වර්තමානයේ පවතින ජල කළමනාකරණ ක්‍රමවේද නවීන තාක්ෂණය, පාරිසරික බලපෑම් අගයන ක්‍රමවේද, ස්වභාවික විපත් හා අවදානම් කළමනාකරණ මෙවලම් උපයෝගී කරගෙන මනා ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව පවතින බව නිගමනය කළ හැකිය.

**පරිශීලන**


අඹන්වල, චන්දිම (2015) ***ලංකාවේ වාරි තාක්ෂණය හා එහි තිරසාරත්වය උදෙසා බලපෑ සමාජ හා තාක්ෂණික සාධක පිළිබඳ විමසුමක්*** https://sinhala.archaeology.lk

ආරියවංශ, කුමුදු (2018) ***ජල සම්පත් කළමනාකරණය අත්‍යවශයද*** https://www.silumina.lk/2018/02/24

බණ්ඩාර ටී.ඩබ්.එම්.ඩබ්, පත්මසිරි ඊ. එච්. ජී. සී, ***ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වාරි කර්මාන්තය තුළින් පිළිබිඹු වන සම්භාව්‍යය ශ්‍රී ලාංකිකයන්ගේ භූගෝලීය පරිකල්පනය*** https://www.researchgate.net

විජේරත්න වී.පී.අයි.එස් , ***ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ජල කළමනාකරණය හා ජෛව විවිධත්වය භූගෝල විද්‍යා අංශය, කොළඹ විශ්වවිද්‍යාලය*** http://archive.cmb.ac.lk

විතානාච්චි. සී . ආර්, ( 2010) ***පුරාණ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ජල කළමනාකරණයේ සුවිශේෂීතාව හඳුනාගැනීම.*** http://repository.rjt.ac.lk

විතානාච්චි. සී. ආර්. ***ලංකාවේ පැරණි ජල කළමනාකරණය මගින් වර්තමානයට ලබාග ගත හැකි ආදර්ශය (දැදුරු ඔය ආශ්‍රිත ක්ෂේත්‍ර අධ්‍යයන ප්‍රතිඵල ඇසුරිනි)*** http://repository.rjt.ac.lk

විතානාච්චි. සී. ආර්. (2009) ***පැරණි අනුරාධපුර නගරය ආශ්‍රිත ජල සම්පාදනයෙහි ලා වාරි කර්මාන්තයේ දායකත්වයත්වය හඳුනාගැනීම*** http://repository.rjt.ac.lk

විතානාච්චි. සී. ආර් (2017) ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය,*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07

සජානි ආර්. පී. එස්. ඊ, නිශාන්ත, නාමල්, ***ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වාරි කර්මාන්තය සහ ඒ ආශ්‍රිත ජල කළමනාකරණය,*** ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමා පොඩිමැණිකේ අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය. http://repository.kln.ac.lk

## 21. පුරාණ වාරි කර්මාන්තය හා තත්කාලීන දේශපාලනය

එම්. ඩී. රණසිංහ

### හැඳින්වීම

**"පෙර කරන ලද අති විශාල වැව් කර්මාන්ත සමහර විට ලක්දිව තරම් ලොව අන් කිසිදු රටක දක්නට නොලැබෙන්නේ ය. මෙතරම් කුඩා වූ රටක මෙතරම් පැරණි වූ ද විශාල වූ ද සංඛ්‍යාවෙන් වැඩි වූ ද වැව් අමුණු තවත් ඇතැයි සිතිය නොහේ......** යනුවෙන් බදුලු දිසාවේ උප ඒජන්තව සිටි බේලි ලක්දිව වාරි කර්මාන්තය පිළිබඳ වාර්තාවක් සපයමින් දක්වා ඇති අදහසට අනුරූපීව ලක්දිව තුළ පැවති පුරාණ වාරි කර්මාන්තය ඉතා විශිෂ්ඨ හා විශ්මයජනක ස්වරූපයක් ගත් බව මනාවට පසක් වේ. මෙසේ ඉතා විශිෂ්ට වූ ලක්දිව වාරි පුරාණ ඉතිහාසය පුරාවිද්‍යාත්මක සාක්ෂි ඔස්සේ පිරික්සා බලන කළ එහි මූලාරම්භක අවස්ථාව පූර්ව ඓතිහාසික අවධිය කරා දිව යන අතර ඒ සඳහා කදිම නිදසුන් ලෙස දැදුරු ඔය, යාන් ඔය යනාදි ගංගා නිම්න ආශ්‍රිත පිහිටියා වූ මෙගලිතික ජනාවාස පෙන්වා දිය හැකිය.

වියළි කලාපය තුළ ජනාවාසකරණයට ලක් වීමත් සමගම පාරිසරික දේශගුණික ගැටලු, කෘෂිකාර්මික හා දෛනික අවශ්‍යතාවන්ට ජලය ප්‍රමාණවත් නොවීම යන කරුණු හේතු කොටගෙන වියළි කලාපය තුල වාරි කර්මාන්තය ස්ථානගත වූ අතර එම පතස් ආශ්‍රිතව ආරම්භ වූ කුඩා ප්‍රමාණයේ වාරි කර්මාන්තය කල් යත්ම විශාල ප්‍රමාණයේ වාරි කර්මාන්ත බවට පරිවර්තනය විය. ඒ සඳහා එකල පැවති සමාජ පසුබිම තුළ දේශපාලන තත්ත්වය තීරණාත්මක සාධකයක් බවට පත් විය. ඒ පරිපාලන යාන්ත්‍රණය මෙහෙයවීම හේතු කොටගෙන දේශපාලනමය තත්ත්වයන් කලින් කලට වෙනස් වීමත් සමග වාරි කර්මාන්තයේ දියුණුව සහ පරිහානිය සමානුපාතිකව සිදු වන අතර පුරාණ වාරි කර්මාන්තය එකල පැවැති දේශපාලනය අත්‍යන්ත වශයෙන් සම්බන්ධ වී ඇති ආකාරය පිළිබඳව හැදෑරීම මෙමඟින් සිදු වේ.

### ක්‍රමවේදය

දත්ත සපයා ගැනීම සඳහා මූලිකව සාහිත්‍යය මූලාශ්‍ර ද, ඊට අමතරව ප්‍රාථමික මූලාශ්‍ර ද ඇසුරු කොට ගෙන සකස් වූ ද්විතීක මූලාශ්‍ර, අන්තර්ජාලය යනාදිය අධ්‍යයන ක්‍රමවේද ලෙස යොදා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

### විමර්ශනය

ස්වාභාවික ජල මූලාශ්‍රයන් ඔස්සේ ආරම්භ වූ පුරාතන මානව සමාජය මිනිස් අවශ්‍යතා සපුරාලමින් ක්‍රමවත් වාරි පද්ධතියක් නිර්මාණයට දායක වූ එකල දේශපාලන අධිකාරය පුරාණ වාරි සමාජය තුළ ඩැනියල් පී. ලූකස් ඇතුලු පිරිස දක්වන පරිදි දේශපාලන-පරිපාලන නමින් උප පද්ධතියක් ලෙස පෙනී සිට ඇත. එයට රාජ්‍යත්වයේ සිට ග්‍රාමීය හෝ ගෝත්‍රික නායකත්වය දක්වා සියලුම ව්‍යුහයන් ඇතුලත් වූ අතර එය වාරි කර්මාන්තයේ වර්ධනයට සෘජු බලපෑමක් එල්ල කිරීමට සමත් විය. ජනාවාස විස්තරණය ස්වභාවයක් නොගැනීම, ජන සංඛ්‍යාව අධික නොවීම හේතු කොට ගෙන ප්‍රාදේශීය පාලකයන් විසින් කුඩා ගම් වැව් නිර්මාණය කිරීම වාරි කර්මාන්තයේ ආරම්භක අවස්ථාව ලෙස දක්වාලිය හැකිය. එය අභිලේඛන මූලාශ්‍ර තුළ **වපි හමික හෝ වවී** යන්න පරුමක යන නිල නාමය සමඟ යොදා තිබීමෙන් එය වඩාත් පැහැදිලි වේ.

හඳගල ලිපියෙහි **පරුමක දිගදතහන කොඩපික වපිහමික** යනුවෙන් යෙදීම ද, එසේම තවත් ශිලා ලිපියක **පරුමක මහවෙබලි යනුවෙන්ද** එසේම තෝනිගල සෙල්ලිපියෙහි පරුමක අභයගේ පුත් පරුමක තිස්සගේ වැව අච්ඡගිරික තිස්ස පබ්බත විහාරවාසී භික්ෂූන්ට පූජා කර ඇති බව ද සඳහන් කොට ඇත. මෙහි දී පරුමකවරුන් යනු සෙල්ලිපි වියරණයේ යෙදුණු උගතුන් පවසන්නේ ප්‍රාදේශීය පාලකයන් බවත් මේ අනුව මුල් කාලයේ දී වාරි කර්මාන්තය කුඩා ගම්වලට සීමා වී ඇති බවත් මෙහි දී එකල ප්‍රාදේශීය පාලකයින් (ගම් ප්‍රධානින්) ගමට අවශ්‍ය ජල ප්‍රමාණයට සරිලන පරිදි වැව් නිර්මාණය සිදු කර ඇති බව ද මේ අනුව පැහැදිලි වේ.

රටක පරිපාලන ව්‍යුහය ගත් කළ දේශපාලන ක්‍රියාකාරිත්වය මත පදනම් වූ අතර මෙහි දී ඒ අතුරෙන් තම දේශපාලන බලය තහවුරු කර ගැනීම සඳහා වාරි නිර්මාණ යොදා ගැනිම එකල සිදු විය. එකල පරිපාලන සංවිධානය යටතේ මධ්‍ය පාලන තුළ රජු ප්‍රධානියා වූ නිසාවෙන් හා ඔහුගේ ප්‍රධාන වගකීමක් ලෙස වාරි කර්මාන්තය සඳහා පහසුකම් ලබා දීම අත්‍යවශ්‍ය වූ නිසාවෙන් රාජ්‍ය අනුග්‍රහය යටතේ වැව්, අමුණු නිර්මාණයෙහි යෙදීම ඒ යටතේ දැක්විය හැකිය. තව ද දේශපාලන අධිකාරියෙහි නියුතු පුද්ගලයන් තම බලය දිගු කාලීනව පවත්වා ගැනීමට නම් තමා වෙත ජනතා ප්‍රසාදය, අනුග්‍රහය නොඅඩුව පැවතිය යුතු අතර ජනතා පක්ෂපාතීත්වය පාලකයා වෙත නොමැති අවස්ථාවන්හි දී පාලකයාගේ බලය කෙටි කලකට සීමා වන බවත් ජනතා පක්ෂපාතීත්වය ඉහළ මට්ටමක ඇති විට පාලන කාලය දීර්ඝ වන බව අතීත දේශපාලන සංසිද්ධි අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

මෙහි දී ඒ සඳහා වාරි නිර්මාණයන් සිදු කිරීම දැක්විය හැකි අතර නිදසුන් ලෙස පරාක්‍රමබාහු රජු, වසභ රජු, පළමුවන විජයබාහු රජු, මහසෙන් රජු සාහිත්‍ය මූලාශ්‍ර ඔස්සේ පෙන්වා දිය හැකිය. අනුරාධපුර යුගයේ රජ කළ ආගමික වශයෙන් ඉතා පිළිගැනීමක් නොමැති මහාවිහාරික භික්ෂූන්ට වධහිංසයන්ට ලක් කර සහ ගෞරවයක් නොමැති, සමාජයේ අප්‍රසාදයට පත් පුද්ගලයෙකු වූ මහසෙන් රජු මින්නේරිය වැව, කවුඩුල්ල වැව, මහකනදරා වැව යනාදී වැව් නිර්මාණය කිරිමෙන් අනතුරුව ජනතාව අතර දෙවියෙකු බවට පත් විමය. එසේම පොළොන්නරු යුගය වන විට ජනතාව වෙත සමීප වීම සඳහා වාරි කර්මාන්තය යොදා ගත් අතර පළවන විජයබාහු රජ විසින් කැඩී බිඳී ගිය වැව්, අමුණු ප්‍රතිසංස්කරණය කරන ලද වාරිමාර්ග පිළිබඳව විස්තරයක් චූලවංශයේ සඳහන්ව තිබීම දැක්විය හැකිය. එහි දී ඔහු දිසවත්තුක වැව, දෙවන මොග්ගල්ලාන රජු විසින් නිර්මාණය කර ඇති පත්තපාසාන වැව, මහාසේන රජු විසින් නිර්මාණය කර ඇති මහාදාරගල්ල වැව, පළවන උපතිස්ස විසින් තනන ලද වලාහස්ස වැව, දෙවෙනි සේන රජු විසින් විශාල කළ බානුවාපි හෙවත් කාණ වාපි, එමෙන්ම පණ්ඩවාපි වැව, දෙවන අග්ගබෝධි තනන ලද එරන්ඩෙගල්ල වැව, තවද කුම්භිල සොබ්බක වැව, සරෙහරු වැව, කිත්තග්ගබෝධි පබ්බත වැව, මණිවාටක වැව යනාදිය ප්‍රතිසංස්කරණය කිරීම මේ යටතට දැක්විය හැකිය. ඒ අනුව පැහැදිලි වන්නේ චෝල ආක්‍රමණිකයන් විසින් රට යටත් කර සිටි අභියෝගාත්මක අවස්ථාවේ බිඳ වැටි තිබුණු වාරි ප්‍රතිසංස්කරණය කරලීමට කටයුතු කිරීම තුළ රජය තව දුරටත් ජනතාවට සමීප කරමින් බලය ස්ථාවර කර ගැනීමට ගත් ක්‍රියා මාර්ගයක් ලෙස යොදා ගෙන තිබේ.

මෙහි උපරිම ඵල නෙලා ගනුයේ පළවන පරාක්‍රමබාහු රජය. ඔහු බලයට පත් වන්නේ දේශපාලන වියවුල් අතරින් බැව් මහාවංසයේ දක්වන අතර රාජ්‍ය බලය තමා වෙත නතු කර ගැනීමට හා ජනතා පක්ෂපාතීත්වය ලබා ගැනීම සඳහා විශාල ලෙස වාරි කර්මාන්තයෙහි නිරත වීම දැක්විය හැකිය. ඒ යටතේ පරාක්‍රම සමුද්‍රය නිර්මාණය කිරීම ද, දක්ඛිණ දේශයේ වැව්, අමුණු ප්‍රතිසංස්කරණය කර ඇති බව චූලවංශයේ සඳහන් වන අතර එහි දී ඔහු විසින් සෙට්ඨිවාපී, ගිරිබාවාපි, කොඩ්රින්ටන් නිකවැරටිය අසල හඳුනා ගෙන ඇති අම්බවාසාවාපි,

චත්තුන්නත වාපි, පටලවාපි, කාළි වාපි, කිරාවාපි, මොරවාපි, කොඩ්රින්ටන් ගල්ගමුව නිකවැව පාරේ සැතපුම් 8ක් පමණ නැගෙනහිරින් පිහිටි ගල්ගිරියාව වැව, නළනරු වාපි, හෙට්ටිපොලට සැතපුම් දෙකක් ගිනිකොණ දෙසින් හඳුනා ගෙන ඇති දැනට මලගනේ නමින් හඳුන්වන මුහුන්නරු හෙවත් මුනරු වාපි ද, ගිරියාවාපි, කසොල්ල වාපි යනාදි වැව් ප්‍රතිසංස්කරණය කිරීම සිදු විය.

කාලයාගේ ඇවෑමෙන් මූල ඓතිහාසික යුගය වන විට ජන සංඛ්‍යාවේ සීඝ්‍ර ප්‍රසාරණය නිසා අවශ්‍යතා සපුරා ගැන්මට, ජලය ප්‍රමාණවත් නොවීම නිසා ක්‍රිස්තු වර්ෂ පළවෙනි සියවස වන විට ලක්දිව වාරි කර්මාන්තයෙහි මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වැව් නිර්මාණය තුළ පුළුල් ව්‍යාප්තියක් දක්නට ලැබුණු අතර එහි පුරෝගාමියා බවට සාහිත්‍ය මූලාශ්‍රගත තොරතුරු අනුව වසභ රජු දැක්විය හැකි අතර ඔහු විසින් මානන්කැටිය, විලච්චිය යනාදි වැව් 11ක් නිර්මාණය කිරීම නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. මෙලෙස වැව් නිර්මාණය කිරිම තුළ ජලය ප්‍රමාණවත් නොවීම මෙන්ම අවශ්‍යතා සපුරා ගැන්මේ යනාදි ගැටලුවලට පිළියම් ලැබීම හේතු කොටගෙන නිසා දේශපාලන වශයෙන් ස්ථාවර බවක් ඇති කර ගැන්මට වාරි කර්මාන්තය යොදා ගෙන ඇති අයුරු මින් පැහැදිලි වේ.

පරිපාලන කේන්ද්‍රස්ථානය තුළ පරිපාලිත සීමාව කරා බලය ව්‍යාප්ත කිරීම දේශපාලන ක්‍රියාවලියේ විශේෂ ලක්ෂණයකි. ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග රාජ්‍යත්වය මගින් අනුගමනය කර ඇති අතර පරිපාලන සීමාවේ පාරිසරික අභියෝගතා හඳුනාගෙන ඒවා අවම කිරීම දේශපාලන නායකත්වය සපයාලීම සඳහා වාරි කර්මාන්තය යොදා ගත්තේය. ජල හිඟයට පිළිමයක් ලෙස වැව් නිර්මාණයෙහි යෙදුණ ද එය රජු හා ජනතාව අතර සබඳතා වර්ධනය කළේය. ඒ තුළ පරිපාලන කේන්ද්‍රස්ථානය තුළ පරිපාලිත සීමාව කරා බලය ව්‍යාප්ත කිරීමේ සාධකයක් බවට පත් විය. ක්‍රිස්තු වර්ෂ පළවෙනි සියවසෙන් පසු මෙම තත්ත්වය විධිමත්ව සිදුව ඇති අතර එකල දේශපාලන අධිකාරිය වාරි කර්මාන්තයට සෘජු දායකත්වය ලබා දිම තුළ රජු හා ජනතාව නියෝජනය කරන පරිපාලන කේන්ද්‍රස්ථානය සහ පරිපාලිත සීමාව අතර සබඳතාව වැඩි දියුණු වී ඇති බැව් පැහැදිලිය. මේ සඳහා නිදසුනක් ලෙස අමුණුවල භාවිතය දක්වාලිය හැකිය. ඒ අමුණ මඟින් බොහෝ දුරකට ජලය රැගෙන යාම සිදු වන නිසාවෙනි.

අමුණ පිහිටි ප්‍රදේශයේ ජනතාව අමුණ නිර්මාණය කිරීමට විරුද්ධ වීම හෝ විනාශ වීමේ ක්‍රියාවලියට දායක වීම සිදු විය හැකි අතර කෙසේ නමුත් අතීතයේ එවැනි ක්‍රියාවන් සිදු වී නොමැති අතර ඒ ජනතාව රජුගේ අණසකට යටත් වීම නිසාවෙන් බව මනාවට පැහැදිලි වේ. එම මධ්‍ය බලය ජනතා සුභ සාධනය පදනම් කරගෙන පර්යන්තය වෙත බෙදා හැරීමේ ක්‍රමවේදයක් මත සිදුවන්නට ඇති බව දැක්විය හැකි අතර ඒ ජනතාව විසින් වාරි කර්මාන්තය ආරක්ෂා කිරීමට පෙළඹීම නිසා ය. උදාහරණ ලෙස, පළවන අග්ගබෝධි රජු විසින් කරවන්නට යෙදුන මිණිපේ අමුණ, දෙවන උදය රජු විසින් මහාන්දිය හෙවත් වළවේ ගඟ හරස් කොට ඉදි කරන ලද අමුණ මේ යටතට පෙන්වා දිය හැකිය.

එකල දේශපාලනික ක්‍රියාවලිය සඳහා ප්‍රභූ යයි සම්මත ජනතාව වන අතර මොවුන් නගර මධ්‍ය කේන්ද්‍ර කොට ගෙන ගොඩනැගෙන මහා සංස්කෘතියට අයත් වන අතර ක්‍රිස්තු පූර්ව 300 සිට ක්‍රිස්තු වර්ෂ 100 දක්වා කාලය තුල මහරජ, රජ, පරුමක, ගමික, ගමණී යනාදිය වශයෙන් දක්නට ලැබිණ. ක්‍රිස්තු වර්ෂ පළමු සියවස වන තුරු අනුරාධපුරය හා තදාශ්‍රිත ප්‍රදේශවලට සීමා වුව ද වසභ රජු විසින් මෙම ක්‍රියාවලිය වෙනසකට ලක් කිරීම තුළ අගනුවරින් පිටත පෙදෙස්වල ද දේශපාලන අධිකාරය දක්නට ලැබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වාරි කර්මාන්තය පදනම් කරගෙන රාජකාරි ක්‍රමය බිහි විය. එකල දේශපාලනය සහ වාරි කර්මාන්තය දැඩි ලෙස සමීප සම්බන්ධතා පවත්වා ඇති බව පැහැදිලි වන අතර වාරි

කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා හසල දැනුමක් ඇති නිලධාරීන් පත් කිරීම එකල දේශපාලන අධිකාරිය විසින් ගත් සාධනීය ක්‍රියාමාර්ගයක් ලෙස හඳුන්වා දිය හැකිය. එකල රාජ්‍ය නිලධාරීන් රාජ්‍ය අධීක්ෂණය යටතේ වාරි කර්මාන්තයට යොදා ගැනීම් තුළ තම රාජකාරිය නිසි අයුරින් කිරීමට පෙළඹෙන අතර ඉහළ දේශපාලන අධිකාරියට රාජ්‍ය නිලධාරියා පෞද්ගලිකව වගකීමට බැඳී සිටින නිසාවෙන් වාරි කර්මාන්තයේ වර්ධනය උදෙසා ක්‍රියා කිරීම නිරායාසයෙන්ම සිදු වූ අතර වාරි කර්මාන්තයෙහි අභිවෘද්ධිය දිනෙන් දින දියුණු වූයේ යයි පැවසීම යුක්ති සහගත වේ. එපමණක් නොව මෙමඟින් ප්‍රධාන පාලකයා වෙත ජනතා ආකර්ෂණය නිරායාසයෙන් ලබා ගැන්මට මෙන්ම පාලකයා හා ජනතාව අතර සම්බන්ධතාවය වඩා වර්ධනය වීමට ද මෙය හේතු වූ බැව් පැවසිය යුතුමය.

එකල රාජ්‍ය පරිපාලන නිලධාරීන් පිළිබඳ තොරතුරු අභිලේඛන මූලාශ්‍ර මඟින් සපයන අතර ඒවා මේ අයුරින් දැක්විය හැකිය. දඹුල්ලේ ඇති ලෙන් ලිපියක **අණනික තිශ** යනුවෙන් දක්වා ඇති අතර සෙනරත් පරණවිතාන ශූරීන්ට අනුව **අණනික තිශ** යනු වාරි ඉංජිනේරු තනතුර හැඳින්වීම සඳහා යොදන පර්යාය පදයක් බව පෙන්වා දැක්විය හැකිය. ඊට අමතරව කෑගලු දිස්ත්‍රික්කයේ මාපිටි ලෙන් ලිපියක **අඩිකය උතර** යන්නේ සඳහන් වී ඇති අතර මෙහි දී ඇළ මාර්ග භාරව සිටි නිලධාරියෙක් හැඳින්වීමට යොදාගෙන ඇති බව හඳුනාගෙන ඇත. එපමණක් නොව දෙවැනි සේන රජු කාලයට අයත් මිහින්තලේ සෙල්ලිපියක **වැවැජැරුව** නම් නිලයක් දැක්වෙන අතර ඉන් ප්‍රකාශ වන්නේ වාරි කර්මාන්තය පිළිබඳ විධායක නිලධාරියෙක් සම්බන්ධ බව නවවෙනි හා දහවන සියවස්වලට අයත් අත්තාණී ටැම්ලිපිවල සඳහන් **වියෝ වදාරන්නන්** වාරි කර්මාන්ත පරීක්ෂකයන් විය හැකි බව එස් ඩබ්ලිව් කොඩ්රිංටන් මහතා උපකල්පනය කරයි.

එසේම පොළොන්නරු රජ මාළිගාව ටැම් ලිපියේ සඳහන් වන් **පෙරවරිබුද්** නැමැති නිලධාරියා ඇළ මාර්ගවල ජලය කෙත්වතුවලට බෙදී යන සීමා නිර්නය කරන පුද්ගලයා විය හැකි බව එච්. ටී බස්නායක මහතා ප්‍රකාශ කර තිබේ.තව ද දෙවන සේන රජුගේ අනුරාධපුර අභය වැව ටැම් ලිපියට අනුව අභය වැවේ මසුන් අල්ලන පුද්ගලයන්ට දඬුවම් කිරීමට **මාඬබියා** නම් නිලධාරියෙක් සිට ඇති බවත් ඔවුන් වාරි නිලධාරියෙක් ලෙස හඳුන්වා දීමට හැකියාවක් නොමැත්තේ ඔවුන් විසින් එක් රාජකාරියකට පමණක් සීමා නොවී ඇති බවට සාධක හමු වීම නිසාය. දහවැනි සියවසට අයත් ටැම් ලිපියක **තලා අරුත් හා තලා අරක්ක** වැදෑරුම් ලෙස තනතුරු දෙකක් දක්වා ඇති අතර තලා යන්න ජල තලාව විල් යනාදිය අර්ථ නිරූපණයට යොදා ගත් බව රුවන් මල් නිඝණ්ටුවෙහි දැක්වේ. මෙහි අරක්ක යනු ආරක්ෂක යන අර්ථය නිරූපණය වන බව හඳුනාගෙන ඇති අතර මේ අනුව පදගත තේරුම් අනුව ජලාරක්ෂක විධායක තනතුරක් බව අනුමානය කළ හැකිය. ශිලා ලිපිවල වැව් මෙහෙ යන වදන් වලින් වාරිමාර්ග ඉදිකිරීමට නඩත්තුව සඳහා ලබාගත් රාජකාරිය හැඳින්වීමට යොදාගෙන ඇත. මෙහි දී අතුරුපොලයාගම අත්තාණි කණුවේ **දොළොස් මහ වැතැන්** නම් නිලධාරියෙකු පිළිබඳ වන අතර ඔහු විසින් වැව් තැනීමට අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීම කාර්යයභාරය විය.

මේ අනුව ජලාරක්ෂක විධායක තනතුරු වාරි කර්මාන්ත පරීක්ෂකරුවන් යන ආදී සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි පුහුණු රාජ්‍ය නිලධාරී මණ්ඩලයක් එකල දේශපාලන අධිකාරිය මඟින් පත් කිරීම හේතුකොටගෙන වාරිකර්මාන්තය විශාල ලෙස ප්‍රසාරණය වූ අතර වාරිකර්මාන්තය නිසා දේශපාලන වශයෙන් එක්තරා ආකාරයකට වැඩවසම් ලක්ෂණ පෙන්නුම් කර ඇති බව සඳහන් කළ යුතුය. එසේම කලින් කලට දේශපාලන වෙනස් වීම් සිදුවීමේ දී දූරදර්ශී පාලකයන් සහ අදූරදර්ශී පාලකයන්ද බලයට පත් වූ අවස්ථා ඇති බව වංසකතා මඟින් පැහැදිලි වන අතර වර්තමානයේ ද මෙම තත්ත්වය දැකිය හැකිය. දූරදර්ශී

පාලකයන් මඟින් වාරි කර්මාන්තයේ දියුණුව ද අදූරදර්ශි පාලකයන් මඟින් වාරි කර්මාන්තයේ පරිහානිය ද සිදු වූ අතර පොළොන්නරු රාජධානියේ අග භාගය ඊට කදිම නිදසුන් සපයයි.

**නිගමනය**

යථෝක්ත කරුණුවලට අනුරූපීව පුරාණ වාරි කර්මාන්තය හා තත්කාලීන දේශපාලනය එකිනෙකට අත්‍යන්ත වශයෙන් සම්බන්ධ වී ඇති බවත් එක් අංශයක වෙනස් වීම අනෙක් අංශයේ වෙනස් වීමට ඍජුව උපස්ථම්භක වන බවත් ඒ අනුව සමානුපාතිකව වෙනස්වීය යන බවත් දැක්විය යුතුය. නිදසුන් ලෙස දූරදර්ශී පාලකයන් මඟින් වාරි කර්මාන්තයේ දියුණුව ද අදූරදර්ශි පාලකයන් මඟින් වාරි කර්මාන්තයේ පරිහානිය ද සිදු වීම දැක්විය හැකි අතර වාරි කර්මාන්තය ආශ්‍රයෙන් එකල දේශපාලන හා පරිපාලන යාන්ත්‍රණය ගොඩනැගී ඇති බවත් එකල දේශපාලන අධිකාරිය මඟින් ගනු ලැබූ ක්‍රියාමාර්ග නිසා කාලයාගේ ඇවෑමෙන් කුඩා ප්‍රමාණයේ වාරි කර්මාන්තය කල්යත්ම විශාල ප්‍රමාණයේ වාරි කර්මාන්ත බවට පරිවර්තනය වූ බැව් මනාවට පසක් වේ. එපමණක් නොව දේශපාලන අධිකාරය තම බලය තහවුරු කර ගැන්මට ජනතා ප්‍රසාදය ලබා ගැනීමට මෙන්ම රජය හා ජනතාව අතර සබඳතාව ගොඩනැගීමට පුරාණ වාරි කර්මාන්තය යොදා ගෙන ඇති බැව් මනාවට පැහැදිලි වේ.

**පරිශීලන**


අමරවංශ, කේ, (1969) **ලක්දිව සෙල්ලිපි,** කොළඹ 10, ඇම්. ඩි ගුණසේන සහ සමාගම

බස්නායක, එච්. ටී, (1997), ***පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, එස්. ඇන්ඩ්. එස් ප්‍රින්ටර්ස්, 49 ජයන්ති වීරසේකර මාවත, කොළඹ 10.

මෙන්ඩිස්, ඩී. ටී. (2017), ***පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය***, කොළඹ 10, ඇස් ගොඩගේ සහ සමාගම.

විතානච්චි, සී. ආර්., (2020), ***ශ්‍රී ලංකාවේ පුරාණ අමුණ හා සම්බන්ධ දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳ විමසුමක්***

විතානාච්චි, සී. ආර්., (2012) ***පුරාණ වාරි මාර්ග විකාශය හා පරාක්‍රම සමුද්‍රය, ශ්‍රී ලාංකේය ඉතිහාසය,*** වෙළුම සසල කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 355-380 පිටු.

සෙනවිරත්න, ඒ (1998), ***පොළොන්නරුව***, වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කොළඹ

සෙනවිරත්න, ඒ(2006***), ඥාන දර්ශන***, කොළඹ 10 ,ඇස් ගොඩගේ සහ සමාගම.

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි,බටුවන්තුඩාවේ දේව රක්ෂිත පඬිතුමා (සංස්),(1967), ***මහාවංස සිංහල***, කොළඹ රත්නාකර පොත් වෙළඳ සමාගම.

# 22. දැදුරු ඔයේ අතු ගංගා ආශ්‍රිත වාරි ජල කළමණාකරණය

ආර්. එම්. යූ. එන්. රත්නායක

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වියළි කලාපයට වර්ෂාවෙන් ප්‍රමාණවත් පරිදි ජල ප්‍රමාණයක් නොලැබීම නිසාවෙන් කෘෂිකර්මාන්තයට මෙන් ම අනෙකුත් අවශ්‍යතා සඳහා විශාල ජල ධාරිතාවයක් අවශ්‍ය බව පෙනී යන්නට විය. එම ගැටලුවට පිළියමක් වශයෙන් මෙම දැදුරු ඔය නිර්මාණය විය. පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්ක හරහා ගලාබසින මෙම දැදුරු ඔය නිම්නය ජනාවාස වීමත් සමග කෘෂිකාර්මික කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට විධිමත් ජලසම්පාදන ක්‍රමයක් තිබිණි. අතීතයේ ජජ්ජර නදිය ලෙසින් හැඳින්වූ දැදුරු ඔයේ ජල අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා නිම්නය පුරා විශාල වශයෙන් වැව් අමුණු ඉදිකර තිබේ. හඳුනා ගත හැකි ලංකාවේ ශේෂව තිබෙන ලොකු කුඩා වැව් අතර වැඩි ව්‍යාප්තියක් දක්නට ලැබෙන්නේ මේ නිම්නයේ වීම සැළකිය යුත්තකි. ඒ අනුව දැදුරු ඔයේ අතු ගංගාවන් හා ඒ ඉදිකරන ලද වැව් හා අමුණුවලින් කෘෂිකර්මාන්තයට ලැබෙන දායකත්වය මෙන් ම මිනිසාගේ අනෙකුත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය විධිමත් අයුරින් කළමනාකරණයකින් යුක්ත ව සැපයෙන ආකාරය පිළිබඳව සංක්ෂිප්ත අධ්‍යනයක් කිරීම වැදගත් වේ.

## ක්‍රමවේදය

දැදුරු ඔය පිළිබඳ තොරතුරු සෙවීමේ දී පර්යේෂණ ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර ගවේෂණය හා සාහිත්‍ය විමර්ශන භාවිතා කරන ලදී. දැදුරු ඔය ආශ්‍රිත ව ජනාවාස වී සිටින මිනිසුන්ගෙන් විමසන ලද තොරතුරුවලට අනුව ඒ මත හිඳිමින් විමර්ශනාත්මකව ගවේෂණයේ යෙදෙමින් මෙන්ම සාහිත්‍ය මූලාශ්‍රගත කරුණුවල සත්‍ය තොරතුරු සොයාගෙන අන්තර්ජාලයේ පවතින තොරතුරු මත වඩාත් අර්ථවත් කරුණු ගොඩනගා හා දැදුරු ඔයේ වාරි ජල කළමනාකරණය කොතෙක් දුරට විහිදී ඇත් ද යන්න ඉදිරිපත් කිරිම මෙම අධ්‍යනයෙන් අපේක්ෂා කරනු ලබන්නෙමු.

## විමර්ශනය

දැදුරු ඔය මාතලේ කඳුවැටියෙන් ආරම්භ වී වර්ග කිලෝමීටර් 2640ක පමණ ප්‍රමාණයක් වූ වපසරියක ගංගා ද්‍රෝණියේ ජලයත් රැගෙන හලාවත ප්‍රදේශයෙන් මුහුදට ගලා බසියි. මෙම ඔය ආරම්භය වගේම එය වැඩි වශයෙන් පෝෂණය කරන්නේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුවැටිවලිනි. දැදුරු ඔය දිගින් කිලෝමීටර් 142ක් වන අතර ලංකාවේ දිගම ගංගාධාර අතරින් හයවැනි ස්ථානය හිමි කරගනී. දැදුරු ඔය ද්‍රෝණියේ අතරමැදි කලාපය පිහිටා ඇති අතර වාර්ෂිකව ගලා යන ජලයෙන් 35% ක් නිරිත දිග මෝසමෙන් ද 15%ක් ඊසාන දිග මෝසමෙන් ද 50%ක් අන්තර් මෝසමෙන් ද පෝෂණය විම විශේෂත්වයයි. දැදුරු ඔය ගලා යන්නේ අතරමැදි කලාපයේ මැදින් නිසා වියළි කලාපයට ආවේණික ජලාශ මඟින් ජලය ගබඩා කර බෙදාහැරීම මෙන්ම ඒ කලාපයේ සූත්‍රය වන අමුණ මඟින් ජලය හරවා යැවීම ද යන වාරිමාර්ග මූලික සංකල්ප දෙක ම එක සේ භාවිතා කිරීමට අපගේ පැරැණ්නන් සමත් වී ඇත. ඉපැරණි අමුණු සංඛ්‍යාවක් තිබී ඇත්තේ දැදුරු ඔය හරහා යි. ඒ අතර, කොට්ඨබද්ද අමුණ, දිතුරේ අමුණ, සූකර නිජ්ජර අමුණ පෙන්වාදිය හැකි අතර දැදුරු ඔයේ අතු ගංගා ලෙස කිඹුල්වානා ඔය, හක්වටුනා ඔය, කොළමුණු ඔය පෙන්වාදිය හැකිය.

පළමුවන පරාක්‍රමබාහු රජ සමයේ ඉදි කළ කොට්ඨබද්ද අමුණ ඉඩම් පෝෂණය කිරීම සඳහා භාවිතා වූ බව සඳහන් වේ. කිඹුල්වානා ඔය හරහා දිතුරේ අමුණ ද ඉපැරණි අතීතයකට උරුමකම් කියයි. පළමුවන පරාක්‍රමබාහු රජ සමයේ ඉදි කළ බවට සටහන් ව ඇති රිදි බැඳි ඇළ ද ඓතිහාසික ව මෙන් ම වත්මනෙහි ද ඉමහත් සේවාවක් සපයන වාරි අමුණකි. සූකර නිජ්ජර අමුණ වේල්ල පිළිබඳව හෙන්රි පාකර් හා බ්‍රෝහියර් යන විද්වතුන් මෙහි ඉදිකිරීම් ව්‍යුහය පිළිබඳ හඳුනා ගැනීමට මෙම වාර්තා තුළ කිසිඳු උත්සාහයක් ගෙන නොමැත. සූකර නිජ්ජර වේල්ලේ උපරිම උස මීටර් 4.00ක් පමණ වේ. මෙම වේල්ල මඟින් වෙනත් ඇළක් නිර්මාණය වූ බවට සාධක නොමැති අතර ඒ වෙනුවට විකල්පයක් ලෙස තලගල්ල ඇළ නම් ස්වාභාවික දිය පහරක් නිර්මාණය කර උප ඇළ මාර්ගයකින් මාගල්ල වැවට ද කිලෝමීටර් විස්සක මඟ ගෙවමින් ජලය රැගෙන ගිය බව සඳහන් වේ. එම උප ඇළ වර්තමානයේ හින් ඇළ ලෙස හඳුන්වයි. පළමු පරාක්‍රමබාහු රජතුමා පඬුවස්නුවර සංවර්ධන කටයුතුවල නියැලී සිටිය දී මාගල්ල වැවට එහි පෝෂක ප්‍රදේශයෙන් ලැබෙන ජලයට අමතර ව දැදුරු ඔය ඉහත්තාවෙන් ද ජලය හරවා එවීමට කටයුතු කළ පඬුවස්නුවර පානීය ජල අවශ්‍යතාවය ද සපුරාලීමට කටයුතු කළ බව පිළිගත් මතයකි. පරාක්‍රමබාහු කුමරා දක්ඛිණ දේශය පාලනය කළ සමයේ ඔහු විසින් දැදුරු ඔය හරහා අමුණු තුනක් බැඳ ඇළ මාර්ග වෙත ජලය හරවා ප්‍රදේශයේ කෙත්වතු සාර කළ බව චූලවංශය දක්වයි. චූලවංශයේ **"රන් කෙම් දැදුරු ඔය දෝරදත්තික නම් සකුණ දිය බස්නාවක් ද මහ ඇලක් ද කරවා එතැන් පටන් ඌරුදොල දක්වා ද ජලය හරවා එසේ එහි ද ධාන්‍ය වර්ග රැස් කළේය"** යනුවෙන් පරාක්‍රමබාහු කුමරු දෝරදත්තික අමුණේ සිට සූකරනිජ්ජර අමුණ තෙක් ප්‍රදේශය දෝරදත්තික අමුණෙන් අස්වැද්දූ ආකාරය සඳහන් වේ. මේ අනුව දෝරදත්තික අමුණ පිහිටිය යුත්තේ සූකරනිජ්ජර අමුණට ඉහළින් විය යුතුය. සි. ඩබ්ලිව්. නිකලස් මහතා A CONCISE HISTORY OF CEYLON කෘතියේ මෙම අමුණ හක්වටුනා ඔය හා කිඹුල්වානා ඔය එක් වන දෙමෝදර පිහිටා ඇති බවත් මෙහි ඇල මාර්ගය තලගල්ල වැවට ජලය සැපයූ බවත් පවසයි. තලගල්ල වැවෙන් වාන් දමන ජලය නැවත එබවලපිටියට ඉහළින් දැදුරු ඔයට නැවත එක්කර තිබූ බවත් එම ජලය නැවතත් රඳවා මාගල්ල වැවට හරවන ලද බව පවසයි.

දැදුරු ඔය දෝණියේ පුරාණ මහවැව් අතර බතලගොඩ වැව, හක්වටුනා ඔය, කිඹුල්වානා ඔය ජලාශය, වෙස්සේරු වැව හා මාගල්ල යන වැව් වාරි ක්ෂේත්‍රයේ ප්‍රධාන කාර්යයන් ඉටුකර ඇත. දැදුරු ඔය පෝෂක ප්‍රදේශයේ වැව් ආසන්න ජල සම්පාදන ක්‍රම ක්‍රිස්තු පූර්ව සමයේ සිට ම බිහි වූ බවට සාධක තිබේ. රිදී විහාරය තිබෙන ක්‍රිස්තු පූර්ව අවසාන භාගයට අයත් ලිපියක ණී පගමක□ නම් වූ වැවක් පිළිබඳව සඳහන් වේ. ගල උඩ විහාරයේ ඇති වසභ රජුගේ ලිපිය ණීඅමරගමක□ නම් වැවක් පිළිබඳ සඳහන්ව ඇත. වාරියපොළ ආසන්නයේ ගල්වල විහාරයේ ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසට අයත් ලිපියක ''බමරහගම'' හා ''මඩගම'' නම් වැව් දෙකක් සම්බන්ධව දක්වා ඇත. මේ වැව් ත්‍රිත්වය නිර්මාණය වී ඇත්තේ දැදුරු ඔයේ අතු ගංගාවක් වන කොළමුණු ඔය ආශ්‍රිතව ය. මේ ඔය පුරාණයේ කොළඹින්න නදී ලෙස හඳුන්වා තිබේ. පඬුවස්නුවර ආසන්නයේ තිබෙන පුරාණ පඬාවැව කරවා ඇත්තේ මේ ඔය හරස්වන පරිදිය. පාණ්ඩවාපිය (පාණ්ඩා වැව) ලෙසින් හැඳින්වුණු මෙම වැව පළමුවන විජයබාහු රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලදි. දක්ඛිණ දේශය සංවර්ධන කාර්යයේ දී පළමුවන පරාක්‍රමබාහු රජු විසින් මෙම වැව වඩාත් විශාල කරන ලද අතර අනතුරුව එය බැණ සමුද්‍රය ලෙස ව්‍යවහාර විය. වර්තමානයේ හෙට්ටිපොළ ආසන්නයේ දක්නට ලැබෙන අතර එය ප්‍රතිස්ථාපනය කිරීමට මිනුම් සැලසුම් කටයුතු කර ඇස්තමේන්තු සමඟ රජයට ඉදිරිපත් කර තිබුණ ද අදටත් එම වැව ප්‍රතිසංස්කරණය කිරිමට නොහැකි විය.

දැදුරු ඔයේ ඉහළ පෝෂක ප්‍රදේශයේ වැඋඩ ආසන්නයේ යටිවිල තිබෙන ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසට අයත් ලිපියක ''චකොර'' නම් වූ වැවක් ද නැලව පිහිටි ලිපියක ''විහරවලිය'' නම්

වැවක් පිළිබඳව ද සඳහන් වී ඇත. වාරියපොළ නගරයට සමීප ව පිහිටි කදිරාගල විහාරයේ තිබෙන අපර බ්‍රාහ්මී ලිපියක මඩර වැව නමින් වූ වැවක් පිළිබඳ සඳහන්ව ඇත. දැදුරු ඔය හා ඒ ආශ්‍රිත ජල මාර්ග පාදක කරගෙන සංවිධානාත්මක වාරි කර්මාන්ත ඉදි කිරිම ආරම්භ කර ඇත්තේ මහසෙන් රජු විසිනි. කුම්භීල නදී හෙවත් කිඹුල්වානා ඔය හරස් කර කරවන ලද කුම්භීලවාපී හෙවත් කිඹුල්වානා වැව මේ රජුගේ වැදගත් වාරි නිර්මාණයකි. පස්වන කාශ්‍යප, පළමුවැනි විජයබාහු හා පළමුවන පරාක්‍රමබාහු යන රජවරුන් විසින් මේ වැව යළි ප්‍රතිසංස්කරණය කර ඇත.

දැදුරු ඔය ආසන්නයේ නිකවැරටිය ප්‍රදේශයේ තිබෙන මාගල්ල වැව ද මහසෙන් රජුගේ නිර්මාණයකි. මෙය මහාගල්ලකවාපි ලෙස හඳුන්වා ඇත. දෙවන වාරි කර්මාන්තය වන මෙය හක්වටුනා ඔය හා කිඹුල්වානා ඔය යන අතු ගංගා එකට හමුවන ස්ථානය වූ සූකර නිජ්ජරයෙහි අමුණු බැඳවීමයි. මේ අමුණේ  සිට ඇළක් මඟින් මහාගල්ලක වාපියට (මාගල්ල වැවටත්) ජලය ගෙන යන ලදී. මාගල්ල වැවේ ධාරිතාව කියුබික් මීටර් 9.251 හෙවත් අක්කර අඩි 6205ක්  වන මුළු වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 206.5කි. මේ වැව ඊට අවුරුදු 850කට පමණ පෙර මහසෙන් රජු විසින් තනවන ලද්දකි. වැවේ වේල්ල ශක්තිමත් කර අලුත් ඇළෙන් ගෙන එනු ලබන ජලය රඳවා ගැනීමට හා පිට කිරීමට හැකි වන සේ එහි සොරොව්ව විශාල කර ඇත. 1889 දී හෙන්රි පාකර් විස්තර කරන්නේ මේ කළුගල් අමුණු බැම්ම දිගින් අඩි 280ක් සහ උස අඩි 15ක් වන බවයි. මෙහි දී වඩා විශාල අමුණු බැම්මකින් ජලය බැද රඳවා රිදී බැඳි ඇළ නමින් හැඳින්වෙන ඇළ දිගේ මාගල්ල වැව කරා ජලය ගෙන ගොස් ඇත. මාගල්ල වැවට ඇතුළු වන්නා වූ එකම ඇළ නම් එබවලපිටිය අමුණෙන් නික්මෙන රිදීබැඳි ඇළයි. මේ නිසා මෙය ඒකාන්තයෙන් ම පරාක්‍රමබාහු රජු විසින් දැදුරු ඔයේ කරවන ලද දෙවැනි වාරි කර්මාන්තය වේ. සැතපුමක් දිග වේල්ලකින් යුත් මාගල්ල වැවේ ජල ධාරිතාව අක්කර අඩි 6205 කි.  මේ වැව 1873 දී සහ 1958 දී ප්‍රතිසංස්කරණයට භාජනය වූ වැවකි. මාගල්ල වැවේ සිට ඇළ මාර්ග තුනකින් වැව යටතේ වගා කර ඇති කුඹුරුවලට ජලය සපයයි.  ඉන් එක් ඇළක් හීලෝගමල දණ්ඩුවාව ප්‍රදේශය කරා ද අනෙක් ඇළ ඉබ්බාවල ප්‍රදේශය කරා ද අනෙක් ඇළ මාර්ගය මාගල්ලේගම ප්‍රදේශය කරා ද ගමන් කෙරේ. මේ ඇළ මාර්ගය මඟින් ජලය සැපයිය හැකි මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය දැනට අක්කර පන්දාහක  ඉක්මවා ගොස් ඇත.  දැදුරු ඔයට ඊසාන දෙසින් පිහිටි හුළුගල්ල වැව මහසෙන් රජු විසින් කරවන ලද සුළුගුළු වැව ලෙස හඳුනාගෙන ඇත. වංශකතාවේ ''ඛීසීරු වැව'' ලෙස සඳහන් වන්නේ මෙම වැව විය හැකිය. ධාතුසේන (ක්‍රිස්තු වර්ෂ 455-473) රජු දැදුරු ඔයේ පෝෂක ශාඛාවක් වූ සංඛවඩ්ඩමානක නදී හෙවත් හක්වටුනා ඔය ආශ්‍රිත ව මා එළිය වැව කරවා තිබේ. පළමුවන විජයබාහු රජු මෙම වැව ප්‍රතිසංස්කරණය කළ බව මහාවංශයේ දැක්වේ. ධාතුසේන රජු විසින් ම දැදුරු ඔයට නැගෙනහිර දෙසින් වූ මැද්දකැටිය වැව ලෙස හැඳින්වෙන පුරාණ සංගමු වැව කරවා ඇත. පළමුවන අග්ගබෝධි රජු හිරිවඩ්ඩමාන වැව තැනවීය. මෙය දැදුරු ඔයට ආසන්නයේ පිහිටි හිරිවඩුන්න වැව ලෙස හඳුනාගත හැකිය.

පළමුවන පරාක්‍රමබාහු රජු දක්ඛිණ දේශයේ පාලනය ලෙස කටයුතු කරන සමයේ මෙන් ම මහ රජු ලෙස කටයුතු කරන කාලයේ ද ප්‍රතිසංස්කරණය කරන ලද වැව් රාශියක් දැදුරු ඔය නිම්නයේ තිබෙන බව හඳුනාගෙන තිබෙන අතර මෙතුමා දක්ඛිණ දේශයේ පාලකයා ව සිටි අවධියේ දැදුරු ඔය නිම්නයේ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණය කිරිම වඩාත් වර්ධනීය ස්වරූපයක් පෙන්නුම් කරයි. බතලගොඩ වැව පැරණි නිර්මාණයක් ලෙස හඳුනාගෙන ඇත. කුමාරදාස රජු හා කල්‍යාණවති රැජිණ (ක්‍රි. ව 1202-1208) විසින් මෙම වැව ප්‍රතිසංස්කරණය කළ බව ව්‍යවහාර වේ. වැව් බැම්මේ තිබෙන පුවරු ලිපියෙන් කල්‍යාණවතී රැජිණ මෙම ප්‍රදේශයේ කළ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු ලබාගත හැකිය. බතලගොඩ වැව හා එයට දැදුරු ඔයෙන් අමතර ජලය රැගෙන එන මහ ඇළ නැවත රජ සමයේ ජලයෙන් පිරී ඉතිරී ගියේ ඉමහත් උත්සාහයෙනි.

දැනට එය හෙක්ටයාර් දෙදහස් විසි පහකට දියවර සපයන කිලෝමීටර් 1.5ක් දිග වැව් බැම්මකින් මිලියන කියුබික් මීටර් හයක ධාරිතාවයක් රඳවා ගත හැකි මනරම් ජලාශයක් ලෙස පෙන්වාදිය හැකිය. දැදුරු ඔයෙහි ජලය තවදුරටත් ජන සමාජයේ හා පරිසරයේ උන්නතිය වෙනුවෙන් සංවර්ධනය කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව නිරන්තර විමර්ශන කරමින් සිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුව රිදී බැදි ඇළ අමුණට ඉහළින් නව ජලාශයක් ඉදිකිරීම පිළිබඳ ව අවධානය යොමු කිරීම ආරම්භ කළේ 1960 දශකයේ දී ය. 2014 වසරේ දී එය යතාර්ථයක් වූයේ ජලය මිලියන කියුබික් මීටර් හැත්තෑ පහක ධාරිතාවයකින් යුත් නව දැදුරු ඔය ජලාශය කැණීම කරලීමෙනි. මෙය වඩාත් ම වැදගත් ලක්ෂණයක් වන්නේ නව වගා බිම්වලට අමතරව එය පවතින මහා පරිමාණ හා මධ්‍යම පරිමාණ වැව් පද්ධතිවලට කන්න දෙක ම වගා කිරීමට හැකි පරිදි හිඟ කාලය ලබා දීමට වඩා ප්‍රමුඛත්වය ලබා දීමයි. කිලෝමීටර් 44ක් වූ වම් ඇළ මගින් එල්ලංගා පද්ධති 30ක් පෝෂණය කරන අතර දකුණු ඉවුරු සොරොව්වෙන් නිකුත් කරන ලද ජලය අන්තර් නිම්න ඇළ මාර්ගය මඟින් මී ඔය හරහා ඉදිකර ඇති ඉඟිනිමිටිය ජලාශයට අමතර ජලය ලබාදෙයි. හක්වටුනා ඔය හෙක්ටයාර් 1780කට සෙත සලසන මෙහි ධාරිතාවය මිලියන කියුබික් මීටර් විසිහයකි. කුම්භීය වාපි නමින් අතීතයෙත් නීරමුල්ලේ වැව ලෙස මෑත ඉතිහාසයේත් හැඳින්වූ කිඹුල්වානා ඔය මහසෙන් රජු ඉදිකරන ලදි. මීට අමතර ව සූකරග්ගවාපි නම් වාරි කර්මාන්තය කිනියම කෝරලේ දැදුරු ඔයේ වම් ඉවුරේ පිහිටි ඌරපොත්ත මෙය යැයි කොඩ්රින්ටන් මහතා විසින් හඳුනාගනු ලැබීය. එලෙස ම මහාකිරාලවාපි ගිරියවාපිල රක්ඛමානවාපි (වර්තමානයේ රක්වාන නමින් හැඳින්වෙන වැවකි) ආදී වාරි නිර්මාණයන් දැදුරු ඔයේ අතු ගංගා ආශ්‍රිත ව නිර්මාණය වී ඇති වාරි නිර්මාණයන් ය. මෑත යුගයේ දක්නට ලැබෙන දැදුරු ඔයේ කිඹුල්වානා ඔය අතු ගංගාව හරස් කර ඉදිකරන ලද කිඹුල්වානා ඔය ව්‍යාපාරයේ වැව් බැම්ම 5575 ක් ද වන අතර එහි ජල ධාරිතාවය අක්කර අඩි 6828 දක්වා වැඩිකර කුඹුරු 1171ක් දක්වා අක්කර අඩි 450කින් වැඩි කර වාර්ෂික නිෂ්පාදනය වැඩි කර ඇත.

**වර්තමාන ඉදිකිරීම්**

වර්තමානයේ දක්නට ලැබෙන මනා ජල කළමනාකරණයකින් යුක්ත ව නිර්මාණය වූ විශිෂ්ටතම නිර්මාණය වන්නේ දැදුරු ඔය ජලාශය යි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැදුරු ඔය හරහා ඉදි කරන ලද වාරි නිර්මාණයකි. වර්ෂ 2014 දී ඉදිකරන ලද මෙම ජලාශයේ මූලික අරමුණ සඳහා ජලය ඝණ මීටර් බිලියනයක් රඳවා තබා ගැනීමයි. එසේ නොමැති නම් මුහුදට ගලා යයි. ජලාශයේ ස්ථාන අධ්‍යනය වර්ෂ 2006 දී ආරම්භ වූ අතර ඉදිකිරීම් වර්ෂ 2008 දී ආරම්භ විය. ජලාශයේ ස්ථාන අධ්‍යනය සහ සැළසුම් කිරීම වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉංජිනේරුවන් විසින් සිදු කරන ලදි. දළ වශයෙන් මීටර් 2400 (අඩි 7900) පළලකින් යුත් වේල්ල 75,000,000 $m^3$ ($2.6x10^0$ cu ft) ධාරිතාවයකින් යුත් දැදුරු ඔය ජලාශය නිර්මාණය කරයි. ජලාශයේ ජලය දළ වශයෙන් හෙක්ටයාර් 11000 (අක්කර 27000) ක ගොවි බිම්වලට වාරි ජලය සැපයීම සඳහා භාවිතා කරන අතර විදුලිබල හා බලශක්ති ආමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන මෙගාවොට් 1.5 ක ජල විදුලි බලාගාරයක් බල ගැන්වීම ද සිදු කරයි. දෙවන වාන් දොරටු අටට අමතර ව ජලාශයේ සිට (වාරිමාර්ග සඳහා) වම් ඇළ මධ්‍යම ඇළ හා දකුණු ඇළ යන ඇළ මාර්ග තුනක් හරහා ගමන් කරයි. දකුණු ඇළ යනු කිලෝමීටර් 33ක් (සැතපුම් 21) කඳක් සහිත ට්‍රාන්ස් - බේසින් කොන්ක්‍රීට් ඇළකි. දකුණු ඇළ දැදුරු ඔය ජලාශයේ සිට ඉඟිනිමිටිය ජලාශය දක්වා 300 cu ft/s ($8.5m^3$ /s) ප්‍රවාහ අනුපාතයකින් ජලය ගලා යන ඇළකි. දැදුරු ඔය නිම්නයේ පුරාණයේ සිට ම කුඩා වැව් මූලික වූ සුළු වාරි නිර්මාණ මත පදනම් ව ගොඩනැගුණු වාරි පද්ධතියකින් සමන්විත විය. නිම්නය ආවරණය වන පරිදි ඉදි වී ඇති විශාල වාරි නිර්මාණ පවතින්නේ සුළු ප්‍රමාණයකි. අධ්‍යයන ප්‍රදේශය තුළ කුඩා වැව්

විශාල ප්‍රමාණය දක්නට ලැබෙන්නේ මේ නිම්නයේ විම විශේෂත්වයකි. ඒ සඳහා හේතුවන්නට ඇත්තේ ප්‍රදේශයේ භූ විෂමතාව බව සිතිය හැකිය.

**නිගමනය**

වර්තමානය වන විට වාරි ජල කළමනාකරණය පිළිබඳ ගෝලීය මට්ටමින් සාකච්ඡා වන අතර දැදුරු ඔයේ අතු ගංගා ආශ්‍රිත වාරි ජල කළමනාකරණය පිළිබඳ සළකා බැලීමේ දී අතීතයේ පටන් වර්තමානය දක්වා නිර්මාණය වූ වාරි නිර්මාණයන්ගෙන් දැදුරු ඔය ආශ්‍රිත ප්‍රදේශවල කෘෂිකර්මාන්තය හා අනෙකුත් වැඩ කටයුතු සඳහා මෙම වාරි නිර්මාණයන් මනා කළමනාකාරිත්වයකින් යුක්ත ව ජලය සැපයීම මනා පිරිවහලක් වේ. දැදුරු ඔයේ අතු ගංගා ආශ්‍රය කරගෙන බිහි වූ වැව් සංවර්ධනය හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රජයේ දායකත්වය නොමඳ ව ලැබිය යුතුය.

**පරිශීලන.**


සුජීව දිසානායක, (2010 මැයි), **ශ්‍රී ලාංකේය වාරි ශිෂ්ටාචාරය**, ඉන්දික කුමාරසිංහ, සිස්ටම්, වීරඹුගෙදර

හදා කමලදාස, **දැදුරු ඔය ප්‍රවාහයෙන් දිය දෝතක්**, ශ්‍රී ලංකා පුරාවිද්‍යාව ,.m.facebook.com - Access Date: 2022.02.10

විතානාච්චි, සී. ආර්., (2012) ***මූල ඓතිහාසික අවධිය***, ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම ස, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 43- 64 පිටු.

විතානාච්චි, සී. ආර්., (2012) ***පුරාණ වාරි මාර්ග විකාශය හා පරාක්‍රම සමුද්‍රය, ශ්‍රී ලාංකේය ඉතිහාසය***, වෙළුම සසල කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 355-380 පිටු.

withanachchi CR , Ancient Sukara Nijjara Dam Of The River – Deduru Oya In Sri Lanka ,repository.rjt.ac.lk, (online) , Acess Date – 2022.03.19

Samarasinghe S.A.P, Sakthivadivel R,Hillmy Sally , Sustainable Management Of the Deduru Oya River Basin Sri Lanka , https://publications.iwmi.org ,Access Date: 2022.03.19

Weerakoon S.B, Deegalage Saliya Sampath, Srikantha Herath, Integrated Water Resoursess Analysis Of the Dawduru Oya Left Bank Counsidering Traditional and Modern Systems, https://www.researchgate.net ,Access Date: 2022.03.19

Deduru Oya Reservoir ,irrigation Ministry, http://irrigationmin.gov.lk , Access Date: 2022.03.15

Samarakoon S.M.L.D ,Dayawansa N.D.K,Gunawardena E.R.N, Land Use Changes Resulting From Construction Of Deduru Oya Reserviour and its.impacts On Livehood, https://www.researchgate.net ,Access Date: 2022.03.19

දැදුරු ඔය ජලාශු ව්‍යාපෘතිය, http://cea.nsf.ac.lk , 2022.03.19

Deduru Oya Reservoir – https://www.tripadvisor..com, 2022.03.18

“Deduru Oya Reservoir the Large irrigation Solution for North Western Province – Ministry of irrigation – http://irrigationmin.gov.lk , Access Date: 2022.03.18

## 23. රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට වාරි කර්මාන්තයේ බලපෑමක් සිදුවීද...?

කේ.ජී.එච් රන්දික

### හැඳින්වීම

ශ්‍රී ලංකාව අතීතයේ සිට රාජාණ්ඩු ක්‍රමයක් ඔස්සේ පාලනය වූ රටකි. මුලම පාලන මධ්‍යස්ථානය වූයේ අනුරාධපුර නගරයයි. අනුරාධපුර රාජධානිය බිඳවැටීමෙන් අනතුරුව ප්‍රධාන පාලන මධ්‍යස්ථානය ලෙස නැගී සිටියේ පොළොන්නරු රාජධානිය ය. අනුරාධපුර හා පොළොන්නරු රාජධානි පැවති සමයේ රජරට මුල් කොට සුවිශේෂී ශිෂ්ටාචාරයක් සභ්‍යත්වයක් ජනනය වූ බැවින් එම සමය රජරට ශිෂ්ටාචාරය ලෙස හැඳින්වේ. සමකාලීන ලොව අන් රටවලට නොදෙවෙනි අයුරින් දියුණු සංස්කෘතියක්, තාක්ෂණයක් තුළින් පොහොසත් වූ ලාංකිකයා රජරට ශිෂ්ටාචාර සමයේ මෙරට ස්වර්ණමය වූ කාල පරිච්ඡේදයක් නිර්මාණය කරවීමෙහි ලා සමත් විය. දියුණු දේශපාලන, සමාජ, සංස්කෘතික මෙන්ම ආර්ථික පසුබිමක් තිබූ මෙම රජරට ශිෂ්ටාචාරය අවස්ථා දෙකක දී විවිධ හේතූන් මත පරිහානියට ලක් වන්නට විය. අනුරාධපුර රාජධානිය බිඳ වැටීමෙන් පසු ලංකා රාජ්‍ය පොළොන්නරුවට විතැන් වූ අතර පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු රජරට ශිෂ්ටාචාරයේ අවසානය සනිටුහන් විය. මේ ආකාරයෙන් රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට විවිධ අවස්ථා වල හේතු සාධක ගණනාවක් ම බලපෑ අතර ශිෂ්ටාචාරයේ පරිහානියට ආර්ථික වශයෙන් එන වාරි කර්මාන්ත වල බිඳ වැටීම හේතු සාධකයක් වුනිද යන්න පිළිබඳව මෙමඟින් සාකච්ඡාවට බඳුන් කොට ඇත.

### ක්‍රමවේදය

මෙම ලිපිය සඳහා තොරතුරු සම්පාදනය කරගැනීම ද්විතීයික දත්ත සම්පාදන ක්‍රමවේදයන් වන සාහිත්‍යය මූලාශ්‍රගත තොරතුරු උපයුක්ත කොටගන්නා ලදී. මේ ආශ්‍රයෙන් දත්ත එක් රැස් කර ගැනීමෙන් මෙම අධ්‍යයන වාර්තාව සිදු කිරීම මඟින් රජරට ශිෂ්ටාචාර අවධිය පරිහානියට පත් වන්නට සෘජුවම හෝ වක්‍රවම හෝ බලපෑම් කළ වාරි කර්මාන්තයේ බලපෑම පිළිබඳව විමර්ෂණාත්මක අධ්‍යයනක් සිදු කිරීමට බලාපොරොත්තු වෙමි.

### විමර්ශනය

පුරාණ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තියේ ඉතා වැදගත් තැනක් ජල සම්පත් පාලනය වෙත යොමු වී තිබිණ. ඒ මන්ද යත් පූර්ව ඓතිහාසික අවදියේ ජනගහනය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ ඇති වූ ආහාර අවශ්‍යතාවයට පිළියම් යෙදීම වෙනුවෙන් වගා බිම් ප්‍රමාණය ව්‍යාප්ත කිරීමට ඔවුනට සිදු විය. එහි දී වියළි කලාපයේ පැවති වියළි දේශගුණික තත්වය ඔවුන්ට මහත් අභියෝගයක් වූ අතර එයට විකල්ප විසඳුම් සොයා යෑමට ඔවුන්ට සිදු විය. පූර්ව ඓතිහාසික අවදියේ මුල් කාලයේ දී වියළි කලාපීය ජනයා සිය ජල අවශ්‍යතා සපුරාගෙන ඇත්තේ ස්වාභාවිකව නිර්මාණය වූ රැළි භූමි හේතුවෙන් හැඩගැසී තිබූ 'පතස්/පතහ' නම්වන වර්ෂා ජලය ඒකරාශී වූ කුඩා පොකුණු හරහා බව විද්වත් මතය වී ඇත. ඉන්පසු අවදියේ දී මූලාශ්‍රයමය ගත තොරතුරු මත පෙනී යන්නේ ජනයා සිය කෘෂිකාර්මික අවශ්‍යතා වෙනුවෙන් වැව් නිර්මාණය වෙත යොමු වූ බවයි. ඒ පිළිබඳව තොරතුරු වංශකතාවන්හි නොදැක්වුණත් ශිලා ලේඛන ආශ්‍රිතව යම් තොරතුරු ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

ක්‍රමයෙන් සිදු වූ ජනගහන වර්ධනයත් සමඟ ඇති වූ ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය යටතේ තරමක් විශාල වැව් නිර්මාණය වී ඇති අතර මුල්කාලීන රජවරුන් ඒ අයුරින් ඊට අනුග්‍රහය දැක්විය. ක්‍රමිකව සිදුවූ ජනගහණ ප්‍රසාරණය සමඟ ඇති වූ ආහාර අවශ්‍යතාවයන්ට පිළියම් සෙවීම වෙනුවෙන් ක්‍රි. පූ. 1 වන සියවසේ සිට මහා වැව් ඉදිවන්නට පටන් ගැනුණු බව ලිඛිතමය සාධක ඇසුරින් නිගමනය කළ හැකිය. පොළොන්නරු අවදියේ මහා පැරකුම් රාජ්‍ය සමයේ සිට ශ්‍රී ලාංකිකයෝ සමුදුරු පරයන වැව් තැනීමට යොමු වූයේ දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් ද සමඟයි. කෙසේ හෝ රජරට ප්‍රදේශයේහි සෑම ගමකටම පාහේ වැවක් තිබුණු බවට සාධක දනුදු හඳුනාගත හැකිය. අතීත ලාංකික ආර්ථිකය මුළුමනින්ම පාහේ කෘෂිකාර්මික පදනමකට යටත්ව තිබුණෙන් ආර්ථික ස්ථාවරත්වය සඳහා සැළසුම් සහගත ලෙස ජල පරිභෝජනය අත්‍යාවශ්‍ය කරුණක් විය.

ශ්‍රී ලංකාවේ වියළි කලාපය මුල් කරගනිමින් බිහි වූ නාගරීකරණයේ ඵලයන් වූයේ අනුරාධපුරය හා පොළොන්නරුවයි. පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිට පස්වන මිහිඳු රජු දක්වා ශතවර්ශ දාහතරක් පමණ පැවති ලංකාවේ පළමුවෙනි රාජධානි සමය වූ අනුරාධපුර රාජධානි සමය තුළ රජරට ශිෂ්ටාචාරයේ ආරම්භය සනිටුහන් විය. රජරට ශිෂ්ටාචාරයේ දෙවන උපත ලෙස අනුරාධපුර රාජධානිය බිඳ වැටීමෙන් පසුව පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස ගොඩ නැඟීම පෙන්වා දිය හැක. එය ශත වර්ෂ දෙකකට සීමා විය. අනුරාධපුර යුගය අරඹමින් පණ්ඩුකාභය රජුගේ සිට පොළොන්නරු යුගයේ පැරකුම්බා ආදි පාලකයන් සිදු කල සුවිසල් වාරි නිර්මාණ රජරට ශිෂ්ටාචාර අවධිය තුළ වාරි තාක්ෂණය දීර්ඝ කාලයක කාල යාත්‍රාවක් දියත් කිරීය. කෘෂිකාර්මිකව ලත් සමෘද්ධිය කොතෙක් ද යත් දේශීය අවශ්‍යතා පූර්ණයෙන් අනතුරුව අතිරික්තය අපනයනයට පවා යොමු වූ ආර්ථික හැකියාවක් මෙරට සතුවිය. එය ක්‍රි.ව 7 වන සියවසෙන් පසු අභාවයට ගිය අතර මේ සමය වන විට ලක්දිව සතර වරක් විදේශීය ආක්‍රමණ වලට ගොදුරු විය. ඒවායේ බලපෑම තුලින් මෙම යුග වල පරිහානිය සිදු විය. රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය පිළිබඳ විමසීමේ දී අනුරාධපුර මෙන්ම පොළොන්නරු යුග ද්විත්වයේම සිදු වූ සංසිද්ධීන් බලපාන්නට වූ බව අධ්‍යයනයේ දී පෙනී යයි. ඒ අනුව මෙහිදී රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට වාරි මාර්ග වල බලපෑමක් සිදු වුනාද යන්න පිළිබඳව කරුණු දැක්වීමේ දී මෙම රාජධානි දිවිත්වයේම පරිහානිය සිදු වන අවස්ථාවන් වල දී ආර්ථිකමය වශයෙන් වාරි මාර්ග වල බිඳ වැටීමෙන් සිදු වූ බලපෑම පිළිබඳව වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කර ඇත.

අනුරාධපුරය සියවස් 15ක් පමණ කාලයක් තුළ ලංකාවේ පාලන මධ්‍යස්ථානය විය. මෙහි ආරම්භක පාලකයා පණ්ඩුකාභය රජු ලෙස සැලකෙන අතර අවසන් පාලකයා වූයේ පස්වන මිහිඳු රජු ය. මෙම රාජධානියේ පරිහානියට හා බිඳවැටීමට බලපෑ හේතු සාධක ගණනාවක් ඇති බව මූලාශ්‍රය පරිශීලනයෙන් හෙළි වේ. අනුරාධපුර රාජධානිය පරිහානියට සහ බිඳ වැටීමට බල පෑ ප්‍රධානතම හේතු සාධකය ලෙස රාජධානියේ අවසන් ශතවර්ෂයේ ඇති වූ දකුණු ඉන්දීය ආක්‍රමණ සැලකිය හැකි ය. නමුත් ආර්ථිකමය වශයෙන් ගත් කළ වාරි මාර්ග වල අඩපණ වීම අනුරපුර යුගයේ දී රාජධානියේ පරිහානියට හේතු වන්නට වූ බව මූලාශ්‍ර ගත තොරතුරු ආශ්‍රයෙන් පැහැදිලි වේ. ඕනෑම රාජ්‍යයක ශක්තිමත් බව රඳා පවතින්නේ ආර්ථිකමය ශක්තිමත් භාවය මතය. සාමාන්‍ය ජනතාව පාලකයාගෙන් බලාපොරොත්තු වූයේ වාරි කර්මාන්ත ඉදි කරමින් පවතින වාරි කර්මාන්ත නඩත්තු කරමින් ආර්ථිකයට අනුග්‍රහයක් දැක්වීමයි. මහාවංසයේ දැක්වෙන පරිදි රජරට ආශ්‍රිතව ඉදි වූ මුල්ම වැව අනුරාධ නම් ප්‍රධානියකු විසින් අනුරාධපුර දකුණු දිශාවේ කරවන ලද්දකි. ක්‍රිස්තු පූර්ව 4 වන සියවසේ පණ්ඩුකාභය රජු විසින් අභය වැව හෙවත් බසවක්කුලම වැව කරවන ලද බවට ඉතිහාසයේ සඳහන් වෙයි. එමෙන්ම දේවානම්පියතිස්ස රජු විසින් තිසා වැව ඉදි කරවීමෙන් තරමක් විශාල වැව් රාශියක් ක්‍රි.පූ. 1වන සියවස අවසානය දක්වා ඉදිවන්නට වූ බවට සාධක හඳුනාගත

හැකිය. එමෙන්ම ඒ වන විට වියළි කලාපයේ සෑම ගමකම පාහේ ගම් වැව් ව්‍යාප්තව පැවති බවට සාධක හඳුනා ගැනීමට හැකියාවක් තිබේ. මෙසේ ගම් වැව් වලින් එහි පහළ තෙත් බිම් සරු කරද්දී එක ගමකට එක් වැවක් ලෙස ආරම්භ වූ වාරිමාර්ග ක්‍රමය ක්‍රමිකව ශතවර්ෂ තුනක් පමණ තාක්ෂණිකව ලත් විකාශනය තුළින් රජරට මූලික කොට ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවස වනවිට විශාල වැව් ඉදිකිරීම ද ඇරඹිය. වසභ, මහසෙන් හා ධාතුසේන වැනි පාලකයින් වැව්, ඇළ මාර්ග හා අමුණු ඉදි කරමින් රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් අතර අවසන් වරට අනුරාධපුර රාජධානියෙහි වාරි කර්මාන්තයක් ඉදි කළ බවට තොරතුරු දක්නට ඇත්තේ හතරවන මහින්ද රජුගේ කාලයේ දී ය. ඉන් පසු වාරි කර්මාන්ත ඉදි කළ බවට හෝ ප්‍රතිසංස්කරණය කළ බවට සාධක දක්නට නොමැත.

අනුරපුර  අග භාගයේ දී පැමිණි දරුණු චෝල ආක්‍රමණය හේතුවෙන් යුධ ගැටුම් මැද මේ ආකාරයට වාරි මාර්ග පද්ධති විනාශ වෙන්නට ඇතැයි සිතිය හැක.  වාරිමාර්ග පද්ධතිය රජරට ජීවනාලිය බඳු ය. මෙම වාරිමාර්ග පද්ධතිය නොසලකා හැරීම රටේ ආර්ථිකය බිඳ වැටීමට ඉවහල් වූ කරුණකි. මේ ආකාරයෙන් විවිධ ආක්‍රමණිකයන් හේතුවෙන් අනුරාධපුර රාජධානි සමයේ වාරි මාර්ග පද්ධති අඩපණ වන්නට පටන් ගත් අතර ඊට හේතු වන්නට ඇත්තේ ආක්‍රමණික තත්වයක් මත වාරි මාර්ග පද්ධතිවල නඩත්තු කටයුතු ආදිය සිදු කරගෙන යාමට බාධා පැමිණීමයි.

එමෙන් ම අනුරපුර අග භාගයේ දී දුර්වල පාලකයන්ගේ රාජ්‍යත්වය  අනුරපුර රාජධානිය බිඳ වැටීමට හේතු වූවා මෙන්ම මෙම දුර්වල රාජ්‍යත්වය අනුරපුර වාරි මාර්ග පද්ධතියේ බිඳ වැටීමට ද ඍජුවම හේතුවක් විය. අනුරාධපුර යුගයේ අවසන් වැදගත් පාලකයා හතරවන මහින්ද රජු ලෙස සැලකිය හැකිය. මොහුගෙන් පසු බලයට පත් වූ පස්වන සේන හා පස්වන මිහිඳු යන රජවරු දුර්වල පාලකයෝ වූහ. මේ ආකාරයෙන් දුර්වල පාලකයන්ගේ රාජ්‍යත්වය රාජ්‍යයේ සෑම අංශයක්ම අඩපණ කරා සේම වාරි මාර්ග පද්ධති වල බිඳ වැටීමට ද මෙකී දුර්වල රාජ්‍යත්වය බලපාන්නට විය. ඒ ආකාරයෙන්ම වාරි මාර්ග පද්ධති වල නඩත්තුවට මෙන්ම ඒවායේ නව ඉදි කිරීම් වලට අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් රටේ කෘෂි ආර්ථිකය බිඳ වැටී රාජධානියේ පරිහානය වේගවත් වන්නට විය.

අනුරාධපුර සිංහාසනය සඳහා මෞර්ය හා ලම්බකර්ණ වංශ දෙක අතර නිරන්තර අරගල පැවතිණ. එක් පෙළපතකට හෝ දීර්ඝ කාලයක් සිංහාසනය හිමි කර ගෙන කටයුතු කළ නොහැකි විය. එම නිසා දීර්ඝ කාලයක් එක් පෙළපතක් බලයේ රැඳී සිටිමින් තම ප්‍රතිපත්ති ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි විය. මේ ආකාරයේ වාතාවරණයක් මත රටේ පාලකයා කෙසේ හෝ තම රාජ්‍යත්වය රැක ගැනීමට පමණක් උත්සහ කල අතර රටේ සමාජ, ආර්ථික තත්වයන් පිළිබඳව සොයා බලා කටයුතු කරන්නට අවධානය ලබා නොදෙන්නට විය. ඒ හේතුවෙන් මෙතෙක් කලක් අනුරපුර ශ්‍රේෂ්ඨ පාලයක් විසින් රැකගෙන ආ වාරි මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණයකින් තොරව අකාලයේ බිඳ වැටෙන්නට විය. ජලය ලැබෙන ප්‍රධාන මාර්ග එසේ බිඳ වැටෙන්නට ගත් නිසාවෙන් කෘෂි ආර්ථිකය සම්පූර්ණයෙන්ම බිඳ වැටි ආර්ථික අතින්ද රාජ්‍ය පිරිහෙන්නට විය.

අනුරපුර රාජධානිය බිඳ වැටීමත් සමඟම රජරට ශිෂ්ටාචාරයේ පළමුවන නාගරික මධ්‍යස්ථානය වියැකී යන්නට වූ අතර නැවතත් රාජ්‍ය මධ්‍යස්ථානය අනුරාධපුරයේ ස්ථාපිත කිරීමට සුදුසු පසුබිමක් නොවීම නිසාවෙන් රජරට ශිෂ්ටාචාරයේ දෙවන උපත පොළොන්නරුවෙන් ආරම්භ විය. අනුරාධපුර යුගයේ මෙන්ම ශ්‍රේෂ්ඨ පාලකයන් රැසක් පොළොන්නරු යුගයේ දී පහළ නොවූ අතර මෙම අවධියේ දී රාජ්‍යත්වයට පත් ශේෂ්ටතම

නරපතියන් කීහිප දෙනෙක් විය. ඒ අතරින් පළවන විජයබාහු රජු, පළවන පරාක්‍රමබාහු රජු සහා කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු සුවිශේෂී වේ. මේ අතරින් පළවන විජයබාහු රජු මෙන්ම පළවන පරාක්‍රමබාහු රජු රටේ ඉදිරි පැවැත්ම සඳහා විශාල වශයෙන් සේවාවන් සිදු කළ අතර රටේ පාලකයාගේ ප්‍රධානම වගකීමක් වන ආර්ථිකය ශක්තිමත් කිරීමටද විශාල දායකත්වයක් ලබා දුනි. අනුරපුර රාජ්‍ය අවසාන භාගයේ දී මෙරට වාරි කර්මාන්තයේ බිඳ වැටීමක් සිදු වූ අතර එහි යළි නැගී සිටීමක් සිදු වූයේ පොළොන්නරු අවධියේ දීය. පළවන විජයබාහු රජුගේ රාජ්‍යත්වයෙන් පසු බිඳ වැටී ගිය වාර් මාර්ග රැසක් යළි ප්‍රතිසංස්කරනය කරන්නට විය. ඒ අතර මහකනදරාව, නාච්චදූව, මාළුළිය, ඉනාමලුව, වලාහස්ස, මින්නේරිය, පණ්ඩවාපී ආදී වැව් ප්‍රතිසංස්කරණය කිරීම සිදු විය. වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කොට වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීමට උත්සාහ දැරීය. එමෙන්ම බුදුගුණ වැව නමින් අභිනවයෙන් වැවක් තැනීම ද සිදු විය.

කෙසේ නමුත් පලවන විජයබාහු රජුගේ ඇවෑමෙන් පසුව පොළොන්නරු රාජධානිය ව්‍යාකුල තත්වයකට පත් විය. පළමුවන විජයබාහු රජතුමා ක්‍රි.ව. 1150/11 කාලයේ දී අභාවප්‍රාප්ත වූ පසු දීර්ඝ කාලයක් මුළුල්ලේ කැරලි ඇති විය. මේ කාලයේ දී ඇති වූ ව්‍යාකුලතාව හේතුවෙන් වාරි මාර්ග පද්ධති වලටද වූ විනාශය පිළිබඳව චූලවංසයේ මේ අයුරින් දක්වා ඇත.

***"මේ කාලය තුළ දී පක්ෂ දෙකේ රජුන්ට යටත් සීමාවල සිටුවන ලද සාමන්තයෝ ඔවුනොවුන් සමග බෙහෙවින් යුධ කරමින් සුසමෘද්ධ නොයෙක් ගම් නියම් ගම් ගිනි තබමින් වතුර පිරුණු වැව් සිඳිමින් සියලු සොරොව් අමුණු හැම අන්දමින්ම වනසමින් පොල් ආදී ප්‍රයෝජනවත් වෘක්ෂයන් සිඳිමින් ඔවුනොවුන්ට සතුරු ව යම් සේ පැරණි ගම් පිහිටි තැනකයි දැන් එකට හැකි නොවේද එසේ රට වැනසුහ"***

අවුරුදු විසි පහක් පමණ කාලයක් මුළුල්ලේ පැවැති ව්‍යාකුල තත්වය මෙයින් පැහැදිළි වේ. මෙසේ රාජ්‍ය පාලනය ලබා ගැනීමට පමණක් අරමුණු කරගෙන රජරට ශිෂ්ටාචාරයේ පදනම වූ වාරිමාර්ග වැනසූ මෙරට අදූරදර්ශී පාලකයන් නිසාවෙන් මෙරට වාරිමාර්ග පද්ධති වලට විශාල වශයෙන් හානියක් සිදු වූ බව පැහැදිලි වේ. මෙම තත්වයද යම් තරමින් හෝ පොළොන්නරුව රාජධානියේ පිරිහීමට බලපෑමක් සිදු වූ බව පෙනේ. මන්ද මෙවැනි රාජ්‍ය ව්‍යාකුල තත්වයන් මත රටේ ආර්ථිකය ද ව්‍යාකුල වූ පසු රාජ්‍යයේ ස්ථාවරත්වය සහමුලින් ම බිඳ වැටීමට ලක්වන බැවිනි.

පළවන විජයබාහු රජුගෙන් පසු විවිධ පාලකයන් රාජ්‍යත්වයට පත් වුව ද ස්ථාවර වීමට නොහැකි විය. විජයබාහු රජුගෙන් පසුව ස්ථාවර රාජ්‍ය පාලනයක් ගෙන ගියේ මහා පරාක්‍රමබාහු රාජ්‍ය සමයේදී ය. දක්ඛිණ දේශයේ උපත ලබමින් ඉතාමත් ව්‍යාකුල තත්වයන් රැසකට මුහුණ දෙමින් හැදී වැඩෙමින් ඉතාමත් සැලසුම් සහගත ලෙස පොළොන්නරුවේ පාලකයා ලෙසට පත් වී මෙරට එක්සත් කිරීමට ද සමත් වූ ශ්‍රේෂ්ට පාලකයෙක් ලෙස පරාක්‍රමබාහු රජු හැඳින්විය හැක. පළවන පරාක්‍රමබාහු රජු මෙරට රාජ්‍යත්වයට පත් වීමෙන් පසු සමාජ, සංස්කෘතික, දේශපාලන, ආර්ථික ආදි සෑම අංගයක්ම දියුණුවට පත් වූ අවධියක් වේ. මෙම රජුගේ අවධියේ දී ආර්ථික තත්වය ද ඉතාමත් ඉහල මට්ටමක පැවතින. දිවයිනේ ආර්ථිකය දියුණු කිරීම සඳහා වාරිමාර්ග කටයුතු රාශියක් මෙතුමා විසින් කරන ලදී. ඒවා අදියර දෙකක් වශයෙන් සිදු වූ බව පැහැදිලි වේ. එනම් දක්ඛිණ දේශයේ පාලකයාව සිටි අවධියේ දී කරන ලද වාරිමාර්ග සහ දිවයිනේ ම පාලකයා වීමෙන් පසු කරන ලද වාරිමාර්ග ලෙසිනි. දක්ඛිණ දේශය සංවර්ධනය කිරීම සඳහා මෙතුමා සිදු කළ වාරිමාර්ග කටයුතු වංසකථාවේ සවිස්තර ලෙස දැක් වේ. එහිදී ''අහසින් වැටෙන එක දිය බිඳකුදු ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතු ය'' යන්න පැවසූ එතුමා දැදුරු ඔය හරස්

කර අමුණු බැඳීමට හා කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළේ අස්වද්දා එම ප්‍රදේශය සරුසාර ගොවි බිමක් කිරීමට කටයුතු කළේ ය. දැදුරු ඔයේ ජලයෙන් ප්‍රයෝජන ගැනීම උදෙසා එතුමා එහි ස්ථාන තුනක අමුණු බඳවා ජලප්‍රවාහන ව්‍යාපාර තුනක් ආරම්භ කළේ ය. ඒවා, කොට්ඨ බද්ද, සුකර්නිජ්ජර, දෝරදත්තික යනුවෙන් වංසකථාවේ සඳහන් වේ. මෙතුමාගේ වාරිමාර්ග කටයුතු අතර වැදගත් ම කාර්යය ලෙස දැක්විය හැක්කේ පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය ඉදි කිරීම යි. එය දෙවන අදියරේ දී කරන ලද්දකි. ලංකාවේ විශාලතම වැව් අතරින් එකක් වන මෙම ජලාශය ඉදි කර ඇත්තේ තෝපා, දුම්බුටුලු හා එරමුදු යන වැව් එක් කිරීමෙනි. මෙයට ජලය ලබා ගෙන ඇත්තේ අඹන් ගඟේ අංගමැඩිල්ල නම් ස්ථානයක අමුණක් බැඳීමෙනි. අමුණෙහි ජලය අංගමැඩිල්ල ඇළ දිගේ වැවට ගලා යාමට සලස්වා ඇත. තිස්තුන් වසරක රාජ්‍ය කාලය තුළ එතුමා විසින් අමුණු 165ක් ද ඇළවල් 3910ක් ද මහවැව් 163ක් ද කුඩා වැව් 2376ක් ද කරවන ලද බව වංසකථාවේ සඳහන් වේ. ප්‍රතිසංස්කරණය කරන ලද වැව් අතර, මින්නේරිය වැව, කලා වැව, නාච්චදූව වැව, ගිරිතලේ වැව, මහකනදරා වැව, යෝධ වැව, මහගල්කඩවල වැව, පදවිය වැව, අංගමු වැව, කවුඩුලු වැව, කණ්ඩලම වැව, උරුවෙල වැව, පාඬික්කුලම් වැව ආදිය සඳහන් කළ හැකි ය.

මේ ආකාරයෙන් පරාක්‍රමබාහු රජු ලාංකේය වාරි මාර්ග පද්ධතිය නගා සිටුවමින් රටේ ආර්ථිකය ඉහළ නැංවීමට ඉතාමත් මෙහෙයක් කළ බව මූලාශ්‍රගත තොරතුරු අනුව සනාථ කරගත හැක. නමුත් පරාක්‍රමබාහු රජුගෙන් පසු යළිත් රාජ්‍ය අස්ථාවර වීමට පටන් ගත් අතර ඉන්පසු රාජ්‍යත්වයට පත් වූ විවිධ පාලකයන් මඟින් මේ අයුරින් වාරි මාර්ග ක්ෂේත්‍රයට මෙහෙවරක් වූ බවට සාධක හමු නොවේ. පසුව පොළොන්නරුවේ රාජ්‍යත්වයට පත් කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල අවධිය පොළොන්නරු යුගයේ අනෙක් වැදගත් සමය විය. නමුත් මෙම රජු විසින් වාරි මාර්ග පද්ධති කිසිවක් කළ බවට සත්‍ය ලෙස සාධක හමු වී නැත. නිශ්ශංකමල්ල රජුගෙන් පසු පොළොන්නරු රාජධානියේ දේශපාලන තත්වය අවුල් සහගත විය. නිශ්ශංකමල්ල රජුගෙන් පසු පාලකයින් වාරිකර්මාන්ත ඉදි කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට පෙලඹුණ ආකාරයක් දක්නට නොමැත. රජරට ශිෂ්ටාචාරයේ ජීවනාලිය වූයේ වාරිමාර්ග පද්ධතිය යි. එය නොසලකා හැරීම ද පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට ඉවහල් විය. මෙවන් පසුබිමක් යටතේ සිදු වූ කාලිංග මාඝ ආක්‍රමණය පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ආසන්න හේතුව ලෙස පිළිගත හැකි ය.

කාලිංග මාඝගේ මෙම ආක්‍රමණය රජරට ශිෂ්ටාචාරයේ වාරි මාර්ග පද්ධතිය විනාශ වීමට සෘජුවම බලපාන්නට විය. මාඝ ආක්‍රමණය පිළිබඳ මහාවංසයේ විස්තර වී තිබේ. වාරිමාර්ග පද්ධතිය විනාශ කිරීම, ආගමික ස්ථාන විනාශ කිරීම, පාලකයන් හා නිලධාරීන් ඝාතනය, පොත් පත් ගිනි තැබීම, සිංහලයන් සතු වස්තුව කේරල භටයන්ට ලබා දීම, භික්ෂූන් හා ප්‍රභූන් ඇතුළු ජනතාවට ශාරීරික හිංසා කිරීම ආදිය සිදු වූ බව එහි සඳහන් වේ. රජරට ශිෂ්ටාචාරයේ ජීවනාලිය වන් වූ වාරි මාර්ග පද්ධති විනාශ කරමින් වැව් අමුණු කඩා දමමින් ශිෂ්ටාචාරයේ මූලික ජල අවශ්‍යතාවය විනාශ කරන්නට විය. එමඟින් කෘෂිකර්මාන්තය බිඳ වැටී ජනයා ඉතාමත් දුෂ්කරතාවන්ට මුහුන දෙන්නට විය. මේ ආකාරයෙන් වර්ෂ 1215 දී කාලිංග මාඝ ආක්‍රමණය කර වැව් අමුණු වනසා පදනම විනාශ කිරීය. වාරි කර්මාන්තය එසේ අභාවයට ගොස් වසංගත රෝග පවා පැතිරිනි. මෙවන් ව්‍යාකූල තත්වයක් හමුවේ රජරට වාසින් රජරට ශිෂ්ටාචාරය අතැර දමා මේ වන විට පිබිදෙමින් පැවති නිරිත දිග ප්‍රදේශ වලට සංක්‍රමනය වීම සිදු වූ නිසාවෙන් සියවස් ගනනාවක් මුලුල්ලේ පැවති රජරට ශිෂ්ටාචාරයේ බිඳ වැටීම සිදු විය. එය යළිත් ගොඩ නැඟීමක කිසිදු සටහනක් නොවූ අතර මාඝ ආක්‍රමනයෙන් සිදු වූ හානිය නිසාවෙන් රජරට ආර්ථික තත්වය විශාල වශයෙන් ව්‍යාකූල වී රජරට ශිෂ්ටාචාරයේ අවසානය පොළොන්නරු යුගයේ අවසානයෙන් සිදු වූ බව අවසන් වශයෙන් පෙන්වා දිය හැක.

**නිගමනය**

පාලකයන් සියයකට අධික පිරිසක් රජකම් කළ රජරට ශිෂ්ටාචාරය ක්‍රමානුකූලව පරිහානියට පත්ව වීම අවසාන වශයෙන් මාඝ ආක්‍රමණයෙන් වැනසී ගොස් නිරිත දිග රාජධානි කරා විතැන් වීම සිදු විය. නිරිත දිග තෙත් කලාපයට අයත් වූ හෙයින් රජරට දී තරම් වාරි කර්මාන්තයේ අවශ්‍යතාවක් එහි නොවීය. ඒ නිසාවෙන් රජරට ආවේනික වූ වාරි තාක්ෂණික උරුමය, රජරට පරිහානියත් සමග අපෙන් ඈත්විය. එකිනෙක බැඳී ඇති රජරට ශිෂ්ටාචාරය හා වාරි කර්මාන්තය අතර අන්තර් සබඳතාව බිඳී යාම තුල ශිෂ්ටාචාරය අවසන් විය. කෙසේ නමුත් මේ තුළින් පැහැදිලි වන්නේ රජරට ශිෂ්ටාචාරයේ දීර්ඝ පැවැත්ම තීරණය කරන ලද වාරි කර්මාන්ත වල අභාවය මුළු ශිෂ්ටාචාරයේ ම පරිහානියට ප්‍රධාන ලෙස බලපෑ බවයි.

**පරිශීලන**


ඉන්ද්‍රකීර්ති, සී. (2004), ***ශ්‍රී ලාංකේය ඉතිහාස තරංග,*** වරකාපොළ ආරිය ප්‍රකාශකයෝ.

බස්නායක, එච්. ටී. ***පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, සමන්ති පොත් ප්‍රකාශකයෝ

විතානාච්චි, සී. ආර්., (2005) ***ශ්‍රී ලංකාවේ අතීත වාරි උරුමය හා වාරි පුරාවිද්‍යා, පුරාතතන,*** ජාතික පුරාවිද්‍යා දින සමරු කලාපය, කොළඹ මධ්‍යම සංස්කෘතික අරමුදල, 95-100 පිටු.

විතානාච්චි, සී. ආර්., (2012) ***පුරාණ වාරි මාර්ග විකාශය හා පරාක්‍රම සමුද්‍රය, ශ්‍රී ලාංකේය ඉතිහාසය,*** වෙළුම සසල කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 355-380 පිටු.

ක්‍රි. ව. 11 වන සියවසේ සිට ක්‍රි. ව. 15 වන සියවස දක්වා ඓතිහාසික තොරතුරු, 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශන සංග්‍රහය

## 24. පරාක්‍රම සමුද්‍රයේ ජල කළමනාකරණය තුළින් අනාවරණය කරගත හැකි තත්කාලීන සමාජයේ තිරසාරත්වය.

යූ. චතුනි ලත්හාරි

### හැඳින්වීම

අඛණ්ඩ පැවැත්මක් සහිත ශිෂ්ටාචාරගත සමාජයක මූලිකම පදනම ජලයයි. ජලය මුල් කොටගත් තත්කාලීන සමාජ සංස්ථාවේ සමතුලිත බව ඇති කරන්නා වූ තිරසාරත්ව සංකල්පය වනාහි එකී ශිෂ්ටාචාරයේ සශ්‍රීකත්වයට බලපානු ලබන ගාමක බලවේගය වේ. තිරසාරත්වය ගුරු තැන්හි තබා අතීත මිනිසා විශාල වාරි සංස්කෘතියක් අපට උරුම කර දී තිබෙන අතර අවුරුද්දේ අඩකටත් වඩා වියළි සමයක් පවතින ප්‍රදේශයක් පුරා විහිදුනු වාරි පද්ධතිය තත්කාලීන සමාජ සැකැස්මේ ගාමක බලවේගය වීය. මෙසේ ජල ගබඩාකරණය, පානීය ජල අවශ්‍යතා සපුරාලීම, පාංශු හා භූගත ජල සංරක්ෂණය, පරිසර උෂ්ණත්වය සහ ජල වාෂ්පීකරණය අඩු කිරීම, කෘෂිකාර්මික හා වගා කටයුතු යනාදී නොයෙකුත් අංශ ගණනාවක් උදෙසා දායකත්වය සපයන වාරි පද්ධතියට අදාළ බොහෝමයක් වැව් ඊසාන දිග මෝසම් වැසි ලබන කලාපයෙහි ස්ථාපිතව පවතී. මෙසේ අවුරුදු දහස් ගණනක් තිස්සේ වැඩී අද පවා ක්‍රියාත්මකව පවත්නා වැව් හා විශාල ඇල පද්ධතීන් උදෙසා ජලය ගෙන ආ ක්‍රම රාශියක් පවතින අතර එකී ක්‍රමවේදයන්ගේ මනා තාක්ෂණික ශිල්ප උපක්‍රම හේතුවෙන් අද වන විටත් ඒවා නොනැසී ක්‍රියාත්මකව පවතී. වැවට ජලය ගෙන ආ ප්‍රධාන ක්‍රම වශයෙන් වැව හා සම්බන්ධ ඉහළ පෝෂක මූකලාන් වලින් යුත් යෝධ ඇළ පද්ධතීන්, ජල හැරවුම් නිර්මිතයන් වශයෙන් ක්‍රියාත්මක වන්නා වූ රිදී බැඳිල්ල සහ කළිඟුල් ඇලවල්, බාහිර ප්‍රභවයන්ගෙන් ජලය ලබා ගැනීම උදෙසා නිර්මිත අමුණු ද පෙන්වා දිය හැක. විවිධ වූ තාක්ෂණික ක්‍රම ගණනාවක් පදනම්ව සැකසී ඇති වාරි පද්ධතිය වටා ඉතා සංවේදී පරිසර කලාපයන් රැසක් හඳුනාගත හැකිවේ. හෙතෙම වැව් පාමුල තෙතමනය සුරකිමින් ශාක වර්ධනය උදෙසා ගෝචර වන්නාවූ ඉස්වැටිත් වැව් ඉහත්තාව තුළ ස්වභාවික ශාකයන්ගේ වර්ධනයත් වැවේ උපරිම ජල මට්ටම් සළකුනු කරන්නා වූ සිසිල් ගුණයෙන් යුත් ශාක ව්‍යාප්තව පවතින්නාවූ වැව් තාවුල්ලත් කිසිදු හෙළිපෙහෙළි කිරීමකින් තොරව ජල පෝෂක රඳා පවත්වාගනු වස් ආරක්ෂා කර තිබේ. ඊට වැඩ ඉනාමළු සකසමින් පනම් බැඳි ගස් චාරිත්‍රයන් සිදුකරමින් වැව භාර දේවාත්මයන්ගේ ආශිර්වාදය ද ගෙන තිබේ. හෙතෙම වැටිවැව්, බිසෝවැව්, කුළුවැව් යනාදීන් නිර්මාණය කරමින් විවිධ වූ අවශ්‍යතාවයන් මත වෙන වෙනම කුඩා වැව් සඳහා ජලය ලබාදීම ද කර තිබේ. අතීතයේ පැවති කෘෂිකර්මාන්තය මුල් කරගත් සමාජයන්හි තිරසාරත්වය උදෙසා උක්ත සාධක බලපා තිබේ. මේනිසා එදිනෙදා ජල පරිහරණයටත් මතුපිට ජල මාර්ගයන් ආරක්ෂා කර ගැනීමටත් හැකියාව ලැබිණි. මෙසේ අඛණ්ඩ ජල සැපයුමක් පැවතීමෙන් වගාබිම සැමදාම සශ්‍රීකව පවත්වා ගැනීමට හැකියාව ලැබීය. හෙතෙම පොළොන්නරු රාජධානියෙහි ඇති මෙවන් විශාල වාරි පද්ධතියක් වන්නේ පරාක්‍රම සමුද්‍රයයි. මෙහි වැව් බැම්ම දිගින් කිලෝමීටර් 12.38ක් සහ උසින් මීටර 9.45කි. වර්ග කි.මී. 71.71ක් පමණ විශාල ජලධාරා ප්‍රදේශයක් වටා විසිරී ඇති සමුද්‍රයෙහි ජල ධාරිතාව ඝන මීටර දසලක්ෂ 134.07ක් ද ජල පැතුරුම හෙක්ටයාර් 2539.5ක්ද වේ. උතුරින් හබරණ ප්‍රදේශය සින්නකුලම් හා දිවුලන්කඩවල වැව දක්වාත් දකුණින් කලහගල ගම, කලහගල වැව, කුකුරු මහවෙල, අංගමැඩිල්ල හා කොටවැල්ල ගම දක්වාත් නැගෙනහිරින් පොළොන්නරුව නගරය හා ගොනාගොල්ල දක්වාත් බටහිරින් සුදු කන්ද හා නැබදිල්ල කඳුවැටියටත් මායිමව ජලාශය ව්‍යාප්ත පවතී. අක්කර 28,000ක් තරම් වූ වගා බිම් ප්‍රමාණයකට මින් ජලය සැපයිය හැක. ඒ හරහා ගොවි පවුල් 20,000ක් පමණ පෝෂණය වේ. තෝපා වැව, දුබුටුළු වැව, එරමුදු වැව, භූ වැව, කලහගල වැව හා බැඳි වැව යන ප්‍රධාන වැව් හයක ඒකාබද්ධයෙන් ගොඩනැංවුණු මෙකී සුවිශාල වාරි කර්මාන්තයෙහි ඇති ඉතා වැදගත් තාක්ෂණිකවූත් පාරිසරික හිතකාමීවූත් ක්‍රියාපටිපාටියන්

හරහා තත්කාලීන කෘෂිකර්මාන්තය මුල් කොටගත් සමාජයේ තිරසාරත්වයට හේතුවක් වී තිබේ.

**ක්‍රමවේදය**

මෙහි පර්යේෂණ අරමුණ බවට පත්වූයේ කෘෂිකර්මය මුල් කොටගත් තත්කාලීන සමාජයේ තිරසාරත්වයට පරාක්‍රම සමුද්‍රය සමඟ බැඳුණු වාරි පද්ධතියේ දායකත්වය කෙබඳු දැයි නිර්ණය කිරීම වේ. ඒ සඳහා අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රම වශයෙන් සාහිත්‍ය විමර්ශනය හා අන්තර්ජාලයත් ජාතික භූ දත්ත කළමනාකරණය යටතේ ඇති ජියෝ පෝර්ටර්ල්ස් උපාංගයත් යොදා ගන්නා ලදී. උක්ත පර්යේෂණයේ අවසන් අභිප්‍රාය බවට පත්වූයේ පරාක්‍රම සමුද්‍රයේ වාරි පද්ධතිය හා බැඳුණු තිරසර ජල කළමනාකරණයේ ප්‍රධාන අංග වන පාරිසරික තිරසරභාවය, සාමාජීය තිරසරභාවය, ආර්ථිකමය තිරසරභාවය සහ ජල කළමනාකරණය හා බැඳුණු පරිපාලන ක්‍රම විධිවල තිරසරභාවය යනාදියෙහි සිදුවූ පරිණාමීය ලක්ෂණයන් ආශ්‍රිතව ශාස්ත්‍රීය අධ්‍යයනයක් සිදු කිරීම වේ.

**විමර්ශනය**

පාරිසරිකවූත් සාමාජීය වූත් ආර්ථිකමය වූත් ජල කළමනාකරණය හා බැඳුණු ක්‍රමවිධිහි පවත්නා වූ තිරසාරත්වය මත ගොඩනැංවී ඇති තිරසර ජල කළමනාකරණය වනාහි අතීත ශ්‍රී ලංකාවේ දැවැන්ත වාරි පද්ධතීන් තුළින් මැනවින් හඳුනාගත හැකි ලක්ෂණයකි. හෙතෙම ජනාවාස ගත වූ නිම්නයේ භූගෝලීය වශයෙන් වඩාත් සුදුසුතම ස්ථානයේ වැවක් නිර්මාණය කොට ඊට ජලය රැස්කර ගනිමින් බිසෝ කොටුව වැනි සුවිශේෂී තාක්ෂණික ක්‍රියාවිධීන් හරහා නිසි කලට නිසි ප්‍රමාණයට ජලය බෙදාහරින ලදී. පරාක්‍රම සමුද්‍රයෙහි පවත්නා මෙවන් වූ අති සුවිශේෂී වාරි තාක්ෂණික අංගයන් ගණනාවක් නිසාවෙන් තත්කාලීන සමාජයේ තිරසාරත්වයට දායකත්වය සපයා තිබේ.

**තිරසාරත්වයට පදනමක් වූ වාරි තාක්ෂණිකාංගයන්**

පරාක්‍රම සමුද්‍රය වෙත මූලාශ්‍ර කීපයකින් ජලය එක් රැස් කර ගෙන තිබේ. තෝපා, දුඹුටුළු, එරමුදු, භූ වැව, කලහගල වැව, බැඳිවැව යනාදී වශයෙන් ප්‍රධාන මූලාශ්‍ර කිහිපයක් හරහා අඛණ්ඩ ජල සැපයුමක් එක් කරගෙන තිබේ. මෙනිසා කෘෂි බිම් වලට කිසිදු බාධාවකින් තොරව ජලය ලබා ගැනීමේ හැකියාවත් සමග කෘෂිකාර්මික තිරසාරත්වය ගොඩනැඟිණි. එපමණක් නොව ඊසාන දිග මෝසම් වර්ෂාවෙන් ලැබෙන්නා වූ ජලයට අමතරව වියළි කලාපයට ජලය ගෙන ආ මහවැලි ගඟ වැනි ස්වභාවික ජල මූලාශ්‍රයන් හරහා ද ජලය ගෙන තිබේ. මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාවක් වන අඹන් ගඟ අංගමැඩිල්ලේ දී හරස්කර ආකාෂ ගංගාව නම් ඇල මාර්ගය මඟින් ජලය ගෙන තිබේ. මෙම ඇල මාර්ගය කිලෝමීටර් අටක් දිග වේ. තවද අඩි 100ත් 200ත් අතර සමෝච්ච රේඛාවන් යොදා ගනිමින් අංගමැඩිල්ල ඇල නිර්මාණය කර තිබේ. වාරි තාක්ෂණයේ වූ මෙවන් විශිෂ්ටත්වයන් හේතුවෙන් ගොවි බිම්හි සශ්‍රීකත්වයත් මිනිසාගේ මූලික අවශ්‍යතාවයනුත් ඉටු කර ගත හැකි විය. එමඟින් පාරිසරික තිරසාරත්වය පවත්වා ගනිමින් පරිසරයේ වූ ජල සංචිතයන් එලෙසම ආරක්ෂා කර ගැනීමට හැකි වීය. වර්ෂාවෙන් තොර ජලය හිඟ සමයන් වලදී ප්‍රමුඛතාවන් හැඳින ඊට අදාලව වැව්වලට ජලය බෙදාහැරීම සිදු කෙරුණු අතර පරාක්‍රම සමුද්‍රය ද ඊට ඉවහල් විය. මෙනිසා සමාජයේ සෑම අවශ්‍යතාවයකටම මනාව ජලය බෙදා හැරි අතර එමඟින් සමාජ තිරසාරත්වය තහවුරු විය. පරාක්‍රම සමුද්‍රය වෙත ජලය ලබාගත් තවත් තාක්ෂණික ක්‍රියාවලියක් වන්නේ අංගමැඩිල්ල ක්‍රමවේදයයි. මෙහිදී ජලය මුදා හැරීමට ප්‍රධාන ඇලක් ද අතිරික්ත ජලය මුදා හැරීමට උප ඇලක් ද තිබූ අතර එම උප ඇල හරහා ජලය ප්‍රධාන ඇළට බැස යාමට සලස්වා තිබේ. තවද මෙහි වේල්ලේ එක්වන ජලය පහළින් සංසරණයට ඉඩ දී තිබේ. බාදනය වළක්වා

ගැනීමට ප්‍රධාන ඇල ආරම්භ වන ස්ථානයෙහිම බැම්මක් බැඳ තිබේ. මෙහිදී හදිසි ජල පීඩනයකදී අතිරික්ත ජලය ප්‍රධාන බැම්ම හරහා ගලා යාමෙන් පරිසර හිතකාමී පද්ධතියක් ගොඩනංවමින් වේල්ල ආරක්ෂා කර තිබේ.

පරාක්‍රම සමුද්‍රය යනු පුරාණ වැව් හතක් එක්කොට නිරූපණය කරන ලද සමුද්‍ර වැවකි. උතුරු දෙසින් තෝපා වැවත් දකුණු දෙසින් අබන් ගඟ ඉවුරේ කොටසක වූ භූ වැවත් වේ. වැවේ මහා බැම්මට ලම්භකව වද්දවමින් වැව ඇතුළේ සිට එහි උස් බිම් යා කරමින් ගොඩනඟා ඇති කළිඟු බැම් මඟින් වැව් හතරේ ජල මට්ටම් ස්වාධීනව පවත්වාගෙන තිබේ. අංගමැඩිල්ල දිය හැරවුමෙන් ඇරඹෙන යෝධ ඇල අතීතයේදී වැව් ඉස්මත්ත දිගේ සුවන්දිරන් ජල මට්ටම් රේඛාවේ ගොස් ඇතුමල්පිටිය වැවට වැටිනි. මෙම යෝධ ඇල මඟින් සමුද්‍රයේ වැව් හතරටම අවශ්‍ය තරමට ජලය හරවා ගෙන ඇත. තවද දිවුලන්කඩවල ඇල පාත්වන නික වැවත් ඇතුමල්පිටිය වැවත් මෙම යෝධ ඇල මඟින් ගෙනෙන ජලය බෙදන ව්‍යුහයක් වශයෙන් අතීතයේ ක්‍රියාත්මක විය. මේ හරහා තෙතමනය සහිත පසක් නිර්මාණය වීමෙන් පසේ සජීවී බවත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයත් සිදුවූ අතර පාංශු තිරසාරත්වයත් පස වනාහි ජල පවිත්‍රාගාරයක් වශයෙන් ක්‍රියාත්මක වීමත් හරහා වගාබිම් සඳහා සාරවත් බිමක් වියළි කලාපයට උරුම කරවීය.

හෙතෙම සමෝච්ච රේඛා ක්‍රමය පදනම්ව අංගමැඩිල්ල ඇල යොදා තිබීමෙන් වර්ෂාවෙන් ලැබෙන ජලය අවම අනුක්‍රමණයක් යටතේ අඩු වේගයකින් ගලා යාමෙන් රොන්මඩ ඇලෙහි වකයන්හි තැන්පත්ව සමුද්‍රය ආරක්ෂා කර තිබේ. මෙනිසා යල මහ දෙකන්නයේ වගාවන්ට අපද්‍රව්‍යවලින් තොර පිරිසිදු ජල නිකුතුවක් සැපයීමෙන් තවදුරටත් කෘෂිකාර්මික සමාජ තිරසාරත්වය තහවුරු වීය. මෙසේ කුඹුරු වෙත ජලය බෙදාහරින ලද ඉල වැව් සහ දැල වැව් වශයෙන් සඳහන් ප්‍රධාන ඇලවල් වූ බවත් අක්කර 20,000 ඉක්මවන කුඹුරු වපසරියක් හිමි පරාක්‍රම සමුද්‍රයෙහි ද පලින් පල එම වැව් තිබූ බවත් මෙමඟින් මනා පාලනයකින් යුතුව ජලය බෙදා හැර කෘෂි අස්වැන්නත් පාංශු තිරසාරත්වයත් තහවුරු කොට තිබෙන බැව් උදුල බණ්ඩාරයන්ගේ වැව නම් පර්යේෂණ ග්‍රන්ථයෙහි සඳහන් කරයි.

**තිරසාරත්වයට පදනමක් වූ ජෛව පද්ධතිය**

පරාක්‍රම සමුද්‍රය වටා නිර්මාණය වී පවතින ජෛව පද්ධතිය එහි තිරසාරත්වයට තවත් හේතුවක් වී තිබේ. හෙතෙම සමුද්‍රයේ මිරිදිය ජෛව පද්ධතිය තුළ ලංකාවටම ආවේණික වූ *Labeo heladiva* නම් මත්ස්‍ය විශේෂය හමුවේ. වර්ෂ 2018 දී ශ්‍රී ලාංකික පර්යේෂණ කණ්ඩායමක් විසින් තහවුරුකරණයට පෙර ඉන්දියාවට ආවේණික වූ *Labeo dussumieri* නම් මත්ස්‍ය විශේෂයක් වශයෙන් මෙම මසුන් හඳුනාගෙන තිබිණි. මෙවැනි ලංකාවටම ආවේණික වූ මත්ස්‍ය විශේෂයන් සඳහා සුදුසු ජෛව පද්ධතියක් වශයෙන් අතීතයේ සිටම පරාක්‍රම සමුද්‍රය ක්‍රියාකර තිබේ. තවද පරාක්‍රම සමුද්‍රයේ ප්‍රධාන පරිභෝජන හා ආර්ථික වටිනාකමක් ඇති ජලජ මත්ස්‍ය විශේෂය වන *Sarotherodon mossambicus* නම් තිලාපි විශේෂය මෙකී ජෛව පද්ධතියේ ජෛව ක්‍රියාවලියට ප්‍රධාන ගාමක බලවේගය වශයෙන් ක්‍රියාත්මක වන *Melosira granulata phytoplankton* මඟින් නිපදවෙන ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් සමුද්‍රය වටා බැඳුණු සංවෘත පරිභෝජන රටාවන්ගේ තිරසාරත්වයේ එක් අංගයක් බවට පත්ව තිබේ.

**සාහිත්‍යමය හා අභිලේඛන මූලාශ්‍ර මඟින් අනාවරණය වන තිරසාරත්වය**

විවිධ සාහිත්‍යමය හා අභිලේඛන මූලාශ්‍ර මඟින් අනාවරණය වන්නා වූ තත්කාලීන තිරසර වාරි පරිපාලන හා සමාජ තොරතුරු මඟින් ද පරාක්‍රම සමුද්‍රයේ වූ තිරසාරාත්මක වාරි දායකත්වය මැනවින් හඳුනාගත හැකිවේ. **"....මෙබඳු දේශයෙහි වැස්සෙන් හට ගත් ජලය මදකුත්**

**ලෝකෝපකාරයෙන් වෙන් ව කිසි කලෙකත් මුහුදට නොයේවා....”** යන උදාර වාක්‍ය එදා පරාක්‍රමබාහු මහ රජතුමන්ගේ සුවිසල් වාරි දැක්ම මැනවින් පෙන්වයි. වර්ෂාව ඉතාමත් අල්ප කලාපයක් වන මෙම ප්‍රදේශයේ පරාක්‍රම සමුද්‍රය වැනි වාරි දායාදයන් නොතිබෙන්නට තවදුරටත් මිනිස් වාසයෙන් තොර භූමියක් වීමට ඉඩ තිබිණි. චූලවංශයේ සඳහන් පරිදි සමුද්‍රයෙන් නික්මුණා වූ ඇලවල් සතරක් ඇතුළු නුවරට ආසන්නයෙන් විශේෂ ස්ථාන සතරකින් ගලා ගොස් තිබේ. ඉන් එකක් වූ අංගමැඩිල්ල අමුණු බැම්මත් ජලය ගෙනගිය ඇලත් සමුද්‍රයට ජලය ගෙන ආ ප්‍රධාන මාර්ගය බැව් සනාථය. ඒ අනුව පරාක්‍රම සමුද්‍රයේ වාරි පාලනය එකිනෙක ඒකාබද්ධ වූ වාරි පද්ධතියක් හරහා ගොඩනැංවී තිබීමෙන් වැසි ජලය අපතේ යාමකින් තොරව ගබඩා කරගත හැකිව තිබේ. වංසකතාගත තොරතුරු සහ කොඩ්රිංග්ටන් වාර්තා අනුව වෙන් වූ දිශාවන්ට ගලායන වෙන් වෙන් ගංගාහි ජලය කෘත්‍රිම ජල මාර්ග මගින් එක් කරවීම පුරාණ සිංහල වාරි සුවිශේෂීත්වයකි. ඒ හරහා තත්කාලීන කෘෂි කර්මාන්තගත සමාජයේ තිරසාරත්ව පදනම ගොඩනැංවීය. පරාක්‍රම සමුද්‍ර වැව් කණ්ඩියේ තැනින් තැන ලේඛන කෙටූ ගල් කණු කීපයකි. එම කණු වල දෙපැත්තේ පරාක්‍රමබාහු රජු කරවන ලද බැව් කියන සංස්කෘත හා සිංහල පද්‍යත් අනෙක් පස ඒ ඒ කණු අතර දුර රියන් වලින්ද ඇතැම් සුප්‍රකට වැව් කණ්ඩිවල දිග හා සසඳා තිබේ.

උදාඃ දෙවැනි කණුවේ සිට තුන්වැන්නට රියන් 1135

තෙවැනි කණුවේ සිට සිව්වැන්නට රියන් 4300 (ගඟතලා නොහොත් කන්තලේ වැව)

සිව්වැන්නේ සිට පස්වැන්නට රියන් 3200 (පදිවැව නොහොත් පදවිය වැව)

පස්වැනි කණුවේ සිට සයවැන්නට රියන් 1700 (කලාවැව)

සයවැන්නේ සිට සත්වැන්නට රියන් 1600 (කණාදියදර නොහොත් කනදරා වැව)

මෙසේ දැක්වීමේ අරමුණ නම් සමුද්‍රයේ වැව් කණ්ඩියේ දිග සුප්‍රකට මහ වැව් කන්ඩිවල මුළු දිග එකතුවට ද වැඩි බව පෙන්වා දී වංශකතාගත පරිදි "වැව රජ" යන උප නාමය ඊට යෝග්‍ය බව සනාථ කරවීමටය. මේ හේතුවෙන් අක්කර 25,188ක් වගාකරමින් 12,137කට ආසන්න ගොවි පවුල් සංඛ්‍යාවක් ජීවත් කරවමින් මෙරට වී නිෂ්පාදනයෙන් 5%ක දායකත්වයක් සැපයීමට සමුද්‍රයට හැකිවිය. තවද ජලය නැවත නැවත පරිහරණය කිරීමත් යම් ප්‍රදේශයකට ලැබෙන වැස්ස උපරිමව භාවිතා කිරීමත් අපගේ සම්ප්‍රදායයි. එහිදී පරාක්‍රම සමුද්‍රයේ අඹන් ගඟ අමුණේ ඉදි වූ රිදී බැඳිල්ල හරහා තිරසර සංවර්ධන එළඹුම යටතේ පාරිසරික සංරක්ෂණයත් සෞඛ්‍ය ගැටලුවලින් තොර මනා ජල කළමනාකරණයත් පාරිසරික බිඳවැටීමෙන් තොර සමාජ සංස්ථාවක් බිහි වීමට හේතුවිය.

හෙතෙම වාරි පදනම මත රැඳුණු ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරය පිළිබඳවත් ඉන් පරාක්‍රම සමුද්‍රය හරහා එල්ල කරන ලද බලපෑමත් ආර්නෝල්ඩ් ටොඉන්බී නම් පර්යේෂකයා විසින් සිය කෘතියේදී මෙසේ පවසා තිබේ. අපූර්ව දියාලු ක්‍රමය යැයි හඳුන්වමින් ටොඉන්බී කඳුවලින් ගලන ජල මංපෙත් බැඳ, ඒ ජලය ඇතැම් ඒවා සරියෙන් අක්කර 4000ක් ඉක්මවූ යෝධ ගබඩා වැව්වලට හරවන හැටිත් ඉන් ඇරඹෙන ඇල මංපෙත් අනෙක් මහ වැව්වලට දුවවන සැටිත්, සෑම මහ වැවක් සහ යෝධ ඇලක් පාමුල විසිරී සිය ගණන් කුඩා වැව් සෑම එකක්ම ගමක න්‍යෂ්ටිය වූ සැටිත් ක්‍රි.ව. එකොළොස්වන සියවසේ වූ මහා පරාක්‍රම සමුද්‍රය තුළ ද තවමත් ඒවා භාවිතයේ පවතින බවත් දක්වයි.

## විවිධ යුගයන්හි දී සිදු කරන ලද ප්‍රතිසංස්කරණයන් මඟින් සිදු වූ තිරසාරත්වය

තවද විවිධ යුගයන් වලදී පරාක්‍රම සමුද්‍රයේ වාරි පද්ධතියට සිදු වූ වෙනස්කම් මඟින් ද තිරසාරාත්මක ලක්ෂණ ඉස්මතු වේ. වර්ෂ 1930න් පසු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංවර්ධන යෝජනාවක් යටතේ වර්ෂ 1937දී පරාක්‍රම සමුද්‍ර යෝජනා ක්‍රමයට ප්‍රථම වතාවට බර යන්ත්‍ර සූත්‍ර යොදා ගැනිණි. මේ හේතුවෙන් ජලාශයේ ජල පෝෂක ධාරිතාව තවදුරටත් වර්ධනය වීමත් එමගින් අවශ්‍යතාව මත කෘෂිබිම් ක්‍රමානුකූලව සංවර්ධනයටත් ඉඩ ලැබිණි. පරාක්‍රමබාහු රජුගෙන් පසුව වර්ෂ 1948 දී අගමැති ඩී. එස්. සේනානායකයන් යටතේත් වර්ෂ 1979 දී ඉංජිනේරු ඥානවර්ධනයන් යටතේත් වැව් වේල්ල ප්‍රතිසංස්කරණය කෙරීය. එනිසා ශක්තිමත් වේල්ලක රඳා පැවැත්මෙන් විශාල ජල ධාරිතාවක් රැස් කොට අවශ්‍ය වේලාවට මුදා හැරීමටත් හැකිවිය. වර්ෂ 1920 වන තෙක්ම ලොව ලොකුම බැම්ම වූයේ මෙයයි. මීට අමතරව සමුද්‍රයෙහි සිදු කළ වත්මන් ප්‍රතිසංස්කරණ හේතුවෙන් ඒ අවට ප්‍රදේශයේ වැඩි වශයෙන් සංක්‍රමණිකයන් ද ප්‍රධානවම වී වගාකරුවන් හා වඩාත් මෑතකදී ධීවරයන්ගේ ආකර්ෂණයත් ලැබී තිබේ. තවද ජල පෝෂක ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 75කි. වර්ෂ 1978 දී සමුද්‍රයේ කැඩී තිබූ බැම්ම නැවත පිළිසකර කොට එහි කොටසක වූ රළපනාව නැවත සකසා තිබේ. මෙමඟින් පොළොන්නරු යුගයෙන් පසුව අභාවයට ගොස් පැවති තිරසාරාත්මක ජලය බෙදාහැරීම නැවත ප්‍රතිසංස්කරණය කොට අනවශ්‍ය සේදී යාම් තුළින් වැව් බැම්ම ආරක්ෂා කර තිබේ. එපමණක් නොව වර්ෂ 1854 දී පරාක්‍රම සමුද්‍රයේ මැද වැව වූ දුඹුටුලු වැව කැඩී වල් බිහිවී මඩ ගොහොරුවක් බවට පත්ව තිබූ අතර නැවත වතාවක් වර්ෂ 1945 දී වැව් බැම්ම නැවත ප්‍රතිසංස්කරණය කරමින් පරාක්‍රම සමුද්‍ර වාරි කර්මාන්තය හා එක්වූ අතර එමඟින් තවදුරටත් ජල පෝෂක ප්‍රදේශයන් වර්ධනය කරමින් වියළි කලාපය ආශ්‍රිතව ජන දිවිය හා සම්බන්ධව තිරසාරාත්මක සමාජයක පදනම දමා තිබේ.

## තිරසාර සංවර්ධනය උදෙසා සංවෘත ආර්ථිකය හා තිරසර ජල කළමනාකරණයේ බලපෑම

තිරසර ජල කළමනාකරණය සහ සංවෘත ආර්ථික රටාවන් යන ද්විත්ව අංශයන් එකිනෙකට සම්බන්ධ වේ. ඊට හේතුව නම් ජනගහනයේ වර්ධනයත් කාලගුණික විපර්යාසයනුත් නිසාවෙන් ඇතිවන්නා වූ ජල සම්පත් හිඟ වීමට විසඳුමක් වශයෙන් තිරසර ජල කළමනාකරණය සහ සංවෘත ආර්ථිකය යන ද්විත්ව අංගයන්ගේ සම්මිශ්‍රණයක් යොදා ගත යුතුව පවතී. තිරසර ජල කළමනාකරණ අංග මඟින් ඇති කරගන්නා වූ ආර්ථික හා පාරිසරික තිරසාරත්වය භාවිතයෙන් වාරි පද්ධතීන් හා බැඳුණු කෘෂිකාර්මික සමාජයන් තුළ සංවෘත ආර්ථික හා චක්‍රීය ජල පරිභෝජන රටාවන් ස්ථාපිත කිරීම මඟින් තිරසාර සංවර්ධනයක් ළඟා කරගත හැකි වේ.

## නිගමනය

පරාක්‍රම සමුද්‍ර වාරි පද්ධතිය හා සබැඳුණු තත්කාලීන කෘෂිකාර්මික සමාජ ක්‍රමයේ පැවති තිරසාරත්වය ගැන පරාක්‍රම සමුද්‍රයෙහි වූ වාරි තාක්ෂණික අංගයන්ගෙනුත් ඒ වටා බැඳුණු ජෛව පද්ධතියත් සාහිත්‍යමය හා අභිලේඛන ගත මූලාශ්‍ර මඟින් අනාවරිත තත්කාලීන තිරසාරාත්මක වාරි පරිපාලන හා සමාජයත් විවිධ යුගයන්හි දී සිදු කරන ලද ප්‍රතිසංස්කරණයනුත් යන මෙම අංශයන් ඔස්සේ පර්යේෂණ කෘති, පර්යේෂණ පත්‍රිකා, සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රත් ජාතික භූ දත්ත කළමනාකරණය යටතේ ඇති ජියෝ පෝර්ටර්ල්ස් උපාංගය වැනි මූලාශ්‍ර භාවිතයෙනුත් දැක්වූ කරුණු මඟින් පාරිසරික තිරසාරත්වය, සාමාජීය තිරසාරත්වය, ආර්ථිකමය තිරසාරත්වය හා ජල කළමනාකරණය සමඟ බැඳුණු පරිපාලන ක්‍රම විධිවල තිරසාරත්වය යනාදිය තහවුරු වූ බැව් හඳුනාගත හැකිය. හෙතෙම මොරගහකන්ද වැනි නව වාරි ව්‍යාපෘතිත් දැනට පවත්වාගෙන යනු ලබන වාරි

ව්‍යාපෘතිත් ප්‍රවර්ධනයේදී සහ සංවර්ධනයේදීත් අතීතයේ වූ මෙවැනි තිරසාරාත්මක අංගයන් ආරක්ෂා වන පරිදි සංවෘත පරිභෝජන හා ආර්ථික රටාවන් ගොඩනැංවෙන ආකාරයට ක්‍රියාවට නැංවීමෙන් මතු පරපුර උදෙසා සම්පත් ආරක්ෂා වන පරිද්දෙන් අපගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකියාව ලැබෙන බැව් නිගමනය කළ හැක.

**පරිශීලන.**


අවුසදහාමි යූ.බී, 1999, ***වැව***, ප්‍රාචී ප්‍රකාශන, හෝකන්දර

බ්‍රෝහියර්, ආර්.එල්. 1999, ***බ්‍රෝහියර් දුටු ලංකාව***, පරි. ඒ. හේවාවසම්, සූරිය ප්‍රකාශකයෝ, මරදාන

විතානාච්චි සී.ආර්, 2017, ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය***, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ

***සිංහල මහාවංශය*** - ප්‍රථම භාගය, 1999, සංස්. ශ්‍රී. සුමංගල මාහිමි හා බටුවන්තුඩාවේ දේවරක්ෂිත, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

Arumugam, S. 1969, ***“Water Resource of Ceylon Its Utilisation And Development”***, A water resource board publication, Colombo

Schiemer, F (1981) ***Parakrama Samudra (Sri Lanka) Project, a study of a tropical lake ecosystem I. An interim review***, Internationale Vereinigung für theoretische undangewandte Limnologie: Verhandlungen, 21:2, 987-993, DOI: 10.1080/03680770.1980.11897121

Sudasinghe H, Ranasinghe R.H.T, 2018, ***A review of the genus Labeo (Teleostei: Cyprinidae) in Sri Lanka***, ZOOTAZA, New Zealand

National Spatial Data Infrastructure Sri Lanka, ***Sri Lanka NSDI Geoportal,*** viewed 22 December 2022, https://geoportal.nsdi.gov.lk/

International Lake Environment Committee Foundation, ***PARAKRAMA SAMUDRA (LAKE PARAKRAMA),*** viewed 19th December 2021, https://wldb.ilec.or.jp/Display/html/3562

Withanachchi, C.R, 2012, ***Technology and techniques applied in ancient Sri Lanka in constructing dams***, Ancient Ceylon - Department of Archaeology, Sri Lanka. 23. 43-58.

# 25. රජරට ශිෂ්ටාචාරයේ වාරි පද්ධතියේ සංවර්ධනය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්.

වයි.පී.එම්.එස්.වික්‍රමසිංහ

## හැඳින්වීම

සරල දිවිපෙවෙතකට හිමිකරුවන් වන ආදි මිනිසා කාලයාගේ ඇවෑමෙන් මතුවන සංකීර්ණ මානව අවශ්‍යතා හා වුවමනා මත ශිෂ්ටාචාරවත් සංස්කෘතියකට හිමිකම් කීමේ වරම උදාකර ගනී. සංකීර්ණ මානව අවශ්‍යතා සාධනය කරගනු වස් විවිධ ජීවන මංපෙත් ඔස්සේ පරිවර්තනයන්ට ලක්වීම සාමාන්‍ය සම්ප්‍රදායයි. ඒ අනුව මිනිසාගේ මුඛ්‍යතම අභියෝගය හා අවශ්‍යතාවය වන ජීවනෝපාය සරිකරගනු වස් අනුගමනය කළයුතු සෑම සාධනීය පියවරයන්ම අනුගමනය කරන්ට පසුබට නොවීය.ආර්ථිකමය සමෘද්ධිය උදාකරගනු පිණිස මිනිස් ශ්‍රමයෙන් නිර්මිත එක් අපූර්ව මානව කෘතියක් ලෙස වාරිමාර්ග පද්ධතිය පිළිබඳ සාඩම්බරයෙන් සාකච්ඡා කළ හැකිය. යුගයක අනන්‍යතා ප්‍රතිමූර්තියක් බඳු වාරි නිර්මාණයේ ආරම්භක අවධිය සරල මට්ටමින් ඇරඹී ඉන්පසු ක්‍රමික හේතු සාධකයන්ගේ බලපෑම මත විකාශනය වෙයි. වාරි නිර්මාණයන් සඳහා රාජ්‍යත්වයේ ආරම්භයේ පටන් රාජ්‍ය අනුග්‍රහය ලද බව සාහිත්‍ය මූලාශ්‍රයෝ ද සාධක සපයයි. එකී විසල් වාරි නිර්මාණයන් අතරින් රජරට ශිෂ්ටාචාරය හෙවත් වැව්බැඳි රාජ්‍ය මූලික කරගත් වාරි පද්ධතියේ ප්‍රාරම්භක යුගයේ පටන් තත්කාලීන සංවර්ධනයක් වාරි ක්‍රම විකාශනයේ දී අපට ප්‍රත්‍යාවර්ථ වේ. එනම් එම සංවර්ධනය පිළිබඳ සංසන්දනාත්මක සාහිත්‍යගත ප්‍රවේශයන් ඔස්සේ වැඩිදුරටත් විමර්ශනයක යෙදීම මෙම ලිපිය තුළින් ඉදිරියේ දී අපේක්ෂා කෙරේ.

## ක්‍රමවේදය

හුදෙක් මෙම පර්යේෂණය සඳහා දත්ත එක්රැස් කිරීමේදී භාවිත කරන ලද ක්‍රමවේදය ක්ෂේත්‍ර නොවන ගවේෂණයයි. එනම් විශේෂයෙන් ම සාහිත්‍යගත සාදක පදනම් කොටගෙන සංසන්දනාත්මක වශයෙන් මෙම පර්යේෂණය ගොනුකොට ඇත.

## විමර්ශනය

"රජරට ශිෂ්ටාචාරය" යනුවෙන් ව්‍යවහාර කරන ජලාශ්‍රිත ශිෂ්ටාචාරය අනුරාධපුර හා පොළොන්නරුව මුලික කොටගත්තකි. වැව්බැඳි රාජ්‍ය යනුවෙන් විරුදාවලී ලැබීම තුළින් අපට මෙම රාජ්‍ය තුළ පැවති වාරි නිර්මාණයන්ගේ මෙහෙවර කවරක්නම් වන්නට ඇතිදැයි සිතාගැනීම එතරම් දුෂ්කර නොවේ. මෙකී කලාපය තුළ විහිදී පැවති ජනාවාසවල පාරිභෝගික ජල අවශ්‍යතාත් කෘෂි යැපුම් රටාව සඳහා අවැසි ජලයත් එක්රැස්කර තබාගැනීමේ අවශ්‍යතාව මත එකල සමාජයේ විසූ ජනයාගේ දැනුමට සාපේක්ෂව ජලය එක්රැස්කර තබාගැනිම සඳහා කුඩා වැව් තනා ගත්තා යැයි සිතීම සාධාරණය. පෙර සිරිත පදනම් කොට එදා රාජ්‍ය පාලකයන් රටේ සශ්‍රීකත්වය උදෙසා සිය රාජ්‍යත්වයේ යුතුකම මැනවින් පසක් කරගෙන සිටි බවට මේ වාරි නිර්මාණයෝ සාක්ෂ්‍ය දරයි. ඉතා සුළු පරිමාණයෙන් පැවති වැව් මහාවිසල් වැව් දක්වා පරිවර්තනය වීම සඳහා දේශපාලනික අනුග්‍රහය තුළින් ලද පිටුබලය ද වෙසෙසින් සිහිපත් කළ යුතුය. එනම් වැවක් යනු සාමූහික ජන ප්‍රජාවකගේ ශ්‍රමය වැගිරීමකින් ලද සංකීර්ණ වූත් ස්වාභාවදහම් අභියෝගයට මිනිසා විසින් දක්වන ලද සාර්ථක ප්‍රතිචාරයකි.

වාරි පද්ධතියේ ආරම්භය පිළිබඳ සඳහන් කිරීමේදී එහි ප්‍රාරම්භක අවස්ථාව කුඩා ගම් වැව් ඉදිකිරීමයි. කෘෂිකාර්මික හා අනෙකුත් අවශ්‍යතා සඳහා ජලය රැස්කර තබා ගැනීමේ

අරමුණින් මුලින්ම ගම්වැව් හෙවත් කුඩා වැව් ඉදි කෙරිණ. ක්‍රමයෙන් ජනගහන වර්ධනයත් සමඟ දියුණු තාක්ෂණ ක්‍රම මගින් ගංගාවල් ඔයවල් හරස්කර, අමුණු මඟින් ජලය හැරවීම, ඇල මාර්ග මගින් විශාල වැව් කරා ගෙන යාම දක්වා පරිවර්තනය විය. බොහොමයක් සිදුවීම් සම්බන්ධව තොරතුරු වාර්තා කරන සාහිත්‍ය මූලාශ්‍ර විශේෂයක් වන වංසකතාවලදී මෙම වාරි ආරම්භක නිර්මාණයන් පිළිබඳ එතරම් වැදගත් තොරතුරු වාර්තා නොකරයි. එම අඩුව මග හරවාලමින් ක්‍රි.ව 1, 2, 3 සියවස්වලට අයත් ශිලාලිපිවල වංසකතාවේ සදහන් නොකරන වැව් 150 පමණ පිළිබඳ තොරතුරු අනාවරණය කරයි. බහුතරයක් ආගමික පූජාකිරීම් ගැන සදහන් කරන මෙම ශිලාලිපිවලින් මගහැරී ගිය වැව් විශාල සංඛ්‍යාවක් පවතින්නට ඇතිබව නිසැකය. රජරට ප්‍රදේශයේ හැම ගමකම පාහේ වැවක් තිබූ බවට සාක්ෂි වේ. එසේම ක්‍රි.ව 5 සියවසේ සමන්තපාසාදිකාවේ බුද්ධඝෝෂ හිමි දක්වන කරුණු අනුව විශාල මෙන්ම කුඩා වැව්ද, පුද්ගලයන් සතු වැව් නඩත්තු හා පාලක නීති ගැන අන්තර්ගතය. මේ සියල්ලෙන්ම අපට පසක් වන්නේ සාමූහික හා පුද්ගලික ශ්‍රමයෙන් එකල කුඩා වැව් ඉදි කරන්නට ඇති බවයි.

තවද ලංකාවේ පූර්ව රාජ්‍ය සමයේ වාරි මාර්ග කටයුතු පැවති බවට මින් ප්‍රතීයමාන වේ. නමුදු විජය රජතුමා සමග පැමිණි අනුරාධ නම් ඇමතිවරයා වැවක් කරවන ලද බව සදහන් වුවත් එය මෙතෙක් හදුනාගෙන නොමැත. පූර්ව ඓතිහාසික අවධියේ දේශපාලනික වශයෙන් යම් යම් ඒකකවල ගොඩ නැගෙමින් පැවතියේ පාලකයන් මුල්කරගත් සංවිධානගත වීමය. එකී පාලනය තුළ එම ප්‍රධානීන්ගේ මූලිකත්වයෙන් යම් වාරි නිර්මාණයන් කරන්නට ඇත්නම් ඒවා හුදෙක් ප්‍රාදේශියත්වයෙන් බැහැරව එනම් ඊට වඩා සුළු වශයෙන් හෝ විශාලත්වයෙන් යුතු වැවක් ඉදිකරන්නට ඇත. ඒ මන්ද යත් ගම් වැවක් ඉදිකිරීමට වඩා ජනයා විශාල වැවක් ඉදිකිරීමට එකල ප්‍රධානියාට සහයෝගය ශ්‍රමය පහසුවෙන් ලබාගන්නට ඇතැයි සාධාරණ නිගමනයක් මෙහිදී ඉදිරිපත් කළ හැකිය.

රාජ්‍ය අනුග්‍රහය මත කලින් කලට වාරි නිර්මාණයන්ගේ පුළුල් පරිවර්තනයක් ප්‍රධාන අවස්ථා 4 යටතේ හදුනාගත හැකිය.

01. ග්‍රාමවාපී අවදිය

02. ධාන්‍යවාපී අවදිය

03. මහාවාපී අවදිය

04. සමුද්‍රවාපී අවදිය

ග්‍රාමවාපී අවදිය ලෙසින් අප හදුන්වන්නේ කුඩාගම් වැව් ඉදිකිරීමේ අවධියයි. ග්‍රාමීය මට්ටමින් ඉදිකරන ලද කුඩාගම් වැව් කොතෙකුත් රජරට ජනපද ආශ්‍රිතව පවතින්නට ඇතැයි විශ්වාස කළ හැකිය .මෙසේ ගම් වැවකට වඩා මදක් විශාල ලෙස තනවන ලද ආදිම වැව්වලින් එකක් ලෙස අනුරාධපුරයේ අභය වැව හෙවත් බසවක්කුලම වැව හැදින්වීමට පිළිවන. පණ්ඩුකාභය රජු විසින් කරවන ලද ප්‍රධාන වැව් 3 ලෙස **ජයවැව, ගාමිණි වැව, අභය වැව** වංශකතාව හෙළිදරව් කරයි. සාහිත්‍ය මූලාශ්‍රයේ මුල්ම ප්‍රධාන වැව ලෙස දක්වන මෙම අභය වැව වත්මන් ස්වරූපයෙන් අද අප හදුනාගැනීමට ප්‍රථම පසුකාලීන අදියරයන් ඔස්සේ සංවර්ධනයට ලක්ව පැමිණි බව කිව යුතුය.

පණ්ඩුකාභයගෙන් පසු ඔහුගේ මුණුබුරන් වන දේවානම්පියතිස්ස සහ මහානාග යන අය වැව් කරවන ලද බව වාර්තා වේ. දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරෙකු වූ මහානාග **"තරච්ච"** නම් වැවක් පිළිබඳ අධීක්ෂණ කටයුතු කරන ලදැයි මහාවංසයේ වැඩි දුරටත්

සදහන් ය. දේවානම්පියතිස්ස රජතුමා විසින් කරවන ලදැයි සැලකෙන තිසාවැව ද ඇතුළුව ක්‍රි.පූ 1 ශතවර්ෂය වනවිට නුවර වැව ද අනුරාධපුර රාජ්‍යයේ වාරිමාර්ග පද්ධතියට එකතුව හමාර ය. උක්ත සදහන් කළ **බසවක්කුලම, නුවර වැව, තිසා වැව** යන මේ වැව් ත්‍රිත්වයම ගම් වැව්වලට වඩා තරමක් විශාල බවද අවධාරණයෙන් කිව යුත්තකි. ජනප්‍රවාදගත කරුණක් ලෙසින් දුටුගැමුණු කුමාර අවධියේ බුලතා නම් යෝධයෙකු විසින් මහියංගණය අසල සොරබොර වැව කරවන ලදි. ගම්වල සිටි ප්‍රභූවරු, ධනවතුන් ආදීන් එලෙස පුද්ගලිකව වැව් කරවීමට දායකත්වය ලබා දී ඇත. ශිලාලේඛනවල "**පරුමක**" නමින් හදුන්වන්නේ එවැනි වාරි කර්මාන්ත ඉදිකරවන ලද පුද්ගලයන් ය. ඔවුහු ගම්වල සිටි ප්‍රභූවරුන් ය. පුද්ගලික වැව් හිමියන් සෙල්ලිපිවල හදුන්වා ඇත්තේ **වවි හමික** හෙවත් **වපි හමික** යනුවෙනි.

මින්පසු වාරි සංවර්ධනයේ දෙවන අදියර වන මහාවාපි යුගය හදුනාගත හැකිය. අනුරාධපුර වාරි කර්මාන්ත වර්ධනයේ මහාවාපි අවධිය ක්‍රි.ව 1 සියවසේ පමණ ආරම්භ වේ. ක්‍රි.පූ 1 වන සියවස අවසාන සමයේ එතෙක් පැවති ග්‍රාමීය වැව් සංකල්පය විශාල වාරි නිර්මාණ දක්වා පරිවර්තනය වීමට විවිධ සමාජයීය හේතු සහ ග්‍රාමීය වැව්වල දුර්වලතාවයන් හේතු විය. රජුගේ මැදිහත් වීමෙන් ප්‍රමාණයෙන් විශාල වාරි මාර්ග ඉදිකිරීමේ කටයුතු නිශ්චිත වශයෙන්ම ආරම්භ වන්නේ ක්‍රි.ව 67-111 වසභ රජුගේ රාජ්‍ය සමය තුළය. දේශපාලනික ස්ථාවරත්වය පදනම් කරගනිමින් ජල දේශපාලන මූලධර්ම අනුව ජලය මැනවින් කළමනාකරණය කළ ප්‍රථම රජු වූයේ වසභ රජුය. එම වාරි නිර්මාණයන් තුළින් වියළි කලාපය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ලදී. එහිලා 44 වසරක දීර්ඝ රාජ්‍ය සමය තුළ වාරි නිර්මාණයන්ගේ කැපී පෙනෙන පරිවර්තනයකට බදුන් වේ. මෙතුමා විසින් වැව් 11 හා ඇළමාර්ග 12 කරවන ලද බව වංසකතා සාහිත්‍යයේ සදහන්ය. මහවැලි ගගේ අතුශාඛාවක් වූ අඹන් ගග ඇළහැරදී හරස්කොට ඇළහැර ඇළ ඉදිකර කිලෝමීටර 24 දුර මේ ඇළමාර්ගය ගමන් කරවයි.

මෙතෙක් අනුරාධපුර මල්වතු ඔය ආදි ගංගා නිම්නවලට සීමාවී තිබූ වාරි මාර්ග මහවැලි ගං ප්‍රදේශය දක්වා පැමිණේ. මහවැලි ගගේ ප්‍රධාන ශාඛාවක් වූ අඹන් ගග හරස්කර වේලි බැදිමට තරම් මෙකල පුනර්ජීවනයක් ඇති වේ. විසල් වාරි නිර්මාණ ඉදිකිරීමට මෙතුමා පෙළඹ ඇත්තේ දකුණු ඉන්දියාවේ විශාල දුර්භික්ෂයක් පැතිර යාමෙන් ධාන්‍ය හිගයක් ඇතිවීම නිසා ධාන්‍ය වලට ඉල්ලුම වැඩි වීම නිසාවෙනි. එම අවශ්‍යතාව අනුව ඉල්ලීම වැඩි නිසා කලාපයේ අවශ්‍යතාවය පිරිමසා ගැනීමට විශාල වාරි ඉදි කරමින් නිෂ්පාදන කාර්ය ශක්තිමත් කළ බව කිව හැකිය. තවද වසභ රාජ්‍ය සමය "**උම්මග්ග ජල මාතිකා**" එනම් උමං ජල මාර්ග ඉදිකලා යැයි සැලකෙන ඇතැම් වැව්වල වට ප්‍රමාණය සැතපුම් 2 හෝ ඊටත් වැඩිවූ බව සී. ඩබ්ලිව් නිකලස් මහතා දක්වයි. මහාවංසයට අනුව වසභ රජතුමා කළායැයි සැලකෙන වාරි නාමාවලියකි. **මයෙන්ති වාපි (මහවිලච්චිය), රාජප්පුල, මහකොළ, අම්බගාමක, මහානිකවිට්ටි, මහාරාමා, කේහාල, කාලිවාපි, වාතමංගණ, අග්ගිවඩ්ඩමානක වාපි** යනුවෙනි.

මහාවාපි අවධියේ තවත් සංධිස්ථාන යුගයක් ලෙස මහසෙන් සමය පෙන්වාදිය හැකිය. වසභ රජු කළ නිර්මාණයන්ට වඩා විසල් වැව් මෙතුමා කරවයි. මහාවංසයේ 37 වන පරිච්ජේදයේ ගාථා 4ක් මොහු සදහා වෙන් කරයි. ඒ අනුව වැව් 16 හා එක් ඇළ මාර්ගයක් මෙතුමා කරයි. **පබ්බතන්ත ඇළ** එකකි. වසභ රජු කිලෝමීටර 24 කැපූ ඇළහැර ඇළ කිලෝමීටර 44 දක්වා දීර්ඝ කරයි. ඇළහැර ඇළ මගින් මින්නේරි, හුරුළු, කවුඩුළු වැව් ඒකාබද්ධ කරයි. මෙය ලංකා වාරි ඉතිහාසයේ දැවැන්ත සංධිස්ථානයකි. මහසෙන් සමයේ ඉදිවූ මින්නේරි වැවට ජලය සැපයුවේ අඹන් ගග හරහා වේල්ලක් බැද තල්වතු ඇළ මගින්

යැයි වංසකතාවේ එයි. එසේම මින්නේරි ව්‍යාපාරය බිහිකලේත් වසභගේ ඇළහැර ඇළ විශාල කිරීමෙන් බව සී.ඩබ්ලිව් නිකලස් මහතා දක්වයි. මින්නේරි වැව් බැම්ම දිගින් සැතපුම් එකයි කාලකි. උස අඩි 44කි. කුඹුරු අක්කර 4000ට වැඩි ප්‍රමාණයක් වගාකළ හැකිය. යාන්ඔයේ ජලය යොමු කිරීමෙන් ඉදිකරන ලද විශාල වාපින් නිසා මහසෙන් රජුගේ කාලයේ දිවයිනේ ඊසානදිග ප්‍රදේශයේ පැවති කෘෂි සමෘද්ධිය ද මෙමගින් සනාථ වේ. මහසෙන් රජුගේ වාපීන් අතර **මාගල්ල, හුරුළු, මහකනදරා, මාමිණිය, කෝකවාක, මොරවැව, රත්මල්කඩ, මහාදාරගල්ල** යනාදී මහාවාපි ගැන වංසකතාවේ ප්‍රකාශ කෙරේ.

මහාවාපි යුගයේ විශිෂ්ටතම අවධියක් ලෙස ධාතුසේන අවධියේ ඇතිවන වැව්වල හා ඇළමාර්ග ඉදිකිරීමේ සංකීර්ණත්වයක් ප්‍රතීයමාන වේ. මහාවංශයේ 38 වන පරිච්ජේදය 45 වන ගාථාවෙන් අටළොස් වැවක් කළ බව සදහන්ය. මෙයින් කලා බළළු, යෝධ ,මා එළිය ,මැද්දෙකැටිය ,මාදතුගම ආදී වැව් හඳුනාගෙන ඇත. කලා වැවෙන් ආරම්භව අනුරාධපුර තිසා වැව දක්වා සැතපුම් 54 දුරක ජල කදක් ගෙනගිය ජයගග යනු ධාතුසේන රජුගේ වැදගත් වාපි නිමැවුමකි. බොහෝ තැන්වල අඩි 40 පළල ජයගගේ මුල් සැතපුම් 17 ජලබැස්ම සැතපුමට අගල් 6 පමණය. ඉතා සුළු ජල බැස්මක් ,භූගෝලීය හා සමෝච්ච රේඛා පිළිබඳ මනා දැනුමකින් මෙය නිමවීමට අතීත මුතුන් මිත්තන්ට හැකියාව තිබුණි. .ඇළ බැම්මට හානි නොවන සේ වක් මාර්ග ඔස්සේ ජලය ගලා යාමටත් දෙපස ගස් ඉදිකිරීමෙන් ජලය වාෂ්ප වීම අවම කිරීමටත් වග බලාගෙන ඇත. සැබවින්ම ජලමාර්ග තාක්ෂණයේ ශ්‍රේෂ්ඨතම සංවර්ධිත අවස්ථාවක් ලෙස ජයගග හැඳින්වීමට හැකිය.

කලාවැව යනු ධාතුසේන රජුගේ තවත් වාපි මෙහෙයුමක නොමැකෙන තිළිණයකි. ගෝණ නදිය හරස්කොට ඉදිකර කලා බළළුවැව නුවර කලාවිය ප්‍රදේශයේ සංවර්ධනයට ඉවුකරන ලද්දේ අනුපමේය මෙහෙයකි. වැවේ වානෙන් පිටවන මහා ජලකද වාන සිට මුහුද දක්වා යන මග "කලාඔය" සේ සලකයි. මෙම කලාවැවේ වැව් බැම්ම සැතපුම් තුන් කාලක් ද උස අඩි 40කි. අක්කර 6380 වපසරියක විහිදේ. ජල ධාරිතාවය අඩි 702678කි. අතීතයේදී මෙම වැවෙන් අක්කර 7000 පමණ ප්‍රදේශයක ගොවිතැන සරිකරයි. ධාතුසේන රජුගේ ප්‍රධාන වාපින් අතර මන්නාරම් දිස්ත්‍රිකයේ වත්මන් යෝධවැව හා එයට ජලය ලබා ගැනීමට මල්වතු ඔයේ සිට සැතපුම් 17 දුර තැනවූ ඇළද වැදගත් ය. යෝධ වැව සැතපුම් 7 1/2 පමණ බැම්මක් චාපයක හැඩයට ඉදිකරන ලද මහා වැවකි. සහල් නැලිය ලෙසින් ද හඳුන්වන මෙහි උස අඩි 14කි.

මහාවාපි යුගයේ වැව් ඉදිකළ චරිතයකි. එවැනි මුගලන් රජු. එතුමා මල්වතු ඔය හරස්කර අමුණු බදවා වැව් 3 කළ බව වංසකතාවේ මෙන්ම සෙල්ලිපිවල ද සදහන් ය. ඒ අනුව 6 සියවසේ කරවන ලද පත්තපාසාන (නාච්චදූව) හා පදවිය වැව් වැදගත්ය. අනුරපුර විශාලම දෙවන වැව පදවිය වැවයි. පිරුණු විට වැවේ සම්පූර්ණ ජල ප්‍රමාණය අක්කර අඩි 85000කි. ආරම්භයේ ධන වාපි ද පසුව පදී වාපි යනුවෙන් හැඳින්වූ මෙහි බැම්ම මුහුදු මට්ටමේ සිට අඩි 350 ඉහළය. විශේෂත්වය වැලි සහ මැටි මිශ්‍රිත පස් භාවිතයෙන් කළ වැව් බැම්ම සඳහා ඈතක සිට පස් ගෙනෙන්නට ඇති අතර කුර මගින් පස් තද කිරිමට ගවයන් දහස් ගණන් යොදාගන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. නැගෙනහිර වැව් බැම්ම සැතපුමක් පමණ දීර්ඝ වන අතර බටහිර බැම්ම සැතපුම් එකයි කාලකි.

ෂෂ වැනි මුගලන් රජුගේම නිර්මාණයක් වන පත්තපාසාන හෙවත් නාච්චදූව වැව මල්වතු ඔය සහ එහි අතු ශාඛාවක් වන මාමිනිය ඔය ආශ්‍රිතව කරඇත. සැතපුමක් පමණ වන වැව් බැම්ම උස අඩි 35කි. අක්කර 4408 ප්‍රදේශයක විහිදී කුඹුරු අක්කර 4200 වපසරියක වගා කටයුතු සාරවත් කරයි. ෂ වැනි අග්බෝ රජු මහාවාපි අවධියට අයිති වැව් ඉදිකළ

නරපතියෙකි. මහවැලි ගඟ හරස්කර මිණිපේ අමුණ හා ඇළ කරවයි. එලෙසම හිරිවඩ්ඩමානක හා කුරුළු වැව කරවන ලද්දේ මෙතුමාය.

මීළඟට ධාන්‍යවාපි අවධිය හෙවත් පොකුරු වැව් පිළිබඳ විමසමු. එකිනෙකට සම්බන්ධ වන වාරි ජාලයක මහා වැවක් ඉදිකර සාගරයට ජලය යාම වලක්වන විශාල වැවකට ජලය හරස් කිරීමකි. එවැනි වැවක් ලෙස II වැනි අග්බෝ රජු කළ කන්තලේ වැව සඳහන් කළ හැකිය. අක්කර 3263 භූමි ප්‍රමාණයක පැතිරෙන අතර වැව් බැම්ම අඩි 52 1/2 තරම්ය. දිවයිනේ වාරි පද්ධතියේ උසම වැව් බැම්ම ලෙස කන්තලේ වැව සඳහන්ය. මින්නේරියෙන් ඇරඹෙන සැතපුම් 29 දිග ඇළකින් මෙයට ජලය සැපයේ. මේ රාජ්‍ය සමය වාරිමාර්ග ඉතිහාසයේ ප්‍රථම ස්වර්ණමය යුගය වශයෙන් සැලකෙනු ලැබේ. මෙතුමාගෙන් පසු 8, 9, 10 සියවස්වල විශාල වාරිමාර්ග ඉදිකිරීම අල්පය. නිශ්චිතව කිව නොහැකි සාදක නිසා මෙතැන් පටන් විශාල වැව් සම්බන්ධ තොරතුරු ඉතාමත් සීමාකාරීය.

ලංකාවේ වාරි මාර්ග ඉදිකිරීම් වල පෘථුල ,සංකීර්ණ මහාපරිමාණ අවධිය වන්නේ මහා පරාක්‍රමබාහු රජ සමය නියෝජනය කල පොළොන්නරු යුගයයි. වංසකතාගත තොරතුරු අනුව එතුමාගේ වාපි කටයුතු අදියර දෙකකින් සිදුවේ.

01 අදියර : දක්ෂිණ දේශයේ පාලකයාව සිටි විට කළ වාරිමාර්ග

02 අදියර : අගරජු වශයෙන් පොළොන්නරුවේ සිටි විට කළ වාරිමාර්ග

**"අහසින් වැටෙන එක දියබිඳ කුඩු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට යා නොදෙව්"** යන මහා පරාක්‍රමබාහු රජුගේ ප්‍රකාශයෙන් ඔහු ජලය උපරිම ආකාරයෙන් ප්‍රයෝජනයට ගත් බවත් සිය රාජ්‍යය ප්‍රතිපත්තීන් සඳහා තම අභිමතාර්ථ සාධනයට මැනැවින් ආරෝපණය කරගත් ආකාරයත් ප්‍රකට ය.

මේ රජු පඬා වැව ප්‍රතිසංස්කරණය කර විශාල කරයි. වැව් 53 ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කළ බව කියවේ. දක්ෂිණ දේශය හරහා ගලායන දැදුරු ඔය ස්ථාන තුනකින් හරස්කොට අමුණු බැඳවූ බව වංසකතාවේ එයි.

01. සූකර නිජ්ජර අමුණ : එබලවපිටිය ස්ථානයෙන් බිඳින ලද අතර මාගල්ලේ වැව වෙත ගෙනගිය බව සඳහන්ය.

02. දෝරදත්තික අමුණ : හක්වටුනා , කිඹුල්වානා ඔය එකතුවන දෙමෝදර ස්ථානයේ බැඳි අතර එහි ජලය තලගල්ල (තිලගුල්ලක වාපි ) වැවට ගෙනයයි.

03. කොට්ටබද්ද අමුණ : මෙනමින් කරන ලද අමුණ හඳුනාගෙන නැත.

02 වන අදියර යටතේ වාරිමාර්ග ඉදිකිරීමේ පෘථුල හා සංකීර්ණ සමය උදාවේ. විශාල වැව් ඉදිළේ වැව් කිහිපයක් ඒකාබද්ධ කරවමිනි. පුරාතන ශ්‍රී ලංකා වාරි මාර්ග සභ්‍යත්වයේ මුදුන් මල්කඩ ලෙස ඉදිවන පරාක්‍රම සමුද්‍රය රජරට ශිෂ්ටාචාර සමයේ ඉදිවූ දැවැන්තම වැවය. මහා පරාක්‍රම සමුද්‍රය වැව තෝපා, දුඹුටුලු, එරබඳු වැව් 03 ඒකාබද්ධ කරයි. මෙහි වැව් බැම්මේ දුර සැතපුම් 8 1/2 කි. අක්කර 5350 භූමියක පැතිරේ. ජල ධාරිතාවය අක්කර අඩි එක්ලක්ෂ නවදාහක් තරම්ය. මෙහි ජලය කුඹුරු වෙත ගලායාම සඳහා ඉතා සංකීර්ණ ඇළවල් කිහිපයක් ද මේ සමයේම ඉදිකරන අතර චූලවංශයේ ඒවා ගම්භීර, හේමාවති ,නීලවාහිනී, යුංගභද්‍ර, චම්පා, යමුනා, සරබූ, නේරංජන ආදී ලෙසය. මේවායින් සිංහල සංස්කෘතිය ඉන්දියානු ආභාසය සමඟ සම්මිශ්‍රණය වූ ආකාරයද ප්‍රකට වේ. පළමුවන පරාක්‍රමබාහු රජුගේ සමයේ ඇතිවූ ආර්ථික සමාජීය හා ආගමික සමෘද්ධිය උදෙසා රටේ ස්වයංපෝෂිත බව සෘජුවම බලපෑ

බවත් ඒ සඳහා අවශ්‍ය ශක්තිය, ධෛර්යය පරාක්‍රමබාහු රජුට ලබාගැනීමට හැකිවූයේ ඔහු විසින් අනුගමනය කරන ලද වාරි මාර්ග සංවර්ධනය කේන්ද්‍ර කරගත් කෘෂි ආර්ථික නගා සිටුවීමේ ක්‍රියාවලියයි. මහවැලි ගඟේ අතුශාඛාව වූ අඹං ගඟ අංගමැඩිල්ල ස්ථානයේදී හරස්කර මෙයට ජලය ලබාගෙන තිබේ. වැව් බැම්ම උස අඩි 40කි. අක්කර 18,200 කෘෂිකාර්මික භූමින් සඳහා ජල ධාරිතාවයක් සතුය. වංසකතාවේ මේ සුවිසල් නිර්මාණය **"මහා සමුද්‍ර"** ලෙස නම් කරයි. වංශකතාවට අනුව එක් දවසින් වැවක් කරවූ අතර එය **"ඒකහාවාපි"** වෙයි. මතිසාගරය, මහින්ද තටාක, පරාක්‍රම සාගරය යන වැව්ද , ගෝමති , කාලිංග යන ඇළමාර්ග කරවූ බව වාර්තා වේ. මෙතුමාගේ වාපි නිර්මාණ සංඛ්‍යාත්මකව වංසකතාවේ මෙසේ දක්වයි. මහවැව් = 163, කුඩාවැව් = 2376, අමුණු = 165, ඇළමාර්ග = 3910, ගල් සොරොව් = 340.

මහා පරාක්‍රමබාහු රජුගෙන් පසු එතරම් සුවිසල් වාපි නිමැවුම් පිළිබඳ අවධානයක් පාලකයන් යොමුකර නැත. චූලවංශයට අනුව පරාක්‍රමබාහු රජුගෙන් පසු මෙරට වාරි කර්මාන්තයේ දියුණුවට සම්බන්ධ වූ රජවරුන් ගැන සාක්ෂි කිසිවක් සඳහන් නොවේ. පරාක්‍රමබාහු රජුගෙන් පසු ඇතිවූ අස්ථාවර දේශපාලන තත්ත්වයේ දීර්ඝකාලීන ප්‍රතිඵල මත වාරි පද්ධතියේ විනාශයට හේතු සාධක සකස් විය. යම් තරමකට හෝ පැරකුම් චරිතය අභිබවා දේශපාලන ස්ථාවරත්වයක් ගොඩ නගා ගැනීමට උත්සාහ කළ නිශ්ශංකමල්ල රජු ඔහුගේ ශිලාලේඛනයන්හි වැව් බොහොමයක් කළ බව කීවද මෙය එක එල්ලේ පිළිගැනීම උගහටය. නිශ්ශංක සමුද්‍රය වැනි විශාල වැවක් කරවූ බවත් විජයකුලම් වැනි එක් දවසින් වැවක් කරවූ බවත් සඳහන්ය. කෙසේ වුවද මහ පැරකුම් රාජ චරිතය අභිබවා යාමේ අභිරුචිය මත පරාක්‍රම රජුට පසුව බිහිවූ අවසන් කීර්තිමත් චරිතයක් ලෙසින් ද හඳුන්වා දීමට පිළිවන.

**නිගමනය.**

රජරට ශිෂ්ටාචාරයේ වාරි නිර්මාණ විශේෂයෙන්ම රාජ්‍ය අනුග්‍රහය මත කාලීනව සැලකිය යුතු ප්‍රවණතාවයන් ඔස්සේ වර්ධනය වූ ආකාරය උක්ත කරුණු තුළින් අපට මනාව ඒත්තු ගන්වයි. වාරි නිර්මාණ මුල් කාලීනව පැවති ආකාරයට ඉදුරාම වෙනස් ආකාරයකින් අදියර 4ක් යටතේ වර්ධනය වේ. මෙහිලා විශේෂයෙන්ම කිවයුතු කරුණ නම් එකල බිහිවූ රාජ්‍ය පාලකයන්ගේ ප්‍රධානත්වයෙන් මෙකී සංවර්ධනයේ ත්‍රිව්‍රතාව ඉහළ නැංවීමට මනා පිටුබලයක් වූ බවය. එකල පෙර සිරිත පදනම් කරගත් රාජ්‍ය පාලකයන් සිය වගකීම් නිසියාකාරව ඉටුකල බවටත් එකල ස්වයංපෝෂිත ආර්ථිකයක් දායාද වූයේ කුමන කරුණක් නිසාදැයි මෙමගින් අපට වටහා ගැනීම අපහසු නොවේ. අනුරාධපුර රාජ්‍යයේ මුල් කාලයට සාපේක්ෂව මැද භාගය වන විටත් මැද භාගයේ සිට පොළොන්නරු රාජ්‍ය දක්වාත් ක්‍රමික පියවරයන් ඔස්සේ ජල හිඟයට පිළියමක් වශයෙන් මොවුන් ප්‍රථමයෙන් ඉතා සරලව ආරම්භ කළ වැව් කර්මාන්තය රාජ්‍ය අනුග්‍රහයෙන් මහා කර්මාන්තයක් බවට පත් කරන අතර ඉතා කුඩා ප්‍රමාණයේ ගම් වැවක සිට මහා පරිමාණ වැව් නිර්මාණය දක්වා විකාශනය වීමක් මේ සියල්ලෙන් ම අවසන ප්‍රතීයමාන කරවයි.

**පරිශීලන.**

නිකලස්, සී. ඩබ්ලිව්., (1972) ***කෘෂිකර්මය සහ ජලානයනය, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, කාණ්ඩය ii,*** විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 526-530 පිටු.

විතානාච්චි. සී. ආර් (2017) ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය***, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07

විතානාච්චි. සී. ආර්. (2009) ***පැරණි අනුරාධපුර නගරය ආශ්‍රිත ජල සම්පාදනයෙහි ලා වාරි කර්මාන්තයේ දායකත්වයත්වය හඳුනාගැනීම***

http://repository.rjt.ac.lk:8080/xmlui/handle/123456789/1657

විතානාච්චි. සී. ආර්, ***ලංකාවේ පැරණි ජල කළමනාකරණය මගින් වර්තමානයට ලබා ගත හැකි ආදර්ශය (දැදුරු ඔය ආශ්‍රිත ක්ෂේත්‍ර අධ්‍යයන ප්‍රතිඵල ඇසුරිනි)*** http://repository.rjt.ac.lk:8080/xmlui/handle/123456789/1657

විතානාච්චි. සී. ආර්, (2018) ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ විකාශනය,*** http://www.vidusara.com/2018/11/07/feature2.html

සිරිවීර ඉන්ද්‍රකීර්ති ,***රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි*** ,දයාවංශ ජයකොඩි සහ සමාගම ,කොළඹ 10

# 26. ග්‍රාමීය වැව ආශ්‍රිත සමාජ උපයෝගීතාවය පිළිබඳ වූ අධ්‍යයනයක්

(කරම්බන්කුලම ග්‍රාමය ඇසුරින්)

ඒ. එම්. එම්. වීරකෝන්

## හැඳින්වීම

ලෝකයේ ඉපැරණි ශිෂ්ටාචාරයන් සියල්ලක් ම පාහේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද ජනාවාස ආරම්භයත් සමඟ ජලය යන්න ප්‍රධාන අවශ්‍යතාවයක් වූ අතර එම නිසාම ජලාශ්‍රිතව එම ශිෂ්ටාචාර බිහිවන්නට විය. ආර්ය සංක්‍රමණයත් සමඟ තම ජනාවාස ගංගා නිම්න ආශ්‍රිතව බිහි කරගත් මොවුන් ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වන වී වගාවට වඩාත් යෝග්‍ය වූ වියළි කලාපයේ ගංගා මිටියාවත් ආශ්‍රිතව වාසය කිරීමට පටන් ගත් අතර වියළි කලාපීය ප්‍රදේශයට වර්ෂාව වසරකට වරක් ලැබුණු නමුත් කෘෂිකාර්මික කටයුතු සඳහා වසර පුරා ජලය අවශ්‍ය වූ හෙයින් එම අතිරික්තව ලැබුනු ජලය සුරක්ෂිත ව ගබඩා කර ගැනීමේ මූලික පරමාර්ථය ඇතිව වැව් ඉදිකිරීම ඇරඹී බව පැහැදිලි වේ. එසේම වාරි කර්මාන්තයේ දියුණුව කෙමෙන් වර්ධනය වීමත් එහි දී මුල් කාලීනව ජල පහරක් ස්වභාවිකව පිහිටි උස් භූමි දෙකකට කොටු කරමින් එක් පසකින් පමණක් ලී දඬු, කොළ අතු, වැනි දෑ හරස් කොට වාරි නිර්මාණය කළ ද එහි තාවකාලික බව හේතුවෙන් ක්‍රමයෙන් දේශීය දැනුම භාවිත කරමින් වඩා සංකීර්ණ නිර්මාණයක් ලෙසට ලාංකීය වාරි නිර්මාණ ලොව අන් කිසිදු රටකට නොදෙවෙනි ආකාරයේ විස්මිත තාක්ෂණික නිර්මාණ බවට වර්ධනය වීම ද හඳුනාගත හැකිය.

මේ අයුරින් ආරම්භ වූ වාරි කර්මාන්තය පුළුල් පරාසයක් දක්වා වර්ධනය වීමත්, වැවයි- දාගැබයි- ගමයි- පන්සලයි යන සංලක්පය පෙරටුකරගත් ජනතාවක් වාසය කරන මෙරට විශාල වාරි කර්මාන්තයේ දියුණුවක් දැකිය හැකි බවත් ඒ අනුව ග්‍රාමීය වැව් පද්ධතිවල අවශ්‍යතාවය විශාල වශයෙන් වැදගත් වන බවද කිව යුතුය. උක්ත අධ්‍යයනයට අනුව එවැනි වූ වැව් බැඳි රාජ්‍යයකට හිමිකම් කියන අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කරම්බන්කුලම ග්‍රාමය වැදගත් වේ. මෙම ග්‍රාමය ආශ්‍රිතව ප්‍රධාන වාරි කර්මාන්තයක් පවතින අතර මෙම අධ්‍යයනයේ දී එම ග්‍රාමීය වැව ආශ්‍රිතව පවතින සමාජ උපයෝගීතාවය කෙබඳු ද යන්න හඳුනා ගැනීමත් ඒ තුළ සමාජ, ආර්ථික ක්ෂේත්‍රයන්හි පවතින තත්වය කෙබඳු ද යන්නත්, වර්තමානය වන විට මේ ආශ්‍රිතව ඇති බලපෑම කවරේද යන්නත් එම බලපෑම් අවම කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් අධ්‍යයනයට බඳුන් කිරීම මෙහි ප්‍රධාන අරමුණ වශයෙන් පෙන්වා දිය හැකිය.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී ඒ සඳහා භාවිත කරන ලද ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන යටතේ සම්මුඛ සාකච්ඡා, ඡායාරූප යනාදිය භාවිත කළ අතර සම්මුඛ සාකච්ඡා සඳහා ගම්මානයේ වැඩිහිටියන් තිදෙනෙකුගේ ද ග්‍රාමනිලධාරී මහතාගේ ද සහය ලබා ගත් අතර ඔවුන්ගේ තොරතුරු වලට අනුව මෙම අධ්‍යයනය සාර්ථක කරගැනීමට හැකි වූ බව කිව යුතුය.

## විමර්ශනය

වැව් බැඳි රාජ්‍යයේ ප්‍රතාපවත් බව විදහාපාන අනුරාධපුර පුරවරයෙහි මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හොරොව්පොතාන මාර්ගයේ කිලෝමීටර් 5 ක් පමණ ගිය පසු

කරම්බන්කුලම ග්‍රාමයට ප්‍රවේශ විය හැකිය. පවුල් 200 ක් පමණ ජීවත්වන මෙම ගම්මානයේ ජනයාගේ සමාජ පසුබිම පිළිබඳව සැලකීමේ දී කෘෂිකාර්මික ආර්ථික රටාවක් අනුගමනය කරන මෙම ජනතාව ඔවුන්ගේ ප්‍රධාන ජීවන උපාය මාර්ගය ලෙස වී ගොවිතැන සිදු කරනු ලබයි. මීට අමතරව හේන් වගාව, ගෙවතු වගාව වැනි දේට ද යොමු ව ඇති බවක් දක්නට ලැබේ. උක්ත අධ්‍යයනයට අනුව බැලීමේ දී මෙම කරම්බන්කුලම ගම්මානය තුළ පවතින ග්‍රාමීය වැව ආශ්‍රිත සමාජ උපයෝගීතාවය කෙබඳු ද යන්න හඳුනා ගැනීම වැදගත් වන අතර එහි දී මෙම ගම් වැසියන් තමන්ගේ සමාජ, ආර්ථික තත්වය මෙම ග්‍රාමීය වැව තුළින් සපුරා ගන්නා ආකාරය පිළිබඳ ව විමසා බැලීමටත් මෙම ග්‍රාමීය වැව ඔවුන්ගේ ජීවනනෝපායට කෙලෙස බලපාන්නේ ද යන්නත්, එහි උපයෝගීතාවය කෙලෙස ද යන්නත් පිළිබඳ අධ්‍යයනයක් මේ තුළින් සිදු වන අතර ඒ අනුව මොවුන්ගේ ආර්ථිකය මෙම වැව හා බැඳී ඇති අයුරු හඳුනා ගැනීමත් එසේම කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීම මෙම වැව හරහා සිදු වීමත් පෙන්වා දිය හැකි අතර මෙම ග්‍රාමය ආශ්‍රිතව පවතින කෘෂිකාර්මික ආර්ථික රටාව ආර්ථිකයේ දියුණුවට මෙන්ම රටේ සංවර්ධනයට ද මඟ සලසන බවත් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාව කෘෂි කර්මාන්තය සඳහා ඉතාමත් යෝග්‍ය භූමියක් වුවත් වර්තමානය වන විට ඒ සඳහා වුවමනා ප්‍රධාන සාධකයක් වන ජලය නිසියාකාර ක්‍රමවේදයක් යටතේ කළමනාකරණය කර ගැනීමක් දක්නට නොලැබේ. අතීතයේ දී මෙම කෘෂි වාරි ජල කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් පැවතුනත් වර්තමානය වන විට එය වියැකී යන ස්වභාවයක් දක්නට ලැබේ. එමෙන්ම අතීතයේ දී ජනයා ප්‍රමාණවත් හා වුවමනා පරිදි කෘෂිකර්මාන්තය සඳහා තෝරාගැනීමට හැකි භූමි ප්‍රමාණයක් පැවතිය ද වර්තමානයේ දී දක්නට ලැබෙනුයේ වැඩි ජනගහනයකින් යුතු ප්‍රදේශයන් හී සීමිත භූමි ප්‍රමාණයකි. මේ අනුව ජනතාවට කුඩා භූමි ප්‍රදේශයක සිදු කරන වී වගාවන් තුළින් වැඩි අස්වැන්නක් බලාපොරොත්තු වීමට සිදුව තිබේ. ඒ අනුව මෙම ගම්මානයේ වැසියන්ට ද මෙවැනි වූ අභියෝග රැසකට මුහුණ දෙමින් තම ජීවනෝපාය සරි කර ගැනීමට සිදුව ඇති බවත් හඳුනාගත හැකිය. එම දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා වර්ෂා ජලයෙන් අතිරික්තය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් යුතුව මෙම වැව් නිර්මාණය කර අවශ්‍යතාවයන් අනුව භාවිතයට ගැනීම පරමාර්ථය වන බවත් පැහැදිලි වන අතර එවැනි වූ මෙම කරම්බන්කුලම ග්‍රාමය තුළ දක්නට ලැබෙන වාරි පද්ධතිය ද එම ගම්මානයේ වැසියන්ගේ සම්පතක් ලෙසට එය ආරක්ෂා කර ගැනීමක් දක්නට ලැබේ. ඒ අනුව මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිතව ප්‍රධාන වශයෙන් මහා වාරිමාර්ග 6 ක් හා සුළු හා මධ්‍යම වාරිමාර්ග 290 ක් පිහිටා ඇති අතර ඒ සියල්ල වර්ෂා ජලයෙන් පමණක් පෝෂණය වේ. එලෙස වර්ෂා ජලයෙන් පමණක් පෝෂණය වන ග්‍රාමීය වැව් පද්ධතිය පිළිබඳ ව සැලකීමේ දී අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ප්‍රධාන කොටම මෝසම් වැසි මත රඳා පැවතීමත් ඒ අතරින් ඊශාන දිග මෝසම් වර්ෂාව පදනම් කරගනිමින් වියළි කලාපයේ කෘෂිකාර්මික කටයුතු වැඩි වශයෙන් සිදු වීමත් දක්නට ලැබේ. ග්‍රාමීය වැව මූලික කරගෙන සිදු කරන වගා කටයුතු සඳහා ජනතාවට මෙම ඊශාන දිග මෝසම් වර්ෂාව අතිශය වැදගත් සාධකයක් ලෙසට පෙන්වා දිය හැකිය.

රජවරු වැව් නිර්මාණය කිරීමේ දී ජනතා අවශ්‍යතාවයන්ට වැඩි ඉඩක් ලබා දෙමින් ග්‍රාමීය වැව ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ජනයාගේ එදිනෙදා ජීවන ක්‍රමය සකස් කර ගැනීමට ඔවුන්ගේ ප්‍රධාන ජීවන උපාය වන කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජලය නිසි ලෙස ලබා ගැනීම මෙම වැව හරහා සිදුවීම පෙන්වා දිය හැකිය. ඒ අනුව මෙම ග්‍රාමය තුළ පවතින වාරි කර්මාන්තය පිළිබඳව විමසීමේ දී මෙම ග්‍රාමය අවට එනම් මෙම ග්‍රාම නිලධාරී වසමට අයත් සුළු වාරි මාර්ග කිහිපයක් ම පවතින අතර එම වැව් ආශ්‍රිතව පවතින ජල ධාරිතාවන් මෙන්ම එම ජලය මගින් පෝෂණය වන කුඹුරු ප්‍රමාණය මෙන්ම කන්න ක්‍රමයට අනුව මෙම කෘෂිකාර්මික කටයුතු සිදු වීම ද පෙන්වා දීමට පුළුවන. ඒ අනුව,

| කරම්බන්කුලම ග්‍රාමනිලධාරි වසමට අයත් වැව් | ජල ධාරිතාවය අක්කර අඩි | ජල සම්පාදනය කළ හැකි කුඹුරු අක්කර ගණන | | වගාකරන කුඹුරු අක්කර ගණන | | ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | යල | මහා | යල | මහා | |
| කරම්බන්කුලම මහා වැව | 255 | 30 | 144 | 30 | 144 | 122 |
| පහලගම වැව | 70 | 0 | 48 | 0 | 48 | 31 |
| දිවුල්ගහ වැව | 65 | 0 | 28 | 0 | 28 | 11 |
| කුඩා වැව | 30 | 0 | 32 | 0 | 32 | 12 |
| මහකටුකැලියාව | 55 | 0 | 34 | 0 | 34 | 18 |
| කුඩා කටුකැලියාව | 10 | 0 | 8 | 0 | 8 | 6 |
| රළපනාව වැව | 270 | 35 | 114 | 35 | 114 | 81 |
| ගිරාකැත්ත වැව | 95 | 0 | 52 | 0 | 52 | 44 |
| ඇල්පත්ගම | 60 | 0 | 46 | 0 | 46 | 36 |
| හබ වැව | 7 | 0 | 10 | 0 | 10 | 6 |
| කෝනගොල්ලෑව | 12 | 0 | 14 | 0 | 14 | 13 |
| කිරිකන්ද වැව | 18 | 0 | 21 | 0 | 21 | 13 |
| මී ගස් වැව | 15 | 0 | 20 | 0 | 20 | 6 |
| කුරුදුගොඩ වැව | 12 | 0 | 13 | 0 | 13 | 5 |

(වගුව 01)

මේ අයුරින් සුළු වාරි මාර්ග ක්‍රම පැවතීම තුළ ගම්වැසියන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන ආකාරයේ ජල සැපයුමක් තිබීම සතුටට කරුණක් වුවත් වර්ෂා ජලය වසරේ එක් කලකට දෙකකට පමණක් සීමා වීම තුළ එම වී ගොවිතැන් කටයුතුවලද අඩු වීමක් දක්නට ලැබේ. ග්‍රාමීය වැව පදනම් කරගත් කෘෂිකර්මාන්තයේ දී ජලයේ ප්‍රමාණවත් බව මත ගම් වැසියන් තම ගොවිතැන් ක්‍රම හා වගාකරන කාලය වෙනස් කිරීම යනාදිය දේශගුණික විචල්‍යතාවයන්ට

මුහුණ දීමට හැකි වන පරිදි ඔවුන්ගේ කෘෂිකර්මාන්තය සකස් කරගෙන තිබූ අතර ඒ අනුව ගොඩ හේන් වගාව හා මඩ වී වගාව සිදු කිරීම තුළ එහි දී අවම වශයෙන් එක් වගාවකින් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට හැකි වී ඇති බවද හඳුනා ගත හැකිය. මේ අනුව මෙම ගම්වාසීන් ගොඩ ඉඩම් හා මඩ ඉඩම් වශයෙන් ඉඩම් බෙදා වෙන් කිරීමකින් යුතුව සිදු කරන ආකාරයක් දැකිය හැකිය. ඒ අනුව වගාකල හැකි ඉඩම් මෙන්ම වගාකල ඉඩම් වශයෙන් ඒවා සංඛ්‍යාත්මකව මෙලෙස දැක්විය හැකිය.

| **ඉඩම් වර්ගය** | **වගාකල හැකි ඉඩම් අක්කර ප්‍රමාණය** | **වගාකළ ඉඩම් අක්කර ප්‍රමාණය** |
|---|---|---|
| **ගොඩ ඉඩම්** | 207 | 166.24 |
| **මඩ ඉඩම්** | 270 | 197.5 |

(වගුව 02)

මෙම ගම්මානයේ වැසියන් වර්තමානය වන විට මේ අයුරින් තම ගොවිතැන් කටයුතු සිදු කළ ද එයින් අපට පසක් වනුයේ වාරි ජලයේ පවතින ප්‍රමාණත්වය නොවේ ද? මෙයට විසඳුමක් වශයෙන් මෙම ගම්වාසීන් වැවේ ජලය ආරක්ෂා කර ගැනීම සඳහා විවිධාකාරයෙන් වී වගාව සිදු කරන අතර ඒ අනුව කැකුලමට වී වැපිරීමේ ක්‍රමය අනුගමනය කිරීමත්, ජලය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී හවුලේ සිදු කරන වගාවත්, වැව් ඉස්මත්තේ සිදු කරන වගාව යනාදිය ද පැරැන්නන් සිදු කළ ආකාරයටම ගොවිතැනට නියඟ බලපෑම වළක්වා ගැනීම සඳහා සිදු කිරීම ඔවුන්ගේ අත්දැකීමේ ප්‍රමාණය කියා පෑමට කදිම නිදසුනකි.

ග්‍රාමීය වැව හා බැඳි කෘෂිකර්මාන්තය තුළ කුඹුරට අවශ්‍ය ජලය සපයා ගැනීම සඳහා වැවේ ප්‍රධාන අංගයක් වන සොරොව්ව ප්‍රමුඛ වේ. සොරොව්ව හරහා ඇළ වේලිවලට ලබා ගන්නා ජලය කුඹුරට යාම පහසු කිරීම සඳහා මෙම ක්‍රමවේදය යොදාගෙන ඇති අතර එහි දී වැවේ ඇතුලතින් අඩියක් පමණ උසකින් ජලය සොරොව්ව හරහා ගෙන ඒමත්, සොරොව්වේ බැස්ම අගල් 10 ක් පමණ වන ආකාරයට සකස් කර තිබීමත් දැකිය හැකි අතර එහි දී අගල් 2 ක පරතරයක් වැව හා සොරොව්ව අතර පැවතීම පෙන්වා දිය හැකිය.




(රූපසටහන 01)

ඒ අනුව සොරොව්වෙන් ලබා ගන්නා ජලය ඇළ වේලි තුළින් කුඹුරට ගෙන යාමත් එසේ ගෙන යාමේ දී මෙම ගම්වාසීන් පවසන ආකාරයට " කරහන්" නමින් හඳුන්වන වතුර බෙදා ගැනීම සඳහා යොදාගනු ලබන කුඩා ස්ථානයක් වන අතර ඒ තුළින් කුඹුරු කිහිපයකට එකවර

වේල්ල හරහා ජලය ගෙන යාමට හැකියාව පවතී. මෙය "පෝල්" යනුවෙන් ද හඳුන්වන අතර අතීතයේ දී මෙය පොල් කඳන් යොදා එම කඳේ කට්ටයක් කපා ජලය ගෙන යාම සිදු වුවත් වර්තමානයේ දී එය කොන්ක්‍රීට් වලින් සාදා ඇති බවක් දක්නට ලැබේ.



කරහන්(පෝල්)
(රූපසටහන 02)



පෝල් එක (ඡායාරූපය 03)

එසේම ජලය වේගයෙන් රැගෙන යාම සඳහා ද මෙම කරහන් භාවිත කරන අතර එහි දී ප්‍රධාන ඇළ ඔස්සේ එන ජලය කරහන් හරහා බැස්මකින් යුතුව ඇළ හරහා වේගයෙන් ගමන් කිරීම සිදු වේ.

වැවක අතිරික්ත ජලය පිටකිරීම සඳහා යොදාගනු ලබන ප්‍රධාන අංගයක් ලෙස හඳුන්වන පිටවාන ද මෙහි දී වැදගත් වන අතර එම පිටවාන තුළින් ඉවත් වන ජලය අමුණට එකතු වීම සිදු වන අතර එහිදී අමුණ හරහා එම ජලය කුඹුරට එකතු වීමට ද ක්‍රමවේදයක් සකස් කර තිබේ.



(ඡායාරූපය 04)

මෙම ගම්මානයේ වැව තුළ වූ මෙවැනි අංගයන් වර්තමානය වන විට කැලෑවට යටවී පැවතීම කණගාටුවට කරුණක් ලෙස පෙන්වා දිය හැකිය. ඒවා අරක්ෂා කරගැනීම සියලු දෙනාගේම වගකීමක් වන බවද කිව යුතුය.

ග්‍රාමීය වැව පදනම් කරගනිමින් සිදු කරනු ලබන ආර්ථිකයේ ප්‍රධාන සාධකයක් වන කෘෂිකර්මාන්තය මෙම කරම්බන්කුලම ගම්මානයේ වැසියන් විවිධ දුෂ්කරතා මැද වුවත් සිදු කරන ආකාරයක් දක්නට ලැබෙන අතර එම කෘෂිකර්මාන්තයට අවශ්‍ය ප්‍රධාන ජල පෝෂක එම ගම්මානයේ වැව තුළින් ලැබෙන බවත්, ඒ අනුව සමාජ අවශ්‍යතාවන්ට රුකුලක් වන මෙම ග්‍රාමීය වැව සියල්ලන්ට ම සම්පතක් ලෙසට හැඳින්විය හැකිය. මෙම සමාජ රටාව තුළ කෘෂිකර්මාන්තය නිසාවෙන් තම ජීවිකාව ගෙන යන අතීතයේ සිටම ග්‍රාමීය වැව පදනම් කරගත් සංස්කෘතියක් පැවතීම තුළ එකල සිටම මෙම වැව තුළින් ජනයාගේ බොහෝ අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වූ අතර වර්තමානය තුළ ද එවැනි අවශ්‍යතාවලට මෙම වැව පාදක වන බවද කිව යුතුය. එම වැව තුළින් මිනිසුන්ගේ පමණක් නොව තිරිසන් සතුන්ගේ ද ජල අවශ්‍යතා සපුරාලීමට සමත් වන අතර සමහර නියං කාලවල දී ළිං වල ජලය හිඟ වන අවස්ථාවන්හී දී ගම්වාසීන්ට තම එදිනෙදා අවශ්‍යතා සපුරාලීමට මෙය උපකාරි වන බවද පැහැදිලි වේ.

අතීතයේ වාරි කර්මාන්තය ආශ්‍රිතව විවිධ නීති රීති පැවතුන අතර එහි දී මත්ස්‍යයන් ඇල්ලීම, වැවකින් ජලය ගැනීම වැනි දේ සඳහා විවිධ බදු වර්ග ද පනවා තිබුණු අතර දකපති, මජිබක යන බදු එහි දී ප්‍රධාන විය. ආර්ථිකයේ සාධකයක් වන වෙළඳාමෙන් ජීවත් වූ ජනයා වැවෙන් ලබා ගන්නා මත්ස්‍යයින් මෙන්ම මල් වැනි දෑ විකිණීම ද සිදු කළ අතර මෙම ගම්මානයේ පවතින වැව බදු දීම නම් වූ ක්‍රියාවලිය තුළ ගමේ ප්‍රධානියා විසින් වසරකට වරක් වැවේ ජලය අඩු වූ පසුව වෙනත් ගමක පුද්ගලයෙකුට සීමිත කාලයක් සඳහා බදු දීමෙන් පසු නැවත එම වැවේ මාළු ඇල්ලීමත්, මල් කැඩීමත් ගමේ ජනයාට තහනම් වන බවත් එසේ සිදු කිරීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා බදු දුන් පුද්ගලයාට ගෙවීමක් කිරීමට ද සිදු විය. එසේම කාලසීමාව අවසන් වීමෙන් අනතුරුව එම වැව නැවත පියවා ගැනීමක් ද සිදු වේ. මෙය ද ගමේ සංවර්ධනයට රුකුලක් වන බවද කිව යුතුය.

පුරාණයේ සිටම මෙම වාරි කර්මාන්තය ජනතා අවශ්‍යතා උදෙසා ක්‍රියාත්මක වූවත් විවිධ හේතූන් නිසා පරිහානියට පත්ව ඇති බවක් දක්නට ලැබේ. මේ හේතුවෙන් ජනතාවට ඔවුන්ගේ ම ක්‍රියාකාරකම් තුළින් වර්තමානයේ ද ප්‍රධාන ගැටලුවක් වී ඇති ජල හිඟතාවයට මුහුණ පෑමට සිදු ව ඇති බවත් හඳුනාගත හැකිය. වර්ෂයේ එක් කලකට පමණක් වර්ෂාව ලැබීම තුළ මෙම අභියෝගය ජය ගැනීම සඳහා ඉහතින් සඳහන් කළ ආකාරයට භූමියේ ස්වභාවික පිහිටීම මත ක්‍රමයෙන් ග්‍රාමීය වැව් ගොඩනගාගත් බවත් එම වැව් ආරක්ෂා කර ගැනීම කාගේත් වගකීමක් ලෙසට ගෙන සිදු කිරීමක් ද දක්නට ලැබුණි. නමුත් මෙම ගම්මානයේ වැව ආශ්‍රිතව පවතින අභියෝග රැසක්ම මෙම අධ්‍යයනයේ දී හඳුනාගැනීමට හැකි වූ බව කිව යුතුය. ඒ අනුව,

- නිසි ජල කළමනාකරණයක් නොමැති වීම.
- වැවක තිරසාරභාවය ආරක්ෂා කරන වැවේ ඉහළ පෝෂක ප්‍රදේශ ආශ්‍රිතව ජනාවාස ව්‍යාප්ත වීම තුළ වැව ස්වභාවික පරිසරයෙන් ගිලිහී ගිය හුදකලා තත්වයට පත්ව තිබීම.
- පුරාණයේ දී මෙය "අපේ වැව" ලෙස සලකා නඩත්තු කළ මෙම ග්‍රාමීය වැව මේ වන විට රජයේ නඩත්තුවක් පමණක් ලෙස සැලකීමට ජනතාව හුරුවීම.
- මේ හේතුවෙන් ස්වයංපෝෂිත බවේ සාධකයක් වූ මෙම ග්‍රාමීය වැව හා ඒ සමඟ සාම්ප්‍රදායික සංස්කෘතිය ක්‍රමයෙන් අභාවයට යාම ද සිදුව ඇති බව කිව යුතුය.

මෙවැනි අභියෝග තුළින් රටක, ප්‍රදේශයක, ගමක සමාජ, ආර්ථික තත්වයන්ට දැඩි ලෙස හානිකර වන බවත් වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන සංකල්පය ද අද වන විට වියැකි

යන ස්වභාවයක් මේ තුළින් දැකිය හැකි අතර එවැනි අභියෝග මඟහරවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම ද ජනතාවගේ වගකීමක් වේ. ඒ අනුව

- රොන් මඩ වැවට ගලා ඒම වැළැක්වීමට පියවර ගැනීම.
- වැවට ඉහළ කලාපයේ පිහිටි වනාන්තර වැස්ම ආරක්ෂා කිරීම මඟින් වැවට ගලා බසින ස්වභාවික ජල පහරවල් රැක ගැනීම.
- එවැනි වැව ආශ්‍රිතව සැකසුණු ව්‍යුහයන් ආරක්ෂා කර නිරතුරුවම ඒවා සක්‍රීය තත්වයෙන් පවත්වා ගැනීමට කටයුතු කිරීම.
- පුරාතනයේ සමාජයේ පැවති ශක්තිමත් යාන්ත්‍රණය වර්තමානය වෙතද ගෙන ඒම තුළ ග්‍රාමීය වැව ආරක්ෂා කිරීමට පියවර ගත යුතුය. නිදසුන් වශයෙන් ගත් කළ පුරාතනයේ වපිහමික, වෙල්වැස්සන්, වෙල් කැමියන්, ගමරාළ (**අමරවංශ හිමි, කොත්මලේ, ලක්දිව සෙල්ලිපි, 1969**) වැනි විවිධ තනතුරු පැවති අතර එලෙස වර්තමානයේ ද වැව් භාරකරුවන් පත් කිරීමත්, කෘෂිකාර්මික නිලධාරීන් පත් කිරීමත්, ගමේ නායකයින් මෙන්ම සමස්තයක් වශයෙන් ගම්වාසීන් සියලු දෙනාගේ ම වගකීම වන වැව ආරක්ෂා කිරීමට පියවර ගැනීමද කළ යුතුව පවති.

මෙවැනි ක්‍රියාමාර්ග තුළින් ග්‍රාමීය වැව ආරක්ෂා කරගැනීමට හැකි වීමත් ඒ තුළ ජනතා අවශ්‍යතාවයන්ට සරිලන ආකාරයේ තම ජීවනෝපාය මාර්ග නිසි ලෙස සිදු කිරීමටත් හැකිවීම පෙන්වා දිය හැකිය. මෙවැනි බොහෝ උපයෝගීතාවයන් සහිත මෙම ග්‍රාමීය වැව සියලු දෙනාගේ සම්පතක් ලෙසට ගෙන එය ආරක්ෂා කිරීමේ වගකීම සියලු දෙනා සතුවන බවද කිව යුතුය.

**නිගමනය**

මෙහිදී ග්‍රාමීය වැව ආශ්‍රිතව පවතින සමාජ උපයෝගීතාවය කෙලෙස ද යන්න අධ්‍යයනයට බඳුන් වන අතර මෙම වාරි කර්මාන්තය අතීතයේ සිටම ජනතා අවශ්‍යතාවයන් අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වූ බවත්, එසේම සමාජ, ආර්ථික ක්ෂේත්‍රයන්හී දී විශාල වශයෙන් වැදගත් වූ බවත්, විශේෂයෙන් ම වැව් බැඳි රාජ්‍යයේ ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය වන කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය කරන ජල පෝෂක මෙම වැව හරහා ලැබීමත් වර්තමානය වන විට ග්‍රාමීය වැව ආශ්‍රිතව පවතින අභියෝග මොනවාද යන්නත් පිළිබඳ ව මෙම අධ්‍යයනයේ දී තොරතුරු ලබා ගැනීමට හැකි වූ අතර එම අභියෝග මඟහරවා ග්‍රාමීය වැව ආරක්ෂා කර ගැනීම වැදගත් වන බවද පෙන්වා දිය හැකිය.

**පරිශීලන**

**සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන්**

අප්පුහාමි, යූ. බී, වයස අවු. 67, ගොවිතැන (වෘත්තිය), කරම්බන්කුලම, කිරිගල්වැව, මැදවච්චිය

අනුලාවති, පී, වයස අවු. 65, ගොවිතැන (වෘත්තිය), කරම්බන්කුලම, කිරිගල්වැව

ප්‍රේමතිලක, ඒ, වයස අවු. 64, ගොවිතැන හා හේන් වගාව (වෘත්තිය), කරම්බන්කුලම, කිරිගල්වැව

මනතුංග, ඒ, වයස අවු. 49, ග්‍රාම නිලධාරි (වෘත්තිය), කනදරාව, මැදවච්චිය

## 27. මින්නේරිය වැව ආශ්‍රිත ගොවි ජනපද ව්‍යාපාරය.

කේ.කේ.ජී.කේ.එම් සෙනරත්.

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අතීතයේ පටන් ප්‍රධාන ජීවනෝපාය වශයෙන් හඳුනා ගැනෙන කෘෂිකර්මාන්තයේ වැදගත් සංධිස්ථානයන් අධ්‍යයනය කිරීමේ දී වාරි තාක්ෂණය හා බැඳී පවතින්නා වූ ගොවි ජනපදයන්හි තොරතුරු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වනු ඇත. අතීත කෘෂිකාර්මික ජන සමාජය ගොඩ නැගීමෙහි ලා ගොවි ජනපද ඇති වීම පුරෝගාමීත්වය ගනිද්දී වර්තමාන ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය වශයෙන් සැලකෙන්නා වූ මින්නේරිය වැව ආශ්‍රිතව ගොඩ නැගෙන ලද ගොවි ජනපද ව්‍යාපාරය විශේෂය. එහි දී මින්නේරිය වැව ආශ්‍රිතව ගොඩ නැගුණු පළමුවන ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය පිළිබඳව අධ්‍යයනය කළ හැකි තතු බොහෝමයකි. එලෙස මේ පිළිබඳව දැනට වාර්ථා වී ඇති තොරතුරු පිළිබඳව මෙම ලිපිය මඟින් අධ්‍යනය කිරීමට යෙදේ. එතුළ විශේෂ අවධානයක් යොමු කෙරෙන කරුණු කිහිපයකි. එනම් මින්නේරිය වැව ආශ්‍රිතව ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කිරීමට පුරෝගාමී වූ අදහස් හා ඒ සම්භන්ධව සිටින ලද ක්‍රියාකාරී පිරිස් කවරේද යන්න, මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භයට ඇති වූ බාධාවන් මොනවාද යන්න මෙන්ම එලෙස ජනපද ආරම්භයට එල්ල වූ බාධා ජය ගනිමින් ගොවි ජනපද ව්‍යාපාරය ගොඩ නංවන ලද්දේ කුමන ආකාරයකින් ද යනාදී මූලික කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම මෙම ලිපියෙහි මූලික අරමුණ වශයෙන් හඳුනා ගනිමු. ජනපද ආරම්භ කිරීම තුළ ආරම්භක අවස්ථාව පටන් අවසන් අවස්ථාව තෙක් බැඳී පවතින ඉහත වූ සියලු සාධක පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී තොරතුරු රැසක් අනාවරණය වේ.

මෙහි දී මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය වුදෙසා අවශ්‍ය කෙරෙන දත්ත සහ තොරතුරු ලබා ගැනීම වුදෙසා ප්‍රාථමික මූලාශ්‍රයන් මෙන්ම ද්විතීයික මූලාශ්‍රයන් ද භාවිතයට ගත හැකි අතර මෙම ප්‍රධාන මූලාශ්‍ර ක්‍රමවේදයන් ද්විත්වයට අමතරව ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් මුණගැසෙන විවිධ පුද්ගල කණ්ඩායම් ඔස්සේ ද දත්ත රැස් කර ගැනීමට හැකි වේ. මේ ආදී වශයෙන් සියලු පාර්ශවයන්ගේ මැදිහත්වීම මත ලබා ගන්නා තොරතුරු ඔස්සේ මින්නේරිය වැව ආශ්‍රිත ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කර ගත හැකි අතරම එහිදී මෙරට ඉතිහාසයේ වැව් ආශ්‍රිතව ඇති කරන ලද විශිෂ්ඨතම ගොවි ජනපද ව්‍යාපාරය වශයෙන් සැළකෙන ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භක ව්‍යාපාර අතර වැදගත් තැනක් ගනු ලබන මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය පිළිබඳව දත් නොදත් තතු රැසක් පිළිබඳව අනාවරණය කර ගැනීමට අවස්ථාව උදා වනු ඇත.

### විමර්ශනය

මෙරට වාරි කර්මාන්තය ආශ්‍රිතව පිහිටුවන ලද ගොවි ජනපද ව්‍යාපාරයට සමගාමීව හඳුනා ගැනෙන මින්නේරිය වැව ආශ්‍රිතව ගොවි ජනපදයක් පිහිටුවීම පිළිබඳව මුල්ම වරට අදහසක් ඉදිරිපත් වීම පිළිබඳව සැළකීමේ දී ඒ සඳහා මුල් වූ ප්‍රධාන සාධකයන් ද්විත්වයක් පිළිබඳව තොරතුරු සඳහන් වේ. එකිනෙක බැඳී පවතින වැදගත් සාධක දෙකක් වන මින් පළමුවැන්න වශයෙන් හඳුනා ගනුයේ පිටතින් ගෙන්වූ ජනතාව පදිංචි කොට වියළි කලාපයේ ජනපද පිහිටුවීම තුළින් මෙම ප්‍රදේශය තුළ කෘෂිකර්මාන්තය නංවාලීමේ සංකල්පය යි. ඒ හා බැඳී පවතින අනෙක් සාධකය වනුයේ මින්නේරිය වැව ආශ්‍රිත පළමුවන සාර්ථක ගොවි ජනපදයක් පිහිටුවීම පිළිබඳ ප්‍රයත්නය යි. ආදි කාලයේ පටන් සිදු වන්නා වූ වාරි කර්මාන්තයන් පිහිටුවීමේ ක්‍රියාවලිය සමඟ බැඳී පවතින ගොවි ජනපද පිහිටුවීම පිළබඳව සාකච්ඡා කිරිමේ දී බ්‍රිතාන්‍ය

පාලනය යටතේ වාරිමාර්ග ප්‍රතිසංස්කරණයන් බහුල වශයෙන් සිදු කරනු ලැබුවද ඊට පෙර කාලයන්වලදී පටන් ජනතාව පදිංචි කරවීම සිදු කරන ලද බවට සාධක හමු වේ. 1840 දී නුවරකලාවියේ දෙමළ ජන පදිකයින් පදිංචි කරවීමේ යොජනා ඉදිරිපත් වීමේ පටන් ජනාකීර්ණ පෙදෙස්වලින් වැසියන් වියළි කලාපය වෙත ගෙන්වා ජලය සහ ඉඩම් සහිත ප්‍රදේශයන්වල පදිංචි කරවීමට විවිධ අවස්ථාවන්වල දී උත්සාහයන් ගනු ලැබූ බව හඳුනා ගනී. මෙරට ගොවි ජනපද ව්‍යාපාරයේ අතීතය පිළිබඳව සොයා බැලීමේ දී එහි ආරම්භක අවස්ථාව දහනම වන සියවස දක්වා දිවෙන බව පෙනේ. 1890 දී මෙරට යටත් විජිත ලේකම්වරයා වශයෙන් සිටි අය විසින් මෙරට ජනාකීර්ණ ප්‍රදේශවල පිරිස් ප්‍රතිසංස්කරණය කරන ලද වැව් ආශ්‍රිතව පදිංචි කරවීම පිළිබඳව යෝජනාවලියක් 1890 අගෝස්තු දහසයවන දින පවත්වන ලද ඒජන්තවරුන්ගේ සම්මේලනයේ දී ඉදිරිපත් කොට ඇත. එලෙස ඉදිරිපත් කරන ලද ජනපද ඇති කිරීමේ යෝජනාවලිය ආර්.ඩබ්ලිවු අයිවර් විසින් පිළිගැණුනු අතර මෙය මෙරට ගොවි ජනපද පිහිටුවීම පිළිබඳ ඉදිරිපත් වන මුල් අදහස් වන බව හඳුනා ගත හැක. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙලෙස ජනපද පිහිටුවීම පිළිබඳව අදහස් ඉදිරිපත් වත්ම වියළි කලාපය තුළ ගොවි ජනපද පිහිටුවීමෙහිලා මුල්ම පියවරයන් ගනු ලැබුවේද බ්‍රිතාන්‍ය පාලන සමය තුළ වීම විශේෂත්වයකි. එලෙස ගනු ලැබූ පළමුවන ප්‍රයත්නය වශයෙන් 1891 වසරේ දී අනුරාධපුර ඒජන්ත වූ ආර්.ඩබ්ලිවු අයිවර් විසින් උතුරු මැද පළාත තුළ කලාවැව පදනම් කර ගනිමින් ගොවි ජනපද පිහිටුවීමට ගත් උත්සාහය පෙන්වා දිය හැකිය. එහිදී අදාල ව්‍යාපෘතිය උදෙසා දිස්ත්‍රික්කය තුළින් තෝරා ගත් පවුල් කිහිපයක් ගෙන ගොස් ඒ ආශ්‍රිත පදිංචි කරවීම සිදු කළ නමුදු එය අසාර්ථක වීම හේතුවෙන් යාපනයෙන් දෙමළ පවුල් කිහිපයක් ගෙන්වා පදිංචි කිරීමේ කටයුතු සිදු කරන ලදි. මෙසේ සිදු කරන ලද කලා වැව ආශ්‍රිත ව්‍යාපාරවලින් අනතුරුව නාච්චදුව වැව ආශ්‍රිතව ද ජනතාව පදිංචි කර ගොවි ජනපද ඇති කිරීමට 1920 වසරේ දී නැවත වරක් උත්සාහ දැරුවද මෙම සියලු ගොවි ජනපද ව්‍යාපෘති අසාර්ථක වීම තුළ උතුරු මැද පළාත තුළ ගොවි ජනපද ඇති කිරීමේ කාර්යය දිගින් දිගටම අසාර්ථක තත්ත්වයක් ගත් බව හඳුනා ගත හැක.

මෙසේ මෙරට ගොවි ජනපද ව්‍යාපාර සියල්ලක්ම පාහේ අසාර්ථක වන පසුබිමක් තුළ කලා වැව සහ මින්නේරිය වැව පාදක කර ගනිමින් 1920 කාල වකවානුවේ දී ව්‍යාපාරික ආයතනයන් කිහිපයක් එකට එක්ව මහා පරිමාණයෙන් වී ගොවිතැන් කිරීම උදෙසා ගත් උත්සාහයන් ද සාර්ථක නොවීය. මින්නේරිය වැව ආශ්‍රිතව ගොවි ජනපද ඇති කිරීම කෙරෙහි මුල් වරට අවධානය යොමු වන්නේ මෙම ව්‍යාපාරිකයන් විසින් වී වගාවන් සඳහා මෙම භූමිය යොදා ගැනීමත් සමඟය. මේ අයුරින් වියළි කලාපයන් තුළ ගොවි ජනපද ව්‍යාපාරයන් අසාර්ථක වීම සමඟ 1929 වසරවල දී නිකුත් කරන ලද ඉඩම් කොමිසමේ වාර්තාවෙන් නිර්දේශ කොට ඇත්තේ ඉඩම් හිඟයට හා ජනාකීර්ණ ගැටලුවට පිළිතුරු සෙවීම සිදු කළ යුත්තේ තෙත් කලාපය තුළ බවයි. තෙත් කලාපය තුළ ගොවි ජනපද පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කල යුතු බව එමගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම සාධක සියල්ලක්ම අධ්‍යනය කිරීමේ දී 1930 පමණ වන තෙක්ම වියළි කලාපය තුළ ගොවි ජනපද ඇති කිරීමට ගත් සියලු උත්සාහයක්ම අසාර්ථක වූ බව තහවුරු වන අතර මේ අයුරින් කලා වැව හා නාච්චදුව වැව ආශ්‍රිතව ඇති කිරීමට ගත් ගොවි ජනපද ව්‍යාපාරය මෙන්ම මින්නේරිය සංවර්ධන සමාගම ආරම්භ කරන ලද ව්‍යාපෘතිය අසාර්ථක වීම කෙරෙහි බලපෑ කරුණු කිහිපයක් හඳුනා ගත හැක. එලෙස මෙම ගොවි ජනපද ව්‍යාපාරයන් අසාර්ථක වීම තුළ මින්නේරිය වැව ආශ්‍රිත ජනපද ව්‍යාපාරය ද අසාර්ථක වීම කෙරෙහි බෙහෙවින් ම හේතු වූ ප්‍රධාන සාධකයන් ලෙස මින්නේරිය ව්‍යාපෘතියට අවශ්‍ය ශ්‍රමිකයන් ලබා ගැනීම අපහසු වීමට හේතු වශයෙන් හඳුනා ගැනෙන ලෙඩ රෝග හා අයහපත් සෞඛ්‍ය තත්ත්වයන්ගේ බලපෑම හඳුනා ගත හැකිය. මේ අයුරින් දිගින් දිගටම වියළි කලාපය තුළ ගොවි ජනපද ආරම්භ කිරීම

අසාර්ථක වන අවදියක ජනපද පිහිටුවිය යුත්තේ තෙත් කලාපයේ බව පිළිගත් අවස්ථාවක මින්නේරිය වැව පාදක කර ගනිමින් ගොවි ජනපදයක් පිහිටුවීම යනු ඉතාමත් වැදගත් අවස්ථාවක් වශයෙන් හැඳින්වීම වඩා නිරවද්‍ය වනු ඇත.

මෙසේ හඳුනා ගන්නා වූ මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය පිළිබඳව සඳහන් වන තවත් වැදගත් තතු රාශියකි. මහාමාන්‍ය ඩී.එස් සේනානායක විසින් ප්‍රකාශ කරනු ලබනුයේ ''මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ඔහුගේ සංකල්පයක් විය'' යනුවෙනි. මෙලෙස සේනානායකයන් විසින් මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ඇති කිරීම ඔහුගේ අදහසක් වන බව ප්‍රකාශ කිරීම පිළිබඳව විවිධ විද්වත් මතයන් වේ. ඒ තුළ සර් ජෝන් කොතලාවල විසින් පවසනු ලබන්නේ වෙනස්ම අදහසකි. ඔහු විසින් පෙන්වා දෙන්නේ මඩකලපුව තෙක් ඉදි කරන ලද නව දුම්රිය මාර්ගයේ මංගල ගමන සඳහා ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීවරු සමඟ එක්වන ඩී.එස් සේනානායකත් මින්නේරිය අසලදී දුම්රියෙන් බැස ඒ අසල පැවති කැළයට ගිය බවත් එහි දී ඔහුට මින්නේරිය වැව් බැම්මේ නටබුන් හමු වී ඇති බවත් එය දුටු සේනානායකයන් පැරණි ලක්දිව රජ දවස මෙන් පෙරදිග ධාන්‍යාගාරය බවට නැවත මෙරට පත් කිරීමේ අදහසින් පැරණි වැව් හා ඇළවල් ප්‍රතිසංස්කරණය කොට ප්‍රයෝජනයට ගැනීමේ අදහස ඔහු තුළ ඇති වූ බවත් මෙම අදහස සමඟ මින්නේරිය ගොවි ජනපද පිහිටුවීමේ අදහස ඩී.එස් සේනානායකත් තුළ ඇති වූ බවත් ය. සේනානායකයන්ගේ මෙම ප්‍රකාශනය මෙන්ම කොතලාවල විසින් ඒ පිළිබඳව ඉදිරිපත් කරන ලද අදහස් ද ප්‍රායෝගිකත්වයට පත් වූ අවස්ථාවක් වේ. ඒ මින්නේරිය ගොවි ජනපද පිහිටුවීමේ සැලැස්ම රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත ඉදිරිපත් කරමින් එහි දී ඒ සඳහා පැමිණි විරෝධතා මැඩ ගනිමින් ඩී.එස් විසින් ගෙන ගිය උත්සාහය යි. මෙලෙස මින්නේරිය ජනපද ඇති කිරීමේ පුරෝගාමියා ඩී.එස් බව පිළිනොගත් මතයන් ද ඉදිරිපත්ව ඇත. ඒ බර්නාඩ් අලුවිහාරේ විසින් සේනානායකයන්ගේ පුරෝගාමීත්වය ප්‍රතික්ෂේප කළ අවස්ථාවයි. ඔහු පවසන්නේ මින්නේරිය ව්‍යාපාරයේ මැවුම්කරු වශයෙන් ඩී.එස් හුවා දැක්වීම පුවත්පත් විසින් සිදු කරන ලද්දක් වන බවයි. මෙලෙස සේනානායකයන් ප්‍රතික්ෂේප කරනු ලබන අලුවිහාරේ විසින් අදහස් කරන්නේ මෙම මින්නේරිය ගොවි ජනපද ඇති කිරීමේ අදහස මුලින්ම ඇති වනුයේ 1892 දී වන බවයි. එහෙයින් ඩී.එස් මෙහි පුරෝගාමියා නොවන බවත් ඩී.එස් විසින් සිදු කරන ලද්දේ මෙම අදහසට නව පණක් ලබා දීම පණක් වන බවත් අලුවිහාරේ පවසයි.

මෙම සියලු කරුණු අධ්‍යනය කිරීමේ දී 19 වන සියවස මැද භාගයේ පමණ පටන් මෙරට ගොවි ජනපද ඇති කිරීම පිළිබඳ අවධානය යොමුව ඇති බව හඳුනා ගත හැකි වන අතර 1892 දී අනුරාධපුර දිස්ත්‍රික් ඉන්ජිනේරුවරයාගේ උපදෙස් මත උතුරු මැද පළාතේ වාරිමාර්ග මණ්ඩලය ජලය අපතේ යාම වළක්වා අක්කර 20 000 ක් පමණ වූ භූමියක් වගා කිරීමට ප්‍රමාණවත් ජලය රැඳවිය හැකි පිරිදි මින්නේරිය වැවේ සොරොව් ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරීමත් මින්නේරිය ගොවි ජනපද ඇති කිරීමේ ප්‍රායෝගික ක්‍රියාවලියේ වැදගත් සංධිස්ථානයක් වශයෙන් හඳුනා ගත හැක. ඒ වන විට මින්නේරිය වැව දැඩි ලෙස අබලන් තත්ත්වයකට පත්ව තිබූ බවට තොරතුරු සඳහන් වන අතර එහි සොරොව්ව ද ඒ වන විට කැඩී ගොස් වැව් ජලය පිටතට ගලා යන තත්ත්වයක පැවති බව සඳහන් වේ. මෙම තත්ත්වය හමුවේ යෝජිත ප්‍රතිසංස්කරණයන් වුදෙසා මධ්‍යම වාරිමාර්ග මණ්ඩලයේ අනුමැතිය හිමි වීමෙන් අනතුරුව 1894 දී අදාල ප්‍රතිසංස්කරණයන් මින්නේරිය වැව ආශ්‍රිතව සිදු කරන ලද බව තොරතුරුවල සඳහන් වේ. සර් ජෝන් කොතලාවලගේ ඩී.එස් පිළිබඳ අදහස බර්නාඩ් අලුවිහාරේ විසින් ප්‍රතික්ෂේප කිරීමට පදනම් වූ ප්‍රධානතම කරුණ වශයෙන් මින්නේරිය වැව ආශ්‍රිතව විශාල භූමි ප්‍රමාණයක් වගා කළ හැකි පරිදි ප්‍රතිසංස්කරණයන් සඳහා ගෙන ආ යෝජනාව මුලින්ම ඉදිරිපත් වීම අවධානයට ලක් කළ

නිසා වන බව මෙමගින් උපකල්පනය කළ හැකිය. එහි දී බර්නාඩ් අලුවිහාරේ විසින් මින්නේරිය වැව ආශ්‍රිතව සිදු කරන ලද ප්‍රතිසංස්කරණයන් හා එහි ජනපද ආරම්භ කිරීම යන කරුණු ද්විත්වය ම එකක් සේ සලකා කටයුතු කොට ඇති බව හඳුනා ගත හැක. මේ අයුරින් මින්නේරිය ආශ්‍රිතව සඳහන් වන තොරතුරුවලට අනුව 1933 ට පෙර මින්නේරිය වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු මෙන්ම එහි මහා පරිමාණයෙන් ඉඩම් වගා කිරීමට ද අසාර්ථක උත්සාහයක් ගෙන ඇති බව හඳුනා ගත හැක.

මේ අයුරින් වියළි කලාපය තුළ ජනපදකරණය දිගින් දිගටම අසාර්ථක වීමත් සමඟ මින්නේරිය යටතේ නැවත වරක් නව සැළැස්මක් සමඟ ගොවි ජනපදයන් ආරම්භ කිරීමට ඩී.එස් සේනානායකයන් විසින් කටයුතු කරන ලද බව සඳහන් වේ. එලෙස මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයට නව පණක් ලබා දීමට සේනානායකයන් විසින් කටයුතු කිරීම තුළ මින්නේරිය වැව ආශ්‍රිත ගොවි ජනපද පිහිටුවීමේ සංකල්පයේ නිර්මාතෘවරයා වශයෙන් ඔහු හැඳින්වීම ද වරදක් නොවන බව සිතිය හැක. ඉහතින් සඳහන් කළ පරිදි 1894 දී වැවේ කැඩී බිඳී ගිය සොරොව්ව ආදිය ප්‍රතිසංස්කරණය කරනු ලැබුව ද එය වැඩි කලක් නොපැවතී ප්‍රධාන සොරොව්වේ දොරටු අවහිර වී බිසෝ කොටුව ගිලා බැසීමට ලක් විය. මෙලෙස නැවත වරක් වැවේ ප්‍රධාන සොරොව්වට හානි වීමෙන් අනතුරුව නැවත වරක් අලුතින් සොරොව් 3ක් ඉදි කොට ප්‍රධාන සොරොව්වේ සිට ජලය ගෙන යාම උදෙසා සැතපුම් නවයක් දිග ඇළක් ඉදි කිරීමට සැළසුම් කරනු ලැබීය. එහි කටයුතු 1897 දී ආරම්භ කරනු ලැබුව ද අවශ්‍ය ශ්‍රමිකයන් ප්‍රමාණවත් පරිදි සපයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් එහි වැඩකටයුතු අවසන් කිරීමට 1903 දක්වා කාලය ගත විය. එහි දී සොරොව් දෙකක් පමණක් ඉදිකෙරුණු අතර යෝජිත ක්‍රියාවලියෙන් වැවේ වාන හා ඇළ මාර්ගයේ සැතපුම් හතරක් ඉදිකොට අවසන් කෙරීය. මෙසේ මින්නේරිය වැව සහ සොරොවුව, ඇළ මාර්ගය යනාදියේ ප්‍රතිසංස්කරණයන් අවසන් කළේ වුව ද ඒ යටතේ අලුතින් කුඹුරු අස්වැද්දීමට ආණ්ඩුව බලාපොරොත්තු වූ පරිදි ගොවීන් පොළඹවා ගැනීම පහසු කාර්යයක් නොවීය. ඊට අවශ්‍ය දිරි ගැන්වීම්, මාර්ග ඉදි කිරීම, ඉඩම් පවරා දීම මෙන්ම එම ඉඩම්වල දැව ප්‍රයෝජනයට ගැනීම් ආදිය ද සැළැස්මකට අනුව සිදු කිරීමට එවක පාලනය කටයුතු කරන ලදි. මෙම කටයුතුවල කළමණාකරු වශයෙන් පත්වන ලද ඒ. ඊ. බර්ඩ් යටතේ සමාගමට ලබා දුන් ඉඩම් අක්කර 250 බැගින් බෙදා එක් කොටසකට ජනපද නිලධාරියෙකු බැගින් පත් කොට සංවර්ධන ක්‍රියාවලිය සිදු කළ ද වර්ෂයේ අවසන ඇති වූ වර්ෂාව සමඟ සියල්ල අඩාල විය. ඒ සමඟ ගමනාගමනයට බාධා ඇති වීම, මැලේරියාව පැතිරීම මෙන්ම වගා බිම් වන සතුන් විනාශ කිරීම ආදිය සමඟ ජනපද ව්‍යාපාරය අසාර්ථක විය. ඒ අතර ඉන්දියාවෙන් ශ්‍රමිකයන් ගෙන්වා ඉඩම් වගා ඇරඹීමට සූදානම් වුව ද සිංහල රජ දවස පැවති සමෘධිය නැවතත් ලගා කර ගැනීමේ ජාතික හැඟීමෙන් යුතුව මින්නේරිය යටතේ ඉඩම් වගා කිරීමේ යොජනාවක් ලංකා මහජන සභාව විසින් ඉදිරිපත් කරනු ලැබීය. නමුත් එය ද අසාර්ථක විය.

මින්නේරිය වාරි කර්මාන්තය හා බැඳී පවතින මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයේ තවත් වැදගත් අවස්ථාවක් වශයෙන් 1923 වසරේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මින්නේරිය වැව යටතේ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය හා ඉඩම් සංවර්ධනය පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීම හඳුනා ගත හැකිය. මෙම සමීක්ෂණයේ දී මින්නේරිය වැවේ පවතින්නා වූ ජල ධාරිතාව පිළබඳව මෙන්ම වැව පදනම් කර ගනිමින් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය පිළිබඳව ද අධ්‍යනය කළ බව සඳහන් වේ. ඒ යටතේ විශේෂයෙන් මින්නේරිය වැව යටතේ පෝෂණය වීමට යෝජිත කුඹුරු ඉඩම් සඳහා ජලය සපයන වාරි මාර්ග පද්ධතිය කුමන ආකාරයකින් සකස් විය යුතු ද යන්න පිළිබඳව වැඩි අවධානයක් යොමු කොට ඇත.ඉන් අනතුරුව නැවත වතාවක් 1931 වාරිමාර්ග සමීක්ෂණයක් සිදු කළහ. එමගින් මේ ආශ්‍රිත ඉඩම් කොටස් කිරීම සිදු කරන

ලද අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද සමීක්ෂණය ඔස්සේ ලබා ගත් තොරතුරු ජනපද ව්‍යාප්ත කිරීමේ කාර්යය සඳහා බෙහෙවින් උපකාරී වූ බව සත්‍යයකි. මින්නේරිය වැව හුදෙක් ජලාශයක්ම පමණක් නොවේ. එමගින් ගිරිතලේ, කන්තලේ, කවුඩුලු වැව ආදී වැව්වලට ද ජලය සැපයීමේ කාර්යය සිදු කරන ලදි. එහෙයින් මින්නේරිය වැව ජලය ගබඩා කිරීම මෙන්ම ජලය සැපයීමට ද වැදගත් වන්නක් වශයෙන් හඳුනා ගත හැක. මේ අයුරින් විවිධ බාධක මධ්‍යයේ ඇති වන්නා වූ මින්නේරිය ගොවි ජනපදවල ආරම්භක අවධිය තුළ මින්නේරිය වැවේ ජලය උපයෝගී කර ගනිමින් වගා කළ ප්‍රමාණය පැරණි ගමේ අක්කර එකසිය හැත්තෑවක ප්‍රමාණයක් බව සඳහන් වේ. ඒ හැරුණු විට පැරණි ගමේ සිට අක්කර විස්සක  දුරින් පිහිටා තිබුණු කුඩා පැරණි ගම්වල අක්කර තුන්සිය පනහක් පමණ මින්නේරිය වැවේ ජලය යොදා ගනිමින් වගා කටයුතු සිදු කරන ලද බව හඳුනා ගනී. මේ අයුරින් මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කිරීමේ ක්‍රියාවලියේ ආරම්භක උත්සවය සිදු වුයේ 1933 අප්‍රේල් 30 වන දින වන අතර වර්තමාන දියනබුබුල බෝධිරුක්ඛාරාමය අසල දී එවක වැඩ බලන ඇමතිව සිටි සර් ජෝන් කොතලාවල මහතා විසින් මීට අදාල පළමු පස් පිඩැල්ල කැපීම සිදු කරන ලදි. ඉන් අනතුරුව කැළෑ එළි පෙහෙළි කොට නව නිවාස ඉදි කිරීම ආරම්භ කරන ලද අතර එම නිවාස සාදා නිම කරන තෙක් මෙම ජනපදිකයින් වුදෙසා හතමුණ දුම්රිය ස්ථානය අසළ ඉදි කරන ලද මඩු දෙකක නවාතැන් පහසුකම් ලබා දෙනු ලැබීය. ගොවි ජනපද ඇති කිරීමේ ආරම්භක අවස්ථාවේ දී මුහුණ පෑමට සිදු වූ සෞඛ්‍යමය ගැටලුවලට නිවැරදිව මුහුණ දෙමින් මෙම අවස්ථාවේ නවාතැන් සඳහා ඉදි කරන ලද වාඩි ඇතින් පිහිටුවීම මෙන්ම ඉන් එක් වාඩියක මැලේරියා උවදුර නොතිබුණ දිස්ත්‍රික්කවලින් පැමිණි ජනයන් ද අනෙක් වාඩියේ මැලේරියා උවදුර තිබුණු දිස්ත්‍රික්කවලින් පැමිණියවුන් ද වෙන් කොට නවාතැන් ලබා දීම තුළ මින්නේරිය වැව ආශ්‍රිත ජනපද ඇති කිරීම තුළ සිදු වූ අඩුපාඩු අවම කර ගනිමින් ගොවි ජනපද ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට අවසන අවස්ථාව උදා විය. ඒ අනුව මින්නේරිය වැව පදනම් කර ගනිමින් මුල්ම ජනපදය ආරම්භ වන ලද්දේ හතමුණ දුම්රිය නැවතුම අසල භූමියක වේ. මෙලෙස ආරම්භ වන ජනපද ක්‍රමයෙන් දුම්රිය මාර්ගය හා මින්නේරිය පටන් ඒ දෙසට දිවෙන මාර්ගය හමු වන ස්ථානයන් තෙක්ම පැතිර යාම කාලයත් සමඟ සිදු විය. මෙම ස්ථානය පසුකාලීනව හිඟුරක්ගොඩ ලෙස නම් කළ අතර එය ජනපද කටයුතුවල මධ්‍යස්ථානය බවට පත් විය. මෙලෙස ජනපදය වර්ධනය වීමත් සමඟ හිඟුරක්ගොඩ නගරය වර්ධනය වීම ද ක්‍රම ක්‍රමයෙන් ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය කරමින් ඩිස්පැන්සරියක්, මාතෘ හා ළදරු ඒකකයක්, පාසලක් යනාදිය මෙන්ම ජනපද ඇති කිරීමේ දී මුල් කාලයේ දී බලපෑ ගමනාගමන පහසුකම් සංවර්ධනය කරමින් මාර්ග පහසුකම් ඇති කිරීම ද සිදු කරන ලදි. මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය මෙසේ සිදු විය.

**නිගමනය.**

මෙරට ගොවි ජනපද ව්‍යාපාරය පිළිබඳව අධ්‍යනය කිරීමේ දී වඩා වැදගත් තැනක් ගනු ලබන මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය තුළ ගැටලුකාරී තත්ත්වයන් රැසක් හඳුනා ගත හැකි වුව ද පසු කාලීනව එම තත්ත්වයන් සියල්ලක් ම පාහේ මගහරවා ගනිමින් සාර්ථකත්වයට පත් විශිෂ්ඨ ගණයේ ජනපද ව්‍යාපාරයක් වශයෙන් මින්නේරිය වැව ආශ්‍රිතව සිදු කරන ලද මෙම ගොවි ජනපද ව්‍යාපාරය හඳුනා ගත හැක. විශේෂයෙන් ආරම්භක අවස්ථාවේ දී එවක පාලකයින්ගේ අනවබෝධය හේතුවෙන් මෙහි බොහෝ කාර්යයන් අසාර්ථක වී ඇති බව මෙම කරුණු අධ්‍යනය කිරීමේ දී අනාවරණය අතර මුල් කාලීනව පැවතියා වූ දුර්වල තත්ත්වයන් මඟහරවා ගනිමින් ඒ ආශ්‍රිත ජනයාට ද වැඩි ප්‍රතිලාභ ප්‍රමාණයක් හිමි කර දෙමින් සාර්ථක ව්‍යාපෘතියක් වශයෙන් මින්නේරිය ගොවි ජනපද

ව්‍යාපාරය ක්‍රියාත්මක වූ බව අවසන් වශයෙන් හඳුනා ගත හැක. එහෙයින් මෙරට ඇති කරන ලද පළමුවන සාර්ථක ගොවි ජනපදය වශයෙන් මින්නේරිය ගොවි ජනපදය හැඳින්වීමෙහි කිසිදු වරදක් නොවන බව මනාව පසක් වනු ඇත.

**පරිශීලන**

කරුණානන්ද, යූ.බී. 1991***, තමන්කඩුව* 1815-1900.** කැලණිය, කර්තෘ ප්‍රකාශනයකි.

Brohier, R.L (1998) ***The Tamankaduwa district and the Elehera – Minneriya canal.*** Colombo.

## 28. වියළි කලාපය ආශ්‍රිත තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිය පිළිබඳ විමර්ශනයක්.

පී.එම්.එස්. සෙනෙවිරත

### හැඳින්වීම

අහසින් වැටුණු එකඳු දිය බිඳුවක් අපතේ නොයවන රටක් ලෙස ශ්‍රී ලංකාව අතීතයේ පටන් මනා කළමනාකරණයකින් යුතු වාරි මාර්ග පද්ධතියකට හිමිකම් කියනු ඇත. කෘෂිකර්මාන්තය තම ප්‍රධාන ජීවනෝපාය කරගත් අතීත ලාංකිකයින් ජලය සමඟ පවත්වන්නේ ඉතාමත් සමීප සම්බන්ධතාවයකි. දේශගුණික තත්වයන් කිහිපයක් හඳුනාගත හැකි මෙරට තුළ වියළි කලාපයයේ ජල අවශ්‍යතාවය බොහොමයක් සපුරාලන්නේ වර්ෂා ජලය මඟිනි. කාලගුණික හේතූන් මත වසර පුරාවටම වර්ෂාව නිශ්චිත නොවන අතර වියළි කාලවලදී ජල අවශ්‍යයතාවය සපුරා ගැනීමට ජල කළමනාකරණය යොදා ගැනේ. ජල ඒකකයකින් නාස්තියකින් තොරව උපරිම අස්වැන්නක් ලබාගත හැකි ආකාරයේ ක්‍රමානුකූල භාවිතය ජල කළමනාකරණය ලෙස හඳුනාගත හැක. මෙහි දී ශ්‍රී ලංකාව තුළ හඳුනාගත හැකි විශිෂ්ටම මානව නිර්මාණය වන්නේ 'වැව' යි. මේ අනුව වර්ෂා ජලය ගබඩා කරගැනීම සඳහා නිර්මාණය වූ වැව් විශාල ප්‍රමාණයක් වියළි කලාපය පුරා ව්‍යාප්තව ඇත.

මහ වැව් මෙන්ම කුඩා වැව් හෙවත් ග්‍රාමීය වැව් ගණනාවකින් සැදුම්ලත් මෙම ජල කලමනාකරණ පද්ධතිය හුදකලා වූවක් නොවන අතර එකිනෙකට සම්බන්ධව පවතින පොකුරු වශයෙන් පවතී. අතීත මුතුන් මිත්තන්ගේ දැනුම් සම්භාරය කැටිකොට ගත් මෙම සාම්ප්‍රදායික ජල කළමනාකරණ පද්ධතිය තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිය ඇතැම් විද්වතුන් එල්ලංගා පද්ධතිය ඃිස්ජාැ ී හිඑැප* ලෙස ද හඳුන්වනු ලැබේ.

### ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු රැස්කර ගැනීමේ දී මූලික වශයෙන්ම ග්‍රන්ථ, ලිපි සහ අන්තර්ජාල පරිශීලනය සිදු කරන ලදී. වියළි කලාපය ආශ්‍රිතව හඳුගත හැකි තිරස් ජාලගත වැව් පද්ධතිය පාදක කරගනිමින් සිදුකර ඇති මෙම අධ්‍යයනයේ දී තිරස් ජාලගත වැව් පද්ධතිය ආශ්‍රිත තාක්ෂණය, පරිසර පද්ධතිය සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සාධක පිළිබඳව අවධානය යොමු කිරීම අරමුණු විය.

### විමර්ශනය

වියළි කලාපයේ කෘෂිකර්මාන්තය පදනම් කරගනිමින් නිර්මාණය වන්නා වූ තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිය හැඳින්වීම සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් Cascade යන වචනය භාවිත වේ. මෙම නාමය මුලින් ම ආචාර්යය සී. ආර් පානබොක්කේ මහතා විසින් Small Village Tank Systems of Sri Lanka: Their Evolution, Setting, Distribution, and Essential Functions යන කෘතියෙහි භාවිත කර ඇත. මෙම වචනය උතුරු ඇමරිකාවේ රොකී කඳුබෑවුම්වල නිර්මාණය වී ඇති දියදහරාවල් හැඳින්වීම සඳහා යොදාගනී. සිංහල භාෂාවෙන් මෙම ජලාපවහන රටාව හැඳින්වීම සඳහා යොදාගන්නා නාමය එල්ලංගා පද්ධතිය නම් වේ. මෙම 'එල්ලංගා' යන නාමය භාවිත කර ඇත්තේ ආචාර්ය එම්. යූ. ඒ. තෙන්නකෝන් විසින් 2000 වර්ෂයේ දී ය. මෙම වචනය ගැමි වහරින් ''ගාවින්ගාවට යාන්තමින් එල්ලා වැටෙන තැන් (වාන්) සහිත දියපාර" යන අර්ථය සහිත ය. ඉන් පසුව මහාචාර්යය චන්දන රෝහණ විතානාච්චි මහතා විසින් මෙම ජලාප්‍රවාහන පද්ධතිය සඳහා සුදුසුම නාමය ලෙස 'තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිය' යන නාමය ඉදිරිපත් කර ඇත. එමෙන්ම තිරස් ජාලගත ග්‍රාමීය වැව් පද්ධතිය පිළිබඳව මහාචාර්යය මද්දුමබණ්ඩාරයන් බහුලව අධ්‍යනයන් සිදුකර ඇත. ශ්‍රී

ලංකාව තුළ පමණක් දැකගත හැකි මෙම දියුණු ජලපවහන පද්ධතියේ ඇති වැදගත්කම නිසාම 2018 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (United Nations Food and Agriculture Organization -FAO) විසින් ලාංකීය තිරස් ජාලගත වැව් පද්ධතිය ගෝලීය වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ කුඩා ග්‍රමීය වැව්වලින් 80%ක් පවතින්නේ පොකුරු වැව් හෙවත් එල්ලංගා පද්ධති ලෙසටයග ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම අනුව ප්‍රධාන වැව් තිරස් ජාලගත වැව් පද්ධති කලාප ත්‍රිත්වයකි.

1 උතුරු උතුරුමැද කලාපය
2 වයඹ කලාපය
3 රුහුණු කලාපය

එම කලාප ත්‍රිත්වයයිග එල්ලංගා පද්ධතිවලින් සියයට 90ක්ම මෙම කලාප ත්‍රිත්වයට අයත්වනු ඇත. ටිවියළි කලාපයේ හඳුනාගත හැකි මෙම ජලාපවහාන පද්ධතිය කිසිසේත්ම හුදකලා වූ පද්ධතියක් නොව. මෙය කුළු වැව්, ග්‍රාමීය වැව්, විශාල වැව් සහ ඇළ මාර්ග ආදියෙන් සමන්විතව ඇත. තිරස් ජාලගත වැව් පද්ධතියක ඉහළින්ම පවතින වැවට ජලය ලැබෙන ඇළ මාර්ගය මූලික ජල ප්‍රභවය ලෙස හඳුන්වනු ඇත. එමෙන්ම එක් වැවක් පෝෂණය වන ප්‍රදේශය ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශය ලෙස හැඳින්වේ. එක් වැවක සිට ඇළ මාර්ග ඔස්සේ තවත් වැවකට ජලය සැපයෙන අතර එම ඇළ මාර්ග අතර වැවෙන් පහළ ජලය ලබාගත හැකි කොටසේ කුඹුරු අස්වැද්දීම සිදු වේ. ඒ අනුව සරලව ගත් කළ මේ තුළින් සිදුවන්නේ එක් වැවකින් ඉවත්වන අතිරික්ත ජලය සහ කෘෂිකර්මාන්තය සඳහා භාවිත කරන ලද ජලය නැවත පරිභෝජනය කිරීමකි. තිරස් ජාලගත වැව් පද්ධතියක සැකැස්ම පහත රූප සටහනින් දක්වා ඇත.




රූපය 01:තිරස් ජාලගත වැව් පද්ධතියක සැකැස්ම

ආචාර්ය පී. බී. ධර්මසේනයන් පවසන්නේ තිරස් ජාලගත වැව් පද්ධතියක් තිරසාර පදනමක් මත මානවයා මැදිහත් වීමෙන් ජලය පස වාතය හා වෘක්ෂලතා ආදිය මානව ශාක සහ සත්ත්ව ප්‍රජාවන්ගේ මූලික අවශ්‍යතා සපුරමින් වියළි කලාපීය හුරුපනයේ ක්ෂුද්‍ර පෝෂක ප්‍රදේශ තුළ සංවිධානය වූ  භූමි හා ජල සම්පත්වලින් හෙබි පාරිසරික පද්ධතියක් ලෙස ය.

ශ්‍රී ලංකාව විවිධ වූ දේශගුණික සහ කාලගුණික තත්වයන්ගෙන් හෙබි ප්‍රදේශයන්ගෙන් සමන්විත රටකි. මෙරට වාර්ශික වර්ෂාපතනය අතින් ගත් කළ අඩු වර්ෂා කාලයක් සහිත ය. සාමාන්‍යයෙන් මෙරට වාර්ශික වර්ෂාපතනය ගත්කළ මිලිමීටර් 1750ක් පමණ වන අතර වාර්ෂික වාශ්පීකරණය මිලිමීටර් 1290ක් පමණ වනු ඇත.  එමෙන්ම මෙරට කෘෂිකර්මාන්තය බහුලව ව්‍යාප්තව ඇත්තේ වියළි කලාපීය ප්‍රදේශයන්වල ය. වියළි කලාපීය ප්‍රදේශන්වල ජනතාව තම ජල පරිභෝජන අවශ්‍යතාවය වැඩි වශයෙන් සපුරාගනු ලබන්නේ වර්ෂා ජලයෙනි. මෝසම් සුළං අවස්ථා දෙකක දී ලැබෙන වර්ෂා ජලය මේ සියලු කටයුතු සඳහා උපකාර කරගනී.  මෙම කෘෂිකාර්මික අවශ්‍යතාවයත් එදිනෙදා පරිභෝජන අවශ්‍යතාවයත් පෙරදැරි කරගෙන අතීතයේ විසූ ජනයා වර්ෂා ජලය ගබඩාකර ගැනීම සඳහා වැව නිර්මාණය කර ඇත. වැවට එක් රැස්වන ජලය මනා කළමනාකරණයකින් යුතුව ප්‍රයෝජනයට ගැනිම සඳහා තිරස් ජාලගත වැව් පද්ධතිය මහත් සේ උපකාර වනු ඇත. එල්ලංගා පද්ධතියක ඇති උපයෝගීතාවය කෙබඳු ද යත් මෙය රජරට වාරි තාක්ෂණයේ හදවත බඳුය.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිශ්පාදනයට විශාලතම පදනම වන මෙම ග්‍රාමීය වැව් කෘෂි ජෛව විවිධත්වය, වන සත්ව සහ තුරුලතා ජෛව විවිධත්වය සඳහා සුවිශේෂි උරුමයකට හිමිකම් කියන අතර ස්වාභාවික විපත් සහ දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තු දෙන අද්විතීය ස්වාරක්ෂකයක් ලෙස ද ක්‍රියාකරයි. තිරස් ජාලගත වැව් පද්ධතිය හා සම්බන්ධ වැව් පද්ධතිය තුළ ජලය රඳවා ගැනීම හේතුවෙන් ජල ගැලීම් පාලනය කර ගැනීමට  ද, ඒ වටා නිර්මාණය වී ඇති පරිසර පද්ධතිය නිසා ජල හානිය අවම කරමින් නියගයට මුහුණ දීමේ හැකියාව ඇතිකර ගැනීමට ද ස්වාභාවික ආපදාවන්ගේ කම්පනයන් උකහා ගැනීමට ද ප්‍රායෝගික විසඳුමක් වැව්වලින් සපයනු ඇතග තිරස් ජාලගත වැව් පද්ධතියක් යනු නිරන්තරයෙන් ජලය රැඳෙන පද්ධතියකි. ඒ හේතුවෙන් භූගත ජල මට්ටම ද ඉහළ යන අතර උල්පත්වල ජලය ද වැඩි කාලයක් ආරක්ෂාකර ගත හැක. එමෙන්ම තිරස් ජාලගත වැව් පද්ධතියක විශාලම සේවය සිදුවන්නේ කෘෂිකර්මාන්තයට ය. පසේ වැඩි කාලයක් ජලය රැඳීම හේතුවෙන් පසේ ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය සිදුවන අතර මොවුන් විසින් පසට එකතුවන ශාක හා සත්ත්ව කොටස් ජීර්ණය කරමින් පසට ස්වාභාවිකව පොහොර ලබා දී පස සරුසාර කරනු ඇතග ස්වාභාවික පරිසරය හා මන් ගණුදෙනුවකින් යුතුව නිර්මාණය කර ඇති මෙම ජලාප්‍රවාහන පද්ධතිය සැබැවින්ම අපූරු නිමැවුමකි. මෙම ජලාපවහන පද්ධතිය ස්වාභාවික ජල පෙරණයක් ආකාරයෙන් ද ක්‍රියාත්මකවනු ඇත. තිරස් ජාලයත වැව් පද්ධතිය තුළ ඒ වටා නිර්මාණය වූ සුවිශේෂී පරිසර පද්ධතියක් හඳුනාගත හැක. විවිධ ශාක මෙන්ම විවිධ සත්ත්ව ප්‍රජාවන්ගෙන් සමන්විත පුළුල් ජෛව විවිධත්වයක් මෙම ජලාප්‍රවාහන පද්ධතිය හා බැඳී පවතී.

### ගස්ගොම්මන (TreeBelt)

ගස්ගොම්මන විශේෂයෙන්ම ඉහත දී සඳහන් කරන ලද ජල පෙරණයක් ලෙස ක්‍රියාත්මක වේ. වැවක ජලය පිටාර මට්ටමට පැමිණි විට පමණක් ජලය රදා සිටින වැවේ ඉහළ කොටසේ ස්වාභාවිකව නිර්මාණය වී ඇති වෘක්ෂලතා සහිත ප්‍රදේශය ගස්ගොම්මන ලෙස හදුනාගනී. විශේෂයෙන්ම මෙම කලාපයේ හඳුනාගත හැකි ශාකයන් ජලයේ පාවී ආ බීජයන්ගෙන් රෝපණය වූ ශාකයන් ය. පහලින් ලන්ද පිහිටා ඇති අතර මෙම කලාපය තුළ බහුළ වශයෙන් පහත සඳහන් වෘක්ෂයන් සහ වැල් වර්ග දැකගත හැක.

➢ ශාක වර්ග

- කුඹුක්
- නාඹඩ
- දඹ
- මයිල

➢ වැල් වර්ග

- බොකල
- එලිපත්ත
- කළවැල්

මෙම ස්වාභාවික වෘක්ෂලතා කලාපය ප්‍රයෝජන රැසක් ලබාදෙන්නා වූ කලාපයකි. වැවේ ජලය සඳහා සුළං බාධකයක් ලෙස මෙම කලාපය ක්‍රියාකරයි. වියළි කලයේ දී වැවේ ජලය සෞම්‍ය මට්ටමේ පවත්වා ගනිමින් වාෂ්පීකරණය අවම කිරීමට ගස්ගොම්මන උපකාරී වේ. මෙම කලාපයේ බහුලව වර්ධනය වන කුඹුක් ශාකයන්ගේ මුල් වැව් ජලයේ ජීවත්වන මත්ස්‍ය පරම්පරාවට මනා වාසස්ථානයකි. ජල පෙරණයක් ලෙස ක්‍රියාත්මක වීමේ දී ඉහළින් ගලා එන ජලය සමඟ එන රොන්මඩ ආදිය තැන්පත් වීම සිදුවේ. මෙම කලාපය සත්ත්ව ජනාවාස සහ මානව ජනාවස වෙන් කරන මායිමක් ලෙස ද ක්‍රියාත්මක වීම සත්ත්ව ප්‍රජාවට මිනිසුන්ගෙන් ඇතිවන බලපෑම අවම කිරීමට ද හේතු වී ඇත.

**කට්ටකඩුව (Interceptor)**

වැව් බැම්මට පහළින් ද කුඹුරු යායට ඉහළින් ද පිහිටා ඇති මෙම ප්‍රදේශය රක්ෂිත භූමියකි. මෙහි ක්ෂුද්‍ර දේශගුණ පරිසර ත්‍රිත්වයක් හඳුනාගත හැක. ඒවා නම්,

- වතුර වල (Water hole)
- තෙත් බිම් (Wetland)
- වියළි උස් බිම් (Dry upland) වේ.

මෙම පරිසරය තුළ හඳුනාගත හැකි මෙම විවිධත්වය හේතුවෙන් ම විවිධ ශාක වර්ග මෙන්ම එම ශාකයන් හොඳින් වර්ධනය වීමට අවශ්‍ය සාධකයන් නිර්මාණය වී ඇත.

තාක්ෂණිකව මෙම කට්ටකඩුව නිර්මාණය කිරීමේ දී වැව් බැම්මේ පළලට සමාන පළලකින් යුතුව නිර්මාණය කර ඇත. මෙම ශාක සහිත කලාපයක් නිර්මාණයේ ප්‍රධාන අරමුණ වන්නේ ජලයේ ඇති ලවණ අවශෝෂණය කර ගැනීමයි. ජලයේ ඇති ලවණ සහ ලෝහ මිශ්‍ර අයන ඉවක් කර කුඹුරු සඳහා ජලය ලබා දෙන අතර එය යතුරුවල ලෙස ද හඳුන්වයි. විවිධ ශාක වර්ගයන්ගෙන් සමන්විත වීම හේතුවෙන් ශක්තිමත් මුල් පද්ධතියකින් ද සමන්විත මෙම ප්‍රදේශය වැව් බැම්මේ ආරක්ෂාවට ද වැවෙන් පහළ ප්‍රදේශයේ සුළං බාධකයක් ලෙස ද ක්‍රියා කරයි. මෙම කලාපයේ ඇති කුඹුක් වැනි ශාකයන ජලයේ ඇති ලවණ අවශෝෂණය කරගනිමින් පිරිසිදු ජලය ලබා දෙන අතර පුරාණ ගැමියන් පානීය ජලය ලබා ගෙන ඇත්තේ මෙම ප්‍රදේශයෙනි. වැව් බැම්ම ඉහළ ප්‍රදේශයේ වැටකෙයියා ශාකය දැකගත හැක. කට්ටකඩුව තුළින් ගැමියන්ගේ එදිනෙදා අවශ්‍යතා බොහෝමක් සපුරා දෙනු ඇත. ගැමියන්ට අවශ්‍ය දර, දැව, මෙන්ම ආහාරයට ගත හැකි දේ ද මේ තුළින් සපයා ගත හැක.

**පෝටාවැටිය සහ ඉස්වැටිය (Check dams and soil ridges)**

ඉහළ ප්‍රදේශවල සිට වැවට එන ජලයේ අවසාදිත රඳවා ගැනීම සඳහා මෙම අංගයන් උපකාර වේ. මෙම ප්‍රදේශය තුළ වැවේ ජලය උපරිම කාලයන් හි දී ජලය රඳවා ගනිමින් වියළි කාලයේ දී ක්‍රමයෙන් වැවට එම රඳවාගත් ජලය ලබා දේ. මෙම කලාපය රොන්මඩ සහිත කලාපයක් වන අතර මෙය අර්ධ ජලජ ශාක සහ සත්ත්ව ප්‍රජාවට හොඳ වාසස්ථානයකි. මෙම ජලාප්‍රවාහන පද්ධතිය හුදකලා නොවූ පද්ධතියක් ලෙස ඉහත දී ද සඳහන් කර ඇති අතර මේ හා සබන්ධව පුළුල් ක්‍රියාවලියක් හඳුනාගත හැක. වියළි කාලය වන විට මහා වැවේ ජලය ආරක්ෂාකර ගැනීම සඳහා කුළු වැව් හෙවත් උල්පත් වැව් උපකාරී වේ. එමෙන්ම තිරස් ජාලගත වැව් පද්ධතියට අයත් කිවුල් ඇළ පොදුවේ ජලය ලබා දෙන පැරණි ස්වාභාවික ජල මාර්ගයකි. මෙම ඇළ ආශ්‍රිතව ගොඩනැගී ඇති පරිසරය සත්ත්ව ප්‍රජාවට කදිම නිජබිමකි. විශේෂයෙන්ම මෙම ඇළ කුඩා මත්ස්‍යයින්ට වාසස්ථානයකි.

යතෝක්ත කරුණු අනුව ශ්‍රී ලංකාවේ පැරණි වාරි තාක්ෂණය ඉතාමත් දියුණු තාක්ෂණයක් බව වැටහේ. විශේෂයෙන්ම අපේ ආදි මුතුන් මිත්තන් තම කාර්යයන් සඳහා පරිසරය වෙනස් කළ ද ස්වාභාවිකත්වයට හානි නොවන ආකරයෙන් පරිසරය සමඟ මනා ගනුදෙනුවක් පවත්වා ගනිමින් තම අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කර ඇත. එයට කදිම නිදසුනක් ලෙස පැරැන්නන් විසින් නිර්මාණය කරගත් එල්ලංගා පද්ධතිය හඳුන්වා දිය හැක. තම කෘෂිකාර්මික දිවි පෙවත පවත්වාගෙන යාම උදෙසා නිර්මාණය කරගත් මෙම ජලාප්‍රවාහන පද්ධතිය තුළ ස්වාභාවික පරිසරයට හානි නොවන ආකාරයෙන් මිනිසාටත් සත්ත්ව ප්‍රජාවටත් ජීවත්විය හැකි ආකාරයෙන් ගොඩනගා ගෙන ඇත.

මෙම ජලාප්‍රවාහන පද්ධතිය විවිධ වූ ප්‍රයෝජනයන් රැසක් අත්කර දෙන්නාවූ පද්ධතියක් ලෙස ද හඳුන්වාදිය හැක. වියළි කලාපය යනු වර්ෂාව අවම කලාපයන් වන අතර එම ප්‍රදේශයන්ගේ සශ්‍රීක බව රඳවා තබා ගැනීමට මෙම ජලාප්‍රවාහන පද්ධතිය රුකුලක් වී ඇත. සැබැවින්ම අහස් ජලය රඳවා තබා ගැනීමට වැව පමණක් ඉදිකළානම් වර්තමානයේ අපට මෙතරම් කතා කිරීමට සශ්‍රීකවත් රටක් හෝ විශිෂ්ට වාරි තාක්ෂණයක් නොතිබෙන්නට හැක. මන් ද යත් වැව ඉදිකළ පමණින් ගොවිතැන් කිරීමට හැකියාවක් නොමැත. ඒ හා සම්බන්ධව ජලය නිසි පරිදි කළමණාකරනය කරගනිමින් පරිභෝජනය කළ යුතු ය. එම නිසි පරිදි ජල කළමනාකරණය එල්ලංගා පද්ධතියක් තුළින් මැනවින් සිදු වේ. තිරස් ජාලගත වැව් පද්ධතිය නිර්මාණයේ දී වියළි කලාපයේ දී මහවැවේ ජලය අවම කාලයේ දී එහි ජලය ආරක්ෂා කරගනිමින් ඒ වටා ඇති පරිසරය නිසි පරිදි පවත්වගෙන යන්නේ කෙසේ ද යන්න කෙරෙහි ද අවධානය ලබා දී ඇත. මේ අනුව බලන කළ සැබැවින් ම පුරාණ හෙළ වාරි තාක්ෂණය විශ්ෂට තාක්ෂණයක් බව කිව හැක. මීට සියවස් ගණනාවකට පෙර නිර්මාණය වූ හෙළ වාරි තාක්ෂණය අදටත් රජරට ගොවීන් තම කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගනී. වර්තමානයේ දීත් මෙරට වියළි කලාපයේ කෘෂිකාර්මික කටයුතු සිදුවන්නේ වැවෙන් ලබාගන්නා ජලයෙනි.

පුරාණ මුතුමිත්තන් විසින් පරිසරය සමඟ ගනුදෙනු කර ඇත්තේ ඉතාමක් අරපරෙස්සමෙනි. තමන්ට අවැසි ආකාරයෙන් පරිසරය නිර්මාණය කරගත් නමුත් පරිසරයේ සමතුලිතතාවයට හානිවන ආකාරයෙන් ක්‍රියාකර නොමැත. නමුත් වර්තමානයේ එම තත්වය හඳුනාගත නොහැකි වන හෙයින් ඒ වටා ගොඩනැගී ඇති පරිසරයට හානිකර තත්වයන් උදාවිය හැක.

**නිගමනය**

වියළි කලාපයේ හමුවන තිරස් ජාලගත වැව් පද්ධතිය ගෝලීය වශයෙන් වැදගත්කමක් හිමිකරගන්නා හෙයින් එම තාක්ෂණය අප විසින් තවදුරත් ආරක්ෂා කරගත යුතු ය. වර්තමානයේ ලංකාව පුරා ඇති වැව් ප්‍රතිසංස්කරණය කරමින් එම උරුමය ආරක්ෂා

කරගැනීමට කටයුතු කරන බව දැකගත හැක. අතීතයේ පටන් වර්තමානය දක්වා ඒ අකාරයෙන්ම අඛණ්ඩව පවත්වාගෙන එමින් අදටත් රජරට ගොවීන්ගේ කෘෂිකාර්මික කටයුතු සාරවත් කරන තිරස් ජාලගත වැව් පද්ධතිය හෙවත් තිරස් ජාලගත වැව් පද්ධතිය ශ්‍රී ලාංකේය උරුමයක් වශයෙනුත් තිරසාර ග්‍රාමීය සංවර්ධනයක් උදෙසාත් සුරක්ෂිත කරගනිමින් ඉදිරියටත් පවත්වාගෙන යාම අත්‍යවශ්‍යය වනු ඇත.

**පරිශීලන.**


දේවින්ද, ආර්. එම්. එස්., (2020). ***මැඩියාව එල්ලංගාව පිළිබඳව වාරි පුරාවිද්‍යාත්මක විමසුමක්.*** *පුරාවිදූ වැලිපිල.* පළමු වෙළුම පළමු කාණ්ඩය. පිටු අංක 15-19.

විතානාච්චි, සී. ආර්., 52, මහාචාර්යය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය. 2022/01/20.

විජේරත්න, වී. පී. අයි. එස්. (nd). ***ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ජල කළමනාකරණය හා ජෛව විවිධත්වය.***

ගුණසේන, චන්දිම. (2018). ***ලංකාවේ වියලි කලාපයේ සිදුවන මානව ජනපද ව්‍යාප්තිය නිසා එල්ලංගා පද්ධයට සිදුවන පාරිසරික බලපෑම හා නව ආකාර මානව ජනපදයක අවශ්‍යතාවය.*** https://www.researchgate.net/publication/328969143 [2022 ජනවාරි 06].

අද දෙරණ. (2018). ***එල්ලංගා ගම්මාන ක්‍රමවේය ලෝක කෘෂිකාර්මික උරුමයක් ලෙස නම් කරයි.*** http://sinhala.adaderana.lk/news.php?nid=87766 [2022 ජනවාරි 06].

රත්නායක, සුලක්ෂි. (2019). ***වියළි බිම් අස්වද්දන එල්ලංගා වාරි පද්ධතිය.*** https://www.dinamina.lk/2019/06/12 [2022 ජනවාරි 06].

ධර්මසේන, පී. බී. (2018). ***ලෝක උරුමයක් වූ වැව් එල්ලංගා පද්ධති.*** http://www.vidusara.com/2018/11/07/feature7.html [2022 ජනවාරි 06].

Geekiyanage, Nalaka and Pushpakumara, D.K.N.G. (2013). ***Ecology of ancient Tank Cascade System in island Sri Lanka.*** *Journal of Marine and Island Cultures.*

Maddumabandara C. M.(2009), ***Village Tank Cascade System of Sri Lanka***, Annual Workshop, Japan.

Panabokke, C.R. (2009). ***Small Village Tank Systems of Sri Lanka: Their Evolution, Setting, Distribution, and Essential Functions.***Hector Kobbekaduwa Agrarian Research and Training Institute.

Ratnayake, S.S., Kumar, L.,Dharmasena, P.B., Kadupitiya, H.K.,Kariyawasam, C.S., Hunter, D. (2021). ***Sustainability of Village Tank Cascade Systems of Sri Lanka: Exploring Cascade Anatomy and Socio-Ecological Nexus for Ecological Restoration Planning.*** *Challenges.* https://doi.org/10.3390/challe12020024

# 29. කුඩා වාපි සංස්කෘතිය හා බැඳි අභිචාර විධි

(නුවර කලාවිය පුරාණ කුංචුට්ටු කොරළයේ වැව් ගම්මාන ඇසුරිනි)

එස්. ආර්. එල්. සේනානායක

## හැඳින්වීම

ලාංකේය ග්‍රාමීය සංස්කෘතිය අතීතයේ සිටම ගොඩනැගුනේ ඒ ආශ්‍රිත කුඩා වැව් පදනම් කරගෙනය. මෙලෙසින් වැවයි දාගැබයි ගමයි පන්සලයි යන බැඳීම ආරම්භයේ සිටම නුවර කලාවිය ජනයාගේ ජීවිත වල පදනම විය. මේ අනුව නිර්මාණය වූ ගැමි ජන ජීවිතය හා බද්ධ වූ සිරිත් විරිත් හා ඇදහිලි ක්‍රම සමුදායක් වශයෙන් අභිචාර ක්‍රම දැක්විය හැකිය. සමාජ ක්‍රමයේ වේගවත් ගමන මත අතීත තත්ත්වය හා එයට උරුම වී ඇති වර්තමාන තත්ත්වය බොහෝ සෙයින් වෙනස්ව ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශිය ලේඛම් කොට්ඨාසයට අයත් පැරණි කුංචුට්ටු කොරළයේ වැව් ගම්මාන ආශ්‍රිතව පවතින අභිචාර විධීන් අතීතයේ තරමට නොවුනත් යම් ප්‍රමාණයක් දුරට සිදු කෙරේ.

ප්‍රදේශයේ එදිනදා ජන ජීවිතය තුළ වැව හා බැඳුණු විවිධ සංස්කෘතින්ට අදාල චාරිත්‍ර වාරිත්‍ර, වත්පිළිවෙත් අභිචාරයන් හා විශ්වාස සාම්ප්‍රදායිකව ගැමි සංස්කෘතිය සමග බැඳි ඇති ආකාරය මෙමඟින් හඳුනාගත හැකිය. එහි දී ප්‍රදේශයේ ජීවත් වන ජනතාව අතර සමාජ සම්බන්ධතා වර්ධනය කිරීමට මෙන්ම ගමේ ප්‍රජාවගේ ජීවනාලිය වන වැවත් ගොවිතැනත් ආරක්ෂා කිරීම සඳහා සිදුකරන ලද අභිචාරාත්මක ක්‍රමවේදයන් හා පූජා පිළිවෙත් පිළිබඳ අවබෝධයක් ලබාගැනිමට අපේක්ෂා කෙරේ. එමෙන්ම ඒ හා සබැඳි මිනිස් ආකල්ප හා සිරිත් විරිත් වර්තමාන සමාජය තුළින් ගිලිහි යාමට ලක්වී ඇති ආකාරය පැහැදිලි කරගත යුතුය.

## ක්‍රමවේදය

පර්යේෂණයට අදාළ මූලික දත්ත ලබාගැනීමේ දී ද්විතීයික මූලාශ්‍රය ලෙස අභිචාර හා වැව සම්බන්ධයෙන් ලියවුණු ග්‍රන්ථ අධ්‍යයනය කිරීම සිදුකරන ලදී. එහි දී යොදාගත් ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය වූයේ සම්මුඛ සාකච්ඡාවයි. අභිචාර වූ කලි අරුතින්ම ජනතාවගේ හැසිරීම් හා චාරිත්‍ර වාරිත්‍ර තුළින් ගොඩනැගුණකි. ඒ සඳහා තොරතුරු ලබා ගැනීමට සුදුසු ම මූලාශ්‍රය වූයේ වැව හා සම්බන්ධ ගැමි ජීවන අත්දැකීම් ය.

## විමර්ශනය

අතීත කුංචුට්ටු කොරළයේ වාරි සංස්කෘතිය ක්‍රියාත්මක වූ සමාජය තුළ ගැමියා තම ජීවිතය සඳහා උපකාර කරන වැවත් ජීවත් වන ගමත් ජීවනෝපාය වන ගොවිතැනත් ආරක්ෂා කිරීම උදෙසා අභිචාරාත්මක විධික්‍රම සිදු කළ අතර එයින් තම ජීවිතය පවා ආරක්ෂා වන බව ඔවුන් තරයේ විශ්වාස කරන ලදී. මේ හා සබැඳි චාරිත්‍ර ක්‍රමානුකූලව ඉටු නොකිරීමෙන් අදෘෂ්‍යමාන බලවේග විසින් තම ජීවිතයට මෙන්ම කෘෂිකර්මාන්තයට බලපෑම් කරන බව ප්‍රදේශයේ පාරම්පරික අත්දැකීම් තුළින් ගම්‍යමාන වේ. එහි දී එවැනි කටයුතු සඳහා වත්පිළිවෙත් සංවිධානය කිරීමට සුභ වේලාවක් සුභ දවසක් ගැමියන් විසින් තීරණය කරනු ලබයි.

නුවර කලාවියට අයත් කැදෑ කෝරළය, කඩවත් කෝරළය, කනදරා කෝරළය, කුංචුට්ටු කෝරළය වැනි පැරණි කෝරළයන්ට අයත් කුඩා ගම්මාන වල නාමයන් සකස් වී ඇත්තේද ඒ ප්‍රදේශවල තිබෙන ග්‍රාමීය වැව් සමඟ බැඳි සංස්කෘතිය මගිනි. එම ප්‍රදේශ අතරින් කුංචුට්ටු කෝරළය කුංජන්-බුට්ටු වශයෙන් උල්පත හා සම්බන්ධ ද්‍රවිඩ නාමයකින් අර්ථවත් වීම තුළ මෙම ප්‍රදේශයේ වැව හා සබැඳි ඇදහිලි අභිචාර හින්දු ආභාෂයත් සමඟ ගොඩනැගී ඇතැයි

කිව හැකිය. එමෙන් ම බෞද්ධ ඇදහිලි හා දේව විශ්වාසයන්ගේ සම්මිශ්‍රණයකින් පෝෂණය වූ වාපි සංස්කෘතිය තුළ ග්‍රාමීය ජන ආකල්ප හැඩගැසී ඇත.

**පනම් බැදීම**

කන්න ක්‍රමය අනුව වගා කටයුතු කරන අතර එම කටයුතු ආරම්භයට පෙර වැවට වර්ෂා ජලය ලබා ගැනීම පිණිස කරනු ලබන අභිචාරාත්මක ක්‍රමයක් ලෙස මෙම වැව් ගම්මාන වල පනම් බැදීම සිදුකරනු ලබයි. මුල්ම වැස්සෙන් අනතුරුව වැවේ කුඩා කුඩා වලවල් ජලයෙන් පිරී යයි. ඒ සමගම ආරම්භ කරන මෙම පනම් බැදීම සඳහා මුලින්ම දේව පූජාවට අවශ්‍ය යහන සකස් කරයි. ඒ සඳහා වැව ළග තිබෙන විශාල ගසක් තෝරාගනි. එය සංහිඳ ලෙස හඳුන්වයි. එම කාර්‍යයට ගමරාළ, කපුරාළ, අනමැතිරාළ, වෙල්විදානේ ආදි ගම් ප්‍රභූන් පැමිණෙයි. එහි දී පනම් බංඩාර හෙවත් පනම් කුමාරයා වෙනුවෙන් යහනක් සාදා ඒ මත බෝල්පනා අතු උඩ බුලත් හතක්, පුවක් හතක්, කෙසෙල්, කැවුම්, මල්, පහන්, සුවඳ දුම් තබා වැද නමස්කාර කරයි. ඉන්පසු බෝල්පනා අත්තක් රැගෙන එහි කහ හා හුණු දවටා මයිල පටියකින් වෙලා සංහිදේ සවිකරයි. විශේෂයෙන් කණුගහවැව ගම්මානයේ දී එම කාර්‍යය සඳහා බෝල්පනා කෝටුවක් ගෙන එහි කහ හා හුණු දවටා බෝල්පනා කොළ 7ක් යහන මත තබා ඒ උඩ කෝටුව තබයි. මින් අනතුරුව බෝල්පනා අත්තේ හෝ කෝටුවේ, වැවේ කුඩා වලවල්වල පිරී තිබෙන ජලයෙන් දෝවනය කරගත් රිදී කාසිය ගැටගසයි. මේ සඳහා අතීතයේ දී වෙන්කරන ලද කාසියක් භාවිත කර ඇති අතර පනම ද ඊට යොදාගෙන තිබේ. මෙසේ පනම් බැදීමේ කාර්‍යය කෙම්මුර දිනයක සවස ගමේ සියලු දෙනාගේ සහයෝගීත්වයෙන් සිදුකරයි. ඉන් අනතුරුව කපු මහතා විසින් මල් පහන් තැබූ යහන සමීපයේ සිට රෑ පුරා දේව කන්නලව්ව සිදු කෙරේ. (යු.බන්දුපාල, ප්‍රධාන කපු මහතා)

**"අවසර අවසර පස්වාහන් දහසකට අයියනා බංඩාර, පනම් බංඩාර, ගලේ බංඩාර, වැවේ බංඩාර, රත්රන් බංඩාර, කඩවර බංඩාර තමුන්නාන්සේ ලා වැවට ගමට වෙළට යහතින් දිවස් හෙලා බැල්ම ලා වදාරන මහා සත්‍යානුභාවයට.. ඇතුන් බැන්ද වූ රන් පනමට, රිදී පනමට, උඩ්රිප්පුවට බැල්ම කර වදාරා පනම් බංඩාර හාමුදුරුවනේ ඔබවහන්සේ වැස්ස වලාහක දේවතාවන්ට අණසක පතුරුවා වැව පුරවා සකල ඓශ්චර්ය සෞභාග්‍ය පතුරුවන්නට ආයුබෝ වේවා.."**

අනතුරුව පාන්දර කපුටා කෑ ගසනනට පෙර පනම හෙවත් රිදී කාසිය වැව ලඟ තිබෙන ගසේ බිදී. පසුව හූ තුනක් තියා පූජා වෙඩිල්ල පත්තු කරයි. පුරාණයේ ඊට ගල් වෙඩිල්ලක් පත්තු කර ඇති අතර අද වන විට රතිඤ්ඤා භාවිත කරයි. මෙසේ පනම් බැදීමෙන් දින හතකට පසු වැවට වර්ෂාව ලැබෙන බව ජන විශ්වාසයයි. අදටත් මෙය කුංචුට්ටු කෝරළයේ වැව් ගම්මාන වලට පොදු වූ අභිචාරයක් වශයෙන් දකින්නට ලැබෙන ලක්ෂණයකි. (යු.බන්දුපාල, ප්‍රධාන කපු මහතා)

**පූජා වෙඩිල්ල**

වැවට ජලය එකතු වී පිටාර ගලායන්න ආසන්න වුන මොහොතක වැව ආරක්ෂා කරගැනීම උදෙසා ප්‍රධාන වශයෙන් මෙම කාර්යය සිදු කරනු ලබයි. ප්‍රදේශයේ ජනයා මීට මිහිර වෙඩි ලෙසද හඳුන්වයි. සවස් කාලයේ දී ගමේ සියලුම පිරිමි පාර්ශවයන් එකතු වී දේව කානාකාරිය සිදු කොට එහි දී පනම් කාසියක් පිරිසිදු රෙදි කඩක ගැටගසා එය බෝල්පනා අතු කීපයක් එකතු කර එහි එල්ලා දේව කන්නලව්ව සිදු කර අවසන් වනවාත් සමඟ මුර වෙඩිල්ලක් පත්තු කිරීම සිදු කරයි. මෙය මිහිරි වෙඩි හෙවත් පූජා වෙඩිල්ලයි. මෙහි දී සිදු කරනු ලබන්නේ ජලයේ ගැවී නොගැවී යන පරිදී වැව මැදට බෙහෙත් කොටන ලද තුවක්කුවකින් වෙඩිල්ලක් තැබීමයි. (යු.බන්දුපාල, ප්‍රධාන කපු මහතා)

මෙය සිදු කරන තවත් ක්‍රමවේදයක් ගැමියන් පුරාණයේ සිට භාවිත කර ඇත. එනම් වැව මැද ලීයක් සිටුවා සුදු රෙදි කඩකින් වෙල් විදානේ එහි පඩුරක් ගැටගසනු ලැබේ. එහි දී එම ලීයේ සීමාව ඉක්මවා වතුර නොයෙන ලෙස දෙවියන්ට භාර කරන අතර වැව හරි මැද සිට බෙහෙත් කොටන තුවක්කුවකින් වැව කෙළින් අහසට වෙඩි තැබීම සිදු කෙරේ. ඉන්පසු දෙවියන්ගේ අනුහසින් ජලය ශබ්ද නගාගෙන ආපසු වැව් පිටිය දෙසට තල්ලු වී යන අතර වර්තමානයේ ද මෙම අභිචාරාත්මක කාර්යය ප්‍රදේශයේ වැව් ගම්මානවල සිදු කරනු ලබයි. ඒ සමඟ ම වැව් සංහිදට එක්රොක් වී සිටින ගැමියන්ගේ සිතට සැනසුම් සුසුමක් එක් වන්නේ වැව ආරක්ෂා වීම වෙනුවෙනි. (කිරිබංඩා, ගමේ වැඩිහිටියෙකි)

**මුඩුප්පු බැඳීම**

කුංචුට්ටු කෝරළයේ වැව් ගම්මාන කිහිපයක වැවේ වතුර වැඩි වී වාන් දැමීමට ආසන්න මොහොතේ වැවට කරදරයක් වෙන්න පෙර මෙම රාජකාරිය කරනු ලබයි. බෝහෝ විට අයියනායක දෙවියන් සිහි කොට මුඩුප්පු බැඳීම සිරිතකි. බුලත් කොළ දෙකක්, රන් හෝ රිදී කාසියක් වැවට දා වැව ඇතුල් පැත්තේ සීමාවන් පනවනු ලැබේ. මෙහි දී කයිල කෝටුවක් ගෙන පොතු ඇර එය සිටුවා එහි පඩුරක් බැඳීම චාරිත්‍රයකි. එය මුඩුප්පු බැඳීම ලෙස සාමාන්‍යයෙන් ගම්වාසීන් හඳුන්වයි. එමෙන්ම කයිල කෝටුවකින් දුන්නක් මෙන් සදා වැවට එය විදිනු ලැබේ. කිරි ඉතිරීම හා මුට්ටි නැමීමේ මංගල්ලය දිනට කයිල කෝටුවේ බැඳපු පඬුර කෝවිළට දමනු ලබයි. මෙසේ ගොවිතැන් සිදු කොට අවසන් වන තුරු වැව ආරක්ෂා වී පවතින බව ගැමි ජන විශ්වාසය වේ. (එන්. කරුණාදාස, වෙද මහතා)

**වප්පැන හැරවීම**

අතීතයේ සිටම මෙම කුඩා වැව් ගම්මාන තුළ යම්කිසි සුභ කාර්යක් සඳහා නැකැත් බැලීමට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ඒ අනුව පළමුවරට වැවෙන් දියවර කෙතට හරවා ගැනීමට දිනයක් නැකත් රාළ විසින් නියම කරන අතර එදින සොරොව්වෙන් ජලය නිකුත් කිරීම වප්පැන හැරවීම නම් වේ. තව ද යල මහ දෙකන්නේ ම ඕනෑම කන්නක් වප්පැන වශයෙන් හඳුනාගත හැකිය. ප්‍රදේශයේ ගැමියන් විසින් එය සිදු කරන්නේ "සබ්බපාපස්ස.." ගාතාව සජ්ඣායනාවත් සමගයි. එමගින් ඔවුන් අපේක්ෂා කරන්නට ඇත්තේ තිසරණේ සරණ ලැබී කෙත්වතු සඳහා නිසි කළට ජලය ලැබීමට හැකියාව උදා වේ යන්නයි. මෙහි දී ඉස්නන් තෙමීම හෙවත් යාය වපුරා පසුව කුඹුරු ලියැදිවලට ජලය එකතු කර හැරවීම ද මේ සමඟ සිදුකරනු ලැබේ. විශේෂයෙන් වප්පැන හැරවීමට සංහිද ලඟට ගොස් දෙවියන්ට කන්නලව් කොට අවසර ලබා ගත යුතුය. අවසර නොගෙන වප්පැන හැරවීම නොකළ යුතු බව පැරණි ගැමියන්ගේ අදහසයි. (එන්. සිරිවර්ධන, වෙල් විදානේ කෙනෙකි)

**කිරි ඉතිරවීමට දිනයක් හා වේලාවක් වෙන් කරවා ගැනීම**

පුරාණයේ සිට ගමේ සියලු දෙනා පොදු ස්ථානයකට රැස්ව මේ පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. මේ සඳහා මූලිකව කටයුතු කරනු ලබන්නේ ගමරාළ, විදානේරාළ, බද්දේරාළ, වැව් ලේඛම් ආදි ප්‍රභූ පිරිස විසිනි. මේ සඳහා සියලු දෙනාට පහසු කෙම්මුර දිනයක් (සෙනසුරාදා, ඉරිදා හෝ බදාදා, බ්‍රහස්පතින්දා) තෝරා ගනි. අදාළ දිනට පෙර වැව් කඩවල( වැව් බැම්මේ මැද) මෙන්ම සංහිද හෝ දේවාලය හුණු පිරියම් කොට සැරසිලි කර ශුද්ධ පවිත්‍ර කරගනි. මෙලෙස දිනයක් වේලාවක් වෙන් කර සියලු ගැමියන්ට දැනුම් දීමෙන් පසු ගම තුළ පිටි කෙටීම, බැදුම් වර්ග සැකසීම, කැවිලි කිරිබත් පිසීම, ගොමමැටි ගෑම, කැළෑ යාම හා ගස් නැගීම සිදු නොකරයි. මෙලෙස අදාළ දිනය උදාවන තෙක් පිළී වර්ග ආහාරයට නොගෙන පේ වීමක් ද සිදු කරයි. දෙවියන් විෂයෙහි පවත්නා ගැමියාගේ අව්‍යාජ ගෞරවය ඉන් ප්‍රකට වේ.

ඒ දිනවල දී ගම තුළ අවමගුලක් හෝ කොටහළු වීමක් සිදු වුවහොත් ඒ නිවෙස්වලින් කිරි ඉතිරවීමේ මංගල්‍යයට කිසිවක් නොගනී. ඊට හේතුව කිලි වැදීමයි. තවද නියම කරගත් දින හෝ එදිනට පෙර දින ගමේ මළගෙදරක් වුවහොත් සතියකින් පූජාව කල් දමනු ලැබේ. එහි දී කපු මහතා විසින් දෙවියන්ට ආලවිචි බාමින් පුවක් ගෙඩි තුනක් ගැට ගසා හේතුව පවසා සමාව අයෙද නැවත සිදු කිරීම සඳහා බාර වීම සිදු කරයි. (යු.බන්දුපාල, කපුමහතා)

**මුර්තං කද වැඩමවීම**

අදාළ දිනට පෙර දින ගමේ වැඩිහිටියන් එක්ව වැව් සංහිඳ පිරිසිදු කරයි. එදින ගමේ සියලු දෙනා ප්‍රධාන කපු මහතාගේ නිවසට හාල්, පොල්, බුලත්, පුවක්, පළතුරු, මුදල් ගෙනවිත් බාරදෙයි. හල්මිල්ලවැටිය, යකාවැව වැනි ගම්මාන වල කිරි ඉතිරිවීමේ දී මෙම ද්‍රව්‍ය සුදු රෙද්දක ඔතා කත් හතක් සාදා ගනී. තිත්තගෝනෑව ගම්මානයේ මුට්ටි නැමීමේ දී එක් කදකට ද්‍රව්‍ය දමා මුරුතං කද සකසයි. මේ අයුරින් සකසා ශබ්ද පූජාවත් සමඟ උඩු වියන් යටින් කපුරාළ මහතාගේ නිවසේ සිට කත් කරේ තබාගෙන වැව් සංහිදට රැගෙන යයි. කිරි ඉතිරවීමේ දී ගමේ දේවාලයට කත් හත, හවසට 4ක් සහ පසුදා උදෑසන 3ක් ලෙස රැගෙන යයි. මෙසේ ගෞරව පූර්වකව වැඩමවද්දී මඟ දෙපස සිට සියලු දෙනා ඊට සම්බන්ධ වේ. ඒ තුළින් දේව ආශිර්වාදය සැලසෙන බව ගැමින්ගේ විශ්වාසය යි. එදින මුර්තං කද වැඩමවීමත් සමඟ දෙවියන් වැදීමේ වැඩ කටයුතු ආරම්භ වේ.

**බහිරව පූජාව**

පළමු දින සවස වැව ආරක්ෂා කිරීමට කැප වූ බහිරව දෙවියන්ට පූජාව ලබා දීම ද සිරිතකි. ඊට පුවක්, බුලත් 50 බැගින් හා කැවිම්, කෙසෙල්, උක්, අන්නාසි, වරකා, දෙහි හා තවත් පළතුරු, මල් ආදිය තබා ආලවිචි බා පහන් දල්වා දේව කන්නලව් කරමින් කෙහෙල් කොටන්වලින් සෑදු මැස්සක් උඩ තබා ජලයේ පා කර හරිනු ලැබේ. මේ තුළින් වැව කාලයක් පුරාවට ආරක්ෂා වන බව ගැමියන්ගේ විශ්වාසයයි. (යු.බන්දුපාල, ප්‍රධාන කපු මහතා)

**කිරි ඉතිරවීම හා මුට්ටි නැමීම**

කුඹුරෙහි අස්වැන්න ලබාගත් පසු එහි අග්‍ර කොටසින් දේව රාජකාරි සිදුකරන අතර කුංචුට්ටු කෝරළයේ බහුලව සිදුකරනු ලබන කිරි ඉතිරවීමට ගන්නා භාණ්ඩ සංහිඳ හෝ දේවාලය මත පැදුරක් එලා ඒ මත තැන්පත් කරයි. කලින් දින කපුරාල සඳහා මුරපැළක් සාදන අතර එදින සවස ආභරණ පෙට්ටිය හේවිසි මැද කිරි උතුරන තැනට රැගෙන යයි. පළමුව අදාළ ස්ථානය බෝල් අත්තකින් ඇමැද කහ දියර ඉස පවිත්‍ර කොට, පට්ටියේ කතරගම දෙවියන් උදෙසා රජගෙය නොහොත් යාලත්තක් බැම සිදුකරයි. පට්ටිය නම් දේව රාජකාරි කරන ස්ථානයයි. මෙහි දී රජගෙය තුල පුල්ලෙයාර් දේව සංකේතය තබයි. මෙම ප්‍රදේශයේ ගැමියන් සියලු සුභ කාර්යන් සඳහා පුල්ලෙයාර් දෙවියන්ට පුද පූජා පවත්වයි. මෙහිදී ද කතරගම දෙවියන් ප්‍රමුඛ කොට පුල්ලෙයාර්, අයිනායක, ගම්භාර වැවේ දෙවියන්, වන්නිය දෙවියන් ආදි සමූහයා පූජා ලබති. මෙහි දී බුලත් පුවක් හා අනෙක් ද්‍රව්‍ය යහන මත තබා දෙවියන් යදිති. අනතුරුව මුර්තන් හැලිය ගොක්කොළ වලින් සරසා ලිප තබයි. කිරි උතුරා ලිපෙන් බාගත් පසු කඩවර ගොටු හා කම්බිලි ගොටු කිරිබත් කැවුම් කෙසෙල් සමඟ පුදනු ලබයි. අනතුරුව දෙවියන්ගේ දානය රැස්ව සිටින ගැමියන් ආහාරයට ගැනීමෙන් අනතුරුව චාරිත්‍රය අවසන් වේ. (යු.බන්දුපාල, ප්‍රධාන කපු මහතා)

මුට්ටි නැමීමද ප්‍රදේශයේ තරමක් දුරට පවත්වන අභිචාරාත්මක චාරිත්‍රයකි. සංහිදේ අයියනායක, පත්තිනි හා ඉලන්දාරි දෙවියන්ට යහන් බැද දේව කානාකාරි සිදු කරයි. මෙහි දී හේවිසි බෙර වැයීමත් සමඟ කපු මහතා විසින් වතාවත් කොට වැව් ජලයෙන් මුට්ටි දෙකක්

පුරවාගෙන පැමිණෙයි. පසුව කුඹුක් ගසක පැත්තට ගැමුණු අතු දෙබලක එම කාර්යය සිදු කරයි. එය කුඹුරු ආරක්ෂා කර දෙන මෙන් මහත් භක්තියෙන් සිදුකරන අභිචාර විධියකි.

### බෝල බැදීම

කුංචුට්ටු කෝරළයේ ගැමියන්ගේ ජීවය බඳු වූ වැව ආරක්ෂාව ට මෙන්ම ඉදිරි පැවත්මට ජල සම්පත මෙන්ම මාලු සම්පත ඉතාම ප්‍රයෝජනවත් වේ. ඒ හා සම්බන්ධ අභිචාර විධියක් ලෙස අණබෝල බැදීම දැක්විය හැකිය. මෙය සිදු කරන්නේ කෘෂි කටයුතු නිමකොට අස්වනු නෙලීමෙන් පසුවයි. විදානේ මහතා විසින් වැවට බැසීමට අනුමැතිය දුන් පසු ගමේ පිරිමි පාර්ශවය කැළයට ගොස් වැල් කපාගෙන විත් "කරක" "කෙමන" කියන උපකරණ සදා මාලු ඇල්ලීම සිදුකරයි. පසුව එම මාලු වර්ග වැව් බැම්මේ ගොඩගසනු ලැබේ. අනතුරුව එම වෙන් කළ මාලුවලින් මුල්ම පංගුව ගමේ ප්‍රභූන්ට ද පසුව වැන්දඹුවන්ට ද ලබා දීම සිරිතකි. ඉන් පසු වෙල් විදානේගේ අනුදැනුමෙන් වැව් කට්ටි කැපීම සිදු කරයි. ඒත් සමගම බෝල්පනා අත්තක් කඩා වැවේ කඩවලේ එල්ලයි. එනම් එතැන් පටන් විදානේ පවසන තුරු මාලු ඇල්ලීම තහනම් බව පෙන්වාදීම සඳහා ය. ඒ තුළින් වැවේ ජලය ගැමි ජන ජීවිතයට බද්ධ වී තිබූ ආකාරය නිරූපණය වේ. (කේ. චන්ද්‍රසේකර, පැරණි විදානේ කෙනෙකි.)

මීට අමතරව කුඩා වැව් හා සබැඳි සංහිඳ ශුද්ධ වස්තුවක් ලෙස සලකයි. සංහිඳ යනු විශාල වෘක්ෂයකි. පරම්පරා කීහිපයක් වැවේ රාජකාරි හඳුනන සංහිඳ අවට ඇටවුම් බසින ලද වනස්පතියක් තිබේ. අතීතයේ දී සංහිඳ සඳහා නුග, කෝන්, වීර, පලු වැනි කාලාන්තරයක් පවතින ගසක් තෝරාගෙන ඇත. වැව් සංහිඳ පරම්පරා විකාශනයක් බැවින් වෙනස් කිරීම තහන්චියකි. ඒ අවට දඩයම් කිරීම තහනම් වේ. එමෙන්ම විල් කොරහෙන් නාවන අතදරුවන් පළමු වරට වැවේ මංකඩට ගෙනවිත් නාවන්නේනම් ඊට පෙර දින සංහිඳෙන් දේව ආශිර්වාදය ඉල්ලා සිටිය යුතුය. තවද ප්‍රදේශයට වැස්ස ලැබීමට ඉලන්දාරි දෙවියන් උදෙසා දෙන පූජාව බුලත් යහනයි. එය ද සංහිඳ තුළ සිදුකරයි. කුංචුට්ටු කොරළයේ වැහි නැති නියං කාලවල විහාරහල්මිල්ලෑව ගමේ විෂ්ණු දේවාලයේ මහා පාත්‍රය රැගෙන එය කිරිබත් ඉතිරෙනකම් පිරවීම සිදුකරයි. එහි දී අහස කලුකර වැසි උදාවන බව ජන විශ්වාසයයි. (කපුරාල, විහාරහල්මිල්ලෑව විශ්ණු දේවාලය)

මේ තුළින් අතීතයේ සිට ජනයා ජලයට, වර්ෂාවට ජලය රැස්කර තබා ගන්නා වැවට කෙතරම් අනුගත වීද යන්න තහවුරු වෙයි. යමෙක් හිතාමතා එම කාර්යයන් මගහරී නම් ඔහුට දෙවියන්ගේ  ආරක්ෂාව නැතිවන බව ගැමියන් දැඩිව විශ්වාස කරයි. කෙසේ වෙතත් මෙවන් අභිචාර විධි වත්මන වන විට සමාජයෙන් ඉවත් වී යමින් පවති. ඊට බලපා ඇත්තේ නව පරම්පරාව තුළ වැඩිහිටියන්ගෙන් දැනමුතුකම් ගැනීමට මැලිකම් දැක්වීමයි. එමෙන්ම ඔවුන් මෙම අභිචාර විශ්වාස නොකරයි. ඒ නිසා මෙම සම්ප්‍රදායික සිරිත්වලට ගරු නොකිරීම මෙන්ම සම්බන්ධ වීම අඩු වෙමින් පවතී. තවද අතීතයේ ඇදහිලි අභිචාර සඳහා බෙර වාදනය කල ජනයා සිටි අතර වත්මන් පරපුර කුලය ඉස්මතු වීම නිසා ඊට මැලිකමක් දක්වයි. එමෙන්ම අතීතයේ තුවක්කු භාවිත කර පූජා වෙඩි තැබුව ද මෑතක සිට ඊට අවසර නැත. විද්‍යාව තාක්ෂණය දියුණුවත් සමඟ කෘෂි කටයුතු කිරීම ආරථික වාසි මුල්කොට සිදු වන නිසා කාර්යය බහුල සංකීර්ණ සමාජයකට අවතීරණ වී ඇත. මෙවැනි හේතු සාධක නිසා පාරම්පරික වැව හා බැඳුණු අභිචාර වර්තමාන සමාජයෙන් ගිලිහි යමින් පවතී.

### නිගමනය

සාම්ප්‍රධායික කුංචුට්ටු කෝරළයේ කුඩා වාපි සංස්කෘතිය හා බැඳුණු සිරිත් විරිත් අභිචාර ප්‍රදේශයට ආවේණික සුවිශේෂී ලක්ෂණවලින් ගැබ්ව පවති. ගැමියන්ගේ ඥාණය, තාක්ෂණය මත අභිචාර බොහෝමයක් කාලයත් සමඟ ඵල රහිත ක්‍රියාවක් ලෙස සැලකුව ද එවන් අභිචාර

තුළින් සියලු දෙනා තුළ එකමුතුකම, සමගිය සහයෝගය වර්ධනය කර අදහස්වලට ගරු කරන සමාජයක් හැඩ ගැසී තිබුණි. අනෙක් අතින් ඒවායෙ හි ගුප්ත විද්‍යාත්මක සත්‍යතාවයක් ගැබ්ව තිබෙන්නට ඇතැයි සිතිය හැක. නොමැත්තේ නම් කාලයක් පුරාවට වැව හා බද්ධව එවැනි අභිචාරයන් පැවතීමට ඉඩකඩක් නොපවතී. එවැනි අභිචාත්මක විධි සමඟ අතීතයේ පරිසර හිතකාමී පිරිසක් බිහි වූ අතර ඒ තුළින් සොබා දහමේ ආශිර්වාදය ඔවුන්ට හිමි විය. ඒ කෙසේ වෙතත් වත්මනේ අපෙන් ගිලිහි යන්නේ එවැනි වූ උදාර මිනිස්කමයි. එවැනි සාම්ප්‍රදායික අභිචාරයන් මේ මහපොළවෙන් සදහටම වියැකී යන්නට මත්තෙන් රැකගැනීම අප සියල්ලගේ ම යුතුකමකි.

**පරිශීලන**

**සම්මුඛ සාකච්ඡා**

බන්දුපාල,යු (ප්‍රධාන කපු මහතා) කණුගහවැව,හල්මිල්ලවැටිය, 18.12.2021

කරුණාදාස,එන් (වෙද මහතා) කණුගහවැව,හල්මිල්ලවැටිය, 18.12.2021

කිරි බංඩා (ගමේ වැඩිහිටියෙකි) තිත්තගෝනෑව, කැබිතිගොල්ලෑව, 17.12.2021

සිරිවර්ධන, එන් (හිටපු වෙල් විදානේ)තිබිරිවැව, කැබිතිගොල්ලෑව, 15.12.2021

චන්ද්‍රසේකර,කේ.(පැරණි විදානේ කෙනෙකි) කොවිල්බැන්දවැව, කැබිතිගොල්ලෑව, 20.12.2021

කපුරාළ, විශ්ණු දේවාලය. විහාරහල්මිල්ලෑව, 21.12.2021

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

දළුපොත, මහින්ද කුමාර. (2003) ***වැව හා සංස්කෘතිය,*** ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

ස්වර්ණසිංහ, කේ.එම්.අයි. (2005) ***අපේ වැවෙන් පැන් දෝතක්,*** චාග ප්‍රකාශනය, පන්නිපි

# 30. ශ්‍රී ලාංකේය පැරණි වැව් ගම්මානවල සිදු කරන පාරම්පරික හා සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් පිළිබඳ විමසුමක්.

කේ. ඩී. සී. සෙව්වන්දි.

**හැඳින්වීම.**

වැව යන සිංහල වචනය පාලි හා සංස්කෘත භාෂාවල එන වාපි යන්නෙන් බිඳුණකි. පැරණි සිංහල සෙල්ලිපිවල මෙය වපි සහ වවි යනුවෙන් සඳහන් කරයි. වැව යනු ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ බිහි වූ අති විශිෂ්ටතම නිර්මාණයකි. හෙළදිව ජන සංස්කෘතිය හා ජලය අතර පැවතියේ අවියෝජනීය සබඳතාවයකි. මහාවංසය තුළ සඳහන් වන පරිදි **"අපපකංපී' දිසෙ දෙසෙ සලිලං වුටඨී සමභවං - විනා ලොකොපකාරෙන ජාතු මා ගඤ්ඡි සාගරං"** යන්නෙහි අර්ථය වන්නේ **"අහසින් වැටෙන එක දිය බිඳක් පවා මනුෂ්‍ය ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා නොයා යුතුය"** යන්නයි. ඒ අනුව ශ්‍රී ලාංකේය අතීත කෘෂිකාර්මික ජන ජීවිතය හා බැඳුණු ප්‍රධාන සංස්කෘතික අංගයක් වශයෙන් හෙළදිව වාරි සංස්කෘතිය පෙන්වා දිය හැකිය. ශ්‍රී ලාංකේය පුරාණ වාරි සංස්කෘතික අංගයක් ලෙස වැව් පදනම් වූ පැරණි වැව් ගම්මානවල සිදු කරන පාරම්පරික හා සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් හඳුනාගත හැකි වේ. එහිදී වැව හා සම්බන්ධ විවිධ උත්සව මෙන්ම ගම් රාජකාරි චාරිත්‍ර පිළිබඳව පාරම්පරික හා සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් යටතේ අධ්‍යයනය කිරීම මෙහි මුඛ්‍ය අරමුණයි.

**ක්‍රමවේදය.**

මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා මූලික වශයෙන් දත්ත රැස්කිරීමේ ක්‍රමවේද ලෙස පුස්තකාල ගවේෂණය යටතේ ප්‍රාථමික මූලාසයන් හා ද්විතියික මූලාශ්‍රයන් මෙන්ම අන්තර්ජාලය ද භාවිතා කරන ලදී. අවසානයේදී මෙම අධ්‍යයනයෙහි අභිප්‍රාය වන්නේ ශ්‍රී ලාංකේය පැරණි වැව් ගම්මානවල සිදු කරනු ලබන පාරම්පරික හා සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් මොනවාද? යන්න සහ ඒවා සිදු කර තිබෙන අයුරු පිළිබඳව සමාජයට යම් අවබෝධයක් ලබා දීම මගින් පැරණි වාරි සංස්කෘතික අංගයන් සම්බන්ධව සමාජය සතු දැනුම ඔප්නැංවීමයි.

**විමර්ශනය.**

ශ්‍රී ලාංකේය සමාජයේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගනිමින් ජීවත් වන ජනයා හා ජල සංස්කෘතිය පිළිබඳව කතා කරන විට වැව යනු අපට අමතක කළ නොහැකි සාධකයකි. වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන බැඳීම පැරණි ලක්වැසි ජනයාගේ සිය ජීවිතවල පදනම විය. ගම තුළ ජීවත් වුණ ප්‍රජාවගේ ජීවිත වල පැවැත්ම තීරණය කරනු ලැබුවේ වැව හා පන්සල මගිනි. එලෙස පැවතගෙන ආ වැව් සංස්කෘතිය පිළිබඳව සැලකීමේදී ගමක් නිර්මාණය වූයේ කුඩා වැවක් මුල් කරගෙන වන අතර එම ගම්මානයෙහි පිහිටා තිබුණ වැව් ජලය පරිහරණය කළේ ද ගම් ප්‍රජාව විසිනි. මෙහිදී වැව් ජලය පමණක් නොව වැවෙහි තිබෙන ඕලු, නෙලුම්, මානෙල් ආදී මල් වර්ග බුදුන්ට පූජා කළ අතර මාළු සම්පත සේම කෙකටිය, ඕලු, නෙලුම් අල හා බීජ ආදී වැවේ තිබෙන ආහාරයට ගත හැකි සියලුම දෑ ගමේ අය විසින් භාවිතයට ගත් අතර ජල සම්පත නිසි ආකාරයට කළමනාකරණය කර එම ජලයෙන් ගොවිතැන් කරමින් ජීවිතය පවත්වාගෙන ගිය බව ද වටහා ගත හැකිවේ. එසේම පාරම්පරික හා සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් වල යෙදෙමින් වැව් ගම්මානවල පවතින්නා වූ වැව හා ජනයා අතර ගොඩනැගුණා වූ සබඳතාවය මනාව ගම්‍යමාන වේ. ඒ අනුව වැවේ ජලය වගාවට පමණක්ම සීමා නොකොට ගමේ ජනයාගේ ජන ජීවිතයට එය බද්ධ කරගත්

ආකාරයත් ඒ තුළින් වැව් ජල සංස්කෘතියට නෑකම් කියන වඩාත් ප්‍රබල අනුගතය ලෙසින් ස්ථාපිතව තිබූ බව හඳුනාගත හැකිය.

**වැව හා සම්බන්ධ උත්සව/ චාරිත්‍රයක් ලෙස බෝල බැඳීම චාරිත්‍රය** ගමේ ප්‍රජාවගේ ජීවනාලිය වූ වැවේ ආරක්ෂාවට සේම ඉදිරි පැවැත්මටත් ගමේ ප්‍රජාව බොහෝ මහන්සි වී කටයුතු කළ අතර වැවේ තිබුණා වූ ජල සම්පත වගේම මාළු සම්පතත් ප්‍රයෝජනයට ගෙන වැවේ ඉදිරි පැවැත්ම උදෙසා සිදු කරනු ලබන එක් ක්‍රමයක් ලෙස මෙම චාරිත්‍රය හැඳින්විය හැකිය. මෙම කාර්යය සිදු කරනු ලබන්නේ කෘෂිකාර්මික කටයුතු නිම කොට අස්වනු නෙළා ගැනීමෙන්ද පසුවය. මෙම කාල වකවානුව තුළ සවස් කාලයක විදානේ මහතා විසින් "දැන් නම් වැවට බහින්න හොඳ කාලය යැයි" ගමේ ප්‍රජාවට කතා කොට කියූ විට විදානේ මහතා පවසන කාරණය ගමෙහි පිරිමි පාර්ශවයට වැටහේ. පහුවදා උදෑසනම කැලේට ගොස් වැල් කපාගෙන විත් "කරක" "කෙමන" යන උපකරණ සාදා අවසානයේ සියල්ල සූදානම් කොටගෙන වැවට බැසීම සිදු කරයි. අතීතයේ දී වැවේ සිටිය සෑම මාළු වර්ගයක්ම වෙන් වෙන් වශයෙන් ගොඩ ගසනු ලබයි. ඉන් පසු වෙන් කරන ලද මාළු වර්ග කොටස් කර මුල්ම පංගුව ගමේ සිටින ප්‍රභූන් හට දීම සිදු කරයි. ඊළග කොටස වැන්දඹුවන් හට ද, ඉතිරි කොටස මාළු අල්ලපු අය අතර එය කුඹුරු කට්ටි ප්‍රමාණය අනුව මාළු බෙදා ගැනීම සිදු වේ. ඉන් පසුව ගමේ ජනයා වැදගත් කාර්යයකට අත ගසයි. එහිදී වෙල් විදානේ විසින් ඊළග පණිවිඩය ගමට දෙනු ලබයි. එහිදී ගැමි ජනයා නැවත කැලේ ගොස් වැල් ඇදගෙන විත් කට්ටි කැපීම සිදු කරයි. මෙම කට්ටි කැපීම සිදු කරනුයේ කුඹුරු ඉඩම් ප්‍රමාණය අනුව ය. එනම් වැවේ වැඩිම ඉඩම් ප්‍රමාණයක් තිබෙන පුද්ගලයා වැවේ වැඩි සම්පත් භුක්ති විඳිනවා සේම වැඩි කට්ටි ප්‍රමාණයක් කැපීම පොදු පිළිගත් රීතියයි.

**මුට්ටි නැමීම චාරිත්‍රය** තුළින් වැවට වර්ෂා ජලය ලබා ගැනීම මෙන්ම වැව වෙතින් ලබාදෙන අස්වැන්නට කරන ලද ගෞරවයක් ලෙස මුට්ටි නැමීම මංගල්‍යය හැඳින්විය හැකිවේ. එහිදී ඉර බැසයන අවස්ථාවකදී වැව ළඟ විශාල ගසක් යට මල්, බුලත්, පුවක්, සුවඳ දුම් සහිත යහනක් මුලින්ම සකස් කරන අතර එම කාර්යය සඳහා මුට්ටි 07ක් භාවිතා කරයි. මෙහිදී කපු මහතා මායම් වී මූලික වතාවත් සිදු කොට වැව් ජලයට පැන නා මුට්ටි 07ට ජලය පුරවාගෙන විත් දේව කාර්යයන් සිදු කරනු ලබයි. මෙහිදී වැවේ ඇතුල් පැත්තට වන්නට හිටුවන ලද කණු 07ක මුට්ටි නැමීම සිදු කරන අතර එම වැවට වර්ෂාව බලාපොරොත්තුවෙන් හා තමන්ගේ කුඹුරු වගාව ආරක්ෂා කර දෙන බලාපොරොත්තුවෙන් ගමේ ජනතාව මහත් භක්තියෙන් සිදු කරනු ලබන අභිචාර විධියක් ලෙසට මෙය පෙන්වා දිය හැකිය. ඇතැම් ස්ථානයන්හී දී මෙයිට වෙනස් ආකාරයෙන් මුට්ටි නැමීමේ මංගල්‍ය සිදු කරනු ලැබේ. වැවේ තිබෙන පැරණි කොහොඹ ගසක් හෝ කුඹුක් ගසක් වැනි වෙනත් විශාල ගසක වැව පැත්තට නැමී තිබෙන හා එකම අත්තෙන් අතු දෙකක් බෙදී යන ආකාරයේ අත්තක් මේ සඳහා යොදා ගනී. අතු දෙකේ මුට්ටි නමා සුළඟ වැටීම නැවැත්වීම සඳහා බැඳ එම කාර්යය සිදු කරයි. එමෙන්ම හේවිසි, හොරණෑ වැයීමෙන් පසු මෙම මුට්ටි නැමීමේ මංගල්‍ය ඉටු කරනු ලැබේ.

**දිය කැපීමේ චාරිත්‍රය** සිදු කරනුයේ කෘෂිකාර්මික කටයුතු නිම වී අස්වනු ද නෙලීමෙන් පසුව ය. මෙය වැව් ගම්මානයේ තිබෙන දේවාලය සමීපයේ සිදු කරයි. දේවාලය ඇතුළෙහි පුරාදින 07ක් පුරාවට පූජාවක් පැවැත්වීම මෙහි ප්‍රථම පියවරයි. ඉන් පසුව ගම්වාසීන් එකතු වී එළිමහනේ නැවත දින 07ක් තිස්සේ පෙරහැර පවත්වයි. එහිදී මුල්ම පෙරහැර පවත්වන දිනයේදී අඩි 10ක් පමණ උස කොඩි ගසක් හෙවත් කප් ගසක් දේවාලය ඉදිරිපිට සිටුවයි. පෙරහැර අවසන් වන දිනයේ දී එනම් 14 වන දිනයේදී එම කප් ගස ඉවත් කිරීම සිදු වේ. කප් ගස ගලවාගෙන ගොස් දිය යට සැඟවීමෙන් එම කාර්යය නිම කරයි. ඊට පසුව ආරම්භ

කරනුයේ "ඌරන්කෙළිය" නම් වූ කාර්යයි. එහිදී ඌරෙක් යැයි සිතා පුහුල් ගෙඩියක් ගෙන ආසන්නයේ ඇති බැද්දෙහි සඟවන අතර දඩයක්කරු විසින් ඌරා සොයාගෙන ගොස් වෙඩි තැබීම සිදු කරයි. ඉන් අනතුරුව කපු මහතා විසින් පංචතූර්ය නාදය පවත්වන අතරතුර දිය කැපීම සිදු කරයි. එහිදී කපු මහතා විසින් කඩුවකින් දිය කඳ දෙබෑ කරන අතර ඒ සමඟම එම ස්ථානයෙන් ජලය භාජනයකට පුරවා ගනී. එලෙස ගනු ලැබූ ජලය සහිත බඳුන දේවාලයෙහි තැන්පත් කර ඊළඟ දිය කැපීමේ උත්සවයේදී එය නැවත භාවිතයට ගනී.

**බුලත් යහන චාරිත්‍රය** සිදු කරනුයේ ගමේ තිබෙන වැවක් ආශ්‍රිතවයි. මෙහිදී තොවිලයක් නැටීම සිදු කරයි. වැවෙන් ජලය ලබාගැනීම හා වැව ආරක්ෂා කර ගැනීම මෙහි අරමුණ වේ. මෙහිදී වැවේ පස් භාවිතයෙන් බලියක් සාදා එය සංකේතවත් කර මෙකී තොවිලය කරනු ලබන්නේ වර්ෂාවෙන් පසුව මෙම බලිය යටයන විට වැව ද පිරෙන බව ඔවුන්ගේ අදහසක් වන බැවිනි.

**පූජා වෙඩිල්ල චාරිත්‍රය** සිදු කරනු ලබන්නේ වවැට ජලය එකතු වී පිටාර ගලා යන්න ආසන්න වූ මොහොතක වැව ආරක්ෂා කර ගැනීම සඳහාය. සවස් කාලයේදී ගමෙහි සිටිනා සියලුම පිරිමි පාර්ශවය එකතු වී දේව කන්නලව්වක් සිදු කොට, එහිදී පනම් කාසියක් පිරිසිදු රෙදි කඩක ගැට ගසා ඉන් අනතුරුව බෝල් අතු කිහිපයක් එකතු කොට එහ එල්ලා දේව කන්නලව්වක් සිදු කොට අවසන් වනවාත් සමඟම මුර වෙඩිල්ලක් පත්තු කිරීම සිදු කරයි. මෙය "පූජා වෙඩිල්ල" යන නමින් ද හඳුන්වයි. මෙහිදී සිදු කරනුයේ වැවෙහි ජලය මැදට බෙහෙත් කොටන ලද තුවක්කුවකින් වෙඩිල්ලක් තැබීමයි. එය සිදු කරනු ලබන ක්‍රම දෙකක් පවතී. එනම් වැව මැද ලීයක් සිටවා සුදු රෙදි කඩකින් වෙල් විදානේ විසින් එහි පඬුරක් ගැට ගසනු ලැබේ. එහිදී එම ලීයේ සීමාව ඉක්මවා ජලය නොඑන ලෙස දෙවියන්ට භාර කරන අතර වැවෙහි හරි මැද සිට බෙහෙත් කොටන ලද තුවක්කුවකින් වැව කෙලින් අහසට වෙඩි තියයි. ඉන් පසුව දෙවියන්ගේ අනුහසින් ජලය ශබ්ද නඟාගෙන ආපසු වැව් පිටිය දෙසට තල්ලු වී යන බව විශ්වාස කරයි.

**මුඩුප්පු බැඳීම රාජකාරිය** කරනු ලබන්නේ වැවේ ජලය වැඩි වී වාන්දැමීමට ආසන්න මොහොතේ වැවට හානියක් වීමට පෙරාතුවයි. බුලත් කොළ දෙකක්, රන් හෝ රිදී කාසියක් වැවට දමා වැව ඇතුළ පැත්තෙහි සීමාවක් පනවා කයිල කෝටුවක් ගෙන පොතු ඇර එය සිටුවා එහි පඬුරක් බඳී. තවත් එක් පඬුරක් වැවට දමයි. ඉන් පසුව මුට්ටි පෙරහැර දවස වන විට කයිල කෝටුවෙහි බැඳ තිබෙන පඬුර ගෙන කෝවිලට දමනු ලබයි. ඊට පසුව කයිල කෝටුවෙන් කපත් සිටුවා බෙහෙත් තුවක්කුවක් ගෙන වැව පැත්තට අහස දෙසට පූජා වෙඩිලි 03ක් පත්තු කරන අවස්ථාවේදී වාන් දෙකෙන්ම ශබ්දයකුත් සමඟම ජලය පිටවී යයි.

**වැව් ගම්මානවල ගම් රාජකාරි චාරිත්‍රය** පිළිබඳව සාකච්ඡා කිරීමේ දී පුරාණ වැව් ගම්මානවල ගැමියන්ගේ පාරම්පරික ජීවනෝපාය වන කෘෂිකර්මාන්තය මෙන්ම වැව හා ප්‍රාදේශීය දෙවියන් සම්බන්ධ කරගනිමින් මෙම චාරිත්‍රය සිදු කරනු ලැබේ. ඉදිරි කන්නය සඳහා වැවට නිසි අයුරින් වර්ෂාව ලැබී වැවෙහි ජලය පිරී ඉතිරී ඒ තුළින් ගොවිතැන් බත සරුසාර කරන ලෙස දෙවියන්ගෙන් ඉල්ලා සිටීම ගම් රාජකාරියේදී ප්‍රධාන වශයෙන් සිදු වන කරුණකි. එසේම මේ අයුරින්ම ඊට පෙර කන්නයෙහිදී දෙවියන්ට සිදු කරනු ලැබූ භාරහාර ඔප්පු කිරීම ද මෙහිදී සිදු වේ. මෙම චාරිත්‍රය වර්තමානයේ වැඩි වශයෙන් දැකිය නොහැකි වන අතර නැගෙනහිර පළාතෙහි පදවි - ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පැරණි වැව් ගම්මානයක් වන පරණමැදවච්චිය ගම්මානයෙහි ගම් රාජකාරි චාරිත්‍ර අදටත් සිදු වේ. පාරම්පරිකව ගම් රාජකාරි චාරිත්‍රය ඉටු කළ කපු පරම්පරාවක කපුරාලට බුලත් අතක් දී

චාරිත්‍ර සිදු කිරීම සඳහා දිනයක් ලබාගැනීමෙන් පසුව ගම් රාජකාරි චාරිත්‍රය ආරම්භ වේ. මෙම චාරිත්‍රය දින දෙකක් පැවැත්වෙන අතර එය බොහෝ දුරට අඟහරුවාදා සහ බදාදා යන දෙදින පැවැත්වීමට දින නියම කිරීම සිදු වේ. කතරගම දෙවියන්, පත්තිනි මෑණියන් සහ වල්ලි අම්මා වැනි ප්‍රකට දෙවි දේවතාවන් මෙන්ම ප්‍රාදේශීය වශයෙන් දෙවියන් ලෙසට සැලකෙන ඉලන්දාරි, කම්බිලි හඳුන්කුමාර, වැවේ බණ්ඩාර, වෙලේ බණ්ඩාර, මලේ බණ්ඩාර, ගලේ බණ්ඩාර, හිඟුරක බණ්ඩාර, පනම් බණ්ඩාර, අයියනායක වැනි දෙවිවරුන් වැනි දෙවිවරුන් සිහිගන්වමින් මෙම චාරිත්‍රය සිදු කරනු ලබයි.

ඉන් අනතුරුව චාරිත්‍ර සඳහා කපුරාල දින ලබා දීමෙන් පසුව අදාළ චාරිත්‍රයට අවශ්‍ය වන ආහාර ද්‍රව්‍ය හා භාණ්ඩ ගමෙහි ජීවත් වන ගැමි පවුල්වලින් එක්රැස් කිරීම සිදු වේ. එහිදී හාල්, පොල්, කැවුම්, බුලත්, පුවක්... යනාදිය එක්රැස් කරයි. වර්තමානයේදී නම් එක් නිවසකින් මුදලින් යම්කිසි ප්‍රමාණයක් එකතු කරනු ලැබුව ද අතීතයේදී මෙම චාරිත්‍රය සඳහා මුදල් එතු නොකළා විය හැකිය. මෙලෙස මෙකී කර්තව්‍ය සඳහා මැදිහත් වන්නේ සමාජ හා ආගමික කටයුතු සඳහා ගම්මානයේ බොහෝ දෙනාගේ විශ්වාසය දිනාගෙන සිටින පුද්ගලයා හෝ පුද්ගලයින් කිහිපදෙනෙකි.

චාරිත්‍රය ඉටු කිරීමට ප්‍රථමයෙන් එක්රැස් කරනු ලැබූ ද්‍රව්‍යවලින් කැවුම් 50ක් සහ බුලත් 50ක් පමණ කිසිදු අයුරකින් ඉඳුල් නොකර චාරිත්‍රයෙහි පළමු කර්තව්‍යය වන **පනම් බැඳීමේ චාරිත්‍රයට** යෙදා ගනී. පළමුවෙන් කපුරාල විසින් චාරිත්‍රයට නියම කරගත් අඟහරුවාදා දිනයේ සවස ගමේ වැවට ගොස් දෙවියන් හට කන්නලව් කිරීමයි. මෙම කන්නලව්වට පෙර වැව් බැම්මේ තෝරාගත් ස්ථානයක සුදු රෙදි කඩක් එළා ඒ මත කැවුම් 50ක් සහ බුලත් 50ක් තබනු ලැබේ. ඉන් අනතුරුව කපුරාල මිණිගෙඩි සොලවමින් දේව කන්නලව්ව සිදු කරනු ලබයි. කන්නලව්වෙන් පසු සුදු රෙදි කඩ මත තබා ඇති කැවුම් සහ බුලත් යනාදියට කුඹියෙකු වැනි සතෙකුගෙන් හෝ හානියක් නොවන බව ගැමියන්ගේ විශ්වාසයයි. අදාළ කන්නලව්ව කිරීමෙන් අනතුරුව කපුරාල එම ස්ථානයෙන් ඉවත්ව යයි. එසේම කන්නලව්ව නිමා කිරීමෙන් පසුව සුදු රෙදි කඩ මත තැබූ කැවුම් සහ බුලත් යනාදිය ද පසුදා හිමිදිරිය වන තෙක් වැව් බැම්ම මත තැබීම සිදු වේ. දේව කන්නලව්වට පසුදා කපුටා කෑගැසීමට පෙරාතුව හිමිදිරියේම වැවට ගොස් පෙරදා සුදු රෙදිකඩ මත තැබූ කැවුම් සහ බුලත් යනාදිය එක පොදියට බැඳගෙන ආපසු පැමිණීම සිදු වේ.

බොහෝ දුරට නුවර කලාවියට පොදු වූ ලක්ෂණයක් ලෙස **පනම් බැඳීමේ** කටයුත්ත ආරම්භ කරනුයේ මුල්ම වර්ෂාවෙන් පසුව වැවේ තිබෙන්නා වූ කුඩා කුඩා වලවල් පිරුණ විගසය. මෙහිදී ප්‍රථමයෙන් දේව පූජාව සඳහා අවශ්‍ය යහන සකස් කිරීම සිදු වෙයි. ඒ සඳහා වැව අසළ තිබෙන සුවිසල් ශාකයක් තෝරා ගනී. එම යහන මත මල්, පහන්, බුලත්, සුවඳ දුම් හා පනම හෙවත් රිදී කාසිය ආදී දේ තැන්පත් කරයි. එම කාසි තැන්පත් කිරීම සිදු කරනුයේ වැවෙහි එකතු වී ඇති කුඩා වලවල් වල ජලයෙන් එම රිදී කාසි දෝවනය කර කෙම්මුර දිනක දීය. එහිදී මල් හා පහන් තැබූ කුරාලය ළඟට වී කපු මහතා රාත්‍රිය පුරාවට කන්නලව් කිරීම සිදු කරයි. ඉන් අනතුරුව පාන්දර වන විට කපුටා කෑ ගසන්නට පෙරාතුව පනම වැව ළඟ තිබෙන ගසේ බඳී. ඊටත් පසුව හූ තුනක් කීමෙන් පසුව පූජා වෙඩිල්ල පත්තු කරයි.

චාරිත්‍රයේ දෙවැනි අදියර හෙවත් **වල්ලිඅම්මාගේ දානය** ඉන් අනතුරුව ආරම්භ වේ. එයට සුදුසු ස්ථානයක් ප්‍රථමයෙන් වෙන් කරගැනීම සිදු වේ. මේ සඳහා ගම්මානයේ ගැමියන් නිතර එක්රැස් වන හෝ එසේ එක්රැස් වීමට සුදුසු යැයි තීරණය කර ගන්නා ස්ථානයක් යොදාගනු ලබයි. මනාව පිරිසිදු කරගත් එම ස්ථානයෙහි තරමක් සවිමත් කෝටු සතරක් සිටවා ඒවාද

උපකාර කරගනිමින් මිනිසාගේ උසට වඩා අඩු උසකින් සුදු රෙදි කඩකින් වියනක් බඳිනු ලැබේ. ඉන් අනතුරුව සිටුවා ගත් ලී කෝටු මත බෝල්පනා අතු එල්ලීම සිදු වේ. චාරිත්‍රයේ ප්‍රධාන අංගය වන කිරි ඉතිර වීම සිදු වන්නේ මෙම ස්ථානයේය. කිරි ඉතිරවීමට සූදානම් කළ කුඩා මැටි  මුට්ටිය හඳුන්වනු ලබන්නේ රජ හැළිය යනුවෙනි. මෙම චාරිත්‍රය සිදු කරන කපුරාල උදෑසනට ආහාර නොගන්නා අතර කැවිලි ආහාරයට ගෙන තේ පානය පමණක් සිදු කරනු ලබයි. එය ද මෙතෙක් පැවති සම්ප්‍රදායක් ලෙසට සැලකේ. මෙම පූජාව සඳහා අවශ්‍ය පූජා භාණ්ඩ ලෙස පොල් ගෙඩියක්, බුලත් සහ අලුතින් නෙළාගත් වී වට්ටියක් ද යොදා ගනී. පූජාවේදී කිරි උතුරා පූජා භාණ්ඩ හා මිණිගෙඩි යොදාගෙන දෙවි දේවතාවන් හට කන්නලව් කිරීමක් ද සිදු වේ.

රජ හැළිය ඉතිරවීමත් සමගම චාරිත්‍රයෙහි තවත් එක් අංගයක් ලෙස ගම්මානයෙහි ගැමි දරුවන්ට මෙන්ම ගම්මානයේ ජීවත් වන්නන් සඳහා දිවා භෝජනයක් සූදානම් කරයි. එයටද යොදා ගනු ලබන්නේ එකී චාරිත්‍රයට ම සුවිශේෂ සාම්ප්‍රදායික ආහාර වට්ටෝරුවක් වන බත්, වට්ටක්කා මාළුව, ගංසූරිය කොළ මැල්ලුම (ගංසූරිය කොළ නැති නම් මඤ්ඤොක්කා කොළ හෝ මුරුංගා කොළ ගනු ලැබේ.), සියඹලා හොද්ද (සියඹලා හොද්ද පිළියෙල කිරීමේ යම් අපහසුතාවක් තිබුණේ නම් කිරි හොද්දක් පිළියෙල කරනු ලැබේ.) යනාදියයි. මේ සඳහා කරවල යනාදි කිසිදු පිලී වර්ගයක් යොදා නොගැනීම විශේෂත්වයකි. තවත් එක් විශේෂ කරුණක් වන්නේ මෙම ආහාර පිළියෙල කිරීම සඳහා වැව් ගම්මානයෙහි ම වැඩිහිටි ගැහැණු සහ පිරිමි සහභාගී වීමයි. දිවා භෝජනය සැකසීමෙන් අනතුරුව ළමයින් හට මුලින් ම ආහාර වර්ග බෙදීම සිදු වන අතර, රජ හැළියේ ඇති කිරිබත් ගුලි ද ළමුන් හට බෙදා දීම සිදු වේ. ඉන් අනතුරුව ගම් රාජකාරි චාරිත්‍රයට සහභාගී වන සියලු දෙනාට ද දිවා භෝජනය පිරිනැමීම සිදු කෙරේ.

ගම් රාජකාරියේ අවසන් චාරිත්‍රය **වැව් ගම්මානයේ ඇති වැවේ වැව් බැම්ම මත** සිදු කරන අතර, එයට අවශ්‍ය ප්‍රධාන ආහාර ද්‍රව්‍යයක් වන්නේ වැව් ගම්මානයේ වැවෙන් ම අල්ලාගෙන පිසූ වැව් මාළුය. මෙම චාරිත්‍රය බදාදා දිනයේ රාත්‍රියේදී සිදු කරන අතර ඊට අවශ්‍ය වැව් මාළු අල්ලා ගැනීම සඳහා තෝරා ගනු ලැබූ ගැමියන් කිහිපදෙනෙක් බදාදා උදෑසන හෝ මධ්‍යාහ්නයට පෙරාතුව වැවට පිටත් කිරීම සිරිතයි. එහිදී බොහෝ විට කරක්ගෙඩිය භාවිතයෙන් මාළු ඇල්ලීම සිදු වන අතර, එය භාවිතා කරමින් මාළු අල්ලා ගත නොහැකි අවස්ථාවන්හී දී වෙනත් උපක්‍රමයකින් මාළු අල්ලා ගැනීම සිදුවේ.

මාළු අල්ලා ගෙනවිත් ඒවා සුද්ද පවිත්‍ර කර තැබීමෙන් පසුව එය පිසින තෙක් ඒවායෙහි ලුණු සහ කහ ගල්වා තබනු ලැබේ. සවස් වරුවෙහි මෙම මාළු පිස ගැනීමෙන් අනතුරුව රාත්‍රී චාරිත්‍රයට එය රැගෙන යනු ලබයි. මෙම අවසන් චාරිත්‍රය සඳහා සහභාගී වන්නේ පිරිමි සාමාජිකයන් පමණි. එම චාරිත්‍රයේ දී වියළි කලාපයේ ජනතාව අදහනු ලබන අයියනායක දෙවියන්, ඉලන්දාරි දෙවියන් සහ වන්නි දෙවියන් යන දෙවියන් තිදෙනා සඳහා වැව් බැම්ම මත කිරිබත් මුට්ටි තුනක් පිළියෙල කරනු ලබයි. මෙම පූජාවට බත්, පරිප්පු හොඳි සහ වැව් මාළු යොදා ගන්නා අතර මුට්ටි තුනේ පිසිනු ලබන කිරිබත් ගුලි කර ඒවා ද පූජාවට යෙදා ගන්නා බත් ඇතුළු ආහාර ද්‍රව්‍ය නැවත ආහාරයට ගැනීමක් සිදු නොකෙරේ. අනතුරුව වැව් බැම්මේ තෝරාගත් ස්ථානයේ සුදු රෙදි කඩක් එලා ඒ මත බුලත් 07ක්, පුවක් 07ක් සහ කැවුම් 07ක් බැගින් තබනු ලැබේ. ඊට පසුව කපුරාල දෙවියන් උදෙසා සිදු කරනු ලබන යාතිකාව ආරම්භ කරයි. එම යාතිකාවේ දී කපුරාල විසින් දෙවියන්ගෙන් ඉල්ලා සිටිනුයේ වැව ජලයෙන් පිරී යන තරමට වැස්ස ලබාදෙන ලෙසත්, වැව් ජලයෙන් සිදු කරන ගොවිතැන් බත සරුසාර වන ලෙසත් සහ ගම්මානයේ වැසියන් ලෙඩ රෝග හා අනෙකුත්

උපද්‍රවලින් ආරක්ෂා කර දෙන ලෙසත් ය. යාතිකාව අවසන් කිරීමත් සමඟ ගැමියෙකු විසින් තුවක්කුවක් භාවිතයෙන් වැවට වෙඩිල්ලක් තැබීම සිදු කරයි. වර්තමානයේ දී අලි වෙඩිල්ලක් වැවට දැමීම සිදු කරයි. අනතුරුව අදාළ ස්ථානයෙහි දුම්මල ඇල්ලීම සිදු වන අතර එම කර්තව්‍යයෙන් පසුව සුදු රෙදිකඩ මත තැබූ බුලත්, පුවක් හා කැවුම් යනාදිය අසුරාගෙන ගම්මැද්දට ඒමෙන් පසුව ගම් රාජකාරියෙහි අවසන් චාරිත්‍රය නිමවේ. සියලුම චාරිත්‍ර නිමා වී ඊට පසු උදෑසන කපුරාල ගම්මානයෙන් පිටත් වී යන අතර පූජාව සඳහා එක් කළ ආහාර ද්‍රව්‍ය, භාණ්ඩ හා මුදල් ඉතිරි වී ඇත්නම් ඒවා සියල්ල ද කපුරාළ හට ලබා දීම සිදු වේ.

**නිගමනය.**

අතීතයේ සිට පැවති පාරම්පරික හා සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් නූතනයේදී විනාශවීමට බලපා ඇති ප්‍රධානතම හේතු සාධකය ලෙස වැව් පද්ධතිය විනාශ වීම හඳුනාගත හැකිය. වාරි පද්ධතිය ගම්මානයට සමීප නොවීම තුළ හුදකලා වී ආරක්ෂා නොවීමෙන් කාලයත් සමඟ වැව, ගැමි ජන සමාජයෙන් දුරස්වීම සිදුව තිබේ. එම කරුණු හේතු පාදක කොටගෙන වැව හා සම්බන්ධ පුරාණ ක්‍රියාකාරකම් පිළිබඳ හෝඩුවාවක් හෝ නොමැති වීමට මත්තෙන් පාරම්පරික හා සාම්ප්‍රදායිකත්වය සුරැකීම අප සතු වගකීමකි.

**පරිශීලන.**


ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ***ජලය හා සංස්කෘතිය,*** ආසියානු සංවර්ධන බැංකු සහායික තෙවන ජලසම්පාදන හා සනීපාරක්ෂක (ආංශීය) ව්‍යාපෘතිය.

දළුපොත, එම්. කේ. (2003) ***වැව හා සංස්කෘතිය***, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

මායාදුන්න, එම්. (2019), ***සංස්කෘතිය (සමාජ විද්‍යාත්මක ප්‍රවේශයක්)***

වීරසූරිය, පී. (2006), ***සිංහල සමාජය හා සංස්කෘතිය.***

ස්වර්ණසිංහ, කේ. එම්. අයි. (2005), ***අපේ වැවෙන් පැන් දෝතක්***, වාග ප්‍රකාශන, පන්නිපිටිය.

සෙනෙවිරත්න, ඒ. (1996), ***සිංහල සමාජය හා සංස්කෘතිය.***

# 31. ශ්‍රී ලංකාවේ අතීත වාරි කර්මාන්තය තුළින් පිළිඹිබු වන භූගෝලීය පරිකල්පනය

ඒ.එම්.ජී.එච්.එම්. හේමාතිලක

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඉතිහාසය පුරාවටම දැකිය හැකි සුවිශේෂීම ලක්ෂණයක් වන්නේ මෙරට ආර්ථිකය, දේශපාලනය, සමාජ සංස්කෘතිය යන ක්ෂේත්‍ර කෘෂිකර්මය හා ජල සම්පත මත පදනම්ව විකාශනය වී තිබීමයි. ''වී වගාව කේන්ද්‍ර කොටගත් කෘෂිකර්මාන්තයේ දී ජලය හා භූමිය මනා ලෙස කළමනාකරණය කිරීම ඉතාමත් වැදගත් වේ. වසර දෙදහස් පන්සියයකට අධික ඉතිහාසය පුරා ශ්‍රී ලාංකිකයන් විසින් ජලය හා භූමිය ඉතා ඵලදායීව සහ කාර්යක්ෂම ලෙස පරිහරණය කළ බවට සාක්ෂි බොහෝය. අතීත ශ්‍රී ලාංකිකයන් විසින් අනුගමනය කළ විස්මය ජනක ජල කළමනාකරණ ක්‍රම බොහෝමයක් මෙරට අතීත වාරිකර්මාන්තය තුළින් හඳුනාගත හැකිය. මෙරට ප්‍රධානතම ආර්ථික ක්‍රමවේදය වූ කෘෂිකර්මාන්තය දී වී වගාව කෙරෙහි බලපා තිබූ ස්වභාවික අභියෝගය වූ ජල හිඟය දුරලීම උදෙසා මෙරට ජනතාව ප්‍රධාන ක්‍රම දෙකක් යටතේ එනම් වැසි ජලය බැම්මක් බැඳ හිර කොට තැනිතලා ප්‍රදේශයක තබා ගැනීමත්, ගලා යන ජල කඳ විශාල වැවක සිරකර තැබීමත් වශයෙනි. මේ ආකාරයට භූගෝලීය ලක්ෂණ අනුගමනය කරමින් අතීත වාරි ශිල්පීන් වාරි කර්මාන්තය දියුණුවට පත් කොට ඇත. එම ලක්ෂණ වැව්, අමුණු ආදී වශයෙන් දැනට ශේෂ වී ඇති ස්ථාන විමර්ශනයේ දී පැහැදිලි වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ඔස්සේ අපේක්ෂා කළ අරමුණු වන්නේ අතීත වාරිකර්මාන්තය දෙස විමසුම් ඇසින් බලන විට පැහැදිලිව පෙනෙන මෙරට අතීත වැසියාගේ භූගෝලීය පරිකල්පන ලක්ෂණයන් පිළිබඳව විමර්ශනයක් සිදු කිරීමයි. මෙහි තොරතුරු එක්රැස් කිරීමේ අධ්‍යයන ක්‍රමවේදයන් ලෙස මූලික වශයෙන්ම භාවිතකොට ඇත්තේ ප්‍රාථමික මූලාශ්‍රයන්, ද්විතීක මූලාශ්‍රයන් හා තෘතියක මූලාශ්‍රයන් යන ක්ෂේත්‍ර තුන යටතෙහිම හමුවන තොරතුරු අධ්‍යයනය කිරීමයි. එමෙන්ම මෙම ලිපිය ඔස්සේ බලාපොරොත්තු වන්නා වූ ප්‍රතිඵලය වන්නේ මෙරට වාරි කර්මාන්තය තුළ ලොකු, කුඩා වැව්, ඇළ වේලි යනාදිය භූගෝලීය ලක්ෂණවලට අනුගතව විධිමත් ආකාරයට භූමිය ප්‍රයෝජනයට ගෙන මෙම සම්භාව්‍ය වාරි නිර්මාණ භූගෝලීය පරිකල්පනයකින් යුතුව සිදුකොට ඇති බව හුවා දැක්වීමයි.

## විමර්ශනය

ශ්‍රී ලංකාවේ පුරාණ සිංහල ශිෂ්ටාචාරයේ සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඊට උරුම වාරි සංස්කෘතියයි. මෙම ක්‍රියාවලියේ මූලික අරමුණ වන්නේ වර්ෂා කාලයේ දී ජලාශයක රැස් කරගනු ලබන ජලය නියං කාලයේ දී ඇළ මාර්ග මඟින් කෙත් බිම් කරා සැපයීමයි. වැවක නිර්මාණ සැලසුම් දෙස අවධානය යොමු කිරීමේ දී, විද්‍යාව දියුණු ලෙස සලකනු ලබන වර්තමානයේ දී භාවිතා වන දැනුම පුරාණයේ තිබූ බව පෙනේ. වැවක් යනු, ආරක්ෂිතව ජලය රැස්කර තබාගෙන අවශ්‍යතා අනුව ජලය මුදාහරිනු ලබන ජල මූලාශ්‍රයකි. එහි දී එම වාරි කර්මාන්තය නිර්මාණයේ දී විමර්ශනය කළ යුතු බොහෝ දේ ඇතත් මූලික වශයෙන්ම වැදගත් වන්නේ භූ දර්ශනය හෙවත් භූමිය යොදා ගන්නා ආකාරයයි. ඕනෑම ඉදිකිරීමකට පෙර භූමිය පිළිබඳව අවධානය යොමු කිරීම වර්තමානයේ දී ද සිදුකරන්නකි. මෙහි දී වාරි නිර්මාණ ඉදිකිරීමට නම් එම නිර්මාණයට සරිලන ආකාරයේ භූමියක් තිබිය යුතුය. එසේ නොමැති නම් අවශ්‍ය ආකාරයට භූමිය සකස් කළ යුතුය. එබැවින් අවශ්‍ය ආකාරයේ භූමියක්

නොතිබුණහොත් රැස්කරනු ලබන ජලය පොළොවට උරාගෙන ජලය ඉක්මනින්ම පොළොවට වහනය වේ නම් එය වැවක් නිර්මාණයට හෝ කුමන හෝ වාරි නිර්මාණයකට නුසුදුසු පස් තට්ටුවක් සහිත භූමි ප්‍රදේශයක් ලෙස සැලකේ. එබැවින් පහසුවෙන්ම ජලය පස තුළට කා වැදී පස තුළින් ජලය වහනය නොවන මැටි සහිත යෝග්‍ය බිමක් වාරි නිර්මාණ සඳහා අත්‍යාවශ්‍යම සාධකයක් සේ සළකනු ලබයි. එම ස්ථරය ජලය කාන්දු නොවන අපාරගම්‍ය මැටි ස්ථරයක් සහිත බිමක් විය යුතුය.

භූ දර්ශනය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී වැව් බැම්ම නිර්මාණය කළ ආකාරය ඉතාමත් වැදගත් වේ. වැවක කල් පැවැත්ම රඳා පවතිනුයේ වැව් බැම්මේ ශක්තිමත්භාවය මතය. ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් අතීත වාරි කර්මාන්තයේ දී යොදාගත් භූගෝලීය ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ලැබේ. වැවක මූලික අංගයක් වන්නා වූ වැව් බැම්ම භූ දර්ශන උපයෝගී කොට ගෙන නිර්මාණය කොට ඇත. මෙහි දී වැව් නිර්මාණයේ දී අතීත වාරි ශිල්පීන් විසින් වැව් බැම්මෙහි පවතිනු ලබන දිග අඩු කර ගැනීම සඳහා එම පොළව මත පිහිටි ස්වභාවික කඳු හා උස් බැම් ආශ්‍රය කර ගැනීම ලොකු කුඩා සෑම වැව් නිර්මාණයකම දැකගත හැකිය. මෙහි දී සලකා බලා ඇති භූගෝලීය ලක්ෂණය වන්නේ කඳු කීපයක් යා කර බැම්ම බැඳීමෙන් කුඩා බැම්මකින් පුළුල් ජල ප්‍රදේශයක් ආවරණය කිරීමයි. කන්තලේ වැව සහ කලා වැව වැනි වැව් පරීක්ෂා කිරීමේ දී ඒ පිළිබඳව පැහැදිලි වේ. මෙරට බොහෝ වැව් බැඳ ඇත්තේ කඳු යා කොට කුඩා වැව් බැඳීම මඟිනි. මෙම බැම් හා කඳු නිසා පුළුල් මිටියාවතක විශාල ජල ධාරිතාවයන් රැස් වේ. එසේම කඳුවලින් උල්පත්වලින් මෙම ජලාශයට එක්රැස් වන ජල මාර්ග ගැන ද සැලකිලිමත් විය. ඊට අමතරව එම වැව් නිර්මාණය කරනු ලබන මිටියාවතේ වගා කළ හැකි බිම් ප්‍රදේශය ගැන ද සැලකිලිමත් වී ඇත. තව ද වැව ඉදිකළ ප්‍රදේශයට පහළට වන්නට තැනිතලා සිහින් බෑස්මක් ඇති මුළු භූමි භාගයක් තිබීම ද අත්‍යාවශ්‍ය වේ.

ඊට අමතරව මෙම වාරි නිර්මාණයක් ඉදිකිරීමේ දී අවධානය යොමු කරනු ලබන තවත් භූගෝලීය ලක්ෂණයක් වන්නේ, මෙලෙස රැස් කරනු ලබන ජලය ජලාශයට එකතුවන ඇළවල්, දියපාරවල්, උල්පත් හා ජල ප්‍රභවයන් ගැන ද අවධානය යොමු කිරීමයි. විශේෂයෙන් ම අවුරුද්දේ කෙටි කාලයක් තුල ලැබෙන නිරිතදිග මෝසම් වැසිවලින් එකතුවන ජලධාරාව ඉලක්ක කොටගෙන මෙම වැව් නිර්මාණය සිදු කොට ඇත. එසේම නිරිත දිග මෝසමෙන් පසු ලැබෙන ජලය ඉතා කෙටි මාර්ග ඔස්සේ වැව කරා යොමුකර ගැනීමට සැලසුම් සකස් කිරීම ද ඔවුන්ගේ ප්‍රධාන අංගයක් වී ඇත. අතීතයේ දී ස්වභාවික භූගෝලීය සාධක වූ ගල් පර්වත, ඇළ දොළ, ගංගා, උල්පත් සහ වනාන්තර, බිමේ බෑස්ම, වගා කිරීමට යෝග්‍ය ඉඩම්වල ඇති සරුසාර බව, පසේ ස්වභාවය ආදී පාරම්පරික තත්වයන් සියල්ල පිළිබඳව අවධානය යොමු කොට ඇත. වැව නිර්මාණයෙන් පසුව වැව තුල පවතින්නා වූ ජලය මුදාහරිනුයේ ගුරුත්වාකර්ෂණ බලය කේන්ද්‍ර කොටගෙනය. එම ජලය මුදා හැරීම සඳහා විශේෂ තෙරපුමක් භාවිතයට ගෙන නැත.

අතීත වාරි කර්මාන්තය තුළින් පිළිඹිබු වන භූගෝලීය පරිකල්පනය හෙවත් භූ දර්ශනය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී මූලික වශයෙන්ම වැවක් නිර්මාණයේ දී ඉදිකරනු ලබන වැවක අංග භූගෝලීය වශයෙන් එයට අනුගතව සකස් කරගත් ආකාරය පෙනී යයි. වැවක ප්‍රධාන අංගයක් වන වැව්කන්ද වැදගත් තැනක් හිමිකර ගනී. ජීව කාලය තීරණය වනුයේ වැව් බැම්මේ ශක්තිමත් බව මතය. මෙම වැව් බැම්ම, වැව් කණ්ඩිය, බන්ධන හා සේතු යන විවිධ නම්වලින් හඳුන්වන මෙම කොටස ප්‍රවාහන මාධ්‍යයක් ලෙස ද හැඳින්වේ. මෙහි දී මෙම

වැව් බැම්මේ උස තීරණය කරනුයේ වැවට එකතු වන ජල ප්‍රමාණය, පෝෂිත ප්‍රදේශයට ලැබෙන වර්ෂාපතනය, පහත් බිම් සඳහා බෙදිය හැකි ජල ප්‍රමාණය සහ පිටාර අනතුරුවය. අතීතයේ දී වැව් බැම්ම නිර්මාණය කොට ඇත්තේ කොන්ක්‍රීට් වැනි කෘතිම අමුද්‍රව්‍යවලින් නොව එම ස්ථානයේ දෙපස පවතින්නා වූ මැටි සහ පස් වල උපයෝගීතාවය මතය. මෙම ඉදිකරනු ලබන වැව් බැම්මට වැවෙහි එකතුවන ජල ධාරිතාවයේ පීඩනය තල්ලුව දරාගැනීමේ හැකියාව තිබිය යුතුය. එසේම කඳු ආදිය සම්බන්ධකොට යා කිරීමෙන් වැව් කන්දේ දිග ප්‍රමාණය අඩුකර ගැනීමට උත්සාහ කොට ඇත. එහි දී වැව් කන්දේ දිග ප්‍රමාණය සෘජුවම වැව් බැම්මේ පිට පැත්තට වැඩි පස් ප්‍රමාණයක් ගොඩකර ඇත. එයට හේතුව ඇතිවන පීඩනය අවම කරගැනීමය. වැවක ආයු කාලය තීරණය වන්නේ වැව් බැම්මේ ශක්තිමත් බව මතය. වැව් බැම්මේ පැවැත්ම සඳහා පැරණි වාරි ශිල්පීන් වැව් ඉදිකිරීම සඳහා හැකි තරම් දුරට පාෂාණ උද්ගතයක් ප්‍රයෝජනයට ගෙන ඇති අතර ක්වාර්ට්සයිට් රිජ්, සිරස් ග්රැනයිට්, ස්ඵටික පාෂාණ (Quartzite ridge,Vertical granite,Biotite hornblende gneiss,Crystalline rock) වැනි පාෂාණ ස්ථර ආශ්‍රිතව විශාල වැව්වල වැව් බැම්ම ඉදි කොට ඇත. ගල්ගමුව වැව, පරාක්‍රම සමුද්‍රය, තෝරගොල 'ල හා මින්නේරිය යන වැව් ආශ්‍රිතව සිදු කල පර්යේෂණ තුලින් එය හඳුනාගෙන ඇති බවට නිදසුන් වේ. කලාවැව, තබ්බෝව වැව හා මින්නේරිය වැව් බැම්ම පොළොවෙහි ක්වාට්සයිට් පාෂාණ විහිදීම මත ස්ථානගත කොට ඇත. එය පාෂාණ සංයුතිය පිළිබඳව සැලකිලිමත් වූ බවට කදිම සාක්ෂියකි. සැතපුම් 20 ක වට ප්‍රමාණයකින් යුක්ත වන්නා වූ ක්‍රිස්තු වර්ෂ 275 දී මහසෙන් රජු විසින් නිර්මිත මින්නේරිය වැවෙහි වැව් බැම්ම වර්තමානයේ දී ද දක්නට ලැබේ. මෙම ක්වාට්සයිට් පාෂාණය සවිවර පාෂාණයක් සේ නොව අධි පාරගම්‍ය පාෂාණයක් ලෙස ක්‍රියා කරයි. සවිවර පාෂාණ යනු එම පාෂාණය තුළ වැඩි වශයෙන් සිදුරු පවතින්නා වූ පාෂාණ වර්ගයකි. සාමාන්‍යයෙන් සිදුරු වැඩි වශයෙන් පවතිනුයේ වැලි සහ බොරළු පොළොවෙහි ය. ඉහත සඳහන් කළ ආකාරයට ක්වාට්සයිට් පාෂාණය අධිපාරගම්‍ය වේ. මෙහි දී පාරගම්‍යතාවය යනු පාෂාණයක පවතින කුස්තුර හා විවර තුළින් ජලය කාන්දු වීමට ඇති හැකියාවයි. එහි දී ක්වාට්සයිට් පාෂාණය මගින් වැව් බැම්ම ජලය කාන්දු කිරීම වැඩි වශයෙන් සිදු කිරීමට මෙම පාෂාණය යොදාගෙන ඇති බව පෙනේ. පාෂාණය ස්ඵටිකරූපී කුස්තුරවලින් සමන්විත වේ. මෙම පාෂාණය ගැඹුරේ දී වුවද ජලය රඳවාගෙන සිටිය හැකි පාෂාණයකි. මෙම ක්වාට්සයිට් පාෂාණ විහිදුම සහිතව සොරබර වැව හා ගල්ගමුව ආදී වැව්වල වැව් බැම්ම ද නිර්මාණය කොට තිබේ.

පුරාණ කාලයෙහි වැව් නිර්මාණය සිදුවුයේ හුදෙකලා තනි නිර්මාණයක් ලෙස නොව ජන ජීවිතය හා බැඳී මෙන්ම, තවත් වැව් පද්ධතියෙන් සමග එක්වය. මෙම වැව් පද්ධතිය ඇළ මාර්ග මගින් සම්බන්ධකොට පවත්වා ඇත. එබැවින් මෙම වාරි පද්ධතිය දාමයක පුරුකක් බවට පත්ව ඇත. මෙහි දී මෙම වාරි පද්ධතිය බිහිකිරීම සඳහා අනෙක් වැව් සමග සම්බන්ධ විය හැකි අයුරින් ජල මට්ටම පවත්වා ගෙන යාමට හැකිවේද යන්න වැව් බැම්ම ඉදිකිරීමේ දී සලකා බලා ඇති බවත් සාධකයක් වේ.

වැව් බැම්මක් ඉදිකිරීමේ කාර්යය ඉතාමත්ම සුවිශේෂී වේ. මෙම වැව් බැම්ම ඉදිකිරීමේ කාර්යය හුදෙක් පස් බැම්මක් ඉදිකිරීමක් නොවේ. වැව් බැම්ම කොටස් තුනකින් යුක්ත වේ.

- නාරටිය
- ආධාරක බැවුම්
- රළපනාව

වැව් බැම්මේ ශක්තිමත්ම කොටස වන නාරටිය, මැටි හා බොරළු යන පාෂාණයක් මිශ්‍ර කොට සාදාගත් මිශ්‍රණයකින් ඉදිකොට ඇත. පළමුව තෝරාගත් භූමියේ මතුපිට පස් ආවරණය ඉවත් කොට අභ්‍යන්තරයේ පවතින තද පාෂාණ හෝ පොළොව ස්ථරය මතු කරගනී. ඉන් අනතුරුව ගල් දමා විශාල අත්තිවාරමක් සකසනු ලැබේ. ඉන් අනතුරුව කුඩා ගල් වර්ග හා මැටි යොදා නාරටිය සකස් කෙරේ. මෙම කොටස ඉතාමත් ශක්තිමත්ව ඉදිකෙරෙනුයේ ඔවුන් සතුව තිබූ භූගෝලීය දැනුම නිසාවෙනි.

ආධාරක බැවුම වැවෙහි ඇතුළත හා පිටත පැත්තෙන් යොදන පස් බැම්මක් වේ. මේ සඳහා ඉතා තද සවිමත් කළුගල් යොදා ගැනේ. එය රළපනාවයි. මේ ආකාරයට ඉදිකරගනු ලබූ විශේෂ වැව් බැම් කිහිපයක් වර්තමානයේදී දක්නට ලැබේ. යෝධ වැවේ බැම්ම තැනිතලා බිමේ චාපාකාරව කිලෝ මීටර් 7 ක් දිගට විහිදී තිබේ. එය ස්වාභාවික කඳුවැටිවල සහය අඩු වශයෙන් යොදා ඉදිකරන ලද වැවකි. පරාක්‍රම සමුද්‍රයේ බැම්ම කිලෝ මීටර් 13.6 දිගු වන අතර එමගින් ජලය ඝන මීටර් මිලියන 46 ක් රඳවා තබා ගෙන ඇත. කලාවැවේ වැව් බැම්ම අඩි 40ක් හා නුවර වැවේ බැම්ම අඩි 33ක් උසින් නිර්මාණය කොට ඇත. අතීතයේ වාරි ඉංජිනේරුවන් විසින් භූගෝලීය ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කරමින් මෙම නිර්මාණ ඉදිකිරීම ශ්‍රී ලංකාවේ කන්තලේ වැවේ වැව් බැම්ම විනාශ වී යාම හා අදටත් ජීවමාන අයුරින් අපට දැකගැනීමට හැකියාව පවතින අතර නූතනයේ ඇමරිකාවේ ඉදිකළ ෆ්‍රැන්සිස් වේල්ල බිඳී ගොස් ජීවිත 430ක් පිළිගත්තේ ඔවුන් මෙම භූගෝලීය ලක්ෂණ පිළිබඳව නිසි අවධානය යොමු නොකළ බැවිනි. වැව් බැම්ම ඉදිකිරීමේදී එහි හැඩයද ඉතාමත් වැදගත් වී ඇත. යෝධවැව සහ ආනකට්ටිමුරුක්කු වැව උදාහරණ වේ. භූමියේ වාසිය සේ ගැනෙන්නේ කඳුවැටි පිහිටීම, භූගත ශිලාතලාවේ පිහිටීම, මතුපිට ගල් පර්වත පිහිටීම ආදී ලක්ෂණයි. කලා වැවේ බැම්ම දඟරාකාර ස්වභාවයක් ගැනීම, යෝධ වැවේ බැම්ම චාපාකාර වීම, කන්තලේ වැව් බැම්ම ඍජුවීම, බළලු වැවේ බැම්ම පිටතට නෙරූ ස්වභාවයක් ගැනීම ආදී වශයෙන් භූමියට ගැලපෙන ආකාරයට ඉදිකිරීම් කොට ඇත.

පැන්නුම, වැව් දොර වැනි නම් වලින් හැඳින්වෙන සොරොව්ව ඉදිකොට ඇත්තේ ද භූගෝලීය ලක්ෂණ පදනම් කරගනිමිනි. ගොඩ සොරොව්ව හා මඩ සොරොව්ව වශයෙන් කොටස් දෙකකින් සමන්විතය. එය නිර්මාණයට ප්‍රාග් කේම්බ්‍රීය නයිස් හා ග්‍රැනයිට් පාෂාණය භාවිත කොට ඇති අතර ගොඩ සොරොව්ව වැවෙහි සාමාන්‍ය ජලය නිකුත් වන අවස්ථාවල භාවිතයට ගැනෙන අතර මඩ සොරොව්වට තරමක් ඉහළින් පිහිටා ඇත. වැවෙහි ජල මට්ටම යහපත් තත්ත්වය පවතින අවස්ථාවල මෙම සොරොව්ව හරහා කෘෂි ක්ෂේත්‍ර වලට ජලය මුදාහරිනු ලැබේ. නාළිකා පද්ධතිය, බිසෝකොටුව, ජල පාලක උපකරණ හා ජල බාධක බැම්, වාරි බල කුහරය ආදී කොටස්වලින් සමන්විතය. අතීතයේ වැවෙහි සොරොව්ව නිර්මාණය කළේ ගල් භාවිතයෙනි. භූගෝලීය සොරොව්ව නිර්මාණය සඳහා යොදාගැනීම පිළිබඳව සලකා බැලීමේ දී ඉදිකිරීම පිටාර මට්ටමට තරමක් පහළින් හා කුඹුරු යායේ ඉහල කොටසට වඩා තරමක් ඉහළින් ඉදිකොට ඇත. සොරොව්ව වැව් බැම්මේ පහලින් ඉදිකල විට ජලය පිටතට ගලා යාමත් සොරොව්වට ඇතිවන පීඩනය අවම කිරීමටත් මෙය ඉවහල් විය.

ජලාශයක් ඔස්සේ ජලය බැහැර කිරීමට අනුගමනය කල තවත් ක්‍රමවේදයක් වශයෙන් දුරස්ථ ප්‍රත්‍යන්ත ප්‍රදේශ කරා ජලය හරවා යැවීමේ ක්‍රමය ක්‍රියාත්මක කර තිබේ. මෙහිදී නිසලව ගලා යන දිය පහරවල් හා ගංගාවන් හරහා අමුණු ඉදි කිරීමත් සමඟම සොරොව් හා ඇළ මාර්ග තැනීම ද පුරාණ හෙළ ඉංජිනේරුවන් සතුව තිබූ නිර්මාණශීලීත්වය පෙන්වයි. මල්වතු සහ ඇලහැර වැනි දිය පහරවල්හි ජලය රැඳවීම ඉතා පහසු කරුණක් නොවේ. මින්නේරි වැවට

ප්‍රධාන වශයෙන් ජලය සැපයූ ඇළ මාර්ගය වූයේ ඇලහැර ඇලයි. එසේම කවුඩුළු ඔයෙන් කවුඩුළු වැවට දිය සැපයීම සිදුව ඇත. දිගින් යාර 70ක් සහ ජල මට්ටමෙන් අඩි 40ක් පමණ උස් වූ ඇළහැර අමුණ මගින් මහවැලි ගඟෙන් හැර වුණු ඇළකින් දිඹුලාගල දෙසට සැතපුම් 20ක පමණ දුරකට සැපයුණු අතර එම ඇළ මාර්ග ඉදිවීම මහසෙන් සමයේ සිදුවූවකි. ධාතුසේන රජු සමයේද මෙලෙසම කලාඔය හරස්කොට කලාවැවට ජලය ලබා ගැනීමත්, ජය ගඟ මගින් උතුරින් පිහිටි තිස්ස වැව මෙන්ම කිලෝ මීටර් 87ක් පමණ ඈතින් පිහිටි ගම් වැව් වලටද ජලය ලබා දී ඇත. අතීත හෙළ දැනුම කෙතරම් ද යත් අනුරාධපුර නගරයට වඩා ඉහල උන්නතාංශයකින් පිහිටි කලා වැව පිහිටා ඇතත් කිලෝමීටයකට සෙන්ටි මීටර් 10න් (සැතපුමකට අඟල් හයක්) පමණ ආනතියක් ඇති ඇළ මාර්ග තනවා ඇත. මීට අමතරව ගංගා හරස් කොට අමුණ බැඳ ඇති අවස්ථා ලෙස කළු ගඟේ පිහිටි හත්තොට අමුණ, මහවැලි ගඟෙහි පිහිටි මණිමේඛලා අමුණ, මල්වතු ඔය පිහිටි අමුණ වශයෙන් අමුණු කිහිපයක් දැකිය හැකි අතර ඒවා ඔස්සේ ඇළ මාර්ග මගින් ජලාශ වෙත ජලය යවා ඇත

වාන් ඉදිකිරීම ජලාශයේ අතිරික්ත ජලය පිට කිරීමින් වැව ආරක්ෂා කර ගැනීමට ඉදිකළ උපක්‍රමයකි. අධික වර්ෂා සමයෙහි එකතුවන අතිරික්ත ජලය පිටකරන වාන එකල 'නිබ්බාහත උදක' වශයෙන් හඳුන්වා ඇත. මෙම වාන විශාල ජල කොටසත් පිටවීමේ දී ඉතාමත් ශක්තිමත්ව තිබිය යුතු බැවින් ස්වභාවිකව පිහිටා ගල් තලාවක් එහි නිර්මාණයට යොදාගෙන ඇත. උදාහරණ ලෙස කලාවැව වාන, පැරණි වාරි ඉංජිනේරුවන් භූමියෙහි විද්‍යාත්මක පිහිටීම පිළිබඳව මනා අවබෝධයකින් විසූ බව පිළිඹිබු කරයි. මෙම භූගෝලීය දැනුම මගින් පාරිසරිකව ඇතිවන ගැටලු ද මගහරවා ගැනීමට හැකියාව ලැබී ඇත. සමෝච්ච රේඛා හා සමතලා මට්ටම් පිළිබඳ අවබෝධයකින් නිරවද්‍ය ලෙසින් ශිල්පීය උපකරණ භාවිතා කිරීමේ හැකියාවන් හේතුවෙන් ගංගා හරස් කොට වැව් තැනීමට හැකිව තිබේ. වේලි ඉදිකිරීමේ දී ඔවුන් අතීතයේ අනුගමනය කළ ප්‍රධාන කරුණු කිහිපයක් තිබී ඇත.

- වැවෙහි වේල්ල ඉදිකිරීමේදී ගල්තලාවක පිහිටීම වැඩිවශයෙන් අවධානය ගෙන ඇත.
- වේළි සහිත මහා ජලාශ ඉදිකිරීමේදී ඉදිකිරීම් කාර්ය අවම කිරීම උදෙසා කටයුතු කිරීම. උදාහරණ මල්වතු ඔය හරහා 1.6නපක් පමණ දිගු අමුණක් බැඳ නාච්චාදූව ජලාශය නිර්මාණය
- ජලය බෙදාහැරීමේ ඇළ මාර්ග ඉදිකිරීමේ දී භූමියේ උන්නතාංශය පිළිබඳ අවධානය යොමු කිරීම

වේලි නිර්මාණය පිළිබඳව අවධානය යොමු කිරීමේදී විදේශ ඉංජිනේරුවරුන් හා විශේෂඥයින් විශ්මයට පත්වී ඇත්තේ නූතන තාක්ෂණික උපකරණ මගින් වේල්ලක් තැනීමට ස්ථානයක් මාදුරුඔය ආසන්නයේ තෝරාගෙන, එම ස්ථානයේ කැණීම් කරන අවස්ථාවේ, අතීතයේ මහවැලි ගඟ හරවා තිබූ පැරණි වේල්ලෙහි නෂ්ටාවශේෂ හමුවී තිබීමෙනි. මෙයින් අතීත වාරි ඉංජිනේරුවන් තුළ තිබූ භූගෝලීය දැනුම විද්‍යමාන වේ. මහවැලි ගඟ හා මාදුරු ඔය ප්‍රදේශය ක්‍රි.ව. 01 සියවසේ දී අන්තර් ගංගා නමින් හඳුන්වා ඇත. මෙහිදී හමුවූ සොරොව්ව කාබන් 14 කාලනිර්ණයට අනුව අනුව ක්‍රිස්තු පූර්ව පළමු වන සියවසට අයත් බව සොයාගෙන ඇත.

**නිගමනය**

මෙරට බහුතර ජනකාය වූ සිංහලයන්ගේ ශිෂ්ටාචාරය වාරි තාක්ෂණික ක්‍රමෝපායන් මත රඳා පවතින්නකි. සමාජ, ආර්ථික, දේශපාලනික වශයෙන් වැදගත් වන්නාවූ මෙම වාරි

කර්මාන්තය තුළ විවිධ වූ විශ්මිත නිර්මාණ දක්නට ලැබෙන අතර මෙම නිර්මාණ අවුරුදු දහස් ගණනක් පැරැණි වුවද අදටත් නොනැසී පවතිනුයේ මෙරට වාරි ඉංජිනේරුවන් තුළ පැවති දක්ෂතාවය නිසාවෙනි. මෙම නිර්මාණය කියාපානුයේ අතීත හෙළ වාරි ශිල්පයේ මහිමය, ඔවුන් තුළ තිබූ ගැඹුරු දැක්ම, ඉමහත් උත්සාහය සහ කැපවීම ආදියයි. ඓතිහාසික ලෝක ශිෂ්ඨාචාරයන් හමුවේ ශ්‍රී ලංකාවේ මානව ශිෂ්ටාචාරය ඉතාමත් උත්තරීතර හා ප්‍රෞඪ අතීතයකට උරුමකම් කියන්නේ මෙකී නිර්මාණ හා ඉදිකිරීම් තුළ දක්නට ලැබෙන භූගෝලීය පරිකල්පනය නිසාමය. වාරිමාර්ග දෙස අවධානය යොමු කරන විට අප හට පෙනී යන්නේ, සැලසුම් පිළියෙල කොට එම නිර්මාණ ඉදිකළ සිංහල වාරි ශිල්පීන් අතිවිශිෂ්ට ශිල්පීය කෞශල්‍යයක් ඇතිව සිටි බවයි. යම් ජල සම්පාදන ව්‍යාපාරයක් වර්තමානයේ දී ඇරඹුවහොත්, එය විශාල ව්‍යාපෘතියක් ලෙස සලකනු ලැබෙතත්, අතීත හෙළයන් භාවිතා කළ මූලික මිනුම්, ගණිත සූත්‍ර, උපකරණ හා කුමන ආකාරයේ ශිල්පීන් වැඩ කළේ ද යන්න අප්‍රකටය. ඔවුන්ට සියලු තොරතුරු මුඛ පරම්පරාගතව ගෙන ආ නොහැක. එයට කුමන හෝ විකල්පයක් ඔවුන් භාවිතා කරන්නට ඇත. මේ ආකාරයට වාරි කර්මාන්තය තුළ අතීතයේ වාරි කර්මාන්තය තුළින් භූගෝලය පරිකල්පනය පිළිබිඹු වන බව පැහැදිලි වේ.

**පරිශීලන.**

***පරාර්ථ 5 වෙළුම*** (2013) සංස්කාරක මණ්ඩලය, මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල ප්‍රකාශනයකි

බස්නායක සී. ආර්. එම්. ***දියවර වගතුග,*** 2011, කතෘ ප්‍රකාශන

විතානාච්චි, සී. ආර්., (2005) ***ශ්‍රී ලංකාවේ අතීත වාරි උරුමය හා වාරි පුරාවිද්‍යා, පුරාතතන,*** ජාතික පුරාවිද්‍යා දින සමරු කලාපය, කොළඹ මධ්‍යම සංස්කෘතික අරමුදල

සෙනෙවිරත්න, ඒ. (2001) ***පුරාණ සිංහල වාරි සංස්කෘතිය,*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ



# පුරාවේද

හත් වැනි කලාපය

2022

ARHM

ISSN 2989-0306

ISSN 2478-0774

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය
පුරාවිද්‍යා විෂය සංගමයේ ප්‍රකාශනයකි.

මිල රු. 800/=